323 වන කාණ්ඩය - 17 වන කලාපය
தொகுதி 323 - இல. 17
Volume 323 - No. 17

2025 දෙසැම්බර් 19වන සිකුරාදා
2025 டிசம்பர் 19, வெள்ளிக்கிழமை
Friday 19th December, 2025

# පාර්ලිමේන්තු විවාද
(හැන්සාඩ්)

# பாராளுமன்ற விவாதங்கள்
(ஹன்சாட்)

# PARLIAMENTARY DEBATES
(HANSARD)

## නිල වාර්තාව
அதிகார அறிக்கை
OFFICIAL REPORT

# අන්තර්ගත ප්‍රධාන කරුණු


**නිවේදන:**
ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම් [තීරුව 3101]

**රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව** [තීරුව 3102]

**පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය:**
කොරියාවේ රැකියා සඳහා වන ගිවිසුම් යාවත්කාලීන කිරීම [තීරුව 3104]

**2025.09.10 දින ගරු රවී කරුණානායක මහතා විසින් යොමු කරන ලද ප්‍රශ්නය:**
ගරු අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර [තීරුව 3106]

**විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ පළාත් සභා මැතිවරණය පැවැත්වීම පිළිබඳව රජයේ ස්ථාවරය:**
අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය [තීරුව 3114]

**වරප්‍රසාද:**
සාවද්‍ය කරුණු සමාජගත කිරීම [තීරුව 3118]

**වරප්‍රසාද යෝජනා:**
ගරු චතුරංග අබේසිංහ මහතා විසින් 2025.10.24 දින මතු කරන ලද වරප්‍රසාද සම්බන්ධ කරුණු [තීරුව 3120]

**පරිපූරක මුදල:**
හදිසි ආපදා තත්ත්වය නිසා අඩාළ වූ ජන ජීවිත සහ යටිතල පහසුකම් යථාවත් කිරීම [තීරු 3121-3274 ]


# பிரதான உள்ளடக்கம்


**அறிவிப்புகள்:**
இலங்கை நிலையான சொத்து உயர்தொழிலர்கள் நிறுவகம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள் [ப: 3101]

**அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை** [ப: 3102]

**தனி அறிவித்தல் மூல வினா:**
கொரியா வேலைவாய்ப்புக்கான ஒப்பந்தத்தைப் புதுப்பித்தல் [ப: 3104]

**2025.09.10ஆம் திகதி மாண்புமிகு ரவி கருணாநாயக்கவால் விடுக்கப்பட்ட வினா:**
மாண்புமிகு பிரதம அமைச்சரினது விடை [ப: 3106]

**நிறைவேற்றதிகார சனாதிபதி முறைமையை ஒழித்தல் மற்றும் மாகாண சபைத் தேர்தலை நடாத்தல் பற்றிய அரசின் நிலைப்பாடு:**
பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று [ப: 3114]

**சிறப்புரிமை:**
தவறான தகவல்களைப் பரப்புதல் [ப: 3118]

**சிறப்புரிமைப் பிரேரணைகள்:**
2025.10.24ஆம் திகதி மாண்புமிகு சதுரங்க அபேசிங்ஹவால் எழுப்பப்பட்ட சிறப்புரிமை பற்றிய விடயம் [ப: 3120]

**குறைநிரப்புத் தொகை:**
அனர்த்தத்தினால் பாதிக்கப்பட்ட மக்களின் வாழ்வாதாரங்களையும் சேதமடைந்த உட்கட்டமைப்புகளையும் மீளக் கட்டியெழுப்பல் [ப: 3121-3274]


# PRINCIPAL CONTENTS


ANNOUNCEMENTS:
Institute of Real Estate Professionals, Sri Lanka Bill: Petitions to the Supreme Court [Col. 3101]

PUBLIC FINANCE COMMITTEE REPORT [Col. 3102]

QUESTION BY PRIVATE NOTICE:
Updating Agreements on Job Opportunities in Korea [Col. 3104]

QUESTION POSED BY HON. RAVI KARUNANAYAKE ON 10.09.2025:
Reply by Hon. Prime Minister [Col. 3106]

GOVERNMENT STANCE ON ABOLISHING EXECUTIVE PRESIDENCY AND HOLDING PROVINCIAL COUNCILS ELECTION:
Statement by Prime Minister and Minister of Education, Higher Education and Vocational Education [Col. 3114]

PRIVILEGE:
Dissemination of False Information [Col. 3118]

PRIVILEGE MOTIONS:
Matters of Privilege Raised by Hon. Chathuranga Abeysinghe on 24.10.2025 [Col. 3120]

SUPPLEMENTARY SUM:
Restoration of Disrupted Livelihoods and Damaged Infrastructure Due to Emergency Disaster [Cols. 3121-3274]

# පාර්ලිමේන්තුව
# பாராளுமன்றம்
# PARLIAMENT

***2025 දෙසැම්බර් 19වන සිකුරාදා***
*2025 டிசம்பர் 19, வெள்ளிக்கிழமை*
*Friday 19th December, 2025*

**පූ.භා. 9.30ට පාර්ලිමේන්තුව රැස් විය.**
**කථානායකතුමා [ගරු (වෛද්‍ය) ජගත් වික්‍රමරත්න මහතා] මූලාසනාරූඪ විය.**
பாராளுமன்றம் மு.ப. 9.30 மணிக்குக் கூடியது.
சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ஜகத் விக்கிரமரத்ன] தலைமை வகித்தார்கள்.
The Parliament met at 9.30 a.m.,
MR. SPEAKER [THE HON. (DR.) JAGATH WICKRAMARATNE] in the Chair.

## නිවේදන
## அறிவிப்புகள்
## ANNOUNCEMENTS

### ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය පනත් කෙටුම්පත: ශ්‍රේෂ්ඨාධිකරණයට පෙත්සම්
### இலங்கை நிலையான சொத்து உயர்தொழிலர்கள் நிறுவகம் சட்டமூலம்: உயர் நீதிமன்றுக்கு மனுக்கள்
### INSTITUTE OF REAL ESTATE PROFESSIONALS, SRI LANKA BILL: PETITIONS TO THE SUPREME COURT

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ 121(1) ව්‍යවස්ථාව ප්‍රකාරව, "ශ්‍රී ලංකා තථ්‍ය දේපළ වෘත්තිකයන්ගේ ආයතනය" නමැති පනත් කෙටුම්පත සම්බන්ධයෙන් ශ්‍රේෂ්ඨාධිකරණය වෙත ඉදිරිපත් කරන ලද පෙත්සම් දෙකක පිටපත් 2025 දෙසැම්බර් 18වන දින මා වෙත ලැබී ඇති බව පාර්ලිමේන්තුවට දැනුම් දීමට කැමැත්තෙමි.

## ලිපි ලේඛනාදිය පිළිගැන්වීම
## சமர்ப்பிக்கப்பட்ட பத்திரங்கள்
## PAPERS PRESENTED

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)

Hon. Speaker, I present the-

(i) Regulations made by the Minister of Finance, Planning and Economic Development under Section 20 read with Sections 4(1) and 14 of the Imports and Exports (Control) Act, No. 1 of 1969 amended by Acts, No. 48 of 1985 and No. 28 of 1987 and published in Gazette Extraordinary No. 2465/07 of 01st December, 2025; and

(ii) Recommendations submitted to the Hon. President by the Finance Commission for the year 2026 in terms of Subarticle 4(a) of Article 154R of the Constitution of the Democratic Socialist Republic of Sri Lanka.

I move that these Regulations and the Recommendations be referred to the Committee on Public Finance.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Performance Report of the President's Fund for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Governance, Justice and Civil Protection.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)

Sir, I present the Annual Report of the State Mortgage and Investment Bank for the year 2024.

I move that this Report be referred to the Sectoral Oversight Committee on Economic Development and International Relations.

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ වාර්තාව
## அரசாங்க நிதி பற்றிய குழுவின் அறிக்கை
## PUBLIC FINANCE COMMITTEE REPORT

**ගරු හර්ෂණ රාජකරුණා මහතා**
(மாண்புமிகு ஹர்ஷண ராஜகருணா)
(The Hon. Harshana Rajakaruna)

ගරු කථානායකතුමනි, රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපති වෙනුවෙන් මම රජයේ මුදල් පිළිබඳ කාරක සභාව වෙත යොමු කරන ලද 2026 ජනවාරි 01 දින ආරම්භ වී 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මූල්‍ය වර්ෂය සඳහා මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍යාංශයේ ශීර්ෂය 240 - වැඩසටහන 02 - 2026 අංක 1 දරන පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධයෙන් එකී කාරක සභාවේ වාර්තාව ඉදිරිපත් කරමි.

*සභාමේසය මත තිබිය යුතුයයි නියෝග කරන ලදී.*
*சபாபீடத்தில் இருக்கக் கட்டளையிடப்பட்டது.*
*Ordered to lie upon the Table.*

## පෙත්සම්
## மனுக்கள்
## PETITIONS

**ගරු (මහාචාර්ය) ඒ.එච්.එම්.එච්. අබයරත්න මහතා (රාජ්‍ය පරිපාලන, පළාත් සභා සහ පළාත් පාලන අමාත්‍යතුමා)**
(மாண்புமிகு (பேராசிரியர்) ஏ.எச்.எம்.எச். அபயரத்ன - பொது நிருவாக, மாகாண சபைகள் மற்றும் உள்ளூராட்சி அமைச்சர்)
(The Hon. (Prof.) A.H.M.H. Abayarathna - Minister of Public Administration, Provincial Councils and Local Government)

ගරු කථානායකතුමනි, ආනමඩුව, තට්ටෑව පාර යන ලිපිනයෙහි පදිංචි ජී.ජී. සුජිත් නිශාන්ත මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු කථානායකතුමනි, කොළඹ 06, කිරුළපන, බලපොකුණ පාර, අංක 62 යන ලිපිනයෙහි පදිංචි පී. ප්‍රේමලාල් පීරිස් මහතාගෙන් ලැබුණු පෙත්සමක් මම පිළිගන්වමි.

**ගරු බී. ආරියවංශ මහතා**
(மாண்புமிகு பி. ஆரியவங்ஷ)
(The Hon. B. Ariyawansha)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) ඕමල්පේ, දාපනේ, අංක 69/1 යන ලිපිනයෙහි පදිංචි එස්.එල්. සුජාතා සේපාලි මහත්මියගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ඕමල්පේ, මහරුප්ප, අංක 66/D යන ලිපිනයෙහි පදිංචි ටී.ජී. උදේනි සරෝජා මහත්මියගෙන් ලැබුණු පෙත්සම.

**ගරු (වෛද්‍ය) ජගත් ගුණවර්ධන මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஜகத் குணவர்தன)
(The Hon. (Dr.) Jagath Gunawardana)

ගරු කථානායකතුමනි, මම පහත සඳහන් පෙත්සම් දෙක පිළිගන්වමි.

(1) යටිගල්ඔළුව, කැත්තකෙටු හේන, අංක 52 යන ලිපිනයෙහි පදිංචි පී.එල්.එච්. විජේවර්ධන මහතාගෙන් ලැබුණු පෙත්සම; සහ

(2) ගෝනවිල, මාකඳුර, කෝරළේ වත්ත, අංක 156 යන ලිපිනයෙහි පදිංචි ආර්.එම්.ඩී. ජගත් මහතාගෙන් ලැබුණු පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් පිළිබඳ කාරක සභාවට පැවරිය යුතු යයි නියෝග කරන ලදී.***

*சமர்ப்பிக்கப்பட்ட மனுக்களைப் பொதுமனுக் குழுவுக்குச் சாட்டக் கட்டளையிடப்பட்டது.*

*Petitions ordered to be referred to the Committee on Public Petitions.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නය, ගරු සජිත් ප්‍රේමදාස මහතා.

## පෞද්ගලිකව දැනුම් දීමෙන් ඇසූ ප්‍රශ්නය
## தனி அறிவித்தல் மூல வினா
## QUESTION BY PRIVATE NOTICE

### කොරියාවේ රැකියා සඳහා වන ගිවිසුම් යාවත්කාලීන කිරීම
### கொரியா வேலைவாய்ப்புக்கான ஒப்பந்தத்தைப் புதுப்பித்தல்
### UPDATING AGREEMENTS ON JOB OPPORTUNITIES IN KOREA

**ගරු සජිත් ප්‍රේමදාස මහතා (විරුද්ධ පාර්ශ්වයේ නායකතුමා)**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ - எதிர்க்கட்சி முதல்வர்)
(The Hon. Sajith Premadasa - Leader of the Opposition)

ගරු කථානායකතුමනි, ශ්‍රී ලංකාවට ලැබෙන විදේශ ප්‍රේෂණ කෙරෙහි දායක වන ඉතා වැදගත් ක්ෂේත්‍රයක් ලෙස විදේශ රැකියා ක්ෂේත්‍රය හඳුන්වා දිය හැකියි. ඒ අතරින් කොරියානු ජනරජයේ රැකියාවලට හිමි වන්නේ සුවිශේෂී ස්ථානයක්. පසුගිය වසර කිහිපය තුළ කොරියානු ජනරජයේ විදේශ රැකියා සඳහා සුදුසුකම් ලබා ඇති නමුත්, රැකියා සඳහා අවස්ථාව නොලැබීම මත පොරොත්තු ලේඛනයේ රැඳී සිටින තරුණ තරුණියන්ගේ ප්‍රමාණය ඉහළ ගොස් තිබෙනවා. එවැනි තත්ත්වයක් තුළ කොරියානු ජනරජය සමඟ පවතින Employment Permit System - EPS - යටතේ වන ද්විපාර්ශ්වික ගිවිසුම් යාවත්කාලීන කිරීම සඳහා රජයේ මැදිහත් වීම හදිසි හා අත්‍යවශ්‍ය වන බැවින් කරුණු කාරණා පැහැදිලි කර ගැනීමට පහත සඳහන් ප්‍රශ්න මම යොමු කරනවා. ගරු කථානායකතුමනි, ඇත්ත වශයෙන්ම මාර්තු මාසයේ ඒ අලුත්වීම සිදු නොවුණොත් අපේ රටේ යෞවන යෞවනියන් 10,000කට ආසන්න ප්‍රමාණයක් අනාථ වෙනවා.

1. ද්විපාර්ශ්වික ගිවිසුම් යටතේ ශ්‍රී ලංකාවට විදේශ රැකියා අවස්ථා ලබා දෙන රටවල් මොනවාද? ඒ අතරින් කොරියානු ජනරජය විසින් ලබා දෙන රැකියා අවස්ථා ප්‍රමාණය කාණ්ඩ වශයෙන් වෙන් වෙන්ව මෙම සභාවට ඉදිරිපත් කළ හැකිද?

2. කොරියානු ජනරජය විසින් ලබා දෙනු ලබන රැකියා අවස්ථා ප්‍රමාණය පසුගිය වසර පහ තුළ අඩු වී තිබේද? එසේ නම් ඊට හේතු මොනවාද? මේ සම්බන්ධයෙන් වත්මන් රජය විසින් සිදු කර ඇති අධ්‍යයන මොනවාද? එම අධ්‍යයන වාර්තා සභාගත කළ හැකිද?

3. කොරියානු ජනරජයේ රැකියා සඳහා සුදුසුකම් සපුරා ඇති, එමෙන්ම වෙබ් අඩවියේ ලියාපදිංචි වී ඇති රැකියා අපේක්ෂකයින් වසර 02ක කාලය අවසාන වීමෙන් පසුව ස්වයංක්‍රීයව ඉවත් වීම සිදු වීමෙන් එම අපේක්ෂකයන්ට සිදු වන අසාධාරණය වැළැක්වීම සඳහා රජයේ අවධානය යොමු වී තිබේද?

ගරු කථානායකතුමනි, ලක්ෂ ගණනක් මුදල් වියදම් කළ 10,000ක් පමණ දැන් පොරොත්තු ලේඛනයේ ඉන්නවා. රුපියල් ලක්ෂ ගණනක් මුදල් වියදම් කරලා පුහුණු වුණු එම තරුණ තරුණියන් මාර්තු මාසය වනකොට අනිවාර්යයෙන්ම ඉවත් වනවා. දැන් එම අය ලොකු ප්‍රශ්නයකට මුහුණ දෙනවා.

මේ සම්බන්ධයෙන් දැනට රජය විසින් ගෙන ඇති පියවර මොනවාද? එම පොරොත්තු කාල සීමාව දීර්ඝ කර ගැනීම සඳහා වත්මන් රජය විසින් කොරියානු ජනරජය සමඟ ද්විපාර්ශ්වික සාකච්ඡා පවත්වා තිබේද? එසේ නම් ඒවායේ ප්‍රගතිය කෙබඳුද?

අපිත්, අපේ පැත්තෙන් කොරියානු තානාපතිතුමියත් එක්ක සාකච්ඡා පවත්වලා, මේ ප්‍රශ්නයට ඉක්මන් විසඳුමක් ලබා දෙන ලෙස ඉල්ලීම් කළා. නමුත් මම හිතන විධියට, රාජ්‍ය පාර්ශ්වයෙන් දැවැන්ත මැදිහත්වීමක් අවශ්‍යයි මේ ගැටලුව විසඳන්න.

4. කොරියානු රජයේ රැකියා අපේක්ෂාවෙන් ලැයිස්තුගතව සිටින 9,000කට අධික අපේක්ෂකයින් සඳහා සහන සැලසීමට විශේෂ ගිවිසුම් හෝ ප්‍රමුඛතා වැඩ පිළිවෙළක් කඩිනමින් සකස් කිරීමට රජය සූදානම්ද?

5. කොරියානු ජනරජය හැර නව රැකියා වෙළෙඳ පොළවල් විවෘත කර ගැනීමට වත්මන් රජය විසින් එළඹ ඇති ද්විපාර්ශ්වික - bilateral/ G2G - ගිවිසුම් මොනවාද?

6. 2011 වර්ෂයේ ඉතාලි රජය සමඟ අත්සන් තබන ලද G2G ගිවිසුම යටතේ 2014 වර්ෂයේ පැවැති විභාගය සමත් වී ඇති නමුත් රැකියා සඳහා පිටත්ව යාමට නොහැකිව සිටින අපේක්ෂකයන් සඳහා අවස්ථාව නොලැබී යාමට හේතු මොනවාද? එම ගැටලුව විසඳීම සම්බන්ධයෙන් රජය ගෙන ඇති ක්‍රියාමාර්ග මොනවාද? එම පිරිසට සහන ක්‍රමවේදයක් සකස් කිරීමට රජය පියවර ගනු ලබන්නේද? නොඑසේනම් ඒ මන්ද?

දැනට විභාගය සමත් 86දෙනාගෙන් හත්දෙනෙකු නිෂ්කාසනය වී තිබෙනවා. ඔවුන්ගෙන් නිෂ්කාසනය වූ එක් අපේක්ෂකයෙක් මේ වන විට ඉතාලියට ගිහිල්ලාත් තිබෙනවා. නිෂ්කාසනය හිමි වූ අනෙකුත් අයට මේ රැකියා ලබා දෙන්නට, ඉතාලියට යවන්නට රජය මැදිහත් වන්නේ කවදාද කියන එකත් මේ අවස්ථාවේදී මම දැනගන්නට කැමැතියි.

ස්තුතියි.

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)
ගරු කථානායකතුමනි, එම ප්‍රශ්නයට පිළිතුර ලබා දීම සඳහා සති දෙකක කාලයක් ඉල්ලා සිටිනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට පොඩි කාරණාවක් ඉදිරිපත් කරන්න පුළුවන්ද, ගරු කථානායකතුමනි?

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
කියන්න, ගරු විපක්ෂ නායකතුමා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු සභානායකතුමනි, ඔබතුමා කිව්වා මේ ප්‍රශ්නයට සති දෙකකින් පිළිතුරක් දෙනවා කියලා. හැබැයි, මාර්තු මාසය වෙනකොට මෙගොල්ලන්ගේ deadline එක up වෙනවා. ඒ නිසා පිළිතුරු දෙනවා වාගේම යම් ක්‍රියාමාර්ගයක් ගැනීමත් අවශ්‍යයි. 9,000ක්, 10,000ක් පමණ අය එක එක්කෙනා ලක්ෂ ගණන් වියදම් කරලා medical tests ඔක්කෝම කරලා ඉන්නේ. උත්තරය දෙන එක ගැන බොහොම ස්තුතියි. නමුත්, කරුණාකරලා කාලය පනින්නට කලින් - මාර්තු අග වෙන්න පෙර - විසඳුමක් ලබා දෙන්න කටයුතු කරන්න කියලා මම බොහොම ගෞරවයෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, ගරු විපක්ෂ නායකතුමා මතු කරපු කරුණු සම්බන්ධයෙන් මම විදේශ කටයුතු අමාත්‍යතුමාව දැනුවත් කරන්නම්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
අමාත්‍යාංශ නිවේදන, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු ආචාර්ය හරිනි අමරසූරිය.

2025.09.10 දින ගරු රවී කරුණානායක මහතා අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම සහ 2025.09.24 දින ගරු සජිත් ප්‍රේමදාස මහතා විසින් ස්ථාවර නියෝග 27 (2) යටතේ අසන ලද ප්‍රශ්නයට පිළිතුරු ලබා දීම.

## 2025.09.10 දින ගරු රවී කරුණානායක මහතා විසින් යොමු කරන ලද ප්‍රශ්නය: ගරු අග්‍රාමාත්‍යතුමියගේ පිළිතුර
## 2025.09.10ஆம் திகதி மாண்புமிகு ரவி கருணாநாயக்கவால் விடுக்கப்பட்ட வினா: மாண்புமிகு பிரதம அமைச்சரினது விடை
## QUESTION POSED BY HON. RAVI KARUNANAYAKE ON 10.09.2025: REPLY BY HON. PRIME MINISTER

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ගරු රවී කරුණානායක මහතා විසින් අසන ලද ප්‍රශ්නයට ගරු කුමාර ජයකොඩි අමාත්‍යතුමා විසින් පිළිතුර ලබා දෙනවා ඇති.

**ගරු කුමාර ජයකොඩි මහතා (බලශක්ති අමාත්‍යතුමා)**
(மாண்புமிகு குமார ஜயகொடி - வலுசக்தி அமைச்சர்)
(The Hon. Kumara Jayakody - Minister of Energy)
ගරු කථානායකතුමනි, 2025.09.10 දින ගරු රවී කරුණානායක මහතා විසින් ගරු අග්‍රාමාත්‍යතුමියගෙන් අසන ලද ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

1. ලංකා විදුලිබල මණ්ඩලය විසින් 2024 වර්ෂය සඳහා රුපියල් මිලියන 615,019ක මුළු ආදායමක් සහ රුපියල් මිලියන 470,624ක් වූ මුළු පිරිවැයක් වාර්තා කර ඇත. LTL සමාගමේ කොටස් අළෙවියෙන් ලද ලාභය සහ උපලබ්ධි නොවූ විනිමය පරිවර්තිත ගැළපුම් ලාභය ඇතුළුව මුදල් නොවන ගනුදෙනු ගැළපීමෙන් පසු, පහත දක්වා ඇති පරිදි එම වර්ෂය සඳහා වන මෙහෙයුම් ලාභය රුපියල් මිලියන 106,601ක් ලෙස වාර්තා වී ඇත. එකී විස්තර ඇමුණුමේ අංක 01 වගුවෙහි දක්වා ඇත.

[ගරු කුමාර ජයකොඩි මහතා]

ඇමුණුමේ අංක 02 වගුවේ දක්වා ඇති පරිදි, ලංකා විදුලිබල මණ්ඩලයේ හිඟ ණය පියවීම සඳහා මෙම ලාභය ප්‍රධාන වශයෙන් යොදා ගෙන ඇත.

ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය ප්‍රධාන වශයෙන් රුපියල් මිලියන 40,258ක බැංකු අයිරාවක්ද ඇතුළත්ව දිගු හා කෙටි කාලීන ණය සහ රුපියල් මිලියන 56,006ක් වූ ගෙවිය යුතු ප්‍රධාන වෙළෙඳ ණයවලින් සැලකිය යුතු කොටසක් පියවීමට කටයුතු කර තිබේ. ඒ අනුව, ලංකා විදුලිබල මණ්ඩලය විසින් එහි ලාභයෙන් රුපියල් මිලියන 96,264ක් හිඟ ණය පියවීම සඳහා යොදාගෙන ඇත.

2024 වර්ෂයේ ලංකා විදුලිබල මණ්ඩලයේ මුළු පිරිවැය වූ රුපියල් මිලියන 470,624ට අදාළ වන සවිස්තරාත්මක තොරතුරු ඇමුණුමේ අංක 03 වගුවෙහි දක්වා ඇත.

ඒ අනුව පිරිවැය වර්ග කළ විට මුළු පිරිවැයෙන් පරිපාලන වියදම් ලෙස සියයට 3.09ක් හා මූල්‍ය වියදම් ලෙස සියයට 4.63ක් හඳුනා ගත හැක. ඒ අනුව ආයතනික වියදම් ලෙස වැය කර ඇත්තේ රුපියල් මිලියන 14,557.35ක මුදලකි. එය ප්‍රතිශතයක් ලෙස සියයට 3.09කි.

ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි ගාස්තු අයක්‍රමය සංශෝධනය සඳහා ඉල්ලීම් කළ විට අඩු විදුලි ගාස්තුවල ප්‍රතිලාභය පාරිභෝගිකයා වෙත ලබා දීම සඳහා සමස්ත පිරිවැය කෙරෙහි අවධානය යොමු කර විදුලි ගාස්තු අයක්‍රමය සංශෝධනය කිරීමට මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් කටයුතු කරනු ලබන අතර, එය ස්වාධීන ආයතනයක් වන බැවින් රජය ඒ සඳහා මැදිහත්වීමක් සිදු නොකරයි.

2. මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් අනුමත කරන ලද 2025-2044 දිගුකාලීන විදුලි ජනන සැලැස්ම අනුව, සැලසුම් කර ඇති සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ධාරිතාව මෙගාවොට් 1,848ක් වන අතර 2025 ජුනි මාසය වන විට ස්ථාපිත කරන ලද සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ධාරිතාව මෙගාවොට් 2,695ක් වී ඇත. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති සැබෑ ස්ථාපිත ධාරිතාව 2025 වර්ෂය සඳහා සැලසුම් කර ඇති අගය ඉක්මවා ගොස් ඇති බව මින් පෙන්නුම් කරයි. මීට අමතරව, මේ වන විට 2026 සහ 2027 වර්ෂ සඳහා, භූමිය මත ඉදි කෙරෙන සූර්ය බලශක්ති බලාගාර සම්බන්ධයෙන් ගිවිසුම්ගතව ඇති ධාරිතාව පිළිවෙළින් මෙගාවොට් 237ක් සහ මෙගාවොට් 426ක් ලෙස පවතී. මෙම සංඛ්‍යා දත්ත දෙකම එම වර්ෂ දෙක සඳහා සැලසුම් කර ඇති ධාරිතාවට පිළිවෙළින් මෙගාවොට් 220ට සහ මෙගාවොට් 250ට වඩා වැඩිය. විස්තර ඇමුණුමේ අංක 04 වගුවෙහි දක්වා ඇත.

ඉහත අංක 01, 02, 03 සහ 04 වගු ඇතුළත් ඇමුණුම මම **සභාගත*** කරනවා.

මෙම සංඛ්‍යා දත්තවලින් පෙනී යන්නේ සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය ඒකාබද්ධ කිරීම ලංකා විදුලිබල මණ්ඩලය විසින් දිරිමත් කර ඇති බවයි. එසේ නොවූයේ නම් ගිවිසුම්ගත ධාරිතාවල සංඛ්‍යා දත්ත මෙසේ සැලසුම් කර ඇති ධාරිතාවන් ඉක්මවා යාමක් සිදු වන්නේ නැත. සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති බලාගාර සඳහා ගාස්තු ගණනය කිරීම සම්මත විදුලිය මිල දී ගැනීමේ ගිවිසුම යටතේ දැනටමත් "පිරිවැය, ධන ආන්තිකය - cost plus margin - යන පදනම මත සිදු කෙරේ. තවද, තරගකාරී ලංසු තැබීමේ ක්‍රියාවලියද සමාන්තරව සිදු කෙරේ. තාක්ෂණය, ප්‍රාග්ධන පිරිවැය ව්‍යුහයන්, සවිරාම -කඩින් කඩ- ස්වභාවය, උපයෝජ්‍යතාව, ඉන්ධන පිරිවැය යනාදියෙහි ඇති වෙනස්කම් හේතුවෙන් තාප බලාගාර සඳහා ගෙවනු ලබන මිල ගණන් සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය, ඒ කියන්නේ, සූර්ය හා සුළං බලශක්තිය සමඟ සංසන්දනය කිරීම සාධාරණ නොවේ.

නමුත්, සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්තිය හා සැසඳීමේදී තාප විදුලි බලය සඳහා වන පිරිවැය ලෝකයේ කොහෙත් අධික වන බව සැබෑවකි.

බලශක්ති අමාත්‍යාංශය විසින් පත් කරනු ලබන තාක්ෂණික කමිටුවක් මඟින් පවතින ආර්ථික තත්ත්වය පිළිබඳව සැලකිල්ලට ගෙන එකඟ වූ මිල සූත්‍රයක් පදනම් කරගෙන මෙම මිල ගණන් වාර්ෂිකව ගණනය කරනු ලැබේ. බලශක්ති අමාත්‍යාංශය, ලංකා විදුලිබල මණ්ඩලය, ලංකා විදුලි (පුද්ගලික) සමාගම, ශ්‍රී ලංකා සුනිත්‍ය බලශක්ති අධිකාරිය, මහජන උපයෝගිතා කොමිෂන් සභාව සහ ශ්‍රී ලංකා මහ බැංකුව යන ආයතන නියෝජනය වන පරිදි කමිටුවේ සාමාජිකයන් පත් කර ඇත.

වසර 20ක ගිවිසුම් කාලයක් සඳහා සාමාන්‍ය අගය - Levelized Cost of Energy - මෙමඟින් ගණනය කෙරේ. මිල සූත්‍රය සඳහා පහත නිර්ණායක සලකා බලනු ලැබේ.

1. Capital cost of the plant
    a) CIF value of the solar panels and inverters
    b) Exchange rate
    c) Applicable taxes
2. Plant factor of the solar plant
3. Annual interest rates of the debts
4. Operation and maintenance cost including escalation rate for 20 years
5. Return on equity

එසේ ගණනය කරනු ලබන මිල ගණන් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය ලබා ගත් පසු ක්‍රියාත්මක කෙරේ.

3. බැටරි බලශක්ති ගබඩා පද්ධතිය හෙවත් BESS - Battery Energy Storage System - මූලිකව හඳුන්වා දෙන ලද්දේ වසර 10ක මෙහෙයුම් චක්‍රයක් මත පදනම්වයි. නමුත්, ආසන්නම ටෙන්ඩර් එකේදී අපි ඒක අවුරුදු 15 දක්වා දීර්ඝ කරලා තිබෙනවා. ගාස්තුව වසර 10ක මෙහෙයුම් ක්‍රියාකාරිත්වය පදනම් කරගෙන සකස් කර ඇති හෙයින් පාරිභෝගිකයාට/බැටරි ස්ථාපිත කරන්නාට අසාධාරණයක් සිදු නොවේ. වර්තමාන තාක්ෂණය සහ සෑම වසරකම බැටරිවල සියයට 2.5ක ධාරිතාව අඩු වීම ප්‍රමුඛ කරුණක් බව මෙහිදී සැලකිල්ලට ගෙන ඇත. තාක්ෂණය වෙනස් වීම මත ඇති වෙලා තිබෙන දියුණුව නිසා අපි ඒ අවුරුදු 10, අවුරුදු 15 දක්වා මේ වන විට දීර්ඝ කර තිබෙනවා. මුදල් අමාත්‍යාංශයෙන් ඒ පිළිබඳ ගැසට් එකක් ඉදිරිපත් කරලා තිබෙනවා. ඒකත් අපි මෙතැනට අමුණා තිබෙනවා. බැටරි ආනයනය කිරීමේදී සියයට 46ක ආනයන බද්දක් රේගුව විසින් ඔක්තෝබර් 15 දක්වා පැනවූවා. ආණ්ඩුව විධියට අපි battery storages සඳහා bonded warehouse facility යටතේ මෙගාවොට් 1 ඉඳන් ඉහළට ඒ බද්ද සම්පූර්ණයෙන්ම ඉවත් කරලා තිබෙනවා.

4. 2024 වර්ෂයේ උපයා ගත් ලාභයෙන් සිදු කළ ඉහත පියවීම්වලට අමතරව 2025 ජනවාරි සහ ජූනි ගාස්තු සංශෝධනවලදී ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින් රුපියල් මිලියන 62,956ක් ගාස්තු අඩු කිරීමක් වශයෙන් පාරිභෝගිකයා වෙත නැවත ලබා දීම -

---

** පිළිතුර අවසානයේ පළ කර ඇත.*
** விடையினிறுதியில் தரப்பட்டுள்ளது.*
** Produced at end of Answer.*

clawback - කර ඇත. එහි ප්‍රතිඵලයක් ලෙස 2025 ජනවාරි 18වන දින සිට ක්‍රියාත්මක වන පරිදි පාරිභෝගික ගාස්තුව සියයට 20.08කින් අඩු කර ඇත.

මේක පැහැදිලිව තේරුම් ගන්න ඕනෑ. ජනවාරිවල සියයට 20.08කින් අඩු කරන්න මහජන උපයෝගිතා කොමිසමෙන් නියෝග කළා.

මෙම ගැළපීම පාරිභෝගිකයා වෙත තාවකාලික සහනයක් සලසා දී ඇත.

ලංකා විදුලිබල මණ්ඩලයේ මූල්‍ය තත්ත්වය කෙරෙහි එය සැලකිය යුතු ලෙස බලපා ඇති බව කියන්න ඕනෑ. ඒක දැන් මීළඟ ඡේදයේදී තේරෙනවා.

මෙම තීරණය හේතුවෙන් 2025 වර්ෂයේ මුල් මාස තුන තුළ රුපියල් මිලියන 18,474ක මෙහෙයුම් අලාභයක් ලංකා විදුලිබල මණ්ඩලයෙන් වාර්තා වී ඇත. එබැවින් අතිරික්තයක් නොමැත. එම හිඟය පියවා ගැනීම පිණිස 2025 ජුනි 12වන දින සිට ක්‍රියාත්මක වන පරිදි සියයට 15ක ගාස්තු වැඩි කිරීමක් ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව විසින්ම ආපසු අනුමත කරනවා.

ඒ කියන්නේ, තමන්ගේ පුරෝකථනය වැරදියි කියලා. ගාස්තුව සියයට 20.08කින් අඩු කළාට ඊට පසුව පාඩුවක් වුණා. ඒ පාඩුව පියවන්න නැවත සියයට 15ක් වැඩි කරන්න කියලා එම ආයතනයෙන්ම අපට නියෝග කරලා තිබෙනවා.

දැනට, 2025 ඔක්තෝබර් - දෙසැම්බර් කාල පරිච්ඡේදය සඳහා ලංකා විදුලිබල මණ්ඩලය විසින් විදුලි ගාස්තු යෝජනාවක් ඉදිරිපත් කර ඇති අතර, එහිදී විදුලි ප්‍රේෂණ පුරෝකථනය, වියදම් සහ ආදායම් පුරෝකථනය සැලකිල්ලට ගනිමින් එම කාල පරිච්ඡේදය සඳහා තවදුරටත් සියයට 6.8ක ගාස්තු වැඩි කිරීමක් සඳහා ඉල්ලීමක් සිදු කර ඇත. කෙසේ වුවද, ලංකා විදුලිබල මණ්ඩලයේ ගාස්තු යෝජනාව අනුමත කිරීමේ අවසාන අධිකාරි බලය ඇත්තේ ශ්‍රී ලංකා මහජන උපයෝගිතා කොමිෂන් සභාව සතුව වන අතර, මෙම යෝජනාව සම්බන්ධයෙන් පාර්ශ්වකරුවන්ගේ සහ පාරිභෝගිකයන්ගේ ප්‍රතිචාර ලබා ගැනීම සඳහා මහජන අදහස් විමසීමේ ක්‍රියාවලියකින් පසුව 2025 ඔක්තෝබර් - දෙසැම්බර් කාල පරිච්ඡේදය සඳහා සංශෝධනයකින් තොරව පවතින ගාස්තු ක්‍රමයම ක්‍රියාත්මක කිරීමට අනුමැතිය ලබා දී ඇත.

***සභාමේසය මත තබන ලද ඇමුණුම:**
*சபாபீடத்தில் வைக்கப்பட்ட இணைப்பு :*
*Annex tabled:*

ඇමුණුම

<u>**වගු අංක 01**</u>

| **2024.12.31 දිනෙන් අවසන් වර්ෂය සඳහා ලාභය** | රු. මිලියන |
|---|---|
| මුළු ආදායම | 615,019 |
| මුළු පිරිවැය | (470,624) |
| 2024 අවසන් වර්ෂය සඳහා ලාභය | 144,395 |
| ***අඩු කළා: මුදල් නොවන ගනුදෙනු ගැලපීම්*** | |
| LTL සමාගමේ කොටස් අලෙවියෙන් ලද ලාභය | (26,038) |
| උපලබ්ධි නොවූ විනිමය පරිවර්තිත ගැලපුම් ලාභය | (11,756) |
| | |
| **මුදල් නොවන ගණුදෙනු ගැලපීමෙන් පසු ශුද්ධ ලාභය** | **106,601** |

වගු අංක 02

| **ණය** | **2024.01.01 දිනට රු. මිලියන** | **2024.12.31 දිනට රු.මිලියන** | **ණය අඩු වීම – රු.මිලියන** | |
|---|---|---|---|---|
| **දිගු කාලීන ණය** | | | | |
| ව්‍යාපෘති ණය – ලංවිම | 107,463 | 95,952 | | 11,511 |
| ණයකරය | 20,000 | 20,000 | | - |
| කාරක ප්‍රාග්ධනය සඳහා වූ දිගු කාලීන ණය | 61,853 | 46,640 | | 15,213 |
| Lease Creditors | 11 | 4 | | 7 |
| **බැංකු අයිරාව ඇතුළු කෙටි කාලීන ණය** | 63,838 | 50,311 | | 13,527 |
| | **253,165** | **212,907** | | **40,258** |
| **ප්‍රධාන වෙළඳ ණය** | | | | |
| CPC | 308 | 176 | | 132 |
| IPP-NCRE (සා.නො.පු.බ.) | 32,644 | 5,172 | | 27,472 |
| ගල් අඟුරු සම්බන්ධව ගෙවිය යුතු මුදල් | 30,331 | 27,944 | | 2,387 |
| CMEC | 8,402 | - | | 8,402 |
| IPP-Thermal (තාප) | 52,666 | 8,972 | 43,694 | |
| LTL සමාගමේ කොටස් මගින් පියවීම ඉවත් කිරීම | | | (26,081) | 17,613 |
| | **124,351** | **42,264** | | **56,006** |
| **මුළු එකතුව** | **377,516** | **255,171** | | **96,264** |

වගු අංක 03

| මුළු පිරිවැය | රු. මිලියන | පිරිවැය ප්‍රතිශතයක් ලෙස |
|---|---|---|
| සෘජු ජනන පිරිවැය | 302,400.23 | 64.26 % |
| ජනන මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය සහ ක්ෂය වීම් | 37,344.95 | 7.94 % |
| සම්ප්‍රේෂණ මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය සහ ක්ෂය වීම් | 14,096.04 | 2.99 % |
| බෙදාහැරීම් මෙහෙයුම් සහ නඩත්තු පිරිවැය සහ ක්ෂය වීම් | 80,454.77 | 17.09 % |
| පරිපාලන වියදම් | 14,557.35 | 3.09 % |
| මූල්‍ය පිරිවැය | 21,770.84 | 4.63 % |
| **මුළු එකතුව** | **470,624.18** | **100 %** |

වගු අංක 04

| | 2025 | 2026 | 2027 |
|---|---|---|---|
| සැලසුම් කර ඇති සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ධාරිතාව (මෙගා වොට්) | 1848 | - | - |
| ස්ථාපිත කරන ලද සාම්ප්‍රදායික නොවන පුනර්ජනනීය බලශක්ති ධාරිතාව (මෙගා වොට්) | 2695 | - | - |
| භූමිය මත ඉදිකෙරෙන සූර්ය බලශක්ති බලාගාර සම්බන්ධයෙන් ගිවිසුම්ගතව ඇති ධාරිතාව (මෙගා වොට්) | - | 237 | 426 |
| භූමිය මත ඉදිකෙරෙන සූර්ය බලශක්ති බලාගාර සම්බන්ධයෙන් සැලසුම් කර ඇති ධාරිතාවට (මෙගා වොට්) | - | 220 | 250 |

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ගරු ඇමතිතුමනි, මෙම ප්‍රශ්නයේදී ඔබතුමන්ලා විදුලි බිල තුනෙන් එකකින් අඩු කරනවා කිව්වාට, යම් ප්‍රමාණයක් අඩු කරලා දැන් නැවතත් වැඩි කරන්නයි තිබෙන්නේ. ඔබතුමන්ලාගේ එකම ප්‍රයත්නය වන්නේ ආදායම වැඩි කිරීම මිසක් වියදම අඩු කරන්න නොවෙයි. මේකේ ලෙහෙසියෙන් වියදම අඩු කරන්න පුළුවන් හැකියාව තිබේද්දීත් මට පෙනෙන්නේ නැහැ, කිසිසේත්ම ඒකට උත්තරයක් ලැබෙනවා කියලා.

ගරු ඇමතිතුමනි, ඔබතුමා 3වැනි ප්‍රශ්නයට ලබා දුන් පිළිතුරට අනුව අහනවා නම්, life cycle එක අවුරුදු 20ක් තියන්න පුළුවන් අවස්ථාවක, පෞද්ගලික අංශයෙන් ඒ සම්පූර්ණ වියදම දරන අවස්ථාවක එසේ අවුරුදු 20 කිරීමට තිබෙන ප්‍රශ්නය මොකක්ද? මේක අවුරුදු 10ද, 15ද? අධෛර්යවත් කිරීමේ වැඩ පිළිවෙළක් ලෙස තමයි මට මේක පෙනෙන්නේ. ඒ විතරක් නොවෙයි, ලංකා විදුලිබල මණ්ඩලයේ මීට පෙර තිබුණු අලාභය සම්බන්ධව කියන කොට ඔබතුමන්ලා කිව්වා 2024 වර්ෂයේ මිලියන 96,000ක් -ඒ කියන්නේ බිලියන 96ක්- ගෙවා තිබෙනවා කියලා. ඔබතුමන්ලා දැන් කරනවා වාගේ claw back කරන්න පුළුවන් ප්‍රමාණයක් දමලා පාරිභෝගිකයාට වාසියක් දෙන්න පුළුවන් අවස්ථාවක් ඇති කරන්න.

ඒ විතරක් නොවෙයි, Cyclone "Ditwah" නිසා විදුලිබල මණ්ඩලයට යම් අහිතකර තත්ත්වයක් ඇති වුණාද, ඒ තුළ ප්‍රේෂණය සහ නිෂ්පාදනය කොතරම් අඩු වෙලා තිබෙනවාද කියා මා දැන ගන්න කැමැතියි. මම මේ ප්‍රශ්නය තුළ අසා තිබෙන ආකාරයට බැටරි ගබඩා කිරීමේදී, firm generation එකක් ඇති කිරීමේදී, මේ රටට තෙල් වියදමින් බලපෑමක් ඇති නොවන විධියට ආයෝජන කරන්න ඕනෑය කියන කාරණය දැන් පිළිගන්නවාද, නැද්ද කියන එක මම ගරු කථානායකතුමා හරහා ඇමතිතුමාගෙන් අහනවා.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
ගරු කථානායකතුමනි, ගරු මන්ත්‍රීතුමා කියන පරිදි ඇත්තටම වියදම පාලනය කිරීමේ සහ වියදම අඩු කිරීමේ දැඩි ස්ථාවරයක අපි ඉන්නවා. අපි මිලදී ගැනීමේ මිල අඩු කර තිබෙන්නේ වියදම අඩු කරන්න තමයි. මිලදී ගැනීම කියන එක විදුලිබල මණ්ඩලයට වියදමක් තමයි. හැබැයි, මිලදී ගැනීමේ මිල අඩු කරනකොට විපක්ෂයෙන් අහනවා, ඇයි purchase price එක අඩු කරන්නේ කියලා. ඇත්තටම මේ උත්තරය තුළත් ඒ ගැන තිබෙනවා. ඒක තීරණය වන සාධක ටිකක් තිබෙනවා. සූර්ය පැනල හරහා ගැනීම තුළින් ඇත්තටම cost එක අඩු වෙලා තිබෙනවා. බොහෝ විට පරණ තිබුණු, -

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Exchange rate එක පහළ යනවා නේ. රුපියල අවප්‍රමාණය වෙනවා නේ. ඒක ප්‍රශ්නයක්.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර කෙටි කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
මෙහෙමයි. අපි price එක revise කළාට පස්සේ ආපු තත්ත්වයක් නේ, ඒක. ලබන අවුරුද්ද මුල වෙනකොට අපි කොහොමත් ආපසු ඒ ගැන consider කරනවා. කාටවත් පාඩු වන විධියට අපි මේ කිසිම දෙයක් කරන්නේ නැහැ. හැබැයි ඉතින් අනවශ්‍ය ලාභ ලබන්න ඉඩ තියන්නේත් නැහැ. ඒ දෙකම අපි බලන්න ඕනෑ. මොකද, - *[බාධා කිරීමක්]* ඒක ඉතින් ඇත්තටම calculation එකක් කරලා, -

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමා, පිළිතුර කෙටි කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
අපි තවම ඒක ඉවර කරලා නැහැ. මොකද, මේ කාර්තුව ඉවර වෙන්න ඕනෑ. මේ කාර්තුව ඉවර වුණාට පස්සේ ජනවාරිවල ඉඳලා තමයි ඒක බලන්න වෙන්නේ. ඒ වාගේම ඇත්තටම මිල අඩු වෙලා තිබෙනවා. මොකද, ටෙන්ඩර් ඉදිරිපත් කළ අයගෙනුත් අපි හිතපු නැති විධියේ හොඳ මිල ගණන්, අඩු මිල ගණන් ඉදිරිපත් වෙලා තිබෙනවා. අපි පුළුවන් තරම් ටෙන්ඩර් කැඳවීම හරහා තමයි ඉස්සරහට යන්න හදන්නේ. එතකොට මීටත් වඩා මිල අඩු වෙනවා. ඒ නිසා කාටවත් පාඩුවක් වෙන්නේ නැහැ. මොකද, අවුරුදු තුනකින් capital එක recover වෙච්ච සෝලා පැනල පද්ධති තමයි ලංකාවේ තිබුණේ. ගණන් හදනකොට කියනවා, අවුරුදු හතයි කියලා. හැබැයි rooftop panels ගහපු බහුතරයක් කට්ටියගේ practically අවුරුදු තුනෙන් recover වුණා. ඉතින්, ඒක තමයි ඇත්ත තත්ත්වය. ඒ formula එකේම වැරැද්දක් තිබෙනවා. අපි ඒක දැන් හදාගෙන යනවා. මොකද, එහෙම වුණාම ඒ cost එකේ වැඩි වීම එන්නේ අන්තිමට මිලියන 70ක් වන customersලාට. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
පිළිතුර අවසන් කරන්න, ගරු අමාත්‍යතුමා. *[බාධා කිරීමක්]* ගරු අමාත්‍යතුමා, පිළිතුර අවසන් කරන්න. *[බාධා කිරීමක්]* විවාදයකට යන්න අවශ්‍ය නැහැ. ගරු අමාත්‍යතුමා, ඒ නිසා පිළතුර අවසන් කරන්න. *[බාධා කිරීමක්]* ගරු අමාත්‍යතුමා, පිළිතුර අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
නැහැ, නැහැ. අවුරුදු තුනයි කිව්වේ, capital cost එක. Batteriesවලින් අපි පටන් ගත්තේ අලුතෙන්. එතකොට ඇත්තටම පටන් ගන්නකොට අවුරුදු 10ක guarantee එකක් තමයි වෙළෙඳ පොළේ batteriesවලට තිබුණේ. අපි ඒවා සලකා බලා තමයි වැඩ

කරන්න ඕනෑ. මොකද, අපි batteries හදන්නේ නැහැ නේ. එතකොට අපි අවුරුදු 10ක් කියලා පටන් ගත්තා. හැබැයි, අපේ tender එකේ අතරමගදී ඇත්තටම තාක්ෂණය වෙනස් වෙනවා; තාක්ෂණය වේගයෙන් වෙනස් වෙනවා. එතකොට අවුරුදු 15 කියන එක සම්බන්ධයෙන් අපි tender එක call කරන්න ඉස්සෙල්ලා ඒක ගැන දැනුවත් කරලා,- *[බාධා කිරීමක්]* අවුරුදු 15ක කාලයකට තමයි තිබෙන්නේ. හැබැයි තව ඉස්සරහට යනකොට අවුරුදු 20ද, 30ද කියලා අපට බලන්න පුළුවන්. මොකද, අපි තවම මේක පටන් ගත්තා විතරයි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, පිළිතුර ලබා දීලා අවසන් කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
Solar power system එක පටන් ගන්නකොට කරන්න තිබිච්ච දේවල් ගොඩක් කරලා තිබුණේ නැහැ, ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි. ඔබතුමන්ලා හිටපු ආණ්ඩු කාලවල solar power system එක පටන් ගන්නකොට කරපු නැති දේවල් ගොඩක් තිබෙනවා. අපි ඒවාත් කරගෙන තමයි මේ යන්නේ. මොකද, මේ ක්ෂේත්‍රය කඩා වැටෙන්න නොදී ඉදිරියට ගෙනයන්න ඕනෑ. අපට මේක උස්සන්න, පල්ලෙහාට දමන්න එහෙම කරන්න බැහැ. අපි මේක smoothly ගෙනියන්න ඕනෑ. අපි interest එක ගැනත් හිතන්න ඕනෑ; customer ගැනත් හිතන්න ඕනෑ. ඒ වාගේම, මේකේ stability එක ගෙනියන්නත් ඕනෑ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, පිළිතුර ලබා දීලා ඉක්මනින් අවසන් කරන්න.

**ගරු කුමාර ජයකොඩි මහතා**
(மாண்புமிகு குமார ஜயகொடி)
(The Hon. Kumara Jayakody)
කලින් කිව්වා වාගේ, "දිට්වා" සුළි කුණාටුව නිසා අපට ලොකු වියදමකුත් ගිහිල්ලා තිබෙනවා; ඒ වාගේ දේවලුත් සිද්ධ වෙලා තිබෙනවා. අපට ඉදිරියේදී වියදම් කරන්න විතරක් නොවෙයි, මේ දවස් ටිකේ ලොකු operational cost එකක් අපට යනවා. මොකද, අපි සේවකයෝ හැම තැනම යවලා ලොකු මහන්සියක් අරගෙන ඒක වුවමනාවෙන්ම කළා. අපි සීමා - control - කිරීමකින් තොරව ඒක ඉක්මනට කරන්න අවශ්‍ය වැඩ කටයුතු කළා. ඒ වාගේ දේවලුත් තිබෙනවා. ඒ cost කිසිවක් අපට කොහෙන්වත් හම්බ වෙන්නේ නැහැ. මේ බිල් එකේ මුදලින්ම තිබෙනවා. අපට සහනාධාර හම්බ වෙන්නේ නැහැ නේ. *[බාධා කිරීමක්]*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු අමාත්‍යතුමනි, මේක විවාදයක් නොවෙයි. ඔබතුමා පිළිතුර ලබා දීලා අවසන් කරන්න. *[බාධා කිරීමක්]*

අමාත්‍යාංශ නිවේදනය, අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍ය ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය.

## විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සහ පළාත් සභා මැතිවරණය පැවැත්වීම පිළිබඳව රජයේ ස්ථාවරය: අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමියගේ ප්‍රකාශය

## நிறைவேற்றதிகார சனாதிபதி முறைமையை ஒழித்தல் மற்றும் மாகாண சபைத் தேர்தலை நடாத்தல் பற்றிய அரசின் நிலைப்பாடு: பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சருமானவரினது கூற்று

## GOVERNMENT STANCE ON ABOLISHING EXECUTIVE PRESIDENCY AND HOLDING PROVINCIAL COUNCILS ELECTION: STATEMENT BY PRIME MINISTER AND MINISTER OF EDUCATION, HIGHER EDUCATION AND VOCATIONAL EDUCATION

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
ගරු කථානායකතුමනි, විපක්ෂ නායක ගරු සජිත් ප්‍රේමදාස මැතිතුමා විසින් 2025.09.24 වැනි දින අසන ලද ස්ථාවර නියෝග 27(2) යටතේ ප්‍රශ්නයට පිළිතුර මෙසේයි.

01. "පොහොසත් රටක්-ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 194 පිටුවේ, "නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් කෙටුම්පත් කරනු ලබන අතර, එය මහජනතාව වෙත ඉදිරිපත් කර සංවාදයකින් අනතුරුව අවශ්‍ය වෙනස්කම් සිදුකොට ජනමත විචාරණයක් ද සමග සම්මත කරගනු ඇත" යනුවෙන් සඳහන්ව ඇති අතර, එපරිදි කටයුතු කිරීම රජයේ අපේක්ෂාවයි. ඒ සඳහා මේ වන විට මීට පෙර නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කිරීම සඳහා පත් කරන ලද කමිටුවල වාර්තා හා අනෙකුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා ප්‍රතිසංස්කරණ යෝජනා සලකා බලමින් සිටින අතර, මූලික සංකල්ප පත්‍රිකාව අමාත්‍ය මණ්ඩලයට ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලබයි.

02. "පොහොසත් රටක්, ලස්සන ජීවිතයක්" ප්‍රතිපත්ති ප්‍රකාශනයේ 194 පිටුවේ, "විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීම හා විධායක බලතල රහිත ජනාධිපතිවරයෙක් පත් කිරීම" පිළිබඳව සඳහන්ව ඇති අතර, ඉහත 01හි සඳහන් ආකාරයට නව ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් සම්පාදනය කරන අවස්ථාවේ දී විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කොට පාර්ලිමේන්තු ආණ්ඩු ක්‍රමයක් ස්ථාපිත කිරීමට කටයුතු කරනු ඇත.

03. ව්‍යවස්ථා සංශෝධනය සිදු කරන විට නිසැකයෙන්ම විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කරනු ඇත.

    නව ව්‍යවස්ථාවක් රැගෙන ඒමකින් තොරව විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීමට නොහැක. විධායක ජනාධිපති ක්‍රමය අහෝසි කිරීම සඳහා වන කටයුතු හා එය

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

කළ යුතු ආකාරය පිළිබඳව අධ්‍යයනයක් මේ වන විට ආරම්භ වී ඇත. රටේ ප්‍රමුඛ ප්‍රශ්න සඳහා විසඳුම් දෙන අතරම මෙම කාර්යයට ද ප්‍රමුඛ අවධානයක් දී ඇත. නිශ්චිත කාල වකවානු ඉදිරියේදී ප්‍රකාශයට පත් කරනු ඇත.

04. පළාත් සභා ඡන්දය හැකි ඉක්මණින් පැවැත්වීම රජයේ අපේක්ෂාව වන අතර, ඒ සඳහා අවශ්‍ය කටයුතු මේ වනවිට සිදු කරමින් පවතී.

05. නැත.

2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතෙහි 3(අ) වගන්තිය යටතේ හඳුන්වා දී ඇති නව විධිවිධාන මඟින් ජනාධිපතිවරයා විසින් පත් කරනු ලබන සීමා නිර්ණය කිරීමේ කමිටුවක් මඟින් මැතිවරණයට අදාළව මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීම හා මැතිවරණ කොට්ඨාස ගණන තීරණය කිරීම සම්බන්ධයෙන් වාර්තාවක් ඉදිරිපත් කළ යුතු අතර, එම වාර්තාවට පාර්ලිමේන්තුවේ අනුමැතිය ලැබීමෙන් පසුව පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට හැකියාව ඇත.

මේ දක්වා මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය කිරීමේ කටයුතු අවසන්ව නොමැති බැවින් 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතේ විධිවිධාන ප්‍රකාරව පළාත් සභා ඡන්ද විමසීම පැවැත්වීමට නොහැකි වී ඇත. ඒ අනුව පළාත් සභා මැතිවරණය, මැතිවරණ කොට්ඨාස සීමා නිර්ණය අවසන් කිරීමෙන් පසු 2017 අංක 17 දරන පළාත් සභා ඡන්ද විමසීම් (සංශෝධන) පනතෙහි විධිවිධාන ප්‍රකාරව පවත්වන්නේ ද, එසේ නැතහොත් මෙම පනතේ ඉහත විධිවිධානයට සංශෝධනයක් ගෙන එමින් පැරණි ක්‍රමයට පළාත් සභා මැතිවරණය පවත්වන්නේ ද යන්න සම්බන්ධයෙන් මේ වන විට දීර්ඝ වශයෙන් කරුණු සලකා බලමින් සිටින අතර, එම අධ්‍යයනයෙන් අනතුරුව අවසන් තීරණය ගැනීමට නියමිතය. කෙසේ වුවද, මෙම කටයුතු අවසානයේ පළාත් සභා මැතිවරණය පවත්වනු ඇත.

2026 අය වැය තුළ පළාත් සභා මැතිවරණය පැවැත්වීමට මුදල් වෙන් කර ඇත.

06. රජයේ අභිචෝදක කාර්යාලය පිහිටුවීමට අදාළව අංක: අමප/25/0683/818/044 හා 2025.05.07 දිනැති සහ අංක: අමප/25/1279/818/044 - I හා 2025.08.04 දිනැති අමාත්‍ය මණ්ඩල තීරණ මඟින් යෝජිත රජයේ අභිචෝදක කාර්යාලය ස්ථාපිත කිරීම සඳහා නව නීතියක් හඳුන්වා දීම පිණිස අදාළ කරුණු අධ්‍යයනය කර නිර්දේශ සහිත වාර්තාවක් ඉදිරිපත් කිරීමට සහ අවශ්‍ය අවස්ථාවන්හිදී දැනට බලපවත්නා නීති සඳහා සංශෝධන හඳුනාගෙන නිර්දේශ ඉදිරිපත් කිරීමට තාක්ෂණික විශේෂඥ කමිටුවක් ස්ථාපනය කිරීම සඳහා අමාත්‍ය මණ්ඩල අනුමැතිය ලැබී ඇති අතර එම කමිටුව විසින් මේ වන විට කරුණු අධ්‍යයනය කරමින් පවතී. කමිටු වාර්තාව ලැබීමෙන් අනතුරුව නැවත අමාත්‍ය මණ්ඩලය වෙත එය ඉදිරිපත් කර, රජයේ අභිචෝදක කාර්යාලය පිහිටුවීම සඳහා වන පනත් කෙටුම්පත නීති කෙටුම්පත් සම්පාදක මඟින් සකස් කරවාගෙන නීතිපතිවරයාගේ නිෂ්කාසන ලබා ගැනීමෙන් පසුව පාර්ලිමේන්තුවේ අනුමැතිය සඳහා ඉදිරිපත් කිරීමට අපේක්ෂා කරනු ලැබේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු අග්‍රාමාත්‍යතුමිය විශේෂයෙන් ප්‍රකාශ කළා, ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ පැහැදිලි සංශෝධනයක් ක්‍රියාත්මක වෙනවාය කියලා, එහෙම නැත්නම් අලුත් ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් නිර්මාණය වෙනවාය කියලා. ඒ පිළිබඳව අපි ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම මම යම් පැහැදිලි කර ගැනීමක් කර ගන්නට කැමැතියි.

ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව සංශෝධනය වනකොට ඇත්තවශයෙන්ම අපේ රටේ මූලික අයිතිවාසිකම් සම්බන්ධයෙන් විග්‍රහය තිබෙන්නේ, දේශපාලන සහ සිවිල් අයිතිවාසිකම් පිළිබඳවයි. නමුත් අපි විශ්වාස කරනවා, මූලික අයිතිවාසිකම සඳහා වන එම නිර්වචනය වඩාත් පුළුල් වෙන්නට ඕනෑය කියලා. ඒ වාගේම නිදහස් සෞඛ්‍ය සඳහා වන අයිතිය, නිදහස් අධ්‍යාපනය සඳහා වන අයිතිය, සංස්කෘතිකමය අයිතීන්, ආගමික අයිතීන් යනාදී වශයෙන් පුළුල් නිර්වචනයක් සහිතව මූලික අයිතිවාසිකම් ක්‍රියාත්මක විය යුතුයි කියලා අපි විශ්වාස කරනවා. ඒක මම මේ අවස්ථාවේ ඉතාම පැහැදිලිව කියන්න ඕනෑ. මම ඔබතුමියට එහි ඇති වැදගත්කම අවධාරණය කරන්නට කැමැතියි.

විශේෂයෙන් Ondansetron කියන බාල එන්නත් ලබා ගැනීම නිසා හබරකඩ සහ මතුගම ප්‍රදේශයේ කාන්තාවන් දෙපළක් ජීවිතක්ෂයට පත් වෙලා තිබෙනවා. ඒ, බාල බෙහෙත් ප්‍රශ්නය සහ අනවසර ඖෂධ මාෆියාව හේතුවෙනුයි. නිදහස් සෞඛ්‍ය තුළ ගුණාත්මකභාවයෙන් ඉහළ බෙහෙත් හේත් ලබා දීම ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාව අනුව මූලික අයිතිවාසිකමක් වෙනකොට ඇත්තවශයෙන්ම පුරවැසියාගේ ජීවත් වීමේ අයිතියත් ශක්තිමත් වෙනවා. ඒ නිසා විශේෂයෙන්ම මම සඳහන් කරන්න කැමතියි, Ondansetron කියන බාල එන්නත් ලබාගෙන ජීවිත දෙකක් අහිමි වෙලා තිබෙන බව. එම තත්ත්වය තුළ ඒ පිළිබඳව ගන්න ක්‍රියාමාර්ගය මොකක්ද? හැබැයි, අද අපට අහන්න ලැබෙනවා, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන දූෂණ, වංචා හෙළිදරව් කරන වෛද්‍ය බෙල්ලන මැතිතුමා මාධ්‍යයට කථා කළා කියලා එතුමාගේ රැකියාව අහිමි කරලා තිබෙනවා කියලා. එහෙම වෙන්න බැහැ නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ප්‍රශ්නයට අදාළව පැහැදිලි කර ගැනීම ඉදිරිපත් කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, මට විනාඩියක් දෙන්න.

එතුමාගේ රැකියාව අහිමි කරලා තිබෙන්නේ මාධ්‍යයට කථා කළා කියලා. එතුමාට අයිතියක් නැද්ද, බාල බෙහෙත් ගැන කථා කරන්න? එතුමාට අයිතියක් නැද්ද, සෞඛ්‍ය ක්ෂේත්‍රයේ සිදු වන දූෂණ, වංචා සහ අක්‍රමිකතා පිළිබඳව කථා කරන්න? දැන් එතුමාගේ වැඩ තහනම් කරලා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමනි, ප්‍රශ්නයට අදාළව කථා කරන්න.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට කථා කරන්න ඉඩ දෙන්නකෝ, ගරු කථානායකතුමනි. මම මේ කථා කරන්නේ මූලික අයිතිවාසිකම් ගැන. ප්‍රශ්නයට අදාළව මම කථා කරන්නේ.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමා විනාඩි තුනක් වැඩිපුර අරගෙන තිබෙනවා. විනාඩි දෙකයි උපරිම වශයෙන් ලබා දෙන්නේ.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
මට තව විනාඩියක් දෙන්න. මම මේ කථා කරන්නේ මූලික අයිතිවාසිකම් ගැන, ජීවත් වීමේ අයිතිය ගැන.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ඔබතුමාට තව විනාඩියක් ලබා දෙනවා.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
සෞඛ්‍ය අයිතිය මූලික අයිතිවාසිකමක්. දැන් Ondansetron කියන බාල එන්නත ලබා දීලා, ජීවිත දෙකක් අහිමි වෙලා තිබෙනවා. කාගේද වැඩ තහනම් වෙලා තිබෙන්නේ? හැබැයි, බෙල්ලන මහත්මයා මේ රටේ සෞඛ්‍ය ක්ෂේත්‍රයේ තිබෙන දූෂණ සහ වංචා පිළිබඳව මාධ්‍යයට කථා කළා කියලා එතුමාව ගෙදර යවලා තිබෙනවා. මොකක්ද මේකේ සාධාරණත්වය? මම කාරුණිකව ඉල්ලීමක් කරනවා. සෞඛ්‍ය හා ජනමාධ්‍ය අමාත්‍යාංශයේ වැඩබලන ලේකම් විසින් වෛද්‍ය බෙල්ලන මහතාගේ රාජකාරි වැඩ තහනම් කරමින් එතුමාට යවන ලද 2025.12.18 දිනැති ලිපිය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

මම අහන්න කැමතියි, ජීවිත අහිමි වුණු හබරකඩ 37 හැවිරිදි කාන්තාවගේ සහ මතුගම 23 හැවිරිදි කාන්තාවගේ අයිතිවාසිකම් ආරක්ෂා කරන්නේ කවුද කියලා. මොකක්ද රජය ඒ වෙනුවෙන් ලබා දෙන උත්තරය? මේ බාල බෙහෙත් නිසා ජීවිත අහිමි වුණු ඒ කාන්තාවන්ට යුක්තිය සහ සාධාරණත්වය ඉෂ්ට කරන්නේ කවුද කියන එකත් මම අහන්න කැමතියි.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
ගරු කථානායකතුමනි, ඒ කාන්තාවන් දෙදෙනා මරණයට පත් වීම ගැන අපි රජයක් හැටියටත්, පොදුවේත් කනගාටුවට පත් වෙනවා. එය සිදු විය යුතු දෙයක් නොවෙයි කියන එක අපි පිළිගන්නවා. ඒ නිසා රජය මේ පිළිබඳව විමර්ශනයක් කරලා ඒකට අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න බව අපි කාටත් විශ්වාසයි. ඒක එසේ සිද්ධ විය යුතුයි. ඒ කාන්තාවන් දෙදෙනා මිය යාම ගැන අපි කනගාටු වෙනවා. එවැනි සිද්ධීන් යළි සිදු නොවීමට අපි අවශ්‍ය කටයුතු කරමින් යනවා. ඒ පිළිබඳව තව කරුණු අවශ්‍ය නම් අපේ නියෝජ්‍ය සෞඛ්‍ය ඇමතිතුමාගෙන් පිළිතුරක් ලබා ගන්නත් පුළුවන්. මේ වෙලාවේදී ඒ සම්බන්ධයෙන් විමර්ශනයක් පවත්වනවා. ඒ විමර්ශනයේ කරුණු තහවුරු වෙනකම් ඒ පිළිබඳ කරුණු ඉදිරිපත් කිරීමෙන් වැළකී සිටීම තමයි විමර්ශනය හරියට සිදුවීමටත් උපකාරී වෙන්නේ.

අනෙක් කාරණය මේකයි, ගරු කථානායකතුමනි. ව්‍යවස්ථාවේ තිබෙන මූලික අයිතිවාසිකම් පිළිබඳ Chapter එක අනිවාර්යයෙන් පුළුල් විය යුතුයි කියන ස්ථාවරයේ තමයි අපේ ආණ්ඩුව ඉන්නේ. විශේෂයෙන්ම ආර්ථික, සමාජයීය සහ සංස්කෘතික අයිතිවාසිකම්, සිවිල් සහ දේශපාලන අයිතිවාසිකම් වාගේම ශක්තිමත් සහ වැදගත්. ඒ නිසා මූලික අයිතිවාසිකම් පුළුල් වන විධියට ව්‍යවස්ථාවක් ගෙන ඒම පිළිබඳව විපක්ෂ නායකතුමාත් අපිට සහයෝගය දෙන එක ගැන මම ඉතාම සතුටු වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
වරප්‍රසාද ප්‍රශ්නය, ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා.

## වරප්‍රසාද: සාවද්‍ය කරුණු සමාජගත කිරීම
## சிறப்புரிமை: தவறான தகவல்களைப் பரப்புதல்
## PRIVILEGE: DISSEMINATION OF FALSE INFORMATION

**ගරු ශාන්ත පද්ම කුමාර සුබසිංහ මහතා**
(மாண்புமிகு ஷாந்த பத்ம குமார சுபசிங்ஹ)
(The Hon. Shantha Pathma Kumara Subasingha)
ගරු කථානායකතුමනි, මා ඉදිරිපත් කරන්නේ මන්ත්‍රී වරප්‍රසාද කඩ වීම පිළිබඳවයි.

ශාන්ත පද්ම කුමාර වන මම 2024 වසරේ පැවති පාර්ලිමේන්තු මැතිවරණයේදී ජාතික ජන බලවේගය නියෝජනය කරමින් රත්නපුර දිස්ත්‍රික්කයෙන් මනාප ඡන්ද 139,000කට වැඩි ප්‍රමාණයක් ලබාගෙන 10වැනි පාර්ලිමේන්තුවට තේරී පත්වීමි.

2025.12.16වන දින සහ ඉන් පසුව මා ඉලක්ක කර ගනිමින් සාවද්‍ය කරුණු සමාජගත කිරීමට සූරියකන්ද පොලිසියේ පොලිස් ස්ථානාධිපති, චාමින්ද සහ සුසන්ත යන අය විසින් ආරම්භ කරන ලදුව, පසුව කොළොන්න ප්‍රාදේශීය සභාවේ සජබයේ මන්ත්‍රී බුද්ධික යන අය විසින් කරන ලද අපහාස කිරීමේ කටයුත්තක් සමාජ මාධ්‍යයේත්, අනෙකුත් මුද්‍රිත සහ ඉලෙක්ට්‍රොනික මාධ්‍යයේත් පළ කිරීම, මාගේ පාර්ලිමේන්තු කටයුතුවලට සහභාගී වීමට බාධා පැමිණවීම අරමුණු කර ගනිමින් සිදු කර ඇති බව නිරීක්ෂණය කරමි. ඒ අනුව අදාළ පොලිස් නිලධාරින් සහ මාධ්‍ය පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනත උල්ලංඝනය කර ඇත.

තවද, සමගි ජන බලවේගය පක්ෂයේ පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු අජි නීතිඥ යැයි කියා ගන්නා අජිත් පී. පෙරේරා මහතා විසින් 2025.12.17වන දින මාධ්‍ය හමුවක් කැඳවමින් මාගේ නම, පක්ෂය, දිස්ත්‍රික්කය සහ මනාප ප්‍රමාණය සඳහන් කර ව්‍යාජ කරුණු දැක්වීමක් සිදු කරමින් පාර්ලිමේන්තු (බලතල හා වරප්‍රසාද) පනතේ උපලේඛන 'අ' කොටසේ 8හි දක්වා ඇති වරද සිදුකොට පාර්ලිමේන්තු මන්ත්‍රීවරයෙකු ලෙස මාගේ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනයට කටයුතුකොට ඇත.

මෙම තත්ත්වය යටතේ මාගේ පාර්ලිමේන්තු වරප්‍රසාද උල්ලංඝනය වී ඇති බැවින් ඒ හා සම්බන්ධ සියලුදෙනා ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කමිටුව හමුවට ගෙන එන ලෙසත්, ඒ පිළිබඳව සුදුසු ක්‍රියාමාර්ග ගන්නා ලෙසත් ඔබතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටිනවා, ගරු කථානායකතුමනි. මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාටත් ස්තුතිවන්ත වෙනවා.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු.

---
**** පුස්තකාලයේ තබා ඇත.***
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
Sir, I rise to a point of Order.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු විපක්ෂ නායකතුමා, ඔබතුමාගේ point of Order එක මොකක්ද?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු කථානායකතුමනි, ගරු ශාන්ත පද්ම කුමාර මන්ත්‍රීතුමා මේ සභාවේදී වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරනකොට, "අධි නීතිඥ යැයි කියා ගන්නා අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමා" කියලා කරන්න බැරි, අයුතු ආරෝපණයක් කළා. මම හිතන විධියට ඒක නිවැරැදි වෙන්නට ඕනෑ. එහෙම කථා කරන එක වැරැදියි. එතුමා අධිනීතිඥවරයෙක්. එතුමා සුදුසුකම් තිබෙන, සහතික තිබෙන නීතිඥවරයෙක්; උසස් අධ්‍යාපනය ලබපු නීතිඥවරයෙක්. ඒ නිසා "අධිනීතිඥවරයෙක් යැයි කියා ගන්නා" කියන කථාව මම හිතන විධියට වැරැදි ප්‍රකාශයක්. ඒක හැන්සාඩ් වාර්තාවෙන් ඉවත් කරන්න කටයුතු කරන්න. මොකද, අජිත් පී. පෙරේරා මැතිතුමාට ඕනෑ තරම් සුදුසුකම් තිබෙනවා. එතුමා හොඳ, ප්‍රවීණ නීතිඥවරයෙක්.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා (අධිකරණ සහ ජාතික ඒකාබද්ධතා අමාත්‍යතුමා)**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார - நீதி மற்றும் தேசிய ஒருமைப்பாட்டு அமைச்சர்)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law - Minister of Justice and National Integration)
ගරු කථානායකතුමනි,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ගරු හර්ෂණ නානායක්කාර ඇමතිතුමා.

**ගරු නීතිඥ හර්ෂණ නානායක්කාර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ஹர்ஷன நாணாயக்கார)
(The Hon. Harshana Nanayakkara, Attorney-at-Law)
ඔබතුමාගේ අවසරය ඇතුව යම් පැහැදිලි කිරීමක් කරන්න අවසරයි, ගරු කථානායකතුමනි. මේ රටේ "අධිනීතිඥ" කියලා තනතුරක් නැහැ. හරිද? එහෙම තනතුරක් නැහැ. එහෙම තනතුරක් තිබෙනවා නම් අජිත් පී. පෙරේරා මන්ත්‍රීතුමාට පුළුවන්, එතුමා උසාවි ගියාම නම සලකුණු කරනකොට "අධිනීතිඥ" කියලා උසාවියේ නම සටහන් කරන්න. නමුත්, එතුමා උසාවියේ එහෙම සටහන් කරන්නේ නැහැ. ලංකාවේ "අධිනීතිඥ" කියලා අය ඉන්නේ නීතිපති දෙපාර්තමේන්තුවේ විතරයි. ගරු විපක්ෂ නායකතුමාට සහාය වෙන්නයි මම ඒ පැහැදිලි කිරීම කළේ.

බොහොම ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩ කටයුතු ආරම්භයේදී යෝජනා.

## පාර්ලිමේන්තුවේ කටයුතු
## பாராளுமன்ற அலுவல்
## BUSINESS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "න්‍යාය පත්‍රයේ ප්‍රධාන වැඩකටයුතුවල අංක 1 දරන විෂයය පිළිබඳ වැඩ අද දින රැස්වීමේදී පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 27හි විධිවිධානයන්ගෙන් නිදහස් විය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## පාර්ලිමේන්තුවේ රැස්වීම්
## பாராளுமன்ற அமர்வு
## SITTINGS OF THE PARLIAMENT

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "අද දින විසිර යෑමේදී මෙම පාර්ලිමේන්තුව 2026 ජනවාරි 06 අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් තැබිය යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## වරප්‍රසාද යෝජනා
## சிறப்புரிமைப் பிரேரணைகள்
## PRIVILEGE MOTIONS

### ගරු චතුරංග අබේසිංහ මහතා විසින් 2025.10.24 දින මතු කරන ලද වරප්‍රසාද සම්බන්ධ කරුණු
### 2025.10.24ஆம் திகதி மாண்புமிகு சதுரங்க அபேசிங்ஹவால் எழுப்பப்பட்ட சிறப்புரிமை பற்றிய விடயம்
### MATTERS OF PRIVILEGE RAISED BY HON. CHATHURANGA ABEYSINGHE ON 24.10.2025

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
ගරු කථානායකතුමනි, මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

> "පාර්ලිමේන්තු මන්ත්‍රී ගරු චතුරංග අබේසිංහ මහතා විසින් තමාගේ වරප්‍රසාද කඩවී ඇති බවට 2025 ඔක්තෝබර් 24 දින පාර්ලිමේන්තුවේ දී මතු කරන ලද කරුණු, පාර්ලිමේන්තුවේ ස්ථාවර නියෝග 118හි විධිවිධාන ප්‍රකාරව ආචාර ධර්ම සහ වරප්‍රසාද පිළිබඳ කාරක සභාවට යොමු කළ යුතු ය."

*ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.*
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
ප්‍රධාන වැඩකටයුතු.

න්‍යාය පත්‍රයේ විෂය අංක 1, පරිපූරක මුදල,- ශීර්ෂය 240 - වැඩසටහන 02, සම්මත කිරීම සඳහා ඉදිරිපත් කිරීම, කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍ය ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා.

## පරිපූරක මුදල: හදිසි ආපදා තත්ත්වය නිසා අඩාළ වූ ජන ජීවිත සහ යටිතල පහසුකම් යථාවත් කිරීම

## குறைநிரப்புத் தொகை: அனர்த்தத்தினால் பாதிக்கப்பட்ட மக்களின் வாழ்வாதாரங்களையும் சேதமடைந்த உட்கட்டமைப்புகளையும் மீளக் கட்டியெழுப்பல்

## SUPPLEMENTARY SUM: RESTORATION OF DISRUPTED LIVELIHOODS AND DAMAGED INFRASTRUCTURE DUE TO EMERGENCY DISASTER

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)

ගරු කථානායකතුමනි, අග්‍රාමාත්‍ය සහ උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය වෙනුවෙන් මා පහත සඳහන් යෝජනාව ඉදිරිපත් කරනවා:

"2026 ජනවාරි 01 දිනෙන් ආරම්භ වන හා 2026 දෙසැම්බර් 31 දිනෙන් අවසන් වන මුදල් වර්ෂයේ ප්‍රයෝජනය සඳහා ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ඒකාබද්ධ අරමුදලෙන් හෝ රජයට අයත් අනිකුත් ඕනෑම අරමුදලකින් හෝ මුදලකින් හෝ ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ අභිමතය පරිදි රජය විසින් ලබා ගන්නා ලද ඕනෑම ණය මුදලකින් රුපියල් බිලියන පන්සියයක් (රු. 500,000,000,000) නොඉක්මවන අතිරේක මුදලක් ගෙවිය යුතු බවටත් එකී මුදල මෙහි ඇති උපලේඛනයේ දක්වා ඇති පරිදි වියදම් කළ යුතු බවටත්, මෙම පාර්ලිමේන්තුව යෝජනා සම්මත කරයි:-

**උපලේඛනය**

| | | | | |
|---|---|---|---|---|
| **ශීර්ෂය** | **240** | - | ජාතික අයවැය දෙපාර්තමේන්තුව | |
| **වැඩසටහන** | **02** | - | සංවර්ධන වැඩසටහන | |
| | | | පුනරාවර්තන වියදම් | රු. 150,000,000,000 |
| | | | මූලධන වියදම් | රු. 350,000,000,000 |
| | | | මුළු වියදම | **රු. 500,000,000,000** |

(අමාත්‍ය මණ්ඩලයේ අනුමතිය දන්වා තිබේ.)"

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*வினா எடுத்தியம்பப்பெற்றது.*
*Question proposed.*

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)

Next, the Hon. Anura Karunathilaka. You have 14 minutes.

[පූ.භා. 10.15]

**ගරු අනුර කරුණාතිලක මහතා (වරාය සහ සිවිල් ගුවන් සේවා අමාත්‍යතුමා)**
(மாண்புமிகு அனுர கருணாதிலக்க - துறைமுகங்கள் மற்றும் சிவில் விமான சேவைகள் அமைச்சர்)
(The Hon. Anura Karunathilaka - Minister of Ports and Civil Aviation)

ගරු කථානායකතුමනි, මෑත ඉතිහාසයේ අප මුහුණ දුන් විශාලතම ව්‍යසනය තමයි පසුගිය දිනවල ඇති වුණු සුළි කුණාටුව සහ ඒ සමඟ ඇති වුණු ගංවතුර තත්ත්වය. එම හදිසි ආපදා තත්ත්වයෙන් අඩාළ වූ ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම හා විනාශ වූ යටිතල පහසුකම් නැවත ගොඩනැඟීමට වෙන් කරන මූල්‍ය සම්පාදනය පිළිබඳව තමයි අපි අද සාකච්ඡා කරන්නේ. ඒ ඇති වුණු විනාශයෙන් ආපදාවට ලක් වී අසරණ වූ ජනතාවගේ ජීවිත නැවත නඟා සිටුවීමේ වගකීමත්, එම ව්‍යසනය නිසා විනාශයට පත් වුණු කෘෂි කර්මාන්තය, ප්‍රවාහනය, සෞඛ්‍ය සහ අධ්‍යාපනය වැනි ක්ෂේත්‍රවල යටිතල පහසුකම් සැලසුම් සහගතව, විධිමත් ලෙස ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අවශ්‍ය වන මූල්‍ය ප්‍රතිපාදන ලබා දීමේ වගකීමත් මූල්‍ය බලය හිමි ආයතනය හැටියට පාර්ලිමේන්තුවට තිබෙනවා. එම නිසා තමයි අද මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කර තිබෙන්නේ.

මෙම ව්‍යසනය ඇති වුණු මොහොතේදීම අපේ මූලික අවධානය යොමු වුණේ, ව්‍යසනයෙන් ආපදාවට පත් වුණු ජනතාවගේ ජීවිත ගලවා ගැනීම, ඔවුන් ආරක්ෂිත ස්ථානවලට රැගෙන යෑම සහ ගංවතුරට කොටු වෙලා ඉන්න ජනතාවට ආහාර, ජලය හා ඖෂධ වැනි අත්‍යවශ්‍ය දේවල් සම්පාදනය කරලා ඔවුන්ගේ ජීවිත සුරක්ෂිත කිරීම කෙරෙහියි. එම වගකීම තමයි අපට පළමු පියවරේදී, පළමු පැය 24දී තිබුණේ. මේ රටේ මහ ජනතාවත්, ඒ වාගේම ජාත්‍යන්තර මිතුරන් ඇතුළු සියලුදෙනාගේම සහභාගීත්වයෙන්, ආපදාවට පත් ජනතාවගේ මූලික අවශ්‍යතා පළමු පියවරේදී සම්පාදනය කරලා ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න රජයක් හැටියට අපට පුළුවන්කම ලැබුණා කියලා අපි හිතනවා. මෙහිදී රජයට අතිරේක ප්‍රතිපාදන සපයා ගැනීම අවශ්‍යයි. ඒ වාගේම ආපදාවට පත් ජනතාව සඳහා වියළි ආහාර ද්‍රව්‍ය කොහොමද ලබා දෙන්න ඕනෑ, පිසූ ආහාර ලබා දීම සඳහා අවශ්‍ය වන චක්‍රලේඛ මොනවාද කියන එක සම්බන්ධයෙන් අපි කරුණු ඉදිරිපත් කළා. මට මතක හැටියට, එම පළමු චක්‍රලේඛය නිකුත් වුණේ නොවැම්බර් මාසයේ 29වැනි දා. නොවැම්බර් 29වැනි දායින් පසුව පැය 24ක් ඇතුළත අපි ක්‍රියාත්මක වුණා. මීට කලින් තිබුණු සම්ප්‍රදාය අනුව නම්, සාමාන්‍යයෙන් පිසූ ආහාර ඇතුළු අනෙකුත් ආහාර ද්‍රව්‍ය ලබා දෙන්නේ පැය 24කට පසුව. නමුත්, මේ අවස්ථාවේදී අපි රජය හැටියට පැය 24ක් අතුළතම ඒ සඳහා අවශ්‍ය වන සහන ලබා දෙන්න කටයුතු කළා.

ඊළඟට අපි ඉක්මනින්ම අවධානය යොමු කළ කාරණය තමයි, ඒ අයට ඉතා ඉක්මනින් සාමාන්‍ය ජන ජීවිතය ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වන කටයුතු සම්පාදනය කරන්න ඕනෑ කොහොමද සහ ඒ සඳහා රජය හැටියට කටයුතු කරන්න ඕනෑ කොහොමද කියන එක. ඒ නිසා ඉක්මනින්ම තමන්ගේ නිවාස පිරිසිදු කරගන්න රුපියල් 25,000ක්, නිවාස යථා තත්ත්වයට පත් කරගැනීම සඳහා රුපියල් 50,000ක්, ඒ වාගේම පාසල් ළමුන්ට රුපියල් 15,000ක් ආදී වශයෙන් ඒ අවශ්‍ය කරන සහන පැකේජය ජනතාවට ලබා දෙන්න රජයක් හැටියට අපි කටයුතු කළා. ඒකට අවශ්‍ය රුපියල් බිලියන 50ක අතිරේක පරිපූරක ඇස්තමේන්තුව පසුගිය දවසක මේ පාර්ලිමේන්තුව විසින් සම්මත කළා. මේ දේවල් මේ විධියට ක්‍රියාත්මක වෙනකොට, ඉතාම කාර්යක්ෂමව සහ පැවැති ආපදා තත්ත්වය මත තිබුණු වටපිටාව තුළ ඉතාම ඉක්මනින් මේ සහන

[ගරු අනුර කරුණාතිලක මහතා]

ජනතාවට ලබා දීම සඳහා මේ රටේ රාජ්‍ය සේවකයින්, දිස්ත්‍රික් ලේකම්වරු, ප්‍රාදේශීය ලේකම්වරු, සහකාර ප්‍රාදේශීය ලේකම්වරු, ග්‍රාම නිලධාරින් ඇතුළු අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරින් දිවා රෑ මහන්සි වෙලා, තමන්ගේ පවුල ගැන හිතන්නේ නැතිව, ඉතාම වගකීමෙන් යුතුව වැඩ කළ බව අපි දන්නවා. එහි ප්‍රතිඵලයක් හැටියට ඒ සහනවලින් වැඩි ප්‍රමාණයක් මේ වෙනකොට ලබා දෙන්න කටයුතු කරලා තිබෙනවා. හැබැයි, සමහර අවස්ථාවලදී, එනම් විශේෂයෙන් ඊයේ දවස පුරාත්, සමහර මාධ්‍ය සාකච්ඡාවලදීත් අපට අහන්න ලැබුණා, මේ මුදල ලැබෙයිද කියලා සමහරු සැක මතු කළ ආකාරය. ඒ වාගේම, මෙහි තිබෙනවාය කියා තමන් හිතාගත්තු යම් යම් අඩුපාඩුකම් පෙන්වා දෙන්නත් කටයුතු කළා. නමුත්, ඇත්තටම ඔවුන් දන්නවා අපේ රටේ රාජ්‍ය සේවය කොයි තරම් කාර්යක්ෂම වුණත්, මේ වාගේ ව්‍යසනයක් ඇති වුණාට පසුව එහෙම දේවල් වෙන්න පුළුවන් කියලා. ලක්ෂ 17ක් වාගේ පිරිසක් මේ ව්‍යසනයෙන් ආපදාවට ලක් වුණා; 490,000ක් වාගේ පවුල් සංඛ්‍යාවක් මේ ව්‍යසනයෙන් ආපදාවට ලක් වුණා. එහෙම වුණාම එක්කෙනෙකු දෙදෙනෙකු මඟ හැරෙන එක, සමහර අවස්ථාවලදී ඒ සඳහා කිසියම් කාලයක් ගත වන එක සාධාරණයි. නමුත්, සමහර අය මේ තත්ත්වය තේරුම් ගන්නේ නැතිව කටයුතු කිරීම කනගාටුදායකයි කියන එකත් මේ වෙලාවේ මම මතක් කරන්න ඕනෑ. හැබැයි, මෙහි තිබෙන කාර්යක්ෂමතාව ගත්තොත්, බොහෝ තැන්වල පසුගිය 17වන දා වනකොට මේ සහනවලින් විශේෂයෙන්ම රුපියල් 25,000ක මුදල ලබා දීමේ කටයුතු අවම වශයෙන් සියයට 30ක්, 35ක් පමණ සම්පූර්ණ කරන්න කටයුතු කර තිබෙනවා.

ගරු කථානායකතුමනි, මා වැඩකටයුතු කරන, මා සම්බන්ධ වී කටයුතු කරන අපේ බියගම ආසනය ගත්තොත්, ඒ ආසනය තුළ පවුල් 5,500ක් ආපදාවට ලක් වුණා. ඒ අතරින් මේ වනකොට පවුල් 4,767කට -සියයට 87කට- එම රුපියල් 25,000ක මුදල ලබා දීම සඳහා අපි කටයුතු කර තිබෙනවා. ඒ වාගේම තවත් පවුල් 7,492කට වියළි ආහාර ඇතුළු අනෙකුත් සහන ලබා දීම සඳහා කටයුතු කර තිබෙනවා. ඒ වාගේම, පාසල් ළමුන්ට ලබා දෙන රුපියල් 15,000ක මුදල ලබා දීම සඳහා අවශ්‍ය ඉල්ලුම් පත් මේ වෙනකොටත් විදුහල්පතිවරුන් හරහා ලබා දෙන්න අපි කටයුතු කර තිබෙනවා.

ඒ වාගේම කර්මාන්ත හා කුඩා ව්‍යාපාරවල තොරතුරු ලබා ගැනීම සඳහා මේ වෙද්දී විධිමත් පියවර අරගෙන තිබෙනවා. රජයක් විධියට අපි එක පැත්තකින් ප්‍රතිපත්තිමය තීන්දු අරගෙන තිබෙනවා ලබා දෙන්න ඕනෑ සහන මොනවාද කියලා. ඒ වාගේම රජයක් හැටියට තමන් ගත්තු ප්‍රතිපත්තිමය තීන්දු ඉක්මනින් හා කාර්යක්ෂමව ක්‍රියාත්මක කර ගැනීම සඳහා අවශ්‍ය රාජ්‍ය යන්ත්‍රණය, රාජ්‍ය නිලධාරී යන්ත්‍රණය මෙහෙයවීම මේ වෙනකොට සිදු කරමින් පවතිනවා.

මෙවැනි විපතකදී අපේ පළමු වගකීම තමයි, මූලික පැය කිහිපයේදී ජනතාවගේ ජීවිත සුරක්ෂිත කරන එක. අනෙක් පියවර තමයි, ඒ ජන ජීවිතය සාමාන්‍ය තත්ත්වයට ඉතාම ඉක්මනින් ළඟා කර ගැනීම සඳහා අවශ්‍ය වන පහසුකම් සපයන එක.

ගරු කථානායකතුමනි, අපේ ඊළඟ අවශ්‍යතාව තමයි, විනාශයට පත් වුණු යටිතල පහසුකම් ලබා දීම සඳහා කටයුතු කිරීම. මා කලිනුත් කිව්වා වාගේ, මෑත ඉතිහාසයේ ඇති වුණු විශාලතම විනාශය වන මෙම ව්‍යසනය නිසා ජීවිත 643ක් අහිමි වෙලා තිබෙනවා; 183දෙනෙකු අතුරුදහන් වෙලා තිබෙනවා; පවුල් 490,385ක 1,702,719ක ජනතාවක් ආපදාවට ලක් වෙලා ඉන්නවා. පූර්ණ නිවාස හානි 13,781ක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම අර්ධ වශයෙන් නිවාස 101,055ක් හානියට පත් වෙලා තිබෙනවා. විදුලිය, මහා මාර්ග, අධ්‍යාපනය, කෘෂිකර්මය වාගේ ක්ෂේත්‍රවල යටිතල පහසුකම්වල විශාල වෙනසක්, විශාල විනාශයක් සිද්ධ වෙලා තිබෙනවා.

ඇත්තටම සංඛ්‍යාත්මකව රුපියල්වලින් හෝ ඩොලර්වලින් ඒවායේ ඇස්තමේන්තුව තවමත් අපට ලැබිලා නැහැ. විවිධ ආයතන ඒ සඳහා කටයුතු කරමින් ඉන්නවා. අපි විශ්වාස කරනවා ලෝක බැංකුව විසින් කරගෙන යන ඒ තක්සේරු වාර්තාව ඉදිරි සතිය ඇතුළත අපට ලැබෙයි කියලා. අද දවසේ අප මේ ඉදිරිපත් කරන මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් බලාපොරොත්තු වන්නේ ඒ යටිතල පහසුකම් ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අවශ්‍ය ප්‍රතිපාදන වෙන් කර ගැනීමයි. මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කිරීම හරහා සංවර්ධන සහනාධාර යටතේ රුපියල් බිලියන 500ක අතිරේක මුදලක් බලාපොරොත්තු වෙනවා. මේ මුදලින් දැනටමත් බලපෑමට ලක් වූ නිවාස සඳහා අවශ්‍ය වන පුනරාවර්තන වියදම් යටතේ රුපියල් බිලියන 150ක් ලබා දීලා තිබෙනවා. ඒ වාගේම වර්ගීකරණයේ ප්‍රාග්ධන වියදම් යටතේ ඇති ඉතිරි රුපියල් බිලියන 350න් හානියට පත් වූ නිවාස ප්‍රතිසංස්කරණය සඳහා රුපියල් බිලියන 100ක් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම, හානියට පත් පොදු යටිතල පහසුකම් ප්‍රතිසංස්කරණය කිරීම සඳහා අවශ්‍ය වන රුපියල් බිලියන 250 ද මේ තුළ ඇතුළත් වෙනවා. මෙහිදී යම් කෙනෙක් අහන්න පුළුවන් ප්‍රශ්නයක් තමයි, මේ විධියට අතිරේක මුදල් වෙන් කිරීමත් එක්ක ප්‍රාථමික වියදමේ සීමාව, දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 13ක් කියන සීමාව ඉක්මවා යනවා නේද කියන එක. ඔව්, ඇත්ත තමයි. ප්‍රාථමික වියදම් සීමාව මේ අතිරේක මුදල් වෙන් කිරීම නිසා සියයට 1.5කින් වැඩි වෙලා තිබෙනවා. ඒ අනුව ප්‍රාථමික වියදම් සීමාව දළ ජාතික නිෂ්පාදිතයෙන් සියයට 14.5ක් වෙලා තිබෙනවා. නමුත්, 2024 අංක 44 දරන රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතේ 16 (4) වගන්තියට අනුව මේ වාගේ ව්‍යසනකාරී තත්ත්වයක් පැන නැඟුණු මොහොතක, ප්‍රාථමික වියදමේ සීමාව ඉක්මවා යමින්, ඒ සඳහා අවශ්‍ය වන ප්‍රතිපාදන වෙන් කිරීමේ බලය මේ පාර්ලිමේන්තුවට තිබෙනවා. ඒ අනුව මූල්‍ය කළමනාකරණ පනතේ කිසිම වගන්තියකට පටහැනි නොවන විධියට තමයි, මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන්නේ.

ඒ වාගේම, යම් කෙනෙකු ප්‍රශ්නයක් අහන්න පුළුවන්, මේ අතිරේක රුපියල් බිලියන 500ක් වෙන් කිරීමත් එක්ක, අපේ ණය ගැනීමේ සීමාව කිසියම් විධියකින් වැඩිවීමක් සිද්ධ වෙනවා නේද කියලා. ඇත්තටම ගරු කථානායකතුමනි, අපි දැනටමත් 2025 අංක 23 දරන විසර්ජන පනත යටතේ රුපියල් බිලියන 3,740ක ණය ගැනීමේ අවශ්‍යතාවක් අනුමත කරලා තිබෙනවා. ඒ සීමාව තුළ, අතිරේක ණය ගැනීමකින් තොරව තමයි මේ මූල්‍ය කළමනාකරණය කිරීමේ හැකියාව අපිට අත් පත් කර තිබෙන්නේ. නමුත්, 2026 වර්ෂය සඳහා ප්‍රාථමික අතිරික්තය අපි කලින් අපේක්ෂා කළා, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 2.5ක් කියලා. නමුත්, මේ අතිරේක මූල්‍යනය කිරීම නිසා, ඒ මට්ටම දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 1 දක්වා අඩු වෙන්න පුළුවන් කියන එක අපට අපේක්ෂා කරන්න පුළුවන්. ඒ හැර, එක පැත්තකින් රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනතට අනුකූලවත්, ඒ වාගේම ණය ගැනීමේ සීමාව ඉක්මවා යන්නේ නැතුවත්, මේ මුදල් වෙන් කිරීම කරන්න පුළුවන්කම අපට ලැබිලා තිබෙනවා.

අපට මේ ශක්තිය, මේ හැකියාව ලැබිලා තිබෙන්නේ කොහොමද කියලා කල්පනා කරලා බැලුවොත්, රුපියල් බිලියන 500ක වාගේ ප්‍රමාණයක් මේ සඳහා වෙන් කරන්න අවශ්‍ය වන ශක්තිය අපට ලැබුණේ කොහොමද කියලා බැලුවොත්, 2025

වර්ෂයේ ප්‍රාථමික ගිණුමේ ශේෂය ඉක්මවා ගිහිල්ලා කිසියම් මුදලක් ඉතිරි කර ගන්න අපට පුළුවන්කම ලැබුණු බව අපට මතකයි. ඒ, විශේෂයෙන් අතිරේක බදු කිසිවක් පනවන්නේ නැතිවයි. ඒ වාගේම යහපත් මූල්‍ය විනයක් පවත්වා ගනිමින්, දූෂණය සහ නාස්තිය අවම කර ගනිමින්, ඒ රාජ්‍ය ආදායම් ඉලක්ක ඉක්මවා යමින් ආදායම් වැඩි කර ගැනීම සඳහා කටයුතු කරන්න අපට පුළුවන්කම ලැබුණා. ඒ නිසා තමයි මේ මූල්‍ය ශක්තිය අපට ලැබිලා තිබෙන්නේ. අපි ජාතික ජන බලවේගය හැටියට මේ රටේ ජනතාවට කිව්වා, අපේ ප්‍රතිපත්ති ප්‍රකාශනය තුළින් නොසැලෙන ආර්ථිකයක් මේ රට තුළ හදනවා කියලා. මෙන්න මේක තමයි නොසැලෙන ආර්ථිකයේ මූලික ලක්ෂණ. රට තුළ ව්‍යසනයක් ඇති වෙච්ච වෙලාවක, එහෙම නැත්නම් කිසියම් විධියක ප්‍රහාරයක් එල්ල වෙච්ච වෙලාවක, ජාත්‍යන්තරයේ සමහර සිදුවීම් ඇති වෙච්ච වෙලාවක අපේ රටේ කලින් තිබුණේ, ජාත්‍යන්තරය තුළ හෙම්බිරිස්සාවක් හැදුණොත් අපට නියුමෝනියාව ඇති වන ආර්ථිකයක්. නමුත්, අප අවුරුද්දක් ඇතුළත ගත් පියවර නිසා අපට පුළුවන්කම ලැබී තිබෙනවා, මේ වාගේ ව්‍යසනයක් මැද වුණත් අවශ්‍ය වන මූල්‍ය ශක්තිය ලබා දීම සඳහා කටයුතු කරන්න.

මේ රුපියල් බිලියන 500ට අමතරව, අපි 2026 අය වැය තුළ ආපදා කළමනාකරණය ඇතුළු වෙනත් විෂයන් සඳහා තවත් රුපියල් බිලියන 100ක විතර මුදල් ප්‍රමාණයක් දැනටමත් වෙන් කර තිබෙනවා. ඒ විතරක් නොවෙයි. ජාත්‍යන්තර මිතුරන් මේ වෙලාවේදී අපව තනි කළේ නැහැ. ආපදාව සිදු වී මුල් පැය 24 තුළදීම ගලවා ගැනීමේ මෙහෙයුම් සඳහා අවශ්‍ය වන කණ්ඩායම් අපට ලබා දුන්නා. ඒ වාගේම, මානුෂීය ආධාර ද අපට ලැබුණා. ඒ විතරක් නොවෙයි. රට නැවත ගොඩනැඟීමේ "Rebuilding Sri Lanka" වැඩසටහනට මූල්‍ය ආධාර ලබා දීමටත් බොහෝ දෙනෙක් මේ වන විට කටයුතු කර තිබෙනවා. ඒ නිසා අපි විශ්වාස කරනවා, එක පැත්තකින් රට තුළ තිබෙන මූල්‍ය ශක්තියත්, අනෙක් පැත්තෙන් ජාතික වශයෙන් සහ ජාත්‍යන්තර වශයෙන් විවිධ ආයතන, විවිධ පුද්ගලයන්, පෞද්ගලික අංශය සහ විවිධ රටවල් අපට දක්වන සහයෝගයත් තුළ මේ ව්‍යසනයෙන් මිදීම සඳහා, මේ ව්‍යසනය හමුවේ නැඟී සිටීම සඳහා අවශ්‍ය වන ශක්තිය අපට තිබෙනවා කියලා. ඒ අතරේ සමහරු කල්පනා කරනවා, මේ රට තුළ කිසියම් විධියට panic එකක්,-

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Hon. Minister, your time is over.

**ගරු අනුර කරුණාතිලක මහතා**
(மாண்புமிகு அனுர கருணாதிலக்க)
(The Hon. Anura Karunathilaka)
ගරු කථානායකතුමනි, මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

සමහරු කල්පනා කරනවා, රට තුළ කිසියම් විධියක ව්‍යාකූලත්වයක් ඇති කරන්න. සමහරු කියනවා, මේ අවස්ථාව ප්‍රයෝජනයට අරගෙන, පැනලා ඉඩම් අල්ලා ගන්න කියලා. ඒ වාගේම සමහරු කියනවා, "විපක්ෂයේ අපිට අවස්ථාවක් නැහැ" කියලා. ගරු කථානායකතුමනි, උදාහරණයක් විධියට පසුගිය දවසක පැවැති ගම්පහ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේ රැස්වීම ගත්තොත්, එයට සම්බන්ධ වුණේ විපක්ෂයේ පළාත් පාලන නියෝජිතයන් එක් කෙනෙකු විතරයි. පාර්ලිමේන්තු මන්ත්‍රීවරු 4දෙනෙක් හෝ 5දෙනෙක් ගම්පහ දිස්ත්‍රික්කය නියෝජනය කරනවා. නමුත්, ඒ දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවට සහභාගි වෙලා තමන්ගේ දිස්ත්‍රික්කය තුළ ආපදාවට ලක් වෙච්ච අය පිළිබඳව සාකච්ඡා කරලා, 'කණ්ඩායමක් හැටියට අපි මේකට මුහුණ දෙන්නේ කොහොමද' කියන කාරණය සම්බන්ධයෙන් යෝජනා හෝ අදහස් ලබා දෙන්න ඒ එක මන්ත්‍රීවරයෙක්වත් ඉදිරිපත් වුණේ නැහැ. එවන් වටපිටාවක තමයි රජය හැටියට අපට කටයුතු කරන්න සිදු වෙලා තිබෙන්නේ.

ගරු කථානායකතුමනි, අවසාන වශයෙන් මම කියන්නේ මේකයි. රටකට ව්‍යසනයන්ට මුහුණ දෙන්න සිද්ධ වෙනවා. හැබැයි, ඒ ව්‍යසනයන්ගෙන් මිදිලා ඉතා ඉක්මනින් යථා තත්ත්වයට පත් වෙන එක තමයි රටක් හැටියට තිබෙන වගකීම. වැටිච්ච තැනින් නැඟිටලා ආණ්ඩු බලය ලබා ගත් දේශපාලන ව්‍යාපාරයක් හැටියට අපට අත්දැකීම් තිබෙනවා වැටිච්ච තැනින් නැඟී සිටීම සම්බන්ධයෙන්. අන්න ඒ අත්දැකීම් උපයෝගි කරගෙන මේ ව්‍යසන තත්ත්වයෙන් රට ගලවාගෙන ඉදිරියට යෑම සඳහා අවශ්‍ය වන ශක්තියත්, ධෛර්යයත් අපට තිබෙනවා. මේ රටේ ජනතාව වෙනුවෙන් අපි ඒක කරනවා. ඒ සඳහා එකතු වෙන්න කියලා සියලු පාර්ශ්වයන්ගෙන් ඉල්ලමින් මම නිහඬ වෙනවා.

ගරු කථානායකතුමනි, මට කාලය ලබා දුන්නාට බෙහෙවින් ස්තුතියි.

**ගරු කථානායකතුමා**
(மாண்புமிகு சபாநாயகர் அவர்கள்)
(The Hon. Speaker)
Next, the Hon. R.M. Ranjith Madduma Bandara. You have nine minutes.

Order, please! The Hon. Deputy Speaker will now take the Chair.

***අනතුරුව ගරු කථානායකතුමා මූලාසනයෙන් ඉවත් වුයෙන්, නියෝජ්‍ය කථානායකතුමා [ගරු (වෛද්‍ය) රිස්වි සාලි මහතා] මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு சபாநாயகர் அவர்கள் அக்கிராசனத் தினின்று அகலவே, பிரதிச் சபாநாயகர் அவர்கள் [மாண்புமிகு (வைத்தியர்) ரிஸ்வி சாலி] தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. SPEAKER left the Chair, and DEPUTY SPEAKER [THE HON. (DR.) RIZVIE SALIH] took the Chair.*

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ranjith Madduma Bandara, you may commence your speech.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Gayantha Karunathilleka, what is the point you want to make?

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද වැදගත් විවාදයක් පැවැත්වෙන්නේ. අද දවස විශේෂ දවසක් හැටියට සලකා දිවා ආහාර විවේකය සඳහා තිබෙන පැය භාගයත් අපට විවාදය සඳහා ලබා දෙන්න කියලා මම ගරු අගමැතිනියගෙන් ඉල්ලා සිටිනවා. මොකද, රටේ ප්‍රශ්න ගැන නේ, මේ හැමෝම කථා කරන්නේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Prime Minister.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Deputy Speaker, I think we have discussed this before. Also, I think we have allotted enough time for today's Debate. We need to think of the Parliament staff also. They need that break; it is for their benefit also that we have allotted those 30 minutes. Therefore, I suggest that we go on as scheduled. We have allotted plenty of time for this Debate, Sir.

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Yes, Hon. Leader of the Opposition?

**ගරු සජිත් ප්‍රේමදාස මහතා**
(மாண்புமிகு சஜித் பிரேமதாஸ)
(The Hon. Sajith Premadasa)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුවෙන් විපතට පත් වුණු ජනතාවට රුපියල් බිලියන 500ක් වෙන් කිරීමේ පරිපූරක ඇස්තමේන්තුවට අපේත් උපරිම සහයෝගය ලබා දෙමින් අප මේ ඉල්ලා සිටින්නේ විපතට පත් වුණු, ජීවිත අහිමි වුණු, ගේ දොර අහිමි වුණු, ජීවනෝපාය අහිමි වුණු ජනතාව ගැන කියන්න, ඒ අයගේ ප්‍රශ්න ඉදිරිපත් කරන්න වෙලාව ලබා දෙන්න කියලායි. එම නිසා මේ මොහොතේ සානුකම්පිකව -අනුකම්පා සහගතව- හිතලා ඒ වෙලාවත් ලබා දෙන්න. ඒ මිනිසුන් වෙනුවෙන් හදවත පොඩ්ඩක් හරි උණු වෙනවා ඇති නේ. එම නිසා කරුණාකර lunch time එකත් විවාදයට ලබා දෙන්න. කවුරුවත් බඩගින්නේ ඉන්නේ නැහැ, ඒ වෙලාව මේ විවාදයට ලබා දීමේ හේතුව නිසා.

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
Hon. Deputy Speaker, we all are quite aware of the magnitude of this problem. This is not the first occasion on which we have debated this issue. The Hon. Leader of the Opposition and the Members of the Opposition have had enough time to talk about this. Yesterday also, we had a full day to debate this. Even previously, we had time. And, this is not the only forum in which opinions could be expressed and decisions could be made. Therefore, on behalf of the Government, we propose that we go on as scheduled with the half-hour lunch break. Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay. We will go on with the usual half-an-hour lunch break.

Hon. Ranjith Madduma Bandara, you may commence your speech now.

[පූ.භා. 10.33]

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි කනගාටු වෙනවා, අපේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරුන්ට තවත් විනාඩි 30ක් මේ ගැන අදහස් දක්වන්න අවස්ථාව ලබා නොදීම ගැන. මේ පාර්ලිමේන්තුවේ සම්ප්‍රදායක් තිබෙනවා, මේ වාගේ අවස්ථාවල දිවා ආහාරය සඳහා වෙන් කර ඇති කාල සීමාවත් අරගෙන විවාදය පැවැත්වීම. ඉතින් රජය මේ සම්බන්ධයෙන් කටයුතු කරන්නේ මේ ආකාරයෙන්ය කියලා විපතට පත් වෙච්ච ජනතාවට අපි කියනවා. කෝක නමුත් 1,000කට වඩා ජීවිත හානි සිදු වෙලා, මිලියන ගණනකගේ දේපළ ඇතුළු සියලු දේ නැති වෙලා ඉන්න වෙලාවක ආණ්ඩුව ගෙනාපු රුපියල් බිලියන 500 පරිපූරක ඇස්තමේන්තුවට අපේ සහයෝගය ලබා දෙනවා. නමුත්, අපට බලන්න වෙනවා, මේ ව්‍යසනයට පෙර රජයේ සූදානම කොහොමද, මේ ව්‍යසනයෙන් පසුව -පශ්චාත් කටයුතු ගැන - ආණ්ඩුව කටයුතු කරන්නේ කොහොමද කියන එක.

මේ රටේ ජනතාවට අපි ස්තුතිවන්ත වෙනවා. මොකද, ආණ්ඩුවට ඉස්සෙල්ලා මේ රටේ ජනතාව ඉදිරිපත් වුණා, ආපදාවලට ලක් වෙච්ච ජනතාවට අවශ්‍ය ආහාර ලබා දෙන්න. සමහර පන්සල්වල, පල්ලිවල, කෝවිල්වල ආහාර උයලා දුන්නා. ආණ්ඩුව හිටියේ පිටුපසින්; ජනතාව හිටියේ ඊට ඉස්සරහින්. මට මතකයි, සුනාමිය පැමිණි වෙලාවේ මධ්‍යම කඳුකරයේ ජනතාව ඇවිල්ලා සුනාමියෙන් විපතට පත් වෙච්ච මුහුදුකරයේ කට්ටියට උදවු කළ ආකාරය. අද ඒකේ අනෙක් පැත්ත. මුහුදුකරයේ, වෙරළ තීරයේ, දකුණේ, උතුරේ සහ අනෙකුත් තැන්වල ඉන්න අය ඇවිල්ලා මේ ව්‍යසනයෙන් විපතට පත් ජනතාවට උදවු කළා. ආණ්ඩුවට ඉස්සෙල්ලා ඒගොල්ලෝ උදවු කළා. අපි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලට ගියාම දැක්කා, බඩු ගොඩ ගහලා තිබෙන විධිය. ඒ, ආණ්ඩුවේ මුදල් නොවෙයි, ජනතාව දුන්නු සහනාධාර.

ආණ්ඩුව මේ මරණවලට වග කියන්න ඕනෑ. මේ සම්බන්ධයෙන් ඉස්සෙල්ලාම දැනුම් දුන්නේ, නොවැම්බර් 11වන දා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අය දිගින් දිගටම කිව්වා, මෙවැනි අයහපත් කාලගුණයක් ඇති වෙනවා, පීඩන අවපාතයක් ඇති වෙනවා, ඒකට සූදානම් වෙන්න කියලා.

ඒ වාගේම මට මතකයි, වාරිමාර්ග අධ්‍යක්ෂතුමා කියලා තිබුණා, පහළ ප්‍රදේශවල ඉන්න ජනතාව ප්‍රවේසම් වෙන්න, වැඩියෙන් වහිනවා, වතුර වැඩියෙන් එයි කියලා. නමුත් ආණ්ඩුව කිසිම ක්‍රියාමාර්ගයක් ගත්තේ නැහැ. 26වෙනි දා මේ කුණාටුව එනකම් ආණ්ඩුව නින්දේ හිටියේ. 27වන දා තමයි ආණ්ඩුව මේ ගැන කණ්ඩායම් රැස් කළේ. ඇයි හේතුව? මේ රටේ ආපදා වැඩි වෙනකොට, සුනාමි එනකොට, වියළි කාලගුණයක් එනකොට, ගංවතුර එනකොට වෙනම ආපදා කළමනාකරණ ඇමතිවරයෙක් පත් කරනවා. මොකක්ද මේ ජනාධිපතිවරයා කළේ? ආරක්ෂක ඇමතිත් එතුමා. මුදල් ඇමතිත් එතුමා. ඩිජිටල් ආර්ථික ඇමතිත් එතුමා. ආපදා කළමනාකරණ ඇමතිත් එතුමා. එතුමාට ආයතන 171ක් තිබෙනවා. අපි කියනවා, මේක ජනාධිපතිවරයාගේ වගකීම පැහැර හැරීමක් කියලා. තමන්ට කරන්න බැරි තරමට ආයතන 171ක් එකතු කරගෙන, මේ ගැන එතුමාගේ අවධානය යොමු නොවුණු නිසා තමයි අද මේ තත්ත්වය ඇතිවෙලා තිබෙන්නේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මේ ගැන දිගින් දිගටම කිව්වා. අද මොකක්ද රජය කරලා තිබෙන්නේ? අපට ආරංචියි, ආරක්ෂක ලේකම්වරයා එතුමාට තර්ජනය කරලා තිබෙනවාය කියලා, නැවත මාධ්‍ය ඉස්සරහට යන්න එපා කියලා. මේ විනාශයෙන් පස්සේ අපි දැක්කේ නැහැ කාලගුණ විද්‍යා

දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා මාධ්‍යයට එනවා. මෙන්න ආණ්ඩුවේ ඒකාධිපති පාලනය? ඒ විතරක් නොවෙයි. වාරිමාර්ග අධ්‍යක්ෂ ජනරාල්වරයා කිව්වා, පහළ ප්‍රදේශවලට ගංවතුර බිය එනවා කියලා. එහෙම නම්, ඒගොල්ලන්ට තිබුණා, ආණ්ඩුවට ඒ ගැන උපදෙස් දෙන්න, කොත්මලේ ජලාශයේ වාන් දොරටු වේලාසනින් අරින්න. එහෙම වුණා නම්, කොත්මලේට මේ විනාශය වෙන්නේ නැහැ. මහවැලියේ රන්දෙණිගල, වික්ටෝරියා ජලාශවල වාන් දොරවල් අරින්න තිබුණා. ටික ටික වතුර අරින්න තිබුණා. ඒක කළේ නැහැ. ආණ්ඩුව ඒ වගකීම භාර ගන්න ඕනෑ. ආණ්ඩුව මොකක්ද කරන්නේ? ඒ තොරතුරු කියපු නිලධාරින්ට විරුද්ධව අද කටයුතු කරනවා.

ආණ්ඩුව අද මුදල් හොයනවා, බිලියන 500ක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ රටට නිතර නිතර මේ වාගේ ස්වාභාවික ආපදා එන නිසා යහ පාලන ආණ්ඩුව කාලයේ අපි ස්වාභාවික ආපදා සම්බන්ධයෙන් රක්ෂණයක් කළා. අපේ ගරු රවී කරුණානායක හිටපු මුදල් ඇමතිතුමාට මම ඒ ගැන ස්තුතිවන්ත වෙනවා. ඒ තමයි, ජාතික රක්ෂණ භාර අරමුදල. රුපියල් බිලියන එකහමාරක් ඒකට වාරිකය ගෙව්වා. ඒ කාලයේ ඇති වුණු හැම ආපදාවකදීම ඒකෙන් මුදල් ගෙව්වා. නමුත් මේ ආණ්ඩුව මොකක්ද කළේ? එවැනි රක්ෂණ ක්‍රම අද අහෝසි කරලා තිබෙන්නේ. එවැනි රක්ෂණ ක්‍රමයකට මුදල් ගෙව්වේ නැහැ. එහෙම කළා නම් මේ වාගේ පරිපූරක ඇස්තමේන්තු ගෙනෙන්න ඕනෑ නැහැ. මොකද, ඒ රක්ෂණය මඟින් මුදල් ගෙවනවා.

අපි බලමු, මේ ආණ්ඩුව කොහොමද කටයුතු කරලා තිබෙන්නේ කියලා. අදාළ දෙපාර්තමේන්තු මේ ගැන ආණ්ඩුවට දැන්වූයේ නොවැම්බර් මාසයේ 11වැනි දා. නමුත් ඒ ගැන පළමුවෙනි රැස්වීම පැවැත්වූයේ ආපදාව වුණාට පස්සේ නොවැම්බර් මාසයේ 27වැනි දා. අපේ විපක්ෂ නායකතුමා කිව්වා, හදිසි තත්ත්වයක් ප්‍රකාශ කරන්න කියලා. නොවැම්බර් 29වැනි දා තමයි ඒකත් ප්‍රකාශ කළේ. හරි නම් ආපදාවක් වෙච්ච ගමන් ඒක ප්‍රකාශ කරන්න ඕනෑ. ආණ්ඩුවට තිබෙන අත්දැකීම්, පළපුරුද්ද සහ ආණ්ඩුවේ අකාර්යක්ෂමතාව තමයි මේකෙන් පෙනෙන්නේ. 27වැනි දා වෙච්ච සිද්ධියට මුහුණ දුන් ජනතාවට අවශ්‍ය ආහාර සහ අනෙක් දේවල්වලට අදාළව ආධාර පැකේජය ලබා දීම ගැන ජනාධිපතිවරයා සඳහන් කරන්නේ දෙසැම්බර් මාසයේ 05වැනි දා. ඒ කියන්නේ සිදුවීම වෙලා සතියකටත් පස්සේ. දෙසැම්බර් මාසයේ 05වැනි දා ජනාධිපතිවරයා මේ ආධාර පැකේජය ගැන පාර්ලිමේන්තුවේ ප්‍රකාශ කළත්, ඒ සම්බන්ධව නිලධාරින්ට දන්වන්න දවස් 9ක් ගත වෙලා තිබෙනවා. දෙසැම්බර් මාසයේ 14වැනි දා තමයි ආරක්ෂක ලේකම් ඒ සම්බන්ධ චක්‍රලේඛය යවන්නේ. ගෙවල් යට වුණේ 27වැනි දා. ඊට දවස් 18කට පසුව තමයි ආණ්ඩුව ඒ මිනිස්සුන්ගේ ගෙවල් ශුද්ධ කිරීමට අවශ්‍ය උපදෙස් සහ මුදල් අදාළ නිලධාරින්ට ලබා දෙන්නේ. රුපියල් 25,000 විතරයි දීලා තිබෙන්නේ. එතැනින් එහාට මොකුත් දීලා නැහැ. ජනාධිපතිවරයා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා මහ ලොකුවට කිව්වා, "ටකරමක් අයින් වුණත් ලක්ෂ 10ක් අපි දෙනවා." කියලා. නමුත් එතුමාගේම ආණ්ඩුවේ මාධ්‍ය ප්‍රකාශක වන සෞඛ්‍ය ඇමතිතුමා කියනවා, "නැහැ ටකරම අයින් වුණොත් ටකරම විතරයි දෙන්නේ" කියලා. අපි අහනවා, ජනාධිපතිවරයා මේ වාගේ කයිවාරු ගහන්නේ ඇයි කියලා. මේ රටේ ජනතාව දන්නවා, තමුන්නාන්සේලාට කථා කරන්න විතරයි පුළුවන් කියලා. වැඩ කරන්න බැරි විත්තිය දන්නවා. මේ ව්‍යසනය වෙලා සති 2ක් ගත වුණාට පසුව තමයි නිලධාරින්ට උපදෙස් දුන්නේ.

මේ ආණ්ඩුව මේ ගැන බොහොම මන්දගාමීව කටයුතු කරන්නේ. අද මේ තුළ දේශපාලන ඇඟිලි ගැසීම් තිබෙනවා. ග්‍රාම නිලධාරින්ගේ සංගමය කියනවා, "දේශපාලන ඇඟිලි ගැසීම් තිබෙනවා. කවදාවත් ආපදාවකදී මන්ත්‍රීවරුන් මෙහෙම ඇඟිලි ගහලා නැහැ. අද ජාතික ජන බලවේගයේ JVP මන්ත්‍රීවරු මේකට ඇඟිලි ගහනවා, ඒ නිසා අපි මේකෙන් අයින් වෙනවා" කියලා. දැනටමත් මාතලේ, යටවත්ත ප්‍රාදේශීය ලේකම් කාර්යාලයේ ග්‍රාම නිලධාරින් රාජකාරිවලින් අයින් වෙලා තිබෙනවා, මේ දේශපාලන ඇඟිලි ගැසීම් නිසා. ඒ වාගේම තමයි බදුල්ල දිස්ත්‍රික්කයේත්. විපක්ෂ නායකතුමාත් ඊයේ කිව්වා වාගේ ඊළඟ එක තමයි ප්‍රජා ශක්ති කමිටුවේ නිර්දේශය ගන්න ඕනෑය කියන එක. මොකක්ද ඒක? ඒක ජේවීපී කමිටුව. ඒකේ නිර්දේශය ඕනෑ ඒ ආධාර ලබා ගන්නා අයට. ඒ අහිංසක මිනිසුන්ට ආධාර දෙන එකටත් මේ ආණ්ඩුව දේශපාලනය ගාවගෙන. අපි ආණ්ඩුවෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ දේශපාලන අතපෙවීම් නවත්වන්න කියලා. ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ පැහැදිලිව මේවාට අවශ්‍ය ප්‍රතිපාදන තිබෙනවා. ඒ අනුව අරමුදලක් පිහිටුවන්න. පසුගිය අගෝස්තු මාසයේ 6වැනි දා කමිටුව රැස් වුණා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. R.M. Ranjith Madduma Bandara, your time is up.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
මට තව විනාඩියක් ලබා දෙන්න.

එතැනදී තීන්දු කළා, රුපියල් මිලියන 10ක් යොදවලා අරමුදලක් පිහිටුවන්න. ආණ්ඩුව ඒක කළේ නැහැ. ඒකට ලේකම් කෙනෙක් පත් කරන්න කිව්වා. නමුත් පත් කළේ නැහැ. ඔන්න, ආණ්ඩුවේ මන්දගාමී වැඩ පිළිවෙළ; ක්‍රියාත්මක නොවීම! අද මොකක්ද වෙලා තිබෙන්නේ? ආණ්ඩුවට මේ රජයේ නිලධාරින් සම්බන්ධව පුදුම අවිශ්වාසයක් තිබෙන්නේ. ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේම තිබෙනවා, මුදල් කමිටුවක් පත් කරන්න ඕනෑ, ගිණුමක් විවෘත කරන්න ඕනෑ කියලා. ආණ්ඩුව මොකක්ද අද කරලා තිබෙන්නේ? නිලධාරින් වෙනුවට මේ රටේ ආණ්ඩුවත් එක්ක ඉන්න, ආණ්ඩුවට සල්ලි දුන්න ව්‍යාපාරිකයන් එක්කාසු කරගෙන මුදල් කමිටුවක් පත් කරලා තිබෙනවා; වෙනම කමිටුවක් පත් කරලා තිබෙනවා. අපි අහනවා ආණ්ඩුවෙන්, මේ රටේ නිලධාරින් අවිශ්වාසද කියලා. තමුන්නාන්සේලා නිලධාරින් තළා පෙළා ඇතුළට දමලා, නිලධාරින් වැටෙනකොට-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. R.M. Ranjith Madduma Bandara, your time is up.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
අපි ආණ්ඩුවට කියනවා අවශ්‍ය කටයුතු වහාම කරන්න කියලා.

ඒ එක්කම ලෝක ආහාර සංවිධානය කියා තිබෙනවා මේ රටේ ජනතාවට බඩගින්නේ ඉන්න වෙයි කියලා. ආහාර සුරක්ෂිතතාව සම්බන්ධ ප්‍රශ්නයක් තිබෙනවා. ගොවිතැන් කරන ප්‍රදේශ තමයි වැඩියෙන්ම බලපෑමට ලක්වෙලා තිබෙන්නේ. ඒ නිසා අපි ආණ්ඩුවට කියනවා, ඒ සම්බන්ධව වහාම ක්‍රියාමාර්ග ගන්න කියලා. යට වෙච්ච කුඹුරුවලට, යට වෙච්ච කෘෂිකාර්මික වගා

[ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා]

බිම්වලට වෙච්ච හානියට මුදල් දෙන්න ක්‍රමයක් තවමත් හදලා නැහැ. ආණ්ඩුව මේ විධියට ඉබි ගමනෙන් ගියොත්, මේ ක්‍රමය අසාර්ථක වෙයි. ජනතාවට බඩගින්නේ ඉන්න වෙයි. ඒ විතරක් නොවෙයි, ආණ්ඩුවට පෙර සූදානමකුත් නැහැ ව්‍යසනයෙන් පස්සේ කටයුතු කරන ආකාරය පිළිබඳව. ඒ පිළිබඳව අපි කනගාටු වෙනවා. ඒ සම්බන්ධයෙන් ආණ්ඩුවට අපි චෝදනා කරන චිත්තියත් මතක් කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Thanura Dissanayake. You have 10 minutes.

[පූ.භා. 10.44]

**ගරු තනුර දිසානායක මහතා**
(மாண்புமிகு தனுர திசாநாயக்க)
(The Hon. Thanura Dissanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ව්‍යසනයට, මේ ස්වාභාවික විපතට මුහුණ දීම නිසා ජීවිත අහිමි වූ, ඒ වාගේම විවිධ රෝගාබාධවලට ලක් වූ සහ අතුරුදහන් වුණු ජනතාවට, ඒ අයගේ පවුල්වල අයට, ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ මහජන නියෝජිතයකු විධියට මාගේ කනගාටුව ප්‍රකාශ කරන්න මුලින්ම මේ අවස්ථාව යොදා ගන්නවා.

ඒ වාගේම තමයි, මේ ව්‍යසනය සිදු වූ මොහොතේ සිට ශ්‍රී ලාංකිකයන් විධියට සියලුම රජයේ ආයතනවල සේවකයන්, ආරක්ෂක අංශ ඇතුළුව ප්‍රජා දායකත්වය සහිතව සියලු දෙනාම එක්ව දැවැන්ත ක්‍රියාවලියක යෙදෙමින් ඉඳලා තමයි සති 3ක් විතර වෙනකොට මේ තත්ත්වයට අපේ රට පත් කර ගත්තේ. ඒ ක්‍රියාවලිය ඇතුළේ ජීවිත අහිමි වූ ලංකා විදුලිබල මණ්ඩලයේ සහෝදරයා වෙනුවෙන්, ශ්‍රී ලංකා නාවික හමුදාවේ සහෝදරවරු 5දෙනා වෙනුවෙන්, ගුවන් නියමු සහෝදරයා වෙනුවෙන් එම පවුල්වලට අයටත්, විවිධ අනතුරුවලට සහ ආබාධවලට ලක්වූ සියලුම රාජ්‍ය නිලධාරීන් ඇතුළු විවිධ ප්‍රදේශවලින් ස්වේච්ඡාවෙන් ඇවිල්ලා මේ ජනතාව වෙනුවෙන් උදව් කිරීමට පැමිණ විවිධ රෝගාබාධවලට ලක් වූ අපේ රටේ සියලුම ජනතාවටත් මගේ කනගාටුව සහ ශෝකය ප්‍රකාශ කරන්නට කැමැතියි. අපි රටක් විධියට, ජාතියක් විධියට දැවැන්තම ස්වභාවික ව්‍යසනයකට මුහුණ දුන්නා. එසේ මුහුණ දීලා දැන් වේගයෙන් ඒ තත්ත්වයන් යථා තත්ත්වයට පත් කර ගනිමින් ඊළඟ අදියරවලට ඇවිල්ලා තිබෙනවා. මේක ඉතාම සාමූහික ක්‍රියාවලියක්. එම නිසා ඒ සාමූහික ක්‍රියාවලියේ සිටින සියලු දෙනාටම මගේ ගෞරවනීය ස්තුතිය පළ කරනවා. ඒ වාගේම, රට යථා තත්ත්වයට පත් කිරීම සඳහා අපට ලොකු ගමනක් ඉදිරියට යන්න වෙනවා.

විපක්ෂයේ මන්ත්‍රීවරු මේ පාර්ලිමේන්තුවේ දිවා ආහාරය සඳහා වෙන් කර තිබෙන පැය භාගයක කාලයත් විවාද කිරීම සඳහා ඉල්ලා සිටිනවා මා දැක්කා. දිවා ආහාරය වෙනුවෙන් සභාවේ වැඩ කටයුතු විනාඩි 30කට අත්හිටුවන්නේ නැතිව එම විනාඩි 30ත් මේ සාකච්ඡාව වෙනුවෙන් අරගන්න කියලා ඔවුන් කියනවා. නමුත්, අපි අද දවසේ මේ schedule එක හදලා තිබෙන්නේ විපක්ෂයත් සමඟ කලින් කථාබහ කරලා එකඟතාවන් සහිතවයි. මේ මන්ත්‍රීවරු දන්නවා, මේ මන්ත්‍රීවරුන්ට ඕනෑම වෙලාවක එළියට ගිහිල්ලා, අවශ්‍ය නම් කෑම කාලා එන්නත් පුළුවන් කියලා. එතුමන්ලාට පාර්ලිමේන්තුවෙන් එළියට ගිහිල්ලාත් එන්න පුළුවන්. හැබැයි, මේ සේවකයන්ට, මේ කාර්ය මණ්ඩලයට එහෙම කරන්න හැකියාවක් නැහැ. අපි මුළු දවස පුරාම මේ විවාදය පැවැත්වුවොත් ඔවුන්ට දිවා ආහාරය සඳහා ඒ ලැබෙන පැය භාගයක විවේක කාලය ලැබෙන්නේත් නැහැ. අපිත් එක්ක එකට මේ පාර්ලිමේන්තුවේ ක්‍රියාවලිය ගෙනයෑම සඳහා දායක වන කාර්ය මණ්ඩලය ගැන මේ විපක්ෂයට සහකම්පනයක් නැද්ද කියලා මම අහන්න කැමැතියි. මොකද, අපි ඊයේ අවශ්‍ය තරම් වේලාව දුන්නා. ආණ්ඩුවක් විධියට අපි කල් තැබීමේ විවාදයක් ඉල්ලා සිටියා. එම නිසා ඕනෑ තරම් කථා කරන්න අවස්ථාව ලැබිලා තිබෙනවා. මාධ්‍යයට අදහස් දීලා තිබෙනවා, වාද විවාදවලට ඇවිල්ලා තිබෙනවා. විශේෂයෙන්ම මම මතක් කරන්න ඕනෑ, පරිවර්තකයින් සහ සංඥා භාෂා ශිල්පීන් ඉතාම සීමිත ප්‍රමාණයක් තමයි පාර්ලිමේන්තුවේ ඉන්නේ කියන කාරණය. මම දන්නා විධියට අද දවසේ එක සංඥා භාෂා නිලධාරිනියක් විතරයි ඉන්නේ. ඉතින් මුළු දවසම වැඩ කරන්න වුණොත් ඔයගොල්ලන් ඒ නිලධාරිනිය ගැන හිතන්නේ නැද්ද? විවේක කාලයක් විධියට දිවා ආහාරයට අඩුම පැය භාගයයි නේ, ඒ නිලධාරිනියට හම්බ වෙන්නේ. ඒ කාලය තුළ තමයි එතුමියටත් අවශ්‍ය කටයුතු කර ගන්න වෙන්නේ; කෑම ටිකක් කන්න හරි, washroom එකකට හරි යන්න ඒ කාලය තමයි තිබෙන්නේ. ඒ නිසා මේ රටත්, ජනතාවත් විපතට පත්වෙලා සිටියදී අපිත් එක්ක එකට වැඩ කරන මේ කාර්ය මණ්ඩලය ගැනත් අපි හිතන්න ඕනෑ. නිකම් බොරුවට පෙන්වන්න එන්න එපා, මිනිස්සු වෙනුවෙන් මේ පැය භාගයත් ගත්තා කියලා. මොකද, මහජන නියෝජිතයන්ට ඕනෑ තරම් අවස්ථාව තිබෙනවා මේ වෙනුවෙන් වැඩ කරන්න.

මේ වෙලාවේ ජනතාව බිමට ගිහිල්ලා වැඩ කරනවා. අපි මේ ව්‍යසනයට සෘජුවම මුහුණ දුන් මොහොතේ ඉඳලා ජනතාව බිමට ගිහිල්ලා වැඩ කරනවා. මේ මිනිස්සු අපේ රටේ ජනතාවත් එක්ක, රජයේ නිලධාරීන් එක්ක, ආරක්ෂක අංශ එක්ක එකට හැප්පෙමින්, ගැටෙමින් වැඩ කරපු මිනිස්සු.

Visit එකකට නුවර ගිය අයත් මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා. අපිට කියන්න තිබෙන්නේ මේකයි. අද වෙනකොටත් මේ බිමේ තත්ත්වය ගැන තවමත් මේ අයට කිසි දෙයක් තේරිලා නැහැ. විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරු කථා කරනකොට තේරෙනවා මේ බිමේ තත්ත්වය අද වෙනකොටත් තේරුම් අරගෙන නැහැ කියන එක. කට්ටිය කියනවා, ආණ්ඩුව තීන්දු තීරණ අරගෙන රුපියල් 25,000ක් දෙන්න සතියක් විතර ගියා ලු. ඉස්සෙල්ලා මතක තියා ගන්න ඕනෑ මධ්‍යම පළාතට අයත් මහනුවර දිස්ත්‍රික්කයට එන්න තිබෙන සියලු ප්‍රවේශ මාර්ග කැඩුණා, අභ්‍යන්තර ප්‍රවේශ මාර්ග කැඩුණා, ප්‍රාදේශීය ලේකම්වරුන්ට කථා කරන්න බැරි වුණා, සංඥා පද්ධති ඔක්කොම ක්‍රියා විරහිත වුණා, විදුලිබලය අකර්මණ්‍ය වුණා, අපේ ජල සම්පාදන පද්ධති 20න්, 18ක් අක්‍රිය වුණා කියන එක. මෙතුමන්ලා මේ ගරු සභාවේ ඉඳගෙන විහිළු කථා කියනවා. මොන විහිළුවක්ද මම දන්නේ නැහැ. තවමත් තේරෙන්නේ නැද්ද? අඩුම තරමේ ප්‍රවෘත්ති - news - බලලා, අර මිනිස්සුන්ට වෙලා තිබෙන විනාශය දැකලා තේරුම් ගන්න ඕනෑ. මොකද, අත්දැකීම් තිබෙන මිනිස්සු විධියට බිමට වෙලා තිබෙන විනාශය තේරුම් ගන්න ඕනෑ නේ. හැබැයි, අපි ආණ්ඩුවක් විධියට ඒ මොහොතේ මැදිහත්වීම සඳහා අවශ්‍ය තීන්දු තීරණ ඉතා වේගයෙන් ගත්තා.

මම නියෝජනය කරන දිස්ත්‍රික්කය ගත්තොත්, මට හොඳ අත්දැකීම් තිබෙනවා. අපේ නිලධාරීන් සහ ජනතාව ඉතා ඉවසීමෙන් කටයුතු කළා. ඇතැම් නිලධාරීන්ට තමන්ගේ ගෙදර හොයා ගන්නවත් නැහැ. එහෙම තිබියදී තමයි ඒ මිනිස්සු වැඩ කළේ. එහෙම වැඩ කරලා තමයි අද මේ තත්ත්වයට රට ගත්තේ. ඒක නිසා මේක මේ සරල කථාවක්, එහෙම නැත්නම් මේ ආණ්ඩුවට මඩ ගහන්න හෝ අහුවෙන අහුවෙන ඒවා උස්සන් යන්න පුළුවන් අවස්ථාවක් නොවෙයි. ඇත්තටම මම ඉතා කනගාටු වෙන කාරණාවක් තිබෙනවා. විපක්ෂයෙන් නුවර ආපු සමහර මිනිස්සුන්ගේ මුහුණ බලන්නවත් මට නම් මගේ ජීවිතේට

හිතෙන්නේ නැහැ. මොකද, ඒ තරම් මහ පහත් විධියට තමයි ඒ අය හැසිරුණේ. අපේ දිසාපතිතුමාගෙන් විවිධ විවිධ ප්‍රශ්න ඇහුවේ - interrogate කළේ - හරියට නිකම් ප්‍රශ්න අහන්න ආපු කට්ටිය වාගේ; ඒ වාගේ තමයි හිටියේ. ඒ වෙලාවේ ඒගොල්ලන් අහනවා, සුරක්ෂා කඳවුරු කීයක් තිබෙනවාද කියලා. සුරක්ෂා කඳවුරු තියා සන්නිවේදනය කරන්න ප්‍රාදේශීය ලේකම් කෙනෙක්ට දුරකථන සම්බන්ධතාවත් නැහැ. යුධ හමුදාව, විවිධ ජනතාව පයින් ගිහිල්ලා තමයි මහනුවර දිස්ත්‍රික්කයේ එහෙන් මෙහෙන් සන්නිවේදනය හදා ගත්තේ. ඒ නිසා භූමියේ තත්ත්වය ගැන දන්නේ නැතිව මෙතැනට ඇවිල්ලා විහිළු කථා කරන්න එපා කියලා විපක්ෂයේ මන්ත්‍රීවරුන්ට අපි කියන්න කැමැතියි. ඔක්කෝම මන්ත්‍රීවරු නොවෙන්න ඇති. හැබැයි, මොකක් හරි අවුලක් තිබෙන මන්ත්‍රීවරු ටිකක් ඉන්නවා. ඒගොල්ලන්ට මම මේක කියන්න කැමැතියි. මොකද, ඒගොල්ලන්ට ඒක කියා ගන්නම ඕනෑ.

මේ ව්‍යසනය එසේ මෙසේ ව්‍යසනයක් නොවෙයි, අතිදැවැන්ත ව්‍යසනයක්. සියලු පද්ධති අක්‍රිය වෙච්ච ව්‍යසනයක්. හැබැයි, ඉතා කෙටි කාලයක් ඇතුළත අපි මේ දේවල් වේගයෙන් යථා තත්ත්වයට ගෙනැල්ලා තිබෙනවා. තවමත් තිබෙනවා, බස් යන්න බැරි පාරවල්. තවමත් තිබෙනවා, ගල් අයින් කළ යුතු පාරවල්. තවමත් NBRI එකේ සහතිකය ගන්න තිබෙනවා. තවමත් ජනතාව දෙගිඩියාවෙන් ඉන්න තැන් තිබෙනවා. දැන් මධ්‍යම කඳුකරයට ආයෙත් වහිනවා. දැන් ජලාශ පිරිලා නේ තිබෙන්නේ. විපක්ෂය පැත්තේ ඉන්න මහලොකු ඉංජිනේරුවන් ටික කියන්නකෝ මොකක්ද දැන් කරන්න ඕනෑ කියලා. දැන් ජලාශ පිරිලා නේ ඔක්කෝම; ජලාශ සම්පූර්ණයෙන් පිරිලා තිබෙන්නේ. දැන් මොකක්ද කරන්න ඕනෑ. කියන්නකෝ, උපදෙස් ටික. විශාල වැස්සක් ඇවිල්ලා තිබුණේ. අදත් ජලාශ ටික පිරිලා තිබෙන්නේ. දැන් වාන් දානවා. මොකක්ද, කරන්න ඕනෑ එතකොට? අපි මේ වෙලාවේ ස්වභාවධර්මයත් එක්කයි සටන් කරන්නේ. නාය යාම් නැවතත් සක්‍රිය වෙලා තිබෙනවා. යුද හමුදාව ඇතුළු ත්‍රිවිධ හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය සහ ස්වේච්ඡාවෙන් ආපු ජනතාව තමයි මේ වැඩ ඔක්කොම කළේ. ගාල්ල, මාතර ඇතුළු විවිධ ප්‍රදේශවලින් ස්වේච්ඡාවෙන් ජනතාව ආවා. විශේෂයෙන් මධ්‍යම පළාතේ සමහර දිස්ත්‍රික්කවල සක්‍රිය තත්ත්වයන් ඇතුළේ ඒගොල්ලන් වැඩ කළා කියලා මම දන්නවා. අද වැස්ස පැච්චාට නාය යාම් අක්‍රිය වෙන්නේ නැහැ. දවස් ගණනක් වතුර ගලාගෙන ආවා. ගල් වැටෙයි ද කියලා ෂුවර් නැහැ. අඛණ්ඩව ගස් වැටෙනවා. එහෙම තිබෙද්දී තමයි ඒ මිනිස්සු වැඩ කළේ. එහෙම වැඩ කරලා තමයි අද තත්ත්වයට මේක ගෙනාවේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මහනුවර දිස්ත්‍රික්කයෙත් 60වතාවකට වඩා ආපදා කළමනාකරණ රැස්වීම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල පවත්වා තිබෙනවා. ඒ හැම අවස්ථාවකම මම ඒගොල්ලන්ගේ ගති ලක්ෂණයක් දැක්කා. ඒගොල්ලන්ගේ ඡන්ද දායකයන් සිටින ප්‍රදේශ ගැන විතරයි ප්‍රශ්න ඇහුවේ. සමස්තය ගැන සහකම්පනයක් නැහැ. ඒගොල්ලන්ගේ ඡන්ද දායකයන් සිටින පැතිවල තිබෙන ප්‍රශ්න ගැන තමයි ඇහුවේ. අවස්ථා 4කදී විතර ඒගොල්ලන් මුණ ගැසුණා. ජනාධිපතිතුමා ආපු එකට ආවා. ඉතුරු ටිකට ආවා. මම දන්නේ නැහැ, අනෙක් ඒවායේ නම් දැක්කේ නැහැ. ජනතාව එක්ක එකතු වෙලා මොනවා හරි කරන්න ඇති. හැබැයි, අපි දැකපු විශේෂ ගති ලක්ෂණයක් තමයි, අපිත් ඉන්න සභාවලදී විපක්ෂයේ මන්ත්‍රීවරු ප්‍රශ්න ඇහුවේ තමන්ගේ ඡන්ද දායක බලප්‍රදේශ ගැන විතරයි කියන එක. අනෙක් ජනතාව ගැන ඒගොල්ලන්ට කිසි හැඟීමක් නැහැ.

මේ තත්ත්වයට මුහුණ දුන් අපි වේගයෙන් ගොඩ නැඟෙන්න ඕනෑ. 2026 දෙසැම්බර් 31 දක්වා අපි මේ අය වැයෙන් වෙන් කර ගත්ත මුදල් යොදවමින්, ඒ වාගේම ජන ජීවිතය යථා තත්ත්වයට පත් කිරීම සඳහා - ආපදාවට පත් වූ ජනතාව එයින් නඟා සිටුවීමට, අවතැන් වෙලා ඉන්න ජනතාව රැඳී සිටින සුරක්ෂා මධ්‍යස්ථානවල කටයුතු සඳහා - වෙන් කරපු මුදල් භාවිත කරමින් ඒ ජන ජීවිත අපට යම් තලයකට ගෙනෙන්න පුළුවන්. හැබැයි අපි දන්නවා, යටිතල පහසුකම් වාගේම අනෙකුත් පද්ධති සක්‍රිය කරන්නත් තිබෙන බව.

අපි ගිය අවුරුද්දේ ඉඳන් හොඳ මූල්‍ය විනයක් ගොඩ නඟාගෙන ආවා. ප්‍රාථමික ගිණුමේ විශාල අතිරික්තයක් අපි එකතු කළා. ඒ නිසා අද ණය ගන්නේ නැතිව, පොලී අනුපාත වෙනස් කරන්නේ නැතිව, ඒ වාගේම අපි කරගෙන ආපු වැඩ අඩාළ කරගන්නේ නැතිව, ලබන අවුරුද්දට අපි සැලසුම් කරපු එකම ක්‍රියාවලියක්වත් අඩාළ කරගන්නේ නැතිව, මේ ව්‍යසනය නිසා අමතරව පැටවුණු බර සඳහා රුපියල් බිලියන 500ක් වෙන් කරගෙන මේ රට තිබුණාට වඩා හොඳට හදන්න අපි කටයුතු කරනවා. ඒක කරන්න අපට ශක්තියක් තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය අවුරුද්ද පුරාම මේ ගරු සභාවේ සිටින විපක්ෂයේ මන්ත්‍රීතුමන්ලා රාජ්‍ය නිලධාරින් ආණ්ඩුවත් එක්ක වැඩ කරන්නේ නැහැ කියලා මොකක්ද මන්දා මන්තරයක් මතුර මතුරා හිටියා. රාජ්‍ය නිලධාරින් එක්ක නොවෙයි ද දන්නේ නැහැ අපි වැඩ කළේ. මම නම් අපට වඩා ගෞරවය දෙන්නේ මේ රටේ රාජ්‍ය නිලධාරින්ට, ත්‍රිවිධ හමුදාවට, ඒ වාගේම මේ රටේ සහකම්පනයක් තිබෙන මිනිස්සුන්ට. ඒ මිනිස්සු ටික එකතු වෙලා තමයි මේ රට මේ තත්ත්වයට ගෙනාවේ. ආණ්ඩුවක් විධියට අපි අවශ්‍ය ශක්තිය, ධෛර්යය, ඒගොල්ලන්ට වැඩ කරන්න ඕනෑ කරන ඉඩ හසර ඔක්කොම ලබා දීලා තිබෙනවා. අපි එක භාණ්ඩයක්වත් බෙදන්න නම් ගියේ නැහැ.

මම දැක්කා මෙතැනට ඇවිල්ලා ප්‍රශ්න අහපු මන්ත්‍රීවරයෙක් මහනුවරට ගිහිල්ලා මිනිස්සුන්ට රෙදි වීසි කරනවා. ඒ මිනිස්සු දැන් අනාථ වෙලා සිටියත්, කලින් හොඳට ජීවත් වුණු මිනිස්සු. තමන්ට පාලනය කරන්න බැරි වුණු ස්වාභාවික ව්‍යසනයකට ඔවුන් මුහුණ දීලා ඉන්නවා. සුජීව සේනසිංහ මන්ත්‍රීවරයා මහනුවරට ඇවිල්ලා රෙදි වීසි කළා. රෙදි වීසි කරන්න නම් මහනුවර පැත්ත පළාතට එන්න එපා. මහනුවර එහෙම මිනිස්සු නැහැ. ඔබතුමන්ලා ඔබතුමන්ලාගේ ප්‍රදේශවලට ගිහිල්ලා ඕනෑ කෙහෙල් මලක් කර ගන්න. ඕනෑ නම් සීල් ගහපු කෙසෙල් ගෙඩි බෙදන්න. රෙදි වීසි කරන්න නම් මහනුවරට එන්න එපා කියලා මම එතුමාට කියන්න කැමැතියි.

අපේ රටේ ජනතාව අභිමානයෙන් ජීවත් වන ජනතාවක්. ඒ ජනතාවට තවත් අභිමානයෙන් ජීවත් වෙන්න පුළුවන් විධියට අපි මේ රට ගොඩනඟනවා. මේ සියලුදෙනා එක්ක අපි මේ රට හොඳින් හදනවා. මට තේරෙන විධියට නම්, මෙම ස්වාභාවික ව්‍යසනයෙන් වැඩිම විපතකට පත්වෙලා තිබෙන්නේ මේ රටේ විපක්ෂය. එම නිසා මම ඉතාම කනගාටුවෙන් සහ පිළිකුලෙන් යුතුව විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන්ගේ කටයුතු ප්‍රතික්ෂේප කරනවා. මෙම රුපියල් බිලියන 500, 2026 වසර සඳහා අපි අය වැයෙන් වෙන් කළ මුදලත් එක්ක එකතු කරගෙන මේ රට නැවත ගොඩනඟනවා; යථා තත්ත්වයට පත් කරනවා කියන කාරණය අපි කියන්න කැමැතියි. ඒ වෙනුවෙන් මේ රටේ ජනතාවත්, මේ රටේ රාජ්‍ය යාන්ත්‍රණයත් එක්ක එකතුවෙලා කැපවීමෙන් වැඩ කරන්න අපි සියලුදෙනාම ලැහැස්තියි.

මට කථා කරන්න අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. (Dr.) Pathmanathan Sathiyalingam. You have eight minutes.

[மு.ப. 10.54]

**ගරු (වෛද්‍ය) පත්මනාදන් සත්‍යලිංගම් මහතා**
(மாண்புமிகு (வைத்தியர்) பத்மநாதன் சத்தியலிங்கம்)
(The Hon. (Dr.) Pathmanathan Sathiyalingam)

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த நாட்டிலே ஏற்பட்ட பேர் அனர்த்தத்திலே உயிர் நீத்த சகோதரர்களுக்கு எனது அஞ்சலியை நான் செலுத்திக் கொள்கிறேன். அதேபோல, இந்தப் பேர் அனர்த்தத்திலே தங்களுடைய குடும்ப உறுப்பினர்களை இழந்த உறவுகளுடன் சேர்ந்து நானும் துயர் பகிர்கின்றேன். இந்தப் பேரழிவு என்பது இலங்கைக்கு முதற்தடவையாக ஏற்பட்டது அல்ல. கடந்த காலத்தில் இந்த நாட்டிலே சூறாவளி ஏற்பட்டிருக்கிறது; வறட்சிப் பேரழிவுகள் ஏற்பட்டிருக்கின்றன; கொள்ளை நோய்கள் பரவியிருக்கின்றன; மண் சரிவுகள் மற்றும் வெள்ள அனர்த்தங்கள் ஏற்பட்டிருக்கின்றன. 2004ஆம் ஆண்டு சுனாமி ஏற்பட்டது. அந்தச் சுனாமியால் எங்களுடைய நாட்டில் கிட்டத்தட்ட 30,000 பேர் இறந்தார்கள். ஆகவே, பேரிடர் என்பது இந்த நாட்டுக்கு இப்போது முதற்தடவையாக ஏற்படவில்லை. இந்தப் பேரிடர்களாலே மக்கள் காயப்படுகிறார்கள்; இறக்கிறார்கள். அவர்களுடைய வாழ்வாதாரங்கள் இழக்கப்படுகின்றன; வீடுகள் மற்றும் உட்கட்டுமானங்கள் அழிவடைகின்றன.

எங்களுடைய வன்னித் தேர்தல் தொகுதியை எடுத்துக்கொண்டால், எங்களுடைய ஜீவனோபாயம் விவசாயம் மற்றும் விலங்கு வேளாண்மையாகக் காணப்படுகின்றது. மன்னார் மாவட்டத்திலே கிட்டத்தட்ட 15,000இற்கும் மேற்பட்ட கால்நடைகள் - பசு மாடுகள் - இறந்திருக்கின்றன; 30,000இற்கும் மேற்பட்ட கோழிகள் இறந்திருக்கின்றன; கிட்டத்தட்ட 10,000 ஆடுகள் இறந்திருக்கின்றன. எங்களுடைய வவுனியா மற்றும் முல்லைத்தீவு மாவட்டங்களிலும் இதே நிலைமை! இந்த 3 மாவட்டங்களினதும் ஒவ்வொரு மாவட்டத்திலும் 10,000 ஏக்கருக்கும் மேற்பட்ட வயல் நிலங்கள் முற்றாக அழிந்திருக்கின்றன; வீடுகள் முற்றாக அழிந்திருக்கின்றன; உட்கட்டுமானங்கள் அழிந்திருக்கின்றன. இது எங்களுடைய வன்னித் தேர்தல் தொகுதிக்கு மாத்திரமல்ல, இலங்கை முழுவதும் இப்படியான ஒரு பேரழிவு நடந்திருக்கிறது.

அண்மைய உலக வங்கியின் தரவுகளின்படி, ஒவ்வொரு வருடமும் குறைந்தது கிட்டத்தட்ட 380 மில்லியன் டொலர் பெறுமதியான அழிவு இந்த நாட்டிலே பேரிடர்களால் ஏற்படுகின்றது. வெள்ளத்தால் மாத்திரம் ஒவ்வொரு வருடமும் 240 மில்லியன் டொலர் அழிவு ஏற்படுகின்றது. எங்களுடைய நாட்டைப் பொறுத்தவரையில், இந்த அழிவுகளுக்காகப் பாரிய தொகைப் பணம் செலவிடப்படுகிறது. அப்படியிருந்தும், அரசாங்கம் நல்ல பல திட்டங்களை பாதிக்கப்பட்ட மக்களுக்கு வழங்கியிருக்கிறது. அதற்காக அரசாங்கத்தைப் பாராட்டுகிறோம். இந்த அரசாங்கத்துடன் சேர்ந்து வேலைசெய்வதற்கு நாங்களும் தயாராக இருக்கிறோம். ஆனால், அந்த இழப்பீடுகளை வழங்குவதிலே பாரிய குறைபாடுகள் காணப்படுவதையும் இந்த இடத்திலே சுட்டிக்காட்ட விரும்புகின்றேன்.

இழப்பீடுகள் தொடர்பாகப் பதிவுகளை மேற்கொள்ளு கின்ற அல்லது அதனை ஒழுங்கு செய்கின்ற அலுவலர்கள் பற்றாக்குறை இதற்கு முக்கியமான காரணமாக இருக்கின்றது. இழப்பீடு வழங்கலில் பாரிய அரசியல் தலையீடும் காணப்படுகின்றது. 'பிரஜா சக்தி' என்ற திட்டத்தினூடாக முழுமையான அரசியல் மயப்படுத்தப்பட்ட விடயங்கள் எங்களுடைய மாவட்டங்களில் நடைபெறுகின்றன. அங்கு நடைபெறுகின்ற இவ்வாறான பல சம்பவங்களைச் சொல்லலாம். இந்தத் துயரமான நேரத்தில், அவற்றை நான் ஒரு குற்றமாக முன்வைக்க விரும்பவில்லை.

எங்களுடைய நாடு இவ்வாறு பல பேரிடர்களைச் சந்தித்திருக்கின்றது. 2004ஆம் ஆண்டு ஏற்பட்ட சுனாமிக்குப் பின்னர், disaster management சம்பந்தமாக 2005ஆம் ஆண்டு 13ஆம் இலக்க இலங்கை பேரழிவு செயலாட்சிச் சட்டம் கொண்டு வரப்பட்டது. அந்தச் சட்டத்தின் பிரகாரம், National Council for Disaster Management மூன்று மாதங்களுக்கு ஒரு தடவை கூட வேண்டும். அப்படியென்றால், இதுவரையில் 80 தடவை இந்த National Council for Disaster Management கூடியிருக்க வேண்டும். ஆனால், 2018ஆம் ஆண்டு வரையான 13 வருடங்களில் 12 தடவைதான் கூடியிருக்கின்றது. அதாவது, வருடத்திற்கு ஒருமுறை கூடியிருக்கின்றது. 2018ஆம் ஆண்டுக்குப் பிறகு, உங்களுடைய அரசாங்க காலத்தில், 7 ஆண்டுகளுக்குப் பிறகு, National Council for Disaster Management கடந்த 8ஆம் மாதம், மாண்புமிகு சனாதிபதி அவர்களது தலைமையில் கூடியது. இலங்கை பேரழிவு செயலாட்சிச் சட்டத்தின் பிரகாரம் மூன்று மாதத்துக்கு ஒரு தடவை National Council for Disaster Management கூட வேண்டும். பேரிடர் ஏற்பட்டதோ, இல்லையோ 11ஆம் மாதம் National Council for Disaster Management கூடியிருக்க வேண்டும். ஆனால், அப்படி நடைபெறவில்லை.

நான் சொல்ல வருகின்ற விடயம் என்னவென்றால், பேரிடர் ஏற்பட்டதோ ஏற்படவில்லையோ, mitigation, preparedness, response அதற்குப் பின்னர் recovery ஆகிய இந்த நான்கு விடயத்திலும் நாங்கள் தயார் நிலையில் இருந்திருக்க வேண்டும். Mitigation என்பது அபாயநிலையைக் குறைத்தல் ஆகும். இந்தப் பேரிடரில்கூட, அதற்குரிய வழியைச் செய்திருக்கின்றோமா? இல்லை. மலைநாட்டில் ஒவ்வொரு முறையும் மண்சரிவு ஏற்படுகின்றது; வெள்ள அனர்த்தம் ஏற்படுகின்றது. இடம்பெயர்ந்து சென்ற மக்களை வெள்ளம் வடிந்து, நிலங்கள் காய்ந்ததன் பிற்பாடு அதே இடத்தில் மீண்டும் குடியேற்றுவார்கள். இன்றைக்கு அதனுடைய பலனை நாங்கள் அனுபவித்து வருகின்றோம். இன்று எங்களுடைய மக்கள், உறவுகள் என எத்தனையோ பேர் இறந்திருக்கின்றார்கள். இந்த முறை ஏற்பட்ட பேரிடரின்போதுகூட தயார் நிலை - preparedness - அறவே இருக்கவில்லை அல்லது மிகவும் குறைந்த நிலையில் இருந்தது. நாங்கள் திட்டமிடல் செய்யவில்லை. பயிற்சிகளை வழங்குகின்றோமா என்றால் அதுவும் இல்லை.

Disaster Management Centreஐப் பாருங்கள்! அவர்கள் செயற்பட முடியாத நிலையில் இருக்கின்றார்கள். அங்கு கடுமையான ஊழியர் பற்றாக்குறை இருக்கின்றது. அங்குள்ள வெற்றிடங்கள் நிரப்பப்படவில்லை. ஒவ்வொரு மாகாணத்திலும் Deputy Director at Disaster Management Centre இருக்க வேண்டும். எந்த மாகாணத்தில் இருக்கின்றது? ஒரு மாகாணத்திலும் இல்லை! ஒவ்வொரு பிரதேச செயலக பிரிவுகளிலும் ஒரு Disaster Management Officer - DMO - இருக்க வேண்டும். அப்படி நியமிக்கப்படவில்லை; ஒரு மாவட்டத்துக்கு ஒருவர்தான் இருக்கின்றார். கடந்த திங்கட்கிழமை நடைபெற்ற disaster management கூட்டத்தின் போது பல நல்ல விடயங்கள் முன்மொழியப்பட்டது. இந்த 2005ஆம் ஆண்டின் 13ஆம் இலக்க சட்டத்தை தற்போதைய காலத்துக்கேற்ப திருத்தியமைப்பதற்கான முன்மொழிவு முன்வைக்கப்பட்டுள்ளது. அது நல்ல விஷயம். இந்தப் பேரிடருக்கு முக்கியமான காரணம், இதற்கு முன்னரிருந்த அரசாங்கங்கள்தான். அந்த விடயத்தில் சரியான திட்டமிடல்

களைச் செய்யாததால் தற்போதைய அரசாங்கமும் அதில் சிறிய பங்கை வகிக்கின்றது. இந்த பேரழிவை தடுக்கக்கூடிய mitigation process, preparedness, response அதற்குப் பின்னர் recovery ஆகிய இந்த நான்கு விடயங்களுக்குமான உரிய வழிமுறைகளைக் கையாண்டு, அதற்கு அரசாங்கம் தயார் நிலையில் இல்லையென்று சொன்னால், இவ்வாறான பேரழிவுகள் தொடர்ந்து நடைபெறத்தான் போகின்றன.

ஒவ்வொரு வருடமும் நடைபெறுகின்ற பேரழிவினால், என்னுடைய மாவட்டத்திலுள்ள சில கிராமங்கள் திரும்பத் திரும்ப பேரிழிவுக்குள்ளாகின்றன. வவுனியாவில் கந்தசாமி கிராமத்தை இதற்கு உதாரணமாகச் சொல்லலாம். இன்னும் பல கிராமங்களும் இருக்கின்றன. முல்லைத்தீவில், மன்னாரில் அப்படியான கிராமங்கள் இருக்கின்றன. தயவுசெய்து அங்குள்ள மக்களை மீண்டும் அதே இடத்தில் குடியமர்த்த வேண்டாம். பொருத்தமான இடத்தை அடையாளங்கண்டு, அவர்களை relocate பண்ண வேண்டும். அதாவது, மீண்டும் பாதிப்புகளுக்கு உட்படாத வகையில் அவர்களை மீள்குடியேற்றுவதற்கான நடவடிக்கைகளைச் செய்ய வேண்டுமெனக் கேட்டு, இந்தச் சந்தர்ப்பத்துக்கு நன்றிகூறி, விடை பெறுகின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Ananda Wijepala. You have 11 minutes.

[පූ.භා. 11.03]

**ගරු ආනන්ද විජේපාල මහතා (මහජන ආරක්ෂක සහ පාර්ලිමේන්තු කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு ஆனந்த விஜேபால - பொதுமக்கள் பாதுகாப்பு மற்றும் பாராளுமன்ற அலுவல்கள் அமைச்சர்)
(The Hon. Ananda Wijepala - Minister of Public Security and Parliamentary Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම පළමුවෙන්ම මේ ව්‍යසන තත්ත්වය නිසා, නැත්නම් මේ ආපදා තත්ත්වය හේතුවෙන් මිය ගිය අය වෙනුවෙන් එම පවුල් වෙත ශෝකය ප්‍රකාශ කර සිටිනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, විශේෂයෙන්ම කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව මෙම සුළි කුණාටු තත්ත්වය පිළිබඳව අනතුරු හැඟවූ මොහොතේ සිටම රජයක් හැටියට අපි ගත යුතු සියලු ක්‍රියාමාර්ග අරගෙන තිබෙනවා. සමහර මන්ත්‍රීවරුන් මේ සභාවේදී මේ සම්බන්ධව වැරදි අදහස් ප්‍රකාශ කළා. උදාහරණයක් හැටියට මට කුරුණෑගල දිස්ත්‍රික්කය පිළිබඳව කියන්න පුළුවන්. මෙම ව්‍යසන තත්ත්වය පිළිබඳව දැනුවත් වූ වහාම අපි අවස්ථා තුනකදී ශබ්ද විකාශන යන්ත්‍ර යොදාගෙන දැඳුරු ඔය ආශ්‍රිතව සිටි ජනතාව ඉවත් කරන්න කටයුතු කළා. පොලීසියත් අපට වාර්තා කරලා තිබෙනවා, මේ අවස්ථාවේදී ඔවුන් ක්‍රියාත්මක වූ ආකාරය පිළිබඳව. පොලීසිය විතරක් නොවෙයි, වාරිමාර්ග දෙපාර්තමේන්තුව ඇතුළු ආපදා කළමනාකරණ ක්ෂේත්‍රයට අදාළ සියලු ආයතන ඒ පිළිබඳව තීන්දු තීරණ අරන් තිබෙනවා. මහා වාරි ව්‍යාපෘති යටතේ තිබෙන සියලු ජලාශවලට එකතු වන ජලය කළමනාකරණය කරන්න ඔවුන් පියවර අරගෙන තිබෙනවා. ඒ පිළිබඳව ඕනෑම කෙනෙකුට පරීක්ෂා කර බලන්න පුළුවන්. ඒ විතරක් නොවෙයි. ත්‍රිවිධ හමුදාව සහ පොලීසියත් මේ සම්බන්ධව පූර්ව ක්‍රියාමාර්ග අරන් තිබෙනවා.

මෙම ව්‍යසනය ඇති වුණාට පස්සේ නොවැම්බර් මාසයේ 27වැනි දා ගරු ජනාධිපතිතුමා මේ පාර්ලිමේන්තුවට ඇවිල්ලා පක්ෂ විපක්ෂ මන්ත්‍රීවරු සම්බන්ධ කරගෙන රැස්වීමක් පැවැත්වූවා. එහිදී එම කාරණය පිළිබඳව මන්ත්‍රීවරු දැනුවත් කළා. ඒ සම්බන්ධයෙන් ගත යුතු ක්‍රියාමාර්ග පිළිබඳව සාකච්ඡා කළා. ගරු විපක්ෂ නායකතුමාත් ඒ රැස්වීමට සම්බන්ධ වෙලා හිටියා. ඒ නිසා විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු කරන සමහර ප්‍රකාශ ඇත්තටම ව්‍යාජයි. එතුමන්ලා බොරු ප්‍රචාර රටට අරගෙන එනවා. මේ ව්‍යසනය හමුවේ රජයට උදවු කරනවා කියමින් ව්‍යාජ ප්‍රකාශ රට පුරාම පැතිරවීම තමයි එතුමන්ලා කරන්නේ. ඊට අමතරව මේ ගරු සභාවට ඇවිල්ලා මේ කාරණය එතුමන්ලා නැවත නැවතත් කියනවා.

මම ඒ සඳහා උදාහරණයක් කියන්නම්. ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා මේ ගරු සභාවේදී කථා කරනකොට කිව්වා, චක්‍රලේඛ නිකුත් කර තිබෙන්නේ 05වැනි දාය කියලා. චක්‍රලේඛ නිකුත් කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, 29වැනි දා. චක්‍රලේඛ 2ක් නිකුත් වෙනවා. ආරක්ෂක ලේකම් හරහා එක චක්‍රලේඛයක් නිකුත් වෙනවා. අනෙක් චක්‍රලේඛය ජාතික අය වැය දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්වරයා නිකුත් කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ආපදාවක් සිදු වුණාම ඉස්සෙල්ලාම රුපියල් 25,000 ගෙවීම නොවෙයි කරන්නේ, ඒ අය සඳහා පිසූ ආහාර ලබා දීමයි.

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)
Sir, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
What is your point of Order, Hon. Ranjith Madduma Bandara?

**ගරු ආර්.එම්. රංජිත් මද්දුම බණ්ඩාර මහතා**
(மாண்புமிகு ஆர்.எம். ரஞ்ஜித் மத்தும பண்டார)
(The Hon. R.M. Ranjith Madduma Bandara)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ මහජන ආරක්ෂක ඇමතිතුමා මගේ නම කිව්වා. ගරු ඇමතිතුමනි, මම කිව්වේ මෙකයි. ජනාධිපතිතුමා දෙසැම්බර් මාසයේ 05වැනි දා පාර්ලිමේන්තුවට ඇවිල්ලා ප්‍රකාශයක් කළා, මේ, මේ දීමනා දෙනවා කියලා. ඒ සම්බන්ධ චක්‍රලේඛය නිකුත් කරන්නේ දෙසැම්බර් මාසයේ 14වැනි දා. ඒ කියන්නේ, දවස් 9කට පස්සේ. "මේකද තමුන්නාන්සේලාගේ කාර්යක්ෂමතාව?" කියායි මම ඇහුවේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ananda Wijepala, you may proceed.

**ගරු ආනන්ද විජේපාල මහතා**
(மாண்புமிகு ஆனந்த விஜேபால)
(The Hon. Ananda Wijepala)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ස්වාභාවික ආපදාවක් හෝ මිනිසුන් විසින් කරන ආපදාවක් වැනි යම් ආපදාවක් සිද්ධ වුණාට පසුව ඒ ආපදාව සම්බන්ධයෙන් ක්‍රියා කරන ආකාරයක් තිබෙනවා. ඒ පිළිබඳ විෂයයන් තිබෙනවා. ආපදා කළමනාකරණය තිබෙනවා. යම් ආපදාවක් සිද්ධ වුණාම, ආපදා කළමනාකරණය අනුව ඉස්සෙල්ලාම අවශ්‍ය වන්නේ ඒ පිරිස රැක බලා ගැනීම, ඔවුන්ට සුදුසු ස්ථාන තෝරා ගැනීම, සුරක්ෂිත ස්ථානවලට ඔවුන්ව

[ගරු ආනන්ද විජේපාල මහතා]

ස්ථානගත කිරීමයි. දෙවැනි කාරණය තමයි, ඔවුන්ට පිසූ ආහාර ලබා දීම. තුන්වැනි කාරණය, වියළි සලාක ලබා දීම. මේ සම්බන්ධ චක්‍රලේඛ 29වැනි දා නිකුත් වුණා. චක්‍රලේඛ 2ක් නිකුත් වුණා. අපි රජයක් හැටියට ගන්න පුළුවන් සියලු ක්‍රියාමාර්ග ඒ මොහොතේදීම අරගෙන තිබෙනවා. ජනාධිපතිතුමා සෘජුවම විෂය භාර ඇමතිවරයා හැටියට ඒ සඳහා මැදිහත් වෙලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, ආරම්භයේදීම අපට කරන්න තිබුණේ ගංවතුරෙන් සහ නාය යාමෙන් කොටු වූ පිරිස් මුදා ගැනීමයි. හෙලිකොප්ටර් යානා යොදා මුදා ගැනීම් විශාල වශයෙන් කළා. ඊට අමතරව ඒ පිරිස් මුදා ගැනීමට රජයේ බෝට්ටු යොදවා තිබුණා. ඒවා ප්‍රමාණවත් නොවන නිසා ධීවර බෝට්ටු, පෞද්ගලික බෝට්ටු විශාල ප්‍රමාණයක් යොදවා මුදා ගැනීම් කටයුතු නිරන්තරයෙන් සිද්ධ කළා. ඒ සඳහා මහජන නියෝජිතයින් වාගේම ත්‍රිවිධ හමුදාව, පොලිසිය, ග්‍රාම නිලධාරිවරයාගේ ඉඳලා ලේකම්වරයා දක්වා සියලු අංශවල රාජ්‍ය නිලධාරින් කැපවීමෙන් කටයුතු කළා. මම මේක අවස්ථාවක් කර ගන්නවා, ඒ සියලු නිලධාරින්ටත් ස්තුතිය පළ කරන්න.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට පෙර කථා කළ අපේ මන්ත්‍රීතුමා කිව්ව කාරණය නිවැරදියි. ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාව මේ කථා කරන මහත්වරුන්ගේ ආණ්ඩු කාලයේ අවුරුදු හතකට රැස් කරලා තිබුණේ නැහැ. ගරු ජනාධිපතිතුමා පසුගිය අගෝස්තු මාසයේ මේ සභාව රැස් කරලා 2005 අංක 13 දරන ශ්‍රී ලංකා ව්‍යසන කළමනාකරණ පනතේ අඩුපාඩු සංශෝධනය කරන්න තීන්දුව අරගෙනයි තිබුණේ. එතුමා නිකම් හිටියේ නැහැ. ආපදාවක් සඳහා සූදානම් වීම සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සකස් කරමින් හිටියා. ඒ සඳහා අවශ්‍ය ක්‍රියාමාර්ග සහ තීරණ අරගෙන තිබුණා වාගේම නිලධාරින්ට උපදෙස් ලබා දීලා තිබුණා. අවුරුදු 7ක් රැස් නොවුණු ව්‍යසන කළමනාකරණ සඳහා වූ ජාතික සභාව අගෝස්තු මාසයේ රැස් වෙලා තිබුණා. ඊට අමතරව මේ ව්‍යසනයෙන් පසුව පසුගිය 15වැනි දා සියලු දෙනා එකතු වෙලා තීන්දු තීරණ අරගෙන තිබෙනවා. විපක්ෂ නායකතුමාත් එදා ඒ සඳහා පැමිණ හිටියා.

මේ ව්‍යසනය ගැන කථා කරනකොට මම කියන්න කැමතියි, අපට දැනට කරන්න තිබෙන්නේ මේ ව්‍යසනයෙන් හානියට පත් ජනතාවට සහන සැලසීම සහ මේ ව්‍යසනය හේතුවෙන් අහිමි වූ යටිතල පහසුකම් නැවත ගොඩනැඟීම බව. ප්‍රධාන කාරණා තුනක් කෙරෙහි රජය අවධානය යොමු කරලා තිබෙනවා. එක කාරණයක් තමයි, යටිතල පහසුකම් සංවර්ධනය කිරීම. පාලම්, පාරවල්, බෝක්කු, වාරිමාර්ග පද්ධති මේ ව්‍යසනයෙන් විශාල වශයෙන් හානියට පත් වෙලා තිබෙනවා. ඒ සියල්ල පිළිසකර කිරීම සඳහා අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග දිස්ත්‍රික්ක සහ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මට්ටමින් මේ වෙනකොට අරගෙන තිබෙනවා. ඒ සඳහා මුදල් යොදවා තිබෙනවා. රාජ්‍ය ආයතනවල සෘජු මැදිහත් වීමෙන් ඒවා නැවත ඉදි කෙරෙමින් පවතිනවා. මම හිතන විධියට ලංකාවේ විතරක් නොවෙයි, ජාත්‍යන්තරයේත් පැසසුමට ලක් වන ආකාරයෙන් යටිතල පහසුකම් සැපයීම සම්බන්ධයෙන් කටයුතු කරලා තිබෙනවා. මාර්ග කිහිපයක් හැර සියලු ප්‍රවේශ මාර්ග මේ වෙනකොට තාවකාලිකව සකස් කරලා, ගමනාගමන පහසුකම් සඳහා අවශ්‍ය පියවර අරගෙන තිබෙනවා.

ඊළඟ එක තමයි, පෞද්ගලික දේපළ පිළිබඳ කාරණාව. විශේෂයෙන් නිවාස පිළිසකර කරගැනීම අවශ්‍යයි. මේ වෙනකොට පූර්ණ වශයෙන් විනාශ වූ නිවාස පිළිබඳව සහ අර්ධ වශයෙන් විනාශ වූ නිවාස පිළිබඳව සංඛ්‍යාලේඛන, දත්ත එකතු කරලා තිබෙනවා. එම නිසා ඒ සම්බන්ධයෙන් කටයුතු කිරීම අවශ්‍යයි. ඊට අමතරව පවුල් 610,000ක්, එහෙම නැත්නම් ලක්ෂ 22ක් වූ ජනතාව මේ ආපදාවේ බලපෑමට ලක් වුණා. පවුල් 610,000ක පුද්ගලයින් ලක්ෂ 22ක් වෙනුවෙන් සුරක්ෂා මධ්‍යස්ථාන 1,200 ගණනක් තිබුණා. නමුත්, අද වනකොට තිබෙන්නේ සුරක්ෂා මධ්‍යස්ථාන 709යි. ඒවායේ පවුල් 25,976ක පුද්ගලයින් 80,678යි ඉන්නේ. මේ වෙනකොටත් පුද්ගලයින් විශාල ප්‍රමාණයක් ආපසු නිවෙස් කරා ගිහිල්ලා තිබෙනවා. ඒ නිවෙස් පිරිසිදු කර ගැනීම හෝ මූළුතැන්ගෙයි උපකරණ ලබා ගැනීම සඳහා රුපියල් 25,000ක මුදලක් ලබා දෙන්න අපි අවශ්‍ය පියවර ගත්තා. ඒ සඳහා රුපියල් බිලියන 17.6ක් මේ වෙනකොට වෙන් කරලා තිබෙනවා, දිස්ත්‍රික් ලේකම්වරුන්ට සහ ප්‍රාදේශීය ලේකම්වරුන්ට. මේ වෙනකොට ඒ මුදලින් රුපියල් බිලියන 6.4ක් රුපියල් 25,000 ගණනේ පවුල් 257,000කට ගෙවලා තිබෙනවා. දැනට හඳුනාගෙන තිබෙන ආකාරයට, බලපෑමට ලක් වුණු පවුල් 610,000 අතුරින් පවුල් 493,000ක් මේ දීමනාව ලැබීමට හිමිකම ලබනවා. ඒ අනුව, ඉදිරි සතිය ඇතුළත මේ පීඩාවට පත් පවුල් සියල්ලටම ඒ මුදල් ගෙවා අවසන් කරන්න කටයුතු කරනවා. ඒ සඳහා දැනටමත් මුදල් වෙන් කරලා තිබෙනවා. එම නිසා ඒ පිළිබඳව කිසිදු ගැටලුවක් නැහැ. මුදල් ගෙවීම මේ වෙනකොට කඩිනමින් සිද්ධ වෙනවා. ඒ සඳහා නිලධාරින් සක්‍රියව දායක වෙලා ඉන්නවා.

ඊට අමතරව, නිවාසවලට අවශ්‍ය උපකරණ මිලදී ගැනීම සඳහා රුපියල් 50,000ක දීමනාව ගෙවීම ආරම්භ කරලා තිබෙනවා. ඒ සඳහාත් ප්‍රාදේශීය ලේකම්වරුන්ට හා දිස්ත්‍රික් ලේකම්වරුන්ට මුදල් යවා තිබෙනවා. ඒ විතරක් නොවෙයි, වගා හානි සම්බන්ධයෙන් වන්දි ගෙවීමට දැන් ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුව සහ කෘෂිකර්ම දෙපාර්තමේන්තුව කටයුතු කරමින් සිටිනවා. ඒ, වී වගාව, කෙසෙල් වගාව, එළවලු වගාව වැනි වගාවන් සඳහායි. ඊට අමතරව අපනයන කෘෂි භෝග වගා සම්බන්ධයෙනුත් වන්දි ගෙවීම් ක්‍රමයක් ස්ථාපිත කරලා තිබෙනවා. ඒ වාගේම ධීවර කර්මාන්තයට සිද්ධ වෙච්ච හානි ප්‍රතිපූරණය කරන්නේ කොහොමද කියන එක සම්බන්ධයෙන් අපි කටයුතු කරමින් ඉන්නවා. මේ වෙනකොට ඒ පිළිබඳව සාකච්ඡා පවත්වා තීන්දු තීරණ අරගෙන තිබෙනවා. පශු සම්පත් ක්ෂේත්‍රයට සිද්ධ වෙච්ච හානි සම්බන්ධයෙන් නිවැරදි දත්ත දැන් ලැබිලා තිබෙනවා. ඒ සඳහා වූ වන්දි ක්‍රමයකුත් ක්‍රියාත්මක වෙනවා. ඒ වාගේම මේ ආපදා තත්ත්වය හේතුවෙන් ව්‍යාපාර සහ ඊට අදාළ කර්මාන්ත, ආයතන හානියට පත් වුණා. ඒ සම්බන්ධයෙන් සහනදායී පොලී අනුපාත යටතේ සහන කාලයක් - grace period එකක් - සහිතව ණය මුදලක් ලබා දෙන්න අවශ්‍ය පියවර අපි ගනිමින් ඉන්නවා. ඒ අනුව හානි වෙච්ච පෞද්ගලික දේපළ, රාජ්‍ය දේපළ ඇතුළු සියල්ල වෙනුවෙන් කටයුතු කරන්න රජය මැදිහත් වෙලා තිබෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා ඇති, පසුගිය කාලයේ උතුර, නැඟෙනහිර පැවති යුද තත්ත්වය නිසා මිලියන ගණන් ජනතාව අවතැන් වුණා කියන එක. මේ කථා කරන බොහෝ අයගේ පාලන සමයන්වල මිලියන ගණන් ජනතාව සුබසාධන මධ්‍යස්ථානවල දශක ගණන් හිටියා. නිවාස ආධාර හැටියට දුන්නේ රුපියල් 150,000ක් බව අපේ රවූෆ් හකීම් මහත්මයා දන්නවා ඇති. නිවාස වන්දි හැටියට රුපියල් ලක්ෂ 2ක් තමයි ඒ ජනතාවට දීලා තිබුණේ. ඒ හින්දා දශක ගණන් ඒ අයගේ වන්දි මුදල් ගෙවා ගන්න බැරි වෙලා තිබුණා. දශක ගණනාවක් ඒ ජනතාව අවතැන් කඳවුරුවල, නැත්නම් සුබසාධන මධ්‍යස්ථානවල හිටියා, මේ කථා කරන බොහෝ මහත්වරුන්ගේ පාලන කාලයන් තුළ. නමුත්, අපි මේ සුබසාධන මධ්‍යස්ථාන 709 ඉතාම කෙටි කාලයකින් අවසන් කරලා, සියලුදෙනාට සහන සලසන්න අවශ්‍ය සියලු ක්‍රියාමාර්ග අද වනකොට අරගෙන තිබෙනවා. කිසිවෙකුත් අත් නොහැර ඒ සියලුදෙනා අපි රැක බලා ගන්නවා. සියලුදෙනාට අවශ්‍ය වියළි ආහාර ලබා දෙනවා. ඔවුන් සුරක්ෂා මධ්‍යස්ථානවල ස්ථානගත කළා විතරක් නොවෙයි, ඔවුන්ව සුදුසු ස්ථානවල නැවත පදිංචි කරවනවා. නැවත පදිංචි කරවන්න බැරි වුණොත් ඔවුන් ප්‍රතිෂ්ඨාපනගත කරනවා, එහෙම නැත්නම් relocation programme එකකට අපි යනවා; අපි ඒ අය relocate කරනවා. අපි

අනාරක්ෂිත ස්ථානවල ඉන්න සියලුදෙනා ඒවායින් ඉවත් කරලා, ඒ අයව රජයේ ඉඩම්වල පදිංචි කරවන්න කටයුතු කරනවා. මේ වෙනකොට පෞද්ගලික අංශයේත් යම් ඉඩම් ප්‍රමාණයක් ඒ සඳහා ලබා දී තිබෙනවා. උදාහරණයක් හැටියට ගත්තොත්, කුරුණෑගල දිස්ත්‍රික්කයේ මැල්සිරිපුර අපේ බෞද්ධ විහාරස්ථානයක අක්කර 20ක ඉඩමක් ඒ සඳහා ලබා දීලා තිබෙනවා. මේ වාගේ ඉඩම් විශාල ප්‍රමාණයක් ලැබෙමින් තිබෙනවා. මේ සියලුදෙනා සුරක්ෂිත ස්ථානවල නැවත පදිංචි කිරීම, නැත්නම් ප්‍රතිෂ්ඨානගත කිරීම අපි කරනවා. ඒ ආකාරයට විෂය භාර ඇමතිවරයා හැටියට ගරු ජනාධිපතිතුමා රජයක් හැටියට ගත හැකි, අවශ්‍ය සෑම ක්‍රියාමාර්ගයක්ම ගත්තා. ඒ වෙනුවෙන් මුදල් වෙන් කළා. අද අනුමත කර ගන්නා මේ රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුව අපි ඒ වෙනුවෙන් යොදවනවා. ඒ මුදල් සියල්ල මේ රටේ ජනතාවගේ සුබසිද්ධිය වෙනුවෙන් අපි යොදවනවා. ඒ වාගේම, සියලු යටිතල පහසුකම් තිබුණු තත්ත්වයටත් වඩා ඉහළ තත්ත්වයට ප්‍රමිතිගතව නැවත ගොඩනඟන්න අවශ්‍ය සියලු පියවර මේ වනවිට අපි අරගෙන තිබෙනවා. ඒ සඳහා ග්‍රාම නිලධාරි මහත්මයාගේ සිට අමාත්‍යාංශ ලේකම්වරයා දක්වා සියලු රාජ්‍ය ආයතනවල රාජ්‍ය සේවකයින් මැදිහත් වෙලා සක්‍රියව ඒ වෙනුවෙන් දායක වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔබතුමා දන්නවා, මේ ආපදා තත්ත්වය හේතුවෙන් විශේෂයෙන් නාවික හමුදාවේ පස්දෙනෙක් ජීවිත පූජා කළ බව. ඒ වාගේම පොලිස් නිලධාරියෙක් ජීවිතය පූජා කළා. ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරියෙක් ජීවිතය පූජා කළා. ඒ විතරක් නොවෙයි, ගුවන් හමුදා නිලධාරියෙකුත් ජීවිත පූජා කළා. ඔවුන් වෙනුවෙන් අපේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පළ කරනවා. ඒ වාගේම එම පවුල්වල අයටත් අපේ කනගාටුව පළ කරනවා. රාජ්‍ය සේවකයින් එහෙම ජීවිත පරිත්‍යාගයෙන් කටයුතු කරලා තිබෙනවා. ග්‍රාම නිලධාරින්, සමෘද්ධි සංවර්ධන නිලධාරින්, ආර්ථික සංවර්ධන නිලධාරින්, කෘෂිකර්ම පර්යේෂණ නිෂ්පාදන සහකාර නිලධාරින්ගේ ඉඳලා ක්ෂේත්‍රගත සියලු නිලධාරින් ඒ කටයුතුවලට දායක වුණා. ප්‍රාදේශීය ලේකම්වරයා, දිස්ත්‍රික් ලේකම්වරයා ඒ කටයුතුවලට දායක වුණා. එම නිසා ඒ සියලු නිලධාරින්ට, ත්‍රිවිධ හමුදාව, පොලීසියට අපේ ගෞරවය සහ ස්තුතිය මේ අවස්ථාවේදී පළ කරන්න ඕනෑ. ඔවුන් ඒ වෙනුවෙන් සක්‍රියව දායක වෙලා තිබෙනවා. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් රාජ්‍ය නිලධාරින් ගැන වැරදි අර්ථ කථනයක් කරන්න මේ සභාවේදී උත්සාහ කරමින් හිටියා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ ආපදාවෙන් පීඩාවට පත් සියලු දෙනා රැක බලා ගන්නවා විතරක් නොවෙයි, ඔවුන්ට සුරක්ෂිත ජීවිතයක් අනාගතයේදී අත්පත් කර දෙන්න අවශ්‍ය කටයුතුත් අපි කරනවා. ඒ වාගේම පීඩාවට පත් පාසල් සිසුන් සඳහා ජනාධිපති අරමුදලින් රුපියල් 10,000කුත්, භාණ්ඩාගාර අරමුදලින් රුපියල් 15,000කුත් බැගින් රුපියල් 25,000ක් ලබා දෙන වැඩ පිළිවෙළක් මේ වෙනකොට දියත් කරලා තිබෙනවා. ඒ සඳහා මුදල් වෙන් කරලා තිබෙනවා. ඒ කටයුත්තත් ඉදිරි සතියක්, දෙකක් ඇතුළත අවසන් කරන්න අපි බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, රටක් හැටියට අපි මේ ආපදාවට පත් වුණා. ඒ වාගේම අපි රජයක් හැටියට මේ ආපදාවෙන් රටේ ජනයා මුදාගෙන, සුරක්ෂිතව ඔවුන්ගේ අනාගතය සුරක්ෂිත කරන්න අවශ්‍ය සෑම පියවරක්ම ගන්නවා කියන එක මේ සභාවට ප්‍රකාශ කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Rauff Hakeem. You have nine minutes.

[11.16 a.m.]

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரஊப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
*Bismillahir Rahmanir Raheem.*

Hon. Deputy Speaker, the recent disaster is such that any government would definitely be overwhelmed by the magnitude and the scale of it. Therefore, there is no point in criticizing any government. But, when we discuss matters relating to this, we are entitled to point out certain shortcomings and those must be accepted in the spirit of things.

As it were, we have noticed that people from all over the country have come forward to generously assist the affected people. Different religious organizations also came forward and people gave leadership. As a Member of the Kandy District, I must say that the Chairman of our District Development Committee, the Hon. Minister K.D. Lal Kantha, the Hon. Minister (Dr.) Hiniduma Sunil Senevi, the Hon. Deputy Minister Nalin Hewage and several people came forward to help. Even our Chief Opposition Whip, the Hon. Gayantha Karunathilleka came with machinery to help remove the garbage. Of course, the Hon. Fasmin Sharif, Member of Parliament from Gampola was also with me at several meetings where we were discussing immediate measures to be taken. Sir, I must also take this opportunity to thank the Akkaraipattu Mayor and former Minister, the Hon. A.L.M. Athaullah, the Hon. (Dr.) M.L.A.M. Hizbullah, Member of Parliament who came with the entire team of the Kattankudy Urban Council, the Chairman of the Addalaichenai Pradeshiya Sabha, Mr. A.S.M. Uwais, the Chairman of the Eravur Urban Council and former Member of Parliament, the Hon. M. S. Naleem, the Hon. M.S. Uthumalebbe, Member of Parliament and the Chairman of the Pottuvil Pradeshiya Sabha, Mr. S. M. M Musharraf. They all came with heavy machinery to remove all the garbage from the Gampola area, which was worse-affected and also in Gelioya, Kalugamuwa and various other places in Udunuwara and Udapalatha areas.

The Local Authorities of Udapalatha and Gampola are controlled by the Opposition. Yet, I must say, the Government also lent enough support and enough assistance to work together with other opposition parties to relieve the burden handled by the local authority members. All of them participated in a united way to somehow do their bit to save people from this disaster. But, the disaster relief machinery has been very slow to respond. In certain areas, the administrative machinery has taken a little time to get into action, but yet some things are now beginning to happen. But, of course, the relief measures have not reached the people. Yesterday, the Hon. (Dr.) M.L.A.M. Hizbullah, too, pointed out these matters.

இங்கு நான் குறிப்பாக ஒன்றைச் சொல்ல வேண்டும். அதாவது, ஆண்டியாகடவத்தை, அல்-ஹிக்மா பாடசாலையின் பரிதாப நிலைபற்றி சொல்ல வேண்டும். அந்தப் பாடசாலையை அந்த இடத்திலே தொடர்ந்து கொண்டுசெல்ல முடியாத ஒரு நிலைமை பாரிய மண்சரிவின் காரணமாக ஏற்பட்டிருக்கின்றது. அந்தப் பாடசாலையை வேறு இடத்திற்கு

[ගරු නිතිඥ රවුෆ් හකීම් මහතා]

மாற்ற வேண்டுமென்ற விவகாரம் சம்பந்தமாக நான் அங்கிருக்கின்ற கல்வி அலுவலகத்திலும், உடபலாத்த பிரதேச சபையில் நடைபெற்ற அனர்த்த நிவாரணம் சம்பந்தமான கூட்டத்திலும் அதேபோல, கண்டியில் நடைபெற்ற அனர்த்த நிவாரணம் தொடர்பான கூட்டத்திலும் கதைத்திருக்கின்றேன். நேற்று பிரதம அமைச்சர் அவர்களைச் சந்தித்து அவரிடத்திலே இந்த விவகாரம் சம்பந்தமாகச் சொல்லியிருக்கிறேன். அந்தப் பாடசாலை மட்டுமல்ல, பாரிய மண்சரிவு காரணமாக 29 பேர் உயிரிழந்த நிலையில், ரம்புக்வெல்ல பாடசாலையும் மிக மோசமாகப் பாதிக்கப்பட்டிருக்கின்றது. அந்தப் பாடசாலை யையும் வேறு இடத்திற்கு மாற்ற வேண்டும். இது சம்பந்தமாக உடனடி நிவாரணங்கள் -

Immediate disaster recovery measures must be taken by the Ministry of Education, Higher Education and Vocational Education and the Ministry of Health and Mass Media. Now, the Wattegama Hospital has to be shifted to a different place; it cannot be left to be there. Therefore, immediate measures have to be taken.

Whether it be health or education, we need to do a quick needs assessment. That is why, when I spoke in Parliament on the very first day after the disaster, I asked the Government to call for a donor conference. Of course, the Government has now announced that a donor conference is to be called; the Hon. Minister Vijitha Herath had said so. And, the "Daily Mirror" states that the Government is to call for an international donor conference and a needs assessment mission has been sanctioned by the World Bank to do that. But, the local officers have to assist quickly to do the needs assessment, not only to restore the damaged infrastructure, but also to ensure that the country is disaster resilient in future disasters.

I must also say that we have to bring former projects into operation again with the assistance of multilateral agencies, the World Bank and the ADB. One is the Climate Resilient Infrastructure Project, which was a big programme the World Bank, the ADB and various other bilateral donors also put money into to carry on various disaster resilient infrastructure programmes. That had been discontinued and it has to be put back on wheels so that we can have substantial funds flowing into that.

Also, when I suggested the idea of bringing former leaders of this country into this effort, people started mocking at me, laughing at me and criticizing me. What I said was, if you make an appeal to the former leaders of this country to come together around one table and make an appeal to the international community, it would have a symbolic impact. Former President Chandrika Bandaranaike Kumaratunga had met the Hon. Prime Minister and made a donation from the Bandaranaike Memorial National Foundation. That is welcome. Then, there are also other Presidents who, of course, maybe, politically, your rivals, but who could sit together and make a common appeal with the President, and it would make a symbolic impact as far as the international community is concerned**.** That is why I said, forget about political differences today. All of us have come together at the local level. So, why can we not do it at the top level? That is what matters when it comes to international assistance. So, do that even if it is late, but it is not too late. The fact is, when a disaster happens, the delay in every day matters because the attention of the international community could turn on to different areas. We know that already the Ukraine issue and the Gaza issue are there. So, the attention of the Middle East and Europe is already focused elsewhere. Therefore, we need to get our closer neighbours to lead the effort to call for a donor conference. I hope it would be expedited so that enough funds would flow in.

Also, I must call for an immediate restoration of the entire Gampola urban area. The Gampola Town is totally inundated. Every infrastructure had been destroyed; all the businesses had suffered; there is hardly any resident who had not been affected. Therefore, a special urban regeneration programme together with a proper drainage plan must be implemented with the assistance of the UDA and the SLLRDC for the Gampola Urban Council area. Such is the situation in the Gelioya Town as well and we have also seen such other small villages close to the river like Kalugamuwa, Parana Elpitiya and various other areas, where we had to remove piles and piles of garbage. We had finally completed that. This morning, too, our machinery had been working in those areas. I am quite glad that we were able to contribute at least in some small measure for the last two weeks to bring some relief and compensation to those areas.

The other issue is about the buffer zones. When it comes to rivers, particularly major rivers like the Mahaweli and its tributaries, we need to have a proper buffer zone identified with the assistance of the NBRI, the UDA, the DMC, the Irrigation Department, the Mahaweli Authority and the SLLRDC. We will have to bring all those agencies together and decide on the buffer zone so that we would ultimately be able to determine which houses could remain there, the residents of which houses have to be shifted or relocated, which houses could be repaired and ultimately, what the buffer zone would be as far as the policy is concerned. The buffer zone would differ from place to place because of its geographic location, the height and in low-tide areas. So, these matters have to be given complete attention. I must again thank former MP, Hon. M.S. Naleem and various others who had assisted us with heavy machinery in attending to these matters.

Together with that, we must also talk about the issue concerning insurance. Now, the insurance regulator must be approached because insurance companies are finding ways and means to avoid paying insurance and that is the biggest problem. When a disaster like this strikes and when an insurance cover is there for fire and floods, sometimes they hide behind the fact that a cyclone does not come within the stipulated package to give relief. So, these matters must be paid attention because those companies have reinsurance. This is why reinsurance is there; their risk is mitigated by reinsurance. Therefore, the insurance regulator must be called upon by the Government to keep a careful eye on how much of insurance is being repaid to the affected in those areas.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Rauff Hakeem, your time is up.

**ගරු නීතිඥ රවුෆ් හකීම් මහතා**
(மாண்புமிகு சட்டத்தரணி ரவூப் ஹகீம்)
(The Hon. Rauff Hakeem, Attorney-at-Law)
Sir, the Hon. Prime Minister, who is also the Minister of Education, Higher Education and Vocational Education, is here. As far as schools are concerned, 140 schools had been impacted in Kandy alone and a few have to be relocated. Therefore, a proper needs assessment has to be done very fast. Also, make sure that you consult the local school communities - the school development societies, past pupils' associations and various others - so that you would not take a decision that would finally not be accepted by them. So, that consultation has to be held without delay. The Hon. President is expected to come to Kandy again and I hope the Hon. Prime Minister, too, would find some time to come and listen to our problems and try to give some solutions.

Thank you.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Prime Minister. You have 15 minutes.

[11.27 a.m.]

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය (අග්‍රාමාත්‍ය සහ අධ්‍යාපන, උසස් අධ්‍යාපන සහ වෘත්තීය අධ්‍යාපන අමාත්‍යතුමිය)**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய - பிரதம அமைச்சரும் கல்வி, உயர் கல்வி மற்றும் தொழிற்கல்வி அமைச்சரும்)
(The Hon. (Dr.) Harini Amarasuriya - Prime Minister and Minister of Education, Higher Education and Vocational Education)
Hon. Deputy Speaker, first, I must inform the Hon. Member that I have already been to Kandy and that I have every intention of returning.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අද දෙසැම්බර් මාසයේ 19වන දා. "දිට්වා" සුළි කුණාටු ව්‍යසනය අපේ රටට ඒ බලපෑම සිදු කරලා සති තුනක වාගේ කාලයකට පසුව තමයි පාර්ලිමේන්තුව නැවත රැස් වෙලා අප මේ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර ගන්න මේ විවාදය පවත්වමින් තිබෙන්නේ. මේ රට යථා තත්ත්වයට පත් කරන්න මේ සති තුන තුළ මොන තරම් මැදිහත් වීමක් සිදු වුණාද කියන එක ගැනත් අපට මේ වනකොට යම් අදහසක් තිබෙන්න ඕනෑ.

නොවැම්බර් 27වන දා ඉඳන්ම රජයේ, රජයේ නිලධාරින්ගේ, ත්‍රිවිධ හමුදාවේ, පොලීසියේ මැදිහත් වීම සහ මේ රටේ ජනතාව, ජාත්‍යන්තර ප්‍රජාව වෙතින් අපට ලැබුණු සහයෝගය, විපක්ෂයේ මන්ත්‍රීවරුන්ගෙන් අපට ලැබුණු සහයෝගය, විශේෂයෙන්ම ගරු ජනාධිපතිතුමාගෙන් ලැබුණු නායකත්වය සහ මහ පෙන්වීම ආදිය නිසා තමයි මෙච්චර විනාශයක් සිදු වුණායින් පසුව වුණත් මේ තත්ත්වයට පත් වෙන්න අපේ රටට හැකියාව ලැබුණේ. විශේෂයෙන්ම ජලය, විදුලිය, මහාමාර්ග ආදි යටිතල පහසුකම්වලට සිද්ධ වෙච්ච ඒ අතිවිශාල බලපෑමත් එක්ක බැලුවාම, රටේ බොහෝ පළාත්වල ජන ජීවිතය අද වන කොට මේ තත්ත්වයට පත් කර ගන්න පුළුවන් වීම පිළිබඳව අප සතුටු විය යුතුයි කියලායි මා හිතන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැන විශේෂත්වයක් තිබෙනවා. මේ ව්‍යසනය එක සිද්ධියක් විතරක් නොවෙයි. මේක හරිම dynamic situation එකක්. අපි අදත් මධ්‍යම පළාතේ පාසල් සියල්ල වසා දමන්න තීරණයක් ගත්තා. මොකද, දැන් ඇති වෙලා තිබෙන තත්ත්වය තුළ සාමාන්‍ය වර්ෂාපතනයකින් වුණත් අවදානම වැඩි වෙන්න පුළුවන්. Landslide threat එක සක්‍රියයි. ඒ පළාත්වල ඒ පාරවල ගමන් කරන කොට වුණත්, ඒ ගම්මානවලට යනකොට වුණත් ඕනෑම කෙනෙකුට තේරෙනවා, landslides threat එක සක්‍රියයි කියලා. ඒ නිසා එය නිරන්තර අධීක්ෂණයට, නිරීක්ෂණයට ලක් කරමින් තමයි අප තීන්දු තීරණ ගන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

අපි කෙටි කාලීන පියවර ගෙන තිබෙනවා. අපි මේ මොහොතේ -මුල් අවස්ථාවේ- ජනතාව ආරක්ෂා කරමින් ජනතාව මුදා ගැනීමට මෙහෙයුමක් ක්‍රියාත්මක කළා. ඒ වාගේම, ජනතාවගේ ආරක්ෂාව තහවුරු කරමින් නැවත ගොඩ නැඟීමට, recovery phase එකට යන අතරම rebuild කරන්න අවශ්‍ය වන දීර්ඝ කාලීන වැඩ පිළිවෙළ ගැනත් අපි අවධානය යොමු කරමින් ඉන්නවා. ගරු රවුෆ් හකීම් මන්ත්‍රීතුමාත් මතු කළා, අපට පාසල් relocate කරන්න වන අවස්ථාත් තිබෙන්න පුළුවන් කියලා. ගම්මාන ගැනත් එලෙස හිතන්න සිදු වන අවස්ථා ද තිබෙනවා. එය කෙටි කාලීන වාගේම, මධ්‍ය කාලීන හා දීර්ඝ කාලීන වැඩ පිළිවෙළකින් විය යුතුයි. අප හිතන විධියට ඒ සඳහා අවුරුදු දෙකතුනක වැඩ පිළිවෙළක් අවශ්‍ය වෙනවා. අප මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන්නේ, 2026 වර්ෂයේදී අපට අවශ්‍ය කරන ඒ වැඩ කටයුතු ටික කරගෙන යන්නයි. ඒ අනුව සැලසුම් සහගතව තමයි අප මෙයට මැදිහත් වෙලා ඉන්නේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපට මේ තත්ත්වය හමුවේ වුණත් 2025 වර්ෂයේ රුපියල් බිලියන 75ක් වියදම් කරන්න මුදල් වෙන් කර ගන්න හැකි වුණේත්, ඒ වාගේම 2026 වර්ෂයට රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කර තිබෙන්නේත් අපේ ආර්ථික සැලසුම්වලට හානියක් නොවන විධියට බව මා විශේෂයෙන් සඳහන් කරන්න ඕනෑ. අපේ පුළුල් ආර්ථික සැලස්ම තුළ යන ගමන්ම නැවත වතාවක් ණය බරින් මිරිකෙන තත්ත්වයකට යන එකත් වළක්වා ගනිමින් තමයි අප මේ සියල්ලම කරන්නේ. අපට මේක කරන්න පුළුවන් වෙලා තිබෙන්නේ අපේ ආර්ථික කළමනාකරණය කෙරෙහි අප මුල ඉඳන්ම දුන් අවධානය නිසයි. එම ආර්ථික ඉලක්කවලට හානියක් නොවන විධියට 2025 වර්ෂයට රුපියල් බිලියන 75ක් වෙන් කරන්නත්, 2026 වෙනුවෙන් මෙම පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්නත් ඇත්ත වශයෙන්ම අපට හැකියාව ලැබිලා තිබෙන්නේත් එම ආර්ථික කළමනාකරණය නිසාය කියන එකත් මම මතක් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම ව්‍යසන තත්ත්වයේදී අපට බොහෝ දෙනෙකුගෙන් විශාල සහයෝගයක් ලැබුණා. මම මේ වෙලාව අවස්ථාවක් කර ගන්නවා ඒ සියලුදෙනාට ස්තුති කරන්න. විශේෂයෙන්ම ජාත්‍යන්තර ප්‍රජාව, පිට රට ඉන්න ශ්‍රී ලාංකිකයන්, මේ රටේ පෞද්ගලික ආයතන, සාමාන්‍ය ජනතාව සහ දරුවන් ආදි සියලුදෙනාම මේ අවස්ථාවේ සහයෝගය ලබා දෙන්න විශාල විධියට මැදිහත් වෙලා ඉන්නවා. සමහර අය උදවු කිරීම සඳහා ස්වේච්ඡාවෙන් ඉදිරිපත් වෙලා ඉන්නවා; අපට බඩු භාණ්ඩ ලබා දීලා තිබෙනවා; ඒ වාගේම අපට මුදල් ලබා දීලා තිබෙනවා. අපේ රටේ ජනතාවගේ තිබෙන ඒ spirit එක අපි අගය

[ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය]

කරන්න ඕනෑ. ඒ අගය කිරීම කරන අතරම, අපි ඒ ගැන විශේෂයෙන් සතුටු වෙනවා. මොකද, අපට ආධාර කරන්න එන ජනතාවත්, ජාත්‍යන්තර ආයතන වුණත් කියන දෙයක් තමයි, "මේ ආණ්ඩුව පිළිබඳව තිබෙන විශ්වාසය නිසායි භය නැතුව මේකට මේ විධියට සහයෝගය දක්වන්න අපට පුළුවන් වෙලා තිබෙන්නේ" කියන එක. ඒ බවත් මම මේ වෙලාවේ විශේෂයෙන් මතක් කරනවා. මේ recovery effort එකේදී වුණත් ඒ වෙනුවෙන් මුදල් එකතු කිරීමට, ඒකට සහයෝගය ලබා ගැනීමට ඉල්ලීම් ඉදිරිපත් කරන කොටත් ඒ විශ්වාසය පලුදු නොවන විධියට පෙනී සිටින්න අපට පුළුවන් වෙලා තිබෙනවා. ගරු රවූෆ් හකීම් මන්ත්‍රීතුමනි, මේ කටයුත්ත සඳහා අප කාවද එකතු කර ගන්නේ කියන කාරණයේදී අපට ඒ ගැනත් හිතන්න වෙනවා. මොකද, විශ්වාසය පලුදු වුණු අය, විශේෂයෙන් ව්‍යසනවලදීත් දූෂණ ක්‍රියාවලට හසු වුණු අය අපි මේ වතාවේ මේකට එකතු නොකර ගනිමු කියලා මම යෝජනා කරනවා, ගරු මන්ත්‍රීතුමනි. මොකද, අපට මේ වෙලාවේ මුළු රටම එකතු කර ගන්න පුළුවන් වුණේත්, ජාත්‍යන්තරය මේ විධියට ඉදිරිපත් වෙලා තිබෙන්නේත් අප ඉදිරිපත් කර තිබෙන මේ අදූෂිත ආණ්ඩුකරණය කෙරෙහි තිබෙන විශ්වාසය මතයි. එයත් මේ තත්ත්වයට විශාල සාධකයක් වෙලා තිබෙනවා කියන එකත් මම මතක් කරන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ වෙලාවේ විශේෂයෙන් අධ්‍යාපන ක්ෂේත්‍රයේ තත්ත්වය ගැනත් යම් අදහසක් ඉදිරිපත් කරන්න කැමැතියි. අපට 17වන දා පළාත්වලින් ලැබුණු තොරතුරු අනුවයි මම මේ දත්ත ඉදිරිපත් කරන්නේ. මම නැවත වතාවක් කියනවා, මේ දත්ත දිනෙන් දින වෙනස් වන බව. මේවා අවසාන දත්ත නොවෙයි. මේ දත්ත අනුව, රජයේ පාසල් 1,382ක් පමණ සෘජුවම මේ ආපදාවට ලක් වෙලා තිබෙනවා.

එයින් මධ්‍යම පළාතේත්, ඌව පළාතේත්, සබරගමුව පළාතේත් පාසල් තමයි වැඩිම ප්‍රමාණයක් හානියට ලක් වෙලා තිබෙන්නේ. අපි මේ වෙනකොට පාසල් විවෘත කර තිබෙනවා. පාසල් 666ක් විතර අපට තවම විවෘත කරගන්න බැරි වුණා. අද අපි මධ්‍යම පළාතේ පාසල්වලට නැවත වතාවක් නිවාඩු ප්‍රකාශ කළා. ඒ නිසා දැන් වසා තිබෙන ඉස්කෝල ප්‍රමාණයත් වැඩිවෙලා තිබෙනවා. මේ වෙනකොට අපේ පාසල් ගණනාවක් සුරක්ෂා මධ්‍යස්ථාන හැටියටත් පවත්වාගෙන යන නිසා අපි ඒ සියල්ලමත් සලකා බලා තමයි මේ පාසල් විවෘත කිරීම පිළිබඳ තීරණයක් ගත්තේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පාසල් විවෘත කිරීමේ අපේ ප්‍රධාන අරමුණක් වුණේ, මෙවැනි ආපදාවකට, මෙවැනි ව්‍යසනයකට පසු යටිතල පහසුකම් ගැනත් බලන අතර, මානසික සෞඛ්‍යය, මනෝ සමාජීය යහපැවැත්ම ගැනත් බලන්න ඕනෑය කියන එක. විශේෂයෙන්ම දරුවන්ට නැවත වතාවක් ඔවුන්ගේ සාමාන්‍ය ජීවිතය ඇති කරන්න පුළුවන් තත්ත්වය නිර්මාණය කිරීම අපට අතිශයින්ම වැදගත් වුණා. දරුවන්ට පාසල තරම් ආරක්ෂිත තැනක් නැහැ. සාමාන්‍යයෙන් ගත්තොත්, පවුල් පරිසරයත්, පාසලත් දරුවෙකුට ආරක්ෂිත තැනක්. එතකොට පාසල තුළ ඒ routine එක නැවත වතාවක් ආරම්භ කිරීම දරුවන්ගේ recovery එකටත් ප්‍රයෝජනවත් වෙයි කියලා අපි හිතුවා. ඒ නිසා තමයි අපි මේ තීරණය ගත්තේ, ක්‍රමානුකූලව ආරක්ෂිත තැන්වල විවෘත කරන්න පුළුවන් පාසල් විවෘත කරමු කියලා. පාසල් විවෘත කරනකොටත් අපි ඒ උපදෙස් දීලා තිබෙන්නේ සියලු විදුහල්පතිවරුන්ට, ගුරුවරුන්ට, කලාප නිලධාරින්ට, අධ්‍යාපන නිලධාරින්ට. සාම්ප්‍රදායිකව පාසල් විවෘත කර, විභාග පවත්වා syllabus එක cover කරන්න නොවෙයි, මේ අවස්ථාවේ මේ දින ප්‍රමාණය පාවිච්චි කර දරුවන්ගේ මානසික සුවය, ඔවුන්ගේ යහපැවැත්ම, ඔවුන්ගේ මනෝ සමාජීය යහපැවැත්ම ශක්තිමත් කරන්න මේක අවස්ථාවක් කරගන්න කියලා අපි උපදෙස් ගණනාවක් දීලා තිබෙනවා.

මේ ආපදාව සිද්ධ වෙනකොට උසස් පෙළ විභාගය කරමින් සිටි දරුවන් පිරිසක් ඉන්නවා. ඒ ඉතිරි දවස් 7 අපි reschedule කර තිබෙනවා. ඒ දරුවන්ට අපි විශේෂ අවධානයක් දෙන්න ඕනෑ. ඒ වාගේම එන අවුරුද්දේ සාමාන්‍ය පෙළට පෙනී සිටින දරුවන් වෙනුවෙන් සාමාන්‍ය පෙළ විභාගය පෙබරවාරි මාසයේ පවත්වන්නට නියමිතයි. ඒ දරුවන්ටත් අපි විශේෂ මැදිහත්වීම් කර තිබෙනවා. ඒ වාගේම ආපදාවට ලක් වූ සියලු දරුවන්ට ජනාධිපති අරමුදලින් රුපියල් 10,000කුත්, භාණ්ඩාගාරයෙන් රුපියල් 15,000ක මුදලකුත් ලබා දෙනවා. මේ ආපදාවට ලක් වෙච්ච සියලු දරුවන්ට රුපියල් 25,000ක දීමනාවක් අපි ලබා දෙන්නේ ඔවුන්ගේ පොත්පත්, uniforms යන මේ සියල්ල නැවත ලබා ගැනීම සඳහායි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි අධ්‍යාපනය කියන ක්ෂේත්‍රය දෙස බලන්නේත්, ඒ දරුවන් එක්ක තිබෙන සම්බන්ධය දෙස බලන්නේත්, හුදෙක් උගන්වන්න විතරක් දරුවන් පාසලට කැඳවාගෙන එන්න නොවෙයි, මේ ව්‍යසනයෙන් පසුව දරුවන්ගේ recovery එක පිළිබඳවත් හිතලා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම මේ වෙලාවේ කියන්න ඕනෑ, පාසල් පද්ධතියට විතරක් නොවෙයි, අපේ විශ්වවිද්‍යාල පද්ධතියටත් හානි සිද්ධ වුණු බව. ඒ ව්‍යසනය සිද්ධ වෙනකොට විශ්වවිද්‍යාල ගණනාවක ශිෂ්‍ය ශිෂ්‍යාවන් ගංවතුර නිසා ආපදාවට ලක් වුණා. විශේෂයෙන්ම පේරාදෙණිය විශ්වවිද්‍යාලයට වෙලා තිබෙන හානිය ඉතාම ඉහළයි. UGC එකේ විශේෂ කමිටුවක් පත් කරලා, ඒ assessment එක ගැන අපි සොයා බලනවා. විශේෂයෙන්ම, Veterinary Medicine and Animal Science Faculty එක, Agriculture Faculty එක, gymnasium එක, swimming pool එක වැනි විශාල ප්‍රදේශයකට මේ නිසා අධික හානියක් සිද්ධ වෙලා තිබෙනවා. Hostelsවලට හානි සිද්ධ වෙලා තිබෙනවා. හැබැයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙතැනින් අපට ඉගෙනගන්න තව පාඩමකුත් තිබෙනවා. මම පේරාදෙණිය විශ්වවිද්‍යාලයට ගියාම පැහැදිලි වුණා Sir Ivor Jenningsගේ කාලයේ හදපු එක බිල්ඩින් එකකටවත් හානියක් වෙලා නැහැ, අඩුම තරමින් වතුර අහලක්වත් ගිහින් නැහැ කියලා. මොකක්ද ඒකෙන් අපට කියා දෙන පාඩම? ඒකෙන් කියන්නේ plan කරනකොට, හරි විධියට විද්‍යාත්මක කරුණු අනුව සුදුසු තැන්වල අපි ගොඩනැඟිලි හදනවා නම් අපට ආරක්ෂා වෙන්න පුළුවන් කියන එකයි. තිබිය යුතු standards ගැන හිතන්නේ නැතිව, environment එක ගැන හිතන්නේ නැතිව ගත්තු තීන්දු තීරණ නිසා ඇති වෙලා තිබෙන ව්‍යසනය මේ වෙලාවේ අපට හොඳින් දැක ගන්න පුළුවන්. ඒක විශ්වවිද්‍යාලයට විතරක් නොවෙයි, බලපෑමට ලක් වුණු ගම්මාන දිහා බලනකොටත්, පාසල් දිහා බලනකොටත් ඒ කාරණය ඉතාම පැහැදිලියි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි rebuilding ගැන කථා කරනකොට, relocation ගැන කථා කරනකොට, අපි ඒක කරන්නේ විද්‍යාත්මක පදනමක් මත. පරිසර හානිය ගැන හිතමින්, ඒවා සියල්ලම අවම කරමින්, අවදානම අඩු කරමින් තමයි rebuild කරන්නේ. අපි බලාපොරොත්තු වෙනවා අපි ගන්නා ඒ තීන්දු තීරණවලට විපක්ෂයෙනුත් සහයෝගය ලැබෙයි කියලා. තිබෙන නීති රීතිවලට ගරු කරමින්, පාරිසරික අවශ්‍යතා ගැනත් හිතලා ඉදිරි තීන්දු තීරණ ගන්න සියලුදෙනා සහයෝගයෙන් වැඩ කරයි කියලා මම බලාපොරොත්තු වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ විද්‍යාපීඨ ගණනාවකටත් හානි වෙලා තිබෙනවා. පුලතිසිපුර, පේරාදෙණිය, මහවැලිය, සාරිපුත්ත කියන විද්‍යාපීඨවලටත් හානි වෙලා තිබෙනවා. වෘත්තීය සහ තාක්ෂණ ක්ෂේත්‍රයේ පුහුණු මධ්‍යස්ථානවලටත් හානි වෙලා තිබෙනවා. ඒ අතර රන්වැල්ල, කලාඔය, මුලතිවු, පේරාදෙණිය මධ්‍යස්ථාන තිබෙනවා. මේවා සියල්ල පිළිබඳව අපි හරි assessment එකක් කළ යුතුයි. බිල්ඩින්වලට වෙලා තිබෙන හානිය විතරක් නොවෙයි

equipment, computer labs වාගේ දේවලුත් තිබෙනවා. උදාහරණයක් හැටියට පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ servers ගණනාවක් විනාශ වෙලා තිබෙනවා. මේ සියල්ලම අපි ගණනය කරමින් සිටිනවා. පාසල් මට්ටමින් තිබෙන computer labsවලට හානි වෙලා තිබෙනවා. මම ඉතාම ස්තුතිවන්ත වෙනවා Digital Task Force එකේ සාමාජිකයන්ට. මේ වෙනකොට අපේ Digital Task Force එක මහර පාසල්වල, ඒ infrastructure assessment එක කරගෙන යනවා. මම හිතන විධියට, ගිය සතියේ ඒ අය අනුරාධපුරයේ පාසලක් වෙනුවෙන් මැදිහත් වුණා. අද පුත්තලමට යනවා. ඊට පස්සේ මධ්‍යම පළාතට යනවා. ඒ digital infrastructure ගැනත් assessment එකක් කළාට පස්සේ ඒ වෙනුවෙන් මැදිහත් වෙන්න මේ වෙනකොටත් සමාගම් කිහිපයක් ඉදිරිපත් වෙලා තිබෙනවා. මම ඒ සියලුදෙනාටම ස්තුතිවන්ත වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි මේ කටයුතු කරන්නේ දත්ත මත, තොරතුරු මත, විද්‍යාත්මකව පියවරෙන් පියවරට. Disaster recovery එකේ phases තිබෙනවා. Rescue කරන්න ඕනෑ, relieve කරන්න ඕනෑ, rebuild කරන්න ඕනෑ, recovery එක ගැන හිතන්න ඕනෑ. දත්ත මත, assessments මත, විද්‍යාත්මක තොරතුරු මත තමයි අපි ඒ සියලු තීන්දු තීරණ ගන්නේ. හැබැයි අපි රටට, අපේ ජනතාවට පොරොන්දුවක් වෙනවා අපි එකතු වෙලා මේ රට නැවත ගොඩ නඟනවා කියලා. ඔබ අප සියලුදෙනා එකතු වෙලා තමයි ඒක කරන්නේ. ඒ හයිය ඔබ මේ සති තුන තුළත් පෙන්වුවා. ඉදිරියටත් එය පෙන්වයි. ඒ සමගිය හරහා මේ රට නැවත වතාවක් යථා තත්ත්වයට පත් කරන්නත්, සියලුදෙනාගේම ජීවිත සුරක්ෂිත කරන්නත් හැකියාව ලැබෙයි කියන විශ්වාසය ඇතිව තමයි අපි වැඩ කරන්නේ ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒ සඳහා මේ වෙලාවේ අපට සහයෝගය දෙන සියලුදෙනාටම මම විශේෂයෙන් ස්තුතිවන්ත වෙනවා.

මට කාලය ලබා දුන්නාට බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. K. Kader Masthan. You have six minutes.

[மு.ப. 11.43]

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இந்த அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கும் உயிரிழந்தவர்களின் குடும்பங்களுக்கும் முதலில் எனது ஆழ்ந்த அனுதாபங்களைத் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த அனர்த்தத்தினால் பாதிக்கப்பட்டவர்களுக்கு அரசாங்க அதிகாரிகள் முதல் பாராளுமன்ற உறுப்பினர்கள், பொது அமைப்புகளின் பிரதிநிதிகள், பொது மக்கள் என அனைவரும் உதவிகளைச் செய்து கொண்டிருக்கின்றார்கள். சில இடங்களில் பாதிக்கப்பட்ட மக்கள்கூட, பாதிப்புக்குட்பட்ட பகுதிகளுக்குச் சென்று உதவிகளைச் செய்து கொடுத்திருக்கிறார்கள். அவ்வாறான செயற்பாட்டில் ஈடுபட்ட அனைவருக்கும் இந்த இடத்தில் நன்றியைத் தெரிவித்துக் கொள்வதோடு, அவர்களுக்கு எனது பாராட்டுகளையும் தெரிவித்துக் கொள்கின்றேன். அதேபோல, நானும் எனது ஸ்ரீலங்கா தொழிலாளர் கட்சியைச் சார்ந்த உறுப்பினர்களும் பல தியாகங்களைச் செய்து பாதிப்புற்ற மக்களுக்கு சேவை செய்திருந்தோம். அந்த அடிப்படையில், எனது கட்சித் தலைவருக்கும் உறுப்பினர்களுக்கும் எனது நன்றிகளையும் பாராட்டுகளையும் தெரிவித்துக் கொள்கின்றேன்.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, மக்களைக் கடுமையான சோதனைக்குள்ளாக்கிய 'தித்வா' புயலுக்கும், அதனோடு ஏற்பட்ட வெள்ள அழிவுகளுக்கும் முகம் கொடுத்த மக்களுக்கு நிவாரணங்களை வழங்கும் அரசாங்கத்துக்கு நன்றியைத் தெரிவிக்கின்ற அதேவேளை, எவ்விதமான முறைகேடுகளும் இன்றிச் சரியான முறையில் அரசாங்கத்தின் அனைத்துச் செயற்பாடுகளும் வெற்றிகரமாக நிறைவேற வேண்டுமென மனப்பூர்வமாகப் பிராத்தனையும் செய்கின்றேன். அத்தோடு, பல்வேறு வகைகளிலும் சொல்லொணாத் துயரங்களை அனுபவிக்கும் எமது மக்கள் விரைவாக அதிலிருந்து மீள வேண்டுமென்றும் பிரார்த்திக்கின்றேன். மனப்பூர்வமான ஒத்துழைப்புகளை வழங்க என்னால் முடிந்ததுடன், அதற்கான முழுமையான முயற்சிகளையும் மேற்கொண்டேன். இந்த நிலையில், மாண்புமிகு சனாதிபதி அவர்கள் பாதிக்கப்பட்ட மாவட்டங்களுக்குச் சென்று, மாவட்ட ஒருங்கிணைப்புக் குழுக் கூட்டங்களை நடாத்துவதும் பாதிப்புகளை நேரடியாகப் பார்வையிடுவதுடன் பாதிக்கப்பட்ட மக்களைச் சந்திப்பதும் வரவேற்கத்தக்க விடயமாகும்.

எனினும், இம்மாதம் 13ஆம் திகதி மாண்புமிகு ஜனாதிபதி அவர்களின் தலைமையில் இடம்பெற்ற புத்தளம் மாவட்டத்துக்கான விசேட ஒருங்கிணைப்புக் குழுக் கூட்டத்தில் புத்தளம் - இளவன்குளம் - மன்னார் வீதியினூடாக 1980ஆம் ஆண்டுகளுக்குப் பிறகு பொதுப் போக்குவரத்து நடைபெறவில்லை எனவும் இது சம்பந்தப்பட்ட வழக்கு உயர் நீதிமன்றத்தில் தீர்ப்பு வழங்கப்பட்டு முடிவுறுத்தப்பட்டதாகவும் அதிகாரிகளால் பிழையான தகவல்களை வழங்கி, மாண்புமிகு ஜனாதிபதி அவர்களைப் பிழையாக வழிநடத்தியுள்ளனர். கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, இவ்வீதியினூடான போக்குவரத்து மூலம் கொழும்பில் இருந்து யாழ்ப்பாணத்துக்குப் பயணம் செய்கின்றபோது சுமார் 80 கிலோமீற்றர் குறைவாகவும் ஆகக்குறைந்தது இரண்டரை மணித்தியாலங்களையும் மீதப்படுத்த முடியும். யுத்த சூழ்நிலை காரணமாக 1990ஆம் ஆண்டுகளில் இடம்பெற்ற இடப்பெயர்வுகளுக்கு பின்னர் இவ்வீதியூடான போக்குவரத்து கைவிடப்பட்டாலும் 2010ஆம் ஆண்டு மீள போக்குவரத்து ஆரம்பிக்கப்பட்டன. இந்த நிலையில் இவ்வீதியூடான பொதுப் போக்குவரத்தினால் வில்பத்து வனவிலங்குகளுக்கு இடையூறு ஏற்படுவதாகக் கூறி உயர் நீதிமன்றத்தில் வழக்குத் தொடரப்பட்டது. இருந்தாலும், உயர் நீதிமன்றத்தால் இந்த வீதியை எந்த அபிவிருத்தியும் செய்யாமல் போக்குவரத்து செய்யலாம் என்ற இடைக்கால கட்டளை கொடுக்கப்பட்டது. அந்த அடிப்படையில் 2019 யூன் வரைக்கும் மன்னார் - புத்தளம் - கல்பிட்டி நகரங்களுக்கிடையிலான இலங்கைப் போக்குவரத்து சபை பேருந்துகள், தனியார் பேருந்துகள் மற்றும் ஏனைய வாகனங்களும் போக்குவரத்துச் சேவைகளில் ஈடுபட்டன. ஆனால், இவ்வீதியின் 37ஆவது கிலோமீற்றரில் அமைந்திருக்கும் பாலம் சேதமடைந்திருப்பதாகக் கூறி, 2019 யூன் மாதத்துக்குப் பின்னர் இதனூடான போக்குவரத்து இடைநிறுத்தப்பட்டது.

கௌரவ பிரதிச் சபாநாயகர் அவர்களே, குறிப்பாக விலங்குகளுக்கு இடையூறு ஏற்படுத்துவதாக கூறித்தான் இந்த வழக்குப் போடப்பட்டு, இடைக்காலத் தடை இருந்தது. கிட்டத்தட்ட15 வருடங்கள் இந்த வழக்கு நடைபெற்றன. அந்த

[ගරු කේ. කාදර් මස්තාන් මහතා]

15 வருடங்களும் பலர் பிரதிவாதிகளாக இருந்ததோடு, மக்கள் பக்கம் நின்று வாதிட்டனர். இந்த காலகட்டத்தில்தான் வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் இந்த வீதியினூடாக பொதுமக்கள் பாவனைக்கு இடமளிக்கமாட்டோம் என உறுதி வழங்கியதன் அடிப்படையில், முதலாம் வழக்காளியின் கோரிக்கை நிறைவேற்றப்பட்டதனால், இந்த வழக்கு மீளப் பெறப்பட்டு முடிவுறுத்தப்பட்டதாக வழக்குப் போடப்பட்டவர்களால் தெரிவிக்கப்பட்டது. ஆனாலும் வில்பத்து வனாந்தரத்தினூடாக பொதுப் போக்குவரத்தினால் வன விலங்குகளுக்கு ஏதேனும் அசௌகரியங்கள் ஏற்படுமெனின், ஹபரனை நாற்சந்தியில் இருந்து - கந்தளாய் - கனேவல்பொல - மின்னேரியா - தம்புள்ள ஆகிய நகரங்களுக்கும் இடையிலான வீதிகளும் அதேபோன்று அம்பாறை - சியம்பலாண்டுவ போன்ற வீதிகளும் இதே அமைப்பிலான வனவிலங்குகள் வாழும் பிரதேசங்களாவதுடன் பொதுப் போக்குவரத்துகள் அந்த வீதியினூடாக இடம்பெறுகின்றபோதிலும் இவ்வீதிகளுக்கு எவ்வித தடைகளும் விதிக்கப்படவில்லை. ஆனால், ஆச்சரியமான விடயம் என்னவென்றால், இந்த வழக்கின் 4 மற்றும் 9 தொடக்கம் 21ஆம் பிரதிவாதிகள் அனைவரும் இந்தப் பாதையை திறப்பதற்காக மக்கள் சார்பாக நீண்ட காலமாக செயற்பட்டவர்கள் அனைவரும் இந்தப் பாதையை அடியோடு மூடுவதற்கு வனசீவராசிகள் பாதுகாப்பு திணைக்களத்தின் உறுதிமொழிகளோடு ஏற்பட்ட இணக்கப்பாட்டுடனான வழக்கு முடிவுறுத்தல் தொடர்பாக எவ்விதமான கருத்துகளையும் குறிப்பிடாது முற்று முழுதாக ஏற்றுக்கொண்டு தலையாட்டி மௌனமாக இருந்ததானது அம்மக்களை ஏமாற்றிய பெரும் துரோகச் செயல் என்பதுடன்,

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Hon. K. Kader Masthan, you have only one more minute.

**ගරු කේ. කාදර් මස්තාන් මහතා**
(மாண்புமிகு கே. காதர் மஸ்தான்)
(The Hon. K. Kader Masthan)

ஒரு நிமிடம் தாருங்கள். இது ஒரு மாபெரும் சதித்திட்டமோ என சந்தேகம் எழுகின்றது. அத்தோடு, இந்த வீதியினூடாக பொதுப்போக்குரத்து சம்பந்தமான தீர்மானத்தை வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களம் எவ்வாறு தீர்மானிக்க முடியும். பல நூற்றாண்டுகளாக மக்களால் பாவிக்கப்பட்ட இந்த வீதி மக்களின் தேவைகளை புறந்தள்ளி அதிரடியாக முற்று முழுதாக தடைசெய்வது எவ்வகையிலும் பொருத்தமானதில்லை. நீதிமன்றத்தால் தீர்ப்பு ஒன்று வழங்கப்படாத சூழ்நிலையில் வனசீவராசிகள் பாதுகாப்புத் திணைக்களத்தின் கருத்துகளை அடிப்படையாகக் கொண்டு முடிவுறுத்துப்பட்டுள்ள இந்த வழக்கின் பின்னணியில் பெரும் பிரதேசம் ஒன்றின் எதிர்கால அபிவிருத்திகளும் இலட்சக்கணக்கான மக்களின் போக்குவரத்து பாதிப்படைகின்றதென்ற அடிப்படையில், இது சம்பந்தமான 2025.05.07ஆம் திகதி உயர்நீதிமன்ற தீர்ப்பையும் ஏனைய அனைத்து ஆவணங்களையும் ஹன்சாட் பதிவுக்காகச் *சமர்ப்பிக்கிறேன்.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

எப்படியும் அந்த வீதியில் எதிர்காலங்களில் வெள்ளம் ஏற்படும். அவ்வாறு வெள்ளம் ஏற்பட்டால், மன்னாருக்குரிய போக்குவரத்து தடுக்கப்படும். யாழ்ப்பாண வீதியின் போக்குவரத்தும் தடுக்கப்படுவதால், இந்த வீதிக்குப் பாதிப்பு வராதபடி ஏற்பாடுகளைச் செய்துதர வேண்டுமெனக் கேட்டு எனது உரையை நிறைவுசெய்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

Next, the Hon. Namal Karunaratne. You have 11 minutes.

[පූ.භා. 11.51]

**ගරු නාමල් කරුණාරත්න මහතා (කෘෂිකර්ම සහ පශු සම්පත් නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு நாமல் கருணாரத்ன - கமத்தொழில் மற்றும் கால்நடை வளங்கள் பிரதி அமைச்சர்)
(The Hon. Namal Karunaratne - Deputy Minister of Agriculture and Livestock)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඉතිහාසයේ ගංවතුරක් විසින් සිදු කරන ලද දැවැන්තම විනාශය අපේ රටට පසුගිය දවසක සිද්ධ වුණා. මේ ව්‍යසනයේදී විශාල පිරිසක් අපෙන් සමු ගත්තා, නිවාස අහිමි වුණා, දේපළ විනාශ වුණා, පරිසරය විනාශ වුණා, ගහකොළ විනාශ වුණා, සතා සිවුපාවුන් ගහගෙන ගියා, පස්වලට යට වුණා. විශාල හානියක් ඒ තුළින් සිද්ධ වුණා. ඒ උදූරා ගත්ත ජීවිතවල වටිනාකම රුපියල් ශතවලින් අපට තක්සේරු කරන්න බැහැ. අනෙක් දේවල් නම් තක්සේරු කරන්න පුළුවන්. ඒ වාගේම, සමහර පවුල්වල එකම දරුවෙක් බේරුණා, පවුලේ අනෙක් ඔක්කොම අය නැති වුණා. ඒ ඇති වෙන වේදනාව, දුක, ඒ පපු කැවුත්තට දැනෙන වේදනාව තක්සේරු කරන්න බැහැ. මේ ශෝචනීය තත්ත්වය රටට උදා වෙනකොට, අපේ රාජ්‍ය ආයතන, රජයේ නිලධාරින්, මහජන නියෝජිතයින්, ස්වේච්ඡා සංවිධාන ඇතුළු සියලුදෙනා අඩු වැඩි වශයෙන් තමන්ට කන්න තිබෙන දේ පවා පරිත්‍යාග කරමින්, නිවාඩු නොගෙන, ඉරිදා ද, සෙනසුරාදා ද, පෝය ද කියලා නොබලා, රෑ ද, දවල් ද කියන කිසිවක් නොතකා, ජීවිත අවදානමක් තියා ගෙන මහා දැවැන්ත මැදිහත්වීමක් කළා. ඒක මේ වෙලාවේදී බොහොම අගය කරන්න ඕනෑ දෙයක්.

අපේ රජයේ ආයතනවල සේවකයෝ හිඟයි. කෘෂිකර්ම අමාත්‍යාංශයේ ගත්තොත්, කෘෂිසලා විතරක් 3,900ක් හිඟයි. ඉන්න අය වසම් දෙක තුනක වැඩ බලනවා. ඒ අයට වැඩ ගොඩක් ආවා. යම් කෙනෙකුට වැඩ දහයක් කිරීමේ හැකියාව නම් තිබෙන්නේ, සියයකට වැඩියෙන් වැඩ පැටවුණා. ලොකු පීඩනයක් ඇතුළේ මේ අය වැඩ කළා. ඒ තත්ත්වයත් එක්ක කාටවත් හිතා ගන්න බැරි විධියට, රට සම්පූර්ණයෙන්ම උඩු යටිකුරු වෙච්ච පරිසරයක් ඇතුළේ සතියක් හමාරක් ගත වෙනකොට, අපේ රට සාමාන්‍ය තත්ත්වයට ගන්න සමත් වුණා. ඒ වෙනුවෙන් මැදිහත් වුණු හැම කෙනෙක්ම මේ වෙලාවේදී මම නැවත වතාවක් ගෞරවයෙන් මතක් කරනවා.

මේ තත්ත්වයත් එක්ක මම ඊයේ හිටියේ මන්නාරම දිස්ත්‍රික්කයේ. මම ස්ථාන ගණනාවකට ගියා. ඒ ප්‍රදේශවල වැව් අමුණු කැඩිලා බිඳිලා ගිහිල්ලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර වැව්වල bund එක තිබුණු තැනක් හොයා ගන්න නැහැ; bund එකක් නැහැ, ගලවාගෙන ගිහිල්ලා. කුඹුරු නැහැ, ගලවාගෙන ගිහිල්ලා. සමහර කුඹුරු ගංගා බවට පත් වෙලා, ඇළවේලි බවට පත් වෙලා. විශාල හානියක් වෙලා තිබෙනවා. ඒ පරිසරය ඇතුළේ ඉතිහාසයේ කවදාවත් නැති විධියට රජය ඉතා ක්ෂණිකව මැදිහත් වෙලා, ඒ ජනතාව යථා තත්ත්වයට ගන්න

අවශ්‍ය සහන කටයුතු සිද්ධ කරන්න, දැවැන්ත මුදල් කොටසක් නිදහස් කරලා තිබෙනවා. අද මේ කරන්නේත් ඉදිරියේදී ඒ කටයුතු කර ගන්න අවශ්‍ය පරිසරය හදන එකයි. ඒ වෙනුවෙන් දැවැන්ත මැදිහත්වීමක් කරමින් ඉන්නවා. අතීත අත්දැකීම් එක්ක ජනතාවට ලොකු සැක සංකාවක් තිබුණා; "අපි යට වුණා, අපි විනාශ වුණා, ගෙවල් නැති වුණා, මෙතැනින් පස්සේ අපිට මොනවා වෙයිද?" කියන සැක සංකාවෙන් ජනතාව හිටියා. ඒ ජනතාවට යම් කිසි නැවුම් බලාපොරොත්තුවක් ඇති වුණා. පසුගිය 05වැනි දා අපේ ජනාධිපතිතුමා මෙන්න මේ ඉදිරි පෙළ අසුනේ සිට පාර්ලිමේන්තුව අමතන අවස්ථාවේ, ඉදිරි වැඩ පිළිවෙළ මොකක්ද කියලා පැහැදිලි කරනකොට, ඒ ජනතාවට අර දුක වේදනාව මැද්දෙන් සියුම් සතුටක් දැනෙන්න පටන් ගත්තා. අන්න ඒ වැඩ පිළිවෙළ දැන් දියත් කරන්න පටන්ගෙන තිබෙනවා. විපක්ෂයේ සිටින සමහරුන් මොන චෝදනා එල්ල කළත්, මේ වනකොට ඒ ජනතාවට අවශ්‍ය සහන ලැබෙන්න පටන්ගෙන තිබෙනවා කියන එක අපි කියන්න ඕනෑ. ඒ කටයුතු වේගයෙන් සිද්ධ වෙමින් තිබෙනවා. අපේ ඉලක්කය තමයි, ඉතාම කෙටි කාලයක් තුළ රට යථා තත්ත්වයට පත් කරලා, ජන ජීවිත සාමාන්‍ය තත්ත්වයටත් වඩා ඉහළට ගෙන යන එක.

මෙම ව්‍යසනයෙන් කෘෂි කර්මාන්තයට සිදුවෙලා තිබෙන හානිය පිළිබඳ තොරතුරු මට මේ වෙලාවේ ඉදිරිපත් කරන්න පුළුවන්. ඒවා පූර්ණ හානි, අර්ධ හානි සහ සුළු හානි වශයෙන් අපට ගන්න පුළුවන්. සුළු වාරිමාර්ග 1,277කට මේ වනකොට හානි සිද්ධවෙලා තිබෙනවා. ඇළ මාර්ග 3,229කට හානි සිද්ධවෙලා තිබෙනවා. අමුණු 1,277ක් සහ කුඩා වැව් 1,071ක් මේ වනකොට හානියට පත්වෙලා තිබෙනවා. මේ ඔක්කෝම හදන්න ඕනෑ. ඒ වාගේම සැලකිය යුතු ගොවි බිම් ප්‍රමාණයකට පූර්ණ හානි සිදුවෙලා තිබෙනවා, ඒ වාගේම තවත් ගොවි බිම් ප්‍රමාණයකට අර්ධ හානි සිදුවෙලා තිබෙනවා. තවම මේ තොරතුරු ලැබෙමින් පවතිනවා. ඉස්සරහට මේ තොරතුරු තවත් වෙනස් වන්න පුළුවන්. මේ වනකොට ලැබී තිබෙන තොරතුරු අනුව හෙක්ටෙයාර 33,347කට පූර්ණ හානි සිදුවෙලා තිබෙනවා. හෙක්ටෙයාර 9,716කට අර්ධ හානි සිදුවෙලා තිබෙනවා. ඒ වාගේම වගා නොකරපු ඉඩම්වලටත් හානි සිදුවෙලා තිබෙනවා. ඒ අනුව වගා නොකරපු කුඹුරු හෙක්ටෙයාර 1,400කට හානි සිදුවෙලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, වගා නොකරපු නිසා වගා හානියක් සිදු නොවුණත් කුඹුරට හානිවෙලා තිබෙනවා. ඒ නිසා ඒ අයටත් අපි පූර්ණ වන්දිය ගෙවනවා. මොකද, ඒ අයට මේ කන්නය වගා කරගන්න බැරිවන නිසා. මේ තත්ත්වය ඇතුළේ ගොවීන් 25,511 දෙනෙකුට වගා හානිවලට රුපියල් මිලියන 1,499.9ක් මේ වනකොටත් ගෙවලා ඉවරයි. ඉතිරි ගෙවීම් කටයුතු ටික දැන් අපි කරගෙන යනවා. දෙසැම්බර් 31ට පෙර ඒ සියලුම වන්දි මුදල් ටික ගොවි ජනතාවට ලබා දෙන එක තමයි අපේ සැලසුම.

ඒ වාගේම මේ ව්‍යසනයෙන් බඩඉරිඟු සහ අනෙකුත් භෝග හැම එකක්ම විනාශ වෙලා තිබෙනවා. මීට පෙරත් ආපදාවක් ඇවිල්ලා වගා හානියක් සිදුවුණාට පස්සේ ගොවි ජනතාවට වන්දි ගෙව්වේ භෝග හයකට විතරයි. වී, බඩඉරිඟු, අර්තාපල්, ලොකු ලූනු, මිරිස් සහ සෝයා කියන භෝග හයට තමයි වගා හානි වුණාට පස්සේ වන්දි ගෙව්වේ. හැබැයි, මේක දැන් එතැනින් ඉස්සරහට ගිහිල්ලා, සියලුම එළවලු භෝග වර්ගත්, කෙසෙල්, පැණි කොමඩු වාගේ පලතුරු වර්ගත්, ධාන්‍ය වර්ගත් වගා හානි ගෙවීම්වලට ඇතුළත් කරලා තිබෙනවා. ඒ වාගේම ගෙවන වන්දි මුදලත් වැඩි කරලා තිබෙනවා. මෙම ආපදාවෙන් සත්ව ගොවිපොළවල් සෑහෙන ප්‍රමාණයකටත් හානිවෙලා තිබෙනවා. සත්තු විශාල ප්‍රමාණයක් ගහගෙන ගිහිල්ලා තිබෙනවා, මැරිලා තිබෙනවා. අපි ඒ සියලු තොරතුරු ලබා ගන්නවා. අපි මේ රටේ ගොවි ජනතාවට කියනවා, ඔබට, ඔබේ වගා බිමට, ඔබේ සත්ව ගොවිපොළට, කුමන හෝ භෝගයකට හානියක් සිද්ධ වුණොත් අපි ඔබව අතහරින්නේ නැහැ කියලා. ඒ අනුව ඒ හැම දෙයක් සම්බන්ධයෙන්ම රජය විශේෂ අවධානයක් යොමු කර තිබෙන බව මේ අවස්ථාවේදී මම ප්‍රකාශ කරන්න කැමැතියි.

මේ වෙලාවේ විශේෂයෙන්ම මම තවත් කාරණාවක් මතක් කරන්න කැමැතියි. අපි ගොවි ජනතාවට ආචාර කරනවා. මම ඊයේ හිටියේ මන්නාරම දිස්ත්‍රික්කයේ. මන්නාරම දිස්ත්‍රික්කයේ වගා හානි වෙච්ච වගා බිම්වලින්, කුඹුරුවලින් සියයට 75ක් මේ වනකොටත් නැවත වගා කරලා අවසානයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අපේ වීරෝදාර ගොවියා නිකම් ඉන්නේ නැහැ. වගා බිම් හානි වුණත් ඔවුන් ඒ අභියෝගයට මුහුණ දෙනවා. ඔවුන් දැන් නැවත වගාව ආරම්භ කරලා තිබෙනවා. වගා කරන්න බැරි ඒවා අත්හැරලා තිබෙනවා. මේකෙන් සමහර අය කාලකණ්ණි සතුටක් භුක්ති විඳින්න හිටියා. ඒගොල්ලන් මාධ්‍යවලටත් හරි උජාරුවෙන් කිව්වා, ඉස්සරහට ආහාර හිඟයක් එනවා, හාල් හිඟයක් එනවා, එළවලු ඔක්කෝම පිටරටින් ගේන්න වෙනවා, මෙහෙමයි මෙහෙමයි කියලා. ඔබට ඒ කාලකණ්ණි සතුට භුක්ති විඳින්න අපේ රටේ ගොවි ජනතාව කිසිසේත්ම ඉඩ තබන්නේ නැහැ කියන එක මම මේ වෙලාවේ ප්‍රකාශ කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, දශකයක කාල පරාසය අධ්‍යයනය කරලා බලනකොට දැවැන්තම යල අස්වැන්න පසුගිය යල කන්නයේදී අපට ලැබුණා.

එහෙම නම්, ඒ වී තොග අප ළඟ තිබෙනවා. මේ ගංවතුරෙන් ඉතාම සුළු ප්‍රමාණයකට විතරයි වගා හානි වුණේ. මේ මහ කන්නයේ ආරක්ෂා වුණු වගා බිම් ටික අපට තිබෙනවා. අපි ඒවා නැවත වගා කරනවා. ඒ අස්වැන්නත් ඉස්සරහට එනවා. එම නිසා ආහාරවල හිඟයක්, හාල්වල හිඟයක් එන්න විධියක් නැත. එවැනි හිඟයක් එන්න ඉඩ තබන්නේද නැත. විශේෂයෙන්ම බිත්තර, මස් ආදී දේවල් ගත්තොත්, ඒ සම්බන්ධයෙන් මේ වනකොට අපට අභියෝගයක් තිබෙනවා. රටට ප්‍රධාන වශයෙන් බිත්තර සපයන අක්‍රම් මහත්මයාගේ ගොවිපළවලටත් මෙවර විශාල හානියක් සිද්ධවෙලා තිබෙනවා. ඒකේ යම් බලපෑමක් තිබෙනවා. නමුත්, මේ සියල්ල යථා තත්ත්වයට ගන්න අපි විශාල මහන්සියක් දරමින් ඉන්නවා. ඒ තත්ත්වය ඇතුළේ අපි අනිවාර්යයෙන්ම කියනවා, මේ වනකොට ගෙවල් අහිමි වුණු අය, ගෙවල්වලට අර්ධ හානි වුණු අය, දේපළ හානි වුණු අය, කර්මාන්තවලට හානි වුණු අය, ගොවි බිම්වලට හානි වුණු අය වාගේම අනෙකුත් සෙසු සියලු දේවල්වලට හානි වුණු අය ඇතුළු මේ හැම කෙනෙක් පිළිබඳවම සැලකිල්ලට අරගෙන රජය මේ වනකොට තීන්දු තීරණ අරගෙන තිබෙන බව.

විපක්ෂයෙන්ම කිව්වා, රාජ්‍ය භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා යනවා කියලා. රාජ්‍ය භාණ්ඩාගාරය පිරිලා ඉතිරිලා යන්නේ මූල්‍ය විනයක් තිබුණු නිසායි, මූල්‍ය කළමනාකරණයක් තිබුණු නිසායි. මූල්‍ය විනයක් සහිතව ඒ කළමනාකරණය නිසියාකාරව කරපු නිසා තමයි ආපදාවක් හේතුවෙන් මෙතෙක් කිසිම ආණ්ඩුවක් යටතේ ජනතාවට නොලැබුණු විශාල මුදල් ප්‍රමාණයක් මෙවර ජනතාවට සම්ප්‍රේෂණය කරන්න අපට හැකියාව ලැබුණේ. රටේ ඉදිරි සංවර්ධන වැඩ ඇතුළු කිසිම දේකට බාධාවකින් තොරව අපට එතැනට යන්න පුළුවන් වුණේ අවුරුද්දක් වාගේ කෙටි කාලයක් තුළ ආණ්ඩුවක් විධියට නිසියාකාරව රාජ්‍ය භාණ්ඩාගාරය කළමනාකරණය කරපු නිසායි. හැබැයි, ඒගොල්ලන් කළේ ඒගොල්ලන් අතරේ බෙදාගත් එක.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Deputy Minister, your time is up.

**ගරු නාමල් කරුණාරත්න මහතා**
(மாண்புமிகு நாமல் கருணாரத்ன)
(The Hon. Namal Karunaratne)

මම ඉක්මනින් කථාව අවසාන කරනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

ඒගොල්ලන් ජනාධිපති අරමුදලේ මුදල් බෙදාගත්තා. ගිනි වන්දි කියලා ගෙවල්වලට රුපියල් කෝටි ප්‍රකෝටි ගණන් වන්දි ගත්තා; insurance එකෙන් වෙනම ගත්තා. ඊට අමතරව රජයේ ගෙවලුත් ගත්තා. ඒගොල්ලන් ඇති පදම් බෙදාගත්තා. හැබැයි, වර්තමාන ආණ්ඩුව මොකක්ද කරන්නේ? ජනතාවට බෙදනවා. මෙන්න මේක දකින්න බැරිව කඩි කුලප්පුව හැදිලා සමහරුන් නොයෙක් දේවල් ප්‍රකාශ කරනවා. ඒ අය ප්‍රකාශ කරන දේවල් අපි ගණන් ගන්නේ නැහැ. අනිවාර්යයෙන්ම අපි මේ ගමන යනවා. රට තිබුණු තැනින් උඩට අනිවාර්යයෙන්ම අපි ගන්නවා. අපි රජය විධියට, ආණ්ඩුව විධියට ඒ සඳහා අනිවාර්යයෙන්ම මැදිහත් වනවා කියන කාරණය මතක් කරමින් මා නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)

The Hon. Hector Appuhamy. You have six minutes.

[අ.භා. 12.04]

**ගරු හෙක්ටර් අප්පුහාමි මහතා**
(மாண்புமிகு ஹெக்டர் அப்புஹாமி)
(The Hon. Hector Appuhamy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමාට ස්තුතිවන්ත වනවා. විශේෂයෙන්ම මුළු රටම අවදානමකට ලක් වූ අවස්ථාවේදී ජනතාව වෙනුවෙන් රුපියල් බිලියන 500ක පරිපූරක මුදලක් වෙන් කිරීම සම්බන්ධව සතුටු වන ගමන්, ඒ සම්බන්ධව ස්තුතිවන්ත වෙමින් තමයි මම කථාව කරන්නේ.

අපේ දිස්ත්‍රික්කය ගත්තොත්, අපේ දිස්ත්‍රික්කයට අයත් ආසන පහටම මේ ගංවතුර උවදුර බලපෑවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, එහි තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, ඔබතුමා කියපු කථාවේ ඉතිරි ටික. අපි දන්නවා, මේ අවස්ථාවේදී සිවිල් ජීවිතවලට, ජනතාව සාමාන්‍යයෙන් ජීවත් වන ක්‍රමවේදයට ප්‍රශ්නයක් වුණා වාගේම ආර්ථිකයටත් දැවැන්ත බලපෑමක් සිද්ධ වුණු බව. ආර්ථිකයට බලපෑමක් සිද්ධ වනකොට විශේෂයෙන්ම මතක තබා ගත යුතු කාරණා කිහිපයක් තිබෙනවා. අපේ ප්‍රදේශය ගත්තොත්, විශේෂයෙන්ම කර්මාන්තකරුවන්ගේ, නිෂ්පාදකයන්ගේ, අපනයන ක්ෂේත්‍රයේ ඉන්න බොහෝදෙනාගේ රුපියල් කෝටි 9, 10, 15, 20 වටිනාකමින් යුතු වත්කම් විනාශයට පත් වුණා. මේ දේවල් නැවත වතාවක් යථා තත්ත්වයට ගැනීම පහසුයි කියලා හිතන්න එපා. මේ අවස්ථාවේදී කඩා වැටෙන්නේ කර්මාන්තකරුවන් පමණක් නොවෙයි. ඒ කර්මාන්තකරුවාගේ පසුපස යැපෙන්නන් රාශියක් ඉන්නවා. වැඩ කරන අය විතරක් නොවෙයි, යැපෙන්නන් රාශියක් ඉන්නවා. ඒ කර්මාන්තකරුවා කඩා වැටෙනකොට ඔවුනුත් කඩා වැටෙනවා. කර්මාන්තකරුවාගෙන් සමාජයත් යැපෙනවා. කර්මාන්තකරුවන් කඩා වැටෙන විට ඔවුන්ගෙන් යැපෙන අයගේ සියලු දේවල් නතර වනවා. තව මාස තුනක්, හතරක් යනකොට තමයි මේ බලපෑම එන්නේ. මේ අයගේ බැංකු ණය තිබෙනවා. මේ අයගේ ලීසිං තිබෙනවා. මේ ප්‍රශ්න ඔක්කෝටම මේ අය මුහුණ දෙන්න ඕනෑ. එම නිසා ආණ්ඩුව මේ ගැටලුවට විධිමත් වැඩ පිළිවෙළක්, සැලැස්මක් සැදිය යුතුයි. වර්තමානයේදී - මේ අවස්ථාවේදී - දෙන දේ විතරක් නොවෙයි, ඒ කරුණු පිළිබඳවත් අපි අවධානය යොමු කරන්න ඕනෑ.

අපේ ප්‍රදේශයේ තිබෙන පොල් කර්මාන්තය, කොහු කර්මාන්තය, ඉස්සන් කර්මාන්තය, විශේෂයෙන්ම ලුණු කර්මාන්තය ඇතුළු මේ කර්මාන්ත ප්‍රධානකොට ගත්තාම, පුත්තලම දිස්ත්‍රික්කයේ ආසන පහේම ඒ කර්මාන්තවලට මේ ආපදාවෙන් බලපෑම් ඇති වුණා. මේ බලපෑම් වුණු අය ගත්තොත්, අපනයන ක්ෂේත්‍රයේ නියුතු විශාල පිරිසක් ඉන්නවා. පොල් කර්මාන්තය, කොහු කර්මාන්තය ඒ වාගේම ලුණු කර්මාන්තය කියන ක්ෂේත්‍ර සියල්ලම ගත්තොත්, ඒ තුළ value-added නිෂ්පාදන ගොඩක් තිබෙනවා. ඒ නිසා අපනයන ක්ෂේත්‍රයේ ඉන්න කණ්ඩායම් කඩා වැටුණාට පසුව ඒගොල්ලන් ඒ රටවලුත් එක්ක වැඩ කටයුතු කරද්දී ප්‍රශ්නයක් මතු වෙනවා.

විශේෂයෙන්ම කල්පිටිය ප්‍රදේශය ගත්තත් එහෙමයි. දැන් නාමල් කරුණාරත්න නියෝජ්‍ය ඇමතිතුමා කිව්වා, වී ගොවිතැනට අවශ්‍ය කරන මුදල් ප්‍රතිපාදන ලබා දීලා, ඒ කටයුතු පටන් ගන්න සහයෝගය ලබා දෙනවා කියලා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කල්පිටියේ භෝග වගා කරන ප්‍රදේශ සම්පූර්ණයෙන් වතුරෙන් යට වෙලා. තව මාස තුනක්වත් යනවා, ඒ වතුර ටික හිඳෙන්න. එතකොට මොකද වෙන්නේ? කල්පිටිය ප්‍රදේශයේ වගා කරන තැන්වල වැඩ කරන කම්කරුවන්ට මේ නත්තල් කාලයේ, අවුරුදු කාලයේ රැකියාව නැතුව යනවා. සමහර වෙලාවට ඒ අය ඉන්න තැන් වතුරින් යට නොවෙන්න පුළුවන්. හැබැයි, වතුරින් යට වුණාට වඩා බරපතළ ප්‍රශ්නයකට ඔවුන් මුහුණ දෙන්න පුළුවන්. ගෙදර වතුරින් යට වෙලා නැත්නම් රුපියල් 25,000 හම්බ වෙන්නේත් නැහැ; රුපියල් 50,000 හම්බ වෙන්නේත් නැහැ. හැබැයි, ගෙදර වටේම වතුරින් යට වෙලා මැද ගේ තිබෙනවා නම්, කිසි වැඩක් කරගන්න බැරි නම්, ඔහු බරපතළ හා අවාසනාවන්ත විධියට ප්‍රශ්න ගොඩකට මුහුණ දෙනවා. ඒ නිසා මම විශ්වාස කරනවා, ආණ්ඩුව මේ සම්බන්ධව විධිමත් වැඩ පිළිවෙළක් හදයි කියලා. එහෙම නොවුණොත් මේ කාරණාවේදී බරපතළ විධියට කඩා වැටෙන්නේ ජන සමාජයයි කියන එක මතක තබා ගන්න.

මේ අවස්ථාවේදී තවත් කාරණාවක් මම කියන්න ඕනෑ. මේ ව්‍යසන අවස්ථාවේදී විදෙස්ගත ශ්‍රී ලාංකිකයින් විශාල වශයෙන් ලංකාවට උදවු කළා. බොහෝ වෙහෙසිලා තමුන්ගේ මුදල් වෙන් කරගෙන, ඒ ප්‍රතිපාදන එකට එකතු කරලා, ඔවුන් භාණ්ඩ වශයෙන් වාගේම මුදල් වශයෙන් අපේ රටට එව්වා. හැම විධියකින්ම ඔවුන් ලංකාවට උදවු උපකාර කළා.

මේ අවස්ථාවේදී මම මේ කාරණයත් මතක් කරනවා. කැනඩාවේ ඇල්බර්ටා ප්‍රාන්තයෙන් එවා තිබෙනවා, කිලෝග්‍රෑම් 5,876ක භාණ්ඩ. ඒ භාණ්ඩ ප්‍රවාහනය සඳහා ඩොලර් 26,442ක් වියදම් කරලා තිබෙනවා. එහෙම මුදල් වියදම් කරලා භාණ්ඩ එව්වත් ඒවා තවමත් තිබෙන්නේ ගබඩාවල. ඒ භාණ්ඩ තවම ජනතාවට ලබා දීලා නැහැ. ඇත්තටම සමහර විට සෘණ 22ක වාගේ සීතලේ ඉඳගෙන තමයි ඒගොල්ලන් ඒ භාණ්ඩ ටික එකතු කරගෙන අපේ රටට එවා තිබෙන්නේ. හැබැයි, ඒ භාණ්ඩ එවද්දී ඒ අය නම් කර එවනවා, මේ මේ අයට දෙන්න කියලා. මොකද, ඒ අයගේ හැඟීමක් වාගේම ආසාවක් තිබෙනවා, ඒ භාණ්ඩ ටික හරියට බෙදුණා, අපි ඒක දැක්කා කියලා. ඒ භාණ්ඩ බෙදනවා දැක්කාම ඒගොල්ලන් සතුටු වෙනවා, ඒගොල්ලන්ගේ මහන්සියට ප්‍රතිඵලයක් ලැබුණා කියලා. මේ ව්‍යසනයේදී මුළු ලෝකයම මේ රටට එවපු භාණ්ඩ සම්බන්ධව යම් විශේෂ වැඩසටහනක් සකස් කරන්න කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලනවා. ඒ විතරක් නොවෙයි, විදේශගත වෙලා ඉන්න ශ්‍රී ලාංකිකයින් ලංකාවට එවපු භාණ්ඩ ටික හරියට බෙදුණාද කියලා සම්පූර්ණයෙන්ම විමසා බලන්න කියාත් අපි ඉල්ලනවා. මොකද, දැනටත් ඔරුගොඩවත්ත අංගණයේ විශාල බඩු ප්‍රමාණයක් නිකම් අත්හැර දමා තිබෙනවා. සමහර භාණ්ඩ ඉතා ඉක්මනින් කල් ඉකුත් වෙනවා. ඒ අය විශාල

මුදලක් වියදම් කරලා එවපු භාණ්ඩ කල් ඉකුත් වෙලා කියලා වීසි කර දැම්මොත් ඒක අපරාධයක්. එහෙම වුණොත් ඒ ශ්‍රී ලාංකිකයින්ට අපේ ලංකාව ගැන තිබෙන ආසාව, හැඟීම නැතුව යාවි. මොකද, ඒගොල්ලන් විශාල බලාපොරොත්තුවකින් තමයි තමන්ගේ මිත්‍රයාට, නෑදෑයින්ට, හිතවතාට ඒ භාණ්ඩ එවා තිබෙන්නේ. එහෙම එවපු භාණ්ඩ රැක ගැනීම සහ විධිමත් පරිදි ඒවා බෙදා හැරීම ඉතාම වැදගත් කියන එක මම මතක් කරනවා. ඒ නිසා මම විශේෂයෙන්ම ඉල්ලනවා, මෙතැන වගකීම් දරන කවුරු හරි ඉන්නවා නම් විශේෂ වැඩ පිළිවෙළක් සකස් කරලා කැනඩාවේ ඇල්බර්ටා ප්‍රාන්තයෙන් එවා තිබෙන භාණ්ඩ බෙදා දීමේ කටයුත්ත ක්‍රියාත්මක කරන්න කියලා. ඒ භාණ්ඩ බෙදා හැරීමේදී ඒවාට මැදිහත්වීම සම්බන්ධයෙන් ග්‍රාම නිලධාරි මහත්වරු අපට ප්‍රශ්න රාශියක් කියනවා; රාජ්‍ය නිලධාරින් ප්‍රශ්න රාශියක් කියනවා. සමහර වෙලාවට භාණ්ඩ බෙදා දීමේදී සිද්ධ වන අක්‍රමිකතා සම්බන්ධයෙන් ප්‍රශ්න රාශියක් මතු වෙලා තිබෙනවා. මේ පිළිබඳව අපි ඔබතුමන්ලාට ඇඟිල්ල දිගු කරනවා නොවෙයි. අපි ඔබතුමන්ලාට කියනවා, මේ දෙන පණිවුඩයත් සැලකිල්ලට අරගෙන මේ සම්බන්ධයෙන් එක එක විධියට උත්තර දෙන්නේ නැතුව හරියට විමසා බලා ජනතාව වෙනුවෙන් මේ භාණ්ඩ බෙදා දීම සඳහා සැලසුම් සහගත වැඩ පිළිවෙළක් හදන්න කියලා.

අවසාන වශයෙන් මට මේ කාරණයත් කියන්න ඉඩ දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. චමින්ද හීනටිගල කියන්නේ, මේ පාර්ලිමේන්තුවේ වැඩ කරන සහෝදර නිලධාරියෙක්. ඔහුගේ පුතා තමයි, චාමික හීනටිගල. ඊයේ පැවැති අවුරුදු 19න් පහළ ක්‍රිකට් තරගයේදී ඔහුගේ පුතා තමයි අවසාන හයේ පහර ගහලා ශ්‍රී ලංකාවට semi-final යන්න අවස්ථාව ලබා දුන්නේ. ඒ නිසා මම විශේෂ ස්තුතියක් පළ කරනවා, ඔහුගේ පුතාට වාගේම ශ්‍රී ලංකා පාර්ලිමේන්තුවේ අපිත් එක්ක ඉන්න ඒ සහෝදර නිලධාරියාට. ඒ ජයග්‍රහණයේ ප්‍රතිඵලය අරගෙන දුන්නේ ඔහුගේ පුතා විසිනුයි. එම නිසා ඒ වෙනුවෙන් අපි ඒ පුතාට සුබ පතමින් ඒ ජයග්‍රහණය අපේ රටට ලබා දීම සම්බන්ධයෙනුත් ස්තුතිවන්ත වෙනවා. මට මේ අවස්ථාව ලබා දුන්නාට ඔබතුමාටත් බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Ravindra Bandara. You have ten minutes.

[අ.භා. 12.11]

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපි රජයක් ලෙස සුවිශේෂී විධියට ආර්ථික ස්ථායීකරණය ඇති කරලා, ආර්ථික ජයග්‍රහණ ලබමින් ඉදිරියට යන වෙලාවක මේ "දිට්වා" සුළි කුණාටුව ආවත්, ඒක අභියෝගයක් කර නොගෙන තමයි මේ පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරලා තිබෙන්නේ. විශේෂයෙන්ම කියන්න ඕනෑ, මම කථා කරන මේ මොහොතේදීත් ඒ ප්‍රදේශවලට වර්ෂාව පවතින බව. අපි දැක්කා, ඊයේත් කාලගුණයේ වෙනස්කම් තිබුණු බව. මේ අභියෝගය ජයග්‍රහණය කරන්න මේ මොහොතේදීත් වැස්සේ වැඩ කරන රාජ්‍ය නිලධාරින් ඉන්නවා; ග්‍රාම නිලධාරි මහත්වරු ඉන්නවා; ප්‍රාදේශීය ලේකම්වරු ඉන්නවා; ඒ වාගේම යුද හමුදාව, සිවිල් ආරක්ෂක බලකාය, පොලීසියට අනුයුක්තව සේවය කරන අය ඉන්නවා. ඒ සියලු දෙනාට වාගේම ස්වේච්ඡාවෙන් වැඩ කරන සහන සේවා බලකායේ සියලු දෙනාටම ඒ වෙනුවෙන් මගේ ප්‍රණාමය මේ අවස්ථාවේදී පළ කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආපදාව නිසා මිනිස්සු ව්‍යසනයට පත් වුණා වාගේම අද මේ කරන කථා තුළත් අපිට පෙනෙනවා, විශේෂයෙන්ම විපක්ෂය මේකෙන් ආපදාවට ලක් වෙලා තිබෙනවාය කියලා. අද අපි දැක්කා, දිවා ආහාර විවේකය සඳහා වෙන් කර තිබෙන ඒ පැය භාගයත් අරගෙන කථා කරමු කියලා ඉල්ලනවා. මීට පෙර අවස්ථාවලදීත් මම දැකලා තිබෙනවා, විශේෂිත අවස්ථාවල, කෑමට වෙන් කර තිබෙන ඒ පැය භාගයත් ගනිමු, රෑත් රැස් වෙමු කියලා විපක්ෂය ඉල්ලනවා. හැබැයි, මීට කලින් එහෙම ඉල්ලපු අවස්ථාවලදීත් කෑමට වෙන් වෙලා තිබුණු පස් වරු 12.30න් පසුව එක් කෙනෙකුවත් සභාවේ රැඳී හිටියේ නැති බව මට මතකයි. ඒ කථාව කරන කෙනා හැර එක්කෙනෙක්වත් සභාවේ රැඳී ඉන්නේ නැහැ. අද දවසේත් එහෙමයි. මේ වෙලාවේදී වුණත් අතේ ඇඟිලි ගාණට අඩුවෙන් තමයි ඒ කථා කරපු අයගේ පක්ෂයේ අය මේ සභාවේ නියෝජනය වෙන්නේ. ඒක තමයි වෙන දේ. Voice-cut එකක් ගන්නවා. නමුත්, සභාවේ රැඳී සිටින්නේ නැතුව යනවා. ඒ වාගේම තවත් අය කිව්වා, මේක එහෙම නොවෙයි, පාර්ලිමේන්තුව රැස් කරලා මේ ගැන කථා කරන්න කියලා. ඒ අය එහෙම කිව්වේ අපේ මන්ත්‍රීවරු ඇතුළු සියලු දෙනා බිම් මට්ටමට බැහැලා වැඩ කටයුතු කරන වේලාවේදීයි. එහෙම කියපු කෙනා මේ වෙලාවේදීත් සභාවේ නැහැ නේ. එතුමා ඊයේ සභාවට කථාව කරන වේලාවට ඇවිල්ලා විනාඩි 10ක්ද කොහේද කථා කරලා, ඊළඟ කථාවටවත් සවන් දෙන්නේ නැතුව ගියා. අදත් එහෙමයි. ඕක තමයි මම හිතන්නේ රටේ ජනතාව දැනගන්න ඕනෑ දේ. මොකද, මේ වාගේ වේලාවක මේ අර්බුදය කළමනාකරණය කිරීම කියන කාරණයේදී අපි දන්නවා, අද මේ රජය ගෙන යන වැඩ පිළිවෙළට හැමෝගේම විශ්වාසය තහවුරු වෙලා තිබෙන බව. ඒ විශ්වාසයත් එක්ක තමයි අපි ඉස්සරහට යන්නේ.

ඇත්තටම අපේ දිස්ත්‍රික්කය ගැන විශේෂයෙන් මම කථා කරන්න ඕනෑ. ඊයේ අපේ සමන්ත විද්‍යාරත්න ඇමතිතුමාත් ඒ ගැන කථා කළා. අපි මේ ආපදා අවස්ථාවේදී මුලින්ම බැලුවා, මිනිස්සුන්ගේ ජීවිත ටික බේරා ගන්න. ඊට පස්සේ පාරවල් ටික clear කරලා, ඒ වෙලාවේදී ළඟා වෙන්න බැරිව තිබුණු ගම්වලට ළඟා වෙන්න පුළුවන් වන විධියට ඒ පාරවල් සකස් කර ගන්න අපි කටයුතු කළා.

ඒ වාගේම අපි පසුකාලීනව දැක්කා, වාරි පද්ධතියට වෙච්ච හානිය. විශේෂයෙන්ම බදුල්ල දිස්ත්‍රික්කයේ වාරි පද්ධතිය සම්පූර්ණයෙන් වාගේ විනාශ වෙලා. වැව් අමුණු සහ ඇළ මාර්ග 1,300කට අධික ප්‍රමාණයක් විනාශ වෙලා. එලෙස විනාශ වෙච්ච වැව් අමුණු සහ ඇළ මාර්ග ටික පිළිසකර කරන්න "අධිෂ්ඨානයේ මහිම" කියලා මහා ශ්‍රම මෙහෙයුමක් පටන් ගත්තා. රාජ්‍ය නිලධාරින්, යුද හමුදාව, සිවිල් ආරක්ෂක බලකායට අතිරේකව දවසට 5,000කට අධික පිරිසක් ස්වේච්ඡාවෙන් ඒ වෙනුවෙන් ශ්‍රමය ලබා දෙනවා. එවැනි ආකාරයෙන් තමයි මේ වැඩ පිළිවෙළ සිද්ධ වෙන්නේ. මම කථා කරන මේ වේලාවේදීත් මහ වැස්සේ ඒගොල්ලන් වැඩ කරනවා.

උමා ඇළ මාස තුන හතරක් යනකම් ගොඩගන්න බැහැ, මේ කන්නය වගා කරන්න බැහැ, වෙනත් භෝගවලට යන්න වෙයි වාගේ කථා කියන වටපිටාවක් තිබියදී දවස් 12ක් තුළ ඒ කටයුතු අපි නිමා කළා. ඒ කටයුතු නිමා කරපු එක අගය කරනවා වෙනුවට ගොඩක් අය වෙනත් දේවල් ගැන කියනවා අපි දැක්කා. විනාශ වුණු උමා ඇළ හැදීමේ කටයුතු ආරම්භ කරමින් පළමුවන දවසේ පිරිත් සජ්ඣායනා කරන්න භික්ෂූන් වහන්සේලා වැඩම කරලා හිටියා. නමුත්, එහි වැඩ පටන් ගත් දවසේ භික්ෂූන් වහන්සේලාත් අඳනකඩය පිටින් ඇවිල්ලා වැඩ කළා. ඒ වාගේම එහි කටයුතු නිමා කරලා පෙරේදා දියවර දෙනකොට ඒ භික්ෂූන් වහන්සේලා වැඩම කරලා නැවත පිරිත් සජ්ඣායනා කළා. ඒ අවස්ථාවේදී තමයි පිරිත් පැන් උමා ඇළට එකතු කළා කියන එකක් ගැන

[ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා]

විවේචනය කරන්නේ. පිරිත් සජ්ඣායනා කරලා ඒ වැඩේ නිමා වුණාට පසුව තමයි එහෙම කළේ. ඒක කලින් සිද්ධ වුණා වාගේ මුට්ටි පා කරපු, පැණි බිව්වා වාගේ විද්‍යාත්මක ක්‍රමයට නැතුව අවිද්‍යාත්මක වැඩ පිළිවෙළක් එක්ක, ඒ කියන්නේ, වැඩක් කරලා නොවෙයි, වැඩට ආශීර්වාද කරන්න දෙවියෝ ඇවිල්ලා හීනෙන් කිව්වා, මම හීන දැක්කා වාගේ කියපු වටපිටාවක් තමයි එතැන තිබුණේ. නමුත්, අපි ඒක කළේ ප්‍රායෝගිකව වැඩ කරලා. මේ හැම තැනකදීම අපි ගොඩක් වෙලාවට temporary solutionsවලට යනවා. මොකද, කන්නයට අවශ්‍ය වතුර ටික දුන්නේ නැත්නම්, උමා ඇළ ව්‍යාපෘතිය කරන්න බැරි වුණා නම් මොකක්ද වෙන්නේ? අක්කර 2,005ක් කියලා තමයි කියැවෙන්නේ. නමුත්, ඇත්තටම ගණනය කරලා බැලුවාම මේ නිසා වී වගාව, උඩරට එළවලු වගාව අක්කර 3,000කට වඩා වගා කරන්න බැරි වෙනවා. එතකොට උඩ රටින් එන කැරට් ටික, බීට් රූට් ටික, අල ටික නැති වෙනවා; වී වගාවට හානි වෙනවා.

ඊළඟට, මහා වාරිමාර්ග ව්‍යාපෘති 18කට මේ ආපදා තත්ත්වය නිසා හානි වෙලා තිබෙනවා. ඒකෙන් ව්‍යාපෘති 4ක් ගැන කියැවුණා, මේ කන්නයට වතුර දෙන්න බැහැ කියලා. නමුත්, අද ස්වේච්ඡා බලකායන් ඇවිල්ලා වැඩ කරලා කියනවා, කෙසේ හෝ මේ කන්නයට වතුර දෙනවා කියලා. වැලි කොට්ට ගහනවා. සමහර තැන්වල වැලි කොට්ට 10,000 ගහලා තිබෙනවා; වැලි කොට්ට 7,000 ගහලා තිබෙනවා. එතකොට කියනවා, වැලි කොට්ට ගහන එක නොවෙයි විසඳුම, soil nailing වාගේ ඒවා තමයි කරන්න ඕනෑ කියලා. ඇත්ත. නමුත්, අපි මේ වෙලාවේ දෙන්න ඕනෑ විසඳුම ලබා දීලා ගොවීන්ට මේ කන්නයේ වගා කරන්න අවශ්‍ය වතුර ටික දෙන්න තමයි උත්සාහ කරන්නේ. ඊට පසුව තමයි අපි ඉංජිනේරුමය විසඳුම්වලට යන්නේ. ඒ වාගේ විසඳුම් ලබා දෙනවා. නමුත් මේ වෙලාවේ කරන්නේ මේ වෙලාවේ කළ යුතු දේවල්. කන්දක් නාය යනවා නම්, ඒක මේ වෙලාවේ වළක්වන්න පුළුවන් ක්‍රමයට ඒක වළක්වනවා.

අපි දැක්කා, සමහර කඳුවල පැල්මවල් වහන්න විශේෂිත මැටි වර්ග තමයි යොදා ගත්තේ. ඒ වාගේම කෙඳි, කොහු වාගේ දේවල් ද යොදා ගන්න පුළුවන්. විද්‍යාත්මක ක්‍රමවේදයක් ඔස්සේ තමයි ඒ දේවල් කළේ. එහෙම නැතුව ගල් දමා තළා, කොන්ක්‍රීට් දමා තළා පීඩනය වැඩි වන විදියට නොවෙයි, ඒවා කළේ. ඒ වෙලාවේ අපි ගත්තේ වතුර යන එක වළක්වන්න අවශ්‍ය විසඳුම. ඒ විදියට තමයි ඒ කටයුතු සිදු කළේ. එවැනි කටයුතු කළ නිසා තමයි මහජනතාව අතරේත් ලොකු ප්‍රසාදයක් ඇති වුණේ.

ඔබතුමන්ලා කියන දේවල් මෙච්චර කාලයකට වුණේ නැහැ නේ. ආර්ථිකය වැටෙනවා කිව්වා, ආර්ථික ස්ථායීකරණය ෆේල් වෙනවා කිව්වා. බලන්න, ඉතිහාසය එක්ක ගත්තාම විදෙස් ප්‍රේෂණ වැඩියෙන්ම ලැබුණු අවුරුද්ද බවට මේ අවුරුද්ද පත් වෙලා තිබෙනවා. වැඩිම සංචාරකයින් පිරිසක් පැමිණි අවුරුද්ද බවට මේ අවුරුද්ද පත් වෙලා තිබෙනවා. ආර්ථික ඉලක්ක කරා ගිහින් තිබෙන නිසා සංචාරකයින්ගේ විශ්වාසය, විදේශගත අයගේ විශ්වාසය, ජනතාවගේ විශ්වාසය දිනාගෙන තිබෙනවා. ඒ අනුව බලද්දී, ඔයගොල්ලන් කියපු දේවල් මොකුත් වුණේ නැහැ නේ. පන්සලට දානය ටික හම්බ වෙන එකක් නැහැ කිව්වා. පෙරහැර නැති වෙයි කිව්වා. ආර්ථිකය වැටෙයි කිව්වා. ආයෙත් පෝලිම් ඇති වෙයි කිව්වා. ඊයේත් කිව්වා, ආයෙත් ගෑස් පෝලිම් ඇති වෙයි කියලා, නේද? පට්ටපල් බොරු කියනවා. ඒ කියපු අයම කලිනුත් එහෙම කිව්වා නේ, නේද? අහවල් මාසයේ ඉඳලා ඩොලර් එකේ වටිනාකම රුපියල් 400ක් වෙනවා කිව්වා. එළියේ ඉන්නා අයත් කියනවා, අප්‍රේල්වල ආර්ථික අර්බුදයක් එනවා කියලා. හැබැයි, ඒ මොකුත් නැහැ. බොහොම ලස්සනට වැඩ ටික කෙරීගෙන යනවා.

අපි විශේෂයෙන්ම කියන්න ඕනෑ, රාජ්‍ය නිලධාරින් සම්බන්ධ වෙලා තමයි මේ සියලු දේවල් සැලසුම්සහගතව කරගෙන යන්නේ කියන එක. එහෙම සම්බන්ධ වෙලා එකමුතුව වැඩක් කරනකොට තමයි ඒ වැඩේ ලස්සන වෙන්නේ. ඒක තමයි අද ලබා දී තිබෙන ආදර්ශය. ගොඩක් වෙලාවට අපි ආපදා කළමනාකරණ කමිටුව රැස් වෙන්නේ රාත්‍රී 7ට පමණ. ඒක ඉවර වෙනකොට, රෑ 12 වාගේ වෙනවා. අන්න ඒ වාගේ වැඩ පිළිවෙළක් එක්ක යද්දීත් තමයි ගොඩක් වෙලාවට මේ වාගේ විවේචන සිදු කරන්නේ.

දැන් කියනවා නේ, මේක කල් ඇතිව දැන ගත්තා, දැනුම් දුන්නා කියලා. අර පාස්කු ප්‍රහාරය එල්ල වුණු වෙලාවේ කියපු කතන්දර වාගේ ඒවා මෙතැනත් කියනවා. ඒ සියල්ල මේ මොහොත වෙනකොටත් බොරු කයිවාරු විතරයි කියලා ඔප්පු වෙලා තිබෙනවා. ඊළඟට කියනවා, යන්ත්‍ර සූත්‍ර වෙලාවට දුන්නේ නැහැ වාගේ කථා. නමුත් සමහර ප්‍රාදේශීය සභාවල තිබෙන්නේ එකම එක බැකෝ යන්ත්‍රයයි, සමහර තැන්වල එක ජේසීබී යන්ත්‍රයයි තිබෙන්නේ. ඒවාත් එළියට ගන්න බැහැ, දෙපැත්තෙන් කඳු කඩාගෙන ඇවිල්ලා. ඒ වුණත් අද වනවිට නොයෙක් තැන්වලින් ස්වේච්ඡාවෙන් ඒ කටයුතු කිරීමට ඉදිරිපත් වෙලා තිබෙනවා. සමහරු පරිත්‍යාග කර තිබෙනවා, යන්ත්‍ර. ඒවා යොදාගෙන වැඩ කරනවා. මිනිස් ශ්‍රමයත් තිබෙනවා.

ඔබතුමන්ලාට මතක ඇති, මීට කලින් මීතොටමුල්ල කුණු කන්ද නාය ගිය අවස්ථාව. ඒකට මිනිස්සු යට වෙලා කෑ ගහද්දී යන්ත්‍රයක් යොදා ඒවා ඉවත් කරන්න බැරි වුණා. පසුව මිනිස්සු උද්ඝෝෂණය කරනකොට, ඒ අයට පහර දුන්නා. මීරියබැද්ද නාය ගියා. ඒ කාලයේ ඒවාට මුහුණු දුන් ආකාරය අපි දැක්කා. ඒ වාගේ තත්ත්වයක් තමයි අතීතයේ තිබුණේ.

මම නියෝජනය කරන්නේ හපුතලේ. හපුතලේ, කබරගල කන්ද නාය ගියා. අපි බලයට එන්න කලින් ඒ වතු ජනතාව සිටියේ මොන වාගේ තත්ත්වයකද? ඒගොල්ලන් තාවකාලිකව දමා තිබුණේ අත් හැර දමපු ටී ෆැක්ටරි එකකට. ඊට පසුව දැන් තමයි ඒගොල්ලන්ගේ නිවාස ටික හැදෙන්නේ. අන්න එහෙමයි ඒ කාලයේ ක්‍රියා කර තිබුණේ. නමුත් ඒ පැවති ක්‍රමය වෙනස් කර අපි දැන් කටයුතු කරනවා.

ඊයේ එක මහත්මයෙක් කිව්වා, ඩොලර් එක වැඩි වෙනවා කියලා. නමුත් මෑත ඉතිහාසය තුළ ඩොලර් එක අඩුවෙන්ම විචලනය වුණේ මේ අවුරුද්දේ. ඒ නිසා මම කියන්න කැමැතියි, ඒ දත්ත එක්ක කථා කරන්න කියලා. අපිට ඩොලර් බිලියන 6ක සංචිත තිබෙනවා. ඒ වාගේම රුපියල් ට්‍රිලියනයක සංචිත තිබෙනවා කියනකොට, හිනා වුණා. නමුත් දැන් තේරුම් යනවා නේද, එහෙම සංචිතයක් තබා ගැනීමේ වැදගත්කම? මොකද, මේවා කළමනාකරණය කිරීමට එය ප්‍රයෝජනවත් වුණා. එය ඉතාම පැහැදිලියි. ඒ නිසා බොරු චෝදනා කරන්නේ නැතුව මේ අවස්ථාවේ බැහැලා වැඩ කරන්න කියලා මම ඒ අයට කියනවා. මම කියන්නේ, විපක්ෂයට මේ වෙලාවේ ඒකට හොඳ අවස්ථාවක් තිබෙනවා කියලායි. 1,300 ගණනක් වාරි ව්‍යාපෘති තිබෙනවා. "අපි වාරි ව්‍යාපෘතියක් භාර ගන්නවා" කියලා අඩු ගණනේ එක වාරි ව්‍යාපෘතියක් හෝ භාරගෙන කටයුතු කළා නම්, - ඒ කාලයේ රතු තරුවෙන් කළා වාගේ - ඒක වටිනවා.

මේ අවස්ථාවේදී මම විශේෂයෙන්ම කියන්න ඕනෑ, මාතර, රත්නපුර, අම්පාර වැනි දිස්ත්‍රික්කවලින් පැමිණි ජනතාව ගැනත්. දවසකට 1,000කට එහා පිරිසක් ඇවිත් ඒ කටයුතුවලට උදවු දුන්නා. මම ඒ මෙහෙයුම අධීක්ෂණය කළ නිසා, ඒක මෙහෙයවපු නිසා මම ඒ ගැන දන්නවා. දවස් 10ක් තිස්සේ ඒ අය කටයුතු කළා. ඒ වාගේම තමයි ඉස්කෝල ටික ගොඩගන්න දැන් "නැණ දිරි මෙහෙයුම" පටන් ගන්නවා. රජයක් ලෙස කටයුතු කරනවා

වාගේම, අපි ඒ විධියටත් වැඩ ටික කරගෙන යනවා. ඕක තමයි මෙච්චර කාලයකට ඔයගොල්ලන්ට කරන්න බැරි වුණේ. අන්න ඒ නිසා තමයි මම කියන්නේ විපක්ෂය දැන් අනාථ වෙලා, කුජීත වෙලා තිබෙන්නේ කියලා. ඊයේ කිව්වා, "අපේ කාලයේ දෙකයිපනහේ වැඩ කළා. ඒක තමයි අපට කෙළවුණේ" කියලා. දෙකයිපනහේ වැඩ කළා කියලා ඒගොල්ලන්ම කියනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravindra Bandara, your time is up.

**ගරු රවීන්ද්‍ර බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரவீந்திர பண்டார)
(The Hon. Ravindra Bandara)
මට තව පොඩි වෙලාවක් ලබා දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

එසේ දෙකයිපනහේ වැඩ කළ නිසා තමයි දෙකයිපනහට වැටුණේ. නමුත් දැන් ඒ වාගේ දේවල් වෙන්නේ නැහැ. මේ අය ගොඩක් බයයි, ප්‍රජාශක්ති වැඩසටහනට. ප්‍රජාශක්ති වැඩසටහනට යන්නේ ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටුවේ සභාපතිවරයාගේ නියෝජිතයා. එම නියෝජිතයා තමයි ඒ අදාළ හැම තැනකටම අවශ්‍ය සහාය දෙන්නේ. මොනවාද විනාශ වෙච්ච කුඹුරු, මොනවාද කැඩුණු පාලම් යනාදී වශයෙන් සොයා බලා ඒවා පිළිසකර කිරීමට අවශ්‍ය සහාය ලබා දෙනවා. ඒ හැම තැනකදීම රාජ්‍ය නිලධාරින් එක්ක එකතු වෙලා බොහොම ලස්සනට ඒ වැඩ ටික කරගෙන යනවා. අන්න ඒකත් එක්ක තමයි මම හිතන විධියට අර විපක්ෂය දරුණු ලෙස ආපදාවට ලක් වෙලා තිබෙන්නේ. ඒ ආපදාවෙන් මිදෙන්න නම්, මම අර කියපු විධියට වැඩකටයුතු කරන්න. එහෙම නැති වුණොත්, අර දෙකයිපනහට වැටුණු තත්ත්වයෙන් තවත් පහළට වැටෙන එක වළක්වන්න බැහැ.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. (Mrs.) Rohini Kumari Wijerathna. You have six minutes.

[අ.භා. 12.21]

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් මාතලේ දිස්ත්‍රික්කයේ මෙන්ම ශ්‍රී ලංකාව පුරාම මිය ගිය, අතුරුදහන් වුණු ජනතාවගේ පවුල්වලට මා මුලින්ම මේ අවස්ථාවේදී මගේ සංවේගය පළ කර සිටිනවා. ඒ වාගේම මිය ගිය අයගේ ආත්මයන්ට සැනසීම, ශාන්තිය ලැබේවා කියලා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම අතුරුදහන් වූවන්ගේ මුහුණු නැවත අපට දකින්නට ලැබේවා කියලාත් මා ප්‍රාර්ථනා කරනවා. ඒ වාගේම අවතැන් වූවන්ට සහන සැලසීමට, ඔවුන්ගේ ජීවිත ඉක්මනින්ම යථාවත් කරන්නට රජයට ශක්තිය, ධෛර්යය ලැබේවා කියලාත් මා ප්‍රාර්ථනා කරනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ වෙලාවේ මම විශේෂ ස්තුතියක් පළ කරන්න ඕනෑ, මාතලේ දිස්ත්‍රික් ලේකම්තුමාට ඒ වාගේම ප්‍රාදේශීය ලේකම්තුමන්ලාට, සහකාර ප්‍රාදේශීය ලේකම්වරුන්ට. ඇතැම් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල සහකාර ප්‍රාදේශීය ලේකම්වරයෙක්වත් නැහැ. ඒ වාගේම ක්ෂේත්‍ර නිලධාරින්ට, වෛද්‍යවරුන්ට, ත්‍රිවිධ හමුදාවට, ස්වාමීන් වහන්සේලාට සහ පූජකතුමන්ලාටත්, ජීවිත බේරා ගන්නට සහයෝගය දීපු ජනතාවටත්, අවතැන් වූ ජනතාවට කෑම ලබා දුන් ජනතාවටත් මගේ ස්තුතිය ප්‍රකාශ කර සිටිනවා. මොකද, මුල් දවස්වල මේ රටේ ජනතාව තමයි අවතැන් වෙච්ච ජනතාවට කන්න දුන්නේ. "ඒ සියලුදෙනාට පින්" කියලා මම මේ වෙලාවේ කියන්න ඕනෑ.

විශේෂයෙන්ම කියන්න ඕනෑ ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මධ්‍යම කඳුකරයේ නාය යෑම්, පැලීම්, පුපුරා යෑම් 1,400කට වැඩිය සිද්ධ වෙලා තිබෙන බව. Knuckles mountain range එක - දුම්බර කඳුවැටිය - විශාල ලෙස පුපුරා ගිහිල්ලා තිබෙනවා. කඳු දිය වෙලා ගිහිල්ලා තිබෙනවා. භූ විද්‍යාඥයන්ට, NBRI එකේ විශේෂඥයන්ට තවම මේ ප්‍රපංචය පැහැදිලි කර ගන්නට, තවම කිසිම සිද්ධාන්තයක් ප්‍රකාශයට පත් කර ගන්නට බැරුව වික්ෂිප්ත වෙලා සිටිනවා. ඇත්තටම කිව්වොත්, මෑත ඉතිහාසයේ මේ රට ඇතුළේ හෝ ජාත්‍යන්තරයේ මෙවැනි සිදුවීමක් වුණාය කියා නිදසුනක්වත් පෙන්වා දෙන්න බැරි තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා. අපේ වයස් සීමාවේ හෝ ඊට එහා අපි මෙහෙම ව්‍යසනයක් දැක්කේ නැහැ. නමුත් බෞද්ධ සංස්කෘතියේ ජාතක කථා පොතේ, ඒ වාගේම හින්දු සංස්කෘතියේ ඇතැම් ග්‍රන්ථවලින් අපි අහලා තිබෙනවා, මහ පොළොව ගුගුරා ගිය අවස්ථා; අහස කම්පා වෙච්ච අවස්ථා. ඒ වාගේම මහ පොළොව පළාගෙන ගිය හැටි, පඞ් පුරය ගිනි ගත්ත හැටි, ඒ වාගේම තුන් බිය ඇති වෙච්ච හැටි අපි අහලා තිබෙනවා. මෑත ඉතිහාසයේ අපි එහෙම දෙයක් අහලා නැහැ. අපේ ජනශ්‍රැතියට අනුව මේවාට කියන්නේ දේව ශාපයන් කියලා; එහෙම නැත්නම් දේව කෝපයන් කියලා. මේ සිදුවීම තුළ අද වෙනකොට තුන් බිය ඇති වෙලා තිබෙනවා. ඒ වාගේම මහ පොළොව පළාගෙන, මධ්‍ය කඳුකරයේ පොළොවෙන් භාගයකට වඩා අද පොළොව ඇතුළට ගිහිල්ලා තිබෙනවා. ඒ ගියේ නරකාදියටද කියන්න අපි දන්නේ නැහැ. මේක දේව ශාපයක්, දේව කෝපයක් විධියට මිස සුළු දෙයක් හැටියට අපට දකින්න බැහැ.

අද කලට වැසි ටික නැහැ; අකාලයේ වහිනවා. ඒ වාගේම කෙත් වතු සාර වෙන්නේ නැහැ, භීතිය තුරන් වෙන්නේ නැහැ. ඒ වාගේම රජු ධාර්මිකව මේ පාර්ලිමේන්තුවේදී දුන් පොරොන්දු මහ පොළොවේ ඉෂ්ට සිද්ධ වෙන්නේ නැහැ. ඒ නිසා අද මහ පොළොවේත් ගැටුම් ඇති වෙලා තිබෙනවා. අලි දෙන්නම්, කොටි දෙන්නම්, ටකරන් දෙන්නම්, ගෙවල් දෙන්නම්, ඉඩම් දෙන්නම් කිව්වාට තව වෙනකල් ටකරනුත් නැහැ; කොටිත් නැහැ; අලිත් නැහැ; ගෙවලුත් නැහැ; ඉඩම් දීලාත් නැහැ. අදට දින 24යි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ලක්ෂ 10, 20, 30, 40, 50 දෙනවාය කිව්වාට, ටකරන්වලට දෙනවාය කිව්ව ලක්ෂ 10වත් නැහැ. මධ්‍යම පළාතේ එහෙම ලැබිච්ච කිසිම කෙනෙක් නැහැ. වෙන දෙයක් තියා ඡන්දය දුන් ජනතාවට ප්‍රශ්න ටික කථා කර ගන්නට, විපක්ෂයේ අපට ආපදා කළමනාකරණ කමිටුවට යන්නට ඉඩකුත් නැහැ. අන්න ඒ තරමට අද තනිකරම දේශපාලනීකරණය වෙලා තිබෙනවා. ඒ වාගේම ආධාර බෙදා දීමත් දේශපාලනීකරණය වෙලා තිබෙනවා. නාගලවත්තේ, සියඹලා ගහමුල ලැයිම නාය යන්න පුළුවන්ය කියලා දේශපාලනයට ආපු දවසේ ඉඳන් මම කියනවා. හැබැයි, මේ වැස්සෙන් සියඹලා ගහමුල ඒ ලැයිම නාය ගියා. ඒ ජීවිත අද අතුරුදහන්. මේකට සාක්ෂියි, ඉඩම් විෂය භාරව එවකට හිටපු අතිරේක දිස්ත්‍රික් ලේකම්තුමා.

ඒ වාගේම මම කියන්න ඕනෑ, මේ කාරණයත්. ආපදාව සිද්ධ වෙලා සති තුනක් ගිහිල්ලාත් මිනිසුන්ට ජීවිතය පටන් ගන්න බැරි වෙච්ච, සහන දී ගන්න බැරි වෙච්ච අවස්ථාවක් මගේ ජීවිතයේ, මට මතක තිබෙන දශක 4ක කාලය ඇතුළත මම දැකලා නැහැ. අන්න ඒ නිසායි මේ ව්‍යසනය අර විද්‍යාඥයන්ට තේරුම් ගන්න බැරි දේව කෝපයක්, දේව ශාපයක් වෙන්නේ.

[ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය]

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අවතැන් වෙච්ච අය අද පණ පිටින් නරකාදියකයි ඉන්නේ. මධ්‍යම කඳුකරයට ආයෙත් වහිනවා. ඊයේත් උඩුදුම්බර පැත්තේ මහා ඛේදවාචකයක් සිදු වෙලා. රටේ තිබෙන කඳවුරුවල සිටින මිනිසුන්ට කන්න හම්බ වෙන්නේ පරිප්පු සහ සෝයාමීට්. මේ රටේ මිනිස්සු ඒ අයට බත් පැකට් දෙන දවස ළඟදීම අවසන් වෙනවා. එතකොට මේ අය දෙන පරිප්පු සහ සෝයා මීට් කන මිනිසුන්ට ඒක කාලා ඇති වන දවසක් එනවා. අන්න එදාට මේ ආණ්ඩුවට දුවන්න පාර හොයා ගන්න බැරි වෙනවා. ඒ නිසා ඒ මිනිසුන්ගේ ප්‍රශ්නවලට විසඳුම් අවශ්‍යයි. ඒවා ශ්‍රමදාන මානසිකත්වයක හිර කරලා, වැලි කොට්ට ගහන අභිමානයක රඳවලා, ගංවතුරේ දේශපාලනය කළා කියලා ඒවාට විසඳුම් ලැබෙන්නේ නැහැ. ඒ නිසා මම මේ කාරණයත් කියනවා. මේ ප්‍රශ්නවලට තාවකාලික පිළියම් ඕනෑ බව ඇත්ත. හැබැයි අප තවමත් දෙන්නේ වැලි කොට්ට පිළියම් නම්, පහුවැනිදාටත් පස සෝදාගෙන යනකොට නැවත වතාවක් පිළියම වැලි කොට්ට ගහන එකද කියන ප්‍රශ්නය අප අහන්න ඕනෑ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තවත් මාසයක් වහිනවා. ඒ නිසා මේවාට ස්ථිර විසඳුම් ඕනෑ. අපි මේ ආණ්ඩුවෙන් අහනවා, මේ වනකොට මේ ව්‍යසනයේදී සිද්ධ වෙච්ච භෞතික විනාශයට ස්ථිර පිළියම් යොදා, ඒ වාගේම ඇස්තමේන්තු සකස් කර තිබෙන්නේ ලංකාවේ කොතැනටද කියලා. ඒ නිසා මම යෝජනා කරනවා, මේ වෙනුවෙන් පක්ෂ, විපක්ෂ හැමෝම එකතු කර ගන්න කියලා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Rohini Kumari Wijerathna, your time is up.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මෙවැනි ව්‍යසනයකදී දේශපාලනය වැඩක් නැහැ; පක්ෂ විපක්ෂ සියලු දෙනාම එකතු කර ගන්න. පාර්ලිමේන්තුවේ ඇති, නැති, අත්දැකීම් තිබෙන මිනිස්සු ඉන්නවා. මේ සියලුදෙනා එකතු කරගෙන ස්ථිර විසඳුම් සොයන්න කියලා මම කියනවා. උද්ධච්චකම තියාගෙන වැඩ කරන්න එපා, please! උද්ධච්චකම තියාගෙන වැඩ කරන්න එපා, Please! අර වාගේ, "Please! එපා", කියලා ආපසු කියන්න එපා. මේ ඔක්කෝම කට්ටිය එකතු කරගෙන මේ කටයුත්ත කරන්න. මේවාට ජාතික සැලසුම් ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මම දැන් අධ්‍යාපනය ගැනත් කථා කරන්න ඕනෑ. ඒ සඳහා මට විනාඩියක් දෙන්න. මොකද, දැන් අපේ ප්‍රදේශයේ පාසල්වල තමයි සහන කඳවුරු වැඩිපුර සංඛ්‍යාවක් තිබෙන්නේ. මේ පාසල් විවෘත කිරීම අනිවාර්යයි. හැබැයි, එහෙමයි කියලා ඒ මිනිසුන්ට යන්න කියන්න බැහැ. මොකද, ඒ මිනිසුන්ට තවම යන්න තැනක් නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Member, we have one more speaker left before lunch.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ඒ නිසා මම යෝජනා කරනවා, ආගමික මධ්‍යස්ථානවල සිටින ස්වාමීන් වහන්සේලා සහ පූජකතුමන්ලා එක්ක කථා කරගෙන ඒ ජනතාව ඒ තැන්වලට ගෙන යන්න කටයුතු කරන්න කියලා. එහෙම නොවුණොත් ප්‍රශ්නයක් ඇති වෙනවා; O/L විභාගය, A/L විභාගය නියමිත දිනවලට තියා ගන්න අපට බැරි වෙනවා. මෙවැනි ව්‍යසනයකදී ඇති වන ප්‍රශ්නවලට නිවැරැදි විසඳුම් සෙව්වේ නැත්නම් මේවා දම්වැලක පුරුක් වාගේ එකින් එක, එකින් එක ඉදිරියටම යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වනකොට වැලිවලින් කුඹුරු ටික, වෙල් ටික ඔක්කෝම වැහිලා ගිහින් තිබෙනවා. කුඹුරුවල වෙල්වල තිබෙන වැලි ටික ඉවත් කරලා අරගෙන යනකොට පොලීසියෙන් දඩ ගහනවා. ඇමතිතුමා ලියුම් ඇරියාට වැඩක් නැහැ. පොලිසිය භාර ඇමතිතුමා ඒකට විරුද්ධයි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. (Mrs.) Rohini Kumari Wijerathna, your time is up.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම කථාව ඉක්මනින් අවසන් කරන්නම්, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. අඹන්ගඟ කෝරළයේ, විල්ගමුවේ මිනිස්සු මේ ප්‍රශ්නයට මුහුණ දෙනවා. මිනිස්සු තමුන්ගේ මහන්සියෙන් ගොවිපොළ ශුද්ධ කරගන්න, කුඹුර ශුද්ධ කරගන්න,-

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
I will have to call upon the next speaker.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ඉක්මනින් කථාව අවසන් කරන්නම්.

ගොවිපොළ, කුඹුර ශුද්ධ කර ගන්න වැලි ටික අයින් කරන කොට ඒකට දඩ ගහනවා නම්, ආණ්ඩුව ඒ වැලි ටික ඉවත් කරලා, ඒ මිනිසුන්ට ඒ කුඹුරු ටික ශුද්ධ කරලා දෙන්න ඕනෑ. මේ වනකොට හරියට දත්ත ටික අරගෙන නැහැ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Gayantha Karunathilleka.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මම ඉක්මනින්ම කථාව අවසන් කරන්නම්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කරුණාකරලා මට විනාඩියක් දෙන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
මම ඔබතුමියට විනාඩි එකහමාරක් විතර වැඩිපුර ලබා දීලා තිබෙන්නේ.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
මට තව විනාඩියක් දෙන්න, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Okay, ඔබතුමියට තවත් තත්පර 10ක් දෙන්නම්. කථාව අවසන් කරන්න.

**ගරු රෝහිණී කුමාරි විජේරත්න මහත්මිය**
(மாண்புமிகு (திருமதி) ரோஹினி குமாரி விஜேரத்ன)
(The Hon. (Mrs.) Rohini Kumari Wijerathna)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තවත් විනාඩියක් දෙන්න.

මේ වනකොට අක්කර 30,000යි කියලා ගණන් බලා තිබෙනවා. දත්ත නැති ප්‍රශ්නයයි මේ තිබෙන්නේ. ඒ නිසා මම කියනවා මේ මිනිසුන්ට ගොවි පොළවල් ශුද්ධ කර ගන්න ආණ්ඩුවේ සහාය දෙන්න කියලා. එහෙම නැත්නම් ගොවියාට වෙන්නේ, ගහෙන් වැටුණු මිනිහාට ගොනා ඇන්නා වාගේ වැඩක්.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Hon. Gayantha Karunathilleka. You have three minutes and your time starts now.

[අ.භා. 12.30]

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ ජීවිත කාලය තුළ අපි අත්දැකපු බිහිසුණුම ඛේදවාචකයට අපි රටක් හැටියට මුහුණ දීලා තිබෙනවා. ඒ විපතට පත් ජනතාවට සහන සැලසීමටත්, එම ජන ජීවිත යථා තත්ත්වයට පත් කිරීමටත් රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කරන දවසයි, අද දවස. අප වග කිව යුතු විපක්ෂයක් ලෙස ඉල්ලා සිටින්නේ මෙච්චරයි. ගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවේදී ප්‍රකාශ කළා, සහන පැකේජයක් ඉතා කඩිනමින් ලබා දෙන්න කියලා. ඒ සහන පැකේජය ඉතා කඩිනමින්, නිවැරදි ක්‍රමවේදය අනුගමනය කරමින්, දේශපාලන අත පෙවීම්වලින් තොරව, විටින් විට විවිධ කප්පාදු කිරීම්වලට ලක් කරන්නේ නැතිව, කොන්දේසි පනවන්නේ නැතිව ඒ ජනතාවටම ලබා දීමට ඉක්මනින් කටයුතු කරන්න කියලා එතුමා කියා සිටියා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කවදාවත්, කාටවත් අත පෑවේ නැති ජනතාවක් තමයි මේ පිරිස අතර ඉන්නේ. සමහරු පවුල් පිටින්ම පොළොවේ මිහිදන් වුණා. තම සමීපතමයින් අහිමි වෙච්ච තව බොහෝ පිරිසක් ඉන්නවා. තවත් පිරිසකට උන් හිටිතැන් අහිමි වෙලා තිබෙනවා. ඇතැම් අයගේ වගාවන් විනාශ වෙලා; ආදායම් මාර්ග නැති වෙලා; දරුවාගේ පොත්පත් ටික පවා නැති වෙලා. ඇඳිවතට පමණක් සීමා වෙච්ච පිරිසකට ආධාර කරන්න තමයි අද මේ මුදල වෙන් කරලා තිබෙන්නේ. ගරු ජනාධිපතිතුමා මේ ගරු සභාවට ඇවිත්, ලබා දෙනවා කියපු සහන පැකේජය ඒ ජනතාවට විශාල බලාපොරොත්තුවක් ගෙන දීලා තිබෙනවා. ඒ ජනතාවගේ හදවතටම කා වැදෙන වචන එතුමා එදා ප්‍රකාශ කළා. "තහඩුවක් ගියත් ලක්ෂ 10ක් දෙනවා" කියපු හැටි ඒ ජනතාව බලාගෙන හිටියා. ඒ නිසා ඒ මුදල් ආධාර හරිහැටි ඒ මිනිසුන්ගේම අතට වහාම පත් කිරීම තමයි අප බලාපොරොත්තු වෙන්නේ.

රජයට පාඩමක් ඉගෙන ගන්න පුළුවන් වුණා ජනතාවගෙන්. විශේෂයෙන්ම අපේ දකුණේ ජනතාව මේ වෙලාවේ මේ ව්‍යසනයෙන් බේරුණා. දකුණේ ජනතාව ක්‍රියා කරපු හැටි බලලා රජයට පාඩම් ඉගෙන ගන්න පුළුවන්. ඒ ජනතාව බොහොම සංවේදී වෙච්ච හැටි හොඳින් පෙනුණා. ඒ ජනතාව විතරක් නොවෙයි, වෙනත් විවිධ පළාත්වල ජනතාවත් මෙහිදී ඉදිරිපත් වෙච්ච ආකාරය අපට ආදර්ශයට ගන්න පුළුවන්. පෞද්ගලික අංශය, මාධ්‍ය ආයතන, පන්සල් හා පල්ලි වැනි ආගමික ස්ථාන මුල් කරගෙන බත් පැකට් හදා ගෙන, වතුර බෝතල් අරගෙන තමයි ඒ මිනිස්සු විපතට පත් ජනතාව අතරට දවසෙන් දෙකෙන් ක්ෂණිකව සංවිධානය වෙලා ගියේ. ඒ වාගේම, වකුලේඛ දිහා බල බලා forms පුරවා පුරවා ඉන්න ගියා නම් මොකක්ද වෙන්නේ කියන එක ගැනත් අපට හිතන්න වෙනවා. සුනාමියට උදව් කරපු හැටි මතක් කර කර දකුණේ ධීවරයෝ බෝට්ටු ලොරිවල පටවාගෙන ඒ පළාත්වලට ගියා. සුනාමියේදී කන්ද උඩරට, වයඹ ජනතාව, උතුර මැද හා රජරට ජනතාව බොහොම සංවේදී වෙච්ච හැටි අපි දැක්කා. කන්ද උඩරට, ඌව නාය යනකොට, වයඹ, බස්නාහිර, උතුරු-නැගෙනහිර ගං වතුරෙන් විනාශ වනකොට දකුණේ ජනතාව ඒ පළාත්වලට ගිහිල්ලා කරපු සේවය වෙනුවෙන් ඒ ජනතාවට අපේ ගෞරවය පුද කරන්න මම මෙය අවස්ථාව කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට තිබෙන්නේ විනාඩි තුනක කාලයක් නිසා තව එක් කරුණක් විතරක් කියලා මගේ කථාව අවසන් කරන්නම්. ගරු විපක්ෂ නායකතුමාත්, විපක්ෂයත් පටු දේශපාලනයෙන් තොරව මේ වෙලාවේ ආදර්ශවත්ව කටයුතු කරලා තිබෙනවා. ඉදිරියටත් අපි ඒ විධියට කටයුතු කරනවා. අපට මෙහිදී දේශපාලනයක් වැඩක් නැහැ. අපේ ජනතාවට සහනයක් සලසන විධිය ගැන තමයි අපි වගකීමෙන් කියන්නේ. මම කියන්න කැමැතියි ගරු විපක්ෂ නායකතුමා මේවාට මැදිහත් වනකොට "අනේ, please එපා" කිව්වා. එසේ කියද්දී එතුමා රාජ්‍ය තාන්ත්‍රිකව කටයුතු කළා. එතුමා අද රෝහල්වලට ලක්ෂ ගණනින් උදව් කරන හැටි අපි දැක්කා. එතුමා කළේ මොකක්ද? එතුමා රාජ්‍ය තාන්ත්‍රිකයෝ කැඳෙව්වා. තානාපතිවරු, මහ කොමසාරිස්වරු විවිධ ජාත්‍යන්තර සංවිධානවල නියෝජිතයෝ කැඳවලා මොකක්ද එතුමා කිව්වේ? "අනේ, please අපේ අපේ රටට විපතක් වෙලා තිබෙනවා. උදව් කරන්න" කියලායි කිව්වේ.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Gayantha Karunathilleka, your time is up.

**ගරු ගයන්ත කරුණාතිලක මහතා**
(மாண்புமிகு கயந்த கருணாதிலக்க)
(The Hon. Gayantha Karunathilleka)
ඒ නිසා අපි රජයෙන් ඉල්ලන්නේ කරුණාකර මේ කියපු පොරොන්දු ටික ඉෂ්ට කරලා දෙන්න කියලායි. අද ඒ සඳහා මුදල් වෙන් වනවා. ඒ වෙනුවෙන් අපේ සම්පූර්ණ සහයෝගය ලබා දෙනවා. ඒ මුදල් ජනතාව අතට පත් කරන්න. ඒ මිනිසුන්ගේ බලාපොරොත්තු නම් බොඳ කරන්න එපා. ඒ අය අහිංසක මිනිස්සු. තම සමීපතමයන්ගේ ජීවිත අහිමි වෙලා, ජන ජීවිතය විනාශ වෙලා ඉන්න ඒ මිනිසුන් රැවටීමට ලක් කරන්නේ නැතිව, විවිධ කොන්දේසි පනවා එක එක කප්පාදු කරන්නේ නැතිව මේ ගරු සභාවට ඇවිල්ලා කියපු විධියටම ඒ ජනතාවගේ බලාපොරොත්තු ඉෂ්ට කරන්න. අපි ඒ වෙනුවෙන් සම්පූර්ණ සහයෝගය දෙනවා. අඩුපාඩු තිබෙනවා නම් පෙන්වා දෙන එක විපක්ෂයේ කාර්යභාරයයි. අපි ඒක ඉෂ්ට කරනවා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මට කාලය ලබා දීම ගැන තමුන්නාන්සේට ස්තුති කරමින් මම නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The Sitting is suspended till 1.00 p.m. for lunch.

***රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවන ලදින්, අ.භා. 1.00ට නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියගේ [ගරු හේමාලි වීරසේකර මහත්මිය]සභාපතිත්වයෙන් නැවත පවත්වන ලදී.***

*அதன்படி, அமர்வு பி.ப. 1.00 மணிவரை இடைநிறுத்தப்பட்டு மீண்டுந் தொடங்கிற்று. குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் [மாண்புமிகு (திருமதி) ஹேமாலி வீரசேகர] தலைமை வகித்தார்கள்.*

*Sitting accordingly suspended till 1.00 p.m. and then resumed, DEPUTY CHAIRPERSON OF COMMITTEES [THE HON. (MRS.) HEMALI WEERASEKARA] in the Chair.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.00]

**ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා**
(மாண்புமிகு அசித நிரோஷண எகொட விதான)
(The Hon. Asitha Niroshana Egoda Vithana)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "දිට්වා" සුළි කුණාටුව විසින් අපේ රටට සිදු කරපු හදිසි ආපදා තත්ත්වය නිසා බිඳ වැටුණු අපේ රටේ ජනතාවගේ ජීවිත නැවත නඟා සිටුවන්න, බිඳ වැටුණු යටිතල පහසුකම් පද්ධතිය නැවත ගොඩ නඟන්න, ජනතාවට ලබා දිය යුතු සහන ලබා දෙන්න රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කරන පාර්ලිමේන්තුවේ මේ විශේෂ අවස්ථාවේදී ඒ පිළිබඳ අදහස් දක්වන්න අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

නොවැම්බර් මාසයේ 23වැනි දා කියන්නේ, "දිට්වා" සුළි කුණාටුව ආරම්භ වෙන්න මූලික පසුබිම සකස් වන, වායුගෝලයේ කැලඹිලි සහගත තත්ත්වය නිර්මාණය වුණ දවස. නොවැම්බර් මාසයේ 25, 26 දිනවල වායුගෝලයේ කැලඹිලි සහගත තත්ත්වය අඩු පීඩන තත්ත්වයක් දක්වා වර්ධනය වනවා. ඉන් පසුව අදාළ ආයතන විසින් ඇම්බර් වර්ණයෙන් යුත් අනතුරු ඇඟවීමේ සංඥා ලබා දෙනවා. ඉන් පසුව මේ තත්ත්වය ඇතුළේ ධීවර ප්‍රජාවගේ දෛනික කටයුතු යම් විධියකට සීමා කර ගන්න කියලා නිවේදන නිකුත් කරනවා. අවදානම් ප්‍රදේශවල ජනතාවට ඒ අවශ්‍ය නිවේදන ලබා දෙනවා. ඉන් පසුව නොවැම්බර් මාසයේ 25වැනි දා සවස 3.45ට පීඩන අවපාතයක් දක්වා වර්ධනය වන බව නිශ්චිතවම සඳහන් කරමින් රතු නිවේදන නිකුත් කරනවා. මේ ආදී ලෙස කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවත්, ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයත් නොවැම්බර් මාසයේ 27වැනි දා දවල් 2.30 වනවිට එය සුළි කුණාටුවක් දක්වා වර්ධනය වනවා කියන නිශ්චිත රතු ඇඟවීම ලබා දෙමින් ඒ අනතුරුදායක තත්ත්වය තුළ තමන්ගේ දේපළ සහ ජීවිත රැක ගැනීම වෙනුවෙන් අදාළ උපදෙස් සමාජයට ලබා දෙන්න පටන් ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ස්වාභාවික ආපදා තත්ත්ව නිශ්චිත ලෙසම කැට තියලා කලින් ප්‍රකාශ කරන්න පුළුවන් දේවල් නොවෙයි. ඒවා ඇති වන තත්ත්ව තුළ වර්ධනය වන තත්ත්වය නිරීක්ෂණය කරමින් අදාළ උපදේශන ලබා දීම තමයි ඒ අදාළ ආයතන තුළින් කළ හැකි වන්නේ. ගත යුතු සියලු ක්‍රියාමාර්ග පිළිබඳව අදාළ ආයතන විසින් නිවේදන ලබා දෙමින් සඳහන් කළා. නමුත්, මෙවැනි ස්වාභාවික ව්‍යසනයකදී -ඒ ආපදා තත්ත්වය තුළ- ඊට මුහුණ දීම සඳහා අපේ ජනතාව ඉතා හොඳින් සංවිධානය කිරීමේ කටයුත්ත කාලයක් තිස්සේ රට තුළ සිදු කර නැහැ. ඊට අවශ්‍ය කරන තාක්ෂණික මෙවලම් සහිත ආයතන පද්ධතියක් අපි ගොඩ නඟලා නැහැ. ඒ නිසා මේ තිබෙන ආපදා තත්ත්වය ඇතුළේ ගත යුතු අත්දැකීම් අපි අරගෙන, ඉදිරියේදී අදාළ කරන තාක්ෂණික උපකරණ පද්ධතියක් සකස් කර ගැනීමත්, ජන සමාජය සංවිධානය කර ගැනීමත් තමයි අපට මේ තුළින් ගන්න තිබෙන අත්දැකීම වෙන්නේ.

කෙසේ නමුත්, ඒ ආපදා තත්ත්වය ඇතුළේ අත්‍යවශ්‍ය සේවා ප්‍රකාශයට පත් කරලා ජනාධිපතිවරයා එතුමාගේ මැදිහත්වීම තීරණාත්මකව ප්‍රකාශයට පත් කළා. ඊට අමතරව, විශේෂ ආපදා මෙහෙයුම් මධ්‍යස්ථානය ගොඩ නැඟුවා. යුද හමුදාපති ලුතිනන් ජනරාල් ලසන්ත රොද්‍රිගෝ මහතාගේ ප්‍රධානත්වයෙන් ඒක සක්‍රිය කළා. ඒ සඳහා සම්බන්ධීකරණය ගොඩ නැඟුවා. ත්‍රිවිධ හමුදාව, රාජ්‍ය ආයතන, පොලීසිය, ස්වේච්ඡා සංවිධාන, මාධ්‍ය ආයතන ඒකට එකතු කළා. ඉන් පසුව මේ සමස්ත තත්ත්වයට නායකත්වය දීම සඳහා අත්‍යවශ්‍ය සේවා කොමසාරිස් ජනරාල්වරයෙකු පත් කළා.

පසුගිය කාලයේ සාකච්ඡාවට ලක් වුණු ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව වසර 7ක් යනකල් අපේ රට තුළ කැඳවලා තිබුණේ නැහැ. ගෝඨාභය රාජපක්ෂ ජනාධිපතිවරයා යටතේත්, රනිල් වික්‍රමසිංහ ජනාධිපතිවරයා යටතේත් වසර 7ක් තුළ මේ ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව කැඳවා තිබුණේ නැහැ. එවන් තත්ත්වයක් තුළ මේ වසරේ අගෝස්තු මාසයේදී වත්මන් ආණ්ඩුව එම සභාව කැඳවූවා. මේ ව්‍යසනය ඇති වුණාට පසුවත් නැවත ඒ සභාව කැඳවමින් සහන කටයුතු සඳහා සහ ඉදිකිරීම් කටයුතු සඳහා අවශ්‍ය නායකත්වය ලබා දුන්නා.

ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපට ඉතුරු වෙලා තිබෙන සියලු ගුවන්යානා සහ හෙලිකොප්ටර් යානා ජන ජීවිත රැක ගැනීම වෙනුවෙන් අපි වෙන් කළා. ඒවා භාවිත කරමින් ජනතාවගේ ජීවිත බේරා ගත්ත ආකාරය මේ රටේ ජනතාව ඇස් දෙකෙන් දැක්කා. ඒ වාගේම තමයි, මේ ව්‍යසනයෙන් පසුව එතෙක් තිබුණු සමහර නීති වෙනස් කරමින් අපි කටයුතු කළා. විශේෂයෙන්ම මුදල් වියදම් කිරීමේදී පළාත් පාලන ආයතනවලට සීමා වෙලා තිබුණු තත්ත්වය වෙනස් කළා. පළාත් පාලන ආයතන සතු යන්ත්‍රෝපකරණ රටේ ඕනෑම තැනකට රැගෙන යෑමට සහ ඒ මුදල් රටේ ඕනෑම තැනකට වියදම් කිරීමට හැකි වන පරිදි විශේෂ චක්‍රලේඛයක් නිකුත් කරනවා. මෙවැනි ස්වාභාවික ආපදා තත්ත්වයක් ඇතුළේ මෙවැනි සංවිධානය වීමක් ඉතිහාසයේ කවදාවත් අපේ රටේ තිබුණේ නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. ඒ සියල්ල සංවිධානය කරමින්, අදාළ යන්ත්‍රණය සකස් කරමින්, ඊට අවශ්‍ය දේශපාලන නායකත්වය ජනාධිපතිවරයාත්, ඒ වාගේම මහජන නියෝජිතයන් විසිනුත් ලබා දුන්නා.

මේ රට නැවත ගොඩනැඟීමේදී අවශ්‍ය මහා මිනිස් ශ්‍රමය ඒක රාශි කිරීම සඳහා ජන මනස සකස් කරමින්, ඊට අවශ්‍ය දායකත්වය රටේ සාමාන්‍ය පුරවැසියන්ගෙන් සහ සංවිධානවලින් ලබා ගනිමින් කටයුතු කිරීම සඳහා අපි මහා මිනිස් පවුරක් ගොඩනැඟුවා. ඒ නිසා තමයි නුවරඑළිය දිස්ත්‍රික්කය, බදුල්ල දිස්ත්‍රික්කය, මාතර දිස්ත්‍රික්කය නැවත ගොඩනැඟීමේ කර්තව්‍යයේදී විශාල සේවයක් ඒ අය විසින් ඉටු කරමින් තිබෙන්නේ. බිඳී ගිය වාරිමාර්ග පද්ධති, පාසල් පද්ධති නැවත ගොඩනඟමින් තිබෙන්නේ ඒ මහා මිනිස් ශ්‍රමය නිසායි. නමුත් විපක්ෂයේ සමහර මහත්වරු, විපක්ෂයේ සමහර මහත්වරුන්ගේ මාධ්‍ය ආයතන ඒ අවස්ථාවේ කටයුතු කළේ කොහොමද? අපි උඩුදුම්බර, හංවැල්ල පාර වැලි කොට්ට දාලා සැපයුම් මාර්ගයක්

ලෙස සකස් කරලා, අවතැන් වෙලා සිටින ජනතාව ආරක්ෂිත කළා. එම තාවකාලික මාර්ගය හරහා ගමන් කරලා අවශ්‍ය ආහාර පාන ලබා දෙමින් ජනතාවගේ ජීවිත බේරා ගන්න කටයුතු කළා. නමුත් තාවකාලික ලෙස ගොඩනඟපු ඒ පාර ඊයේ පෙරේදා ඇති වුණු වර්ෂාවෙන් පසු නැවත බිඳී ගිය පසු "වැලි කොට්ට සංවර්ධනය" කියලා හිනා වුණු විපක්ෂයේ මහත්වරු අපි දැක්කා. ඒ ජන ජීවිත යථාවත් කරන්න මැදිහත් වුණු ඒ මහා ස්වේච්ඡා මිනිස් ශ්‍රමයට තමයි ඒ අය හිනා වෙන්නේ. ඒවා ස්ථිර ඉදිකිරීම් නොවෙයි මහත්වරුනි. ඒ මාර්ගය, ජනතාවට අවශ්‍ය කරන මූලික මැදිහත් වීම් කරන්න, ඔවුන්ට අවශ්‍ය සෞඛ්‍ය පහසුකම් ලබා දෙන්න, ඔවුන්ට පිසූ ආහාර වේල් ලබා දෙන්න, ඔවුන්ට වියළි ආහාර ද්‍රව්‍ය ටික ලබා දෙන්න ඇති කරපු තාවකාලික මාර්ගයක්. ඒ තාවකාලික මාර්ග ඕනෑම මොහොතක බිඳී යන්න පුළුවන්. මොකද, මේ ආපදා තත්ත්වය තවමත් පහවෙලා ගිහිල්ලා නැති නිසා. මේ අය හිනා වෙන්නේ මේ රටේ මනුෂ්‍යත්වයට, මේ රටේ මිනිස් ශ්‍රමයට කියලා අපි විපක්ෂයේ මහත්වරුන්ට අනතුරු අඟවන්න කැමැතියි.

මේ ආපදාවෙන් පස්සේ යළි නැඟිටින මේ රටේ ජනතාව වෙනුවෙන් අපි ක්ෂේත්‍ර 15ක් යටතේ වන්දි ලබා දීම් සිදු කරනවා. මේක ඉතිහාසයේ කවදාවත් සිදු නොවුණු දෙයක්. නිවාස ඉදිකිරීමට, අධ්‍යාපන පද්ධතිය නැවත නඟා සිටුවීමට, යටිතල පහසුකම් සංවර්ධනයට, කෘෂි කර්මාන්තයට, කර්මාන්ත පද්ධතිය නැවත ඇති කිරීමට, වෙළෙඳ ව්‍යාපාරවලට, ව්‍යාපාරික කෘෂි කර්මාන්තයට, ධීවර කටයුතුවලට සහ රැකියා අහිමිවූවන්ට ක්ෂේත්‍ර 15ක් ඔස්සේ අපි වන්දි ලබා දීම සිදු කරනවා. මීට පෙර එවැනි වන්දි ලබා දුන් ක්ෂේත්‍රත් එක්ක සංසන්දනය කළොත්, ආපදාවෙන් විපතට පත් ජනතාවගේ නිවාස පිරිසිදු කර ගැනීම සඳහා මීට පෙර ලබා දීලා තිබුණේ රුපියල් 10,000යි. ඒ මුදල අපි රුපියල් 25,000 දක්වා වැඩි කරලා තිබෙනවා. ආපදාවෙන් හානි වූ එළවලු වගා කර තිබූ ඉඩම් හෙක්ටෙයාරයකට මීට කලින් රුපියලක්වත් ගෙවලා තිබුණේ නැහැ. අපි රුපියල් ලක්ෂ 2ක් ගෙවන්න සැලසුම් කරලා තිබෙනවා. ඊට අමතරව ව්‍යාපාරික කෘෂි කර්මාන්තය වෙනුවෙන් net housesවලට අදාළව වෙනම ඇස්තමේන්තුවක් සකස් කරලා වන්දි ලබා දීමට කටයුතු කරමින් තිබෙනවා. ඒ වාගේම ආපදාවට ලක් වූ ලියාපදිංචි සත්ත්ව ගොවිපොළවල් සඳහා මීට පෙර වන්දි ගෙවලා තිබුණේ නැහැ. අපි ඒ සඳහා රුපියල් ලක්ෂ දෙකක වන්දියක් ලබා දෙනවා. ඊට අමතරව එම ගොවිපොළවල්වල හිටපු සතුන් ප්‍රමාණය ඇස්තමේන්තු කරලා ඒ අනුව වන්දි ලබා දීමට කටයුතු කරමින් තිබෙනවා.

ඒ වාගේම විනාශ වූ නිවාස වෙනුවට නව නිවාස ලබා ගැනීම වෙනුවෙන් ලබා දෙන වන්දි මුදල අපි රුපියල් ලක්ෂ 50 දක්වා වැඩි කරලා තිබෙනවා. මීට කලින් ලබා දුන්නේ රුපියල් ලක්ෂ 25යි. ඒ වාගේම ජනතාව පදිංචිව සිටියදී විනාශ වූ අධි අවදානම් ඉඩම් සඳහා මීට කලින් රුපියල් ලක්ෂ 4ක වන්දි මුදලක් දීලා තිබෙනවා. එම වන්දිය අපි රුපියල් ලක්ෂ 50 දක්වා වැඩි කරලා තිබෙනවා; එම වන්දිය අපි විශාල මුදලකින් වැඩි කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ අනුව මේ රටේ ජනතාව වෙනුවෙන්, ඔවුන්ගේ ජීවිත නැවත යථාවත් කරන්න අපි විශාල වන්දි මුදලක් ලබා දීලා තිබෙනවා.

මීට පෙර අපි විපක්ෂයේ ඉන්නකොටත් තිබුණු අත්දැකීම් නිසා මෙවැනි ස්වාභාවික ආපදාවලට මැදිහත් වන එක අපට අර්බුදයක් නොවෙයි. 1998 සුළි සුළඟ ඇති වුණු වෙලාවේදී, 2003 දකුණු පළාතේ ඇති වූ ගංවතුර අවස්ථාවේදී, 2004දී සුනාමිය අවස්ථාවේදී, 2009දී යුද්ධමය තත්ත්වය යටතේ කරපු සමහර මැදිහත් වීම්වලදී, ඒ වාගේම 2016දී ඇති වූ මහා ගංවතුර අවස්ථාවේදී, 2018දී ඇති වූ ගංවතුර අවස්ථාවේදී, 2022දී ඇති වූ ගංවතුර අවස්ථාවේදී ආදී වශයෙන් සියලු ආපදා අවස්ථාවලදී අපි කුඩා පක්ෂයක් විධියට විපක්ෂයේ සිටිමින් ජනතාව අතරට ගිහිල්ලා වැඩ කළා. හැබැයි, අපි ගිහිල්ලා ආණ්ඩු විරෝධී කැරලි ගහන්න, ජනතාව අතර ආණ්ඩුව අප්‍රසාදයට පත් කරන්න කටයුතු කළේ නැහැ. එවකට තිබුණු ආණ්ඩු ජනතාවට රුපියලක්වත් ලබා නොදුන්නත්, කිසිදු ජනතා සහනයක් ලබා නොදුන්නත්, රට තුළ ව්‍යාකුලත්වයක් වර්ධනය කරන්න අපි කටයුතු කළේ නැහැ. ජනතාව අතර අපි වේගයෙන් වැඩ කරමින් ඔවුන්ගේ විශ්වාස දිනා ගත්තා. ඒ නිසා තමයි, පසුගිය පාර්ලිමේන්තු මැතිවරණයේදී දැවැන්ත ජනතා බලයක් ගොඩනඟන්න අපට පුළුවන්කම ලැබුණේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, නමුත් වර්තමානයේ මොකක්ද වෙන්නේ? විපක්ෂය කරමින් ඉන්නේ කුමක්ද? ඔවුන් ජනතාව වෙනුවෙන් කිසිදු දෙයක් නොකර ආණ්ඩුවට විරෝධයක් ගොඩනඟන්න උත්සාහ කරනවා. ආණ්ඩුව සම්බන්ධයෙන් වැරදි මතයක් හදන්න ඔවුන් හැමවිටම උත්සාහ කළා. IMF එක ගියාට පස්සේ ආර්ථිකය වැටෙයි කිව්වා. දැන් ගංවතුර නිසා ආණ්ඩුව පෙරළන්න ඔවුන් උත්සාහ දරනවා. නමුත් ජනතාව ඒක මුළුමනින්ම ප්‍රතික්ෂේප කරලා තිබෙනවා.

විපක්ෂය තුළ දිලිත් ජයවීර කියලා මන්ත්‍රීවරයෙක් ඉන්නවා. ඔහු තමන්ගේ මාධ්‍ය ආයතන පාවිච්චි කරලා මේ ආපදා තත්ත්වය ඇතුළේ සාහසික බොරු මත ගොඩනඟන්න උත්සාහ දැරුවා. ඒ අනුව "The Indian Express" පුවත්පතේ පළ කරපු සමහර ව්‍යාජ පුවත් උපුටා දක්වමින්, ඒ අනතුරු ඇඟවීම කලින් ඉඳලාම කළා කියලා සාහසික බොරු හදලා ජනතාව සහ ආණ්ඩුව අතර විරෝධයක් ගොඩනඟන්න හැදුවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දිලිත් ජයවීර මහත්මයාගේ ඒ මාධ්‍ය ඉතාම විසකුරු මත පතුරුවමින් ජනතාව අතර මේ විරෝධය ගොඩනඟන්න උත්සාහ කළත්, ජනතාව ඒවා ශත පහකට ගණන් ගත්තේ නැහැ. ඔහුගේ මාධ්‍ය ආයතනය තවදුරටත් එවැනි චේතිය ගණයේ බොරු ඉදිරිපත් කළොත්, එය බිත්තිත් එක්කම පොළොවට සමතලා වෙයි කියලා තමයි අපිට කියන්න තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වීරවංශ කියලා තව "කැලණි යාචකයෙක්" ඉන්නවා. ඔහු, ජනතාව විසින් ප්‍රතික්ෂේප කරලා, පාර්ලිමේන්තුවටවත් එන්න බැරි වෙච්ච හාදයෙක්. ලබන අප්‍රේල්වලදී නැවත ආණ්ඩු විරෝධී අරගළයක් මතුවෙනවා කියලා ඔහු කියනවා. විපක්ෂයේ මේ යාචක ගණයේ දේශපාලන මානසිකත්වය තවදුරටත් තිබෙනවා නම්, ඔවුන් තවදුරටත් ජනතාවගෙන් ප්‍රතික්ෂේප වෙනවා කියලා අපි කියන්න කැමැතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්න ඕනෑ. මේ පාර්ලිමේන්තුවේ ඉන්නවා, කොලොන්නාවේ මන්ත්‍රීවරයෙක්. කොලොන්නාවේ කසළ කන්ද කඩා වැටෙද්දි, ජනතාව - තිස් දෙදෙනෙක් - ඒ කසළ කන්දට යට වෙලා මිය යද්දි, ඒ වාගේම නිවාස 150ක් යට වෙද්දි, ඒ ජනතාවගේ ජීවිත මුදාගන්න JCB machine එකක් දුන්නේ නැහැ. මේ කුණු කන්දට යට වෙච්ච ජනතාවගේ ලතෝනි හඬ පාන්දර වෙනකම්ම ඇහිලා තිබෙනවා. කසළ ඇදීම සම්බන්ධයෙන්, මේ රට නැවත ගොඩනැඟීම සම්බන්ධයෙන් අපි වේගවත් මැදිහත්වීම්

[ගරු අසිත නිරෝෂණ එගොඩ විතාන මහතා]

කරමින් කටයුතු කරද්දී, යහ පාලන ආණ්ඩුව කාලයේ ඒ කුණු කන්දට යට වෙච්ච ජනතාවගේ ජීවිත බේරාගන්න JCB machine එකක් නොදුන්න, ඒ සම්බන්ධයෙන් කටයුතු නොකරපු මන්ත්‍රීවරු තවදුරටත් අපිව හාස්‍යයට ලක් කරන්නට පටන් ගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද මේ තත්ත්වය ඇතුළේ දේශපාලන යන්ත්‍රණයට වේගයෙන් නායකත්වය දෙමින්, ඒ සඳහා මැදිහත් වෙමින් අපි කටයුතු කරමින් සිටින බව නැවත වතාවක් මතක් කරමින් මගේ කථාව අවසන් කරනවා.

ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභාපතිතුමියනි.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා (ආරක්ෂක නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர - பாதுகாப்புப் பிரதி அமைச்சர்)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera - Deputy Minister of Defence)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මේජර් ජනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩියක කාලයක් ලබා දෙනවා.

**ගරු මේජර් ජෙනරාල් (විශ්‍රාමික) අරුණ ජයසේකර මහතා**
(மாண்புமிகு மேஜர் ஜெனரல் (ஓய்வுபெற்ற) அருண ஜயசேகர)
(The Hon. Major General (Rtd.) Aruna Jayasekera)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දීම පිළිබඳව ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

විදේශ සහනාධාර මෙරටට ලැබිලා ඒවා clear කරලා නැහැ, ඒ සම්බන්ධයෙන් නිසි අයුරින් - විධිමත් ලෙස - ක්‍රමවේදයක් සකස් කර නැහැ කියලා අපේ හෙක්ටර් අප්පුහාමි මන්ත්‍රීතුමා ඉස්සෙල්ලා කාරණයක් මතු කළා. ජාතික ආපදා සහන සේවා මධ්‍යස්ථානය සහ ආරක්ෂක අමාත්‍යාංශය විසින් ඒ කටයුතු ඉතාම විධිමත් ලෙස දැනට කරන බව මම කියන්න කැමැතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. විශේෂයෙන්ම අපි ඒ සඳහා ඔරුගොඩවත්තේ තවත් ගබඩාවක් ලබා ගත්තා. ලැබෙන විදේශ සහනාධාර ලංකාවේ ගුවන් තොටුපළවල සිට ගබඩාවට ලැබිලා ග්‍රාම නිලධාරි මහතාගේ මාර්ගයෙන් ඒ අත්‍යවශ්‍ය දේවල් ජනතාවගේ අත්වලට නිසියාකාරව යැම නිසි ක්‍රමවේදයකට සිද්ධ වෙනවා. ඒ සම්බන්ධව කිසිම ප්‍රශ්නයක් නැහැ. ඔරුගොඩවත්තේ ගබඩා දෙකටත් ගිහිල්ලා බලන්න කියලා මම එතුමාට ආරාධනා කරනවා. අපෙන් ඒ සම්බන්ධ විස්තර ඕනෑ නම් ඒ විස්තරත් ඉදිරිපත් කරන්න පුළුවන්.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු චානක මාදුගොඩ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

[අ.භා. 1.13]

**ගරු චානක මාදුගොඩ මහතා**
(மாண்புமிகு சானக மாதுகொட)
(The Hon. Chanaka Madugoda)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට අවස්ථාව ලබා දීම සම්බන්ධයෙන් ඔබතුමියට බෙහෙවින් ස්තුතිවන්ත වෙනවා.

විපක්ෂය මේ ආපදා තත්ත්වය සම්බන්ධයෙන් කිසි දෙයක් කළේ නැහැ කියලා මීට පෙර කථා කරපු අපේ ගරු මන්ත්‍රීතුමා කිව්වා. නමුත් මම ඒ පිළිබඳව කථා කරන්න සූදානම් නැහැ. විශේෂයෙන්ම නාමල් රාජපක්ෂ ගරු මන්ත්‍රීතුමා ඇතුළු විපක්ෂයේ ගරු මන්ත්‍රීතුමන්ලාගේ ඉල්ලීම් පිළිබඳවත් සලකා බලමින් ඊයේ දිනයේත්, අද දවසේත් මේ පාර්ලිමේන්තුව කැඳවලා අපේ ආදරණීය ජනතාවගේ ජීවිත යථාවත් කිරීම වෙනුවෙන් පාර්ලිමේන්තුව තුළ පරිපූරක ඇස්තමේන්තුවක් අනුමත කිරීම සඳහා සිදු කරන මේ ක්‍රියාවලිය පිළිබඳව අපේ දැඩි කැමැත්ත, අපේ සතුට මේ මොහොතේ පළ කරමින්, මේ පරිපූරක ඇස්තමේන්තුවට අපේ පූර්ණ සහයෝගය ලබා දෙනවා කියන කාරණයත් මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ ව්‍යසනය සිදු වෙච්ච අවස්ථාවේ ඉඳන් මේ රටේ ත්‍රිවිධ හමුදාව, දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන්, ග්‍රාම නිලධාරි මහත්ම මහත්මීන්, සෞඛ්‍ය අංශ ඇතුළු සමස්ත රාජ්‍ය සේවය සිදු කරපු කාර්යභාරයට හිස නමා ආචාරය පුද කරන්න අපි කැමැතියි. ඒ වාගේම මේ රටේ සමස්ත ජනතාව මේ ව්‍යසනය තමන්ගේ ව්‍යසනයක් ලෙස දකිමින් සැමදෙනාම පක්ෂ, පාට, ආගම් භේද සියල්ල පසෙකලා එය කළමනාකරණය කර ගැනීම ජාතික වගකීමක් ලෙස සලකා ජාතියක් විධියට ඒ සඳහා එක්ව කටයුතු කිරීමත් අපි අගය කරන්න ඕනෑ. විශේෂයෙන්ම දකුණු පළාත ගත්තාම, මා නියෝජනය කරන ගාල්ල දිස්ත්‍රික්කයේ සියලු පාසල් ඇතුළු සමස්ත ප්‍රජාව සිදු කරපු කාර්යභාරයත් මේ මොහොතේ මා අගය කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රජයකට මෙවැනි දැඩි ව්‍යසනයක් සියයට 100ක් කළමනාකරණය කරන්න බැහැ කියන එක අපි පිළිගන්නා කාරණයක්. නමුත් අපි පිළිගත යුතු තව කාරණයක් තිබෙනවා. මේ ව්‍යසනය සිදු වෙච්ච මොහොතේ රජය පැත්තෙන් යම් යම් අඩුපාඩුකම් සිදු වුණා කියන කාරණය අපට පිළිගන්න සිද්ධ වෙනවා. මේ අනතුර සිදුවූ පළමු අවස්ථාවේ පූර්ව අනතුරු ඇඟවීම් පිළිබඳව ආණ්ඩුවේ දුර්වලකම් තිබුණා කියන කාරණය අපි ඉතාම තදින් පිළිගත යුතු කාරණයක්.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දෙවනුව අනතුරට මුහුණ දීම හා ගලවා ගැනීමේ මෙහෙයුම් ක්‍රියාත්මක කිරීම පිළිබඳව පූර්ව සූදානමක් නොතිබීම නිසා යම් යම් ගැටලු මතු වුණා කියන කාරණයත් අපි පිළිගත යුතුයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වනවිට ඉතිරි වී තිබෙන්නේ ජනතාවට සහන සපයලා, ජනතාවගේ ජන ජීවිතය යථාවත් කරලා, ඔවුන් තමන්ගේ වාසස්ථානවලට යැවීමට කටයුතු කිරීමයි. ආණ්ඩුව මේ වනවිට යම් යම් කාර්ය භාරයන් සිදු කරමින් තිබෙනවා. නමුත් අපි ආණ්ඩුවට කියන්න ඕනෑ කාරණාවක් තිබෙනවා. ආණ්ඩුවේ දේශපාලනික මුහුණුවරක් ගන්න සිද්ධීන් මාලාවක් අපි මේ කටයුතු තුළදී දැක්කා. උතුරු ප්‍රදේශයේ ග්‍රාම නිලධාරිවරයෙක් පිළිබඳ ප්‍රශ්නයක්, ඒ වාගේම මේ ආණ්ඩුවේ දේශපාලනඥයෙක් සිදු කරපු මැදිහත්වීම් වැනි විවිධ මැදිහත්වීම් සිදු කරනවා අපි දැක්කා. ඒ නිසා අපි ඉල්ලීමක් කරනවා. රාජ්‍ය

යාන්ත්‍රණය තුළ කටයුතු කරන දේශපාලන අධිකාරිය විධියට ඔබ මේ රටේ සමස්ත රාජ්‍ය නිලධාරින්ට නිදහසේ කටයුතු කරන්න පුළුවන් වටපිටාවක් ගොඩ නඟාදීම තුළින් මේ කටයුතු ඉතාම හොඳින් කරන්න පුළුවන් කියන කාරණය මා විශ්වාස කරනවා. ඔවුන් තුළ ඒ විශ්වාසය ගොඩ නැඟීමේ වගකීම තිබෙන්නේ ආණ්ඩුවටයි කියන කාරණයත් මම මේ මොහොතේ සිහිපත් කරන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම යම් යෝජනා කිහිපයක් ඉදිරිපත් කරන්නට කැමැතියි. 1980 ජාතික පාරිසරික පනත ක්‍රියාත්මක කළා. ඉඩම් පරිහරණය, එහෙම නැත්නම් land-use policy එක පිළිබඳව යම් කිසි ක්‍රියාමාර්ග ගැනීමට, ක්‍රියාත්මක කිරීමට අදාළ කරුණු ඒ පනත තුළ තිබුණා. නමුත් ඒ පනත තුළින් එම කාර්ය භාරය ඉටු කරන්න හැකියාව ලැබුණේ නැහැ. ඒ තුළ අපට යම් යම් ගැටලු මතුවුණා කියන කාරණය සිහිපත් කරන්නට ඕනෑ. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා, ඉඩම් පරිහරණය පිළිබඳ යම් නීති රීති ගෙනැල්ලා කටයුතු කරන්න කියලා. අපි ජනාවාස ඇති කරන්නට ඕනෑ කොහේද, අපි කෘෂි කර්මාන්තයට ඉඩම් වෙන් කරන්නට ඕනෑ කොහේද, අපි වැවිලි කර්මාන්තයට ඉඩම් වෙන් කරන්නට ඕනෑ කොහේද, අපි කර්මාන්තශාලාවලට ඉඩම් වෙන් කරන්නට ඕනෑ කොහොමද, අපි වන වගාවට ඉඩම් වෙන් කරන්නට ඕනෑ කොහොමද කියන කාරණය පිළිබඳව -රටේ ඉඩම් පරිහරණය පිළිබඳව- යම් කිසි නීති රීති මාලාවක් ක්‍රියාත්මක කිරීමේ වගකීම මේ ආණ්ඩුව විසින් ඉදිරියට ගෙනයනවා නම් වටිනවාය කියන කාරණාවත් මම මේ මොහොතේ සිහිපත් කරන්නට ඕනෑ.

පරිසර ආරක්ෂක කමිටු හරහා මේ වනවිටත් විවිධ සංවේදී කලාප 13ක් හඳුනාගෙන තිබෙනවා කියලා අපි දන්නවා. ඒ සංවේදී කලාප 13 ප්‍රමාණවත් නැහැ. ඒ නිසා ආණ්ඩුව තවත් කලාප හඳුනාගෙන කටයුතු කිරීම කරනවා නම් වටිනවා කියන කාරණය මම කියනවා. ඒවාගේම පාංශු සංරක්ෂණ පනතින් හඳුනාගත් සංවේදී කලාප පිළිබඳව දැඩි අවධානය යොමු කරන්නය කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා.

පාංශු සංරක්ෂණ අරමුදල ඇති කිරීම පිළිබඳව, පාංශු සංරක්ෂණ මණ්ඩලය පත් කිරීම පිළිබඳව යම් යම් ගැටලු තිබෙනවා. අමාත්‍යාංශ ලේකම්වරුන් 12 දෙනෙකුට ඒ තුළ කටයුතු කරන්න සිදු වෙලා තිබෙනවා. එම ගැටලු නිරාකරණය කිරීම වෙනුවෙන් මේ ආණ්ඩුව ඉදිරියට කටයුතු කරනවා නම් වටිනවා කියන කාරණයත් මම මේ මොහොතේ සිහිපත් කරන්නට ඕනෑ.

මම මේ අවස්ථාවේ ඉතාම ඉක්මනින් කෘෂි කර්මාන්තය පිළිබඳවත් සිහිපත් කරන්නට ඕනෑ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ රට තුළ ඉඩම් හෙක්ටෙයාර ලක්ෂ අටහමාරක් පමණ මහ කන්නයේ කෘෂි කර්මාන්තයේ යෙදෙනවා. නමුත් මෙවර හෙක්ටෙයාර ලක්ෂ පහකට ආසන්න ඉඩම් ප්‍රමාණයක් තමයි කෘෂි කර්මාන්තයේ යෙදී තිබෙන්නේ. මේ වනවිට සියයට 20ක පමණ ප්‍රමාණයක් මේ ව්‍යසනයෙන් විනාශයට පත් වෙලා තිබෙනවා කියලා අපි විශ්වාස කරනවා. ඒ නිසා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. ඉදිරියේදී එම සියයට 20 කළමණාකරණය කිරීම වෙනුවෙන් කෘෂිකර්ම දෙපාර්තමේන්තුවට දැඩි වගකීමක් තිබෙනවා. ඉදිරි ජනවාරි මාසයේ අන්තර් මෝසම් වැසි ආරම්භ වෙනවා වෙනවා කියලා අපි දන්නවා. ඊට පෙර, කෙටි කාලීනව පළ දරන බීජ වගාව පිළිබඳව අවධානය යොමු කරන්නය කියලාත් අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා.

ඒ වාගේම කුඩා සහල් මෝල් හිමියන්ගේ සහල් මෝල් විශාල සංඛ්‍යාවක් මේ ගංවතුර නිසා විනාශයට පත් වෙලා තිබෙනවා. ඒ පිළිබඳවත් අවධානය යොමු කරන්නය කියලා අපි ආණ්ඩුවෙන් ඉල්ලීමක් කරනවා. විනාශයට පත් වෙච්ච සියයට 20කට ආසන්න ඉඩම් ප්‍රමාණය තුළ අලුතින් වගාව පටන් ගන්නකොට පොහොර සම්බන්ධයෙන් ගැටලුවක් මතු වෙනවා. කෘෂිකර්මාන්තයේ යෙදෙන ගොවීන්ට අවශ්‍ය පොහොර ලබා දීම වෙනුවෙන් යම් වැඩ පිළිවෙළක් දියත් කිරීම පිළිබඳවත් අවධානය යොමු කරන්නය කියන කාරණය මතක් කරනවා.

ඒ වාගේම යම් හෙයකින් සහල් ආනයනය කරන්න සිදු වුණොත්, - මේ ආශ්‍රිතව අනෙකුත් රටවලත් කෘෂි කර්මාන්තය පිළිබඳ ගැටලුවක් තිබෙනවා කියලා අපි දන්නවා. ඒ නිසා ඒ පිළිබඳවත් ඔබගේ අවධානය යොමු කරන්න කියා මම සිහිපත් කරනවා.

මම ඉතාම කෙටියෙන් මේ කාරණයත් සිහිපත් කරනවා. මේ වනවිට සංචාරක ව්‍යාපාරය පිළිබඳව ඔබතුමන්ලා දැඩි අවධානය යොමු කරලා තිබෙනවා. ඔබතුමන්ලා ඒ තුළින් ඩොලර් බිලියන 10ක් මේ රටට උත්පාදනය කරන්න තීරණය කරගෙන තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඉතාම කෙටියෙන් ඉල්ලීමක් කරනවා. සංචාරක ආකර්ෂණය තිබෙන විවිධ ප්‍රදේශ හානියට පත් වෙලා තිබෙනවා. සංචාරක ව්‍යාපාරය ව්‍යාප්තව තිබෙන දකුණ ඇතුළු සමස්ත ප්‍රදේශවලට මේ තත්ත්වය බලපානවා. ඒ නිසා සංචාරක ව්‍යාපාරය නව විධියකට ඉදිරියට ගෙනයන්න පුළුවන් විවිධ ක්‍රම සොයලා මේ රටට සංචාරකයන් ගෙන ඒමේ වැඩ පිළිවෙළටත් අනුගත වෙන්න කියන කාරණය මම සිහිපත් කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ වනවිට පුල්මුඩේ ඛනිජ වැලි ආයතනයේ ගැටලුවක් මතු වෙලා තිබෙනවා. ඒ ගැටලුව වෙනුවෙනුත් ඔබේ අවධානය යොමු කරන්න කියන කාරණයත්, ඔබත් සමඟ මේ කටයුත්තට අපේ සක්‍රිය දායකත්වය ලබා දෙනවා කියන කාරණයත් සිහිපත් කරමින් මගේ කථාව අවසන් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රොෂාන් අක්මීමන මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 9ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.20]

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය දිනවල ඇති වූ ආපදාවට මුහුණ දුන් දිස්ත්‍රික්කයක් වන ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය නියෝජනය කරන ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකු විධියට ආපදාවට පත්වූවන්ට සහන සැලසීම වෙනුවෙන් ගෙන එන ලද පරිපූරක ඇස්තමේන්තුව හා සම්බන්ධ විවාදයේදී මම මුලින්ම බලාපොරොත්තු වනවා, මේ ආපදා තත්ත්වය නිසා අපේ දිස්ත්‍රික්කයට ඇති වෙච්ච බලපෑම මොන වාගේද සහ ඒකට දිස්ත්‍රික්කයක් ලෙස අපි මුහුණ දුන්නේ කොහොමද කියන එක සම්බන්ධව යම් අදහසක් පළ කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 11ක් තිබෙනවා. ඒ කොට්ඨාස 11ම ජනතාව මේ "දිට්වා" සුළි කුණාටු තත්ත්වය සහ ඒ ආශ්‍රිතව ඇති වුණු ගංවතුර තත්ත්වය නිසා පීඩාවට පත් වුණා. විශේෂයෙන්ම සේරුවිල, වෙරුගල්, මූතූර්, කින්නියා වාගේ

[ගරු රොෂාන් අක්මීමන මහතා]

ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස මෙහිදී ඉතාම දැඩි බලපෑමකට ලක් වුණා. ඒ වාගේම කුච්චවේලි, කන්තලේ, ශ්‍රීපුර වාගේ කොට්ඨාසත් මෙහිදී යම් ආකාරයකට බලපෑමකට ලක් වුණා.

විශේෂයෙන්ම මේ වෙලාවේ මම මේ කාරණයත් සඳහන් කරන්න ඕනෑ. අපේ දිස්ත්‍රික්කයේ ගංවතුර තත්ත්වයට හේතු වුණේ අපේ දිස්ත්‍රික්කයේ ඇති වුණු වර්ෂා තත්ත්වය නොවෙයි. අපි දන්නවා, ත්‍රිකුණාමලය දිස්ත්‍රික්කය කියන්නේ දැඩි වර්ෂාපතනයක් ඇතිවන දිස්ත්‍රික්කයක් නොවෙයි කියලා. නමුත් මධ්‍යම කඳුකරයට ඇද හැලිච්ච ඒ දැඩි වර්ෂාපතනය මහවැලි ගඟ ඔස්සේ මුහුදට ගලා බසින්නේ ත්‍රිකුණාමලයෙන්. වෙරුගල්ආරු, මාවිල්ආරු විධියට අතු ගංගා දෙකක් ඔස්සේ එක පැත්තකින් මුතූර්වලින් ඒ ජලය මුහුදට වැටෙනවා. අනෙක් පැත්තෙන් වෙරුගල්, ලංකාපටුන ප්‍රදේශයෙන් මුහුදට වැටෙනවා. ඒ අතු ගංගා දෙකට මැදිවෙච්ච ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස 4ක් තමයි, සේරුවිල, වෙරුගල්, මුතූර් සහ කින්නියා කියන්නේ. මේ ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස හතරේ 30,000කට ආසන්න ජනතාවක් ගංවතුර තත්ත්වයෙන් පීඩාවට පත් වුණා. හැබැයි, ඒ ආපදා තත්ත්වයට විධිමත් ලෙස සැලසුම්සහගතව පූර්ව සූදානමින් අපි කටයුතු කරපු නිසා එකදු පුද්ගලයෙකුටවත් කිසිදු සීරීමක්වත් නැතුව අපට අපේ ජනතාව බේරාගන්න පුළුවන් වුණා. අපි ඒ ගැන ආඩම්බර වනවා. මොකද, මේ ආපදා තත්ත්වයට දින කිහිපයකට කලින් ඉඳන් අපි මේ ආපදාව සිදු වෙයි කියලා පුරෝකථනය කළා.

අපේ ප්‍රදේශවල ඒ ආපදාවට හේතු වුණේ මාවිල්ආරු බැම්ම කැඩී යෑම සහ අනෙක් පැත්තෙන් මහවැලි ගඟේ තිබුණු ගංවතුර ආරක්ෂණ වේල්ල කැඩී යෑම. විශේෂයෙන් මාවිල්ආරු ස්ථාන 14කින් කැඩී ගිහිල්ලා තිබෙනවා. ඒ කැඩී ගිහිල්ලා තිබෙන ස්ථාන 14 එකතුව ගත්තොත් කිලෝමීටර් එකහමාරක පමණ ප්‍රමාණයක් වනවා. මහවැලි ගඟේ ගංවතුර ආරක්ෂණ වේල්ල ගත්තොත් ස්ථාන 31කින් කැඩී ගිහිල්ලා තිබුණා. සමස්ත එකතුව ගත්තොත් කිලෝමීටර් දෙකහමාරක් විතර වනවා. ඒ ආපු මහා ජල කඳ ගංවතුර ආරක්ෂණ වේලි කඩාගෙන ගම්මානවලට ඇතුළු වුණා. අපි ඊට දින දෙකකට කලින් එවැනි විනාශයක් වෙයි කියලා පුරෝකථනය කරලා රාජ්‍ය යන්ත්‍රණය, ත්‍රිවිධ හමුදාව ඒ ජනතාව ඒකරාශි කරගෙන ආරක්ෂිත ස්ථාන කරා ගෙන යන්න කටයුතු කරපු නිසා අපේ දිස්ත්‍රික්කයේ සිදු වෙන්න ගිය මහා විනාශයක් වළක්වා ගන්න අපට පුළුවන් වුණා.

අපි හිතනවා, මහවැලි ගඟ ඔස්සේ ආවේ මධ්‍යම කඳුකරයේ ජන ජීවිත විනාශ කරමින් ඔවුන්ගේ කඳුළුත් එක්ක ආපු වතුරක් කියලා. ඒක අපේ දිස්ත්‍රික්කයට වෙච්ච විපතක් විධියට අපි දකින්නේ නැහැ. අපි එය දකින්නේ, ශ්‍රී ලංකාවටම වෙච්ච විනාශයක් විධියටයි. මධ්‍යම කඳුකරයේ ජනතාවට වෙච්ච විනාශයේ වේදනාව, ඒ කඳුළු බෙදා ගැනීමක් විධියට අපි දකිනවා, අපේ දිස්ත්‍රික්කයට වෙච්ච පීඩාව.

මම තවත් කාරණයක් කියන්න මේ වෙලාවේ තවත් විනාඩි කිහිපයක් ගන්නවා. මේ වෙලාවේ මම විශේෂයෙන්ම ස්තුතිවන්ත වන්න ඕනෑ, අපේ දිස්ත්‍රික්කයේ ජනතාව මේ ආපදාවට මුහුණ දෙනකොට ඔවුන් එයින් ගලවා ගෙන ජන ජීවිත යථා තත්ත්වයට පත් කරන්න මැදිහත් වෙච්ච කණ්ඩායම් කිහිපයකට. යුද හමුදාව, නාවික හමුදාව, ගුවන් හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය වැනි ආරක්ෂක අංශවල ඉන්න මහත්වරුන් වාගේම අපේ ආගමික ස්ථානවල සිටින ස්වාමීන් වහන්සේලා, පූජකවරුන් මෙහිදී විශාල කැප කිරීමක් කළා. විශේෂයෙන්ම සඳහන් කරන්න ඕනෑ, සේරුවිල රජමහා විහාරය, නීලපොල විහාරය, දෙහිවත්ත විහාරය, මුතූර් පන්සල, මුතූර් මහ පල්ලිය, තාහිද්නගර් පල්ලිය වාගේ ආගමික ස්ථානවල පූජකවරුන්, ස්වාමීන් වහන්සේලා ඇතුළු විශාල පිරිසක් මේ වෙනුවෙන් කැප වුණු බව. මම ඔවුන්ට ආචාරය පුද කරන්න, ස්තුතිය පුද කරන්න මෙය අවස්ථාවක් කර ගන්නවා.

මේ ගංවතුරත් එක්ක සේරුවිල, වෙරුගල්, මුතූර්, කින්නියා කියන ප්‍රදේශවලට ප්‍රවේශය අවහිර වුණා. මාර්ග, මහාමාර්ග කඩාගෙන ගියා. ප්‍රවේශය අවහිර වෙලා දින කිහිපයක් ඒ ජනතාව පීඩාවට පත්ව සිටියා. අන්න ඒ දින කිහිපයේදී ඒ ජනතාවට අවශ්‍ය සහන සලසන්න කන්තලේ, ගෝමරන්කඩවල, ශ්‍රීපුර, තඹලගමුව වාගේ කොට්ඨාසවල ජනතාව සීඝ්‍රයෙන් මැදිහත් වෙලා කිසිම අඩු පාඩුවක් නොවෙන්න අපට මුහුදු මඟින් සහ ගුවන් මඟින් වතුර බෝතල්, ආහාර පාන වැනි අත්‍යවශ්‍ය දේවල් සියල්ල ඉතා සැලසුම් සහගතව මැදිහත් වෙලා සපයා දුන්නා. මම ආඩම්බර වනවා, අපේ දිස්ත්‍රික්කයේ ජනතාව කටයුතු කළ ආකාරය සම්බන්ධයෙන්. ඔවුන්ට ස්තුති කරන්නත් මා මෙය අවස්ථාවක් කර ගන්නවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ශිෂ්ටාචාරයක් කොපමණ විශිෂ්ටද, කොපමණ දියුණුද කියලා තීරණය වන්නේ ඔවුන් තමන්ට පහසු කාලවල -ඒ කියන්නේ, යහපත් කාලවල- කොපමණ සැපට, කොච්චර හොඳින් ජීවත් වුණාද කියන කාරණා අනුව නොවෙයි. අපි ඉතිහාසයේ තිබුණු ඕනෑම දියුණු ශිෂ්ටාචාරයක් සම්බන්ධයෙන් කථා කරන්නේ, ඔවුන් අයහපත් කාලවලදී, ව්‍යසනකාරී තත්ත්වවලදී ඒවාට මුහුණ දුන්නේ කොහොමද; යළි නැඟී සිට සටන් කළේ කොහොමද කියන කාරණා අනුවයි. එම නිසා මේ සෑම ව්‍යසනයක්ම අපට කරුණු-කාරණා තුනක් හෙළිදරව් කරනවා. එකක්, ස්වභාව ධර්මයේ සීමා. ඒ කියන්නේ, ස්වභාව ධර්මයත් එක්ක කටයුතු කරනකොට අපි කුමන සීමාවක ඉඳන්ද කටයුතු කටයුතු කරන්න ඕනෑ කියන එක. අනෙක් එක, අපේ ආයතනවල සීමා. ඒ කියන්නේ, අපට එල්ල වන අභියෝගවලට මුහුණ දෙන්න, සටන් කරන්න අපේ ආයතන පද්ධතිය කොයි තරම් ශක්තිමත්ද, ඒවාට තිබෙන සීමා මොනවාද කියන එක. ඊළඟ එක, අපේ සමාජයේ සීමා. ඒ කියන්නේ, අපි මේ අභියෝගවලට මුහුණ දෙන්න සමාජයක් ලෙස කොච්චර ලැහැස්තිද, සංවිධානාත්මකද කියන එක.

මම හිතනවා, රටක් සමාජයක් විනාශ වන්නේ මේ වාගේ ස්වාභාවික ව්‍යසනවලින් පමණක්ම නොවෙයි කියලා. රටක්, සමාජයක් විනාශ වන්නේ ස්වාභාවික ව්‍යසනවලට සහ මේ වාගේ අර්බුදවලට මුහුණ දීලා යළි නැඟිටින්න පුළුවන් වෙයි කියන විශ්වාසය සමාජයට අහිමි වුණාමයි. එම නිසා අපි හිතනවා, recovery is physical, හැබැයි overcoming it is moral කියලා. මේ වුණු විනාශය අපට නැවත යථා තත්ත්වයට පත් කරන්න පුළුවන් වෙයි. අපට පාරවල් හදන්න පුළුවන්. අපි මුදල් වෙන් කර ගත්තොත්, මහන්සි වුණොත් විනාශ වුණු පාරවල් ටික අපට හදන්න පුළුවන්, පාලම් ටික හදන්න පුළුවන්, විනාශ වුණු ගෙවල් ටික තිබුණාට වඩා හොඳට අපට හදන්න පුළුවන්, අපේ විනාශ වුණු පාසල් සහ අලාභ හානි වුණු පාසල් ප්‍රතිසංස්කරණය කර ගන්න පුළුවන්. අපි දැනටමත් ඒවාට මුදල් වෙන් කරලා තිබෙන්නේ. අපි මේ අර්බුදයෙන් යළි නැඟිටින එක, අපි හිටියාට වඩා ගොඩ එන එක තීරණය වන්නේ අපට මේ විනාශයෙන් පසුවත් යළි නැඟිටින්න පුළුවන් කියන එක සම්බන්ධයෙන් සමාජයට කොච්චර විශ්වාසයක් තිබෙනවාද කියන එක මතයි.

මේ වෙලාවේ රජයක් ඉන්නේ සහන සැලසීම සඳහා පමණක් නොවෙයි. සහන සැලසීමෙන් එහාට ගිහිල්ලා සමාජයට යළි නැඟිටින්න පුළුවන් කියන විශ්වාසය ඇති කරන්න ඕනෑ. මම හිතනවා, ආණ්ඩුව විධියට අපේ වගකීම වන්නේ, හානිය යථා තත්ත්වයට පත් කිරීම - damage එක repair කරන එක - විතරක් නොවෙයි, ජනතාවට විශ්වාසය ඇති කරන එක කියලා. ඒ, නැවත

අපට නැඟිටින්න පුළුවන්, හිටියාට වඩා හොඳින් නැවත ජීවත් වන්න පුළුවන් කියන විශ්වාසය ජනතාව තුළ ඇති කරන එක. මෙවැනි ව්‍යසනකාරී තත්ත්වවලදී පෞද්ගලික වේදනාව සාමූහික වගකීමක් බවට පත් වනවා. කිසිම පුද්ගලයෙකුට හැඟෙන්න හොඳ නැහැ, මේක වුණේ මට විතරක් කියන එක. මේ විනාශය වුණේ මට විතරක්, මේකේ පීඩාව මට විතරයි තිබෙන්නේ, මේකෙන් ගොඩ එන්න වෙන්නේත් මට මගේ උත්සාහයෙන් කියලා කිසිවෙකුට දැනෙන්න හොඳ නැහැ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එම නිසා තමයි මෙම පරිපූරක ඇස්තමේන්තුව අප ගෙන එන්නේ. අපේක්ෂා භංගත්වයෙන් ඉන්න ජනතාවට යළි අපේක්ෂාවක් ලබා දීම වන තෙක් තිබෙන පරතරය - gap එක - පුරවන්න තමයි මෙම පරිපූරක ඇස්තමේන්තුව ගෙන එන්නේ. අපේක්ෂා භංගත්වයෙන් ඉන්න ජනතාවට අපි විශ්වාසයක් ඇති කරන්න ඕනෑ, ඔව්, අපට නැඟිටින්න පුළුවන්, ඊට අවශ්‍ය වැඩ පිළිවෙළ දැන් ක්‍රියාත්මක වනවා කියලා. රටට ජීවිත අහිමි වුණා, ජනතාවට නිවාස අහිමි වුණා, ජීවනෝපාය මාර්ග අහිමි වුණා. හැබැයි රට විනාශ වුණේ නැහැ. අද ලංකාවේ කිසිම කෙනෙක් කියන්නේ නැහැ, අපට ආයෙත් ගොඩ එන්න බැරි වෙයි, මේ වුණු විනාශය නම් ආයෙත් ගොඩ එන්න බැරි විනාශයක් කියලා. තමන්ගේ ගෙය විනාශ වුණු මනුස්සයෙක්වත්, තමන් හම්බ කර ගත් මුළු සේසතම විනාශ වුණු මනුස්සයෙක්වත් අද කියන්නේ නැහැ, අපට මේකෙන් ගොඩ එන්න බැරි වෙයි කියලා. ඒකට හේතුව, අපි ආණ්ඩුවක් විධියට, රජයක් විධියට නිකම් සහන සැලසීම සඳහා මුදල් වෙන් කිරීමට පමණක්ම සීමා නොවී, සමාජයක් ලෙස සාමූහිකව යළි ගොඩනැඟෙන්න පුළුවන් කියන විශ්වාසය ඇති වෙන්න අපේ රාජ්‍ය යන්ත්‍රණය මෙහෙයවා තිබීමයි. අපට විධිමත් සැලැස්මක් තිබෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට විනාඩියක් ලබා දෙන්න.

අපි මෙවැනි අවස්ථාවල එකමුතු වෙමුය කියන්නේ, නිකම්ම නිකම් සටන් පාඨයක් විධියට නොවෙයි. එකමුතුකම කියන්නේ, සමහර අවස්ථාවල අපේ උපාය මාර්ගයක්. අපි දැක්කා, විපක්ෂයේ ඇතැම් මන්ත්‍රීවරුන් සමාජය තුළ යම් ව්‍යාකූලත්වයක් හදන්න උත්සාහ කරනවා. හැබැයි, ඒ වෙලාවේත් අපි විපක්ෂයට චෝදනා නොකර මේ එකමුතුභාවය තබා ගන්න හදන්නේ දේශපාලනික කාරණයක් නිසා නොවෙයි, අපි එය උපක්‍රමයක් විධියට පාවිච්චි කරන්නේ සමාජය එකමුතු කරන්නයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ලෝකයේ දියුණු රටවල් මෙවන් ව්‍යසන ඇති නොවුණු රටවල් නොවෙයි.

ලෝකයේ අපි දියුණුයි කියලා කියන කිසිම රටක් මෙවැනි විපත් සිදු නොවන රටවල් නොවෙයි, මෙවැනි විපත්වලින් ගොඩ එන්න විධිමත් යන්ත්‍රණ හදා ගත් රටවල්.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ඔබතුමාගේ කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු රොෂාන් අක්මීමන මහතා**
(மாண்புமிகு ரொஷான் அக்மீமன)
(The Hon. Roshan Akmeemana)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තත්පර 30කින් මගේ කථාව මම අවසන් කරනවා.

ඒ නිසා අපි හිතනවා, ජනතාවට යළි නැඟිටිය හැකියි කියන විශ්වාසය එන්න නම් මේ විනාශයෙන් ගොඩ එන්න නායකත්වය දෙන්න කෙනෙක් ඉන්නවාද කියන එක ජනතාවට පෙනෙන්න ඕනෑය කියා. ඒකට පිළිතුර "ඔව්" නම් ජනතාවට විශ්වාසයක් එනවා, අපට මේ ව්‍යසනයෙන් ගොඩ එන්න නායකත්වය දෙන්න කෙනෙක් ඉන්නවා කියලා. අපේ ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා ඉන්නවා, ඒ සඳහා නායකත්වය දෙන්න. ජනතාවට පෙනෙන්න ඕනෑ, ඒ සඳහා වැඩ පිළිවෙළක් තිබෙනවා කියන එක. ඔව්, ජාතික ජන බලවේගයේ ආණ්ඩුවට වැඩ පිළිවෙළක් තිබෙනවා. ඒ නිසා ජනතාව විශ්වාසයෙන් ඉන්නවා, මේ ව්‍යසනයෙන් අපට හිටියාට වඩා නැඟිටින්න පුළුවන් කියලා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මුජිබුර් රහුමාන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.30]

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் ரஹுமான்)
(The Hon. Mujibur Rahuman)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ස්තුතියි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපේ රටේ ඇති වුණු ආපදා තත්ත්වයෙන් අහිමි වෙච්ච ජීවිත පිළිබඳව වාගේම ඒ නිසා සිදු වෙච්ච අලාභ හානි පිළිබඳවත් අපි සියලු දෙනාම සංවේදී වෙනවා. ඒ වාගේම අපි සියලු දෙනාම දන්නවා, විශේෂයෙන්ම ස්වාභාවික විපත් කියන ඒවා අපට සම්පූර්ණයෙන්ම නවත්වා ගන්න බැහැ කියලා. නමුත්, ස්වාභාවික විපත් කියන ඒවා යම් ප්‍රමාණයකට කළමනාකරණය කරගන්න අපට හැකියාව තිබුණා නම්, දේපළ හානි හා ජීවිත හානි නවත්වා ගන්නට යම් හැකියාවක් තිබුණා. මොකද, ඒ පිළිබඳව යම් යම් අත්දැකීම් අපට ලෝකයෙන් ලබා ගන්න පුළුවන්. ඒ නිසා තමයි අපට එවැනි ආයතන තිබෙන්නේ. විශේෂයෙන්ම සුනාමියෙන් පසු ආපදා කළමනාකරණ අමාත්‍යාංශය ඒ වෙනුවෙන් ශක්තිමත් පනතක් හැදුවා. ඒ අනුව, ආණ්ඩු පක්ෂයට හා විපක්ෂයට එකට වැඩ කරන්න පුළුවන් යන්ත්‍රණයක් හදන්න පුළුවන් පනතක් හඳුන්වා දුන්නා.

අපි දන්නවා, දැන් මේ පිළිබඳව විවාදයක් තිබෙනවාය කියන එක. ආණ්ඩුව පැත්තෙන් කථා කරන මැති ඇමතිවරු අද ඇවිල්ලා කියනවා, මේ පිළිබඳව අපිව දැනුවත් කළේ නැහැ, අපට හරියට මේ ගැන සංඥා දුන්නේ නැහැ කියලා. ඒක ආණ්ඩුව පැත්තෙන් කථා කරන මැති ඇමතිවරු කියන කරුණක්. නමුත් අපි සියලු දෙනාම දන්නවා, විශේෂයෙන්ම නොවැම්බර් මාසයේ 11වැනි දා අතුල කරුණානායක කියන කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජනරාල්තුමා මාධ්‍ය හමුවක් පවත්වා යම්කිසි ආකාරයේ අනාවැකියක් පළ කළ බව. ඊළඟට, නොවැම්බර් 14වැනි දාත් ඔහු යම්කිසි අනාවැකියක් පළ කළා. නොවැම්බර් මාසයේ 17වැනි දාත් ඔහු මාධ්‍ය හමුවේ අනාවැකියක් පළ කරනවා. ඊළඟට, නොවැම්බර් මාසයේ 23වැනි දා කාලගුණ විද්‍යාඥ මලිත් ප්‍රනාන්දු මහත්මයා මේ සම්බන්ධව යම් අනාවැකියක් පළ කළා. විශාල වර්ෂාපතනයක් ලැබෙන්න පුළුවන්, ගංවතුර තත්ත්වයක් ඇති

[ගරු මුජිබුර් රහුමාන් මහතා]

වෙන්න පුළුවන්, අවපාත පීඩනයක් ඇති වෙලා තිබෙනවා, ඒක යම්කිසි ආකාරයෙන් සුළි සුළං බවට පරිවර්තනය වෙන්න පුළුවන් කියලා අනාවැකි කියා තිබෙනවා. මොකද, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කියන්නේ අනාවැකි. ඔවුන් ඒ අනාවැකි කියන්නේ, ඔවුන් ඒ විෂය සම්බන්ධව යම් දැනුමක් තිබෙන උදවිය නිසායි. ඒ නිසා තමයි ඒවාට අනාවැකි කියලා කියන්නේ. එතකොට මේ අනාවැකි සම්බන්ධව ආණ්ඩුව සංවේදී වුණේ නැත්තේ ඇයි කියන ප්‍රශ්නය නේ තිබෙන්නේ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මා ළඟ තිබෙනවා, නොවැම්බර් මාසයේ 23වැනි දා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව නිකුත් කරපු නිවේදනය. ඒ නිවේදනය ඒගොල්ලන් නිකුත් කරන්නේ 2025 නොවැම්බර් 23වැනි දින සවස 4.00ට, "තද සුළං, තද වැසි සහ රළු මුහුදු ප්‍රදේශ පිළිබඳව අවවාදාත්මක නිවේදනය" යනුවෙන්. මේ, නොවැම්බර් 23වැනි දා සවස 4.00ට නිකුත් කරන නිවේදනය. එහි කියනවා, "සැලකිලිමත් වන්න! දකුණු අන්දමන් මුහුදු ප්‍රදේශය ආශ්‍රිතව අඩු පීඩන කලාපයක් නිර්මාණය වී ඇත. එය බටහිරට බරව වයඹ දෙසට ගමන් කරමින් 2025 නොවැම්බර් 24 දින පමණ වනවිට ගිනිකොණදිග බෙංගාල බොක්ක මුහුදු ප්‍රදේශයේ දී පීඩන අවපාතයක් දක්වා වර්ධනය වීමට ඉඩ ඇත. ඉන්පසු එළඹෙන පැය 48 තුළදී එම පද්ධතිය තවදුරටත් සුළි කුණාටුවක් දක්වා වර්ධනය වීමට බොහෝ දුරට ඉඩ ඇත." යනුවෙන්. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කියා තිබෙන්නේ, සුළි කුණාටුවක් දක්වා වර්ධනය වීමට බොහෝ දුරට ඉඩ තිබෙනවාය කියලා. ඉතින්, ඒක තමයි අනාවැකිය. මේ අනාවැකිය තේරුම් ගත්තේ නැහැ. මම මේ කිව්වේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව 2025 නොවැම්බර් මාසයේ 23වැනි දා නිකුත් කරපු නිවේදනය. මේ නිවේදනය ආණ්ඩුව තේරුම් ගත්තාද? ඒක තමයි තිබෙන ප්‍රශ්නය. 2025 නොවැම්බර් මස 23වැනි දින කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව විසින් නිකුත් කරන ලද එම නිවේදනය මම මේ අවස්ථාවේදී **සභාගත*** කරනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඊළඟට ආයතන කිහිපයක් නොවැම්බර් මාසයේ 17වැනි දා ඉඳලා රැස් වුණා. එහෙම රැස් වුණේ කාගේ මූලිකත්වයෙන්ද? ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ මූලිකත්වයෙන් සහ ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාගේ මූලිකත්වයෙන්. කවුද රැස් වුණේ? ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය, ගොඩනැඟිලි පර්යේෂණ ආයතනය, වාරිමාර්ග දෙපාර්තමේන්තුව, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව, විදුලිබල මණ්ඩලය, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලය හා ධීවර අමාත්‍යාංශය. මේ ආයතන ටිකේ නිලධාරින් නොවැම්බර් මාසයේ 17වැනි දා ඉඳන් 27වැනි දා දක්වා රැස් වුණා. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා තමයි මූලිකත්වය අරගෙන මේ රැස්වීම් කැඳෙව්වේ. ඒ විධියට ප්‍රායෝගිකව රැස් වුණා විතරක් නොවෙයි, Zoom එකෙනුත් රැස්වීම් පැවැත්වූවා. එතකොට ඒ රැස්වීම්වලදී මේවා ගැන සාකච්ඡා වුණේ නැද්ද? ඒ නිලධාරින් කිව්වේ නැද්ද, මෙවැනි තත්ත්වයක් තිබෙනවා කියලා. ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා නේද, ඒ දෙපාර්තමේන්තුව භාරව ඉන්නේ? එතුමා ඒ ගැන දැනගෙන හිටියේ නැද්ද කියලා කියන්න ඕනෑ.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආපදාවක් නැත්නම් මොකටද ඒ ආයතනවල නිලධාරින් රැස් වුණේ? එහෙනම් ඒ ආයතනවල නිලධාරින් රැස් වෙන්න ඕනෑ නැහැ නේ. රටට ආපදා තත්ත්වයක් එන නිසා තමයි මේ ආයතනවල නිලධාරින් ඔක්කෝම රැස් වුණේ. එහෙම රැස් වෙලා ගත්ත තීන්දු මොනවාද, ඒ තීන්දු ඉහළ අය දක්වා ගියාද, ජනාධිපතිතුමාව දැනුවත් කළාද? ඒක නේ තිබෙන ප්‍රශ්නය. කවුද මේ සම්බන්ධ විෂය භාර ඇමතිවරයා? ජනාධිපතිතුමා. ජනාධිපතිතුමා ඒක දැනගෙන හිටියාද, නැද්ද කියන එක නේ ප්‍රශ්නය හැටියට තිබෙන්නේ. මොකද, ජනාධිපතිතුමා රැස්වීම කැඳවන්නේ නොවැම්බර් මාසයේ 27වැනි දා බව මතක තියා ගන්න. නමුත්, මේ ලිපිය ඇවිල්ලා තිබෙන්නේ නොවැම්බර් මාසයේ 23වැනි දා.

ඊළඟට, ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්තුමා ලියුමක් ගහනවා. මොකක්ද එතුමා කියන්නේ? එතුමා සියලු අමාත්‍යාංශ ලේකම්වරුන්ට, ප්‍රධාන ලේකම්වරුන්ට, දෙපාර්තමේන්තු ප්‍රධානීන්ට, දිස්ත්‍රික් ලේකම්වරුන්ට ලියුමක් ගහනවා. මොකක්ද, ඒ? එතුමා කියනවා, "ආපදා තත්ත්වයකදී විපතට පත් වන ජනතාව හා ආපදා අවදානම හේතුවෙන් පදිංචි වාසස්ථානයන්ගෙන් ඉවත් කරන ජනතාවට සහන සැලසීම හා හානියට පත් වූ ප්‍රදේශ යථා තත්ත්වයට පත් කිරීම සඳහා 2025 නොවැම්බර් මස 21වන දින සිට නැවත දැනුම් දෙන තුරු සමස්ත ශ්‍රී ලංකාවම විස්තීර්ණ ආපදා තත්ත්වයකට ලක් වූ බවට මෙයින් ප්‍රකාශයට පත් කරමි." කියලා. කවදාද මෙහෙම කියන්නේ? එතුමා අත්සන් කරලා ලියුම 2025.11.28වැනි දා දානවා. ඒ කියන්නේ, එතුමා backdate කරලා ලියුමක් ගහලා තිබෙනවා. නොවැම්බර් 21වැනි දා ඉඳලා මේ රටේ ආපදා තත්ත්වයක් ඇති වෙලා තිබෙනවා කියලා නොවැම්බර් 28වැනි දා ආරක්ෂක ලේකම්තුමා ලියුම ගහනවා. මොනවාද මේ? මේවා ආණ්ඩුව දන්නේ නැද්ද? සියලු දිස්ත්‍රික් ලේකම්වරුන්ට මෙය ආපදා තත්ත්වයක් හැටියට සලකන්න කියලා ලියුමක් ගහලා තිබෙන්නේ කියලා ආරක්ෂක ලේකම්තුමා ජනාධිපතිතුමාට කිව්වේ නැද්ද? ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, එහෙම නම් මොකටද ඒ ලියුම දැම්මේ? සාකච්ඡා වුණේ මොනවාද? ආරක්ෂක ලේකම් කිව්වේ නැද්ද, එතුමාගේ ප්‍රධානත්වයෙන් 17වැනි දා ඉඳන් 27වැනි දා වෙනකම් සාකච්ඡා තිබුණා කියලා. එහෙම සාකච්ඡා තිබුණා නේද? ඒ backdate කළ ලියුමේ එතුමා එහෙම කියලා තිබෙනවා.

ඊළඟට, ඉන්දියානු කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ගැන අපි හොයා බැලුවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මම වගකීමකින් කියනවා, පැය 12න්, 12ට ඒගොල්ලන් අපේ කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව දැනුවත් කළාය කියන එක. නලින්ද ජයතිස්ස ඇමතිවරයා ගිහිල්ලා මාධ්‍යවලට කිව්වා, "The Indian Express" එක කිව්ව ඒවා බොරු කියලා. මම ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි, "The Indian Express" එක බොරු කිව්වා නම් තමුන්නාන්සේලා ආණ්ඩුවක් හැටියට "The Indian Express" එකට ලියුමක් දැම්මාද, correction එක කළාද, ඒක නිවැරදි කළාද කියලා. නිවැරදි කළා නම් ඒ ලියුම සභාගත කරන්න. TV channel එකකට ගිහිල්ලා කිව්වා, විදේශ කටයුතු අමාත්‍යාංශය ලියුම් ලියනවා කියලා. TV channel එකකට ගිහිල්ලා එහෙම කියලා වැඩක් නැහැ. ඡන්දය දීපු ජනතාව වුන් කරලා කථා කරන්න බැහැ. එහෙම කරන්න එපා. ඔබතුමන්ලා ආවේ විද්‍යාත්මක ක්‍රමයකට වැඩ කරන්න නේ. එම නිසා ඒ විද්‍යාත්මක ක්‍රමවේදය කියන්න. "The Indian Express" එක බොරු කිව්වා නම් ආණ්ඩුවක් හැටියට ඒකට ලියපු උත්තරය සභාගත කරන්න. පාර්ලිමේන්තුවට ගෙනැල්ලා කියන්න, මෙන්න අපි ලියපු ලියුම කියලා. එහෙම නැතුව TV channel එකකට ගිහිල්ලා අපි ඒගොල්ලන්ට ලියුමක් ලියන්න ඉන්නේ කියා එහෙම කියලා වැඩක් නැහැ. අපි නලින්ද ජයතිස්ස මැතිතුමාට කියන්න කැමැතියි, කළු ගඟේ පීනුවා වාගේ මුහුදේ පීනන්න බැහැ කියලා. මොකද, කළු ගඟේ පීනන විධියයි, මුහුදේ පීනන විධියයි ක්‍රම දෙකක්.

---

*** පුස්තකාලයේ තබා ඇත.**
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)
එච්චර ඉක්මනට වේලාවත් ගත වුණාද?

දැන් ඒගොල්ලන් කියනවා, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් එහෙම දෙයක් කිව්වේ නැහැ කියලා. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කාගේ යටතේද තිබෙන්නේ? දැන් කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව තිබෙන්නේ ජනාධිපතිතුමා යටතේ. ඉතින්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් කිව්වේ නැත්නම් ඒකේ වගකීම භාර ගන්න ඕනෑ ඇමතිවරයා විධියට ජනාධිපතිතුමා නේ, වෙන කවුරුවත් නොවෙයි නේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව තිබෙන්නේ ජනාධිපතිතුමා යටතේ. ඉතින්, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව කිව්වේ නැත්නම් ජනාධිපතිතුමා ඒ වගකීම භාර ගන්න ඕනෑ. මොකද, එතුමා ඇවිල්ලා අවුරුද්දක් වෙනවා නේ.

එතුමා දැන් කියනවා, කලින් පනත වෙනස් කරන්න ඕනෑ කියලා. "දිට්වා" ආපු ගමන් තමයි ජනාධිපතිතුමාටත් පනත වෙනස් කරන්න ඕනෑ කියලා මතක් වුණේ. ජනාධිපතිතුමාට මම මේ කාරණය කියන්න කැමතියි. ගැමුණු කුමාරයා කිරි බත් කෑවා වාගේ කියලා කථාවක් තිබෙනවා නේ. අනුර කුමාරත් දැන් අන්න ඒ වාගේ තමයි මේ සම්බන්ධව වැඩ කරගෙන යන්නේ. එතුමාත් තැනින් තැනින් කියනවා. දැන් එතුමා කියනවා, පනත වෙනස් කරන්න ඕනෑ කියලා. පනත වෙනස් කරන්න අවුරුද්දක් තිබුණා නේ. "දිට්වා" දිෂ්ටිය එනකම් ඉන්න ඕනෑ නැහැ නේ, පනත වෙනස් කරන්න. "දිට්වා" ආපු ගමන් තමයි ජනාධිපතිතුමාට මතක් වුණේ මේ පනත හරියන්නේ නැහැ කියලා.

ඊළඟට, ඇමතිතුමා කියනවා, "දිට්වා" කියලා කිව්වේ නැහැ ලු කියලා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, දිට්වාද, රන්වලද, රන්ජන් ජයලාල්ද කියන එක අදාළ නැහැ. සුළි සුළං එනවා, කුණාටුවක් එනවාය කිව්වා නේ. ඒක නේ කිව්වේ. නම වැඩක් නැහැ නේ. දිට්වා එනවාද, රන්වල එනවාද, රන්ජන් ජයලාල් එනවාද කියන එක වැඩක් නැහැ. සුළි සුළඟක් එනවා, කුණාටුවක් එනවා කියලා කිව්වා. නමුත්, ඒක තේරුම් ගන්න බැරි වුණා.

මම ජනාධිපතිතුමාට මේ කාරණයත් කියන්න කැමැතියි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, සිංහල කියමනක් තිබෙනවා, "ගෙදර මහ පොතක් ඇත, එකක්වත් මතක නැත" කියලා. ඔබතුමන්ලාගේ ගෙදර තිබෙනවා, "පොහොසත් රටක් - ලස්සන ජීවිතයක්" කියන ලොකු පොත. ඒ පොතේ තිබෙනවා, ආපදා කළමනාකරණ පනත වෙනස් කරන්න ඕනෑ කියලා. දැන් එතුමා ඇවිල්ලා අවුරුද්දක් ගත වුණා නේ. ඒකයි මම කියන්නේ.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, අවසන් කරන්න.

**ගරු මුජිබුර් රහුමාන් මහතා**
(மாண்புமிகு முஜிபுர் றஹுமான்)
(The Hon. Mujibur Rahuman)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මම අවසන් කරන්නම්.

ඒ නිසා අපි කියනවා, ඒ පොත කියවන්න කියලා. ඒ විතරක් නොවෙයි, මේ සම්බන්ධයෙන් විශේෂ කාරක සභාවක් පත් කරන්න කියලා අපි අද තමුන්නාන්සේලාගෙන් ඉල්ලීමක් කළා. මොකද, මේ අසාධාරණයට ලක් වුණු ජනතාවට සාධාරණය ඉෂ්ට වෙන්න ඕනෑ. මේ අපරාධයට වග කියන්න ඕනෑ පුද්ගලයින් සොයා ගන්න ඕනෑ. ඒ පුද්ගලයින් සොයා ගන්න නම්, විශේෂ කාරක සභාවක් පත් කරන්න. නැවත මෙවැනි අපරාධයක් නොවෙන්න වැඩ කිරීම තමුන්නාන්සේලාගේත් වගකීමක්, අපේත් වගකීමක් කියන එක මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 1.41]

**ගරු වසන්ත සමරසිංහ මහතා (වෙළෙඳ, වාණිජ, ආහාර සුරක්ෂිතතා සහ සමුපකාර සංවර්ධන අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ - வர்த்தக, வாணிப, உணவுப் பாதுகாப்பு மற்றும் கூட்டுறவு அபிவிருத்தி அமைச்சர்)
(The Hon. Wasantha Samarasinghe - Minister of Trade, Commerce, Food Security and Cooperative Development)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අද දවසේ අපි විවාදයට ලක් කරන්නේ, "දිට්වා" සුළි කුණාටුවෙන් මේ රටට සිද්ධ වුණු ආපදාව ප්‍රතිපූරණය කර ගන්න, එහෙම නැත්නම් ඒ ආපදාවට ලක් වුණු ප්‍රදේශ යථාවත් කරන්න, ඒ ජනතාවට සහන සලසන්න වාගේම, රටක් හැටියට නැවත මේ රට ගොඩ නඟන්න අවශ්‍ය කරන මුදල් හැටියට රුපියල් බිලියන 500ක් වෙන් කර ගැනීමට ඉදිරිපත් කරන ලද පරිපූරක ඇස්තමේන්තුව පිළිබඳවයි. ඒ රුපියල් බිලියන 500 වෙන් කරලා වියදම් කරන්නේ කොහොමද කියන එකත් කියලා තිබෙනවා. ඒ නිසා මට හිතෙන්නේ, ඒ කාරණයට අදාළව අදත් විපක්ෂය පැත්තෙන් ඉදිරිපත් වෙන කරුණු අපි නොසලකා හරින්න ඕනෑත් නැහැ, නමුත්, මේ කියන කථා දිගටම මෙහෙම කිය කියා ඉන්න එකෙන් විපක්ෂයේ වුවමනාව මොකක්ද කියලාත් තේරෙනවා. ඔවුන් තවදුරටත් කියන්න උත්සාහ කරනවා, මේ සුළි කුණාටුව පිළිබඳව කල් ඇතිව දැනගෙන ඉඳලා, එහෙම නැත්නම් මේ ගැන කල් ඇතිව කිව්වා, ඒ අදාළ ආරක්ෂක පියවර ගත්තේ නැහැ කියන කථාව. ඒ පිළිබඳව විවිධ තැන්වලදී විවිධ අදහස්, විවිධාකාරයෙන් ඉදිරිපත් වුණා.

මේ තමයි අපේ රටේ season එක, වැසි වැඩි වෙන කාලය. මේකට මහ කන්නය කියලා තමයි, අපේ රටේ ගොවි ජනතාව කියන්නේ. මේ කාලයට කඳුකර ප්‍රදේශවලට වැසි වැටෙන කොට ගංගා පිරෙනවා, ඒ වාගේම වැස්ස වැඩි වුණාට පස්සේ ජලාශ ටික පිරෙනවා, වැව් ටික පිරෙනවා. අනුරාධපුරයේ ජීවත් වන අපේ ලොකුම බලාපොරොත්තුව තමයි, ඒ වැව් ටික පිරිලා, ඒකෙන් මහ කන්නයේත් වැඩ කරලා, යල කන්නයේත් වැඩ කරන්න වතුර ටිකක් එකතු කර ගන්න එක.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රටක ජනතාවක් විශ්වාසයෙන් ගොඩ නඟපු ආණ්ඩුවකට, මේ රටේ ජනතාවට විපතක් වෙන එක හංගන්න තරම් මොළේ අමාරුවක් හෝ පිස්සුවක් නැහැ. මේ පිළිබඳව ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවේදීත් යම් අවස්ථාවක සාකච්ඡා වුණා. ඒ තමයි, 11වැනි මාසයේ 23වැනි දා. ඒ පිළිබඳව ඒ කමිටු වාර්තාවේත් සඳහන්ව තිබෙනවා. මොකද, මේ Maha season එක පටන් ගන්න කොට කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව අපට සඳහන් කරලා තිබෙනවා,

[ගරු වසන්ත සමරසිංහ මහතා]

කුණාටු තත්ත්වයක් ඇති වීමට ඉඩක් තිබෙන්න පුළුවන් නමුත්, ඒක පහව ගියොත් අපට dry season එකක් එනවා කියලා. සියයට 15ක් විතර වැස්ස අඩුවෙන් ලැබෙනවා කියලා අපි මේ වන විට පුරෝකථනය කරලායි තිබෙන්නේ. ඒ නිසා ඒ තත්ත්වයට මුහුණ දීම සඳහා කටයුතු කරන්න වෙනවා; ගොවීන්ගේ වගා හානි වුණොත් ඒවාට අදාළව insurance ගෙවන්න වෙනවා. ඒ වාගේ දේවල් කියලා තිබෙනවා.

ඒ නිසා මේ ඇති වුණු තත්ත්වය තවදුරටත් විකෘති කරන්න විපක්ෂය ගන්නා උත්සාහ පිළිබඳව අපි කනගාටු වෙනවා. මේ ව්‍යසනයේ තරම දැනගෙන, ඒක මායිම් නොකර තවදුරටත් මේ සිදු කරන අපවාද, අවලාද වාගේම මේ නිර්ලජ්ජිත උත්සාහය ගැන අපි කනගාටු වෙනවා. මොකද, මේ තමයි අපේ රටේ ඉතිහාසයේ විශාල වශයෙන් වැසි වැටුණු කාලය. මීට කලින් අපට මෙහෙම වැසි වැටිලා නැහැ. මේ තමයි ලංකාවම එකවර ස්වාභාවික ආපදාවකට ලක් වුණු අවස්ථාව. මුළු රටක මිනිස්සු මේ හේතුවෙන් පීඩාවට පත් වුණා; ජීවිත 700කට ආසන්න ප්‍රමාණයක් අපට අහිමි වුණා; තවත් එකසිය ගණනක් අතුරුදහන් වුණා. මෙහිදී පීඩාවට පත් වෙච්ච ඒ මිනිසුන් වෙනුවෙන්, රටක් හැටියට ගත යුතු උපරිම තීරණ අරගෙන, උපරිම සාධාරණය ඉෂ්ට කරන්න අපි කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා විපක්ෂය මේ සිදු කරමින් තිබෙන්නේ අපරාධයක්. තවදුරටත් මේ අපරාධය කරන එක නවත්තලා, අඩුම තරමින් මේ ඇති වෙලා තිබෙන තත්ත්වයෙන් මේ රට ගොඩ ගැනීම සඳහා තමන්ට කළ හැකි දේවත් කරන්න එකතු වෙන්න. ඒ කළ හැකි දේවත් කරන්න එකතු වෙන එක වෙනුවට, බොරු කිය කියා යන එක තමයි අද විපක්ෂයේ කාර්යභාරය වෙලා තිබෙන්නේ. ඔවුන් භීතියක් හදනවා, බොරුවක් මවන්න හදනවා. අපරාධයක් ගැන කරුණු කියමින් බොරු කියනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මෙවැනි ආපදා තත්ත්වයකින් පසුව ඊළඟට රටේ ජනතාවට ලෙඩ රෝග ඇති වෙන්න පුළුවන්. ඒ අය නැවත පදිංචි කරවීමේ වගකීම අපට පැවරිලා තිබෙනවා. ඒ වාගේම, කෘෂි කර්මාන්තය පැත්තෙන් අපට මුහුණ දෙන්න සිදු වෙලා තිබෙන බරපතළ ප්‍රශ්නයක් තිබෙනවා. අපි ආහාර සුරක්ෂිතතාව පිළිබඳව අවධානය යොමු කරන්න ඕනෑ. මාර්ග පද්ධතිය පිළිසකර කරලා, මාර්ග පද්ධතිය විවෘත කර ගන්න ඕනෑ. වැව් ටික හදා ගන්න ඕනෑ. ඒ නිසා මම මේ කථාව පටන් ගන්න හිතුවේ එතැනින්.

මේ ආපදාවට පත් වෙච්ච ජනතාවට සහන දුන්නේ නැහැ කියන විපක්ෂයට කියන්න ඕනෑ, තමන් ආණ්ඩු කරපු කාලවලදී; තමන්ගේ ආණ්ඩුව යටතේ, ආපදාවට පත්වෙච්ච ජනතාවට ලබා දුන්නේ මොනවාද කියලා ආපහු හැරිලා බලන්න කියලා. ජනාධිපති අනුර දිසානායක සහෝදරයා පාර්ලිමේන්තුවට ඇවිල්ලා කිව්වා, මේ උවදුරේදී ලබා දිය හැකි උපරිම දේවල් අපි ජනතාවට ලබා දෙනවා කියලා. විපක්ෂය දැන් මේ කියන්නේ සමහර තැන්වල මතු වෙච්ච චූටි චූටි ප්‍රශ්න ගැන. ප්‍රශ්න තිබෙන්න පුළුවන්. සමහර ග්‍රාම නිලධාරින්ගේ, ප්‍රාදේශීය ලේකම්වරුන්ගේ දුර්වලතා තිබෙන්න පුළුවන්, ප්‍රමාදයන් තිබෙන්න පුළුවන්. හැබැයි, අපි ඒ පටන් ගත්තු වැඩේ අද වන කල් - අද දෙසැම්බර් 19වැනිදා - දවස් 20කට ආසන්න කාලයක් සාර්ථකව කරගෙන ඇවිත් තිබෙනවා. නොවැම්බර් 30වැනිදා වෙනකල් ගංවතුර තත්ත්වය තිබුණා. දවස් 20කට ආසන්න කාලයක් තුළ අප කරමින් ඉන්නේ මහා ව්‍යායාමයක්. විපක්ෂයේ සමහර මන්ත්‍රීවරු මේවා ගැන ලාවට වාගේ කියාගෙන ගියා. මොකද, එතුමන්ලා ගම්බිම්වල ඉන්න එපායැ. මොකද, මේ වැඩ ටික කෙරෙන්නේ නැහැ කියලාම කියන්නත් බැහැ නේ. සමහරු ගිහිල්ලා බොරු කියන්න හදද්දී, ජනතාව ඒවා ප්‍රතික්ෂේප කරන හැටි අපි දැක්කා. අපි, දීපු දේවල් ගැන ඇති තරමට කරුණු කිව්වා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, වැව් බඳින එක ගැනත් විපක්ෂයේ සමහර අය කිව්වා. වැව් කියන්නේ අපේ රටේ ගොවි ජනතාවගේ ජීවිත වාගේයි. ගමේ වැව කැඩුණා කිව්වාම ගොවියාට දැනුණේ මොකක්ද? තමන්ගේ මුළු සේසතම නැති වුණා වාගේ හැඟීමක්. වැවක් කියන්නේ, බැම්මක් බැඳලා වතුර එකතු කරන එකක් විතරක් නොවෙයි. වැව හා බැඳුණු සංස්කෘතියක් තිබෙනවා. ඒ වැවත් එක්ක තමයි ගම ගොඩ නැඟුණේ. ඒ වැවත් එක්ක තමයි ගමේ ආර්ථිකය හැදුණේ. ඒ වැවත් එක්ක තමයි ඒ මිනිස්සු 365 දවසේම ජීවත් වුණේ. වැවෙන් මාළු ටික අල්ලා ගත්තා වාගේම, වැවෙන් මලක් කඩා ගත්තා වාගේම, උදේ හවස නාන්න, රෙදි ටික හෝදා ගන්න, ජීවිතේ එදිනෙදා කටයුතු කර ගන්න, සතා සිවුපාවට වතුර ටික පොවන්න, කෘෂි කර්මාන්තයට වතුර ටික හරවා ගන්න වැව භාවිත කළා. ඒ තරමටම වැව අපේ ජීවිතවලට සම්බන්ධයි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වැව් 630කට වැඩි ප්‍රමාණයක් කැඩුණා. අපි සමහර ඒවා කැපුවා. සමහර තැන්වල වැව කැඩෙන එක නවත්වන්න ගොවියෝ වාන කැපුවා; වැව කැඩෙන එක නවත්වන්න පිටවානේ ගැඹුර වැඩි කළා. ගොවියෝ ඒ දේවල් කරමින් මහා වැස්සේ, ඒ කුණාටුව අස්සේ මහා ප්‍රයත්නයක් දැරුවා. ඒ මිනිසුන්ට ජාතියේ ආචාරය හිමි වෙන්න ඕනෑ. රටේ මිනිසුන්ට හෙට දවසේ බත දෙන්න තමයි ඒ වැඩේ කළේ. හෙට දවසේ රටේ මිනිසුන්ට කෑම ටික දෙන්න, එළවළු ටික දෙන්න තමයි ඒ වැඩේ කළේ. ගයන්ත මන්ත්‍රීතුමනි, ඔබතුමන්ලාගේ සමහර මන්ත්‍රීවරු කිව්වා, වැලි කොට්ට දමලා වැව් හදන එක හරියන්නේ නැහැ කියලා. අපි ඒ අයට කියනවා, වැවක් හදන තැනකට ඇවිල්ලා බලන්න කියලා. කැඩිච්ච වැවක් හදන්නේ කොහොමද කියලා ඇවිල්ලා බලන්නකෝ. අනුරාධපුරයේ එක්තරා වැවක ඒ හානිය නවත්වා ගත්තේ, වැලි කොට්ට 18,000ක් දමලායි, ගයන්ත මන්ත්‍රීතුමනි. ඒ වැව් බැම්ම තැන් දෙකකින් කැඩුණා. වැව් 65ක් හදන්න, මේ වෙනකොට වැලි කොට්ට 150,000කට වඩා පාවිච්චි කරලා තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වෙනුවෙන් රට පුරා දායක වන ත්‍රිවිධ හමුදාවේ සාමාජිකයන්, පොලීසිය සහ සිවිල් ආරක්ෂක සේවා නිලධාරින් ඇතුළු සියලු දෙනාටම අපේ ගෞරවය පිරිනමන්න ඕනෑ. ඒ වාගේමයි ගම්වල මිනිස්සු. තමන්ගේ ගෙදර තිබෙන හාල් ටිකෙන්, එළවලු ටිකෙන් කෑම උයාගෙන ගිහිල්ලා, එහෙම නැත්නම් තමන්ට දෙන්න පුළුවන් මඤ්ඤොක්කා අලය හරි තම්බා ගෙන ගිහිල්ලා වැඩ කරන මිනිසුන්ට කන්න දීලා, තමනුත් එතැන ඉඳගෙන වැලි ටිකක් පුරවලා දීලා තමන්ගේ වැව ප්‍රතිසංස්කරණය කර ගන්න කටයුතු කරනවා.

ඒ ඇයි? අපි මේ ඉන්නේ මහ කන්නයේ. මහ කන්නයට වැසි වතුර ටික එකතුකර ගන්න ඕනෑ. දැන්, මාසයක්; සති තුනක්, සති හතරක් වෙච්ච පැළ ගොයම තමයි තිබෙන්නේ. ඉස්සරහට ඒ පැළ ගොයමට අවශ්‍ය වතුර ටික ඕනෑ. ඒ විතරක් නොවෙයි, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. අපි හෙක්ටෙයාර 500,000ක් නොවෙයි, හෙක්ටෙයාර 630,000ක් වවලා තිබුණා. මේ අවුරුද්දේ අපේ target එක, හෙක්ටයාර 840,000ක් වවන එකයි. අතරමහ වගා කරන්න සූදානම් කරලා තිබුණු භූමි තිබුණා. ඒවායෙනුත් සමහර ඒවා විනාශ වුණා. කුඹුරුවලට විතරක් සිදු වුණු සමස්ත හානිය හෙක්ටෙයාරවලින් ගත්තොත්, හෙක්ටයාර 106,000ක් වනවා. වගා කරලා තිබුණු භූමිය ඇතුළුව සමස්ත භූමිය ගත්තාම හෙක්ටෙයාර 840,000ක් තිබෙනවා. ඒකෙන් සියයට 15කට ආසන්න ප්‍රමාණයකට හානි වුණා. හෙක්ටෙයාර 106,000න් හෙක්ටයාර 80,000කට වඩා වගා කරන්න පුළුවන්. උදාහරණයක් විදියට, අනුරාධපුර දිස්ත්‍රික්කයේ වගා භූමි හෙක්ටෙයාර 20,000ක් විතර සම්පූර්ණයෙන්ම හානි වුණා. ඒකෙන් හෙක්ටෙයාර 17,000ක පමණ නැවත වගා කරන්න

පුළුවන්. අනෙක් ඒවා වගා කරන්න බැහැ. හේතුව තමයි පොළොව හාරගෙන ගිහිල්ලා, මුළු කුඹුරම වැලිවලින් පිරිලා. ඒ නිසා රජය ඒ ගොවියන්ට හෙක්ටෙයාර එකකට රුපියල් 150,000ක් දුන්නේ නිකම් නොවෙයි. වගා කරන්න පුළුවන් නම් නැවත වගා කරන්නත්, නැවත වගා කරන්න බැරි වන අයට ජීවත් වෙන්නත් රුපියල් 150,000ක් හෙක්ටෙයාර එකක් වෙනුවෙන් ලබා දුන්නා. වැව් තමන්ගේ ජීවිතය වාගේ නඩත්තු කරපු ගොවියාට, වැව් තමන්ගේ පවුල වාගේ නඩත්තු කරපු ගොවියාට, තමන්ගේ ගමේ සාමූහිකත්වය, සහයෝගය, සහෝදරත්වය, එකමුතුකම ඇති කරන්න හේතු වුණු වැව කඩා ගෙන ගියාට පසුව දැනුණු වේදනාවවත් විපක්ෂයට දැනිලා නැහැ. අඩුම තරමින් ඒ වේදනාවවත් විපක්ෂයට දැනිලා නැහැ. වැවක්, දෙකක් හදන තැනකට ගිහිල්ලා වැලි කොට්ට ටිකක් ගහලා, ඒ වැලි කොට්ට ටික දාලා ඒ ජනතාවත් එක්ක එකතු වුණා නම් ඒ පීඩාව, ඒ වේදනාව විපක්ෂයටත් දැනෙනවා. එහෙම නොකරපු නිසා විපක්ෂයට ඒ වේදනාව දැනෙන්නේ නැහැ. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මම කියන්න ඕනෑ, මේ රට නැවත ගොඩ නැඟීමේදී රජරට අපට වැව් ටික විශේෂ බව. එම නිසා වැලි කොට්ට ගහලා නොවෙයි, තමන්ට පුළුවන් නම් අල්ලෙන් වහලා හරි ඒ වැව් ටික රැක ගන්න ගොවියෝ වැඩ කරනවා. මොකද, මේ මහ කන්නයේ මිනිසුන්ට කන්න දෙන්න ඕනෑ. සමහර වැව් තිබෙනවා, මහ කන්නයේ විතරයි වැඩ කරන්න පුළුවන්. ඊළඟ යල් කන්නයේ වැඩ කරන්න වතුර ටික තබා ගන්න බැහැ. මොකද, යල් කන්නයේ වැඩ කළොත් ඊළඟ මහ කන්නයේ වතුර ටික එකතු කරන්න වැව හදා ගන්න බැහැ. ඒ නිසා මේ මහ කන්න වැඩ කරලා, ලබන යල් කන්න අත් හැරලා, වැව හදලා ඊළඟ මහ කන්නට වතුර ටික එකතු කර ගන්න තමයි දැන් ගොවියන් සූදානම් වෙන්නේ, ගරු මන්ත්‍රීතුමනි. ඒ තරමට ගොවියාට වැව වැදගත්.

වෙළෙඳ ඇමතිවරයා හැටියට මමත්, කෘෂිකර්ම ඇමතිවරයාත් අපේ ආහාර ප්‍රතිපත්ති හා සුරක්ෂිතතා කමිටුවේදී මේ රටේ ආහාර නිෂ්පාදනය සම්බන්ධයෙන් සාකච්ඡා කළා. රටේ ආහාර සුරක්ෂිතතාව ඇති කිරීම ගැන අවධානය යොමු කරද්දී සහල්වල හිඟයක් එනවාද කියන කාරණය පිළිබඳව අපි සොයා බලලායි තිබෙන්නේ. දැනට තිබෙන තත්ත්වය අනුව, මේ වගා භූමි ටික වගා කළොත් අපට සහල්වල හිඟයක් එන්නේ නැහැ. හැබැයි, විශේෂත්වයක් තිබෙනවා. මාස හතරේ වී තමයි සම්බා සහ කීරි සම්බා. මාස තුනහමාරේ කීරි සම්බා බීජ හොයා ගන්න අපට බැහැ. එම නිසා එතැනදී හිඟයක් ආවොත්, කීරි සම්බාවල සහ සම්බාවල හිඟයක් ඇති වෙන්න පුළුවන්. හැබැයි, රතු සහල් සහ නාඩු -බාල වී කියන එක- හිඟයක් ඇති වෙන්නේ නැහැ.

ඒ වාගේම ගොවිතැනට අදාළව දැවැන්ත ලෙස හානි වුණු තවත් ක්ෂේත්‍ර තිබෙනවා. හෙක්ටෙයාරවලින් ගත්තොත්, බඩ ඉරිඟු හෙක්ටෙයාර 10,000ක් හානි වෙලා තිබෙනවා. රට කජු ගත්තොත්, හෙක්ටෙයාර 2,011ක් හානි වෙලා තිබෙනවා. අමු මිරිස් ගත්තොත්, හෙක්ටෙයාර 1,188ක් හානි වෙලා තිබෙනවා. උඳු ගත්තොත්, හෙක්ටෙයාර 2,019ක් හානි වෙලා තිබෙනවා. මේ විධියට ගත්තොත්, සියලු භෝගවලට මේ හානිය සිද්ධ වෙලා තිබෙනවා. මේ සියලු භෝග අතරින් සමහර ඒවා මේ වෙලාවේ ආපහු වවන්න බැහැ. අපට මේ වෙලාවේ බඩ ඉරිඟු ආපහු වවන්න බැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි. මොකද, වගා කළ යුතු කාලය අවසන් වෙනවා; වැස්සට අහු වෙනවා.

රට හැටියට මුහුණ දුන්නු මේ ආපදාව, උවදුර හමුවේ ආණ්ඩුව හැටියට ලබා දිය යුතු සියලු සහන අපි ලබා දුන්නා. ධීවරයාගේ බෝට්ටුව, ගොවියාගේ කුඹුර, ව්‍යාපාරිකයාගේ කඩය, සාමාන්‍ය ජනතාවගේ ගෙදර, පොඩි දරුවාගේ - පාසල් දරුවාගේ - පාසල් පොත් ටික ආදි සියල්ල ගැන අපි කල්පනා කළා. පාසල් පොත් ටික ගන්න රුපියල් 25,000ක්, ගේ සුද්ද කර ගන්න රුපියල් 25,000ක්, උපකරණ ගන්න රුපියල් 50,000ක් ආදි වශයෙන් රජය විධියට ලබා දිය යුතු සියලු සහයෝගය ලබා දීම වෙනුවෙන් තමයි අද මේ පරිපූරක ඇස්තමේන්තුව අනුමත කරවා ගන්නේ. ඒ වාගේම අපි බලාපොරොත්තු වෙනවා, ඉදිරියටත් ලබා දිය යුතු සහන ලබා දෙන්න වාගේම තවත් දේවල් කරන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, හදා ගන්න බැරි වුණු පාරවල් ද තිබෙනවා. අපි ඒ සම්බන්ධයෙන් දැනුත් කථාකළා. මධ්‍යම නුවරගම් පළාත ප්‍රාදේශීය සභාවේ විලච්චිය, බෝගස්වැව ප්‍රදේශයේ කිලෝමීටරයක් විතර දුරට පාර කැඩිලා තිබෙනවා අඩි අටක් විතර ගැඹුරට. ඒ තරමට -අඩි අටක් විතර ගැඹුරට- ඒ පාර කැඩිලා තිබෙනවා. පස් දැම්මොත් පස් ටොන් 3,000කට වඩා දමන්න ඕනෑ, ඒ පාර තාවකාලිකව හදා ගන්න. අපේ ම.නු.ප. ප්‍රාදේශීය සභාවේ සභාපතිතුමා, අපේ දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව, ආණ්ඩුකාරතුමා, දිස්ත්‍රික් ලේකම්තුමා, ප්‍රධාන ලේකම්තුමා ඇතුළු අපි එකතු වෙලා තීරණයක් අරගෙන ඒ පාර තාවකාලිකව හදනවා. එහෙම නැත්නම්, ඒ ගම්වල මිනිසුන් ජීවත් වන ප්‍රදේශවලට යන්න බැහැ. වැව් ටික හැදුවාට පසුව ඒක තමයි අපට තිබුණු ලොකුම අභියෝගය. වැව් ටික හැදුවා, පාරවල් ටික හැදුවා, ජනතාවට සහන දුන්නා. ඒ සහන දෙන ගමන් තාවකාලික පිළියම් අවසන් කරලා ස්ථිර විසඳුම්වලට යෑම සඳහා තමයි අපි දැන් වැඩ කරමින් ඉන්නේ. ස්ථිර විසඳුම්වලට යන්න හදන අපට විපක්ෂය කරන සමහර කථාවලට උසුළු විසුළු කරනවා හැර වෙන කියන්න දෙයක් නැහැ, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කථාව අවසන් කරන්න, ගරු ඇමතිතුමා.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
මම තවත් විනාඩියකින් කථාව අවසන් කරන්නම්.

මේ වනකොට විවිධ කථා කියපු විපක්ෂයේ අයගෙන් මම ඉල්ලීමක් කරනවා. ඔබතුමන්ලා දැන්වත් ගිහිල්ලා බලන්න, කලාඔය කොච්චර දරුණු වුණාද කියලා; දැන්වත් ගිහිල්ලා බලන්න, මල්වතු ඔය කොච්චර දරුණු වුණාද කියලා; දැන්වත් ගිහිල්ලා බලන්න, මහවැලි ගඟ කොච්චර දරුණු වුණාද කියලා; දැන්වත් ගිහිල්ලා බලන්න, දැදුරු ඔය කොච්චර දරුණු වුණාද කියලා. ඉතිහාසයේ සිදු වුණු විශාලම ස්වාභාවික උවදුරෙන් මිනිසුන්ගේ ජීවිතවලට වෙච්ච බලපෑම හමුවේ, ඒ උවදුර හමුවේ රජය හැටියට මාලිමාව ආණ්ඩුව ඉතිහාසයේ කවදාවත් නොවුණු විධියට කෙටි කාලයක් තුළ ඒ සියලු ජනතාවට සහන දෙන්න කටයුතු කළා. ඒ විතරක් නොවෙයි, ඉදිරියටත් මේ රට ගොඩ නැඟීම වෙනුවෙන් මුළු රටේම ජනතාව, ආරක්ෂක අංශ, ග්‍රාම නිලධාරිතුමා ඇතුළු රාජ්‍ය සේවකයන් සියලුදෙනා එක්ව, විදේශගත ශ්‍රී ලාංකිකයන්, විදේශ රාජ්‍යයන් ඇතුළු සියලුදෙනාගේ මිත්‍රත්වය, සහෝදරත්වය හරහා, මනුස්සකම පිරි, හදවත් විශාල මිනිසුන් සියලුදෙනා එකට එකතු කරලා මේ රට නිශ්චිත ලෙස ආපසු හැරවිය නොහැකි ලෙස නැවත ගොඩ නැඟීම සිදු කරනවා. අන්න, ඒ කටයුත්තත් එක්ක අත්වැල් බැඳගන්න කියන ආරාධනය කරමින් මම නවතිනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ජීවන් තොන්ඩමන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[பி.ப. 1.56]

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே!

கடந்த வாரம் மலையகத்தைச் சேர்ந்த சமூக செயற்பாட்டாளர்கள் குறிப்பாக, ஜீவரட்னம் சுரேஷ் அவர்களும் அன்டனி ஜேசுதாஸன் அவர்களும் மலையகப் பிரதிநிதிகளுக்கும் சிவில் அமைப்புகளின் தலைமைகளுக்கும் இடையில் கலந்துரையாடல் ஒன்றை ஏற்படுத்தியிருந்தார்கள். இவர்கள், " நிவாரணம், புனர்வாழ்வு, புனர்நிர்மாண நடவடிக்கைகளில் மலையக மக்கள் எதிர்நோக்கும் சவால்களும் தீர்வு நோக்கிய முன்மொழிவுகளும்" என்ற தலைப்பிலான ஓர் ஆவணத்தைச் சமர்ப்பித்து இருந்தார்கள். அதை நான் அவர்கள் சார்பாக இந்தப் பாராளுமன்றத்தில் ***சமர்ப்பிக்கின்றேன்.** அவர்களுக்கு இந்த சபையில் எனது நன்றியையும் தெரிவித்துக் கொள்கின்றேன்.

'தித்வா' புயலால் பாதிக்கப்பட்ட குடும்பங்கள் ஆயிரக்கணக்கில் இருக்கின்றன. இன்றைய தினம் விவாத முடிவில் அரசாங்கம் கட்டாயம் வாக்கெடுப்பைக் கோருமென எதிர்பார்க்கின்றேன். கடந்த வாக்கெடுப்பில் நான் ஆதரவாக வாக்களித்ததற்கு ஒரே காரணம், இந்தச் சபையில் நாம் அனைவரும் ஒரே குரலில் இருந்தாக வேண்டும் என்பதற்காகத் தான். ஏனெனில், இந்த அனர்த்தம் அனைவரையும் பாதித்துள்ளது. இங்கிருக்கின்ற பாராளுமன்ற உறுப்பினர்கள் - அவர்கள் ஆளுங்கட்சியினராக இருக்கட்டும், எதிர்க்கட்சி யினராக இருக்கட்டும் - ஒருவரையொருவர் குறைசொல்வதை விடுத்து, தங்கள் தங்கள் தொகுதிக்கு என்னென்ன உதவிகளைச் செய்ய முடியும் என்றுதான் பார்த்தார்கள். அந்த அடிப்படையில், இலங்கை தொழிலாளர் காங்கிரஸின் பொதுச் செயலாளராகிய நான், என்னால் முடிந்த உதவிகளைச் செய்திருக்கிறேன். நான் இங்கு கட்டாயம் "CELESTE"ஐப் பிரதிநிதித்துவப்படுத்தும் ஜனிக் ஜயசூரியவுக்கு நன்றி தெரிவிக்க வேண்டும்.

இலங்கை - இந்திய சமுதாயப் பேரவையைப் பிரதிநிதித்துவப் படுத்தும் சிவராமன் அவர்களுக்கும் டாக்டர் ராமசுப்பு அவர்களுக்கும் செல்வகுமார் கந்தசாமி அவர்களுக்கும் தனுஷ் தேவநாயகம் அவர்களுக்கும் பால்ராஜு அருணாசலம் அவர்களுக்கும் என்னுடைய நன்றியைத் தெரிவித்துக் கொள்கின்றேன். எங்களால் கிட்டத்தட்ட 60 இலட்சம் ரூபாயைத் திரட்ட முடிந்தது. அதன்மூலம் 2,137 குடும்பங்களுக்கு உதவி செய்ய முடிந்தது. இன்றைய நிலைமையில் இது போதாது. இதனுடன் சம்பந்தப்பட்ட கணக்கு வழக்குகள் முழுமையாக என்னிடம் இருக்கிறது. அதனையும் நான் இந்தச் சபையில் ***சமர்ப்பிக்கின்றேன்.**

நான் இந்த இடத்தில் ஒரு விஷயத்தைச் சொல்ல விரும்புகின்றேன். மாண்புமிகு சனாதிபதி அவர்கள் பாராளுமன்ற கட்டிடத் தொகுதிக்கு வந்திருப்பதாகக் கேள்விப்பட்டேன். அவர் எனது உரையைக் கேட்டுக்கொண்டு இருப்பாரென நம்புகிறேன். கடந்த பாராளுமன்ற அமர்வில் நான், கொத்மலையில் நடந்த அசம்பாவிதம் சம்பந்தமாகவே உரை நிகழ்த்தியிருந்தேன். அதன்போது, அந்தப் பகுதியில் இருக்கின்ற பிரதேச செயலாளர் சரியான முறையில் நடவடிக்கை எடுக்கவில்லை என்ற விஷயத்தை முன்வைத்தேன். அமைச்சர்களாக இருக்கட்டும், அரசாங்கத்தைப் பிரதிநிதித்துவப்படுத்தும் உறுப்பினர்களாக இருக்கட்டும், கட்டாயம் இது சம்பந்தமாக நடவடிக்கை எடுப்பார்கள் என்ற நம்பிக்கை எனக்கு இருந்தது. நேற்றைய தினம் அதே பகுதியில் இருக்கின்ற மக்கள் சமூக வலைத்தளங்களில் இந்தக் குற்றச்சாட்டை வெளிப்படை யாகவே சொல்லியிருக்கிறார்கள். அன்றைக்கு நான் பாராளுமன்றத்தில் இது சம்பந்தமான குற்றச்சாட்டை முன்வைக்கும்போது இருந்த negligence இன்றைக்கு அதிகரித்திருக்கிறது. இது வேதனைக்குரிய விஷயம்! அங்கு வாழ்கின்ற மக்களைப் பிரதேச செயலாளர் முழுமையாகவே புறக்கணிக்கிறார்.

நான் என்னுடைய பாராளுமன்ற காலத்தில் ஒரு தடவைகூட இனரீதியாக உரை நிகழ்த்தியது கிடையாது. கொத்மலை, உடபுசல்லாவ பிரதேசங்களில் மட்டுமல்ல, எங்கு சிங்கள சமூகத்தினர் அதிகமாக வாழ்கிறார்களோ, அங்குள்ள தமிழ் மக்களை பிரதேச செயலாளர் புறக்கணிக்கிறார். இதுதான் உண்மை! இது சம்பந்தமாக அரசாங்கம் கட்டாயமாக நடவடிக்கையெடுக்க வேண்டும். அன்று நான் அந்தக் குற்றச்சாட்டை முன்வைத்ததற்குக் காரணம், வேவண்டன் தோட்டத்தில் இருக்கின்ற மக்கள் அந்தக் குற்றச்சாட்டை பாராளுமன்றத்தில் முன்வைக்குமாறு சொன்னார்கள். நான் அந்தக் குற்றச்சாட்டை முன்வைத்ததனால், இன்றைக்கு அந்த சமூகம் ஒட்டுமொத்தமாக புறக்கணிக்கப்பட்டு இருக்கிறது. இதே நிலைமைதான் அனைத்துப் பகுதியிலும் இருக்கின்றது.

கௌரவ அமைச்சர் அவர்களே, உங்களுடைய நோக்கம் இதுவல்ல என்பது எனக்குத் தெரியும்! ஆகவே, தயவுசெய்து இது சம்பந்தமாக நடவடிக்கை எடுங்கள்! எல்லோரும் மோசமானவர்களென நான் சொல்ல வரவில்லை. ஓரிருவருடைய செயற்பாடுகளால் இன்றைக்கு அரசாங்கத்துக்கு மட்டும் கெட்ட பெயர் கிடையாது; எங்களுக்கு மட்டும் கெட்ட பெயர் கிடையாது; இலங்கை நாட்டுக்கே கெட்ட பெயர்! அதேமாதிரி, இன்றைக்கு கிராம சேவகர்கள் பெயருக்கு நிறைய இடங்களுக்குப் போகிறார்கள்; பதிவுகளை மேற்கொள்கிறார்கள். ஆனாலும், அவர்கள் சரியான முறையில் எதையும் செய்ய மாட்டார்கள்.

கடந்த 9ஆம் திகதி நுவரெலியா மாவட்டத்தில் DCC meeting நடைபெற்றது. அங்கு ஒன்றரை இலட்சம் குடும்பங்கள் இருப்பதாகவும் அவர்களுக்கு ஒன்பது இலட்சம் பேச்சர்ஸ் காணி தேவைப்படுவதாகவும் அந்தக் கூட்டத்தில் மாண்புமிகு சனாதிபதி அவர்கள் தெளிவாகச் சொல்லியிருந்தார். அதன்படி பார்த்தால், ஒரு குடும்பத்துக்கு 6 பேச்சர்ஸ் காணிதான் கிடைக்கும். கௌரவ திகாம்பரம் அவர்கள் அமைச்சராக இருக்கும்போது சட்ட ஏற்பாடொன்று கொண்டுவரப்பட்டது, 7 பேச்சர்ஸ் காணி வழங்கப்பட வேண்டும் என்று. நாங்கள் ஆட்சியில் இருக்கும்போது 10 பேச்சர்ஸ் காணி வழங்கப்பட வேண்டுமென சட்ட ஏற்பாடு கொண்டுவரப்பட்டது. இவ்விடயம் தொடர்பில் தனது நிலைப்பாடு என்ன என்பதை மாண்புமிகு சனாதிபதி அவர்கள் பாராளுமன்றத்துக்குத் தெளிவுபடுத்தியாக வேண்டும்.

கௌரவ வசந்த சமரசிங்ஹ அவர்கள் சொன்னதுபோன்று, பெரும் நம்பிக்கையோடுதான் மக்கள் இந்த அரசாங்கத்தைக்

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

கொண்டுவந்து இருக்கிறார்கள். அதற்கு நாங்கள் மரியாதை கொடுக்கிறோம். அதனால்தான் அவர்களுக்காகவேண்டி வாக்களிக்கிறோம். இந்த நிலையில், திரும்பவும் எங்களுடைய மக்களை 6 பேச்சர்ஸ் காணிக்குள் கட்டுப்படுத்துவது நியாயம் கிடையாது. என்னைப் பொறுத்தவரையில், அவர்களுக்குக் காணி உரிமை வழங்குவதற்கு இதைவிடப் பெரியதொரு சந்தர்ப்பம் கிடைக்காது. கடந்த 9ஆம் திகதி நடைபெற்ற DCC meetingஇல் நாங்கள் ஒரு விடயத்தைச் சொன்னோம். அதாவது, வெளியிடப்பட்டுள்ள circularமூலம் தோட்டப் பகுதியில் இருக்கின்ற மக்கள் புறக்கணிக்கப்படுகிறார்கள் என்று. அதற்கு அங்கிருக்கின்ற GA சொல்கிறார், "இல்லை! நாங்கள் புதிய circularஐ வெளியிட்டு இருக்கிறோம்" என்று. உண்மையிலேயே கடந்த 12ஆம் திகதிதான் புதிய circular வெளியிடப்பட்டு இருக்கிறது. இப்படி நிலைமை இருக்கும் போது, இன்றைக்கும் மலையக மக்கள் புறக்கணிக்கப் படுகிறார்கள். அவர்களுக்குச் சரியான தகவல் போய்ச் சேருவதில்லை.

நேரம் போதாமை காரணமாக, இறுதியாக, ஒரு விடயத்தைச் சொல்லி எனது உரையை முடிக்கலாமென நினைக்கிறேன். இதை நான் எனக்கு வாக்களித்த மக்களுக்குச் சொல்ல விரும்புகின்றேன். சந்தா பணத்திலிருந்து நிவாரணம் வழங்கியதாவும், நாமல் ராஜபக்ஷ வரும்போது நான் அவருடன் கூட்டுச்சேர்ந்து விட்டதாகவும் மக்கள் என்மீது குற்றம் சுமத்தினார்கள். இன்று எல்லோரும்தான் சந்தா பணம் வாங்குகிறார்கள். நான் கணக்கு வழக்குகளை பாராளு மன்றத்தில் சமர்ப்பித்து இருக்கிறேன். எத்தனை பேர் கணக்கு வழக்குகளைச் சமர்ப்பித்து இருக்கிறார்கள்? நுவரெலியா மாவட்டத்தில் அதிகளவானோர் பாதிக்கப்பட்டுள்ளார்கள் என்பதை நாமல் ராஜபக்ஷ உட்பட அனைத்துக் கட்சித் தலைவர்களிடமும் நான் சொல்லியிருக்கிறேன். அந்த மக்களுக்குக் கட்டாயம் நிவாரணம் வழங்கியே ஆகவேண்டும். உங்களால் முடிந்ததைக் கொண்டுவந்து வழங்குங்கள்!. அது ஆளும் கட்சியா, எதிர்க்கட்சியா, சிவில் சமூகமா என்பதில் எனக்குப் பிரச்சினையில்லை.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
දැන් කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු ජීවන් තොන්ඩමන් මහතා**
(மாண்புமிகு ஜீவன் தொண்டமான்)
(The Hon. Jeevan Thondaman)
நான் முடிக்கிறேன்.

நாமல் ராஜபக்ஷ அவர்கள் கிட்டத்தட்ட 8,000 புத்தகங்களை வழங்கினார். இந்தத் தருணத்தில் நாம் அனைவரும் ஒன்றிணைந்து வேலைசெய்ய வேண்டும். தயவுசெய்து, நான் சொன்ன விடயங்களை கௌரவ அமைச்சர் அவர்கள் உள்வாங்கி, அவற்றை மாண்புமிகு சனாதிபதி அவர்களிடம் எத்திவைக்க வேண்டுமெனக் கேட்டு, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.03]

**ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා (කාන්තා සහ ළමා කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) நாமல் சுதர்சன - மகளிர் மற்றும் சிறுவர் அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Namal Sudarshana - Deputy Minister of Women and Child Affairs)
මට මේ අවස්ථාව ලබා දුන්නාට ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියට ස්තුතිවන්ත වෙනවා.

ඉතිහාසයේ අප දන්නා කාල සීමාව ඇතුළතත්, එතැනින් එහාට ගත්තත් දැවැන්තම ව්‍යසනයක් සිදුවෙච්ච මොහොතකට තමයි අපි රටක් විධියට මේ අවස්ථාවේ මුහුණ දෙන්නේ. ඒ ව්‍යසනයට පත්වෙච්ච ජනතාවට ඒ අවශ්‍ය සහන සැලසීම සඳහාත්, රට යථාවත් කරන්නට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන වෙන් කිරීම සඳහාත් අද අපි පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කරන්න බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා වූ විවාදය සිද්ධ වෙන මොහොතේ අදහස් කිහිපයක් දක්වන්න අවස්ථාව ලැබීම පිළිබඳව මා සතුටු වෙනවා.

මෙය, රටේම පැතිරුණු ව්‍යසනයක් බවට පත් වුණා. මේ රටේ දිස්ත්‍රික්ක විශාල ප්‍රමාණයක් මේ ආපදාවට ගොදුරු වුණා. සුනාමිය ගත්තොත්, මුහුදුබඩ ප්‍රදේශ විතරයි ආපදාවට ගොදුරු වුණේ. නමුත්, මධ්‍යම කඳුකරයේ තිබෙන දිස්ත්‍රික්ක සියල්ලමත්, වයඹ පළාතේ දිස්ත්‍රික්ක සියල්ලමත් මේ ව්‍යසනයට මුහුණ දුන්නා. දැදුරු ඔය නිම්නය, මහ ඔය නිම්නය නිසා කුරුණෑගල දිස්ත්‍රික්කය ගංවතුර තර්ජනයට ලක් වුණා. ඒත් එක්කම පාසල් කිහිපයක් නාය යෑමේ අවදානමට ලක් වුණා. නාය යෑම් විශාල ප්‍රමාණයක් කුරුණෑගල දිස්ත්‍රික්කය ඇතුළේත් සිද්ධ වුණා. කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවුල් 27,529ක් වාගේ විශාල ප්‍රමාණයක් මේ ව්‍යසනය නිසා පීඩාවට පත් වෙලා තිබෙනවා. මේ මොහොත වෙනකොටත් නාය යෑමේ අවදානම තවමත් පවතින ප්‍රදේශ තිබෙනවා. මේ මොහොත වන විටත් අපේ ජනතාවගෙන් යම් ප්‍රමාණයක් සුරක්ෂිත මධ්‍යස්ථානවල ජීවත් වෙමින් ඉන්නවා. මේ මොහොත වෙනකොට ගංවතුර අවදානම පහව ගිහිල්ලා ඒ සුරක්ෂිත මධ්‍යස්ථානවල හිටපු පිරිස් තම තමන්ගේ නිවෙස් බලා පිටත් වෙලා තිබෙනවා. විශේෂයෙන්ම කුරුණෑගල දිස්ත්‍රික්කයේ දිස්ත්‍රික් ලේකම්තුමා, ප්‍රාදේශීය ලේකම්වරු, බිම් මට්ටමේ ඉන්න ක්ෂේත්‍ර නිලධාරින්, ග්‍රාම නිලධාරින් ඇතුළු රාජ්‍ය යන්ත්‍රණයේ සියලුදෙනාම දේශපාලන අධිකාරියත් එක්ක සම්බන්ධ වෙමින්, සියලු මහජනතාව එකමුතුව, ශක්තිමත්ව එකතුවෙමින් මේ ව්‍යසනයට මුහුණ දුන්නා. ඒ නිසා මම මෙය අවස්ථාවක් කර ගන්නවා, අපේ දිස්ත්‍රික් ලේකම්තුමා, ප්‍රාදේශීය ලේකම්තුමා ඇතුළු රාජ්‍ය යන්ත්‍රණයේ සියලු නිලධාරින්ට ස්තුතිවන්ත වෙන්න. පුත්තලම දිස්ත්‍රික්කයත්, කුරුණෑගල දිස්ත්‍රික්කයත් මේ ව්‍යසනයට ගොදුරු වුණා. ඒ මොහොතේදී ආණ්ඩුකාරතුමා, පළාත් ප්‍රධාන ලේකම්තුමා ඇතුළු සියලු කාර්යමණ්ඩල කරපු මැදිහත්වීමට ස්තුතිය පුද කරන්න මම මෙය අවස්ථාවක් කරගන්නවා.

විශේෂයෙන්ම කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විධියට මේ මොහොතේ අපට වැඩි බරක් තිබෙනවා, දරුවන් සහ කාන්තාවන් සම්බන්ධයෙන් මැදිහත් වෙන්න. මේ ව්‍යසනයෙන් හානි වුණු දිස්ත්‍රික්ක 17ක පමණ සම්පූර්ණ දත්ත -තොරතුරු- මේ මොහොත වන විට අපට ලැබී තිබෙනවා. මේ ව්‍යසනයෙන් දරුවන් ලක්ෂයකට මදක් වැඩි ප්‍රමාණයක් ආපදාවට පත් වෙලා තිබෙනවා. ඒ දරුවන් වෙනුවෙන් ඒ අවශ්‍ය මැදිහත්වීම් කරන්නට අපි කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශය විධියට පසුගිය දවස් කිහිපයේම විවිධ ආයතනත් එක්ක සාකච්ඡා කරමින් සිටියා. ඒ සඳහා සම්පත් දායකත්වය දෙන්න පුළුවන් ජාත්‍යන්තර සංවිධාන

[ගරු (වෛද්‍ය) නාමල් සුදර්ශන මහතා]

සමඟ, අනෙකුත් අමාත්‍යාංශ සමඟ ඊයේත් සාකච්ඡා කළා. ඒ දරුවන්ට ඇති වෙලා තිබෙන ගැටලු පිළිබඳවත්, විශේෂයෙන්ම පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධයෙන්, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථානවල ඉගෙනුම ලබන දරුවන් වෙනුවෙන් විශේෂ වැඩසටහන් ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු මේ මොහොත වෙනකොට අපි සංවිධානය කරමින් ඉන්නවා.

මේ ව්‍යසනයෙන් කුරුණෑගල දිස්ත්‍රික්කයේ පවුල් 250ක් වාගේ විශාල ප්‍රමාණයක් අවතැන් වෙලා සුරක්ෂිත මධ්‍යස්ථානවල ජීවත් වෙමින් ඉන්නවා. ඒවායේ පුද්ගලයන් 825ක් වාගේ විශාල ප්‍රමාණයක් ඉන්නවා. ඒ අයට අවශ්‍ය සහන ලබා දීමේ කටයුතුත් මේ මොහොත වෙනකොට කරමින් ඉන්නවා. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ, ඒ දිස්ත්‍රික්ක 17හි තොරතුරු අනුව දරුවන් එක්ලක්ෂ හයදහස් තුන්සිය හැත්තෑඑකක් වාගේ විශාල පිරිසක් මේ උවදුරෙන් ආපදාවට පත් වෙලා ඉන්නවා. පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන 681ක දරුවන් 10,088ක් වාගේ විශාල පිරිසක් මේ ව්‍යසනයත් එක්ක ආපදාවට පත් වෙලා තිබෙනවා. මේ ව්‍යසනයෙන් ආපදාවට පත් වෙච්ච පූර්ව ළමා විය සංවර්ධන මධ්‍යස්ථාන සම්බන්ධයෙන් ගන්න පුළුවන් පියවර මොකක්ද, ඒවා යථාවත් කරන්න රජය විධියට මැදිහත් වීමක් කරන්න පුළුවන්ද කියලා අපි නිතරම කථා බහ කරනවා. අපි දන්නවා, පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන විශාල ප්‍රමාණයක් පෞද්ගලික ආයතන හැටියට පවත්වාගෙන යන ඒවා බව. ප්‍රාදේශීය සභා සහ පළාත් පාලන ආයතන විසින් පවත්වන කොටසකුත් තිබෙනවා. රජයක් විධියට මේ මොහොතේ ඔවුන්ට යම් සහනයක් සලසන්නට අපි සාකච්ඡා කරමින් ඉන්නවා. ඒත් එක්කම මේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන තුළ ඉගෙන ගනිමින් සිටින දරුවන් සම්බන්ධයෙනුත් යම් මැදිහත්වීමක් කරන්න පුළුවන්ද කියලා සාකච්ඡා කරමින් සිටිනවා. ඉදිරියේදී මේ පූර්ව ළමාවිය සංවර්ධන මධ්‍යස්ථාන; පෙර පාසල් සඳහා යම් ක්‍රමවේදයක් ගොඩනගන්නට, ඒ සිදුවෙලා තිබෙන ආපදා සම්බන්ධයෙන් යම් මැදිහත්වීමක් කරන්න අපි බලාපොරොත්තු වෙනවා. පසුගිය ආපදා තත්ත්වයත් නිසා මෙම මධ්‍යස්ථාන 100කට වැඩි ප්‍රමාණයක් පූර්ණ ආපදාවට පත් වෙලා සම්පූර්ණයෙන් විනාශ වෙලා තිබෙනවා.

ඒ සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරන අතරතුර, විශේෂයෙන් මතක් කරන්න ඕනෑ කාරණයක් තිබෙනවා. ඒ තමයි, භෞතිකව මේ සියල්ල ගොඩනඟන එක, ඉදිරියේදී සහන සලසන එක සම්බන්ධයෙන් සාකච්ඡාවක් දියත් වුණාට, මේ ව්‍යසනය නිසා පීඩාවට පත් වෙච්ච ඒ ජනතාවගේ මානසික පැත්ත ගොඩනඟන්නට, යථාවත් කරන්නට විශේෂ මැදිහත්වීමක් අප කරන්නට අවශ්‍යයි. මේ සම්බන්ධයෙන් අපට ලොකු වගකීමක් තිබෙනවා. අමාත්‍යාංශය විධියට පසු ගිය දින කිහිපයේම ඒ සම්බන්ධයෙන් අපි සාකච්ඡා කරමින් සිටියා. ගොඩක් වේලාවට මෙවැනි ආපදා තත්ත්වයක් ඇති වුණාම ඒ සඳහා මුහුණ දුන් දරුවන්ට මානසික ව්‍යාකූලතා ඇති වෙන්න පුළුවන්, විශේෂයෙන්ම කාන්තාවන්ට. මේ ආබාධ සහිත පුද්ගලයන් ඇතුළු සියලු ජනතාව මේ පීඩාව නිසා මානසික රෝගී තත්ත්වයන්ට ගොදුරු වෙන්න පුළුවන්. ඒ සඳහා අපට වැඩ පිළිවෙළක් විශේෂයෙන්ම අවශ්‍ය වෙනවා. විශේෂයෙන්ම මෙවැනි අවස්ථාවකට මුහුණ දුන්නාට පසුව විෂාදය - depression - වාගේ තත්ත්වයන්, post-traumatic stress disorder වාගේ මානසික ආබාධ තත්ත්වයන් ඇති වෙන්න පුළුවන්. අන්න ඒ වෙනුවෙන් නිශ්චිත වැඩසටහනක් අප රටක් විධියට දියත් කරන්නට අවශ්‍යයි. ඒ සඳහා අපට කාන්තා සහ ළමා කටයුතු අමාත්‍යාංශය හැටියට විතරක් මැදිහත් වෙන්නට බැහැ. මේ සම්බන්ධව සාකච්ඡා කරන්නට අවශ්‍ය ආයතනත් එක්ක මේ වෙනකොට අපි සම්බන්ධීකරණය හදලා තිබෙනවා. සෞඛ්‍ය අමාත්‍යාංශය, අධ්‍යාපන අමාත්‍යාංශය, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ අමාත්‍යාංශය, රාජ්‍ය පරිපාලන අමාත්‍යාංශය ඇතුළු අමාත්‍යාංශ සියල්ලම බද්ධ කර ගනිමින් මනෝ සමාජීය පැත්තෙන් මේ ජනතාව ගොඩනඟන්නට දීර්ඝ කාලීන වැඩ පිළිවෙළක් සකස් කරන්නට අවශ්‍යයි. මම හිතන විධියට, ඒක අතිශයින්ම වැදගත් කාරණයක්. මොකද, අපි දන්නවා සමහර තැන්වල අපි කථා කරපු දරුවන්ට රෑට නින්ද යන්නේ නැහැ. රෑ 12.00ට, 1.00ට කෑ ගහගෙන ඇහැ ඇරෙනවා. එවැනි පීඩාවකින් සමහර දරුවෝ ඉන්නවා. විශේෂයෙන්ම කාන්තාවනුත් එවැනි තත්ත්වයන්ට ගොදුරු වෙලා ඉන්නවා. මේ සම්බන්ධයෙන් අපි විශේෂ අවධානයක් යොමු කරලා තිබෙනවා. අපි වැඩසටහනක් සූදානම් කරලා තිබෙනවා, ඉදිරි 22වෙනි දා සහ 24වෙනි දා මේ සම්බන්ධයෙන් මැදිහත් වෙන්න. සියලු ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල අපේ කාන්තා හා ළමා කටයුතු අමාත්‍යාංශයට සම්බන්ධ මනෝ උපදේශන නිලධාරින් ඉන්නවා. ඒත් එක්කම සමාජ සේවා දෙපාර්තමේන්තුවේ මනෝ උපදේශන නිලධාරින් ප්‍රාදේශීය ලේකම් කාර්යාලවල ඉන්නවා. ඒ වාගේම පාසල් සම්බන්ධව මනෝ උපදේශන නිලධාරින් ඉන්නවා. මේ නිලධාරින් සියලු දෙනා එකතු කරලා ඔවුන්ගේ ධාරිතා සංවර්ධනය කරන වැඩසටහනක් ක්‍රියාත්මක කරන්න අපි බලාපොරොත්තු වෙනවා. ඒ සඳහා අපි සැලසුම් කරලා තිබෙනවා. ඒ හරහා අනෙකුත් ක්ෂේත්‍ර නිලධාරින් සියලු දෙනාත් දැනුවත් කරමින්, ඔවුන්ට ඒ සම්බන්ධයෙන් පුහුණුව ලබා දෙමින් නිශ්චිත ක්‍රියාවලියක් හරහා මේ ආපදාවට පත් වෙච්ච, මනෝ සමාජීය වශයෙන් බිඳ වැටිච්ච ඒ පිරිස වසර දෙකක් වාගේ කාලයක් තුළදී ගොඩනගන්නට අවශ්‍ය වැඩපිළිවෙළ සකස් කරමින් ඉන්නවා.

මීට අමතරව මම තව පොඩි කාරණයක් මතක් කරන්න ඕනෑ. අද හෝ ඊයේ දිනයේ අපේ විපක්ෂ නායකතුමා කාරණයක් මතක් කළා, ගොම්මුනාව කියන ප්‍රදේශයේ නාය යෑමක් සම්බන්ධයෙන්. මම දැක්කා, යම් පත්තරයක පළ වෙච්ච දෙයක් සහ යම් ලියකියවිලි වගයක් සභාගත කරනවා. ඇත්තටම එතුමා ඒ කාරණය මතු කළේ පසුගිය කෙටි කාලය තුළ ඇති වෙච්ච ව්‍යසනයක් නිසා මේ තත්ත්වය ඇති වුණා වාගෙයි. ගොම්මුනාව කඳුවැටියේ මේ ගල් කොරිය පවත්වාගෙන ගිය එක අවුරුදු ගාණක් තිස්සේ සිදුවුණු වැඩක්. අවුරුදු 8කට ඉස්සෙල්ලා මේක පටන් ගත්තේ. කාගේ පාලන කාලයේද කියලා කථා කරන්න ඕනෑ නැහැ. මේක 2015, 2016ට ආසන්න කාලයේ පටන් ගත්ත එකක්. මේකට විරුද්ධව ජනතාව උද්ඝෝෂණය කළා. තරුණයෝ උද්ඝෝෂණය කළා. 36දෙනෙකුට විරුද්ධව රාජ්‍ය යන්ත්‍රණයට බාධා කළා කියලා පැමිණිලි ඉදිරිපත් වෙලා තමයි එතැන ප්‍රශ්නය ඇති වුණේ. ඒ තැන තමයි මේ වෙනකොට නාය ගිහිල්ලා තිබෙන්නේ. මේකට මැදිහත් වුණේ කවුද කියන එක සම්බන්ධයෙන් කථා කරන්න අවශ්‍ය නැහැ. නුවරඑළිය දිස්ත්‍රික්කයේ හිටපු ඇමතිවරයෙක් තමයි මේ අවසර පත්‍ර ලබා දෙන්න මැදිහත් වෙලා තිබෙන්නේ. ඒ ඉතිහාසය අමතක කරලා පසුගිය අවුරුද්ද ඇතුළත මෙවැනි ව්‍යසනයකට පාර කැපුවා වාගේ කතන්දරයක් මතු කරන්න උත්සාහ ගත්තා. ඒ නිසා දොඩන්ගස්ලන්ද ආසනය ගැන දන්නා, ඒ ප්‍රදේශයට සම්බන්ධ පුද්ගලයෙක් විධියට ඒ කාරණය නිවැරදි කළ යුතුයි. මේ ව්‍යසනයට මුල ඒ ඉතිහාසය ඇතුළේ යහ පාලන ආණ්ඩු කාලයේ ගත් තීන්දු තීරණ බවත් මතක් කරමින්, මට වේලාව වෙන් කිරීම සම්බන්ධයෙන් ඔබතුමියටත් ස්තුතිවන්ත වෙමින් මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 3ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.13]

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට විනාඩි 3යි නේ ලැබුණේ.

"දිට්වා" සුළි කුණාටුව නිසා, එම ගංවතුර තත්ත්වය නිසා පීඩාවට පත් වුණු, ජීවිතක්ෂයට පත් වුණු, අතුරුදහන් වුණු අපේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර් ආදරණීය ජනතාව වෙනුවෙන් මේ අවස්ථාවේදී මගේ ශෝකය, කනගාටුව මුලින්ම ප්‍රකාශ කරනවා.

එම සිද්ධිය දුටු විගස, එම ගංවතුරට යට වුණු ජනතාව බේරා ගැනීමට විශේෂයෙන්ම අපේ දකුණේ ධීවර ජනතාව ඇතුළු අනෙකුත් ජනතාව පැමිණියා. තමන්ගේ ධනය වැය කරමින්, තමන්ගේ බෝට්ටු, jet skis, ඒ වාගේම එන්ජින් බෝට්ටු ලොරිවල පටවා ගෙන ඇවිල්ලා එම ජනතාව බේරා ගන්න දකුණේ ජනතාව විශාල මෙහෙවරක් කළා. ඒ නිසා, පීඩාවට පත් ජනතාව බේරා ගැනීම වෙනුවෙන් කළ කැප කිරීම සම්බන්ධව මම බොහොම ආඩම්බරයෙන් අපේ දකුණේ ජනතාවට මගේ ගෞරවනීය ස්තුතිය මේ උත්තරීතර සභාවේදී පුද කරනවා.

මේ මානුෂික මෙහෙයුම ක්‍රියාත්මක කරන්නට අපේ දකුණේ ජනතාව කෑම බීම ඇතුළු සියලු දේවල් රැගෙන අනෙක් පළාත්වලට ගියා. ආපදාවට පත් ජනතාව ගැන කනගාටු වෙමින්, ඔවුන් වෙනුවෙන් කරන්න තිබෙන සේවාව ඉටු කරමින් එම ජනතාවට කන්න බොන්න ලබා දෙමින් සෑම සහනයක්ම ලබා දෙමින්, දකුණේ ජනතාව විශාල මෙහෙවරක් සිදු කළා කියන එක මම මේ අවස්ථාවේදී ආඩම්බරයෙන් ප්‍රකාශ කරනවා.

මම කියනවා, විශේෂයෙන්ම මේක ශාපයක් බව. බොරු කියලා, කියලා මේ රටේ ජනතාව රවටා බලය ලබා ගෙන, බුද්ධ ශාසනයට කිසිම මෙහෙවරක් ඉෂ්ට නොකර, බුද්ධ ශාසනය ගැන තැකීමක් නොකර මේ රජය කටයුතු කළ නිසා තමයි මේ ශාපය අපේ රටට වැදුණේ. ඒ නිසා මම යෝජනාවක් කරනවා. රජයෙනුත්, ජනාධිපතිතුමාගෙනුත් මම ඉල්ලීමක් කරනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩියක කාලයක් තිබෙනවා.

**ගරු දිලිප් වෙදආරච්චි මහතා**
(மாண்புமிகு திலிப் வெதஆரச்சி)
(The Hon. Dilip Wedaarachchi)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට තවත් විනාඩියක කාලයක් ලබා දෙන්න.

මම ඉල්ලීමක් කරනවා, අපේ මහා සංඝ සභාව කැඳවන්න කියලා. ශ්‍රී මහා බෝධීන් වහන්සේ අභියසට සංඝ සභාව කැඳවා, සමාව අරගෙන මේ රට පාලනය කරන්න කටයුතු කරන්න කියා මම මේ අවස්ථාවේදී සඳහන් කරනවා. මේ රටේ මේ වාගේ ලොකු ව්‍යසනයක් සිද්ධ වුණේ බොරු කියපු නිසා. මේ රටේ විනාශයක් සිද්ධ වුණා. තවම ඒ විනාශය සිද්ධ වෙමින් පවතිනවා. ඒ නිසා අපේ රට රැක ගන්න නම් බුද්ධ ශාසනයට මුල් තැන දීලා කටයුතු කරන්න ඕනෑ. මේක සිංහල බෞද්ධ රටක්. ඒ නිසා මම රජයට නැවත වතාවක් කියනවා, බුද්ධ ශාසනය මුල් කරගෙන මේ රටේ පාලන තන්ත්‍රය තුළ කටයුතු කරන්න කියලා. මට අවස්ථාව ලබා දීම ගැන ඔබතුමියට ස්තුතිවන්ත වෙමින්, විශේෂයෙන්ම දකුණේ ධීවර ජනතාව මේ ව්‍යසනය හමුවේ සිදු කළ මෙහෙවර සම්බන්ධයෙන් නැවත වතාවක් ඔවුන්ට මගේ ස්තුතිය පුද කරමින්, දකුණේ මන්ත්‍රීවරයකු හැටියට එම කටයුත්ත අගය කරමින් මා නිහඬ වෙනවා.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු වසන්ත පියතිස්ස නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.17]

**ගරු වසන්ත පියතිස්ස මහතා (ග්‍රාමීය සංවර්ධන, සමාජ ආරක්ෂණ සහ ප්‍රජා සවිබලගැන්වීමේ නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு வசந்த பியதிஸ்ஸ - கிராமிய அபிவிருத்தி, சமூகப் பாதுகாப்பு மற்றும் சமூக வலுவூட்டுகை பிரதி அமைச்சர்)
(The Hon. Wasantha Piyathissa - Deputy Minister of Rural Development, Social Security and Community Empowerment)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට මේ අවස්ථාව ලබා දීම පිළිබඳව පළමුව ඔබතුමියට ස්තුතිවන්ත වෙනවා.

රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කර ගැනීම සඳහා පාර්ලිමේන්තුවට ඉදිරිපත් කර තිබෙන අද දවසේදී, විශේෂයෙන්ම කරුණු කිහිපයක් ඉදිරිපත් කිරීමට මට මේ අවස්ථාව ලැබීම ගැන මා සතුටු වෙනවා.

UNDP එක විසින් මෙම ව්‍යසනය පිළිබඳව සංඛ්‍යාලේඛන, දත්ත විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා. ඒකෙන් කරුණු 2-3ක් ගත්තොත්, පුද්ගලයින් විසිතුන්ලක්ෂයක් මේ ආපදාවේ බලපෑමට ලක් වෙලා තිබෙනවා. රටේ සමස්ත භූමි ප්‍රමාණයෙන් සියයට 20ක ප්‍රමාණයක් මේ ජල ගැල්මට හසු වෙලා තිබෙනවා. කුඹුරු හෙක්ටෙයාර 530,000ක් පමණ මේ ජල ගැල්මට හසු වෙලා තිබෙනවා. ගංවතුරට හසු වුණු ගොඩනැඟිලි ප්‍රමාණය 720,000ක් පමණ වෙනවා. එය සමස්ත ගොඩනැඟිලිවලින් සියයට 12ක් පමණ වෙනවා. මේ ආකාරයට තොරතුරු - සංඛ්‍යාලේඛන - විශාල ප්‍රමාණයක් ඉදිරිපත් කර තිබෙනවා. මේ ව්‍යසනයේ ප්‍රමාණය කොතෙක්ද කියන කාරණය මේ සියල්ලෙන් අපට ඉතා පැහැදිලි වෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය දවස්වල අපි මහියංගනය ප්‍රදේශයේ, බදුල්ල ප්‍රදේශයේ සහන සේවා කටයුතුවලට සම්බන්ධ වුණා. අපේ දිස්ත්‍රික්කයේ භික්ෂූන් වහන්සේලා, පොදු ජනතාව, සිවිල් ආරක්ෂක බලකාය, ත්‍රිවිධ හමුදාව ඒ කටයුතුවලට සම්බන්ධ වුණා; අපිත් පෞද්ගලිකව සම්බන්ධ වුණා. සමහර තැන්වල අපි දැක්කා, තට්ටු දෙකේ නිවසේ පහළ තට්ටුවේ තිබිච්ච ශීතකරණය උඩ තට්ටුවට පාවෙලා ගිහිල්ලා, උඩ තට්ටුවෙන් වහලට යනකම් පාවෙලා, අන්තිමට තිබුණේ අඩි 40ක් විතර උස වහල උඩ. මේ, ආපු ගංවතුරේ ප්‍රමාණය, මේ ව්‍යසනයේ ප්‍රමාණය. මේ චණ්ඩ මාරුතය එක්ක ආපු වර්ෂාපතනයේ ප්‍රමාණය එයින් හිතාගන්න පුළුවන්කම තිබෙනවා. මාස දෙක තුනකදී ඇද හැලෙන මහා වර්ෂාපතනයක් මේ සුළි කුණාටුව නිසා දින දෙකකදී ඇද හැලෙද්දි ඒකට මුහුණ දීම ලෙහෙසි පහසු වන්නේ නැහැ. මේ ව්‍යසනය ඉතා ඛේදජනකයි කියලා අපි කවුරුත් පිළිගන්නවා.

ඒ එක්කම මේ ව්‍යසනයෙන් පීඩාවට පත් වුණු ජනතාවට, හානියට පත් ඔවුන්ගේ දේපළවලට වහාම වන්දි ගෙවන්න, ඔවුන්ගේ ජීවිත ආරක්ෂා කරන්න, ඔවුන්ට අවශ්‍ය සහන සපයන්න

[ගරු වසන්ත පියතිස්ස මහතා]

මේ රජය -මේ ආණ්ඩුව- ඒ වාගේම ගරු ජනාධිපතිතුමා මුල සිටම අදාළ පරිදි මැදිහත් වුණා; තීන්දු-තීරණ ගත්තා. මේ පාර්ලිමේන්තුවත් දින දෙකකට කල් තබලා, ඒ අදාළ මැදිහත්වීම් කළා. ව්‍යසන කළමනාකරණ කමිටු, දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටු, ප්‍රාදේශීය සම්බන්ධීකරණ කමිටු සියල්ල වහා කැඳවමින්, දුර්වල -බෙලහීන- වෙලා තිබිච්ච, සම්පත් අවම ප්‍රමාණයක් තිබිච්ච මුළුමහත් රාජ්‍ය යන්ත්‍රණය තුළ අපි කවුරුත් එකට එකතු වෙලා උපරිම ශක්ති ප්‍රමාණයෙන් මැදිහත් වුණා, මේ ව්‍යසනයෙන් පීඩාවට පත් ජනතාවට සහන සලසන්න. එහෙම මැදිහත් වෙලා මේ වනකොටත් සිවිල් ආරක්ෂක බලකාය, ත්‍රිවිධ හමුදාව, පොදු ජනතාව, ඒ වාගේම දේශපාලන අධිකාරියේ ක්‍රියාධරයින් ඒ ගම් බිම්වල ජනතාවගේ ගෙවල් සුද්ධ කරනවා; පාලම් හදනවා; ඇළ මාර්ග, බෝක්කු හදනවා. ඒ වාගේ මහා කටයුත්තක නියැළිලා ඉන්න අතරතුර මේ විපක්ෂයේ උදවිය තවදුරටත් කියන්නේ, පූර්ව සූදානමක් තිබුණේ නැහැ, ආපදාවට ලක් වෙච්ච අයට සහන දුන්නේ නැහැ කියලායි.

උදාහරණයක් හැටියට ගත්තොත්, අම්පාර දිස්ත්‍රික්කයේ ජනතාවට රුපියල් 25,000 දීමනාව ලබා දීම මීට දින තුන හතරකට කලින් සියයට 100ක්ම අවසන් කළා. අනෙකුත් සෑම දිස්ත්‍රික්කයකම සියයට 85ක්-90ක් ඉක්මවා රුපියල් 25,000 දීමනාව ලබා දීලා අවසානයි. ඒ වාගේම රුපියල් 50,000 දීමනාව දැන් ලබා දෙමින් යනවා. මේ ලබන දෙසැම්බර් 31වැනි දාට කලින් ඒ අදාළ වන්දි මුදල් ගෙවා අවසන් කරන්න පුළුවන් තත්ත්වයක් තිබෙනවා. ඒ වාගේම උපරිමය රුපියල් ලක්ෂ 50ක් දක්වා හානියට පත් නිවාස සඳහා ගෙවන වන්දි මුදල, ඒ වාගේම උපරිමය රුපියල් ලක්ෂ 50ක් දක්වා ඉඩමක් මිලදී ගැනීම සඳහා ගෙවන වන්දි මුදල ලබා දීම සඳහා අවශ්‍ය සියලු කටයුතු මේ මොහොතේ සිද්ධ වෙමින් තිබෙනවා. ඒ වාගේ ඉතා කාර්යක්ෂම මැදිහත්වීමක් කරද්දි, මේ විපක්ෂය ඉතාම නිර්ලජ්ජිත ලෙස මඩ අවලාද නඟන ස්වරූපයෙන් තමයි කථා කරන්නේ. දිලිප් වෙදආරච්චි මන්ත්‍රීතුමා මීට කලින් කථා කළා. එතුමාගේ කථාව ඇත්තටම දකුණේ ජනතාවටත් අගෞරවයක්. පට්ටපල් බොරු කියලා අපි බලයට ආවාලු. ඒ වාගේම ආගමට දහමට කිසිම මැදිහත්වීමක් නැහැයිලු. එතුමාගෙන් මම අහනවා, අපි ආගමට දහමට සලකන්නේ කොහොමද, පන්සලට පල්ලියට, පූජ්‍ය පක්ෂයට සලකන ක්‍රමවේදය මොකක්ද කියලා. ඒ, හොරකම් කරලාද, වංචා කරලාද, බොරු කියලාද, රවටලාද? තමුන්නාන්සේලා තමයි වසර 76ක පාලන කාලය තුළ එවැනි ගමන් මඟක ආවේ.

ජනතා විමුක්ති පෙරමුණේ නායක රෝහණ විජේවීර සහෝදරයා වසර 40කට පෙර තමයි කිව්වේ, මධ්‍යම කඳුකරය බරපතළ අනතුරකට ලක් වෙලා තිබෙනවා, යම් මොහොතකදී මහා නාය යෑම්, ගංවතුර ආදී ව්‍යසන සිද්ධ විය හැකියි, මේ සංවර්ධනය අවිද්‍යාත්මකයි කියලා. මහවැලි ව්‍යාපාරය, කඩිනම් මහවැලි ව්‍යාපාරයක් බවට පත් කරමින් විද්‍යාත්මකව සිදු කළ යුතු ආකාරයට එම කටයුතු සිදු නොකර, ඉහළ ප්‍රදේශවල වැව් අමුණු ඉදිකිරීම නිසා කඳුකරය මේ විධියට අවදානමට ලක් වෙලා තිබෙනවා. යළි සලකා බැලුවොත්, ඒවා පවා මේ සමස්ත ව්‍යසනයට හේතු විය හැකියි.

නමුත්, ඒ සාකච්ඡාවට නොගොස් අපි ඇත්තවශයෙන්ම බලන්න ඕනෑකම තිබෙන්නේ මෙවැනි තත්ත්වයක් මේ රට තුළ නැවත ඇතිවීම වළක්වා ගැනීම සඳහා කළ යුත්තේ කුමක්ද කියලායි. ඒ සඳහා තමයි මේ මුදල අනුමත කිරීමට අපි කටයුතු කරමින් ඉන්නේ. මේ රුපියල් බිලියන 500 අපි හොයාගන්නේ කොහොමද? රජය සතුව රුපියල් බිලියන 1,200ක් මේ මහා භාණ්ඩාගාරයේ තිබෙනවා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ණය අරගෙනවත්, මුදල් අච්චු ගහලාවත්, එහෙම නැත්නම් ජනතාව මත බදු බර පටවලාවත් නොවෙයි, අපි මේ රුපියල් බිලියන 500 ගන්නේ. ඉතා සූක්ෂ්ම විධියට, විද්‍යාත්මකව, ආර්ථික විද්‍යා පදනමක් සහිතව ඉතා අරපරිස්සමෙන් එකතු කරපු අපේ රටේ මහජනතාවගේ ධනය තමයි පෙරළා මේ සංවර්ධනය සඳහා යොදවන්නේ. තිබුණාට වඩා හොඳ පාරක්; තිබුණාට වඩා හොඳ ගමක්; තිබුණාට වඩා හොඳ නිවසක්; තිබුණාට වඩා හොඳ පරිසර පද්ධතියක් ගොඩනඟන්න තමයි මේ මුදල් වැය කරන්නේ. එහෙම ශක්තිමත් තැනකට අවුරුද්දක් යද්දි මේ රජයට එන්න පුළුවන්කම ලැබුණා. ඒ නිසා අපි ඉස්සරහ තිබෙන බරපතළ අභියෝගය තමයි, අපි ජීවත් වන ශ්‍රී ලංකාව අනාගත පරපුරට සුරක්ෂිත රටක් බවට පත් කරමින් අපේ ඉදිරි සංවර්ධන කටයුතු සිද්ධ කිරීම. ඒ සඳහා තමයි අපේ අවධානය යොමු වන්න ඕනෑකම තිබෙන්නේ.

යම්කිසි මාධ්‍යයක පළවෙලා තිබුණා, ජාත්‍යන්තර අභ්‍යවකාශ මධ්‍යස්ථානයේ දින 178ක් පර්යේෂණ කටයුතු කරමින් ජීවත් වුණු නාසා ආයතනයේ ගගනගාමී Ron Garan කියන ඒ විද්‍යාඥයා ඉදිරිපත් කරපු අලුත් අදහසක්. ඔහු කියනවා, අපගේ අනාගතය රඳා පවතින්නේ එක් සරල සත්‍යයක් වටහා ගැනීම මතයි කියලා. ඒ, මොකක්ද? පොළොව මත සිටින විට අපව බෙදා වෙන් කරන සියල්ල, අභ්‍යවකාශයේ සිට බලද්දි එසැනින් අහෝසි වනවා කියලා ඔහු කියනවා. දේශ සීමා නැති, ආගම් භේද නැති, කුල භේද නැති, ජාති භේද නැති, වෙනත් භේද කිසිවක් නැති, නිල් පාටට පෙනෙන විශාල ග්‍රහ වස්තුවක් තමයි අභ්‍යාවකාශයේ සිට බලද්දි අපට පෙනෙන්නේ. ඒක තමයි අපේ නිවහන. ඒ වාගේම මේ ලක්දිව, ලක්මව ගත්තොත් එය සිංහල, දෙමළ, මුස්ලිම් ඇතුළු අපි හැමෝගේම රට. දේශපාලනය කරන-නොකරන, බලය හොබවන-නැති, ධනය තිබෙන-නොතිබෙන අපි හැමෝම ජීවත් වන නිවහන තමයි, මේ ලස්සන දිවයින. මේ දිවයිනේ තම තමන්ට ඕනෑ විධියට පාරවල් හදන්න, ගොඩනැඟිලි හදන්න, බලපත්‍ර දෙන්න, ඇළ වේලි හදන්න, වැව් හදන්න බැහැ. ඒක යම්කිසි මොහොතක සොබා දහමට පටහැනි නම්, විද්‍යාවට පටහැනි නම් එහි ප්‍රතිවිපාක පෙරළා ජනතාවට එනවා. එවැනි තත්ත්වයක් තමයි මෙයත්. ස්වාභාවික විපත් එනවා. ඒ සියල්ල නවත්වන්න බැහැ. හැබැයි, ඒ තුළින් ජනතාවට සිද්ධ වන, රටට සිද්ධ වන, දේපළවලට සිද්ධ වන හානිය අවම කිරීමට අපට කටයුතු කළ හැකියි.

ඒ නිසා අපි මිනිසුන් විධියට මෙතැන් සිට වගබලා ගත යුතුව තිබෙනවා, මේ ලස්සන දිවයිනට මෙවැනි ස්වාභාවික අනතුරුවලදී, විපත්වලදී අවම හානියක් ඇති වන විධියට වැඩ කටයුතු කළ යුත්තේ කොහොමද කියලා. අපේ රට රැක ගන්නේ කොහොමද, සංවර්ධනය කරා ගෙන යන්නේ කොහොමද කියලා සලකා බලන්න, ඒ දෙස ආපසු හැරී බලන්න අපට හොඳ අවස්ථාවක් දැන් උදා කර දී තිබෙනවා. ඒ පිළිබඳව අපේ අවධානය යොමු කරමින්, අපි කවුරුත් පක්ෂ භේදයකින් තොරව, ජාති ආගම් කුල භේදයකින් තොරව මේ ලක්මව දියුණුව කරා රැගෙන යන්න කැපවෙමු. ඒ සඳහා අපට අවස්ථාවක් නැවත ලැබී තිබෙනවා. ඒ වෙනුවෙන් අපි මැදිහත් වෙමුයි කියන අදහස පළ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු රෝහණ බණ්ඩාර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

[අ.භා. 2.27]

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තවමත් අපි ස්වභාව ධර්මයේ පාඩම ඉගෙන ගෙන නැහැ කියලායි මම හිතන්නේ. මීට පෙර කථා කරපු ගරු නියෝජ්‍ය ඇමතිතුමාගේ කථාවත් එක්ක ගත්තාම අපි තවමත් මේ මහවැලිය අල්ලාගෙන දඟලනවා. ඒ කාලවකවානුවේ ඔය කියන කණ්ඩායම් විපක්ෂයේ හිටියා වාගේ, අදත් ඔය කියන කණ්ඩායම විපක්ෂයේ හිටියා නම් අද මේ උවදුරින් අපි රටක් විධියට මොන විධියට බේරෙයි ද කියන එක ගැන අපට හිතලා බලන්න සිද්ධ වනවා. අපේ රටේ අද මේ තිබෙන සංවර්ධනය දකින්නේ අපි මහවැලි යෝජනා ක්‍රමය හරහායි. එතකොට මහවැලිය නිසා ද මේ සියල්ල වුණේ? නැත්නම් මහවැලියෙන් පස්සේ සංවර්ධනය වනකොට ක්‍රමවත්ව ඒ ඉදිකිරීම් සිද්ධ නොවීම ද මේකට බලපෑවේ කියන කාරණය ගැන වෙනම කතිකාවක් ඇති කරගන්න ඕනෑ. නමුත්, මේක අල්ලාගෙන මෙතුමන්ලාගේ නොහැකියාව වහගන්න උත්සාහ කරනවා කියන එකයි අපට නම් දැන් පෙනෙන්නේ.

අපි වෙන කවුරුවත් ගැන කියන්න ඕනෑ නැහැ. ඔබතුමන්ලාගේ සුනිල් හඳුන්නෙත්ති ඇමතිතුමා කියනවා, "නිල්වලා ගඟ නිදි කෙරෙව්වා" කියලා. නිදා ගත්තා නොවෙයි, නිදි කෙරෙව්වා ලු. ඇයි, දෙවියනේ බැරි වුණේ මල්වතු ඔය නිදි කරවන්න? ඇයි, බැරි වුණේ කලා ඔය නිදි කරවන්න, මහවැලි ගඟ නිදි කරවන්න? මල්වතු ඔය ගැන ප්‍රකාශ කරලා, මඩකලපුවට ගුවනින් ගියා. නිල්වලා ගඟ නිදි කෙරෙව්වා වාගේ අනෙක් ගංගා ටිකත් නිදි කරවන්න බැරි වෙච්ච එක ගැනයි අපි මේ කියන්නේ. එක ගඟක් විතරක් නිදි කරවලා, අනෙක් ඔක්කෝම ගංගාවලට ගලා ගෙන යන්න හැරලා, ඒ ප්‍රදේශ විනාශ වුණාට පස්සේ දැන් ඇවිල්ලා පරණ කුණු ටිකක් ඇදලා දානවා. ඒ සිදු වුණු වැරැද්ද තැන් තැන්වලට කියනවාට වැඩිය, දැන් ඇති වෙලා තිබෙන ආපදා තත්ත්වයත් එක්ක දේශපාලනය කරන්න උත්සාහ කරන්නේ නැතුව අපි එයින් ගොඩ එන්නේ කොහොමද කියලා නේ බලන්න ඕනෑ. මේ බොහෝ කාරණා පිටුපස ඉන්නේ කවුද? මෙතුවක් කාලයක් වන්දි ගෙව්වේ නැති විධියට, පළමු වතාවට මේ මාලිමා රජය ආවාට පස්සේ තමයි වන්දි ගෙවන්නේ කියන මතයට තමයි අද මේ රටේ පොදු ජනතාව ගෙනැල්ලා තිබෙන්නේ. එහෙම හරි කමක් නැහැ, මේ වන්දි ගෙවන්න.

අනුරාධපුර දිස්ත්‍රික්කය නියෝජනය කරන අපේ ගරු වසන්ත සමරසිංහ අමාත්‍යතුමනි, අපි එදා දිස්ත්‍රික් සම්බන්ධීකරණ කමිටුවේදී මේ ගැන කථා කරනකොට ආපදාවට පත් වෙලා හිටපු පවුල් සංඛ්‍යාව 21,913යි. හැබැයි, අද වන්දි ගෙවන්න තෝරා ගෙන තිබෙන්නේ පවුල් 15,000යි. ඒ සංඛ්‍යාවෙනුත් සියයට 30කට වැඩි ප්‍රමාණයකට තවමත් රුපියල් 25,000 ගෙවලා නැහැ, ගරු ඇමතිතුමනි. එතකොට 6,000 ගණනක් හැළුණේ ඇයි? ඒ පිළිබඳව අපි හොයා බලන්න ඕනෑ නැද්ද? නිලධාරියෙකු ගිහිල්ලා "ඔබට ඕනෑ නැහැ නේද?" කියලා ඇහුවොත් ඒ පුද්ගලයා මේ තිබෙන තත්ත්වයත් එක්ක ඒ මුදල් ඉල්ලන්නේ නැති වෙන්න පුළුවන්. හැබැයි, කෙනෙකු ආපදාවට ලක් වෙලා තිබෙනවා නම්, ඒ අය මේ මුදල ලැබීමට සුදුසුකම් ලබා තිබෙනවා නම් ඒ මුදල ලබා දෙන එක නේද මනුස්සකම? ඒ මුදල ලබා දෙන එක නතර කරලා තිබෙන එක සුදුසුකමක් නොවෙයි. ගරු ඇමතිතුමනි, පවුල් 21,913ක් හානියට පත් වුණා නම් පවුල් 15,000කට පමණක් රුපියල් 25,000ක් දීලා නතර වෙන්න එපා.

ගරු ඇමතිතුමනි, ඒ වාගේම ජනතාව මුහුණ දීපු තවත් ගැටලුවක් අපි දැක්කා. නගරබද ගෙවල් ටික සුද්ද කර ගන්න National Water Supply and Drainage Board එකේ වතුර විශාල ප්‍රමාණයක් පාවිච්චි කරන්න වුණා. ඒ නිසා දෙසැම්බර් මාසයට විශාල ජල බිලක් එනවා. ඒක සමහර අයට දරා ගන්න හැකියාවක් නැහැ. එක පැත්තකින්, ඒ ඒකක ප්‍රමාණය ඉක්මවා ගියාට පස්සේ මිල වැඩි වෙනවා. අනෙක් පැත්තෙන්, ජනතාව මේ වතුර පාවිච්චි කළේ තමන්ගේ එදිනෙදා කටයුතුවලට නොවෙයි, ගංවතුර නිසා උවදුරට පත් වෙච්ච තමන්ගේ නිවස පිළිසකර කර ගන්න, නැත්නම් හෝදා ගන්නයි. ඒ නිසා දෙසැම්බර් මාසයේ ජල බිල මේ අයට අඩු කර ලබා දීමට සැලැස්මක් සකස් කරන්න පුළුවන්ද? එහෙම නැත්නම් මේ බිලට අදාළ ගාස්තුව අය නොකර ඉන්නට වැඩ පිළිවෙළක් අපිට සකස් කරන්න බැරිද?

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තවත් විනාඩි 2ක කාලයක් පමණයි තිබෙන්නේ.

**ගරු රෝහණ බණ්ඩාර මහතා**
(மாண்புமிகு ரோஹண பண்டார)
(The Hon. Rohana Bandara)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, තව බොහෝ දේවල් කියන්න තිබුණත් මට ලැබී තිබෙන්නේ සීමිත කාලයක්. නමුත්, මම ඒ සීමිත කාලය තුළ කෘෂිකර්මාන්තය ගැනත් කියන්න කැමතියි. කෘෂිකර්මාන්තය ගත්තාම, අර්ධ හානිවලට වන්දි ලබා දීමේදී ගැටලු ගණනාවක් නිර්මාණය වෙලා තිබෙනවා, ගරු ඇමතිතුමනි. ඒ නිසා එම ගැටලු පිළිබඳව සාකච්ඡා කරලා ඒ ගොවීන්ට යථා තත්ත්වයට පත් වෙන්න පුළුවන් වන විධියට කටයුතු කරන්න කියලා මම කියන්න කැමතියි.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මේ සියල්ල සිද්ධ වන අතරේ අපි දැක්කා, මේ රජයෙන් බෙදනවා වාගේ මරණ සහතික ලබා දෙන්න උත්සව පවත්වනවා. සමාජ මාධ්‍ය තුළ අපි දැක්කා, උපාධි ප්‍රදානය කරනවා වාගේ, සම්මාන දෙනවා වාගේ මහනුවර දිස්ත්‍රික්කයේ මරණ සහතික ලබා දෙනවා. නම කියනවා, ෆොටෝ ගහනවා, සමහර කට්ටිය අත්පුඩිත් ගහනවා. ඒ වාගේ තැනකට මේක ගෙනියන්න එපා. මරණ සහතික බෙදන්න උත්සව පවත්වන්නේ මොකටද?

ඒ දේවල් එහෙම කරන අතරේ පොලිස්පතිතුමාගේ ඇස් වහලා ද කොහොමද කියන්න මම දන්නේ නැහැ, ලංකාවේ සෑම පොලිස් ස්ථානයකම ඉන්න පොලිස් නිලධාරි මහත්වරුන්ට පිහානකුයි, කෝප්පයකුයි දෙන්න තීරණය කරලා තිබෙනවා. එක company එකකින් ලබා ගත හැකි විධියට ඒ specifications ටික හදලා මේවා ඒකෙන් ගන්න අවස්ථාව ලබා දීලා තිබෙනවා. සාමාන්‍ය වෙළෙඳ පොළේ රුපියල් 420ක් විතර වන පිහානක මිල මෙතැන රුපියල් 1,040කට වැඩියි. රුපියල් 100ට විතර ගන්න පුළුවන් කෝප්පය රුපියල් 400 ගණනක් වනවා. ලංකාවේ හොඳ නිෂ්පාදනයක් වන සෙරමික් පිහානක මිලත් රුපියල් 1,000ට අඩුයි. එහෙම තිබියදී, මේ ගංවතුර අස්සේ මිනිස්සු උවදුරට පත් වෙලා සිටියදී ප්ලාස්ටික් පිහානක් සහ කෝප්පයක් එක company එකකින් විතරක් ගන්න පුළුවන් විධියට ටෙන්ඩර් කරලා, ලංකාවේ පොලීසියේ සියලු මහත්වරුන්ට ලබා දෙන්න හදනවා. ඒක කොච්චර වංචාවක්ද? සාමාන්‍ය වෙළෙඳ පොළේ රුපියල් 420ක් වන පිහානක් රුපියල් 1,040කට ගන්න පුළුවන් විධියට specifications ටික හදලා, එක company එකකින් ගන්න හදනවා. ගෙඩිය පිටින් කාට හෝ ඒ company එකෙන් commission එකක් යන විධියටද මේක හදලා තිබෙන්නේ? ගංවතුර දිහාවට අපි ඇස් යොමු කරගෙන ඉන්න අතරේ අනෙක් පැත්තෙන් මේ රටේ තවදුරටත් දූෂණය ක්‍රියාත්මක වෙනවා. දූෂණය නතර කරන්නටත් ප්‍රතිඥා දීලා, දූෂණය අපෙන්

[ගරු රෝහණ බණ්ඩාර මහතා]

නොවෙනවා කියලා බලයට ආපු ආණ්ඩු තුළත් හොරකම, දූෂණය නතර කරන්න කටයුතු කරන තැනක් වන පොලිසියේත් මේ විධියට කාරණා සිද්ධ වෙනවාද කියන එක අපිට සොයා බලන්න සිද්ධ වෙනවා. කථා කළ යුතු තව කරුණු කාරණා ගොඩක් තිබුණත් ඊට වෙලාව නැහැ. අවසාන වශයෙන්, මේ ආපදා තත්ත්වය හේතුවෙන් අනුරාධපුර දිස්ත්‍රික්කයේ ජීවිත අහිමි වුණු අයගේ පවුල්වලටත්, දේපළ හානි සිදු වුණු, වැව් අමුණු කඩාගෙන ගිහිල්ලා තම වෘත්තීයමය කටයුතු හානියට පත් වුණු සියලු දෙනාටත් අපගේ ශෝකය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)

ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.32]

**ගරු මහින්ද ජයසිංහ මහතා (කම්කරු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ - தொழில் பிரதி அமைச்சர்)
(The Hon. Mahinda Jayasinghe - Deputy Minister of Labour)

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, පසුගිය දිනවල ඇති වූ "දිට්වා" සුළි කුණාටුව හේතුවෙන් රට තුළ ඇති වූ ව්‍යසන තත්ත්වය නිසා ජීවිතක්ෂයට පත් වුණු 643දෙනාත්, අතුරුදහන් වුණු 183දෙනාත්, මේ ආපදාවට පත් වුණු ජනතාව මුදා ගන්න ගිහින් අනතුරට ලක්ව ජීවිතක්ෂයට පත් වුණු සියලු දෙනා වෙනුවෙනුත් එම පවුල්වල අයට අපේ බලවත් කනගාටුව ප්‍රකාශ කරමින් මගේ කථාව ආරම්භ කරන්න කැමතියි. ඇත්තටම ඊයේ දවසේත්, අදත් කියන මේ දවස් දෙක තුළ විපක්ෂය නඟන අඳෝනාව දැක්කාම මට මතක් වුණේ අපේ සුනිල් ශාන්තයන්ගේ ගීතයක් වන "විපත පවා සැපතට හරවලා පෙරටම යමු ලංකා" කියන ගීතයයි. ඉතිහාසය පුරා මෙවැනි විපත් ඇති වුණා. අපිට මතකයි, සුනාමි විපත වාගේම ඉතිහාසයේ සිදු වුණු තවත් විපත් ගැන.

ඒ හැම විපතකදීම මේ විපක්ෂය විපත සැපතක් කර ගත්තා. නමුත්, අද මොකද වෙලා තිබෙන්නේ? අද ඒ විපත සැපතක් කර ගන්න බැරි වුණාම, මුළු රටක් මේ විපතෙන් ජාතියක් ලෙස නැඟිටින්න උත්සාහ කරනකොට විපක්ෂයට සැහෙන්න රිදිලා තිබෙන බවක් අපි දකිනවා. එක වෙලාවක ගරු කබීර් හෂීම් මන්ත්‍රීවරයා කියනවා මට මතකයි, ගම්පොල 1,000කට වඩා මැරිලා කියලා. බොහොම උද්දාමයෙන් එතුමා ඒක කියන්නේ. අදත් ගරු ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ළඟ ඉඳගෙන මරණ 1,000කට අඩුයි කියද්දී ගරු රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා කියනවා මම දැක්කා, 1,000කට වඩා මැරිලා කියලා. *[බාධා කිරීමක්]* නැහැ, වැඩියි කියලා කිව්වේ. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමනි, "1,000කට ආසන්න" කියලා ඔබතුමා කිව්වා. ගරු මන්ත්‍රීතුමනි, මම අහගෙන හිටියේ. ඔබතුමා කිව්වා, 1,000කට ආසන්න කියලා. එතුමා දෙවතාවක් පුනරුච්චාරණය කළා, නැහැ, 1,000කට වැඩියි කියලා.

අද උදේ 6.00 වනකොට මුළු රටේම, මේ ආපදා තත්ත්වය හේතුවෙන් මැරිලා තිබෙන්නේ 643දෙනායි. අතුරුදහන් වෙලා තිබෙනවා, 183ක්. දැන් සතුටුද? ඉලක්කම ඉහළ යන එකද සතුටු? කනගාටුයි, මේ වාගේ විපක්ෂයක් ඉන්න එකට. මේක විනාශකාරී විපක්ෂයක්. මේක තමයි, රටේ විපත. ඇත්තටම රටේ විපත මේ විනාශකාරී විපක්ෂය, වෙන මොකක්වත් නොවෙයි. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අඩුම ගාණේ මේ ව්‍යසනයෙන් පසුවවත් විපක්ෂයේ භූමිකාව ටිකක් වෙනස් කරයි කියලා මම හිතුවා. විපක්ෂය වෙනස් විධියකට හිතලා මතලා, කල්පනා කරලා අපෙත් අඩුපාඩුකම් තිබෙනවා නම්, වැරදුණු තැන් තිබෙනවා නම්, ඒවා සාධනීය ලෙස පෙන්වා දීලා කටයුතු කරයි කියාත් මම හිතුවා. එහෙමද මේ කරන්නේ? මේ අය හැම වෙලාවේදීම උත්සාහ කරනවා, මේක ඇතුළේ පටු, පෞද්ගලික දේශපාලන වුවමනා ඉටු කර ගන්න. එම නිසා මම ඒ ගැන ඊට වඩා යමක් කියන්නේ නැහැ. මන්ත්‍රීතුමන්ලා ඒ කියපු ඒවාට එකින් එක උත්තර දෙන්න ගියොත් පැය ගණනක් උත්තර දෙන්න පුළුවන්. මම හිතන විධියට, රටේ ජනතාවත් බලාපොරොත්තු වන්නේ විනාශකාරී විපක්ෂයේ චෝදනාවලට උත්තර දෙන එක නොවෙයි. ජනතාව බලාපොරොත්තු වන්නේ, අපේ ඉදිරි ගමන් මඟ, ඉදිරි වැඩ පිළිවෙළ, මේ විනාශයෙන් පසුව රටක් ලෙස අපි ගොඩනැඟෙන්නේ කොහොමද, ගොඩ එන්නේ කොහොමද, ජාතියක් ලෙස ඉස්සරහට යන්නේ කොහොමද කියලා අපි සාකච්ඡා කරන එකයි.

දැන් හැමෝම වාගේ කිව්වා, රුපියල් 25,000 දීලා නැහැ කියලා. බොහෝ තැන්වල සියයට 60, 65, 70 ආදී වශයෙන් මේ මුදල් ගෙවලා තිබෙනවා. ගම්පහ දිස්ත්‍රික්කයේ පවුල් 79,134ක් ආපදාවට ලක් වුණා. ඊයේ සවස 3.00 වනකොට 70,786කට, ඒ කියන්නේ සියයට 89.45කට මේ රුපියල් 25,000 ගෙවලා අවසන්. සමහර ප්‍රාදේශීය ලේකම් කොට්ඨාස තිබෙනවා, සියයට 90කට, 92කට, 99කට මේ රුපියල් 25,000 ගෙවලා අවසන් කරපු. ආපදාවට ලක් වෙච්ච පවුල්වලට අපි ඉතාම කෙටි කාලයක් ඇතුළත ඒ දීමනාව ගෙවලා නිවසේ පදිංචි වෙන්න ඕනෑ කරන පරිසරය හැදුවා. ඉන් අනතුරුව ක්‍රියාවලියෙහි යම් සංකීර්ණ බවක් තිබෙනවා. ඒවා තක්සේරු කරන්න ඕනෑ. තක්සේරු කරලා තමයි ඉතුරු ගෙවීම් ටික කරන්න ඕනෑ. ඒ ක්‍රියාවලිය දැන් සිදු වෙමින් තිබෙනවා. විනාශ වුණු කර්මාන්ත, ආපදාවට ලක් වුණු කර්මාන්ත 29,000ක් තිබෙනවා. ඒවායින් 10,000කට ආසන්න ප්‍රමාණයක් මේ කෙටි කාලය තුළ සමීක්ෂණය කරලා තිබෙනවා. ඒ අදාළ විශේෂඥයින් ඒ කර්මාන්තශාලාවලට ගිහිල්ලා ඒවා අධීක්ෂණය කර තිබෙනවා.

මා සතුව තිබෙනවා, මේ විනාශකාරී විපක්ෂයේ ඉන්න ඔය මහත්වරු මේ රට පාලනය කරපු කාලයේ සහ අද වනකොට අපි ලබා දෙන සහන පිළිබඳව සඳහන් ලේඛනයක්. එදා ආපදාවෙන් විපතට පත් නිවසක් පිරිසිදු කර ගැනීම සඳහා රුපියල් 10,000ක අත්තිකාරමක් තමයි ලබා දුන්නේ. නමුත්, අද අපි ඒ සඳහා රුපියල් 25,000ක දීමනාවක් අපි ලබා දෙනවා. එදා ආපදාවෙන් විපතට පත් එළවලු වගා කරන හෙක්ටෙයාරයකට ශත 5ක්වත් ගෙවලා නැහැ. නමුත්, අද හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ 2ක් ලබා දෙනවා. එදා ආපදාවට පත් වූ නිවස වෙනුවට නව නිවසක් තනා ගැනීම වෙනුවෙන් උපරිම වශයෙන් ගෙව්වේ රුපියල් ලක්ෂ 25යි. නමුත්, අද රුපියල් ලක්ෂ 50ක් ලබා දෙනවා. ඒ වාගේම එදා ආපදාවට ලක් වූ සත්ව ගොවිපළකට ශත 5ක්වත් ගෙවලා නැහැ. නමුත්, අද ලියාපදිංචි සෑම සත්ව ගොවිපළකටම අපි රුපියල් ලක්ෂ 2ක් ගෙවනවා. ඒ විතරක් නොවෙයි, අධිඅවදානම් සහිත ඉඩම් සඳහා එදා ගෙව්වේ රුපියල් ලක්ෂ 4යි. අද අපි ඒ වෙනුවෙන් රුපියල් ලක්ෂ 50ක් ගෙවනවා. ඕනෑ නම් මේ ලැයිස්තුවම කියාගෙන යන්න පුළුවන්. සමහර ඒවාට ශත 5ක්වත් ගෙවලා නැහැ. විනාශයට ලක් වූ ව්‍යාපාරික ගොඩනැඟිල්ලක් වෙනුවෙන් එදා ශත 5ක්වත් ගෙවලා නැහැ. නමුත්, අද රුපියල් ලක්ෂ 50ක් ගෙවනවා. ඒ විතරක් නොවෙයි, කුඹුරු හෙක්ටෙයාරයකට එදා ශත 5ක්වත් ගෙවලා නැහැ, අද රුපියල් 150,000ක් ගෙවනවා. ඒ වාගේම ලියාපදිංචි කරපු ධීවර බෝට්ටුවක් වෙනුවෙන් එදා ශත 5ක්වත් ගෙවලා නැහැ. නමුත්, ධීවර ජනතාව සිටින දිස්ත්‍රික්ක නියෝජනය කරන කට්ටිය ඒ පිළිබඳව කථා කරනවා. අමුවෙන් මාළු කාපු හැටිත් අපට මතකයි. *[බාධා කිරීමක්]* ඔව්, බෝට්ටු කාලා නැහැ. ධීවර ජනතාවට ශත 5ක්වත් ගෙවලා නැහැ. නමුත්,

අද රුපියල් ලක්ෂ 4ක් ගෙවනවා. ඒ විතරක් නොවෙයි, පාසල් උපකරණ වෙනුවෙන් එදා ශත 5ක්වත් ගෙවලා නැහැ. අද අපේ දරු පැටවුන් වෙනුවෙන් අපි රුපියල් 25,000ක් ගෙවනවා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි,-

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
ඔබතුමා වාඩි වෙන්න. ඔබතුමාගේ කථාවේදී කියන්න.

ලියාපදිංචි කළ සුළු හා මධ්‍ය පරිමාණ ව්‍යාපාර සඳහා එදා ශත 5ක්වත් ගෙවලා නැහැ. නමුත්, අද රුපියල් ලක්ෂ 2ක් ගෙවනවා. *[බාධා කිරීමක්]* ඔබතුමා පසුව කථා කරන්න.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට පොඩි පැහැදිලි කර ගැනීමක් විතරයි අවශ්‍ය.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා එකඟ නම් කථා කරන්න.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
නැහැ, මේක මගේ වේලාව.

ඒ විතරක් නොවෙයි, අවතැන් කඳවුරුවල සිටින නිවාස අහිමි අය සඳහා කුලී නිවසක් ගන්න එදා දුන්නේ රුපියල් 10,000යි. අද ඒ සඳහා රුපියල් 25,000ක් දෙනවා. ඒ වාගේම, ජීවනෝපාය අහිමි වූවන් වෙනුවෙන් එදා ශත 5ක්වත් ගෙවලා නැහැ. අද ජීවනෝපාය අහිමි වූවන් යථා තත්ත්වයට පත් වන තුරු රුපියල් 50,000 ගණනේ මාස 3ක් ගෙවනවා. ඒ විතරක් නොවෙයි, විනාශ වුණු මුළුතැන්ගෙයි උපකරණ මිල දී ගැනීම සඳහා එදා ලබා දුන්නේ රුපියල් 25,000යි. අද රුපියල් 50,000ක් දෙනවා. එදා අර්ධ වශයෙන් හානි වූ නිවසක් සඳහා ලබා දුන්නේ රුපියල් 250,000යි. අද උපරිමය රුපියල් ලක්ෂ 25ක් දක්වා දෙනවා. එම නිසා කාරණය හරි පැහැදිලියි. විපක්ෂය කලබල වන එක ගැන දැන් අහන්න දෙයක් නැහැ; විපක්ෂයට කර කියා ගන්න දෙයක් නැති වන එක ගැන අහන්න දෙයක් නැහැ. එම නිසා අපි මේ රටේ ජනතාවට කිව යුතු කාරණයක් තිබෙනවා. මේ විපතෙන් පස්සේ විපක්ෂය හාන්සි වෙලා ඉන්න කොට, මෙලෝ දෙයක් නොකර ඉන්න කොට, රාජ්‍ය නිලධාරින් ඇතුළුව මේ රටේ ජනතාව විශාල සේවාවක් කළා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ දිස්ත්‍රික්කයේ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ක් තිබෙනවා. පසුගිය දවස්වල ඒ ප්‍රාදේශීය ලේකම් කාර්යාල 13ම සිටින ප්‍රාදේශීය ලේකම්වරුන්ට මම කථා කළා. සමහරු අසනීප වෙලා සිටියේ. ඒ මොකද කියලා අහන කොට ඔවුන් කිව්වා, නිදිමරලා අසනීප තත්ත්වයෙන් ඉන්නේ කියලා. එහෙත් ඔවුන් වැඩ කළා. ඒ විතරක් නොවෙයි, ග්‍රාම නිලධාරි දක්වා ඉහළ සිට පහළට සියලුදෙනා ඉතා විශිෂ්ට සේවාවක් කළා. අපේ ත්‍රිවිධ හමුදාවත්, පොලීසියත් ඉතා විශිෂ්ට සේවාවක් කළා. ඒ වාගේම විශාල පිරිසක් ස්වේච්ඡාවෙන් මේ වෙනුවෙන් සේවය කළා.

දැන් විපක්ෂය උත්සාහ කරමින් ඉන්නවා, රාජ්‍ය සේවකයින් සහ අප අතර විරසකයක් හදන්න. සොරි, අපට එහෙම ප්‍රශ්නයක් නැහැ. හැබැයි, එදා වාගේම අදත් වංචනිකයන්ට, දූෂිතයන්ට එරෙහිව නම් අපි කෙළින් අතට ගන්නවා. ඒ ගැන කිසි ගැටලුවක් නැහැ. එහෙම නැතුව අවංකව සේවය කරන, මේ ව්‍යසනයේදී දිවා රෑ නොබලා වැඩ කරපු කිසිදු රාජ්‍ය සේවකයෙකු අපි තනි කරන්නේ නැහැ. ඔවුන්ගේ හයියට අපි ඔවුන් සමඟ ඉන්නවා. ඒ නිසා අපි නිවැරැදි දේශපාලන නායකත්වය ලබා දෙමින් රාජ්‍ය සේවය, ත්‍රිවිධ හමුදාව, පොලීසිය, සිවිල් ආරක්ෂක බලකාය ආදී සියල්ල නිවැරැදිව මෙහෙයවමින් අද මේ ව්‍යසනය කෙටි කාලීනව කළමනාකරණය කරගෙන තිබෙනවා. ඊට පස්සේ අපි ඊළඟ මාස හය තුළ තාවකාලික ගොඩනැඟීම් කරන්නත්, ඉන් අනතුරුව ස්ථාවර ගොඩනැඟීම් කරන්නත් අවශ්‍ය කරන සැලසුම් හදලා තිබෙනවා.

අපි මේ රටේ සිංහල, දෙමළ, මුස්ලිම්, බර්ගර්, මැලේ සියලු ජනතාවගෙන් ඉල්ලනවා, මේ විනාශකාරී විපක්ෂයේ පදයට නටන්න ලැහැස්ති වෙන්න එපා කියලා. නමුත්, දැන් එවැනි සුළු පිරිසක් ඉතුරු වෙලා ඉන්නවා. Social mediaවලින් අපි ඒක දකිනවා නේ. සුළු පිරිසක් ඉතුරු වෙලා ඉන්නවා. ඒ මිස අද බහුතරයක් ජනතාව එහෙම නැහැ. අපි ඒකත් කියන්න ඕනෑ. මට නම් වශයෙන් කියන්න පුළුවන්, ඔබතුමන්නාන්සේලාගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු,-

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු නියෝජ්‍ය ඇමතිතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු මහින්ද ජයසිංහ මහතා**
(மாண்புமிகு மஹிந்த ஜயசிங்ஹ)
(The Hon. Mahinda Jayasinghe)
මට තව විනාඩියක කාලයක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

ඔබතුමන්ලාගේ ප්‍රාදේශීය සභා මන්ත්‍රීවරු, නාගරික මන්ත්‍රීවරු, අපත් සමඟ හරි හරියට වැඩ කළා. ඒ ආදර්ශයන් බිමේ තිබෙනවා, විපක්ෂය පැත්තේ මේ ඉහළ ඉන්න අතළොස්සක් එහෙම නැති වුණාට. අදත් විපක්ෂය පැත්තේ සමහර කථාවල හොඳ යෝජනා තිබුණා. සමහර සාධනීය විවේචන අපි හිස් මුදුනින් පිළිගන්න සූදානම්. හැබැයි, සමහර නිෂේධනීය විවේචන, මඩ, අවලාද වාගේ දේවලුත් තිබෙනවා. ඊයේත් දැක්කා නේ, මල් පෝච්චියක පැළ දෙකක් අහු වුණාම මාධ්‍ය සාකච්ඡාත් තියලා ඒ ගැන කියනවා. ඒ නිසා මට වෙලාවකට හිතෙනවා, සෙට් එකම ගංජා ගහලාද ඉන්නේ කියලා. ඒගොල්ලන්ම වවලා, ඒගොල්ලන්ම ගහලා වාගෙයි. සෙට් එකම ගංජා ගහලාද කියලා මට වෙලාවකට හිතෙනවා.

විපක්ෂ නායකතුමා කිව්වා, "යැයි", "හිතාගෙන ඉන්න" කියලා කියන්න එපා කියලා; "අධිනීතිඥ යැයි හිතාගෙන ඉන්න" කියලා කියන්න එපා කියලා. ඉතින් මට හිතෙනවා, ඒ ගොඩක් අය එහෙම හිතාගෙනද ඉන්නේ කියලා. කොහොම වුණත්, මම අවසාන වශයෙන් මේ රටේ ජනතාවගෙන් ඉල්ලීමක් කරනවා. විපක්ෂය මොන මොන අභූත චෝදනා නැඟුවත්, මොන මඩ අවලාද නැඟුවත්, වචනයක්, දෙකක් අල්ලාගෙන මොන මොන දේවල් කියන්න හැදුවත්, අපි මේ රටේ ජනතාවත් එක්ක එකතු වෙලා, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන් එක්ක එකතු වෙලා, සහෝදර විදේශ රාජ්‍යයන් එක්ක එකතු වෙලා, ඒ වාගේම මේ රටේ රාජ්‍ය සේවය ඇතුළු සමස්තය සමඟ ඒකාබද්ධව මේ රට ගොඩ නඟන්න ජාතියක් ලෙස නැවත නැඟී සිටින්න මේක අවස්ථාවක් කර ගන්නවා කියන සහතිකය ලබා දෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, இன்று விவாதிக்கப்படுகின்ற -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, I rise to a point of Order.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Madam, ස්ථාවර නියෝග පොත ගන්නකෝ. 141වැනි ස්ථාවර නියෝගය බලන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කියන්න මොකක්ද කියලා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්ච්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ස්ථාවර නියෝග පොත ගන්නකෝ. කවුරු හරි ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියට ස්ථාවර නියෝග පොත දෙන්නකෝ. Madam, 141වැනි ස්ථාවර නියෝගයේ මෙසේ සඳහන් වෙනවා:

> "The Speaker shall be responsible for the management of buildings, security arrangements and the general administration of the Chamber."

Madam, මම කැන්ටිමට කන්න ගියා. රතු බතුයි, හොදියි විතරයි තිබෙන්නේ. වෙන මොකුත් කන්න නැහැ, පාර්ලිමේන්තුව ඇතුළේ. මොන

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது]*
*[Expunged on the order of the Chair.]*

පාර්ලිමේන්තුවක්ද මේ? දෙකහමාරට කන්න ගියා, පාර්ලිමේන්තුවේ කෑම නැහැ. කථානායකතුමාට මේ ගැන කියලා කෑම හදාගන්න.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
හොඳයි. ඒ ගැන ගරු කථානායකතුමාට කියලා අවධානය යොමු කරවන්නම්.
ගරු ඉම්රාන් මහරූෆ් මන්ත්‍රීතුමා කථා කරන්න.

[අ.භා. 2.45]

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, කාලය ගණනය කිරීම දැන් සිට පටන් ගන්නවා ඇති කියලා මම හිතනවා.

நன்றி, கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே! அண்மையில் ஏற்பட்ட அனர்த்தத்தால் ஏற்பட்டுள்ள பாதிப்புகள் சம்பந்தமாக இன்றைய தினம் விவாதிக்கப் படுகின்றது. குறிப்பாக, 'தித்வா' சூறாவளியின் தாக்கத்தால் நாட்டின் அனைத்து மாவட்டங்களிலும் இருக்கின்ற மக்கள் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். இந்த அனர்த்தத்தால் உயிரிழந்தவர்களின் குடும்பத்தினருக்கும் தமது உடைமைகளை இழந்த மக்களுக்கும் எங்களுடைய அனுதாபத்தையும் கவலையையும் இந்த நேரத்தில் தெரிவித்துக் கொள்கின்றோம்.

கௌரவ குழுக்களின் பிரதித் தவிசாளர் அவர்களே, அரசாங்கமானது பாதிக்கப்பட்டவர்களுக்கான நிவாரணங் களையும் கொடுப்பனவுகளையும் சரியான முறையில் வழங்க வேண்டும். எங்களுடைய மாவட்டத்தில் இருக்கின்ற எல்லாத் தரப்பினரும் இந்த அனர்த்தத்தால் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். குறிப்பாக, மீனவர்கள் கடலுக்குச் சென்று தங்களது தொழிலை மேற்கொள்ள முடியாத நிலை காணப்படுகின்றது. அதேபோல், விவசாயிகளுக்கும் கால்நடை வளர்ப்பாளர்களுக்கும் பெரும் பாதிப்பு ஏற்பட்டு இருக்கின்றது. மேலும், நாளாந்தம் கூலிவேலை செய்வோரின் தொழிலும் பாதிக்கப்பட்டு இருக்கின்றது. இவ்வாறு பலரும் பல்வேறு பாதிப்புகளுக்கு உள்ளாகியிருக்கின்ற காரணத்தால், அவர்களுக்கான நட்டஈட்டை வழங்குவதற்கான முயற்சிகளை எடுக்க வேண்டும்.

இன்று எங்களுடைய மாவட்டத்திலுள்ள கிண்ணியா, மூதூர் போன்ற பிரதேசங்கள் கூடுதலாகப் பாதிக்கப்பட்ட பிரதேசங்களாகக் காணப்படுகின்றன. இந்தப் பிரதேசங்களில் நிவாரணம் கிடைக்கவிருப்போரின் பெயர்ப்பட்டியல் எந்த அடிப்படையில், எவ்வாறு எடுக்கப்பட்டது என்பதை நான் இந்த இடத்தில் கேட்க விரும்புகின்றேன். மூதூரில் 6,932 பேருக்கும் கிண்ணியாவில் 4,822 பேருக்கும்தான் 25,000 ரூபாய் வழங்குவதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட்டு இருக்கின்றன. எனினும், இந்தப் பிரதேசங்களிலுள்ள மக்கள் முழுமையாகப் பாதிக்கப்பட்டு இருக்கிறார்கள். நான் ஆரம்பத்தில் சொன்னதுபோன்று, அந்த மக்களுடைய தொழில் - வாழ்வாதாரம் - முழுமையாக முடக்கப்பட்டு இருக்கின்றது. ஆகையால், பாதிக்கப்பட்டவர்களுக்கு எந்த அடிப்படையில் நிவாரணம் வழங்குவது என்பதை யார் முடிவு செய்கிறார்கள் என்பதை நாங்கள் கேட்க விரும்புகின்றோம். எனவே, பாதிக்கப்பட்டு இருக்கின்ற எல்லாத் தரப்பினருக்கும் அரசாங்கத்தால் வழங்கப்படுகின்ற நிவாரணங்கள், நட்டஈடுகள் சரியான முறையில் சென்றடைய வேண்டுமென நான் இந்த இடத்தில் கேட்டுக் கொள்கின்றேன். அது மாத்திரமல்ல, எதிர்க்கட்சியினர் பாதிக்கப்பட்ட மக்கள் மத்தியில் சென்று, அவர்களுடன் கதைத்து ஆறுதல் கூறுவதையும் அவர்களுக்கு நிவாரணம் வழங்குவதையும் அவர்களுடைய பிரச்சினைகளுக்குத் தீர்வுகாண முயல்வதையும் அரச தரப்பினர் குறை காண்கின்றனர். குறிப்பாக, எதிர்க்கட்சியினரால் செய்யப்படுகின்ற

வேலைகளை Facebook மற்றும் ஏனைய சமூக ஊடகங்களில் பார்க்கும்போது, இவர்களால் பொறுத்துக்கொள்ள முடியாமல் இருக்கின்றது. எங்களுடைய மாவட்டத்தில் மத்திய அரசாங்கத்தால் வழங்கப்படுகின்ற நிதியை பகிர்ந்தளிக்கின்ற வர்களாகவும், மத்திய அரசாங்கத்தால் அனுப்பப்படுகின்ற பொருட்களை விநியோகிக்கக்கூடிய விநியோகஸ்தர்களாகவும் இவர்கள் இருக்கிறார்கள்.

அது மாத்திரமல்ல, தொடர்ச்சியாக எந்த நாளும் கூட்டங்களைக் கூட்டி, அரச அதிகாரிகள் நிம்மதியாக வேலைசெய்ய முடியாத ஒரு சூழலை இன்று ஏற்படுத்தி இருக்கிறார்கள். மக்கள் சில அரச அதிகாரிகளைக் குற்றஞ்சாட்டுகின்றார்கள். இதற்கான காரணம் என்ன என்பதை நாங்கள் பார்க்க வேண்டும். கூட்டம் கூட்டம் என்று கூட்டங்களைத் தொடர்ச்சியாக நடாத்துவதானது, அரச அதிகாரிகளின் கடமைக்கு இடையூறாகக் காணப்படுகின்றது. இவ்வாறு பல விடயங்களைச் சொல்லிக்கொண்டே போகலாம். இருந்தாலும், இது எதிர்பாராத விதமாக ஏற்பட்டுள்ள அனர்த்தம் என்ற அடிப்படையில், பாதிக்கப்பட்டிருக்கின்ற மக்களுக்கு எங்களால் இயலுமான உதவிகளைச் செய்ய வேண்டும். அது ஆளுந்தரப்பினராக இருந்தாலும் சரி, எதிர்த்தரப்பினராக இருந்தாலும் சரியே! அவர்கள் எந்த அடிப்படையில் உதவிகளைச் செய்தாலும், அவர்களுக்கு உதவி செய்வதற்கான சந்தர்ப்பங்களைச் சரியாக வழங்காவிட்டாலும் பராவாயில்லை, அவர்களை விமர்சிப்பதை நிறுத்த வேண்டுமென நான் ஆளுந்தரப்பிடம் கேட்டுக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට නියමිත කාලය අවසානයි.

**ගරු ඉම්රාන් මහරූෆ් මහතා**
(மாண்புமிகு இம்ரான் மஹ்ரூப்)
(The Hon. Imran Maharoof)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, මට විනාඩියක් දෙන්න.

கண்டி மாவட்டத்திலுள்ள தெல்தோட்டை பகுதியில் வெள்ளத்தால் பெரியளவில் உடைப்பு ஏற்பட்டுள்ளதால், அப்பிரதேசத்துக்கான போக்குவரத்து தடைப்பட்டு இருக்கின்றது. ஆகையால், மாற்று வீதி ஒன்றைத் தெரிவுசெய்து, அதனைத் துரிதமாக அபிவிருத்தி செய்து, அங்கிருக்கின்ற மக்களுக்கான போக்குவரத்து வசதிகளைச் செய்து கொடுப்பதிலும், சுகாதாரம் மற்றும் பொருளாதாரப் பிரச்சினைகளுக்கான தீர்வை வழங்குவதிலும் இந்த அரசாங்கம் கவனம் செலுத்த வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். அதேபோல், கலஹா பகுதியிலும் இவ்வாறான பிரச்சினைகள் காணப்படுகின்றன. அது தொடர்பிலும் விசேட கவனத்தைச் செலுத்த வேண்டுமெனக் கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன்.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
මීළඟට, ගරු ගමගෙදර දිසානායක නියෝජ්‍ය ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 2.50]

**ගරු ගමගෙදර දිසානායක මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் பிரதி அமைச்சர்)
(The Hon. Gamagedara Dissanayake - Deputy Minister of Buddhasasana, Religious and Cultural Affairs)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආපදාවට පත් ජනතාව වෙනුවෙන් සහන සැලසීම අරමුණු කරගෙන ඉදිරිපත් කර ඇති පරිපූරක මුදල හා සම්බන්ධ යෝජනාව පිළිබඳව අදහස් ඉදිරිපත් කරන්න මට අවස්ථාව ලැබීම ගැන මගේ සතුට ප්‍රකාශ කරනවා. මේ ආපදාව සිද්ධ වෙච්ච වෙලාවේ රටේ පැවතුණු තත්ත්වය පිළිබඳව සිහි බුද්ධියක් තිබෙන හැම කෙනාටම අවබෝධයක් තිබෙනවා කියලා මම හිතනවා. ඒ නිශ්චිත වෙලාවේ ඉතාම දුෂ්කර තත්ත්වයක් ගොඩ නැඟුණා, පළමුවැනි දවස දෙක ඇතුළත. ගම්මානවල කොටු වෙච්ච ජනතාවට එතැනින් මෙහාට එන්නත්, මේ පැත්තේ ඉන්න පිරිස්වලට ඒ ගම්මානවලට යන්නත් බැරි තත්ත්වයක් පළමුවැනි දවස දෙක ඇතුළත උදා වුණු බව කවුරුත් දන්නවා. අඩුම තරමින් මේ දෙපාර්ශ්වය අතර සන්නිවේදන කාර්යක්වත් කර ගන්න බැරි තරම් අතිශය දුෂ්කරතාවක් ඒ මොහොතේ ඇති වෙලා තිබුණා. ඒ දුෂ්කරතම අවස්ථාවේ ගම්වල කොටු වෙච්ච ජනතාව රැක බලා ගන්න මැදිහත් වෙච්ච විශේෂිත කණ්ඩායමක් හිටියා. ඒ තමයි අපේ ග්‍රාමීය මට්ටමේ විහාරස්ථාන සහ ගෞරවනීය ස්වාමීන් වහන්සේලා, අනෙකුත් ආගමික සිද්ධස්ථාන සහ පූජක උතුමන්ලා. බොහෝ මන්ත්‍රීතුමන්ලා කථා කරද්දී ඒ පිළිබඳව අවධානය අඩුවෙන් යොමු වෙච්ච නිසා ඒ ගෞරවනීය ස්වාමීන් වහන්සේලාගේත්, අනෙක් ආගමික සිද්ධස්ථානවල පූජක උතුමන්ලාගේත් මැදිහත්වීම පිළිබඳව අපි මේ වෙලාවේ විශේෂයෙන් කථා බහ කළ යුතුව තිබෙනවා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ආපදාවට පත් වෙච්ච ජනතාව ආපදා තත්ත්වයෙන් මුදා ගැනීම සඳහා වෙහෙස මහන්සි වෙච්ච, මැදිහත් වෙච්ච ආයතන, පුද්ගලයෝ ගණනාවක් හිටියා. එක පැත්තකින්, අපේ රටේ රාජ්‍ය සේවාව මේ වෙලාවේ ඉතාම යුහුසුලුව මැදිහත් වෙමින් මේ ආපදා තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා කටයුතු කළා. ඒ වාගේම ත්‍රිවිධ හමුදාව, ස්වේච්ඡා සහන කණ්ඩායම්, විවිධ පිරිස්, ආගමික නායකයන් මේ කටයුත්තේදී විශාල කාර්ය භාරයක් කළා. ඒ සැමට ගෞරවයක් ලෙස අපි මේ වෙලාවේදී ඒ බව සිහිපත් කරනවා. මේ විධියට ආපදාවට පත් වෙච්ච සමස්ත ජනතාව වෙනුවෙන් රජය හැටියට අපි මැදිහත් වෙලා ඉතිහාසයේ කිසිම දවසක නොවූ තරමට වැඩ කටයුතු සැලසුම් කරලා ක්‍රියාත්මක කරගෙන යනකොට ඒ වැඩ පිළිවෙළ කඩාකප්පල් කරන්න, ඒ වැඩ පිළිවෙළ බිඳ වට්ටන්න මේ විපක්ෂයේ සමහර මන්ත්‍රීවරුන් කටයුතු කරපු විධිය අපි කවුරුත් දැක්කා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, රජය හැටියට මැදිහත් වෙලා අපේ කාර්ය භාරය ඉටු කරන ගමන්ම අපි කල්පනා කළා, බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යාංශය හැටියට මැදිහත් වෙලා මේ කටයුත්තට ශක්තියක් වෙමින් දායකත්වය ලබා දෙන්න. ඒ අනුව අපි ලැබුණු පළමුවැනි අවස්ථාවේම මුළු රටේම ආපදාවට පත් වෙච්ච ආගමික ස්ථාන පිළිබඳව සංගණනයක් කර ගත්තා; තොරතුරු සහ දත්ත එක් රැස් කර ගත්තා. මොකද, බොහෝ දෙනා කියනවා අපි දැක්කා, රජය හැටියට අපි ආගම දහම නොසලකා, ආගමික සිද්ධස්ථාන නොසලකා, ගෞරවනීය ස්වාමීන් වහන්සේලා, පූජක උතුමන්ලා නොසලකා කටයුතු කරනවා කියලා. සමහර මාධ්‍ය නාළිකා පටන්ගත්තා, ආගමික සිද්ධස්ථාන ගොඩනැඟීමේ අරමුදල්

[ගරු ගමගෙදර දිසානායක මහතා]

පිහිටුවන්න. අපි දැක්කා, සමහර අය කොරෝනා වසංගතය වෙලාවේ යම් යම් එන්නත් ගෙන්වන්න මැදිහත් වෙලා ඒ තුළින් කොයි තරම් වංචා සිදු කළාද කියලා. සමහරු උත්සාහ කළා ආගමික මධ්‍යස්ථාන, ආගමික සිද්ධස්ථාන ගොඩනහන්න අරමුදල් හදන්න.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අමාත්‍යාංශයක් හැටියට අපි මේ වනකොට මේ ආපදාවෙන් විපතට පත් වෙච්ච සියලු ආගමික සිද්ධස්ථාන හරියාකාරව හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව අපි මේ වන විට රට පුරා එවැනි ස්ථාන 1,087ක් හඳුනාගෙන තිබෙනවා. විපතට පත් වුණු බෞද්ධාගමික සිද්ධස්ථාන, හින්දු ආගමික සිද්ධස්ථාන, ඉස්ලාම් ආගමික සිද්ධස්ථාන, ක්‍රිස්තියානි ආගමික සිද්ධස්ථාන සම්බන්ධයෙන් කළ යුතු කාර්ය භාරය මොකක්ද කියලා අපි දිස්ත්‍රික්ක මට්ටමින් නිසි විධියට හඳුනාගෙන තිබෙනවා. ඒ අනුව බෞද්ධාගමික සිද්ධස්ථාන 521ක්, හින්දු ආගමික සිද්ධස්ථාන 185ක්, ඉස්ලාම් ආගමික සිද්ධස්ථාන 181ක්, ක්‍රිස්තියානි ආගමික සිද්ධස්ථාන 102ක්, පුරාවිද්‍යා ස්ථාන 32ක්, සංස්කෘතික මධ්‍යස්ථාන 31ක් ආදි වශයෙන් අපි එවැනි ස්ථාන 1,087ක් හඳුනාගෙන තිබෙනවා. හඳුනාගත්තු ඒ ආගමික මධ්‍යස්ථාන, ඒ ආගමික සිද්ධස්ථාන ඉතාම විධිමත්ව ගොඩනැඟීම කළ යුතුව තිබෙනවා. ඒ නිසා අපි තීන්දුවක් ගත්තා, අමාත්‍යාංශය මැදිහත් වෙලා ආපදාවට ලක් වෙච්ච දිස්ත්‍රික්කවලට අපේ මාණ්ඩලික නිලධාරින්ගෙන් සමන්විත කණ්ඩායම් යවලා ඒ අදාළ තොරතුරු සත්‍ය වශයෙන්ම හඳුනාගන්න.

ඒ අනුව අමාත්‍යාංශය හැටියට ප්‍රධාන කණ්ඩායම් 3ක් ඒ ප්‍රධාන දිස්ත්‍රික්කවලට මැදිහත් කරවමින්, එක පැත්තකින් ගරු අමාත්‍යතුමා, නියෝජ්‍ය අමාත්‍යවරුන් දෙපළ, ඒ වාගේම අමාත්‍ය කාර්ය මණ්ඩලය මැදිහත් වෙලා රට පුරා දිස්ත්‍රික්කවල ප්‍රතිසංස්කරණය කළ යුතු ආගමික මධ්‍යස්ථාන හරියාකාරව හඳුනාගෙන තහවුරු කර තිබෙනවා. ඒ මධ්‍යස්ථාන හඳුනාගත්තාට පසුව ඒ මධ්‍යස්ථානවලට අවශ්‍ය කරන ගොඩනැංවීම් කරන්න සැලකිය යුතු ප්‍රතිපාදනයක් අවශ්‍ය වනවා. රජය මැදිහත් වෙලා ඒ ප්‍රතිපාදන ලබා දෙන කල් බලාගෙන ඉන්නේ නැතුව අපි අපේ මූලිකත්වයෙන් ආරම්භ කර තිබෙනවා, මේ කියන ආගමික සිද්ධස්ථාන ගොඩනැඟීම අරමුණු කරගත්තු අරමුදලක්. කියන්න සතුටුයි, ඒ අරමුදල ආරම්භ කරලා දින කිහිපයක් යනකොට -මේ වන විටත්- රුපියල් මිලියන 300කට වඩා වැඩි ප්‍රතිපාදන ලබා දී තිබෙනවා. විශේෂයෙන්ම මිය ගිය අය සිහිපත් කරලා, ඒ වාගේම පීඩාවට පත් වෙච්ච අය සිහිපත් කරලා පුණ්‍යානුමෝදනා පින්කමක් පසුගිය 08වැනි දා හුනුපිටිය ගංගාරාම විහාරස්ථානයේදී අපි සිදු කළා. ඒ වෙලාවේ කරපු ඒ ඉල්ලීමට ප්‍රතිචාර දක්වමින් ඒ මොහොතේ විතරක් රුපියල් මිලියන 165කට වැඩි ප්‍රතිපාදනයක් ලබා දෙන්න පරිත්‍යාගශීලින් කටයුතු කළා. ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඒ වෙලාවේ හුනුපිටිය ගංගාරාමයේ අපේ ගෞරවනීය නායක හාමුදුරුවන් වහන්සේගේ ඉල්ලීම පරිදි එක් ධනපති මහත්මයෙක් අපට රුපියල් මිලියන 100ක් -රුපියල් ලක්ෂ 1,000ක්- පරිත්‍යාග කළා. එතුමා කොයි තරම් සද්භාවයෙන්ද ඒ කටයුත්ත කළේ? ඒ මුදල ප්‍රදානය කරලා එතුමා අපෙන් ඉල්ලීමක් කළා, අඩුම තරමින් තමන්ගේ නමවත් කිසිම තැනක සඳහන් කරන්න එපා කියලා. ඒ තරම් සද්භාවයෙනුයි එතුමන්ලා ඒ කටයුතු කළේ. මීට කලිනුත් ජාතික වශයෙන් ආපදා ඇති වෙච්ච අවස්ථාවල ඒ විධියට පරිත්‍යාග කරලා ඒ අයට යම් අත් දැකීමක් තිබෙන බව අපි දන්නවා. ඒ විධියට පරිත්‍යාග කරලා මීට කලින් ඒ අයට තිබෙන අත්දැකීම මොකක්ද? සුනාමිය වෙලාවේ ඩොලර් මිලියන ගණනින් පරිත්‍යාග ආවා. කොරෝනා වෙලාවේත් පරිත්‍යාග ආවා. හැබැයි, ඒ කරපු පරිත්‍යාගවලට වෙච්ච දේ පිළිබඳව ඒ ජනතාවට අවබෝධයක් තිබෙනවා. මේ වෙලාවේ ජනතාව විශ්වාස කරනවා, තමන් පරිත්‍යාග කරන හැම සතයක්ම ඒ අදාළ පාර්ශ්වයට යනවා. ඒ පිළිබඳව සැකයක් නැහැ කියලා. මේ කෙටි කාලයට විතරක් ආගමික සිද්ධස්ථාන ගොඩනහන්න පමණක් ආරම්භ කරපු අරමුදලට අපට රුපියල් මිලියන 360කට වැඩි මුදලක් ලැබිලා තිබෙනවා. අපි විශ්වාස කරනවා, ඉදිරි කාලයේදී මීටත් වඩා පරිත්‍යාග මේ සඳහා ලබා දෙයි කියලා.

ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, අපේ විපක්ෂයේ සජබයේ ඉන්න මහ ලේකම්තුමා උදේ පාන්දරම බොරුවක් කියලා තමයි මේ විවාදය පටන් ගත්තේ. එතුමා කිව්වා, මාතලේ දිස්ත්‍රික්කයේ යම් සිද්ධියක් ගැන. එතුමා කියනවා, මාතලේ දිස්ත්‍රික්කයේ යටවත්ත ප්‍රාදේශීය ලේකම් කොට්ඨාසයේ දේශපාලන අධිකාරිය විසින් ග්‍රාම නිලධාරින්ට බලපෑමක් කරපු නිසා ග්‍රාම නිලධාරින් වැඩ වර්ජනයකට ගියා කියලා. නමුත් ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, ඇත්ත කථාව මේකයි. සජබයේ ඒ ප්‍රදේශයේ ඉන්න සංවිධායකවරයා -කෝසල බණ්ඩාර කියන පුද්ගලයා- වැරැදි ප්‍රවෘත්තියක් සමාජ මාධ්‍යයට මුදා හැරලා ඒක ප්‍රධාන මාධ්‍යවල පළ කරන්න යෙදුණා. ඒ ප්‍රවෘත්තිය පළ වෙච්ච වහාම යටවත්ත ප්‍රාදේශීය සභාවේ සභාපතිවරයා මැදිහත් වෙලා යටවත්ත පොලිසියේ පැමිණිල්ලක් කරනවා, ආර්අයිබී/1801566 කියන අංකය යටතේ. ඒ පැමිණිල්ල කළාට පස්සේ ඒ ප්‍රවෘත්තිය වැරැදි විධියට පළ කරපු සජබයේ කෙනා මාධ්‍ය සාකච්ඡාවක් තියලා සමාව ගත්තා. ඒක මේ අයත් හොඳට දන්නවා. ඒ මහලේකම් ඒක නොදන්න හේතුවක් නැහැ. හැබැයි, ඒ මහලේකම් ඒක දැන ගෙනත් පාර්ලිමේන්තුවට ඇවිල්ලා බොරු කියනවා. ලජ්ජයි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
කාලය අවසානයි, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි.

**ගරු ගමගෙදර දිසානායක මහතා**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)
මට තව තත්පර 30ක් දෙන්න, ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි.

අපේ දිස්ත්‍රික්කය නියෝජනය කරන මන්ත්‍රීතුමිය මෙතැනට ඇවිල්ලා පට්ටපල් කෙබරයක් ඇද බෑවා. එතුමිය කියනවා, මාතලේ දිස්ත්‍රික්කයේ අකාර්යක්ෂමතාව ගැන. රාජ්‍ය නිලධාරින් හරියට වැඩ කරන්නේ නැහැ කියලායි එතුමිය කියන්නේ. හැබැයි, මේ වෙලාවේ මම වගකීමෙන් කියනවා, රටේ බොහෝ දිස්ත්‍රික්කවල වැඩ කටයුතුවලට සාපේක්ෂව ගත්තාම ඉතාම කාර්යක්ෂමව වැඩ කරලා තිබෙන්නේ මාතලේ දිස්ත්‍රික්කයේ දිසාපතිතුමා ඇතුළු ප්‍රාදේශීය ලේකම්තුමන්ලා සහ ඒ රාජ්‍ය නිලධාරින් කියලා. එතුමිය ඒ දිස්ත්‍රික්කය අකාර්යක්ෂමයි කියලා ඒ රාජ්‍ය නිලධාරින්ට තමයි අපහාසය කළේ. පසුගිය දවස වෙනකොට රුපියල් 25,000 බෙදීමේ ප්‍රතිශතය සියයට 92.8යි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
අවසන් කරන්න, ගරු නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු ගමගෙදර දිසානායක මහතා**
(மாண்புமிகு கமகெதர திசாநாயக்க)
(The Hon. Gamagedara Dissanayake)
ඒ වාගේ කාර්යක්ෂමව වැඩ කරන රාජ්‍ය නිලධාරින්ට මේ විධියට අපහාස, උපහාස කරන එක අපි තරයේ හෙළා දකින ගමන්, මේ විපතට පත් වෙච්ච ජනතාව වෙනුවෙන් සැලසුම්

කරගත් විධියට අමාත්‍යාංශ හැටියටත්, රජය හැටියටත් අතිසාර්ථක විධියට වැඩ කටයුතු කරලා ඒ ජනතාවට තිබුණාටත් වඩා යහපතක් ජීවිතයක් ගත කරන්න අවස්ථාව අපි උදා කරලා දෙනවා කියන කාරණය සඳහන් කරමින් මා නිහඬ වෙනවා.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය**
(மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள்)
(The Hon. Deputy Chairperson of Committees)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

Order, please! ඊට ප්‍රථම, කවුරුන් හෝ ගරු මන්ත්‍රීවරයෙකු මූලාසනය සඳහා ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමාගේ නම යෝජනා කරන්න.

**ගරු වසන්ත සමරසිංහ මහතා**
(மாண்புமிகு வசந்த சமரசிங்ஹ)
(The Hon. Wasantha Samarasinghe)
ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමියනි, "ගරු උපුල් කිත්සිරි මන්ත්‍රීතුමා දැන් මූලාසනය ගත යුතුය"යි මම යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

***අනතුරුව ගරු නියෝජ්‍ය කාරක සභා සභාපතිතුමිය මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනාරූඪ විය.***
*அதன்பிறகு, மாண்புமிகு குழுக்களின் பிரதித் தவிசாளர் அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் தலைமை வகித்தார்கள்.*
*Whereupon THE HON. DEPUTY CHAIRPERSON OF COMMITTEES left the Chair, and THE HON. UPUL KITHSIRI took the Chair.*

[අ.භා. 3.03]

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම විශේෂයෙන් සතුටු වෙනවා, අද දවසේ මේ කාරණය පිළිබඳව කථා කරන්න ලැබීම ගැන. ඉතාම කෙටි වෙලාවක් තිබෙන නිසා මූලික කාරණා කිහිපයක් කියන්න කැමැතියි.

මම දැක්කා, අපේ එක ඇමතිවරයෙක් කියනවා, "විනාශකාරී විපක්ෂය" කියලා. පසුගිය කාලයේම විපක්ෂයේ ඉඳලා විනාශ කරපු කට්ටිය තමයි අද ආණ්ඩුව අරගෙන තිබෙන්නේ. ඒක නිසා තමයි ඒ ගොල්ලන්ට "විනාශකාරී විපක්ෂය" විධියට අප පෙනෙන්නේ. අපි හැම දාම හොඳ දේවල්වලට සහයෝගය දුන්නා; ශක්තිය දුන්නා. කරන්න පුළුවන් වැඩ කටයුතු ටික එකට එකතු වෙලා කෙරුවා. අපි තමුන්නාන්සේලා වාගේ විවේචනය කරමින් පාරවල් දිගේ ඇවිද්දේ නැහැ.

අද වෙනකොටත් මේ ආපදාවෙන් මිය ගිය සහ අතුරුදහන් සියල්ල එකතු කරලා තවම ආණ්ඩුවට හරියට ගණනක් කියා ගන්න බැරුව ඉන්නවා. ඒ අස්සේ මරණ සහතික ප්‍රදානෝත්සව තියලා ෆොටෝ ගන්නවා. ඒ මිනිස්සු අඬ අඬා ඇවිල්ලා මරණ සහතික ගත්තේ. ඒකත් ෆොටෝ ගහලා දානවා පත්තරේයි රූපවාහිනීවලයි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආපදා සහන ක්‍රියාවලියේදී ඇත්ත වශයෙන්ම අපට කරන්න තිබෙන එකම දෙය තමයි ඒකට අවශ්‍ය ශක්තිය දෙන එක. විශේෂයෙන්ම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානයේ - DMC එකේ - ක්‍රියාවලියට අපේ විපක්ෂ නායකතුමා, ගරු එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා ඇතුළු විපක්ෂයේ මන්ත්‍රීවරු සියලුදෙනාම විශාල ශක්තියක් දෙනවා.

මෙහිදී මම විශේෂයෙන්ම කියන්න කැමතියි කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව ගැන. තමුන්නාන්සේලා මුල ඉඳලාම කිව්වා කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ නිලධාරින් දැනුම් දීම කළේ නැහැ කියලා. ශ්‍රී ලංකා කාලගුණ විද්‍යාඥයන්ගේ සංගමය - Sri Lanka Association of Meteorologists - පිටු හතරකින් යුතු මාධ්‍ය නිවේදනයක් නිකුත් කරලා තිබෙනවා. එම මාධ්‍ය නිවේදනය මා **සභාගත*** කරනවා.

ඒ මාධ්‍ය නිවේදනයේ ඔවුන් බොහොම පැහැදිලිව කියනවා, වායුගෝලීය කැලඹිලි ස්වභාවය සම්බන්ධව 23වැනි දා ඉඳලා සියලු බලධාරින් දැනුවත් කළා කියලා. සුළු පන්න ධීවරයන්ට මුහුදට යන්න එපා කියලා 24වැනි දා amber colour එකෙන් යුත් අවවාදත්මක නිවේදනයක්ද, ඊළඟට 25වැනි දා උදේ 10.00ට ඒ පිළිබඳව Red Notice එකක්ද, ඊළඟට, 26වැනි දා රාත්‍රී 10.30ට අනතුරු ඇඟවීමේ නිවේදන ද නිකුත් කර තිබෙනවා. මෙලෙස දැනුවත් කරලා තිබෙද්දී තමයි ඒ සම්බන්ධව අවශ්‍ය කටයුතු නොකර තිබෙන්නේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව තිබෙන්නේ ජනාධිපතිතුමා යටතේ. ඒ වාගේම ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය තිබෙන්නෙත් ජනාධිපතිතුමා යටතේ. කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමා අද හිරකාරයෙක් බවට පත් කරලා තිබෙන්නේ. එතුමා නිවාස අඩස්සියේ ඉන්නේ. එතුමාට තමන්ගේ ළමයෙක් එක්ක කථා කරන්න දෙන්නේ නැහැ. මම කියනවා පුළුවන් නම් එතුමාට ඇවිල්ලා පුවත් පත් සාකච්ඡාවක් තියන්න කියලා. අද එතුමා නිවාස අඩස්සියේ තබා තිබෙන්නේ. මොකද, මේ ආණ්ඩුව දැන් භයයි ඒවා ගැන කියයි කියලා. මොකද, සමහරු එතුමාට කියලා තිබෙනවා ඒ ප්‍රකාශය ඉවත් කර ගන්න කියලා. එතුමා කියා තිබෙනවා, ඉවත් කර ගන්න බැහැ. මම අයින් වනවා කියලා. ඒ තැනට මේ කාරණය පත් වෙලා තිබෙන්නේ. කරුණාකරලා රාජ්‍ය නිලධාරින්ට බලපෑම් කරන්න යන්න එපා.

ඊළඟ, කාරණය මෙයයි. ගරු මහින්ද ජයසිංහ නියෝජ්‍ය ඇමතිතුමනි, ව්‍යසනයෙන් ආපදාවට පත් වූ ව්‍යාපාරිකයන්ට ලක්ෂ 50ක් ගෙවනවා ලු. මම දන්න විධියට නම් ව්‍යාපාරිකයන්ට ලක්ෂ 50ක් ගෙවන්නේ නැහැ. ව්‍යාපාරිකයෙකුට ලක්ෂ 2ක් දෙනවා කියලා තිබෙනවා දැනට ඔවුන්ගේ කටයුතු ටික කර ගන්න. මම ආණ්ඩුවෙන් ඉල්ලනවා, ඒ අයට සුළු පරිමාණයෙන් ණයක් ගැනීමට යම් වැඩ පිළිවෙළක් හදන්න කියලා. ඔවුන්ගේ මූලික වියදම් ටික ගෙවන්න දීලා, ඔවුන්ට මේ ආපදා තත්ත්වයෙන් නැගිටින්න සියයට 7ක, 8ක පොලියට ණයක් ගන්න වැඩ පිළිවෙළක් හදලා දෙන්න. මොකද, දැන් ඔවුන් මුහුණ දීලා තිබෙන්නේ ලොකුම අර්බුදයකට. එම නිසා ඒ සම්බන්ධව යම් වැඩ පිළිවෙළක් හදන්න කියලා ඉල්ලා සිටිනවා.

ඒ කාරණාවලට අමතරව විශේෂයෙන්ම කිව යුතු කරුණු කිහිපයක් තිබෙනවා. එකක් තමයි, බාල බෙහෙත් සම්බන්ධ කාරණය. අද බාල බෙහෙත් පිළිබඳ විශාල අර්බුදයක් මතු වෙලා තිබෙනවා. අද වෛද්‍ය බෙල්ලන මැතිතුමාගේ වැඩ තහනම් කරලා තිබෙනවා; එතුමා ඉවත් කරලා තිබෙනවා. මොකක්ද ඒකට හේතුව? හේතුව තමයි, 2022 - 2024 වර්ෂවල සිදු වුණු රුපියල්

***** ***පුස්තකාලයේ තබා ඇත.***
* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
* *Placed in the Library.*

[ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා]

මිලියන 2,500ක වංචාවක් පිළිබඳව එතුමා අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවට කළ පැමිණිල්ල. ඒක තමයි එතුමා ඉවත් කරන්න ආසන්නතම හේතුව. අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිෂන් සභාවේ අධ්‍යක්ෂ ජෙනරාල්තුමාගෙන් මම ගෞරවයෙන් ඉල්ලනවා කරුණාකරලා ඒ පිළිබඳව හොයන්න කියලා. එය audit query එකක්. ඒ ගැන හොයන්න වැඩ පිළිවෙළ සකස් කරන්න. සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමාත් ගරු සභාවේ ඉන්නවා. ගරු නියෝජ්‍ය ඇමතිතුමනි, කරුණාකරලා ඒ ගැන හොයන්න. ඒ කාරණය හෙළිදරව් කළාය කියලා තමයි අද වෛද්‍ය බෙල්ලන මහත්මයා එළියට තල්ලු කරලා තිබෙන්නේ. එම නිසා ඒ පිළිබඳව අවශ්‍ය කටයුතු ටික කරන්න කියලා මා ඉල්ලා සිටිනවා.

ඊට අමතරව, මේ වැස්ස අස්සේ, මේ ගංවතුර අස්සේ අද බඩඉරිඟුවලට අදාළව විශාල හොරකමක් සිදු වෙමින් පවතිනවා. බඩඉරිඟු ගෙන්වීමේදී ඉස්සෙල්ලාම බඩඉරිඟු මෙට්‍රික්ටොන් 12,500 බැගින් මෙට්‍රික්ටොන් 37,500ක් ගෙන්වීමට MS White Pearl Mills කියන ආයතනයටත්, WAH Industries Limited කියන ආයතනයටත් -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට වෙන් වූ කාලය අවසන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
නැහැ, තවම විනාඩි 5 අවසන් නැහැ. ඔබතුමා වෙලාව බලන්න.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
හරියටම විනාඩි 5 අවසන්.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
හොඳයි. මට තව එක විනාඩියක් දෙන්න.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, බඩඉරිඟු ගෙන්වීමට එසේ අවසර ලබා දී තිබෙද්දී අද වනකොට එය බෙදා දී තිබෙනවා ආයතන 4කට. Golden Foods Agro (Pvt.) Limited එකට මෙට්‍රික්ටොන් 5,100ක්, MF Feeds (Pvt.) Limited එකට මෙට්‍රික්ටොන් 5,100 වශයෙන් ආයතන හතරකට බෙදා දීලා තිබෙනවා. එම නිසා කඩේ රුපියල් 115කට විකුණු බඩඉරිඟු කිලෝව අද වනකොට විකුණන්නේ රුපියල් 170ට. රුපියල් 70 ගණනේ මෙට්‍රික්ටොන් 20,000ට රුපියල් මිලියන 1,400යි. ඒ අනුව රුපියල් මිලියන 1,400ක හොරකමක් ඒ තුළින් සිදු වෙනවා. මේ ගංවතුර උවදුර අස්සේ බඩඉරිඟු ටිකෙන් ලංකාවේ හොරකමක් සිදු වනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අපේ ගම්වල කුකුළු පාලනයේ යෙදෙන විශාල පිරිසක් ඉන්නවා. ඒ අයටත් බඩඉරිඟු කුඩා ප්‍රමාණයෙන් ගෙන්වන්න ඉඩ දෙන්න. දැන් මේ කරලා තිබෙන්නේ මොකක්ද? බඩඉරිඟු මෙට්‍රික්ටොන් 20,000ක් ගෙන්වන්න කොම්පැනි 4කට අවසර දීලා තිබෙනවා. ඒ සඳහා සාමාන්‍යයෙන් කිලෝවකට වැය වන cost එක රුපියල් 115යි.

රුපියල් 190ට තමයි මේගොල්ලන් මේ ලයිසන් එක විකුණා තිබෙන්නේ. ඒ නිසා අද වෙනකොට රුපියල් මිලියන 1,400ක් කොම්පැනිකාරයෝ හතරදෙනෙක් අතර බෙදිලා තිබෙනවා. ඒ විතරක් නොවෙයි. STC එකයි මේ කොම්පැනියි අතර විතරක් නොවෙයි, කාට මේ මුදල් යනවාද කියන එක ගැන මම අපේ ඇමතිතුමාගෙන් අහන්න කැමැතියි. කරුණාකර, වසන්ත සමරසිංහ මැතිතුමාගෙන් - එතුමා සභාවේ සිටියා - ඒ පිළිබඳ විස්තරයක් මම දැනගන්න කැමැතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ රටේ කුකුළු නිෂ්පාදන සිදු කරන අයට මේ මුදල දෙන්න. මේ කොම්පැනිකාරයන්ට සාක්කු පුරවාගන්න සල්ලි දෙන්න එපාය කියන එකත් මතක් කරමින්, මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා (සෞඛ්‍ය නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி - சுகாதார பிரதி அமைச்சர்)
(The Hon. (Dr.) Hansaka Wijemuni - Deputy Minister of Health)

***නැඟී සිටියේය.***
*எழுந்தார்.*
*rose.*

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු සෞඛ්‍ය නියෝජ්‍ය ඇමතිතුමා.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
මෙහෙමයි, ගරු මන්ත්‍රීතුමා. වෛද්‍ය බෙල්ලන මහත්මයාගේ වැඩ තහනම් කිරීම සිද්ධ වෙන්නේ ඔය කියන දේවල් සම්බන්ධව නොවෙයි. ඔහු රෝගීන්ගේ සංවේදී තොරතුරු පිටතට ලබා දීම සහ ජනතාව නොසන්සුන් වන විධියට සාවද්‍ය ප්‍රකාශ නිකුත් කිරීම සම්බන්ධව complaints දෙකක් තිබුණා. ඒ සම්බන්ධව රාජ්‍ය සේවා කොමිෂන් සභාව දීපු අනුමැතියක් අනුව තමයි ඒක සිද්ධ වෙලා තිබෙන්නේ. එහෙම නැතුව, ඔය කියන දේවල් හා සම්බන්ධ නැහැ.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා, අර එතුමා ඉදිරිපත් කරපු තොරතුරු ටික, - *[බාධා කිරීමක්]* කරුණාකර, මට mike එක දෙන්න විනාඩියකට.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු දයාසිරි ජයසේකර මන්ත්‍රීතුමා.

**ගරු නීතිඥ දයාසිරි ජයසේකර මහතා**
(மாண்புமிகு சட்டத்தரணி தயாசிறி ஜயசேக்கர)
(The Hon. Dayasiri Jayasekara, Attorney-at-Law)
මීට කලිනුත් හිටපු රෝහල් අධ්‍යක්ෂකවරු මේ සම්බන්ධව විවිධ තොරතුරු මාධ්‍යයට දීම කළා, ගරු නියෝජ්‍ය ඇමතිතුමනි. බෙල්ලන මහතා විතරක් නොවෙයි, එහෙම කළේ. ඒ නිසා ඔබතුමාට මම කියන්න කැමැතියි, එතුමාව ඉවත් කර තිබෙන්නේ මේ කාරණය පිළිබඳව නම් ඒකත් වැරැදියි කියලා. මොකද, සංවේදී තොරතුරු විධියට ඕනෑ තරම් තොරතුරු එළියට දමා තිබෙනවා. නමුත් මම විශේෂයෙන් කියනවා, කරුණාකර එතුමා ඉදිරිපත් කර තිබෙන තොරතුරු පිළිබඳව පරීක්ෂණයක් කරන්න කියලා, මේ සිද්ධ වෙලා තිබෙන දේවල් පිළිබඳව.

**ගරු (වෛද්‍ය) හංසක විජේමුණි මහතා**
(மாண்புமிகு (வைத்தியர்) ஹங்சக விஜேமுனி)
(The Hon. (Dr.) Hansaka Wijemuni)
ඒ පිළිබඳව මූලික පරීක්ෂණයක් කර තිබෙනවා. රාජ්‍ය සේවා කොමිෂන් සභාවෙන් තමයි, -

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
Sir, I rise to a point of Order.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, මොකක්ද ඔබතුමාගේ point of Order එක?

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මගේ point of Order එක ස්ථාවර නියෝග 92(2)(අ) යටතේ ඉදිරිපත් කරනවා. මට පැහැදිලිව කියන්න, මේ ස්ථාවර නියෝග පොතේ කොහේද Deputy Minister කෙනෙකුට උත්තර දෙන්න පුළුවන් කියලා තිබෙන්නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, එතුමා ආණ්ඩු පක්ෂයේ වෙලාව අරගෙන තමයි ඒකට උත්තර දුන්නේ.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
ආණ්ඩු පක්ෂයෙන් එහෙම වෙලාව ගන්න පුළුවන්ද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
මීළඟට, ගරු සුරංග රත්නායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.11]

**ගරු සුරංග රත්නායක මහතා**
(மாண்புமிகு சுரங்க ரத்நாயக்க)
(The Hon. Suranga Rathnayaka)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විශේෂයෙන්ම "දිට්වා" සුළි කුණාටුව නිසා විපතට පත්, ඒ වාගේම තමන්ගේ දේපළ අහිමි වුණු මේ රටේ සියලුම ජනතාවට; ඒ පවුල්වලට මේ අවස්ථාවේදී අපේ විශේෂ කනගාටුව ප්‍රකාශ කරනවා. "දිට්වා" සුළි කුණාටුව වෙලාවේ මේ රටේ දිස්ත්‍රික් ලේකම්වරුන්, ප්‍රාදේශීය ලේකම්වරුන් විශේෂ කාර්යභාරයක් ඉටු කළා. ඒ වාගේම මේ රටේ ග්‍රාම නිලධාරිවරුන් විශාලම කාර්යභාරයක් ඉටු කළා. මේ සුළි කුණාටුවෙන් ජනතාව ආපදාවට ලක් වුණු මොහොතේ පටන්ම ඒ ජනතාව රැකබලා ගනිමින් ඔවුන් කරපු ඒ විශාල කාර්යභාරයට විපක්ෂයේ මන්ත්‍රීවරයකු විධියට මා ඒ නිලධාරින්ට ස්තුතිවන්ත වෙන්න ඕනෑ. ඒ වාගේම මේ ව්‍යසනය වෙලාවේදී විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට අපි විශාල කාර්යභාරයක් මේ ජනතාව අතරට ගිහින් කළා. විශේෂයෙන් ගත්තොත්, මගේ අනෙක් පැත්තේ අසුනේ සිටින ගරු ජගත් විතාන මන්ත්‍රීතුමා කළුතරින් 400ක පමණ පිරිසක් අරගෙන තඹුත්තේගමට ඇවිල්ලා ගෙවල් සුද්ධ කරලා, ළිං ටික සුද්ධ කරලා ජනතාවට ඉන්න පුළුවන් විධියට අවස්ථාව සලසා දුන්නා. හැබැයි, මේ අපේ රජයේ ඇමතිවරයා අහනවා තඹුත්තේගම කොහේද යට වුණේ කියලා. එතුමාට මම මතක් කරන්න ඕනෑ -එතුමා මෙතැන ඉඳලා ගියා- තඹුත්තේගම අම්බලන්ගල, සියඹලාගස්වැව ප්‍රදේශ යට වුණ බව. එතුමා දන්නෙත් නැහැ තඹුත්තේගම කොහේද යට වුණේ කියලා. ඒ නිසා ඒකත් එතුමාට මතක් කර දෙන්න ඕනෑ. විපක්ෂයේ මන්ත්‍රීවරු විධියට අපි අපේ ජනතාව වෙනුවෙන් අපේ මුදලින් කරන්න පුළුවන් සෑම සත්කාර්යයක්ම කර තිබෙනවා.

අපි දැක්කා, අද ලාල් කාන්ත ඇමතිවරයා කියනවා, මේ වාගේ ව්‍යසන වෙලාවලදී විපක්ෂය ක්‍රියා කරන්න ඕනෑ ආකාරය පිළිබඳව එතුමන්ලාගෙන් ඉගෙන ගන්න කියලා. මම කියනවා, ව්‍යසන වෙලාවලදී ක්‍රියා කරන්න ඕනෑ ආකාරය ඔබතුමන්ලාගෙන් ඉගෙන ගත්තා නම්,- අර ආර්ථික අර්බුදය ආපු වෙලාවේ මේ රටට ඩොලර් ටික එවන්න එපා කියලා ඒ අර්බුදය තව තවත් දිග් ගස්සපු, පාර්ලිමේන්තුවට ගිනි තියන්න කියලා ආපු ඒ විපක්ෂයේ කාර්යභාරය නොවෙයි සමගි ජන බලවේගයේ විපක්ෂයේ කාර්යභාරය කියලා විශේෂයෙන් මම මතක් කරන්න ඕනෑ. සමහර මන්ත්‍රීවරු කිව්වා, අපි පාට, පක්ෂ බලාගෙන ගිහින් බඩු බෙදුවා කියලා. අපි කිසිම පාටක්, පක්ෂයක් බලන්නේ නැතිව ඒ අදාළ තුලානට ගිහිල්ලා, ග්‍රාම නිලධාරි මහත්වරු මුණගැහිලා, ඔවුන්ගෙන් ලැයිස්තු අරගෙන අවතැන් කඳවුරුවලට එන්න කියලා කිසිම පාට, පක්ෂ භේදයකින් තොරව තමයි ඒ ජනතාවට සහන දෙන්නට කටයුතු කළේ කියන කාරණයත් ඔබ සියලු දෙනාටම මතක් කරන්නට ඕනෑ. ඒ අනුව, අපි විපක්ෂයේ කාර්යභාරය හරියට කරලා තිබෙනවා. පසුගිය අවුරුදු 30 තුළ සිදු වුණු ව්‍යසනවලදී ඔබතුමන්ලාගේ විපක්ෂයේ කාර්යභාරය පොඩ්ඩක් මතක් කර ගන්න කියලාත් මම කියන්න කැමැතියි.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුව - Department of Meteorology - 17වෙනි දා සවස 2.00ට රැස්වීමක් කැඳවලා කාලගුණ තොරතුරු පිළිබඳ සමාලෝචනයක් කළා. නැවත වතාවක් 18වෙනි දා Water Panel එක රැස් වුණා. ඊට පස්සේ 20වෙනි දා නැවත Department of Meteorology සහ DMC එකේ කට්ටිය රැස්වෙලා ඒ පිළිබඳව සාකච්ඡාවක් කළා. නැවත 24වෙනි දා ඒ සාකච්ඡාව කළා. හැබැයි 24වෙනි දා සාකච්ඡාවෙන් පස්සේ, Department of Meteorologyහි සහ DMC එකේ නිලධාරින්ගේ සාකච්ඡාවෙන් පස්සේ Water Panel එකේ Secretary වර්ෂාව ලැබෙයි කියන උපකල්පනය මත ඒ ජලාශ භාරව ඉන්න ඉංජිනේරුවරු සියලුදෙනාටම forecast එකක් දුන්නා, ජලාශවල ජල මට්ටම මේ ආකාරයට ඉහළ යන්න පුළුවන් කියලා. ඒ forecast එක එතුමා වාරිමාර්ග ඉංජිනේරුවරුන්ට සහ ඒ WhatsApp group එකට දැම්මා. ඒ WhatsApp group එකේ වාරිමාර්ග ඇමතිවරයා සහ කෘෂිකර්ම ඇමතිවරයාත් ඉන්නවා. හැබැයි කනගාටුවට කාරණය තමයි, ඒ කට්ටිය ඒකට කිසිම සංවේදීතාවක් දැක්වූයේ නැති එක. මේ අය ඒ පිළිබඳව alertව ඉඳලා සංවේදී වෙලා කටයුතු කළා නම් මහවැලි කලාපයේ උතුරපු ජලාශවලින් වුණු විනාශයෙන් සියයට 75ක් නතර කර ගන්න තිබුණා. අද අපි කියනවා, ඒ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් කරන්න කියලා. එක පරීක්ෂණයක්, අමාත්‍යාංශ මට්ටමින් කරන්න. ඒ වාගේම පාර්ලිමේන්තුවේ විශේෂ කාරක සභාවක් පත් කරලා ඇත්තටම 24වෙනි දා කාර්යභාරය ගැන සොයන්න.

[ගරු සුරංග රත්නායක මහතා]

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, Water Panel එකේ ජල කළමනාකරණ ලේකම්තුමා දාපු තොරතුරු ටික, එම පුරෝකථනයන් මම **සභාගත*** කරනවා.

ඔබතුමන්ලා සොයා බලන්න, ඒ පුරෝකථනවලට අදාළව alertව ඉඳලා ඒ වැඩේ කළේ නැහැ. එදා තොරතුරු දීලාත් පාස්කු ප්‍රහාරය වළක්වා ගත්තේ නැහැ වාගේ එකක් තමයි මේකත්. ආණ්ඩු පක්ෂයේ සංවිධායකතුමා කියනවා මම දැක්කා, මේ බුද්ධි තොරතුරු නොවෙයි කියලා. මම කියන්න කැමැතියි, කාලගුණ විද්‍යා දෙපාර්තමේන්තුවෙන් බුද්ධි තොරතුරු දෙන්නේ නැහැ, ඒ අය දෙන්නේ කාලගුණය පිළිබඳ පුරෝකථන බව. හැබැයි, ඒ පුරෝකථන ලැබිලා තිබියදීත් ආපදාව වළක්වා ගන්නට, ඒ පිළිබඳව අවශ්‍ය මැදිහත්වීම කරන්නට ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය අවශ්‍ය කටයුතු කළේ නැහැ. ජනාධිපතිවරයා 26වෙනි දාත් ආපදාව පිළිබඳව කිසිම සූදානමක් නැතිව කලාකාරයන් හෝ වෙනත් කණ්ඩායමක් සමඟ සාකච්ඡාවක් කළා. ඒ නිසා අපි මේ පිළිබඳව විධිමත් පරීක්ෂණයක් බලාපොරොත්තු වෙනවා.

මේ ව්‍යසනය නිසා මරණයට පත් වුණු අයගේ පවුල්වලින්, තමන්ගේ දේපොළ නැති වුණු, විවිධ අඩන්තේට්ටම්වලට සහ අපහසුතාවලට පත් වුණු ජනතාවගෙන් මේ ආණ්ඩුව සමාව ගන්න ඕනෑ, ඒක හරියට කළමනාකරණය කළේ නැති එක ගැන. ජනාධිපතිතුමා ව්‍යසනය වුණාට පස්සේ ඇවිල්ලා පැය 24ම නිදි වරාගෙන වැඩ කළත් වැඩක් නැහැ, ඊට කලිනුයි ඒක කළමනාකරණය කර ගන්න තිබුණේ. ඒ වාගේම ජනාධිපතිතුමාගේ ප්‍රකාශ පිළිබඳව අද මේ රටේ ජනතාවට තිබුණු විශ්වාසය නැති වෙලා ගිහින් තිබෙනවා. එතුමා එක වෙලාවක පාර්ලිමේන්තුවට ඇවිල්ලා කියනවා, ටකරමක් ගියත් අපි ලක්ෂ 10ක් දෙනවා කියලා. ඒ කියලා දිස්ත්‍රික් ලේකම් කාර්යාලයට ඇවිල්ලා කියනවා, නැහැ එහෙම නොවෙයි, ඒක පියවරෙන් පියවර තමයි දෙන්නේ කියලා. කටින් බතල හිටවන්න පුළුවන් ඕනෑම කෙනෙකුට. හැබැයි බිමේ වැඩ කරද්දී ඇත්ත තත්ත්වය තේරුම් අරගෙන වැඩ කරන්න කියන කාරණය ඔබතුමන්ලාට මතක් කරන්න කැමැතියි.

මේ විපතෙන් පස්සේ එක අම්මා කෙනෙක් නාය ගිය ස්ථානයට දවසකට 30 වාරයක් ගිහින් බලලා තිබෙනවා, එතැන තමන්ගේ දුවගේ මිනිය තිබෙනවාද කියලා. එහෙම ශෝකයට පත් වෙලා ඉන්න ජනතාවගේ බිඳුණු හදවත් සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා කිව්වා වාගේ පස් දාලා කොටලා වහන්න බැහැ. ඒ ජනතාවගේ හදවත් තුළ ඒ වේදනාව තවදුරටත් තිබෙනවා. ඔබතුමන්ලා ආණ්ඩු බලය ගත්තේ මුහුදු වතුරෙන් සල්ෆියුරික් අම්ලය හදන්න. මාළු ඉන්න තැන කියලා SMS එක යවන්න. ඊට කලින්, ආපදා කළමනාකරණයට හරි යන්ත්‍රණයක් හදන්න කියන ඉල්ලීම කරමින් මගේ කථාව අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු එම්.ඒ.එම්. තාහිර් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් තිබෙනවා.

---

** පුස්තකාලයේ තබා ඇත.*
** நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*
** Placed in the Library.*

[பி.ப. 3.18]

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இந்த நாட்டிலே ஏற்பட்ட அனர்த்தத்தின்போது பாதிக்கப்பட்ட மக்களுக்காக எல்லோரும் ஒன்றிணைந்து செயற்பட வேண்டும் என்ற அடிப்படையிலே இன்று அவசரமாக இந்தப் பாராளுமன்றம் கூட்டப்பட்டிருக்கின்ற நிலையில், எனக்கும் பேசுவதற்குச் சந்தர்ப்பம் அளித்தமைக்கு நன்றி கூறிக்கொள்கின்றேன்.

இந்த நாட்டிலே மிகவும் சந்தோசமாகவும் கண்ணியமான முறையிலும் வாழ்ந்த மக்களின் நிலைமை ஓர் இரவோடு மாறி, அடுத்த நாள் காலையிலே செய்வதறியாமல் திகைத்து நிற்கக்கூடிய ஒரு சூழல் அண்மையிலே ஏற்பட்டது. அந்தக் கள நிலவரங்களின்போது இந்த நாட்டினுடைய சனாதிபதியாக இருக்கலாம் அல்லது அரச இயந்திரமாக இருக்கலாம், எல்லோரும் ஓடோடிச் சென்று மிக வேகமாகச் சுழன்று, இந்த நாட்டினுடைய மக்களைப் பாதுகாப்பதற்குப் பணிபுரிந்தார்கள். இந்த நாட்டிலே மிக அண்மித்த காலமாக இன ரீதியான பல பாகுபாடுகள், வேறுபாடுகள் இடம்பெற்றிருந்தன. ஆனால், இந்த அனர்த்தம் என்பது இந்நாட்டு மக்கள் அந்த நிலைமையிலிருந்து விடுபட்டு, ஒன்றிணைவதற்கும் - ஒன்றுபடுவதற்கும் - இன, மத வேறுபாடுகள் இல்லாமல் சகோதரர்களாக ஒற்றுமையோடு பயணிப்பதற்குமான ஒரு வாய்ப்பை ஏற்படுத்தியிருக்கின்றது. பல வெளிநாடுகளும் இந்த நாட்டு மக்களைப் பாதுகாப்பதற்கு ஓடோடி முன்வந்தன. எனவே, இந்தச் சந்தர்ப்பத்திலே ஒட்டுமொத்தமாக அத்தனை உள்ளங்களுக்கும் நன்றி கூறிக்கொள்வதோடு, இந்த அனர்த்தத்தால் பாதிக்கப்பட்டு உயிரிழந்த, சொத்துக்களை, உடைமைகளை இழந்த, அத்தனை மக்களுக்கும் எனது கவலையையும் ஆழ்ந்த அனுதாபத்தையும் இச்சந்தர்ப்பத்திலே நான் தெரிவித்துக் கொள்கின்றேன்.

இந்த நாட்டினுடைய சனாதிபதியவர்கள் மக்களைக் கட்டுப்படுத்துகின்ற ஒரு வித்தையைக் கற்றுக் கொண்டிருக்கின்றார் என்று நினைக்கின்றேன். அவர் தேர்தல் காலங்களிலே இந்த மக்களை எவ்வாறு வசப்படுத்தலாம் என்ற வித்தையோடு, கஷ்டத்திலே இருக்கின்ற மக்களுக்கு எவ்வாறு உதவ முடியும் என்ற அடிப்படையில், தான் முன்வந்து அவர்களுடைய துயரைத் துடைக்கவிருப்பதாகப் பல விடயங்களை முன்வைத்தார்கள். அந்த வகையில், "நடைமுறைக்கு ஏற்ற வகையிலே ஒவ்வொரு கட்டங்களாக நாங்கள் மக்களுக்கான பணத்தை வழங்கப் போகின்றோம்; அவர்களுக்கான வீடுகளை, காணிகளை ஏனைய வசதிகளைச் செய்யப் போகின்றோம்" என்று கூறியதும், பாதிக்கப்பட்டிருந்த, கஷ்டத்திலே இருந்த அந்த மக்கள் அதனை ஆறுதலான வார்த்தையாகவும், நம்பிக்கையாகவும் ஏற்றுக்கொண்டு, இந்த நாட்டினுடைய சனாதிபதி, அரச இயந்திரம் அவற்றையெல்லாம் தரும் என்ற ஓர் ஏக்கத்தோடு இன்றுவரைக்கும் காத்துக் கொண்டிருக்கின்றார்கள். ஆனால், அது ஓர் ஏமாற்றமாகிவிடுமா? என்கின்ற ஓர் அச்சம் இன்று எல்லோரிடத்திலும் ஏற்பட்டுக்கொண்டிருக்கின்றது. காரணம், இந்த அனர்த்தத்தினால் பாதிக்கப்பட்டவர்களுக்கு அவர்களின் வீடுகளைக் கழுவித் துப்புரவு செய்வதற்கு முதற்கட்டமாக வழங்கப்படுமெனக் கூறப்பட்ட 25,000 ரூபாய் நிதிகூட இன்று எல்லோருக்கும் போய்ச் சென்றடையாமல் இருக்கின்றது.

அவ்வாறான ஒரு சூழலிலே, இந்த அரசினுடைய ஏனைய திட்டங்கள், மாண்புமிகு சனாதிபதியவர்கள் வாக்களித்த விடயங்கள் மக்களைப் போய்ச் சேருமா? என்பதிலே ஐயமிருக்கின்றது. அரச நிறுவனங்கள் - அது பிரதேச செயலகங்களாக இருக்கலாம் அல்லது மாவட்டக் காரியாலயங்களாக இருக்கலாம் - அந்த மக்களிடத்திலே நடந்துகொள்கின்ற முறை, அந்த மக்களுக்கான பணிகளைச் செய்கின்ற விதம் எங்களுக்கு அந்தச் சந்தேகத்தை ஏற்படுத்துகின்றது.

தேர்தலின்போது சனாதிபதி அவர்கள் ஏற்கனவே கூறிய அந்த வார்த்தைகளை நம்பி மக்கள் அவருக்கு வாக்களித்திருந்தார்கள். இப்போதும் சனாதிபதியவர்களின் வார்த்தையை நம்பி அமைதியாக இருக்கின்றார்கள். கடந்த அரගළය வின்போது எவ்வாறு மக்கள் கிளர்ந்தெழுந்தார்கள் என்று உங்களுக்கு நன்றாகத் தெரியும்! எனவே, பாதிப்பில்லாத வரையில் அந்த அமைதி என்பது ஒரு வகையான அமைதியாக இருக்கலாம்! ஆனால், இன்று இந்த அனர்த்தத்தினால் இலட்சக்கணக்கான மக்கள் பாதிப்புற்றிருக்கின்றார்கள்; அதேநேரம் சகோதரத்துவமாக ஒற்றுமைப்பட்டிருக்கின்றார்கள். எனவே, இந்த ஒற்றுமையைச் சீர்குலைக்காத வகையில் அரசாங்கத்தின் நடவடிக்கைகள் அமைய வேண்டும். மிக நீண்ட காலமாக இந்த மக்கள் மிகவும் சந்தோசமாக வாழ்ந்த, ஓடித் திரிந்த, வர்த்தகம் செய்த இடங்கள் எல்லாம் இன்று பாதிக்கப்பட்டிருக்கின்றது. அவர்களுடைய அந்த இடங்களை மீண்டும் இயல்பு நிலைக்குக் கொண்டுவருவதற்கு, மானசீகமாக, கண்ணியமான முறையிலே, அவர்களிடத்திலே ஆறுதலான வார்த்தைகளைக் கூறி, ஜனாதிபதி அவர்களால் முன்மொழியப்பட்ட திட்டங்களை அந்த மக்களிடத்தில் சேர்ப்பதற்குரிய வகையில் அரசாங்க உத்தியோகத்தர்களைத் தயார்ப்படுத்த வேண்டுமென்று இச்சந்தர்ப்பத்திலே கேட்டுக் கொள்கின்றேன்.

இந்த நாட்டிலே குறிப்பாக மத்திய மாகாணத்திலே மழையின் காரணமாக மண்சரிவு, வெள்ள அனர்த்தம் அதிகமாக ஏற்பட்டிருந்தபோதிலும் வட, கிழக்குப் பிரதேசங்களிலும் வெள்ளத்தினால் கூடுதலான பாதிப்புகள் ஏற்பட்டுள்ளன. எனவே, அங்கே பாதிக்கப்பட்ட மக்களுக்கு -

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන්.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩියක් දෙන්න.

குறிப்பாக வட, கிழக்கிலே இருக்கின்ற மீனவ சமூகத்தினர், விவசாயிகள் இந்த இடர் காலத்திலே அரசினுடைய ஏதாவது நிவாரணங்களையாவது பெற்றுக்கொள்ளலாமென எதிர்பார்த்துக் கொண்டிருக்கிறார்கள். மீனவர்களால் கடலுக்குச் செல்ல முடியாதிருந்தது. ஏனையவர்கள் தூர இடங்களுக்குச் சென்று அவரவர்களுடைய தொழில்களைச் செய்வதற்குப் பாதைகள் மற்றும் ஏனைய விடயங்கள் தடையாக இருந்தது. பள்ளமான பிரதேசங்களிலே வாழ்ந்த மக்களினுடைய சாதாரண வாழ்வு நிலை மாற்றப்பட்டிருக்கின்றது. இவற்றையெல்லாம் கவனத்திலே கொள்ளுமாறு கேட்டுக் கொள்கின்றேன்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, කථාව අවසන් කරන්න.

**ගරු එම්.ඒ.එම්. තාහිර් මහතා**
(மாண்புமிகு எம்.ஏ.எம். தாஹிர்)
(The Hon. M.A.M. Thahir)
මට විනාඩියක් දෙන්න.

தற்போது நாட்டிலேயுள்ள மருந்தகங்களில் மீண்டும் போலியான மருந்துகள் கொண்டுவரப்பட்டு, திரும்பவும் அந்தப் பிரச்சினை வந்திருக்கின்றது. இவ்வாறான ஒரு சூழ்நிலையில், மக்கள் நம்பிக்கையுடன் சென்று தங்களுடைய மருந்துகளைப் பெறுவதற்காக ஏற்பாடு செய்யப்பட்டிருக்கின்ற 'ஒசுசல' என்ற அரச மருந்தகங்களில்கூட இன்று மருந்துத் தட்டுப்பாடு நிலவுகின்றது. இவ்வாறிருக்கும்போது, நிந்தவூரில் இருக்கின்ற 'ஒசுசல' கிளையை மூடிவிட்டு, அதனை வேறொரு பிரதேசத்திற்குக் கொண்டுசெல்வதற்கான நடவடிக்கைகள் இடம்பெறுகின்றன. அந்தப் பிரதேசத்திலேயிருக்கின்ற மக்கள் அங்கே மருந்துகளைக் கொள்வனவு செய்வதில்லையென்றும் அக்கட்டிடத்திற்கான வாடகை கூடுதலாக இருக்கின்றது என்றும் அங்கு பல மோசடிகள் நடைபெற்றிருக்கின்றன என்றும் காரணங்கள் கூறப்பட்டு அந்த மருந்தகத்தை மூடுவதற்கு ஏற்பாடு செய்யப்பட்டுள்ளது. ஆனால், உண்மையான காரணம் என்னவென்றால், அந்த 'ஒசுசல'விலே மக்களுக்கு வழங்கக்கூடிய வகையிலே மருந்துகள் இல்லை என்பதுதான். அங்கு மருந்துகள் இருந்தால் ஏன் மக்கள் போய் வாங்கமுடியாமல் இருக்கின்றது? அங்கேயிருக்கின்ற தனியார் மருந்தகங்களில் இருக்கின்ற மருந்துகள்கூட அங்கு இல்லாமல் இருக்கின்றது.

எனவே, இந்த விடயத்தைக் கவனத்திற்கொண்டு, அதனுடன் தொடர்புடைய ஏனைய விடயங்களையும் ஆராய்ந்து, குறித்த 'ஒசுசல' கிளையை வேறிடத்திற்கு மாற்றுவதற்கான நடவடிக்கையை நிறுத்தி, தொடர்ந்தும் அதனை அங்கு இயங்கச் செய்வதற்கான நடவடிக்கையை மேற்கொள்ள வேண்டும். அதன்மூலமாக அந்தப் பிரதேசத்திலேயிருக்கின்ற இலட்சக்கணக்கான மக்கள் தங்களுக்குத் தேவையான மருந்தைக் குறைந்த விலையிலே பெற்றுக் கொள்வதற்கான வாய்ப்பை ஏற்படுத்திக் கொடுக்க வேண்டும் என்று கேட்டு, எனது உரையை முடித்துக் கொள்கின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) අනිල් ජයන්ත ඇමතිතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 3.26]

**ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා (කම්කරු අමාත්‍ය සහ මුදල් සහ ක්‍රමසම්පාදන නියෝජ්‍ය අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) அனில் ஜயந்த - தொழில் அமைச்சரும் நிதி, திட்டமிடல் பிரதி அமைச்சரும்)
(The Hon. (Dr.) Anil Jayantha - Minister of Labour and Deputy Minister of Finance and Planning)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද දින විවාදයට ගැනෙන පරිපූරක ඇස්තමේන්තුව සම්බන්ධයෙන් කථා කිරීමේදී මම කියන්න ඕනෑ, ඒ තුළින් 2026 වර්ෂය වෙනුවෙන් රුපියල් බිලියන

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

500ක මුදල් ප්‍රතිපාදනයක් වෙන් කර තිබෙන බව. විශේෂයෙන්ම මේ ආපදාවෙන් විවිධ අලාභ හානි සිදු වුණු පුද්ගලයින් සඳහා සහන සැලසීමටත්, ඒ වාගේම ශ්‍රී ලංකාව නැවත ගොඩනැඟීමේ වැඩ පිළිවෙළ සඳහා කටයුතු කිරීමේදීත් රාජ්‍ය මූල්‍ය කළමනාකරණය හා රාජ්‍ය මූල්‍ය විනය නිසි පරිදි ඒ සඳහා වූ නීති රාමුව ඇතුළේ ක්‍රියාත්මක කරමින් අපි ඒ සඳහා මැදිහත් වුණේ කොහොමද කියන කාරණය මේ අවස්ථාවේදී මම සඳහන් කරන්නට ඕනෑ.

2026 වර්ෂයට අදාළ අය වැය අපි දෙසැම්බර් 05වැනි දා සම්මත කර ගත්තා. 2025 වර්ෂයේදී මේ ඇති වූ ආපදා තත්ත්වය නිසා, අපට ක්ෂණිකව මැදිහත් වෙලා අවශ්‍ය සහන ලබා දෙන්න සිද්ධ වුණා. මේ ආපදාව හේතුවෙන් අවතැන් වූ ජනතාවට ආහාර ලබා දීම, ඒ වාගේම ආපදා තත්ත්වය නිසා හානියට පත් වූ ගෙවල්වලට නැවත පදිංචිය සඳහා යෑමට ඒ ගෙවල් පිරිසිදු කර ගැනීම සඳහා රුපියල් 25,000ක මුදලක් ලබා දීම වැනි මූලික වැඩ කටයුතු සඳහාත්, වියළි ආහාර ද්‍රව්‍ය ලබා දීම වැනි ක්ෂණික මැදිහත්වීම් සඳහාත්, ඉදිරි පුනරුත්ථාපන වැඩසටහන් වෙනුවෙනුත් අපි 2025 වර්ෂයට රුපියල් බිලියන 50ක අතිරේක මුදලක් වෙන් කර ගත්තා.

හැබැයි පරිපූරක ඇස්තමේන්තු පිළිබඳව අපි අහලා තිබෙන කථා අනුව හැමදාම තිබුණේ, ආණ්ඩු විසින් හදිසි අවශ්‍යතා කියලා ඔවුන්ගේ අභිමතය පරිදි - discretion එක අනුව - මුදල් වියදම් කරපු අතීතයක්. නමුත්, අපි 2025 වර්ෂය සඳහා රුපියල් බිලියන 50ක් අතිරේකව වෙන් කර ගැනීමේදී, 2025 ඇස්තමේන්තු කරන ලද සමස්ත වියදම කිසිදු ආකාරයකින් වැඩි කර ගන්නේ නැතිවයි ඒ දේ කළේ. ඒ වාගේම රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව ආණ්ඩුවේ ප්‍රාථමික වියදම් දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ක ප්‍රතිශතයක් නොඉක්මවිය යුතුයි. ඒ සියයට 13ක සීමාව ඇතුළේ ඉඳගෙන තමයි අපි මේ කටයුත්ත කළේ. ඇත්තටම අපට මේ ආපදා තත්ත්වය නිසා අවතැන් වූ ජනතාවට සහන සැලසීම සඳහා 2025 වර්ෂයේ දෙසැම්බර් මාසය අවසන් වනකොට රුපියල් බිලියන 75ක වාගේ අවශ්‍යතාවක් තිබුණා. ඒ සඳහා දැනටමත් රුපියල් බිලියන 3ක වාගේ ප්‍රමාණයක් වෙන් කර තිබෙනවා. අපි අය වැයක් තුළින් "අය වැය සංචිත" කියලා කොටසක් අමතරව වෙන් කරනවා. ඒ අය වැය සංචිතවලින් රුපියල් බිලියන 22ක් ඉතිරි වෙලා තිබුණා. ඒ අනුව අවශ්‍ය කරන රුපියල් බිලියන 75න් රුපියල් බිලියන 25ක් දැනටමත් වෙන් කර තිබෙන මුදල්වලින් සම්පාදනය කර ගත්තා. ඊට අමතරව තමයි, වෙනත් වැය ශීර්ෂවලින් මාරු කිරීම් හරහා රුපියල් බිලියන 50ක් වෙන් කර ගත්තේ. මට කියන්න ඕනෑකම තිබුණේ, 2025 වර්ෂය සඳහා කිසිදු ආකාරයකින් අතිරේක මුදල් වැඩි කිරීමකින් තොරව, ණය ගැනීමකින් තොරව, කිසිදු බදු වැඩි කිරීමකින් තොරව තමයි ඒ රුපියල් බිලියන 50 අපි වෙන් කර ගත්තේ කියන කාරණය.

අපි කථා කරන ප්‍රධාන මාතෘකාව තමයි, 2026 වර්ෂය සඳහා මේ රුපියල් බිලියන 500ක මුදල අපි වෙන් කරන්නේ කොහොමද කියන එක. මේක හදිසි ආපදා තත්ත්වයක්. දැනටමත් අපි ප්‍රාථමික වියදම් සඳහා රුපියල් බිලියන 4,485ක් වෙන් කරලා තිබෙනවා. ඒ, දළ දේශීය නිෂ්පාදිතයෙන් සියයට 13ක සීමාව ඇතුළේ. එහෙමනම් සාමාන්‍ය තත්ත්වය යටතේ මේ රුපියල් බිලියන 500ක වියදම කළමනාකරණය කරන්න බැහැ, ඒකට අතිරේක වියදමක් අවශ්‍ය වනවා. අන්න ඒ අතිරේක වියදම තමයි, 2026 වර්ෂය සඳහා අපි එකතු කරන්නේ. 2026 වර්ෂය සඳහා මේ රුපියල් බිලියන 500 එකතු කිරීම නිසා, ප්‍රාථමික වියදම දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට සියයට 1.4කින් ඉහළ යනවා. හැබැයි, ඒ වැඩි කිරීම අපි නීතිය නවලා, නීතිය කඩලා, නීතියට පටහැනිව කරන්නේ නැහැ. අපි එය කරන්නේත්, රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුවයි. එහි 16වන වගන්තියේ ඉතා පැහැදිලිව තිබෙනවා, මෙවැනි ස්වාභාවික අනතුරක්, ආපදා තත්ත්වයක්, හදිසි තත්ත්වයක් ඇති වූ අවස්ථාවකදී ඒ පිළිබඳව පැහැදිලි කරලා ඒ සඳහා මුදල් වෙන් කර ගැනීම කරන්න පුළුවන් කියලා.

ඒ මුදල් වෙන් කර ගැනීම සිදු කිරීමේදී අනුගමනය කරන ක්‍රමවේදයක් තිබෙනවා. ඒ සඳහා අදාළ ඇස්තමේන්තු සකස් කිරීමේ තොරතුරු ඉදිරිපත් කිරීම, පාර්ලිමේන්තුවට ඉදිරිපත් කරලා මේ අවසරය ලබා ගැනීම කියන සියලු ක්‍රියාකාරකම් සිදු කරලා තමයි මේ රුපියල් බිලියන 500 අපි වෙන් කර ගන්නේ. ඒ එක්කම මේ අතිරේක රුපියල් බිලියන 500 වෙන් කරන්න කොහෙන්ද මුදල් හොයා ගන්නේ? ඒ සඳහා අලුතින් බදු පනවනවාද එහෙම නැත්නම් ණයට ගන්නවාද කියන ප්‍රශ්නය සමහර විට මතු වෙන්න පුළුවන්.

ඒ කිසිවක් අපි කරන්නේ නැහැ. අපේ නිවැරදි මුදල් කළමනාකරණය නිසා අපට හැකියාව ලැබුණා, 2025දී ප්‍රාථමික ශේෂය අපේක්ෂිත අගයට වඩා වැඩි අගයකින් පවත්වා ගන්න. සියයට 2.3ට තිබුණු ඉලක්කය වෙනුවට සියයට 3.8ක ඉලක්කයකට අපට යන්න පුළුවන් වුණා. ඒ නිසා අපේ දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට වැඩිපුර තිබුණු සියයට 1.5න්, සියයට 1.4ක් මේ වෙනුවෙන් භාවිත කරලා තමයි, 2026 මේ පරිපූරක ඇස්තමේන්තුව සඳහා අවශ්‍ය මුදල් සම්පාදනය කර ගත්තේ, මේ අතිරික්ත මුදල් ශේෂයෙන්. අපේ cash buffer එක මේ සඳහා පාවිච්චි කරනවා. ඒ නිසා කිසිදු ගැටලුවක් ඇති කර ගන්න අවශ්‍ය වන්නේ නැහැ. සැලසුම් කළ පරිදිම අපි ඉදිරිපත් කර දෙන මේ මුදල් වියදම් කරන්න පුළුවන්. ඒ, ආපදා තත්ත්වය හමුවේ පැන නඟින ප්‍රායෝගික කරුණු වෙනුවෙන් වියදම් කිරීමේ යම්කිසි කාල සීමාවක් ඇතුළේ - අපි මේ මුදල් එකවර මාසයෙන්, දෙකෙන් වියදම් කරලා අවසාන කරන්නේ නැහැ - එහෙම කිරීමේ අවශ්‍යතාවක් එන්නේ නැහැ. හැබැයි, විශේෂයෙන්ම විපක්ෂයෙන් අදහස් මතු කරනවා, අපි එකතු වෙලා මේ වෙනුවෙන් උදවු කරන්නම්, වැඩ කරන්නම් කියලා. ඒ වාගේම මේ වැඩ පිළිවෙළ ඇතුළේ මේක කරන්න බැහැ කියන සැකයත්, භයත් නිර්මාණය කිරීම මම හිතන්නේ යම් ආකාරයකට වැරදි ක්‍රියාවක්. ජනාධිපතිතුමා අදහස් දැක්වීමේදී "අනේ, please!" කියලා ඇත්තටම සඳහන් කළේ, අපිත් එක්ක එකතු වෙලා වැඩ කරන්න එන්න එපා කියන එක නොවෙයි. එකට එකතු වෙලා රට ගොඩගන්න හදන අවස්ථාවේදී සමහරු කකුලෙන් අදිනවා. විශේෂයෙන්ම මිනිස්සු අතර සැකය, අවිශ්වාසය ගොඩනැඟීමට වැඩ කිරීම වෙනුවෙන් එවැනි දේවල් නම් කරන්න එපා කියන අදහස තමයි එතුමා ඒ මතු කළේ.

ඒ වාගේම තව අදහසක් මතු කළා, අපි කළමනාකරණය කළේ නැහැ වාගේ විවිධාකාරයේ චෝදනා. ඒවාට උත්තර දෙනවා වෙනුවට අපි මොකක්ද කළේ? ඉක්මනින් අපි ඒ සඳහා මැදිහත් වෙලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගත්තා. ඒ අනුව ආපු එක් චෝදනාවක් පිළිබඳව මම කරුණු ඉදිරිපත් කරන්න කැමැතියි. ව්‍යසනයකදී, ස්වභාවික විපත්වලදී රක්ෂණය කරලා තිබුණේ නැහැ, කලින් අපි රක්ෂණය කරලා තිබුණා, ඒ අනුව මේකට මුහුණ දෙන්න පුළුවන් වුණා කියලා කියා තිබෙනවා. මම ඉදිරිපත් කරන්නම්, ඒගොල්ලන් කියන රක්ෂණයෙන් ඇත්තටම ආණ්ඩුවට මොකක්ද වුණේ කියලා.

2016දී රක්ෂණ ක්‍රමයක් පටන් ගත්තා. රක්ෂණයක් කරනවා නම් තොරතුරු හොයලා විධිමත් විධියට ඒක කරන්න ඕනෑ. මොකද, ඒක හාරදූර කාර්යයක්. නැත්නම් මේවායේ ගැටලු පැන නඟින්න පුළුවන්. මේ තිබෙන්නේත්, ඒගොල්ලන්ගේ

අවිධිමත්භාවයේම මූල්‍ය විනයේ ගැටලුවක් තමයි. 2016දී මේ රක්ෂණය අරගෙන තිබෙනවා. ඊට පස්සේ 2016දී යම් ප්‍රතිපූරණයක් කරලා වන්දි ලැබිලා තිබෙනවා. 2017, 2018, 2019 වෙනකොට ජාතික රක්ෂණ භාර අරමුදල් කණ්ඩායම විශ්ලේෂණය කරලා කියා තිබෙනවා, මේකෙන් රාජ්‍යයට විශාල පාඩුවක් සිදු වෙනවා කියලා. ඒ පාඩුව සිදු වෙන්නේ කොහොමද? 2016 ඉඳලා 2019 වෙනකම් ආණ්ඩුව විසින් මේ රක්ෂණ භාර අරමුදලට රුපියල් බිලියන 2,800ක් ගෙවලා තිබෙනවා. ඒ වාගේම රක්ෂණ භාර අරමුදල විසින් මේක ප්‍රතිරක්ෂණය සඳහා පිට රට සමාගම්වලට ගෙවලා තිබෙනවා, රුපියල් මිලියන 2,510ක් - රුපියල් බිලියන 2.5ක්-. හැබැයි, ඒගොල්ලන්ගෙන් අපට රක්ෂණ ආවරණ විධියට ලැබිලා තිබෙන්නේ රුපියල් බිලියන 1.4යි. නමුත්, ඒ වෙච්ච පාඩුව වෙනුවෙන් ආණ්ඩුවට ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා, රුපියල් බිලියන 7.5ක්. අවසාන වශයෙන් ගත්තාම ආණ්ඩුව වියදම් කරපු මුදලත්, ඒ රක්ෂණ සමාගම්වලට ගෙවපු මුදලත්, ඒ පැත්තෙන් ලැබිච්ච මුදලත් ගත්තාම අතිරේකව ආණ්ඩුවට රුපියල් බිලියන 8.8ක් ගෙවන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒ වාගේම මේ රක්ෂණ ඔප්පුව දිහා බැලුවාම තාක්ෂණික කරුණු ගණනාවක් පෙනෙන්න තිබෙනවා. එයින් ඇත්තටම සිදු වෙලා තිබෙන්නේ අලාභ ප්‍රතිපූරණයක් කිරීමට වඩා ඉන් එහාට ගිය තත්ත්වයක් නිර්මාණය කර තිබීමයි. ඒකත් ගැටලු සහිත තත්ත්වයක්. අපි ඉදිරියේදී මෙය කළමනාකරණය කරන්නට ඕනෑ නම්, එය සිදු කළ යුතු ආකාරයත්, රක්ෂණය ලබා ගත යුතු ආකාරයත් පිළිබඳව අපට සාකච්ඡා කරන්නට පුළුවන්.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, විපතට පත් වූ පුද්ගලයින් පිළිබඳව අපේ මැදිහත් වීමේදී ප්‍රවේශ දෙකක් තිබෙනවා. පළමු ප්‍රවේශය තමයි, ඔවුන්ට අවශ්‍ය කරන මූලික සහන සැලසීමේ වැඩ කටයුත්ත. දෙවන ප්‍රවේශය තමයි, මෙය ගොඩනැඟීමේ වැඩ කටයුත්ත. ඒකට අවුරුද්දක්, අවුරුදු 2ක් වාගේ කාල සීමාවක් අපට ගත වෙන්න පුළුවන්. අපේ රාජ්‍ය මූල්‍ය කළමනාකරණ පනත අනුව පැහැදිලිව සඳහන් කරලා තිබෙනවා, මෙවැනි තත්ත්වයකදී මෙවැනි අතිරේක මුදල් සම්පාදනය කරගෙන ඉදිරියට යනකොට අපේ රටේ තිබෙන ආර්ථිකයේ තත්ත්වය, වර්ධනය, රාජ්‍ය මූල්‍ය කළමනාකරණය වැනි තත්ත්වයන් පාලනය කර ගන්න හැටි පිළිබඳවත් තොරතුරු ඉදිරිපත් කරන්න ඕනෑය කියලා. ඒ නිසා මම ඉදිරිපත් කරන්න කැමැතියි, මේ වෙනකොටත් අපි අත්පත් කර ගත් ආර්ථික වර්ධනය පිළිබඳව. තුන්වැනි කාර්තුවේදීත් ආර්ථික වර්ධනය සියයට 5.4 ඉක්මවා තිබෙනවා.

අපට පළමුවැනි කාර්තුවේදීත් පුළුවන් වුණා, සියයට 4.8ක වර්ධනයක් අත්පත් කර ගන්න. දෙවැනි කාර්තුවේදී සියයට 4.9ක සහ තුන්වැනි කාර්තුවේදී සියයට 5.4ක වර්ධනයක් අපි අත්පත් කරගෙන තිබෙනවා. ඒ අනුව ඉතාම පැහැදිලිව මේ ඇති වී තිබෙන තත්ත්වය තුළින් අපි තවදුරටත් උත්සාහ කරන්නේ අප බලාපොරොත්තු වූ ආකාරයට මධ්‍ය කාලීන ආර්ථික වර්ධනය වුණු සියයට 7 ඉක්මවා යන වර්ධනයක් අත්පත් කර ගැනීමයි. ඒ වෙනුවෙන් යන ගමන් මාර්ගයේ ප්‍රවණතාව තමයි මේ දත්ත ඇතුළේ පෙන්නුම් කරන්නේ. එම නිසා අපට 2025 වර්ෂය අවසාන කරන්න පුළුවන් වේවි, සියයට 5කට වැඩි ආර්ථික වර්ධන වේගයකින්. ඒ ආර්ථික වර්ධන වේගය ඇතුළේ විශේෂයෙන් වැදගත් වන කර්මාන්ත ක්ෂේත්‍රයේ වර්ධනය සියයට 8.1ක් ලෙස වාර්තා වෙලා තිබෙනවා. කර්මාන්ත ක්ෂේත්‍රය, කෘෂි කර්මාන්ත ක්ෂේත්‍රය සහ සේවා ක්ෂේත්‍රය ගත්තොත්, ඒ ක්ෂේත්‍රවල කැපී පෙනෙන සුවිශේෂී අංශ ගණනාවක් තිබෙනවා. මේ තත්ත්වයත් එක්ක ඒවා හරියට ඉදිරියට පවත්වා ගෙන ගිහිල්ලා, මේ වර්ධනය අඛණ්ඩව පවත්වා ගෙන යන්න අපට අවශ්‍ය කරනවා.

ඒ වාගේම රාජ්‍ය මූල්‍ය කළමනාකරණය ගත්තොත්, අපට දෙසැම්බර් 15වැනි දා වනකොට පුළුවන්කම ලැබී තිබෙනවා, අපි අපේක්ෂා කරපු සමස්ත ආදායම ඉක්මවා යන්න. අපි අපේක්ෂා කරපු සමස්ත ආදායම ඉක්මවා දැනටමත් අපි මුදල් එක්රැස් කර තිබෙනවා. ඒක සංඛ්‍යා විධියට ඉදිරිපත් කළොත්, 2025 වර්ෂයට බදු, බදු නොවන සහ ප්‍රදාන විධියට ආණ්ඩුවේ සමස්ත ආදායම ලෙස රුපියල් බිලියන 4,960ක් අපි අපේක්ෂා කළා. හැබැයි, දෙසැම්බර් 15වැනි දා වනකොට අපට පුළුවන් වුණා, රුපියල් බිලියන 5,124ක් එකතු කර ගන්න. ඒ කියන්නේ, මේ මොහොත වනකොටත් සියයට 103ක වර්ධනයක් අපි අත්පත් කරගෙන තිබෙනවා. අපි බලාපොරොත්තු වෙනවා, වසර අවසාන වනකොට ඊට වඩා වැඩි මට්ටමකට රාජ්‍ය මූල්‍ය ප්‍රගතිය පෙන්නුම් කරන්න.

ඒ වාගේම මේ ආපදා තත්ත්වය කළමනාකරණය කිරීමට විවිධ වූ කණ්ඩායම් මැදිහත් වෙන්නට ඕනෑ. එහි ප්‍රධාන කාරණයක් තමයි, මුදල් එක්රැස් කර ගැනීම. ඒ සඳහා අපි කමිටුවක් පත් කර ගත්තා, "Rebuilding Sri Lanka" අරමුදල කියලා. ඒ අරමුදල පිළිබඳවත් සමාජයේ විවිධ මත හදන්න ගත්තා, ව්‍යාපාරිකයින් එකතු වෙලා තමයි මේ කටයුත්ත කරන්නේ, නිලධාරින් කවුරුවත් මේක ඇතුළේ නැහැ, මේක වැරදි තැනකට යන්නේ කියලා. නමුත්, මම කියන්න කැමැතියි, ඉතා වගවීමෙන් සහ වගකීමෙන් කැබිනට් අනුමැතිය සඳහා මෙය යොමු කරලා තිබෙන බව, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මුදල් එක්රැස් කර ගන්නට අවශ්‍ය කරන කණ්ඩායම් මේ කමිටුව ඇතුළේ ඉන්නවා. රාජ්‍ය නිලධාරින්, මහා භාණ්ඩාගාරයේ ලේකම්තුමා, ජනාධිපති ලේකම් කාර්යාලයේ වැඩ කරන ජ්‍යෙෂ්ඨ අතිරේක ලේකම්වරයෙක් සහිත නිලධාරින් කණ්ඩායමක් ඒ ක්ෂේත්‍රයේ මුදල් සම්පාදනය කර ගැනීම සඳහා මේ කමිටුව ඇතුළේ ඉන්නවා. එම නිසා කිසිම විධියකට භය, සැක සංකා ඇති කර ගත යුතු වන්නේ නැහැ. එහි වගකීම අපි අනිවාර්යයෙන්ම භාර ගන්නවා. ඒ වාගේම මේ මුදල් වියදම් කිරීමේ කාර්ය පටිපාටිය අපි සිද්ධ කරන්නේ ඒ නීති රීති රාමුවට යටත්ව. දැනටමත් විදේශ විනිමයෙන් මුදල් එක්රැස් කර ගන්න තිබෙන ගිණුම් අටකුත්, රුපියල්වලින් තිබෙන ගිණුම් දෙකකුත් ලංකා බැංකුවේ සහ මහජන බැංකුවේ තිබෙනවා. ඒවාට තමයි ඒ මුදල් එක්රැස් වෙන්නේ. එසේ එක්රැස් වන මුදල් තමයි මේ අරමුදල බවට පත් වෙන්නේ. ඊට අමතරව විවිධ භාණ්ඩවලින් කරන පරිත්‍යාග, වෙනත් ආකාරවලින් කරන පරිත්‍යාග මේ සඳහා පාවිච්චි කරන්න අපට ඉඩකඩ ලැබෙනවා.

ඒ වාගේම අපේ අනෙක් හැම ක්ෂේත්‍රයක්ම ගත්තොත්, අපි කිසිම ආකාරයකට ඒ ක්ෂේත්‍රවල ප්‍රගතිය ආපස්සට හරවා නැහැ. අපි ණය සේවාකරණයත්, ණය කළමනාකරණයත් ඉහළ මට්ටමක පවත්වා ගෙන ගිහින් තිබෙනවා. මේ මොහොතේදී මම සඳහන් කරන්න කැමැතියි, අපේ ණය කළමනාකරණය දළ දේශීය නිෂ්පාදිතයේ ප්‍රතිශතයක් විධියට ඉලක්කවලටම යන බව. එහි එක් සන්ධිස්ථානයක් විධියට අපට කර ගන්න බැරි වෙලා තිබුණා, ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ණය ප්‍රතිව්‍යුහගතකරණය කිරීම. නමුත්, මේ මොහොත වනකොට Official Creditor Committee - OCC - එක විසින් ශ්‍රීලන්කන් ගුවන් සමාගමේ ණය ටිකත් ප්‍රතිව්‍යුහගතකරණය කිරීමේ රාමුවට එකඟතාව ප්‍රකාශ කරලා තිබෙනවා. මම හිතනවා, ඒකත් අපට ඉදිරිපත් කරන්න හොඳ තොරතුරක් කියා.

මම මේ කාරණයත් කියා මගේ අදහස් දැක්වීම අවසන් කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මේ කාරණය කියන්න මෙය අවස්ථාවක් කර ගනිමු. ඇත්තටම අපි අපේක්ෂා නොකරපු ව්‍යසනයකට අපට මුහුණ දෙන්න සිද්ධ වුණා. මේ ව්‍යසනයේදී අපේ මැදිහත් වීම, මූල්‍ය විනය පෙන්වීම, ආණ්ඩුකරණය, වග වීම කියන සියල්ලක් සඳහාම අපි නීති රාමුව ඇතුළේ නිසි පරිදි කටයුතු කරනවා කියන කාරණයත් මම කියන්න ඕනෑ. අපේ උත්සාහය වෙන්නේ හුදෙක්ම මේ ව්‍යසනය හමුවේ විපතට පත්

[ගරු (ආචාර්ය) අනිල් ජයන්ත මහතා]

වුණු අයගේ දේවල් නැවත ප්‍රතිපූරණය කරලා, repair කරන කාරණයකට වඩා එහාට ගිය, තිබුණු තත්ත්වයට වඩා හොඳ මට්ටමකට රට පරිවර්තනය කර ගැනීමයි. මෙහි දෙවැනි අදියරේදී මේ මුදල් එකින් එක වියදම් කරන්නේ කොහොමද කියන කාරණය පිළිබඳව මුදල් අමාත්‍යවරයා විධියට වාගේම ආපදා කළමනාකරණ විෂයභාර අමාත්‍යවරයා විධියට ගරු ජනාධිපතිතුමා විස්තරාත්මකව අද මේ පාර්ලිමේන්තුවේදී කරුණු ඉදිරිපත් කිරීමට නියමිතයි කියන කාරණයත් සඳහන් කරමින් මගේ අදහස් දැක්වීම මම අවසන් කරනවා. බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.40]

**ගරු මනෝ ගනේසන් මහතා**
(மாண்புமிகு மனோ கணேசன்)
(The Hon. Mano Ganesan)

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, அண்மையில் ஏற்பட்ட பேரனர்த்தத்தில் சிக்கித் தங்களது உயிர், உடைமைகளை இழந்த மற்றும் அங்கவீனமடைந்த மக்களின் எண்ணிக்கையையும் இழக்கப்பட்ட வீடு உட்பட சொத்துக்களின் எண்ணிக்கையையும் நாங்கள் அனைவரும் அறிவோம். ஆகையால், அதை நான் இங்கு மீண்டும் எடுத்துக்கூறி நேரத்தை வீணடிக்க விரும்பவில்லை. அரசாங்கத்தின் அவதானத்தை ஈர்க்கும் முகமாக ஒன்றை மட்டும் சொல்லிவைக்க விரும்புகின்றேன். இந்தப் பேரனர்த்தத்தால் சில மாவட்டங்கள் தவிர, ஏனைய எல்லா மாவட்டங்களும் துன்பத்தில் விழுந்திருந்தாலும்கூட, கண்டி, நுவரெலியா, பதுளை, மாத்தளை மாவட்டங்கள் பேரவலங்களைச் சந்தித்து இருக்கின்றன என்பது உங்களுக்குத் தெரியும்! அதிலும் குறிப்பாக, மலையகத் தமிழ் மக்களும் பெருந்தோட்டத் தொழிலாளர்களும் மலைகளில் வாழ்ந்து கொண்டிருக்கின்ற மக்களுமே அதிகளவு பாதிப்புக்களைச் சந்தித்து இருக்கிறார்கள். அங்குதான் அதிகளவான மரணங்களும் வீடு இழப்புகளும் நிகழ்ந்தன. ஏற்கனவே இந்த மக்கள் இந்நாட்டில் மிகவும் பின்தங்கிய மக்களாக, பொருளாதார வளர்ச்சி குன்றிய மக்களாக இருக்கிறார்கள். எனவே, இந்த மக்கள்மீது அரசாங்கம் விசேட அவதானத்தைச் செலுத்த வேண்டுமென நான் கோரிக்கை விடுக்கிறேன்.

විශේෂිත අවධානයක් අපට අවශ්‍යයි; we need special attention. ඒක අනවශ්‍ය දෙයක් නොවෙයි, අවශ්‍ය දෙයක්. මොකද, ඒ, මේ රටේ අඩු දියුණු වෙච්ච ජන කණ්ඩායමක්. අවදානම් කලාපයක ජීවත් වෙන ජනතාවක්. ආණ්ඩුවට ඒක හොඳට තේරෙනවා. මේ ව්‍යසනයට පෙර කිහිප අවස්ථාවක්ම මම මේ සභාවේදී මේ ගැන කථා කර තිබෙනවා. මේ ජනතාවගේ ඉඩම් ප්‍රශ්නය විසඳා ගන්න කියලා කියා තිබෙනවා. எங்களுடையமக்களுக்குப் பாதுகாப்பான இடங்கள் தேவை; காணிகள் தேவை. அவர்களுடைய வாழ்விடங்கள் மலையுச்சியிலிருந்து கீழே கொண்டுவரப்பட வேண்டும்.

அந்த மக்களை மேலேயிருந்து கீழே சாலையோரங் களுக்குக் கொண்டுவந்து பாதுகாப்பான நிலையில் வாழ வைப்பதானது, வெறுமனே பேரனர்த்தத்தால் ஏற்படும் மண்சரிவால் அவர்களைப் பாதுகாப்பதற்காக மட்டும் இருக்கக் கூடாது. அதற்கு அப்பால், அந்த மக்கள் தேசிய நீரோட்டத்துக்குள் வர வேண்டும் என்றால், தேசிய பொது நிருவாகத்தின்கீழ் வர வேண்டும் என்றால், அவர்கள் நகரங்களை நோக்கி, கிராமங்களை நோக்கி, சாலைகளை நோக்கி, வீதிகளை நோக்கி வர வேண்டும். மாறாக, ஒதுக்கப்பட்ட நிலையில் வாழக் கூடாது. எனவே, இதனையும் கவனத்திலெடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று இந்த அனர்த்தத்தால் மலையகத்திலும் கண்டியிலும் நுவரெலியாவிலும் பதுளையிலும் மாத்தளையிலும் இடம் பெயர்ந்த அதிகளவான மக்கள் முகாம்களிலே வாழ்ந்து கொண்டு இருக்கிறார்கள். இன்று அவர்களுக்கு, அவர்கள் சார்ந்திருக்கின்ற தோட்ட நிருவாகம் அழுத்தம் கொடுக்கிறது. அதாவது, அரச அதிகாரிகளைப் பயன்படுத்தி அவர்களை மீண்டும் தோட்டங்களுக்கு வருமாறு அழுத்தம் கொடுக்கிறது. காரணம், அவற்றுக்குத் தொழிலாளிகள் தேவை. எங்களைப் பொறுத்தவரை, எங்களுடைய மக்களின் உயிர் தேவை; உடைமைகள் தேவை; வாழ்க்கை தேவை. அதை மறந்து விடக்கூடாது.

தோட்ட நிருவாகமானது, கயமைத்தனமாக அரச அதிகாரிகளையும் NBRI நிறுவனத்தின் அதிகாரிகளையும் பயன்படுத்தி, அந்த மக்களுக்குப் போலியான நம்பிக்கையை வழங்கி, மீண்டும் வீடுகளுக்குத் திரும்புமாறு சொல்கின்றது. இதில் அரசாங்கத்தின் தலையீடு தேவையாக இருக்கின்றது. எனவே, அரசாங்கம் இதில் உடனடியாகத் தலையிட்டு, அந்த மக்களுக்கு நியாயமான முறையில், பாதுகாப்பான காணிகளைப் பெற்றுக்கொடுக்க வேண்டுமெனக் கேட்டுக் கொள்கின்றேன். இந்தப் பேரனர்த்தத்தின் பின்னராவது, நாங்கள் நீண்ட காலமாகக் கோரிவருகின்ற மலையக மக்களுக்கான காணி உரிமை விடயத்துக்கு ஒரு தீர்வு கிடைக்குமென நினைக்கின்றேன்; தீர்வு வர வேண்டுமென விரும்புகின்றேன்.

இன்று அரசாங்கம் நிவாரணம் வழங்குகின்றது. நான் அதனைக் குறைசொல்ல வரவில்லை. அதேபோல, பாடசாலைகளில் தங்கியிருக்கும் மக்களை அங்கிருந்து வேறு இடங்களுக்கு மாற்றிவிட்டு, பாடசாலைகளில் கல்விச் செயற்பாடுகளை ஆரம்பிப்பதற்கான நடவடிக்கைகள் எடுக்கப்பட்டுள்ளன. அது நல்ல விஷயம்! பரவாயில்லை! என்னைப் பொறுத்தவரையில், இவை எல்லாவற்றையும்விட, எங்களுடைய மக்களுக்குப் பாதுகாப்பான இடத்தில் காணிகள் வழங்கப்பட வேண்டும். அவ்வாறான இடத்தில் காணிகள் வழங்கப்பட்டால்தான் எங்களுடைய மக்கள் நிம்மதியாக வாழ முடியும். ஆனபடியால், அவர்களுக்குக் காணி வழங்கும் விடயத்தில் கட்டாயம் அக்கறை எடுக்க வேண்டுமென நான் அரசாங்கத்தைக் கேட்டுக் கொள்கின்றேன்.

இன்று அவசரகாலச் சட்டம் அமுலில் இருக்கிறது. அவசரகால சட்ட விதிகளைப் பயன்படுத்தி அரசாங்கம் வேண்டுமென்றால் காணிகளைச் சுவீகரிக்கலாம். The Goverment could use Emergency Regulations to acquire lands, if there is a need. The Government should have the political will. That is very important.

அது முக்கிய தேவையாக இருக்கின்றது. அரசாங்கத்திடம் மனோதிடம் இருக்குமானால், தேவையான காணிகளைச் சுவீகரிக்க முடியும். கடந்த 5ஆம் திகதி இந்தச் சபையில் மாண்புமிகு சனாதிபதி அவர்கள் உரையாற்றினார். ஒட்டுமொத்த எதிர்க்கட்சியினரும் வெளிநடப்புச் செய்திருந் தார்கள். எனினும், நான் வெளிநடப்புச் செய்யாமல் மாண்புமிகு

சனாதிபதி அவர்களின் உரையைச் செவிமடுத்தேன். அதன்பிறகு வெளியே சென்று அவருடன் உரையாடினேன். அதன்போது, நான் இந்தக் காணிப் பிரச்சினை தொடர்பில் சொன்னேன். அப்போது மாண்புமிகு சனாதிபதி அவர்கள் என்னிடம், "மனோ, எங்களுக்குக் காணி தேவை என்பதை உணர்ந்து கொள்கிறேன்" என்று சொன்னார். மேலும், காணி எங்கே இருக்கின்றதென்றும் கேட்டார். அதற்கு நான், "காணி தோட்டங்களில்தான் இருக்கிறது. தேடி எடுப்போம்" என்று சொன்னேன். அப்போது அவர் என்னிடம், "அதற்கு உதவி செய்யுங்கள்!" என்று சொன்னார். அதற்கு நான், "உதவி செய்கின்றேன்" என்று சொன்னேன். நிச்சயமாக நான் எங்களுடைய மக்களுக்குப் பாதுகாப்பான இடங்களில் காணிகளைத் தேடிக்கொடுப்பதற்கு உதவி செய்வதற்குத் தயாராக இருக்கிறேன் என்பதை இங்கு கூறிவைக்க விரும்புகின்றேன்.

இதற்கு அரசாங்கத்தின் முன்னெடுப்பும் வேண்டும். ஏனெனில், அரசாங்கத்திடம்தான் முழு அதிகாரமும் இருக்கின்றது. நாங்கள் அரசாங்கத் தரப்பு அல்ல, எதிர்க்கட்சி! நாங்கள் கண்காணித்து தேவைகளைச் சொல்ல முடியும். நீங்கள்தான் எங்களுடைய மக்களுக்கான காணிகளைப் பெற்றுத்தர வேண்டும். பாதுகாப்பான காணிகளைத் தருவதன் மூலம்தான் மலையகத் தமிழ் மக்களை இந்த நாட்டில் வாழ வைக்க முடியுமெனக் கூறி, விடைபெறுகின்றேன். நன்றி. வணக்கம்!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු නලින් බණ්ඩාර ජයමහ මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් තිබෙනවා.

[අ.භා. 3.46]

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඉතා වැදගත් අවස්ථාවක ඉතාම කෙටි වේලාවක් තමයි කථා කරන්න තිබෙන්නේ.

මුලින්ම මම කාරණයක් කියන්න ඕනෑ. ඉතාම කනගාටුයි, මම දැන් phone එක බල බල ඉන්නකොට දැක්කා, මීට කලින් කථා කරපු කෙනෙක් - වසන්ත පියතිස්ස කියන නියෝජ්‍ය ඇමතිවරයා - සඳහන් කර තිබෙනවා, මේ වරද මහවැලි ව්‍යාපාරය හින්දායි වුණේ කියලා, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි. මම අහනවා, මේ ආණ්ඩුවේ මැති ඇමතිවරුන්ගෙන් මේ මෝඩ කථාව ඔයගොල්ලනුත් අනුමත කරනවාද කියලා. 1970දී විජේවීර මහත්මයා කියපු කථාවක් අල්ලාගෙන, ඒක තවම කරේ තියාගෙන යන කිහිප දෙනෙක් ඉන්නවා. මීට කලිනුත් එක්කෙනෙක් පාර්ලිමේන්තුවේදී ඒක කිව්වා. ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමනි, ඔබතුමාට පුළුවන් නම්, හදලා බලලා කියන්න, මහවැලිය නිසා මේ රටේ ආර්ථිකයේ වූ ප්‍රසාරණය; කෘෂිකර්මාන්තයේ වූ ප්‍රසාරණය. මහවැලි පද්ධතියේ ජලාශවලින් 1980 දශකයේ විතරක් මෙගාවොට් 739ක් හැදුණා. ඊට පස්සේ තව මෙගාවොට් 175ක් හැදුණා. සම්පූර්ණ ගණන මෙගාවොට් 914ක්. විදුලිය නිෂ්පාදනය විතරක් නොවෙයි, මහවැලිය නිසා තමයි මේ ජල කළමනාකරණය වෙන්නේ; floods control වෙන්නේ. කොත්මලේ ජලාශය නොවන්න හැමදාම ගම්පොළ යට වෙනවා; අවුරුදු දෙකතුනකට සැරයක් යට වෙනවා. කොත්මලේ ජලාශය හින්දා තමයි කොත්මලේ පහළ නිම්නය control වෙන්නේ. ඒ වාගේම මහවැලියේ තිබෙන වික්ටෝරියා ජලාශය, රන්දෙණිගල ජලාශය නිසා මහියංගනය ඇතුළු පහළ ප්‍රදේශයම control වෙනවා, ජල කළමනාකරණය වෙනවා. නමුත් මේ අය තවම බණිනවා, මේක වුණේ මහවැලිය හින්දා කියලා. මම දන්නේ නැහැ, මේ අය කොහේද ඉන්නේ කියලා. මේ ගොන් කථා අයින් කර ගන්න කියන්න, ඔබතුමන්ලා. බොහොම වැදගත් උගත් මහත්වරු ඔය පැත්තේ ඕනෑ තරම් ඉන්නවා. මෙවැනි මේ ගොන් කථා නම් කියන්නේ, මේවා වල් පැළ නොවෙයි, මල් පැළ නොවෙයි, ගොන් පැළ. මේ ගොන් පැළ ටික අයින් කර ගන්න කියන්න.

අනෙක, පුළුවන් නම් මට කියන්නකෝ, අඩි 5,000ට උඩින් මහවැලි පද්ධතියේ එක ජලාශයක්වත් හදලා තිබෙනවාද කියලා, ඔය කියන වණ්ඩි. අඩි 5,000කට උඩ කථාවක් තමයි විජේවීර මහත්තයා කියලා තිබුණේ. අඩි 5,000ට උඩ එක ජලාශයක්වත් ලංකාවේ නැහැ. අඩි 5,000ට උඩ අපේ රටේ තිබෙන්නේ වර්ග කිලෝමීටර 200ත්, 300ත් අතර ඉතාම පටු ප්‍රදේශයක්. ඒකෙනුත් අතිබහුතරයක් කඳුකර ප්‍රදේශ. එහි තිබෙන එකම නගරය තමයි නුවරඑළිය නගරය. නුවර තිබෙන්නේ වර්ග කිලෝමීටර 5ක් විතර, ඔබතුමා දන්නවා නකල්ස් කඳු මුදුන. ඊළඟට, ශ්‍රීපාද කඳු මුදුන වර්ග කිලෝමීටර 10ක් විතර තිබෙනවා. ඊළඟට තිබෙන්නේ නුවරඑළිය Great Western Mountain, Horton Plains, කිරිගල්පොත්ත, තොටුපළ කන්ද. මෙන්න මේ range එක තිබෙන්නේ. ඒ ටිකේත් අතිබහුතරයක් කැලෑ. නුවරඑළිය නගරය විතරයි නගරයකට තිබෙන්නේ. ඒක සුද්දාගේ කාලයේ ඉඳන් තිබුණා. මේ විපතට හේතුව අඩි 5,000ට උඩ බලාගාර හදපු එක ලු. නමුත් එහෙම බලාගාර එකක්වත් නැහැ. අපේ උඩම තිබෙන බලාගාරය, ඉහළ කොත්මලේ බලාගාරය. එයත් අඩි 3,817යි, full supply level එක. ඉතින් ඒ නිසා මේ වාගේ ගොන් කථා කියන අයට කට වහගෙන ඉන්න කියන්න, ඉස්සෙල්ලාම.

මේ අනතුර ගත්තොත්, වළක්වන්න පුළුවන් දේවල් තිබෙනවා, වළක්වන්න බැරි දේවල් තිබෙනවා කියලා මම දන්නවා. මේකේ නාය ගිය ඒවා වළක්වන්න බැහැ. අපි ඒක දන්නවා. මොකද, කඳු අල්ලා ගෙන ඉන්නද? හැබැයි, මිනිස්සු ඉවත් කර ගන්න තිබුණා. ඒවා කළේ නැහැ. ඒකයි අපට තිබෙන වේදනාව. ඒ වාගේම ජල කළමනාකරණය කරන්න තිබුණා. අපේ දැදුරු ඔය manage කරන්න තිබුණා. සෞඛ්‍ය ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ හිටියා නම් හොඳයි. හලාවත රෝහල සම්පූර්ණයෙන් ඉවරයි. එක උපකරණයක් නැහැ. ICUs ටික ඉවරයි. ඒක manage කරන්න තිබුණා; උලපනේ ඉඳන් මහනුවරටම manage කරන්න තිබුණා; මිනිස් ජීවිත බේරා ගන්න තිබුණා. ඒ නිසා ගොන් කථා කියන ඒවා නම් නවත්වන්න වෙනවා. මේ ආණ්ඩුවේ ඉන්න අයට අපි ඒක කියන්න ඕනෑ.

ඒ වාගේම, වන්දි ගෙවීම ගැනත් කියන්න ඕනෑ. ඒ ගැන ජනාධිපතිතුමා කියපු කථාවක් තිබුණා නේ. පොල්ගහවෙල රෝහල් කන්ද නාය ගියා. එතැන පවුල් 11ක්. රුපියල් 25,000 තවම ඒ අයට හම්බ වෙලා නැහැ. හේතුව මොකක්ද? ඔප්පු නැහැ කියනවා. අවුරුදු 40ක්, 45ක් එතැන ජීවත් වුණු මිනිස්සු; ඔප්පු නැති වෙන්න පුළුවන්. හැබැයි, ඒ අය ඒ භූමියේ හිටපු මිනිස්සු නේ. ඒ අයට එහි ඡන්දය තිබෙනවා; ලියාපදිංචිය තිබෙනවා. ග්‍රාම සේවක ඒ අයව දන්නවා. ප්‍රාදේශීය ලේකම් ළඟ තොරතුරු තිබෙනවා. ඔබතුමන්ලා හදනවා, කියපු චක්‍රලේඛ කෝ? අද බිංගිරිය ප්‍රාදේශීය සභාවේ ඉඳලා මම ආවේ. ප්‍රාදේශීය සභාවලට එවලා තිබෙනවා, චක්‍රලේඛ. ප්‍රාදේශීය සභාවේ සභාපති, ලේකම් අල්ලා ගන්න එපා, සභාපතිතුමා අපේ කෙනෙක් නිසා මට පෙන්නුවේ. දැන් එවලා තිබෙනවා, චක්‍රලේඛ. විශේෂයෙන්ම පාරවල් ටික හදන්න බොරලු ටික කපා ගන්න පුරාවිද්‍යා දෙපාර්තමේන්තුවේ අවසරය, පරිසර ආයතනයේ අවසරය, අර අවසරය, මේ අවසරය ඔක්කෝම ගන්න ලු.

[ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා]

මේ වෙලාවේ මොන අවසරද? ප්‍රාදේශීය සභාවේ සභාපතිට හරි, ප්‍රාදේශීය ලේකම්ට හරි ඒ තීන්දුව ගන්න දෙන්න. ප්‍රාදේශීය ලේකම්වරුන්ට ගිහිල්ලා ඒ තීන්දුව ගන්න දෙන්න. එහෙම නැතිව අවසර අරගන්න බලාගෙන හිටියොත් ඒ පාරවල් හදන්න බැහැ. තවමත් ගොවි බිම්වලට යන්න බැහැ. මම උදේ ගියා දැදුරු ඔය අයිනේ තිබෙන වෙල්ලංගිරිය ගොවි ජනපදයට. ඇළවල් ටික කැඩිලා, pump houses ටික කැඩිලා, මිනිසුන්ට තවමත් ඒ පාරවලට ඇතුළු වෙන්න බැරිව ඉන්නවා. පාරවල් ටික හදාගන්න බොරළු ටික නැහැ. මොනවාද මේ කරන්නේ? දැන් දවස් කීයක් ගිහිල්ලාද? මේ තීන්දු තීරණ ගන්න සහ ක්‍රියාත්මක කරන්න තමයි ආණ්ඩුව ඉන්න ඕනෑ. මේ කටයුතු ක්‍රියාත්මක කරන්න අවශ්‍ය බලය වහාම ගමේ ඉන්න ග්‍රාම නිලධාරිට දෙන්න. හැබැයි, ඒ එකක්වත් වෙන්නේ නැහැ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමා, ඔබතුමාට ලැබී තිබෙන කාලය අවසන්.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
කෘෂිකර්ම ඇමතිතුමා මේ වෙලාවේ සභාවේ ඉන්නවා. ගරු ඇමතිතුමනි, වාරිමාර්ග විෂය භාර ඇමතිතුමාත් ඔබතුමා. ඒ මිනිසුන්ට ඒ ටික කර ගන්න අවසර දෙන්න. ඒ මිනිසුන්ට තමන්ගේ යාන වාහන දමාගෙනවත් ඒවා හදාගන්න විධියක් නැහැ, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමනි. මොකද, ඒවා හිර වෙලා. බොරළු ටිකක් කපාගන්න විධියක් නැහැ. සමහර කුඹුරුවල, ඉඩම්වල වැලි කඳු. ඒ වැලි ටික අයින් කර ගන්න දෙන්නේ නැහැ. මේ වෙලාවේ නීති රීති පැත්තකට දමලා ඒ මිනිසුන්ට තමන්ගේ ගෙවත්ත සුද්ද කර ගන්න ඉඩ දෙන්න; කුඹුර සුද්ද කර ගන්න ඉඩ දෙන්න. මොන නීති රීතිද? තමන්ගේ කුඹුරේ තිබෙන, තමන්ගේ ගෙවත්තේ තිබෙන වැලි ටික ඇද ගන්න ඒ මිනිහාට ආණ්ඩුවේ අවසරය දෙන්නේ නැත්නම්, මොන කෙහෙල්මල් ආණ්ඩුවක්ද මේක? ආපදාවක් වෙච්ච වෙලාවකදීවත් නීති රීති පැත්තකට දමලා ඒ මිනිහාට ඒ වැඩේ කර ගන්න ඉඩ දෙන්න එපායැ. ඒ මිනිස්සු ඔබතුමන්ලාගෙන් සල්ලි ඉල්ලන්නේ නැහැ. ඒ මිනිස්සු කියන්නේ, තමන්ගේ ට්‍රැක්ටරයෙන් හරි ඒවා අයින් කර ගන්නම් කියලායි. ඒවායේ තිබෙන වැලි කඳු ප්‍රමාණය බලලා ඒක මෙච්චර වටිනවා, අච්චර වටිනවා කියලා ඊර්ෂ්‍යා කරන්න එපා. ඒකට ඊර්ෂ්‍යා කරනවා, ඒ මිනිස්සු කීයක් හරි වැඩියෙන් ගනීවි කියලා. ඉතින් දෙයියනේ මොකද? ආපදාවෙන් හරි තමන්ගේ මිදුලට වැලි කියුබ් 10ක්, 20ක් ඇවිල්ලා ඒ මිනිහා ඒක විකුණා ගත්තාම කාටද අමාරුව? බිග් කුච්චන්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමා.

**ගරු නලින් බණ්ඩාර ජයමහ මහතා**
(மாண்புமிகு நலின் பண்டார ஜயமஹ)
(The Hon. Nalin Bandara Jayamaha)
මම අවසන් කරනවා.

මෙන්න මේවා තමයි බරපතළ ප්‍රශ්න. රාජ්‍ය නිලධාරින්ට මේ ආණ්ඩුවෙන් අවශ්‍ය සහයෝගය ලැබෙන්නේ නැහැ. ඇමතිවරු ගිහිල්ලා බඩු උස්සලා හරියන්නේ නැහැ; මෙට්ට කර ගහලා, මුට්ට කර ගහලා, සැල්වීනියා ඇදලා, පාසි ඇදලා හරියන්නේ නැහැ. අවශ්‍ය නීති රීති ටික හදලා දෙන්න; අවශ්‍ය යන්ත්‍රණය හදලා දෙන්න; අවශ්‍ය පාලම හදලා දෙන්න. රාජ්‍ය නිලධාරින්ගේ කොඳු කඩලා හරියන්නේ නැහැ. ඔවුන්ට බලය දෙන්න; බය නැතිව වැඩ කරන්න කියන්න. හොඳ රාජ්‍ය නිලධාරින් ඒ ආයතනවල ඉන්නවා. ඒ කටයුතු ක්‍රියාත්මක වෙන්නේ නැතිව මේවා කරලා හරියන්නේ නැහැ. ඒ නිසා කරුණාකර වහාම මේ තීන්දු තීරණ ගන්න. ඔබතුමන්ලාට ඕනෑ තරම් අවස්ථාව තිබුණා, මේ ආපදාව පිළිබඳ දැඩි අවදානම ගැන රටට කියන්න. හැබැයි, කිව්වේ නැහැ. 25වැනි දා දැනගත්තා නම් ඔබතුමන්ලාට පැය 48ක් තිබුණා, කියන්න. මනෝ ගනේසන් මන්ත්‍රීතුමා, පැය 48ක් කියන්නේ ගොඩක් දේවල් කරන්න පුළුවන් වෙලාවක්. හැබැයි, එකක්වත් කළේ නැහැ. ඔබතුමන්ලා රැස් වුණාද? ආපදා කළමනාකරණ කමිටුව රැස් වුණු තැනක් මට කියන්න. ආපදා කළමනාකරණ මධ්‍යස්ථානය වහාම විසුරුවා හරින්න. තව ගොඩක් දේවල් කියන්න තිබෙනවා. නමුත්, කථා කරන්න වෙලාවක් නැහැ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි පහක කාලයක් ලැබෙනවා.

[பி.ப. 3.54]

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
*பிஸ்மில்லாஹிர் ரஹ்மானிர் ரஹீம்.*

கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, இன்றைய விவாதத்தின்போது, நாட்டில் ஏற்பட்ட அனர்த்தத்தில் உயிரிழந்தவர்களுக்கு எனது அஞ்சலியைச் செலுத்துவதுடன், காயப்பட்டு வருத்தங்களோடு இருப்பவர்களுக்கு என்னுடைய அனுதாபங்களையும் முதலிலே தெரிவித்துக் கொள்கின்றேன். இது ஓர் எதிர்பாராத அனர்த்தம்! இன்னும் அதனுடைய தாக்கத்தை ஈடுசெய்ய முடியவில்லை. இரண்டு தினங்களுக்கு முன்னர் கண்டி, கம்பளை, கல்லோயா போன்ற பகுதிகளுக்கும், தொடர்ந்தேர்ச்சியாக திருகோணமலை, மன்னார், வவுனியா, புத்தளம் போன்ற இன்னோரன்ன பாதிக்கப்பட்ட பகுதிகளுக்கும் சென்று பாதிப்புகளுடைய தாக்கத்தை நாங்கள் அறிந்து கொண்டோம். அதன் அடிப்படையில், இப்பாதிப்பின் நிவாரண நடவடிக்கைகளுக்காக இந்த உயர் சபையிலே அரசாங்கம் ஒதுக்குகின்ற ரூபாய் 500 பில்லியனும் போதாதென்ற நிலைமையை நாம் காண்கின்றோம்.

ஜனாதிபதி அவர்கள் மாவட்ட ரீதியாகப் பல இடங்களுக்கும் சென்றிருந்தார்; மன்னார் மாவட்டத்திற்கும் வருகைதந்தார். நாங்கள் ஜனாதிபதியிடத்திலே அங்குள்ள நிலைமைகளை எடுத்துச் சொன்னோம். குறிப்பாக, மன்னார் மாவட்ட மீனவர்கள் மிகவும் பாதிக்கப்பட்டிருக்கிறார்கள். அவர்களுக்கான ஒரு விசேஷ வேலைத்திட்டத்தை முன்னெடுக்குமாறு வேண்டுகோள் விடுத்தபோது, அதைச் செய்வதாக வாக்குறுதியளித்தார். மன்னாரில் மாத்திரமல்ல, அம்பாறை, மட்டக்களப்பு, திருகோணமலை, முல்லைத்தீவு, புத்தளம் போன்ற மாவட்டங்களிலுள்ள மீனவர்களும் பொதுவாக இந்தத் தாக்கத்தினால் நேரடியாக இல்லாவிட்டாலும் அவர்களுடைய தொழில்களை இழந்து பல நாட்களாகக் கஷ்டத்திலேயிருக்கிறார்கள். அவர்களையும்

கவனத்திலே கொள்ளவேண்டுமென்று வேண்டுகோள் விடுக்கின்றோம். அதேபோல, விவசாயிகளுக்கு நஷ்டஈடு வழங்குவதாகச் சொல்லப்பட்டாலும் அவசரமாக அவர்கள் மீள எழுவதற்கான ஏற்பாடுகளை அரசாங்கம் செய்துகொடுக்க வேண்டும். அதிகாரிகளுடைய அசமந்தப்போக்குக் காரணமாக விவசாயிகள் இவ்வாறான விஷயங்களிலே நம்பிக்கை யிழந்தவர்களாக இருக்கிறார்கள்.

ஜனாதிபதி அவர்கள் இந்த அனர்த்தத்திற்குப் பிறகு அநேகமான விடயங்கள் சம்பந்தமாக அறிவிப்புகளைச் செய்திருந்தாலும், அரச அதிகாரிகள் அசமந்தப்போக்குடன் செயற்படுகிறார்கள். குறிப்பாக 25,000 ரூபாய் வழங்குவதாக இருந்தாலும்சரி, 50,000 ரூபாய் வழங்குவதாக இருந்தாலும் சரி, கொடுப்பனவுகள் வழங்கும் விடயத்திலே அதிகாரிகளிடம் அந்த அசமந்தப்போக்கு காணப்படுகின்றது. அது சம்பந்தமாக இடம்பெற்ற ஒரு கூட்டத்திலே இந்த இரண்டு கொடுப்பனவுகளையும் சேர்த்துக் கொடுக்க முடியாதா? என்று ஜனாதிபதி அவர்களே கேட்டிருந்தார். குறிப்பாக, கிராம உத்தியோகத்தர் போய்ப் பார்க்காத வீடுகள்கூட இன்னும் இருக்கின்றன. தண்ணீர் வற்றிய பிறகு வந்து, வெள்ளம் வந்ததா, photo எடுத்தீர்களா, மாடு செத்ததா, ஆடு செத்ததா, வீட்டுப் பொருட்கள் அழிந்தனவா? என்று கேட்கின்ற ஒரு துர்ப்பாக்கிய நிலைமை பற்றி மக்கள் தொலைபேசி மூலமாக எங்களிடத்திலே முறையிடுகிறார்கள். ஒரு கிராம சேவையாளர் பிரிவை எடுத்துக்கொண்டால், அங்கு கிராம உத்தியோகத்தர் இருக்கிறார், DO இருக்கிறார், சமுர்த்தி அதிகாரி இருக்கிறார், அவர்களைவிட, இன்னோரன்ன அதிகாரிகளும் இருக்கிறார்கள். இவர்கள் மக்களுடைய கொடுப்பனவுகளை வழங்குகின்ற விஷயத்திலே தாமதம் காட்டாமல் கூட்டு அடிப்படையிலே அவசரமாகச் செயல்பட வேண்டுமென்று நாங்கள் வேண்டுகோள் விடுக்கின்றோம்.

புத்தளம் மாவட்டத்தை எடுத்துக்கொண்டால், உப்புத் தொழில் அங்கே முற்றாக நாசமடைந்திருக்கின்றது. அதே போல, இந்த நாட்டுக்குத் தேவையான அதிகமான விவசாய உற்பத்திப் பொருட்களை விளைவிக்கின்ற மாவட்டமாக அண்மைக் காலமாக இருந்துவருகின்ற அந்தப் பிரதேசத்தின் விவசாயமும் முற்றாக அழிந்திருக்கின்றது. வீட்டுத் தேவைக்காக விவசாயத்தை மேற்கொள்கின்ற, மரக்கறி வகைகளை உற்பத்தி செய்கின்ற அந்தப் பிரதேச விவசாயிகள் மிகவும் கஷ்டப்படுகிறார்கள். அதேபோல், பல கஷ்டங்களை இந்த மாவட்டம் எதிர்நோக்குகின்றது. எனவே, அவர்கள் தொடர்பாகவும் அமைச்சர் வசந்த சமரசிங்ஹ அவர்களும் அமைச்சர் கே.டி. லால் காந்த அவர்களும் இணைந்து விசேட வேலைத்திட்டமொன்றை முன்னெடுக்க வேண்டுமென்று கேட்டுக் கொள்கின்றேன்.

அதுபோல, பாதைகள் மிக மோசமாகப் பாதிக்கப் பட்டிருக்கின்றது. போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சர் மாவட்ட ரீதியாகச் சென்று பாதிக்கப்பட்ட பாதைகளைப் பார்வையிட்டு வருவதை நாங்கள் காண்கின்றோம். என்றாலும், சில இடங்களில் மாணவர்கள் பாடசாலைகளுக்குச் செல்ல முடியாதவாறான துர்ப்பாக்கிய நிலையில் பாதைகள் காணப்படுகின்றன. அங்குள்ள பிரதேச சபைகளோடு சேர்ந்து அவற்றை அவசரமாகப் புனரமைக்கும் விடயங்களைச் செய்து தாருங்கள்!

அதேபோல, இந்த அனர்த்தத்தினால் பாதிக்கப்பட்ட பலர் இன்னும் இடைத்தங்கல் முகாம்களில் அல்லது நண்பர்களின், தெரிந்தவர்களின் வீடுகளில், பொது இடங்களில் இருக்கின் றார்கள். அவர்களுக்கான கொடுப்பனவுகள், திட்டங்கள் அறிவிக்கப்பட்ட பொழுதும், circulars அனுப்பப்பட்ட பொழுதும் மக்கள் அவற்றைப் பெற்றுக் கொள்வதில் தாமதங்கள் காணப்படுகின்றன; அதற்கான சரியான வழிகாட்டுதல்களை நாங்கள் காணவில்லை. அதனால்தான் இன்று காலையில்கூட பல இடங்களில் பிரதேச செயலகங்களுக்கு முன்னால், "25,000 ரூபாய் தருவதாகச் சொன்னீர்கள், தரவில்லை! இன்னும் ஏன் தாமதம்?" என்றெல்லாம் ஆர்ப்பாட்டங்கள் நடைபெறுவதை நான் பார்த்தேன்.

கண்டியில் முற்றாக அழிந்த ஒரு பிரதேசத்துக்கு நான் சென்றிருந்தேன். அங்கு கோடிக் கணக்கான நஷ்டம் ஏற்பட்டிருக்கின்றது. அங்குள்ளவர்கள் 25,000ரூபாய், 50,000 ரூபாய்க்கு கையேந்துகின்றவர்கள் அல்லர். தாம் சொந்தமாக, அழகாகச் சேர்த்த அத்தனையையும் இழந்து, முழுவதையும் குப்பைகளாகக் குவித்துவிட்டு, இன்று இருப்பதற்கு, படுப்பதற்குப் பாய்கூட இல்லாத ஒரு துர்ப்பாக்கிய நிலையில் அவர்கள் இருக்கின்றார்கள். அவ்வாறானவர்கள்கூட பல மைல் தூரம் அலைந்து திரிந்து அந்த 25,000 ரூபாயைப் பெற வேண்டிய துர்ப்பாக்கிய நிலை! அரசாங்கம் நினைத்தால், பிரதேச செயலாளர் ஊடாக, அந்தந்தக் கிராமங்களின் பன்சலையிலோ, பாடசாலையிலோ, பள்ளிவாசலிலோ வைத்து அதனை வழங்க முடியும். அதை நாங்கள் சொன்னபோது பிரதேச செயலாளர்கள் மறுக்கின்றார்கள். எனவே, இந்த விடயங்களில் கவனம் செலுத்த வேண்டிய தார்மீகப் பொறுப்பு அரசாங்கத்திற்குத்தான் இருக்கின்றது.

அரசாங்கம் எடுத்து வருகின்ற நடவடிக்கைகளுடன் தொடர்பானதாக நேற்று ஆலங்குடாவில் நடந்த ஒரு சம்பவம் குறித்து கேள்விப்பட்டேன். அதாவது, உங்களுடைய கட்சியைச் சார்ந்தவர்கள், தங்களுடைய வீட்டிற்கு வந்துதான் நிவாரணப் பொருட்களைப் பெற்றுக்கொள்ள வேண்டுமென்று கூறும் சில துர்ப்பாக்கியமான செயல்கள் நடப்பதனால், அங்கு பிரச்சினை உருவாகின்றது. எனவே, இதில் அரசியலைப் பார்க்காமல் மனிதாபிமானத்தோடு நடந்து கொள்ளுங்கள்! இந்த அனர்த்தத்தின்போது மௌலவிமார், பன்சலையில் உள்ள சாதுக்கள், இந்து மதகுருமார், கத்தோலிக்க மதகுருமார் எந்தவிதமான பேதமுமில்லாமல் செயற்பட்டதும், சாதாரண மக்களும் தமது சொந்தப் பணத்தை அள்ளி எறிந்து செலவு செய்து, இரவு பகல் பார்க்காமல் உதவி செய்ததும் உங்களுக்குத் தெரியும். அதை நாங்கள் நேரடியாகவே கண்டோம். அகில இலங்கை ஜம்மியத்துல் உலமா நாடளாவிய ரீதியில் இன, மத பேதமின்றி, கோடிக்கணக்கான ரூபாயை மக்களிடத்தில் இருந்து சேர்த்து அனர்த்தத்தால் பாதிக்கப்பட்ட மக்களுக்கு, அரசாங்கத்தால் வழங்கப்பட்ட பொருட்கள் போய்ச் சேர்வதற்கு முன்னர் பகிர்ந்தளித்ததை நாங்கள் கண்டோம். அதற்கு அனைத்து இனத்தைச் சேர்ந்த வியாபாரிகளும் உதவி செய்திருக்கிறார்கள். அவர்களுக்கும் இந்த உயர்ந்த சபையில் இந்நாட்டு மக்கள் சார்பாக எங்களுடைய மனமார்ந்த நன்றியை நாங்கள் தெரிவித்துக் கொள்கின்றோம்.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, දැන් කථාව අවසන් කරන්න.

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
හොඳයි.

[ගරු රිසාඩ් බදියුදීන් මහතා]

அத்துடன், இந்தியா, பாகிஸ்தான், ஐக்கிய அரபு அமீரகம் போன்ற பல வெளிநாடுகள் எமக்கு உதவிகளைச் செய்திருக் கின்றன. அவர்களுக்கும் எமது மனமார்ந்த நன்றியைத் தெரிவித்துக் கொள்கின்றோம். இந்த அரசாங்கம் அந்த உதவிகளைச் சரியாகப் பெற்று, முறையான திட்டமிடல் ஊடாக அவற்றைப் பயன்படுத்தி, நீண்டகாலத் திட்டங்களை வகுத்து, சட்டங்களை இறுக்கமாக்கி, எதிர்காலத்தில் இந்த மாதிரியான அனர்த்தங்கள் ஏற்படாமல் தடுப்பதற்கான நடவடிக்கைகளை முன்னெடுக்க வேண்டுமென அன்பாக வேண்டி, விடைபெறுகின்றேன். நன்றி!

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු බිමල් රත්නායක අමාත්‍යතුමා. ඔබතුමාට විනාඩි 13ක කාලයක් වෙන් කර තිබෙනවා.

[අ.භා. 4.00]

**ගරු බිමල් රත්නායක මහතා (ප්‍රවාහන, මහාමාර්ග සහ නාගරික සංවර්ධන අමාත්‍ය සහ පාර්ලිමේන්තුවේ සභානායකතුමා)**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க - போக்குவரத்து, நெடுஞ்சாலைகள் மற்றும் நகர அபிவிருத்தி அமைச்சரும் பாராளுமன்றச் சபை முதல்வரும்)
(The Hon. Bimal Rathnayake - Minister of Transport, Highways and Urban Development and the Leader of the House of Parliament)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේ ආපදාවෙන් විනාශ වෙච්ච ජන ජීවිත නැවත ගොඩ නගා ගැනීම සඳහා එක ඩොලරයක්වත් ණයට ගන්නේ නැතුව, රාජ්‍ය භාණ්ඩාගාරයෙන් රුපියල් කෝටි 50,000ක අතිරේක මුදලක් ලබා ගැනීම සඳහා ඉදිරිපත් කළ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කර ගැනීම සඳහා තමයි අපි අද මෙම විවාදය කරන්නේ.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මේක ඉතාම විශේෂ දෙයක්. නමුත් ඒක අගය කරන්න තරම් සමහර පුද්ගලයන්ට දේශපාලන ධෛර්යයක් නැතිවීම ගැන අපි කනගාටු වෙනවා. සාමාන්‍යයෙන් මීට කලින් ආපදාවලදී සිද්ධ වුණේ මොකක්ද? එදා දස අතේ ණය වුණා. ලෝකයෙනුත් ණය අරගෙන, රටේ ණය සීමාව වැඩි කරගෙන තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි ඒ කටයුතු කළේ. ඒ කාලයේ ඉදිකිරීම් සඳහා ප්‍රාග්ධන ප්‍රතිපාදන ලබා දීමේදී මුදලින් සියයට 25ක් ලබා දුන්නේත් ණය වෙලා තමයි. නමුත් අද මේ රුපියල් කෝටි 50,000ක විශාල මුදල, ලබන ජනවාරි සිට දෙසැම්බර් 31 දක්වා කාලයට 2026 අය වැයෙන් ලබා දීලා තිබෙන මුදලට අමතරව ලබා දෙනවා. මේ දෙසැම්බර් 31 දක්වා අපි තව රුපියල් කෝටි 7,200ක් ලබා දුන්නා. Cyclone එක ආවේ නොවැම්බර් 27 සහ 28 දිනවල. දෙසැම්බර් 05වැනි දා ඉඳලා මේ දවස් 25ට මේ කටයුතු සඳහා කෝටි 7,200ක් ලබා දුන්නා. මේ කෝටි 50,000 ලබා දෙන්නේ ඊට අමතරව. අපි ඒ ගැන සතුටු වෙනවා.

මේ සියල්ලම කරන්න පුළුවන් වුණේ ඇත්තටම අපි ඔක්කෝගේම දායකත්වයෙන් බව ඇත්ත. නමුත් මේ දේවල් කරන්න පුළුවන් වුණේ මුදල් අමාත්‍යාංශය නිසා. මුදල් අමාත්‍යාංශය හරියාකාරව, මුදල් විනයක් ඇතුව වුවමනාවෙන් කටයුතු කළ නිසා තමයි අද අපට රටක් විදියට මේ පාලම් හදන්න, බෝක්කු හදන්න අවශ්‍ය මුදල් මේ විදියට වෙන් කර ගන්න පුළුවන් වන්නේ. රුපියල් 25,000 දුන්නේ නැහැ කියන්න පුළුවන් වුණේත් ඒ නිසා. රුපියල් 3,000 දුන්නේ නැහැ, 5,000 දුන්නේ නැහැ කිය කියානේ හිටියේ. 25,000 දුන්නේ නැහැ කියලා හරි, 75,000 දුන්නේ නැහැ කියලා හරි විවේචනයක් කරන්න පුළුවන් වන්නේත් ඒ නිසා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආපදාවට ලක් වුණු හැම ගෙදරක් වෙනුවෙන්ම රුපියල් 75,000ක් ලැබෙනවා. පාසල් දරුවන්ට රුපියල් 25,000ක් ලැබෙනවා. ආපදාවට ලක් වුණු ගෙදරක දරුවෙක් සිටිනවා නම්, ඒ ගෙදර අයට රුපියල් 100,000ක් ලැබෙනවා, ඒ දරුවාට ලැබෙන රුපියල් 25,000ත් එක්ක. ඒ නිසා අපි කියන්න කැමැතියි, ඒක ලැබුණේ නැහැ කියලා විවේචනය කරන්න පුළුවන් වන්නේත් බංකොලොත් වෙච්ච රටක් භාර ගෙන මේ අවුරුද්දක කාලයක් ඇතුළත අපි කළ කටයුතු නිසාය කියන කාරණය. ඒක තමයි ඇත්ත. අද මේ ඔක්කෝම අයගේ කථාවලින් කියැවුණු ඇත්ත ඒකයි. ඒ නිසා අපි හිතනවා, අඩු ගණනේ ඒ පිළිබඳව අවබෝධයක් තිබෙන අයවත් ජනතාවට ඒ කාරණා ඉදිරිපත් කරන එක හොඳයි කියලා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අද අපි මේ අතිරේක රුපියල් කෝටි 50,000 -බිලියන 500- ලබා දෙන්නේ විශේෂයෙන්ම හදිසි අවස්ථාවටම නොවෙයි. ඒ කියන්නේ කන බොන ඒවාට, රුපියල් 25,000, රුපියල් 50,000, රුපියල් 75,000 ගෙවන ඒවාටම නොවෙයි. ඒවාට නොවෙයි ඇත්තටම. මේ රුපියල් කෝටි 50,000 වෙන් වෙන්නේ මේ ආපදාවෙන් රටේ විනාශයට පත් වූ ඒවාට අදාළ කරන ස්ථිර විසඳුම් ලබා දීම සඳහායි. කැඩිච්ච ජල සම්පාදන මධ්‍යස්ථාන හදන්න, කැඩිච්ච ඉස්කෝල අලුතින් හදන්න, රජයේ වාහන නැති වෙලා නම් ඒවා නැවත මිලදී ගැනීම වාගේ කටයුතුවලට තමයි මේ මුදල වෙන් කරන්නේ. පාරවල් හදන්න, පාලම් හදන්න, කෝච්චි පාරවල් අලුතින් හදන්න මේ මුදල යොදවනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, කොච්චර කිව්වත් පිළිගන්නේ නැති කට්ටියට ඒක ඒත්තු ගන්වන්න try කරන එකේ තේරුමක් නැහැ කියලා මම හිතුවා. ඒ නිසා ඒක ජනතාවට තීන්දු කරන්න දීලා අපි ආණ්ඩුවක් විදියට ලබන ජනවාරි 01වැනි දා ඉඳලා මේ මුදලත්, ඒ වාගේම පසුගිය දෙසැම්බර් 05වැනි දා 2026 අවුරුද්දට සම්මත කළ අය වැයෙන් වෙන් කරන මුදලත් යොදවා කටයුතු කරන්න බලාපොරොත්තු වෙනවා. 2026 අය වැයෙන් අපට විශාල මුදලක් වෙන් කරනු ලැබුවා. ප්‍රවාහන, මහාමාර්ග අමාත්‍යාංශයට 2026 සාමාන්‍ය අය වැයෙන් කෝටි 32,000ක් ලබා දුන්නා, පාරවල් හදන්න. මේ අතිරේක ඇස්තමේන්තුවෙන් අපේ අමාත්‍යාංශයට ලබා දෙනවා, රුපියල් කෝටි 12,000ක්. ඒ අනුව ලබන අවුරුද්දට කෝටි 44,000ක් වෙන්කර තිබෙනවා, කැඩිච්ච පාරවල් අලුතින් හදන්නත්, අපේ සාමාන්‍ය වැඩසටහන යටතේ පාරවල් හදන්නත්. ඒකෙන් කෝටි 4,000ක් වෙන්කර තිබෙනවා, ග්‍රාමීය මාර්ග හදන්න. ඒ මාර්ගවලින් කිහිපයක් කැඩිලා ඇති. අපි ඒවාත් හදනවා. නමුත් මේ ව්‍යසනයෙන් හානියට පත් නොවුණු මාතර, ගාල්ලේ, කළුතර, යාපනයේ මාර්ගත් අපි හදනවා.

ඒ වාගේම ජනවාරි 1වැනි දා වැටුප් වැඩි වෙනවා. අපි කිව්වා අපි රට එල්ලුවේ නැහැ කියලා, අර එල්ලෙන පාලමේ. දේශපාලන සූදුවක් කරන කට්ටියට නම් මේක ඉතාම හොඳ අවස්ථාවක් තිබෙන ප්‍රශ්න වැඩි කරලාත් පෙන්වලා, "දැන් ඉතින් පඩි වැඩි කරන්න බැහැ" කියන්න. නමුත් පාර්ලිමේන්තුවේ සේවක මහත්වරු දන්නවා මොකක්ද වෙලා තිබෙන්නේ කියලා. එතුමන්ලාගේ දිගු කාලීන ඉල්ලීමක් තිබුණා. දැන් ඒකට මොකක්ද වෙලා තිබෙන්නේ කියලාත් දන්නවා. ඒ තීන්දු ගත්තේත් මේ ව්‍යසනය මැද්දේ. මේ ව්‍යසනයට පස්සේ ගත්ත තීන්දු ඒවා. මම කියන්න යන්නේ නැහැ ඒ විස්තර. නමුත් කියන්න ඕනෑ, තිබුණු තැනට වඩා රට ඉහළට අරගෙන තමයි ජනාධිපතිතුමාත්, ආණ්ඩුවත් මේ කටයුතු නතර කරන්නේ.

කැඩිච්ච පාරවල් ගැන මම නැවත කථා කරන්නේ නැහැ, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මගේ අමාත්‍යාංශය ගත්තොත්, රුපියල් කෝටි 5 සිට100 දක්වා මුදල් ප්‍රතිපාදන වෙන් කරලා තිබෙනවා. ජනවාරි 1වැනි දා අලුත් පාරවල් 14ක් හදන්න අපි පටන් ගන්නවා. ඒ වාගේම අධිවේගී මාර්ගය ගත්තොත් ඒකේ කිසිම ප්‍රමාදයක් නැහැ. අපි හරි timeline එකේ යනවා. ඒකට අනුව අපි හදලා දෙනවා අධිවේගී මාර්ගය. අපි ඒ වැඩ කරගෙන යනවා.

දැදුරු ඔය වැල්ලව පාලම කැඩිලා තිබුණා. නමුත් දැන් ඕනෑ නම් එතැනින් යන්න පුළුවන්. ඒක තාවකාලිකව හදලා තිබෙනවා. නමුත් අපි නිරීක්ෂණය කළාම, ඒ පාලම හදපු විධියේත් අඩුපාඩුවක් තිබෙන බව ඉංජිනේරුවන් ප්‍රකාශ කළා. ඒ නිසා ඒ වාගේ තැන්වල අපි අලුත්ම පාලම් හදනවා. ඒ අනුව රට තිබුණු තැනට වඩා හොඳ තැනකට ගෙනෙනවා, පාරවල් පැත්තෙන් ගත්තොත්.

ඒ වාගේම ඊට වඩා පොඩි පොඩි දේවලුත් තිබුණා. Kerawalapitiya Expressway එක ගත්තොත්, විශාල පෝලිමකුත් තිබෙනවා. තේරුමක් නැති වැඩකුත් එතැන තිබෙනවා. කෙරවලපිටිය exit එක වටේ නිකම් යනවා. මගේ දැනීමේ හැටියට අද රෑ ගැසට් කරලා කෙරවලපිටිය entry point එක අයින් කරනවා. එතකොට අඩු ගණනේ තවත් විනාඩි 8ක්-10ක් මිනිසුන්ට ඉතුරු වෙනවා. ගැසට් කරලා දවස් දෙකක් විතර ඕනෑ වෙයි, pilot කාර්යය කරන්න. බොහෝ විට ලබන සඳුදා-අඟහරුවාදා වෙනකොට ඒක කරන්න පුළුවන් වෙයි. ඒවා ලොකු වැඩ නොවෙයි. නමුත් කෙරිලා තිබුණේ නැහැ. මම කියන්නේ ඒකයි. අපි ඒ වාගේ පොඩි දේවලුත් කරලා ජීවිතවලට දශමයක් හරි පහසු කරනවා, දවසින් දවස.

ඊළඟට, කෝච්චි සම්බන්ධව ගත්තොත්, කැඩුණු කෝච්චි හදන එක ගැනත් අපි කථා කරලා තිබෙනවා. ඔබතුමා දන්නවා, ජනවාරි 2වැනි දා ජනාධිපතිතුමාගේ නායකත්වයෙන් අපි railway stationsවල තත්ත්වය දියුණු කරන්න වැඩසටහනක් ආරම්භ කළා, "Dream Destination" කියලා. ඒ අනුව ගාල්ල, තල්පේ railway station එක නවීකරණය කරන්න සමාගමකින් උදව් කළා. Clean Sri Lanka වැඩසටහන සහ අමාත්‍යාංශය විධියට අපි උදව් කළා, Sri Lanka Railways එකට. අපි ඒ railway station එක 2වැනි දා උදේ විවෘත කරනවා. ඒ ඔක්කෝම කරන්නේ මේ cyclone එකෙන් විපතට පත් වූවන්ට උදව් කරන අතරේ. අපි 2වැනි දා උදේ ඒ railway station එක විවෘත කරනවා. ගයන්ත කරුණාතිලක මන්ත්‍රීතුමා ඒ පැත්තේ හිටියොත් ඔබතුමාත් එන්න - open invitation.

ඒ වාගේම තමයි පේරාදෙණිය නව පාලම. ඔබතුමා දන්නවා, එතැන අතිවිශාල island එකක් හැදිලා තිබුණා, කුණුවලින්. කුණු කිව්වාට විශාල බට ගස් යනාදියෙන්. ඉඩම් අංශයේ අයත් නාවික හමුදාවත් ගිහිල්ලා ඉතාම අමාරුවෙන් ඒ ටික සම්පූර්ණයෙන් අයින් කළා. පෙරේදා අපි පේරාදෙණිය විශ්වවිද්‍යාලයේ මහාචාර්යවරුන්ගෙන් සම්පූර්ණ සැලසුම අරගෙන තිබෙනවා එතැන මොකක්ද වෙලා තිබෙන්නේ කියලා බලන්න. අද ඒ ගැන Zoom හරහා සාකච්ඡාවකුත් පැවැත්වෙනවා. ඒ තොරතුරු එක්ක ඉංජිනේරුවරු "ප්‍රශ්නයක් නැහැ" කියලා කියාවි කියන අදහස තමයි දැනට තිබෙන්නේ, අපට පෙනෙන විධියට. එහෙම වුණොත් ඔය පේරාදෙණිය railway පාලම - පරණ පාලම - මාර්තු 31වැනි දා වෙනකොට හදලා ඉවර කරලා, සිංහල-දෙමළ අලුත් අවුරුද්දට කලින් ඒක උඩින් කෝච්චි ගෙනයනවා කියන එක තමයි අපේ plan එක. හැබැයි, ඒ විතරක් නොවෙයි. පේරාදෙණියේ railway track එක double track එකක් කරන්න කියලා දිගු කාලීන ඉල්ලීමක් තිබෙනවා. ඒ අනුව අපි පේරාදෙණියේ හදන අලුත් track එකේ විශාල පාලමක් හදන්න පටන් ගන්නවා. ඒවා කරනවා.

ඒ වාගේම අපේ රටේ රජයේ සේවකයෙක් කෝච්චියට සීසන් ටිකට් එකක් ඉස්සර වෙලාම ගන්නවා නම් කොළඹට ඇවිල්ලා ලියාපදිංචි වෙන්න ඕනෑ. යාපනයේ පදිංචි රජයේ සේවකයෙක් කෝච්චියට සීසන් ටිකට් එකක් ගන්නවා නම් කොළඹට ඇවිල්ලා ලියාපදිංචි වෙන්න ඕනෑ. ඒක තමයි මේ රටේ තත්ත්වය. පසුගිය දවස්වල cyclone එක නිසා ගොඩක් trains cancel වුණා. එතකොට ඒ මුදල් refund කරන්න විධියක් නැහැ. Refunds ගෙවන්න පුළුවන්කම තිබෙන්නේ, කොළඹ කොටුව සහ මරදාන railway stationsවලින් විතරයි. ඒකත් ඉතාම සීමිත මුදලක් පමණයි. මමත් ගිහිල්ලා බැලුවා මොකක්ද මේ කියලා. මගේ දැනීමේ හැටියට දුම්රිය සාමාන්‍යාධිකාරිතුමා දැන් දැනුවත් කරලා තිබෙනවා, trains cancel වුණාම refunds ගෙවන්න පුළුවන් railway stations ප්‍රමාණය වැඩි කරන්නත්, මුදලේ ප්‍රමාණය වැඩි කරන්නත්.

අපේ ලොකු සැලැස්මක් තිබෙනවා. ඉතා ඉක්මනින්, විශේෂයෙන්ම කෝච්චි සීසන් ටිකට් එක online ගන්න පුළුවන් ආකාරයට හදන්න. එතකොට කෝච්චි සීසන් ටිකට් එක ගන්න කවුරුවත් කොහේවත් එන්න ඕනෑ නැහැ; ගෙදර ඉඳන් ඒක ගන්න පුළුවන්. අපි ඒක කරනවා. මට නිශ්චිතව දිනයක් කියන්න බැහැ. නමුත් තව මාස 3කට කලින් ඒක කෙරෙයි කියලා මම හිතනවා.

ඒ වාගේම ලංකාවේ බොහෝ ආයතන මේ ආපදාවෙන් නැඟී සිටින්න වැඩ කරන බව ඔබතුමා දන්නවා. නමුත්, මම ඊයේ මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවට ගියා. ඒ දෙපාර්තමේන්තුව දැක්කාම ඇත්තටම මට දුක හිතුණා. ඉතාම සීමිත ඉඩ කඩක් ඇතුළේ සේවක සේවිකාවන් pack වෙලා shifts දෙකක් කරනවා. මොකටද? පසුගිය කාලයේ කරපු සොරකම් නිසා, පසුගිය කාලයේ කරපු වැරදි වැඩ නිසා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, අතිවිශාල වශයෙන්, - අපට තවමත් driving licence එක දීගන්න බැරි රටක් බවට පත් වෙලා තිබෙනවා. අද driving licence එක ගන්න ගිහිල්ලා පාස් වුණොත් ඒක ලැබෙන්නේ මාස ගණනකින්. සමහර විට අවුරුදු ගණනක් ගිහිල්ලා තමයි ඒ driving licence එක ලැබෙන්නේ. අපි මීට මාසයකට කලින් පටන් ගත්තා, අලුත් backlog එක print කරන්න. දැන් ඒක පටන් අරගෙන තිබෙනවා. අපි එක මාසයක් ඇතුළත driving licence 125,000ක් print කරලා තිබෙනවා. අපේ target එක පෙබරවාරි 28. නමුත්, අවුරුදු ගණනක් තිස්සේ මෙතැන ඉන්න සමහර අය දායක වෙලා හදපු ඒ අවුල ලිහලා, මාර්තු 31 දිනට කලින් අපි driving licences ලබා ගැනීමට තිබෙන පෝලිම නැති කරනවා. මේ ව්‍යසනයෙන් පාලම් කැඩිලා, ඉස්කෝල කැඩිලා තිබෙන වෙලාවක තමයි අපි මේ දේවල් කරන්නේ.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු ඇමතිතුමනි, ඔබතුමාට තවත් විනාඩි දෙකක කාලයක් පමණයි ඉතිරිව තිබෙන්නේ.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට විනාඩි 11ක කාලයක් තිබුණා. මට තව විනාඩි දෙකහමාරක කාලයක් ඉතිරිව තිබෙනවා.

ඒ වාගේම, මේ කාරණයත් මම කියන්න කැමැතියි. විදේශගත ශ්‍රී ලාංකිකයෝ ඉන්නවා. ඒගොල්ලන් ලංකාවේ citizensලා. නමුත්, ඒ අයට පිට රට driving licence එකක් තිබෙනවා නම්, අපි ලබන සතියේ Christmas තෑග්ගක් විධියට විදේශගත ශ්‍රී ලාංකිකයෝ ලංකාවට එද්දී boarding pass එක ඉදිරිපත් කළාට

[ගරු බිමල් රත්නායක මහතා]

පසුව, එයාට පිට රට driving licence එකක් තිබෙනවා නම්, කටුනායකදී එයාටත් පුළුවන් driving licence එක එතැනින් ගන්න. ඔහුට හෝ ඇයට මෝටර් රථ කාර්යාලයට ඇවිල්ලා කාලය නාස්ති කරගන්න ඕනෑ නැහැ. ඒක තමයි විදේශගතව සිට ලංකාවට එන ශ්‍රී ලාංකිකයන්ට අපි නත්තලට දෙන තෑග්ග. අපි ඒ අයව උනන්දු කරන්නත් ඕනෑ නේ.

අනෙක් කාරණය තමයි, SLTB එක. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආපදාවත් එක්ක අපි SLTB බස් 1,000යි ධාවනය කළේ. දැන් SLTB බස් රථ 4,800ක් ධාවනය කරනවා. SLTB එක අලුත් දෙයක් කළා. කෝච්චි නැති වුණාට පස්සේ මහනුවර ඉඳලා කොළඹට SLTB එකේ බස් දාලා ඒවායින් දැනුත් මිනිස්සු ගේනවා. හලාවත වාගේ ඩිපෝ සම්පූර්ණයෙන්ම ජලයෙන් යට වුණා. ඒ තැන් බලන්න සභාපතිතුමා ගියා. අපි ඒ ඩිපෝ එක තිබුණාට වැඩිය හොඳට හදනවා. මම කියන්නේ නැහැ ඒක අතිසුපිරියට හදනවා කියලා. ඩිපෝ කියන්නේ, හිටපු පාලකයන් විශාල වශයෙන් විනාශ කරපු ආයතන. අද අපට උපදෙස් දෙන්න ගොඩක් අය ඉන්නවා නේ. මේ අය රට කාපු, රට විනාශ කරපු අය. ඇත්තටම මේ අය SLTB එකට කරපු විනාශය උඩුදුම්බරට වුණු විනාශයට වඩා වැඩියි. SLTB එකට රාජපක්ෂලා, වික්‍රමසිංහලා, ප්‍රේමදාසලා කරපු විනාශය අති විශාලයි. මම ඉතාම නිහතමානීව කියනවා, ඔය මුළු මධ්‍යම කඳුකරයට කරපු විනාශයට වඩා ඒ විනාශය වැඩියි කියලා. අපි ඒක අමාරුවෙන් ගොඩ ගනිමින් ඉන්නවා. ඒ නිසා විනාශ වූ ඩිපෝ තිබුණාට වැඩිය හොඳට අපි හදනවා. අපි ඒ වැඩ කටයුතු පටන් අරගෙන තිබෙනවා. ඒ වාගේම තමයි අපි ජනවාරි මාසය තුළදී SLTB එකේ ටිකට් එක සඳහා bank card payments පටන් ගන්නවා. එතකොට ඉතුරු සල්ලි සම්බන්ධයෙන් ප්‍රශ්නයක් වෙන්නේ නැහැ. එතකොට සමහර කොන්දොස්තරලාට මාටියා ගහන්නත් බැහැ.

ඒ වාගේම කොළඹ සහ මන්නාරමේ ගංවතුර පාලනය සම්බන්ධයෙන් කටයුතු කරන්නය කියලා ජනාධිපතිතුමා අපට උපදෙස් දීලා තිබෙනවා. ඒවා ටිකක් දිගු කාලීන වැඩ. මේ ඔක්කෝමත් එක්ක අපි ඒ වැඩත් පටන් ගන්නවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

ඒ වාගේම තමයි, නාගරික සංවර්ධනය. මම ඒකත් කියන්න ඕනෑ.

**ගරු රිෂාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)
මන්නාරමේ මොනවාද කරන්නේ?

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
මන්නාරම සම්බන්ධයෙන් කරන දේ මම පස්සේ කියන්නම්. ඒකට දැන් මට වෙලාව නැහැ. මම මන්නාරමට ගියා. මම කරපු ඒවා දැක්කා. ගරු රිෂාඩ් බදියුදීන් මන්ත්‍රීතුමනි, ඔබතුමා DDC එකේදී මේ ගැන කිව්වා. ඒ ටික තමයි කරන්න යන්නේ. නමුත්, ඒක කරන්න machine එකක් හදන්න ඕනෑ නේ. ඒක තමයි අපි කරන දේ. අද එතැන නියෝජ්‍ය වාරිමාර්ග ඇමතිතුමා ඉන්නවා. හෙට නියෝජ්‍ය වාරිමාර්ග ඇමති මන්නාරමට එනවා. පෙරේදා නියෝජ්‍ය කෘෂිකර්ම ඇමති මන්නාරමට ආවා. 23වැනිදා නියෝජ්‍ය විදුලිබල ඇමතිතුමා මන්නාරමට එනවා. ජනාධිපතිතුමා 13වැනිදා, මම 16 වැනිදා ආවා. ඊට පස්සේ තවත් නියෝජ්‍ය ඇමතිවරු 3දෙනෙක් එනවා. අපි මන්නාරමට හොඳට සලකනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට නියමිත කාලය අවසන් නිසා මම මේ කාරණයත් කියලා මගේ කථාව අවසන් කරන්නම්. නාගරික සංවර්ධන අධිකාරිය ගැනත් මම කියන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, නාගරික සංවර්ධන අධිකාරිය යටතේ කොළඹ නගරයේ ප්‍රධාන flats 24ක් තිබෙනවා. අපි ඒ සියල්ල උපරිම වශයෙන් නවීකරණය කරනවා. අපි බලාපොරොත්තු වෙනවා ඒ ජනතාවට ඔප්පු දෙන්න. අපි ජනතාවගෙන් ඉල්ලා සිටිනවා, අපි ඔබට ඔප්පු ලබා දෙනවා; ඔබ ගෙවිය යුතු කුඩා මුදල් ප්‍රමාණ තිබෙනවා; කරුණාකර ඒවා ගෙවන්න කියලා. එතකොට අපට මේක කරන්න ලේසියි. ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරියට අයත් ගෙවල්වල ඉන්න මිනිස්සු තවම ලයිට් බිල, වතුර බිල ගෙවන්නේ පෝලිම්වල ඉඳලා. ගරු මනෝ ගනේසන් මැතිතුමනි, 2026 ජනවාරි 31වැනි දා වන විට අපි මේ දේවල් online ගෙවන්න පුළුවන් ආකාරයට හදනවා. එතකොට කාටවත් තැන් තැන්වලට ගිහිල්ලා රස්තියාදු වෙන්න ඕනෑ නැහැ. ඒ වාගේම තමයි කඳුකරයේ. ඒක අවසාන සැලසුම ආවාට පසුව අපි බලාපොරොත්තු වෙනවා, ඒ උපදෙස් මාලාවට එනවා නම්, සැලසුමට එනවා නම්, කඳුකරය තුළ ඒ දෙපාර්තමේන්තු සියල්ල එකතු කරගෙන ඉතා හොඳ පහසුකම් තිබෙන කුඩා නගර, townships රජයෙන් අපට ලබා දෙන මඟපෙන්වීම මත හදන්න.

මේ සියල්ල අතරේ, ජනවාරි පළමුවෙනි දා ඉඳලා මාර්ග ආරක්ෂාව පිළිබඳව අපි අලුතෙන් නීතිරීති ගැසට් කරනවා. ඒ නිසා, රට වුට්ටක්වත් නතර වෙලා නැහැ. අපි ආපදාව කළමනාකරණය කරනවා වාගේම, ආපදාව වෙන්න කලින් රට තිබුණාට වඩා හොඳ තැනකට රට ගන්නවා. ඒ වාගේම තිබුණු සැලසුම් සියල්ල අපි track එකට දාලා කරනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. මම හිතන විධියට ඒක තමයි ආපදාව අපිට දුන්නු අභියෝගය. දැන් ගොඩාක් අය කියන්නේ "දිට්වා පරදන මෙහෙයුම" කියලා. අපි දිට්වා පරදන ඒ මෙහෙයුම ආරම්භ කරලා තිබෙනවා.

බොහොම ස්තුතියි, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 6ක කාලයක් තිබෙනවා.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මට විනාඩි 8ක් තිබුණා නේ?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
අවසානය වන විට කාලය අඩු වෙලා තිබෙනවා, ගරු මන්ත්‍රීතුමා.

[අ.භා. 4.16]

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ආර්ථික විද්‍යාව හැදෑරීමේදී මෙවැනි කථාවක් තිබෙනවා. අපි හිතමු, වීදුරුවක් තිබෙනවා, නැත්නම් ජනේලයක් තිබෙනවා කියලා. ජනේලයට ගලක් ගහලා ජනේලය කැඩුණොත් අපි අලුත් වීදුරුවක් දාලා ජනේලය ආපහු

හදනවා. එතකොට ආර්ථිකය වර්ධනය වෙනවා. හැබැයි, තිබෙන්නේ එක ජනේලයයි. හැබැයි, ඇත්තවශයෙන්ම අපිට ජනේල දෙකක් තිබෙන්න ඕනෑ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මෙන්න මෙතැන තමයි අපි හිතන්න ඕනෑ. *[බාධා කිරීමක්]* අපිට ජනේල දෙකක් ඕනෑ, ගරු බිමල් ඇමතිතුමනි. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ, මම කියනදේ අහගෙන. අපි පාරවල් කැඩුණාම පාරවල් හදනවා. හැබැයි, ඒ පාරවල්ම තමයි තිබෙන්නේ. හැබැයි, අපිට තවත් පාරවල් ඕනෑ. ඉස්පිරිතාල ගොඩනැඟිලි කැඩුණාම අපි ඒවා හදනවා. හැබැයි, අපිට තව ඉස්පිරිතාල ඕනෑ. එතකොට දැන් මේ කියන්නේ අපි ණය සතයක්වත් ගන්නේ නැතිව කරනවා කියලායි. ඇත්ත වශයෙන්ම ණය සතයක්වත් ගන්නේ නැතිව නොවෙයි. රුපියල් බිලියන 3,740ක් ණය ගන්නවා. ඒ ණය ගන්න ඕනෑ. මොකක්ද, මේකෙන් වෙන්නේ? කරන්න ගිය දේවල් කරනවා වෙනුවට, මොකක්ද වෙන්නේ? යම් ප්‍රමාණයක් කරනවා. අර කැඩිච්ච දේවල් හදනවා. ඉතින්, මම හිතන විධියට මෙන්න මෙතැන දී ආර්ථිකය ඉස්සරහට වර්ධනය කර ගන්න යනකොට, දරිද්‍රතාව සියයට 25 ඉඳලා ගොඩදානකොට රජය කල්පනා කරන්න ඕනෑ, රජයේ priority එක මොකක්ද, ප්‍රමුඛතාව දිය යුත්තේ කුමකටද කියලා. අපි පොඩි කාලයේ දී ඉස්කෝලේ හදනවා නේ Venn diagrams. ඒ Venn diagram එකේ තිබෙනවා රජයට කළ හැකි දේවල්. ඊට පස්සේ තිබෙනවා රජයටත් කළ හැකි, පෞද්ගලික අංශයටත් කළ හැකි දේවල්. මෙතැනදී රජයට කළ හැකි දේවල් අපි කරමු. Public-private partnerships, එහෙම නැත්නම් පෞද්ගලික අංශය හරහා අපට අවශ්‍ය යටිතල පහසුකම් හදා ගන්න අපි ආයකත්වය ගනිමු. උදාහරණයක් හැටියට, SriLankan Airlines ගනිමු. එයට රුපියල් බිලියන 100ක් අපි වෙන් කරමු. අපි විදුලිබල පනත හකුළා ගත්තා. උදාහරණයක් හැටියට ගත්තොත්, විදුලිබල පනත හකුළා ගත්ත නිසා transmission lines හදා ගන්න පෞද්ගලික අංශයේ දායකත්වය ගන්න අපිට හැකියාවක් නැහැ. Distribution හදා ගන්න පෞද්ගලික අංශයෙන් දායකත්වයක් ගන්න අපිට හැකියාවක් නැහැ. හැබැයි, ඒක පෞද්ගලික අංශයටත් කරන්න පුළුවන්. අපි විතරක්ම කරන්න ඕනෑ නැහැ. අපි ණය ගන්නවා. ගරු බිමල් ඇමතිතුමා කියපු දේ හරියටම නිවැරදි නැහැ. රුපියල් බිලියන 3,740ක් ණය ගන්නවා. කරන්න ගිය දේවල් වෙනුවට මේවා තමයි කරන්නේ. ඒ නිසා policy එක ගැන පොඩ්ඩක් හිතන්න කියන එක තමයි මම කාරුණිකව ඉල්ලන්නේ.

අපි දවස් 10කට විතර කලින් හඟුරන්කෙත, රිකිල්ලගස්කඩ, මතුරට, වලපනේ ප්‍රදේශවලට ගියා. එතැනදී කැටයාපතන කියන ප්‍රදේශයටත් ගියා. එතැන 300දෙනෙක් විතර හිටියා. ඇත්ත වශයෙන්ම මනුෂ්‍යයෙක් ඇඬුවා. මොකද, ඔවුන්ගේ සමහර ගෙවල් කඩා වැටිලා. සමහර ගෙවල් කඩා වැටිලා නැහැ, නමුත් යන්න බයයි. ආණ්ඩුවෙන් සමහරු කියනවා, එතැනට යන්න කියලා. චන්ද්‍රිකා මැතිනියගේ කාලයේ ගෙනාවා, National Involuntary Resettlement Policy කියලා එකක්. ඒ කියන්නේ කැමැත්තෙන් තොර නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය. අපි තවම ඒක නීතියක් බවට පරිවර්තනය කරලා නැහැ. අපිට මිනිස්සුන්ට බල කරන්න බැහැ. බල කරන්න එපා. ඔවුන්ගේ ප්‍රශ්නය තේරුම් ගන්න. මෙතැනදී human rights ගැනත් හිතන්න. සමහර කට්ටියට තමයි මේ ආපදාව වැඩියෙන් වැදිලා තිබෙන්නේ. ඒ ප්‍රදේශවල ජීවත් වෙන පුද්ගලයෝ කවුද කියලා හොයා බලන්න. ඔවුන් කවුද, ඔවුන් කරන්නේ කුමක්ද කියලා හොයා බලන්න. ඔවුන්ව නැවත පදිංචි කරනකොට ඔවුන් කරපු දේ නැවතත් ඔවුන්ට කරන්න පුළුවන්ද? මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, ඒ නිසා කැමැත්තෙන් තොර නැවත පදිංචි කිරීමේ ප්‍රතිපත්තිය අපි ඔක්කොම එකතු වෙලා නීතියක් බවට පරිවර්තනය කරමු කියලා මම යෝජනා කරනවා.

ඒක ආපදාවට විතරක් නොවෙයි, සංවර්ධන වැඩ කටයුතු කරනකොටත් අවශ්‍ය වනවා. දැන් කාටවත් මට කියන්න හැකියාවක් නැහැ, සල්ලි නැහැ, මේක කරන්න බැහැ කියලා. Budget එක පටන් ගන්නකොට මම කිව්වාම භාණ්ඩාගාරයේ ඕනෑ තරම් සල්ලි තිබෙනවා කියලා, සමහර අය මට කාඩ් ගැහුවා. ඒකට හේතුවක් තිබෙනවා. ඒ තමයි, මිනිස්සුන්ගේ බෙල්ල තද කරලා බදු ගැසීම. එහෙම තමයි බදු ලැබුණේ. ඊට පස්සේ අනපේක්ෂිත ලෙස වාහන ආනයනය කිරීම නිසාත් බදු ලැබුණා. මේ මුදල් අවශ්‍ය විධියට දැන් වියදම් කරන්න.

2027 අවුරුද්ද විතර වනකොට අපට අවශ්‍ය වනවා, මේ රුපියල් බිලියන 500ට අමතරව තවත් රුපියල් බිලියන 500ක්. මොකද, මේකෙන් කරන්න පුළුවන් දේවල් සීමිතයි. 2026-2027 අවුරුද්දේත් රුපියල් ට්‍රිලියනයක් වියදම් කරනවා නම් අපි ප්‍රමුඛතාව හඳුනා ගන්න එක වඩාත්ම හොඳයි, කොයි ආකාරයටද අපේ වියදම් කළ යුත්තේ කියන එක සම්බන්ධයෙන්. මට වෙලාව නැති නිසා මම එක දෙයක් විතරක් කියන්න කැමැතියි.

අද Verité Research ආයතනයෙන් කියලා තිබුණා, IMF එකට ගිහිල්ලා ඩොලර් මිලියන 200ක පමණ quick loan එකක් ලබා ගත්තොත්, සමහර වෙලාවට ඒකට සියයට 6ක වාගේ පොලියක් ගෙවන්න වෙයි කියලා. ඒ නිසා ඔවුන් අහලා තිබුණා, ලංකාවේ අපට dollar bond එකක් float කරන්න බැරි ඇයි කියලා. ඔයගොල්ලන් dollar bond එකක් float කළා. බලාපොරොත්තු වුණා, ඩොලර් මිලියන 250ක් දක්වා ඒක upsize කරන්න. ඩොලර් මිලියන 50කට දානවා, 250ක ප්‍රමාණයක් ගන්න බලාපොරොත්තු වනවා කිව්වා. අන්තිමට කීයද ආවේ? අවුරුද්දට ඩොලර් මිලියන 37ක් ද කොහේද ආවා. ඊට පස්සේ අවුරුදු දෙකට මිලියන 13ක් ද කොහේද ආවා. අවුරුදු 3ට කවුරුවත් ඉදිරිපත් වුණේ නැහැ. එතකොට සියයට 6 ගණනේ තමයි කොහොමත් ලංකාවෙන් මේ අවස්ථාවේදී Domestic Dollar Bond එකෙන් හරි සල්ලි ගන්නේ. ඒ නිසා මම කියන දේ තේරුම් ගන්න. ලංකාවට ඔය කියන තරම් appetite එකක් නැහැ, මිනිස්සුන්ගෙන් ඒ මුදල් ආයෝජනය කරන්න. "Rebuilding Sri Lanka" fund එකක් ගැන ඔයගොල්ලන් කථා කළාට එහෙම එකක් නැහැ. රජයේ මුදල් පිළිබඳ කාරක සභාවේ සභාපතිවරයා හැටියට මම නැවතත් ඒක කියනවා. මම ජනාධිපතිවරයාට මේ සම්බන්ධව ඊයේ ලියුමකුත් ලිව්වා. තවදුරටත් ප්‍රමාද කරන්නේ නැතිව කරුණාකරලා මේ පාර්ලිමේන්තුවට මේක ගෙනැල්ලා පාර්ලිමේන්තුවේ සම්මත කරගෙන ඇත්තවශයෙන්ම මේ fund එක තිබෙනවා කියලා ලෝකයට කියන්න. දැනට මුදල් යවන්නේ Deputy Secretary to the Treasuryගේ account එකට. ඒකේ වැරැද්දක් නැහැ. නමුත්, ඒක "Rebuilding Sri Lanka" fund එක නොවෙයි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට නියමිත කාලය අවසන් නිසා කථාව අවසන් කරන්න.

**ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා**
(மாண்புமிகு (கலாநிதி) ஹர்ஷ த சில்வா)
(The Hon. (Dr.) Harsha de Silva)
හොඳයි. අවසාන වශයෙන් මම මේ කාරණයත් කියන්නම්.

දැන් බලන්න, මේ සියලු දේ එක්ක රුපියලට මොකක්ද වෙන්නේ කියලා. අද රුපියලේ අගය 313ක් ද, 314ක් ද වනවා. ලොකු pressure එකක් රුපියලට තිබෙනවා. මේ සියලු දේ එකිනෙකට සම්බන්ධ වෙලා තිබෙනවා. එම නිසා රජයට කරන්න

[ගරු (ආචාර්ය) හර්ෂ ද සිල්වා මහතා]

පුළුවන් දේවල් රජය කරන්න. රජයට සහ පෞද්ගලික අංශයට එකතුව කරන්න පුළුවන් දේවල් තිබෙනවා නම්, පෞද්ගලික අංශයේ දායකත්වයත් අරගෙන ඒක කරන්න. එහෙම ප්‍රමුඛතාව හඳුනාගෙන අපි ඉස්සරහට යමු කියන එකයි මට මේ අවස්ථාවේදී කියන්න තිබෙන්නේ.

බොහොම ස්තුතියි.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 5ක කාලයක් ලැබෙනවා.

[பி.ப. 4.23]

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

நன்றி, கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே! எனக்கு ஒதுக்கப்பட்டுள்ள நேரத்தில் இரண்டு நிமிடங்கள் தமிழில் கதைக்கலாமென ஆசைப்படுகின்றேன். இந்தச் சபையில் கௌரவ பாதுகாப்புப் பிரதி அமைச்சர் இருக்கிறார். அவர் வழமையாக உரைபெயர்ப்பைக் கேட்கக்கூடிய headphoneஐ காதில் போடுவதில்லை; Helmetஐத்தான் போட்டுக் கொண்டு இருப்பார். நான் கதைப்பது அவருக்கு விளங்குவதில்லை. இப்போதும் எங்கேயோ பார்த்துக்கொண்டுதான் இருக்கிறார். திருகோணமலையின் வெருகல் பிரதேசத்திலுள்ள மக்களுக்கு நிவாரணம் கொடுப்பதற்காக உங்களுடைய சிலர் சென்றிருக்கிறார்கள். கடைசியில், முஸ்லிம் இனத்தைச் சேர்ந்த அனஸ் என்ற DS - Divisional Secretary, நிவாரணம் கேட்ட மக்களுக்கு எதிராக வழக்குத் தாக்கல்செய்து, நான்கு பேரை arrest பண்ணச்செய்து இருப்பதோடு, மூன்று பேரை சிறையில் அடைக்கவும் செய்திருக்கிறார். இது எவ்வளவு வெட்கமான விடயம் என்பதை யோசித்துப் பாருங்கள்! கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, "அரசாங்கம் கொடுக்கும் நிவாரணம் ஏன் எங்களுக்கு இல்லை?" என்று கேட்டதற்காக மூன்று பேரை சிறையில் அடைத்திருக்கிறார்கள். රාජකාරියට බාධා කිරීම என்று சொல்லி, இன்னும் 17 பேரை பொலிஸார் தேடிக்கொண்டு இருக்கிறார்கள். வெட்கம்! கௌரவ பாதுகாப்புப் பிரதி அமைச்சர் அவர்கள் சபையிலிருந்து எழுந்து வெளியே சென்று விட்டார். நான் சில விடயங்களைச் சிங்களத்தில் சொல்ல ஆசைப்படுகின்றேன்.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මම දෙමළ. මම ජාතිවාදය ගැන කථා කරන්න යන්නේ. මම දෙමළ, මගේ ආගම හින්දු. හැබැයි, මගේ අතේ තිබෙන්නේ අස්ගිරි මහා නායක හාමුදුරුවෝ දමපු පිරිත් නූලක්. හැබැයි, ඔබතුමන්ලා ලජ්ජා වෙන්න ඕනෑ. *[බාධා කිරීමක්]* ඇහුණේ නැහැ. කාගේ හෝ කටහඬක් තිබෙනවාද? මම ගිහිල්ලා අස්ගිරි මහා නායක හාමුදුරුවන් හම්බවෙලා කථා කළා, අපේ දෙමළ ජනතාවගේ ප්‍රශ්න ගැන. හැබැයි, උන්වහන්සේලා මට උත්තර දුන්නා, මේ ආණ්ඩුව ඉන්නේ තව පොඩි කාලයයි කියලා. ඒ තරමටම මේ රට ඇතුළේ ජීවත් වන සිංහල, දෙමළ, මුස්ලිම් ජනතාවට එපා වෙලා තිබෙන්නේ. මමත් බැලුවා, ගෙදර තිබෙන ටකරන් ටිකක් ගලවලා රුපියල් ලක්ෂ 20ක් ගන්න පුළුවන්ද කියලා. *[බාධා කිරීමක්]* ඉන්නකෝ, පාපිස්සෝ. රුපියල් ලක්ෂ 20ක් ගන්න පුළුවන්ද කියලා බලන්න, ඇත්තටම මමත් ටකරන් දෙකක් ගැලෙව්වා. හැබැයි, ටකරන් දෙකක් ගියා කියලා රුපියල් ලක්ෂ 20ක් දෙන්නේ නැහැයිලු. දැන් ඒ ටකරන් දෙක දමන්න මට රුපියල් 20,000ක් යනවා. *[බාධා කිරීමක්]*

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

ලජ්ජයි, ටකරමක් ගියත් රුපියල් ලක්ෂ 10ක් දෙනවා කිව්වා. මම හිතන විධියට, දැන් ලොක්කා එනවා. ලොක්කා එනකොට අපි එළියට යනවා. හැබැයි, ජනාධිපතිතුමා ආවාට පස්සේ මම අහන්න කැමැතියි, මගේ ගෙදර ගැලවුණු ටකරන් දෙකට රුපියල් ලක්ෂ 20ක් ගන්න පුළුවන්ද කියලා. ඇයි අනේ, රටට ඔච්චර බොරු කියන්නේ?

මට තව එකක් කියන්න තිබෙනවා. *[බාධා කිරීමක්]* ඇහුණේ නැහැ. නැඟිටලා point of Order එකක් අරගෙන කථා කරන්න. ලජ්ජාවේ බැහැ. ටකරන් නොවෙයි, underwears දෙන්නවත් මේ රටේ සල්ලි නැහැ. ඒක මතක තියාගන්න. තමුන්නාන්සේලාත්

***[මූලාසනයේ අණ පරිදි ඉවත් කරන ලදී.]***
*[அக்கிராசனக் கட்டளைப்படி அகற்றப்பட்டுள்ளது.]*
*[Expunged on the order of the Chair.]*

නැතුව ඇවිල්ලා තිබෙන්නේ. බුද්ධාගමේ කවුරු හරි මෙතැන ඉන්නවා නම් කරුණාකරලා අත උස්සන්න කියන්න. මම හින්දු, මම දෙමළ. හැබැයි, මම අනික් ආගමික නායකයින් ළඟට ගිහිල්ලාත් වඳිනවා.

මම කියන්නත් කැමැති නැහැ, බුදු පිළිම ගැන කියලා කිව්වා, පිළිම වන්දනාව ගෝත්‍රික වැඩක් කියලා. මේ අය ඒ වාගේ තත්ත්වයකට අපේ මේ ලස්සන සිංහල රට, දෙමළ රට, මුස්ලිම් රට තල්ලු කරගෙන යනවා, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

මට තව කාරණයක් කියන්න තිබෙනවා. ඒ, Dr. Bellana ගැන. මම කෙළින්ම කියන්නම්.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)

ගරු මන්ත්‍රීතුමනි, ඔබතුමාට තව විනාඩි දෙකක කාලයක් තිබෙනවා.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)

Thank you.

Dr. Bellana කියන්නේ, තනිකරම දේශපාලනය කරන පුද්ගලයෙක්. මම ඒක ෂුවර් එකටම කියනවා. රනිල්ගේ ගේම් එක විතරයි බෙල්ලන ගහන්නේ. හැබැයි, ලජ්ජාවේ බැහැ, හිටපු Secretary 2020 දී රුපියල් මිලියන 210ක් වියදම් කරලා Colombo National Hospital එකේ laboratory එකට machines 5ක් අරගෙන තිබෙනවා. ඒවා අරගෙන තිබෙන්නේ හේමාස් එකෙන්. හේමාස් එකෙන් ඔහුට "කට්" එකක් ඇවිල්ලා තිබෙනවා. කුමාර වික්‍රමසිංහ, National Hospital එකේ හිටපු Directorට "කට්" එකක් ඇවිල්ලා තිබෙනවා. බෙල්ලන ඒකට විරුද්ධව complaint එකක් දාලා තිබෙනවා. ඊට පස්සේ බෙල්ලන අයින් කරලා. මේක මාර රටක් නේ. මම මේ පාර්ලිමේන්තුවේ ඉන්න නිසා ඔයගොල්ලන්ට මාව අයින් කරන්න බැරිව ඉන්නේ. කවුරු හරි කෙනෙක් අල්ලස් හෝ දූෂණ චෝදනා විමර්ශන කොමිසමට ගිහිල්ලා පැමිණිල්ලක් කළාම හෙට වනකොට ලියුමක් එනවා, "උඹලා ගෙදර පලයල්ලා" කියලා. මට ලජ්ජාවේ බැහැ.

දැන් ජනාධිපතිතුමා එනවා කිව්වා නේ. ආවොත් එතුමාට මේ ගැන කියන්න. මම එතුමා ළඟට ගිහිල්ලා මුණගැහුණු වෙලාවේ මගේ අත අල්ලලා මිරිකලා ඇහුවා, "මල්ලී, ඔයාට තිබෙන ප්‍රශ්නය මොකක්ද, ඇයි පාර්ලිමේන්තුවේ වැඩිපුර සද්දෙ දාන්නේ?" කියලා. මට කිසි ප්‍රශ්නයක් නැහැ, ජනාධිපතිතුමනි. මම කථා කරන්නේ දුප්පත් මිනිස්සු වෙනුවෙන්. ගම්වලට ගිහිල්ලා බලන්න. දැන් තමුන්නාන්සේලාට හෙල්මට් දමාගෙනවත් යන්න පුළුවන්ද කියලා කියන්නකෝ. දැන් 225දෙනාටම කැබ් ගෙන්වන්න යනවා. පොලීසිය භාර ඇමතිතුමා දැන් මේ සභාවේ ඉන්නවා. එතුමාටත් දැන් පාරේ යන්න බැරිවෙලා තිබෙන්නේ. *[බාධා කිරීමක්]* පොඩ්ඩක් ඉන්නකෝ, හිනාවෙන්නේ නැතුව. අපි නම් තුවක්කුව අරගෙන යනවා. අපි දෙමළ මිනිස්සු. එක සිංහල මිනිහෙක්වත් මාව මරන්නේ නැහැ. භය වෙන්න එපා. තුවක්කුවත් අරගෙන මම ගම්වලට ගිහිල්ලා පාරේ ඇවිදිනවා. ඔබතුමන්ලා මට තුවක්කුවක් දීලා තිබෙනවා නේ. අපේ ප්‍රශ්න බේරාගන්න අපට පුළුවන්. හැබැයි, අපේ ආරක්ෂක ඇමතිතුමා යනවා, එතුමාට ඉස්සරහ ගාඩිලා 10යි, පිටුපස ගාඩිලා 20යි. ලජ්ජාවේ බැහැ, මේක ඔබතුමන්ලාගේ රට නේ. අපි ගම්වලට යනවා නම්, ඔබතුමන්ලාට යන්න බැරි ඇයි? පුළුවන් නම් යන්න.

කරුණාකරලා බෙල්ලනගේ complaint එක විමර්ශනය කරලා බලන්න. එහෙම විමර්ශනය කරලා බලලා, ඒක වැරදි නම් කමක් නැහැ. මට තත්පර 20ක් දෙන්න, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි.

හැබැයි, ඔයගොල්ලන් ගිහිල්ලා රනිල්ව court එකට දැම්මා. ඊට පසුව බෙල්ලන බේරන්න ගියා. ලජ්ජා නැද්ද? මේ Ondansetron බෙහෙත ගහලා කාන්තාවන් දෙදෙනෙක් මැරිලා තිබෙනවා. හිතලා බලන්නකෝ, ඔබතුමන්ලාගේ ගෙදර දෙදෙනෙක් මැරිලා තිබෙනවා නම් ඔයගොල්ලන් ඔහොම කරනවාද කියලා. ඔබතුමන්ලාගේ ගෙදර දෙදෙනෙක් මැරිලා තිබෙනවා නම් ඔයගොල්ලන් ඔහොම කරනවාද?

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
කථාව අවසන් කරන්න, ගරු මන්ත්‍රීතුමනි.

**ගරු (වෛද්‍ය) රාමනාදන් අර්චුනා මහතා**
(மாண்புமிகு (வைத்தியர்) இராமநாதன் அர்ச்சுனா)
(The Hon. (Dr.) Ramanathan Archchuna)
මේ කාරණයත් කියලා මගේ කථාව ඉවර කරන්නම්, මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි. NMRA එකේ Directorව එළෙව්වා. ඒ තත්ත්වයට ඔයගොල්ලන් අපේ රට ගෙනැල්ලා තිබෙනවා. කරුණාකරලා මම ඉල්ලීමක් කරන්නම්. මට නම් ඕනෑ නැහැ, තහඩු ගන්න රුපියල් ලක්ෂ 10ක්. හැබැයි, රුපියල් ලක්ෂ 50ක් දෙන්නම්, රුපියල් ලක්ෂ 100ක් දෙන්නම් කිව්වා නේ. කරුණාකරලා ගිහින් ඒ මිනිසුන්ව පොඩ්ඩක් හමු වෙන්න. හැබැයි, ඔබතුමන්ලාට ගුටි කන්න වෙනවා. නමුත්, ඒ මිනිසුන්ව ගිහින් හමු වෙන්න. අපි බේරා ගන්නම්, අපේ නම කියලා. Dr. Aruchuna යැව්වා, ඒ නිසා ගහන්න එපා, අපේ පක්ෂයේ කියලා බේරා ගන්නම්. ලජ්ජාවේ බැහැ. මම කථාව ඉවර කරනවා.

Thank you.

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි 10ක කාලයක් ලැබෙනවා.

[අ.භා. 4.30]

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමනි, මට මේ අවස්ථාව ලබා දීම මම අගය කරනවා.

අය වැය සම්මත කළත්, ඊට පසුව ඇති වෙලා තිබෙන ව්‍යසනය නිසා නැවත පාර්ලිමේන්තුව කැඳවලා තිබෙනවා. ඒ නිසා මේ මොහොතේදී අපි කථා කරන්නේ අපේ රටේ ආර්ථිකය සවි ශක්තිමත් මට්ටමට ගේන්න කටයුතු කරන්නේ කොයි ආකාරයෙන්ද කියන එක ගැනයි. මේ ව්‍යසනය අවස්ථාවේදී වැඩ කරපු රණවිරුවන්ට, පොලීසියට, ආපදා කළමනාකරණ සේවයේ සියලු දෙනාට සහ සමස්ත ජනතාවට මනුෂ්‍යත්වයෙන් වැඩ කිරීම සම්බන්ධයෙන් මගේ සහ එක්සත් ජාතික පක්ෂයේ කෘතඥතාව පළ කරන්න මම ප්‍රථමයෙන්ම කැමතියි. රුපියල් බිලියන 500ක්, එහෙම නැත්නම් රුපියල් කෝටි 5,000ක් සඳහා වන මේ පරිපූරක ඇස්තමේන්තුව සම්මත කිරීම සඳහා මේ අවස්ථාවේදී අවසර දෙනවා වාගේම මේක තාවකාලිකව ගන්න ඇස්තමේන්තුවක් ලෙස තමයි මම සලකන්නේ. මොකද, මීට අවුරුදු 20කට පමණ පෙර සුනාමිය සිදු වූ අවස්ථාවේදී එයින් ආපදාවට පත් වූවන්ට සහන සලසන්න ඇමෙරිකානු ඩොලර් බිලියන 7ක්, 8ක් විතර වැය වුණා. නමුත්, මේ අවස්ථාවේදී ඊට වැඩිය ලොකු ව්‍යසනයක් ඇති වෙලා තිබෙනවා. මේ ආපදාවෙන් රටට කිසිම පාඩුවක් ඇති නොවන විධියට අපි රට සංවර්ධනය කරන්න අවශ්‍යයි. එකමුතුව වැඩ කිරීම තමයි මේ අවස්ථාවේදී අත්‍යවශ්‍ය කාර්යය වෙන්නේ. ඒ නිසා මම හිතන විධියට, මේ අවස්ථාවේදී එකමුතුව කටයුතු කරන්න අවශ්‍යයි.

මේ අවස්ථාවේදී ගරු සභාවේ මුදල් ඇමතිවරයා සහ නියෝජ්‍ය ඇමතිවරයා පෙනෙන්න නැහැ. නමුත්, මේ සභාවේ අපේ ලාල් කාන්ත ඇමතිතුමා සහ අනෙක් ඇමතිවරු ඉන්න නිසායි මම මේ කාරණය කියන්නේ. අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ හයවැනි වාරිකය අරගෙන මේ කටයුත්ත ඉදිරියට ගෙන ගියා නම් මේ රටට මීට වැඩිය සුබදායක වෙයි කියායි මම සලකන්නේ. මොකද, සැප්තැම්බර් මාසයේ හයවැනි tranche එක අවසන් කරලා, මේක ඊට පසුව ඇති වුණු දෙයක් නිසා ඒ හය වැනි වාරිකය වන ඇමෙරිකානු ඩොලර් බිලියන 357ත් අරගෙන කටයුතු කළා නම් රටට මීට වැඩිය වටිනවා කියලා මම හිතනවා. මොකද, අපි දැන් මෙතැන Fixed Capital Formation එකක්,-

**ගරු මූලාසනාරූඪ මන්ත්‍රීතුමා**
(மாண்புமிகு தலைமைதாங்கும் உறுப்பினர் அவர்கள்)
(The Hon. Presiding Member)
Order, please! මේ අවස්ථාවේදී ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනයට පැමිණෙනවා ඇති.

***අනතුරුව ගරු උපුල් කිත්සිරි මහතා මූලාසනයෙන් ඉවත් වූයෙන්, ගරු නියෝජ්‍ය කථානායකතුමා මූලාසනාරූඪ විය.***

*அதன்பிறகு, மாண்புமிகு உபுல் கித்சிறி அவர்கள் அக்கிராசனத்தினின்று அகலவே, மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் தலைமை வகித்தார்கள்.*

*Whereupon THE HON. UPUL KITHSIRI left the Chair and THE HON. DEPUTY SPEAKER took the Chair.*

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Hon. Deputy Speaker, I am so happy that you are in the Chair. I know your magnanimous nature would help us speak a little longer. On that particular basis, මම මේ

[ගරු රවී කරුණානායක මහතා]

කාරණය කියන්න මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා. මූලාසනයේ මාරු වීම මගේ time එකෙන් නොවෙයි ගන්නේ කියාත් මම විශ්වාස කරනවා.

මේ අවස්ථාවේදී මම තවත් කාරණයක් මතක් කරන්න අවශ්‍යයි. 2015දී මම මුදල් ඇමති වශයෙන් කටයුතු කළ අවස්ථාවේදී ලෝකයේ පළමුවැනි වතාවට ව්‍යසනවලින් අපේ රට ආරක්ෂා කිරීම සඳහා රක්ෂණ යෝජනා ක්‍රමයක් හඳුන්වා දුන්නා. ඒ පිළිබඳව රංජිත් මද්දුම බණ්ඩාර හිටපු ඇමතිතුමාත්, අපේ මරික්කාර් මන්ත්‍රීතුමාත් මතක් කළා. ඒ සම්බන්ධයෙන් ලෝක බැංකුවත් ඇවිත් අපට ප්‍රශංසා කළා. ස්වාභාවික ආපදා - natural disasters - සියල්ලෙන් අපේ රටම ආරක්ෂා කිරීම සඳහා රක්ෂණය කරන්න පුළුවන් විධියේ ක්‍රමවේදයක් ඇති කරලා තිබුණා. මම හිතන විධියට, රජයේ නිලධාරින් හරහා වැරදි තොරතුරු ජනාධිපතිතුමාට ගිහින් තිබුණා. ඒ රක්ෂණ කොම්පැනියේ ඉන්වොයිස් සභාගත කරන්න මම බලාපොරොත්තු වෙනවා. 2016දී අපි මේ රක්ෂණ යෝජනා ක්‍රමය පටන් ගත්තාම රුපියල් මිලියන 336ක වාරිකයක් ගෙවලා අපට බිලියන 5ක -මිලියන 5,000ක- ප්‍රතිලාභයක් ලබා ගන්න පුළුවන් වුණා. අපි මේ කටයුතු කළේ National Insurance Trust Fund එක තුළින්. National Insurance Trust Fund එක තුළින් ගෙන ගිය වැඩ පිළිවෙළ යටතේ මෙය සාර්ථක වුණු නිසා ඒගොල්ලන් වෙන අයත් එක්ක කටයුතු කරන්න ගිහින් අන්තිමට මේක වැරදි විධියකට ක්‍රියාත්මක වුණා.

මුදල් ඇමතිවරයා වශයෙන් මම 2015, 2016 සහ 2017දී මේක සාර්ථකව ක්‍රියාත්මක කළත්, මා ඇමති ධුරයෙන් අයින් වුණාට පසුව මේ රක්ෂණ ක්‍රමය වෙනත් විධියකට ක්‍රියාත්මක වෙලා තිබෙනවා. මම ජනාධිපතිතුමාගෙන් ඉල්ලා සිටිනවා, කරුණාකරලා මේ ගැන නැවත බලන්න කියලා. මොකද, මේ රක්ෂණ ක්‍රමය අද තිබුණා නම් රටේ පාඩුව අද වෙනත් රක්ෂණ කොම්පැනියක් තුළින් අපිට ලබා ගන්න පුළුවන්කම තිබුණා. රංජිත් මද්දුම බණ්ඩාර මන්ත්‍රීතුමා පෙන්වා දුන්නා, මේ මඟින් අපට කොතරම් සල්ලි ප්‍රමාණයක් ගෙවන්න පුළුවන් වුණාද කියලා. එස්.එම්. මරික්කාර් මන්ත්‍රීතුමා පෙන්වා දුන්නා, කොළොන්නාවේ මේ වාගේ තත්ත්වයක් ඇති වුණා කියලා. මම හිතන විධියට, අපි මේ රක්ෂණ වාරිකය - premium එක - ගෙව්වේ 2016 අප්‍රේල් 01වැනි දා. හැබැයි, 2016 මැයි 18වැනි දා වෙනකොට ගංවතුර ආවා. 2016 මැයි 25වැනි දා වෙනකොට බිලියන 2ක් ගෙවලා අවසන් කරන්න අපිට පුළුවන්කම ලැබුණා. මේ වාගේ අවස්ථාවක ආපදා තත්ත්වයන්ගෙන් ආරක්ෂා වීම සඳහා රක්ෂණය කරලා තිබුණා නම් රටට ලොකු ශක්තිමත්භාවයක් තමයි ඇති වන්නේ.

ඒ විතරක් නොවෙයි, මේ වාගේ දියුණු වෙන රටකට, we can obtain premium funding or premium financing through this so that we would not to lose even the premium that we pay. Sir, with your permission, I would like to **table*** two letters issued by the National Insurance Trust Fund Board and Allianz SE Reinsurance Branch, Asia Pacific.

Sir, after this disaster happened or after Cyclone "Ditwah", foreign institutions were able to state the damage that had been caused. The United Nations came up first with the physical damage caused, on the basis of the geological survey done, obviously based on satellite images. They were able to get it done because it was such a devastation. I do not think any country could do it by itself. Then, the World Bank came in, intimating what type of collateral damage had been caused. But, I would like to call upon the Government to ensure that, prior to the foreign elements coming into Sri Lanka, that our local teams do their estimate. ජාතික වශයෙන් තිබෙන අපේ කණ්ඩායමේ ඇස්තමේන්තුව ඉස්සෙල්ලා අරගෙන පිට රට අයට එන්න කියන්න. මොකද, ඒ අය ඇවිල්ලා බැරි වෙලාවත් මේක අවතක්සේරු කළොත්, ඒකෙන් අපේ රටට ලොකු පාඩුවක් සිදු වෙනවා. When a disaster of this nature happens, the collateral damage caused - whether it be the deaths or damages to roads, buildings, houses, hospitals, schools et cetera - is immense. With regard to this particular disaster, we see that there had been structural damage as well as economic damage and we have got to look at fiscal reconstruction, if we are to go forward. We have got to bring back the capital lost, achieve macroeconomic stability and the liquidity process must be restored at this particular moment.

Sir, rebuilding Sri Lanka has to be done with togetherness. We must set aside our political differences, the different political shades and ensure that we move forward so that Sri Lanka would be able to have a very forward-looking future. Also with regard to capital restoration, we must ensure that the capital lost and gone is brought back for us to recover.

***[මෙම අවස්ථාවේදී ගරු ජනාධිපති අනුර කුමාර දිසානායක මැතිතුමා සභා ගර්භයට පැමිණියේය.]***

*[இச்சந்தர்ப்பத்தில் மாண்புமிகு சனாதிபதி அநுர குமார திஸாநாயக்க அவர்கள் சபாமண்டபத்துட் பிரவேசித்தார்.]*

*[At this stage, the Hon. President Anura Kumara Dissanayake entered the Chamber.]*

අපි නැවත ඒ ප්‍රාග්ධනය එකතු කරන්න පුළුවන් විධියකට කටයුතු කරන්න අවශ්‍යයි. ඒ වාගේම, අපේ capital stock එක replace කරන්නත් අවශ්‍යයි. ඒ අනුව නැති වෙලා තිබෙන ප්‍රාග්ධනය අපිට හොයා ගන්න වෙන්නේ grants තුළින්, නැත්නම් යම් විධියකින් ආධාර තුළින්. නමුත්, ඒක රටට ඔරොත්තු දෙන්න පුළුවන් විධියට ක්‍රියාත්මක කිරීමක් තමයි අවශ්‍ය වන්නේ. ඒ නිසා මම හිතන විධියට ප්‍රථමයෙන්ම අපට අවශ්‍ය වන්නේ මේක දේශීය කණ්ඩායමක් මඟින් ඇස්තමේන්තු කිරීමයි.

මේ අවස්ථාවේදී ගරු ජනාධිපතිතුමා මේ සභාවේ ඉන්න නිසා මම එතුමාගෙන් කාරුණිකව ඉල්ලා සිටින්නේ මේකයි. මේකේ සියලු ඇස්තමේන්තු අපි ඩොලර්වලින් කරන්න අවශ්‍යයි. මොකද, අය වැය පිළිබඳව විවාද කරන අවස්ථාවේදී රුපියල් 300ට තිබුණු ඩොලරය අද රුපියල් 313යි. මේ කථා කරන මොහොතේදී අපි මේක රුපියල් වශයෙන් ඇස්තමේන්තු කළොත් ඒකෙන් රටට අලාභයක් ඇති වෙනවා. ඒ නිසා ඉදිරියේදී මේක ඩොලර්වලින් ඇස්තමේන්තු කිරීම අත්‍යවශ්‍යයි. ඊට පසුව ජාත්‍යන්තර මට්ටමින්, whether it be the United Nations or the World Bank, they should endorse the valuation that has been done. ඒ වාගේම, මේකට ජාත්‍යන්තර inspection team එකක් අවශ්‍යයි, recovery plan එකක් අවශ්‍යයි. ඒ වාගේම, මේකට ආධාර ලබා ගන්න පුළුවන් මාර්ග ඇති කරන්න අවශ්‍යයි. ඊට පසුව අපි ලෝකයට යන්න අවශ්‍යයි. මෙහෙම කටයුතු කරනකොට මම හිතන විධියට ප්‍රථමයෙන්ම ස්වාධීනත්වයක් සහිත මහ බැංකුවක් තිබෙන්න අවශ්‍යයි. එවැනි මහ බැංකුවක් අපට තිබෙනවා. නමුත්, ඒ අය කථා කරන විධියට ඒ අයට රුපියල ආරක්ෂා කරන්න අමාරු තත්ත්වයක් ඇති වෙලා තිබෙන බව පෙනෙනවා. ඒ නිසා ප්‍රථමයෙන්ම අවශ්‍ය වන්නේ රුපියල ආරක්ෂා කිරීමයි. මොකද,

---

***** *පුස්තකාලයේ තබා ඇත.*

* *நூல் நிலையத்தில் வைக்கப்பட்டுள்ளது.*

* *Placed in the Library.*

රුපියල අවප්‍රමාණය වීමෙන් අපේ වැයට රුපියල් බිලියන 46ක් එකතු වෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී රුපියල ශක්තිමත් කිරීම තුළ අපිට ලැබෙන ආධාර මීට වැඩිය ප්‍රායෝගිකව පාවිච්චි කරන්න පුළුවන් වෙනවා.

ගරු ජනාධිපතිතුමා මේ සභාවට එන මොහොතේදී මම කථා කරමින් හිටියේ රක්ෂණ ක්‍රමය ගැනයි. ඔබතුමාට දීලා තිබෙන්නේ වැරදි දත්ත. තිබෙන සැබෑ මට්ටම පිළිබඳ දත්ත මම ඔබතුමාට එවන්නම්. National Insurance Trust Fund එක තිබෙනවා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)
ඔබතුමන්ලාගේ ආණ්ඩුවෙන් ඒක අයින් කළේ.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
නැහැ, මම අමාත්‍ය ධුරයෙන් අයින් වුණාට පසුවත් ඒක වෙනස් වුණා. ඒකත් මම කියන්න අවශ්‍යයි. ඒ වාගේ ඒවා වෙනවා, සාර්ථකත්වය ඇති වෙනකොට. ඒ වාගේ වෙන වෙන කටයුතු වෙනවා. මම ඔබතුමාට මේ කාරණය ඉදිරිපත් කළා. මොකද, මේ වාගේ දේවල් රක්ෂණය කරනකොට ඒවායේ රක්ෂණ වාරික ලංකාව ගෙවන්න ඕනෑත් නැහැ. මේකේ premium insurance සඳහා වෙනත් රටවල් අපට උදවු කරනවා, අපි දියුණු වෙන රටක් නිසා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
අපේ ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාව රැස් වුණා නේ. ඒ වෙලාවේ ව්‍යසන කළමනාකරණය සඳහා වූ ජාතික සභාවෙන් කමිටුවක් පත් කළා, එවැනි රක්ෂණ ක්‍රමයක් පිළිබඳව අධ්‍යයනයක් කරලා වාර්තාවක් ඉදිරිපත් කරන්න කියලා.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ඒක බොහොම හොඳයි. මම ඔබතුමාට මා ළඟ තිබෙන මේ ලේඛනය එවන්නම්. මොකද, ඔබතුමන්ලාට මේකට පිට රටින් නිකම් මුදල් ගන්න පුළුවන් වේවි. මම හිතන විධියට හොඳම දේ තමයි, අපි මෙතැනින්ම මුදල් එකතු කරන්න පටන් ගන්න එක. මොකද, මන්ත්‍රීවරුන්ට රක්ෂණ ආවරණයක් තිබෙනවා. මගේ රක්ෂණ ආවරණය මම ජනතාව වෙනුවෙන් භාර දෙනවා. ඒ මුදල් ජනතාවට ලබා දෙන්න. දැන් කැබ් 1,775ක් ගෙනෙන්න හදනවා. ඒවායේ වටිනාකම රුපියල් බිලියන 42යි. ඒ කියන්නේ, රුපියල් කෝටි 420යි. අපි ඒ මුදලත් එකතු කරමු. ඊට පසුව රක්ෂා 75,000ක් ලබන අවුරුද්දට දෙන්න ඕනෑය කියලා තිබෙනවා. ඒ වෙනුවෙන් රුපියල් කෝටි 1,250ක් වැය වෙනවා. ඒ දෙක එකතු කළාම එතැනම රුපියල් කෝටි 1,700කට ආසන්න මුදලක් තිබෙනවා. රටක් හැටියට අපිට මෙහෙම තමයි මුදල් එකතු කරන්න පුළුවන් වන්නේ කියායි මුදල් ඇමති වශයෙන් කටයුතු කරන අපේ ජනාධිපතිතුමාට මම කියන්නේ. අපේ ඒකාධිකාරයක් ඇති කරලා තිබෙනවා, යකඩවලට, ඇලුමිනියම්වලට, ටයිල්වලට, සිමෙන්තිවලට.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, your time is up.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Just give me two more minutes, Sir. Your generosity is the best we have seen.

ඒවාට සියයට 45ක බද්දක් ගෙවලා තිබෙනවා. ගරු ජනාධිපතිතුමනි, මේ අවස්ථාව පාවිච්චි කරන්න. ඒවායේ තිබෙන්නේ අධික බදු බරක්. වෙනත් රටවල් එක්ක සංසන්දනය කරලා බලන කොට අපේ රටේ සියයට 45කින් ඉදිකිරීම් වියදම් වැඩි වෙලා තිබෙනවා. ඒ බදු ප්‍රමාණයන් අඩු වුණොත් අපට මීට වඩා අඩු මුදලකින් ඉදිකිරීම් කරන්න පුළුවන්. අපේ රටේ හෝටලයක් හදන්න මිලියන 100ක් වියදම් වෙනවා නම් තායිලන්තය, මැලේසියාව, ඉන්දුනීසියාවේ ඒ හෝටලය හදන්න වැය වෙන්නේ මිලියන 65යි. ඒක නිසා ඔබතුමාට මේ අවස්ථාව පාවිච්චි කරන්න පුළුවන්, ඒ සඳහා tax rebate එකක් දෙන්න. එතකොට තමන්ගේ primary balance එකට ප්‍රශ්නයක් ඇති වෙන්නේත් නැහැ. ඒක අය වැයට බලපාන්නේත් නැහැ. ඒ සම්බන්ධයෙන් IMF එකත් එක්ක කථා කරන්න අවශ්‍යතාවක් නැහැ. මොකද රටේ ඉදිකිරීම් කර්මාන්තය නංවන එක අත්‍යවශ්‍ය කටයුත්තක් නිසා.

ලංකාව ක්‍රිකට්වලට බොහොම ප්‍රසිද්ධයි. මැච් එකකදී, දෙකකදී හෝ තුනකදී අපේ රටට funding දෙන්න කියලා ඉල්ලීමක් කරන්න. එහෙම කරලා තමයි අපට ඇමෙරිකානු ඩොලර් බිලියන තුනක්, හතරක්, පහක් හොයන්න වෙන්නේ. සුනාමිය වෙලාවේදී යූඑස් ඩොලර් බිලියන හතක්, අටක් ගියා නම් මේ ඇස්තමේන්තු අනුව ඩොලර් බිලියන 15ක් විතර යාවි. ඒ මුදල අපි හොයා ගනිමු. ඒ මුදල ණය ආධාර වශයෙන් අපට ගන්න බැහැ. මොකද අපේ debt sustainability issue එක නිසා අපට ණය ගන්න බැහැ. එක්කෝ ඒක අපට grants විධියට ලැබෙන්න ඕනෑ. නැත්නම් වෙනත් රටවලට අපේ රටට ඇවිල්ලා ඒ විනාශ වෙච්ච තැන් හදන්න කියලා භාර දෙන එක තමයි කරන්න ඕනෑ.

මම මේ අවස්ථාව උපයෝගී කර ගන්නවා, තව එක් කාරණයක් කියන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon. Ravi Karunanayake, please wind up now. There is a limit to my generosity also.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
Okay, Sir.

අපි රට භාර දෙන කොට අපේ සංචිත ප්‍රමාණය ඩොලර් මිලියන 5,900ක් තිබුණු එක අවුරුද්දකට වැඩි කාලයක් ගත වෙද්දී වැඩි වෙලා තිබෙන්නේ ඇමෙරිකානු ඩොලර් මිලියන 1,100කින්. ඒ සංචිත ප්‍රමාණයන් ශක්තිමත් වෙන විධියට අපි කටයුතු කරන්න අවශ්‍යයි. මට වැඩිපුර කථා කරන්න වේලාව දැන් හරස් වෙලා තිබෙනවා. ආපදාව නිසා හුඟාක් දෙනෙක් අමාරුවෙන් ජීවත් වෙන්නේ. ඒ අයගේ ජීවිත යථා තත්ත්වයට පත් වේවා කියලා මම ප්‍රාර්ථනා කරනවා. 2025 අවුරුද්ද අවසන්

[ගරු රවී කරුණානායක මහතා]

වෙන්න ආසන්න මේ වෙලාවේ රටවැසි සියලු දෙනාටම ප්‍රීතිමත් නත්තලක් සහ 2026 සුබ අලුත් අවුරුද්දක් වේවා කියලා එක්සත් ජාතික පක්ෂය වෙනුවෙන් මම ප්‍රාර්ථනා කරනවා. ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Next, the Hon. Thurairasa Ravikaran. You have nine minutes.

[பி.ப. 4.44]

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, மாண்புமிகு சனாதிபதி அவர்களே, அன்பான வணக்கம்!

2024ஆம் ஆண்டு சுனாமிக்குப் பின்னர், இலங்கையில் அதிகளவு பாதிப்பை 'தித்வா' புயல் ஏற்படுத்தியுள்ளது. 'தித்வா' புயலால் முல்லைத்தீவு மாவட்ட மக்களின் இயல்புவாழ்வு முற்றாக நிலைகுலைந்தது. வீதிப் போக்குவரத்து முடக்கப்பட்டு தனிமைப்படுத்தப்பட்டனர். மின்சாரம், தொலைத்தொடர்பு சேவைகள் சில நாட்கள் செயலிழந்தன. 45,000 ஏக்கருக்கும் மேற்பட்ட வயல் நிலங்கள் கிட்டத்தட்ட 5 நாட்கள் நீரில் மூழ்கின. ஐந்து நாட்களுக்கும் மேலாக மீன்பிடி முற்றாகத் தடைப்பட்டது.

'தித்வா' புயல் காரணமாக முல்லைத்தீவில் 22,918 குடும்பங்களைச் சேர்ந்த 67,340 பேர் பாதிக்கப்பட்டனர். 40 இடைத்தங்கல் முகாம்களில் 1,191 குடும்பங்களைச் சேர்ந்த 3,591 பேர் பாதுகாக்கப்பட்டனர். 32 வீடுகள் முற்றாகவும் 1,379 வீடுகள் பகுதியளவிலும் சேதமடைந்தன. 250க்கும் மேற்பட்ட கிலோமீற்றர் நீளம் கொண்ட 193 சாலைகள் சேதப்பட்டன. ஐந்து மதகுகள் மற்றும் 30 பாலங்களின் சேதநிலைகள் இதுவரை அறிக்கைப்படுத்தப்பட்டுள்ளது. நாயாற்றுப் பாலம் ஊடான போக்குவரத்து இன்றுவரை வழமைக்குத் திரும்பவில்லை. ஒன்பது பாரிய மற்றும் நடுத்தர அளவிலான குளங்களும் 32 சிறு குளங்களும் சேதப்பட்டன. முப்பது படகுகள், 147 நன்னீர் சிறு படகுகள் தொலைந்துள்ளன. ஆடு, மாடு, கோழி உட்பட 8,800க்கும் மேற்பட்ட கால்நடைகள் முல்லைத்தீவில் இழக்கப்பட்டுள்ளன. புயல் மற்றும் வெள்ள இடரால் முல்லைத்தீவு மாவட்டத்தில் ஒருவரும் உயிரிழக்கவில்லை. ஒருவர் காயமுற்றார். இவற்றுக்கும் மேலாக அபாய நிலையில் தற்பொழுது 4,604 வீடுகள் உள்ளன. இது மாவட்டத்தின் புள்ளிவிபரம் நேற்றுவரைக்குமானது.

13.12.2025இன்படி, 23,641 குடும்பங்களைச் சேர்ந்த 77,451 பேர் மன்னாரில் பாதிக்கப்பட்டுள்ளனர். நால்வர் உயிரிழந்ததாக புள்ளிவிபரம் சுட்டிக்காட்டுகின்றது. 88 பாதுகாப்பு நிலையங்களில் 5,580 குடும்பங்களைச் சேர்ந்த 18,088 பேர் பாதுகாக்கப்பட்டனர். 70 வீடுகள் முற்றாகவும் 1,517 வீடுகள் பகுதியளவிலும் சேதப்பட்டன. 22,000க்கும் மேற்பட்ட ஏக்கர் வயல் நிலம் பாதிப்படைந்தது. 45,000க்கும் மேற்பட்ட கால்நடைகளை மன்னார் நிலம் இழந்தது. 151 படகுகள் சேதமடைந்தன.

09.12.2025இன்படி, 6,076 குடும்பங்களைச் சேர்ந்த 19,868 பேர் வவுனியாவில் பாதிக்கப்பட்டனர். 15 வீடுகள் முற்றாகவும் 864 வீடுகள் பகுதியளவிலும் சேதப்பட்டன. 58 பாதுகாப்பு நிலையங்களில் மக்கள் தங்கவைக்கப்பட்டு பாதுகாக்கப் பட்டனர். 349 சாலைகள், 34 மதகுகள் மற்றும் பாலங்கள், 24 வடிகால்கள், 4 நீர்வழங்கல் அலகுகள் சேதப்பட்டன. 124 குளங்கள் பாதிப்படைந்தன. 10,000க்கும் மேற்பட்ட கால்நடைகளை வவுனியா நிலம் இழந்தது.

கடந்த 20 ஆண்டுகளில் இந்தத் தீவு சந்தித்த பெரும் இயற்கை அனர்த்தம் இதுவாகும். இது தீவின் பெரும்பாலான மாவட்டங்களைப் பாதித்தது. பெரும் எண்ணிக்கையிலான மலையக உறவுகளை இந்த இடர்ச்சியில் நாம் இழந்து தவிக்கிறோம். இப்பேரிடரில் உயிரை, உடைமையை, வாழ்வாதார மூலங்களை இழந்துள்ள குடும்பங்களுடன் நின்று பாதிப்பிலிருந்து மெல்ல மீளவேண்டிய அதேநேரம், இத்தகைய இழப்புகள் மீண்டும் தொடராத வகையில் நிலைபேறான மீட்சியை இத்தீவில் ஏற்படுத்த நாம் அனைவரும் உறுதிகொள்ள வேண்டும்.

ஆழிப்பேரலையின் பின்னர் கடற்கரையோரங்களில் இருந்து மக்களின் வாழ்விடங்கள் உயரச் சென்றதைப்போல, இப்பேரிடரின் பின்னர் மக்களை மண்சரிவு அபாயமுள்ள இடங்களில் இருந்தும் தாழ்நிலப் பகுதிகளில் இருந்தும் வேறிடத்துக்குக் குடியமரச்செய்து, பாதுகாப்பான வாழ்வை உறுதிப்படுத்த அரசு நடவடிக்கை எடுக்க வேண்டும்.

முல்லைத்தீவு மாவட்டம் ஆழிப்பேரலை பேரிடரை எதிர்கொண்ட மாவட்டமாகும். அதேபோல், கடந்த மாத பெரும் புயலின் பெரும்பாதிப்பையும் எதிர்கொண்ட மாவட்டமாகும். அபிவிருத்தியின் அளவுகோலில் பலவற்றிலும் ‘இல்லை’ என்ற வகுதிக்குள் உள்ளடக்கப்படும் இம்மாவட்டத்தின் நீர் மேலாண்மை இன்னும் மேம்படுத்தப்பட வேண்டிய நிலையிலே உள்ளது. இதைப்போல் இனியொருபொழுதும் வேண்டாம் என்பதற்கு முல்லைத்தீவின் உடன் தேவைகளை இந்தச் சபையில் முன்வைக்கிறேன்.

குளச் சேதங்களுக்கான நிரந்தரத் தீர்வு, பொருத்தமற்ற வாழ்விட மக்களுக்கான மாற்று வாழ்விட ஏற்பாடு, கைவிடப்பட்ட குளங்களைப் பராமரித்தல், ஆற்றுப்படுக்கை களை எல்லைப்படுத்தல், குளங்களை உரிய திணைக்களங் களிடம் பாரப்படுத்தல், வெள்ளத்தால் தனிமைப்படுத்தப்படும் கிராமங்கள் மற்றும் பிரதேசங்களுக்கான நிரந்தரத் தீர்வு, விவசாய வீதிகள் சீரமைப்பு, வெள்ளநீர் மற்றும் உவர்நீர்க் கட்டுப்பாட்டு அணைகள் கட்டுமானம், நகரப் பகுதிகளுக்கான நிரந்தர வடிகால் அமைப்பை நடைமுறைப்படுத்தல் உள்ளிட்டவற்றுக்குத் தங்களின் 2026ஆம் ஆண்டுக்கான பாதீடு வாய்ப்பளிக்க வேண்டுமென அரசாங்கத்திடம் கேட்டுக் கொள்கின்றேன்.

அடுத்து, குளங்களுக்கான நிரந்தரத் தீர்வு பற்றி சொல்ல விரும்புகின்றேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர் அவர்களே, முல்லைத்தீவில் 32 சிறு குளங்கள் சேதப்பட்டுள்ளன. முல்லைத்தீவின் பேரளவிலான குளமாகக் காணப்படும் முத்தையன்கட்டுக் குளமும் தண்ணிமுறிப்புக் குளமும் காலதாமதம் இன்றி மிக விரைவாகச் சீர்செய்யப்பட வேண்டிய தேவை காணப்படுகின்றது. வவுனிக்குளத்திலும் எதிர்காலத்தில் பாதிப்பு ஏற்படாது இருப்பதன் பொருட்டு, வவுனிக்குள மேம்பாடு கருதிய அபிவிருத்திப் பணிகள் முன்னெடுக்கப்பட வேண்டும் என்பதையும் இந்தச் சபையினூடாக அரசாங்கத்தின் கவனத்துக்குக் கொண்டு வருகின்றேன்.

அடுத்து, கைவிடப்பட்ட குளங்களைப் பராமரித்தல், ஆற்றுப்படுக்கைகளை எல்லைப்படுத்தல், குளங்களை உரிய திணைக்களங்களிடம் பாரப்படுத்தல் தொடர்பில் கூற விரும்புகின்றேன். கௌரவ தலைமைதாங்கும் உறுப்பினர்

அவர்களே, 20 நடுத்தரப் பெரிய குளங்களையும் நூற்றுக் கணக்கான சிறு குளங்களையும் 19 ஆற்றுப்படுக்கைகளையும் முல்லைத்தீவு கொண்டுள்ளது. குளம் நிரம்பி வான்பாயும்போதும், நிரம்பி நீர் வழியும்போதும், உடைப்பெடுத்துப் பாயும்போதும் அங்கு பாரிய பாதிப்புகள் ஏற்படுகின்றன. முல்லைத்தீவில் ஏற்படும் வெள்ளப் பெருக்குக்கு பராமரிக்கப்படாதுள்ள கழிவாறுகளே காரணமாகும். இவற்றில் பெரும்பாலானவை வனவளத் திணைக்களத்தின் கட்டுப்பாட்டிலே உள்ளது. கழிவாறுகளை உடனடியாகத் துப்புரவுசெய்து, அவற்றை எல்லைப்படுத்தி, அவற்றிலுள்ள தடைகளை அப்புறப்படுத்தி அகலப்படுத்தும் போது, குளத்தின் கீழ்ப்பகுதிகளில் இருந்து வருகின்ற நீர் விரைவாகத் தடையின்றிச் செல்லும். இதன்மூலம் ஆற்றங்கரைகளில் ஏற்படும் வெள்ளப்பெருக்கைத் தடுக்க முடிவதோடு, குளங்களுக்குகீழ் உள்ள பிரதேசங்களில் ஏற்படும் வெள்ளப்பெருக்கையும் கட்டுப்படுத்த இயலும்.

பதிவுகளின் அடிப்படையில், முல்லைத்தீவில் 483 சிறு குளங்கள் உள்ளன. அவற்றுள் 181 குளங்கள் கைவிடப்பட்டுள்ளன. சிறு குளங்கள் உடைப்பெடுத்துப் பாயும் வெள்ள நீரானது, நடுத்தர மற்றும் பெரிய குளங்களுக்கு மேலும் பாதிப்பைக்கொண்டு வருகின்றது. சிறு குளங்களைப் பராமரிக்கும் வகையில், அவற்றை உரிய திணைக்களங்களிடம் பாரப்படுத்தும்போது, மாவட்டத்தின் வறட்சியைப் போக்க முடியும் என்பதோடு, எதிர்கால வெள்ளப் பாதிப்பையும் குறைக்க முடியும்.

வனவளத் திணைக்களத்துக்கும் படையினருக்கும் குளங்களும் ஆற்றுப்படுகைகளும் ஏன்? எனக் கேட்கின்றேன். முல்லைத்தீவு மாவட்டத்தில் மட்டும் 21 குளங்கள் வனவளத் திணைக்களத்தின் கட்டுப்பாட்டில் கைவிடப்பட்ட நிலையில் உள்ளன. அக்குளங்களை எல்லைப்படுத்தி உரிய திணைக்களங்களிடம் கையளித்து, அவற்றை உரிய திணைக்களங்களே பராமரிப்பதற்கு அரசாங்கம் வழிகாட்ட வேண்டும். 438 பயனாளிகளுக்கான 1,483 ஏக்கர் வாழ்வாதார நிலம் வனவளத் திணைக்களத்தின் கையகப்படுத்தலால் பயன்பாடற்று உள்ளது.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Hon.Thurairasa Ravikaran, your time is up.

**ගරු තුරෙයිරාසා රවිකරන් මහතා**
(மாண்புமிகு துரைராசா ரவிகரன்)
(The Hon. Thurairasa Ravikaran)
Sir, give me one more minute, please.

நான் இவ்வுயரிய சபையில் மாண்புமிகு சனாதிபதி அவர்களுக்கும் முக்கியமான அமைச்சர்களுக்கும் நன்றி கூறிக்கொள்கின்றேன். வட்டுவாகல் பாலம் அமைத்தல் உட்பட பல நன்மைபயக்கும் விடயங்களை நீங்கள் செய்துகொண்டு இருக்கின்ற அதேநேரம், மீன்பிடியுடன் தொடர்புடைய தடை செய்யப்பட்ட தொழில்களை நிறுத்தவும், இந்திய இழுவைப் படகுகளின் வருகையைக் கட்டுப்படுத்தவும் ஆவன செய்ய வேண்டும். நான் ஏற்கனவே குறிப்பிட்டதைப்போன்று, விவசாயிகளின் வாழ்வாதாரத்துக்கு வழிகாட்ட வேண்டு மெனவும் மக்களைப் பாதுகாக்க வேண்டுமெனவும் கேட்டுக் கொள்கின்றேன். நன்றி!

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
The next speaker is the Hon. M. Nizam Kariapper. You have four minutes.

[අ.භා. 4.53 ]

**ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා**
(மாண்புமிகு சனாதிபதி சட்டத்தரணி எம். நிசாம் காரியப்பர்)
(The Hon. M. Nizam Kariapper, PC)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමනි, "දිට්වා" වැනි සුළි කුණාටුවකට පුළුවන් පාලම් බිඳ දමන්න, කඳු හොඳලා දමන්න, මිනිස් ජීවිත නැති කරන්න, ඇළ වේලි බිඳ දමන්න. නමුත්, සුළි කුණාටුවකට කවදාවත් බැහැ, සමාජයක් විනාශ කරන්න. හැබැයි, සමාජයක් සම්පූර්ණයෙන් සෝදා දමන්න පුළුවන් එක් දෙයක් තිබෙනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ඒක තමයි නොදැනුවත්කම -ignorance-, අවිද්‍යාව. ඒ නොදැනුවත්කම සුළි කුණාටුවට වඩා බරපතළයි; භයානකයි. ඒ නිසා අපි මුහුණ දී තිබෙන විශාලතම සුළි කුණාටුව ලෙස මා දකින්නේ "දිට්වා" නොවෙයි; නොදැනුවත්කමයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු ජනාධිපතිතුමනි, මෙහිදී මතු වන ප්‍රධාන ප්‍රශ්නය වන්නේ කුමක්ද? මේ නොදැනුවත්කම සමාජයේ සාමාන්‍ය ජනතාව අතර පමණක් තිබෙන දෙයක් ද, නැත්නම් දැනුම ලබා දිය යුතු වෘත්තිකයන් අතර තිබෙන දෙයක් ද, එසේත් නැත්නම් නිලධාරින් මෙහෙයවිය යුතු දේශපාලන නායකත්වය තුළ තිබෙන දෙයක්ද කියන ප්‍රශ්නයයි මතු වන්නේ.

නිවර්තන කලාපයේ බිහිසුණු කාලගුණික සංසිද්ධි පිළිබඳව ජනතාවගේ අවබෝධය ඉතාම අඩු සහ වැරදි මට්ටමකයි තිබෙන්නේ, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. මේ වකවානුව තුළ ලංකාවේ පමණක් නොවෙයි, මේ අතිශය භයානක කාලගුණික ව්‍යසනය ලෝකයේ බොහෝ රටවල පවතිනවා. නමුත්, ඒ පිළිබඳව සමාජය තුළ ගැඹුරු සංවාදයක් සිදු වන බවක් නම් පෙනෙන්නට නැහැ. මේ නොදැනුවත්කම නිසා නිලධාරි මට්ටමෙන්ද, දේශපාලන නායකත්වයෙන්ද, පාර්ලිමේන්තුව තුළ ද මෙවැනි බිහිසුණු ව්‍යසන පිළිබඳ කතිකාව ඉතාම සීරුමාරු, සිල්ලර, සැහැල්ලු, විද්‍යානුකූල නොවන ආකාරයෙන් සිදු වන බවක් මට පෙනී යනවා, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. කනගාටුවෙන් වුණත් කියන්න වෙනවා, මේ උත්තරීතර සභාව තුළ පවා මෙම ව්‍යසනය පිළිබඳ විද්‍යානුකූල තර්ක විතර්ක හෝ සිදු වූ වැරදි පිළිබඳ අවංක පිළිගැනීමක් හෝ ඉදිරියට යාම පිළිබඳව ජාතික සංවාදයක් හෝ සිදු වෙලා නැහැ කියන එක. ඒක තමයි ඇත්ත.

ඉස්සර වෙලාම අප කළ යුත්තේ මොකක්ද? "දිට්වා" සුළි කුණාටුවේ scale එක, දිග පළල, පරිමාණය, ශක්තිය විද්‍යානුකූලව දකින එකයි. මේක කානු, බෝක්කු සුද්ධ කරලා, දේශපාලන සහන බෙදලා Facebook එකේ දාගෙන, ශ්‍රමදාන කරලා අවසන් කරන්න පුළුවන් දෙයක් නොවෙයි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි. ජන ජීවිතය නැවත යථා තත්ත්වයට පත් කිරීම අත්‍යවශ්‍යයි, ගරු ජනාධිපතිතුමනි. මම ඒක පිළිගන්නවා. ඒ වාගේම, සහන දීම අත්‍යවශ්‍යයි. ඒ සියල්ලේම මූලික පදනම විය යුත්තේ නිවැරදි දත්ත සහ යථාර්ථ අවබෝධයයි. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ සමාජය තුළ විද්වතුන් ලිපි මඟින් "දිට්වා" සුළි කුණාටුවේ තිබෙන බරපතළකම ගණිතානුකූලව පෙන්වා දී තිබෙනවා. ඒ කිසිවක් සමාජය තුළ හෝ පාර්ලිමේන්තුව තුළ සංවාදයට ලක් වෙලා නැහැ.

මම උදාහරණයක් කියන්නම්. නොවැම්බර් 27වන දින පමණක් දිස්ත්‍රික්ක 10කට සාමාන්‍යයෙන් මිලිමීටර් 200ක වර්ෂාපතනයක් පතිත වුණා. ඒක ගණනය කරලා බැලුවොත් එක දවසක් තුළ වැටුණු ජල ප්‍රමාණය ඝන මීටර් බිලියන 5.2කට අධිකයි. අපේ සියලුම ජලාශවල මුළු ධාරිතාව ඝන මීටර් මිලියන 6යි. මෙවැනි ජල කන්දරාවක් අඩි 3,000කට වඩා උස කඳු ප්‍රදේශවලින් පහළට ගලාගෙන එනකොට එහි ඇති වන විභව ශක්තිය කොච්චරද කියා හිතාගන්න පුළුවන්ද? මේ විභව ශක්තිය

[ගරු ජනාධිපති නීතිඥ එම්. නිසාම් කාරියප්පර් මහතා]

මම පෙන්වන්නම්. එය ඩුල් ට්‍රිලියන 13,300ක් වනවා. මේක මා කරපු ගණනයක් නොව, ජ්‍යෙෂ්ඨ කථිකාචාර්යවරයෙකු කරපු ගණනයක්. සංසන්දනය කර බලනවා නම් හිරෝෂිමාවට හෙළන ලද පරමාණු බෝම්බයක ශක්තිය ඩුල් බිලියන 600යි. අපේ මේ කුඩා දූපතේ දිස්ත්‍රික්ක 10කින් එක දවසක් තුළ හිරෝෂිමාවට හෙළූ බෝම්බ 200ක ශක්තියට සමාන විභව ශක්තියක් තිබෙන ජල කන්දරාවක් මුහුදට ගලාගෙන ගියා. මම හිතනවා, ගරු ජනාධිපතිතුමා මේ ගැන දන්නවා ඇති කියලා. මොකද, එතුමා භෞතික විද්‍යාව පිළිබඳව දන්නා පුද්ගලයෙක්. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙවැනි යථාර්ථයක් තිබියදී, අපට මේ ව්‍යසනයෙන් ගොඩ එන්න තිබෙන විසඳුම විධියට මා දකින්නේ, අප තුළ තිබෙන විශේෂඥ දැනුම, විද්‍යානුකූල සැලසුම, කලාපීය සහයෝගීතාව සහ ජාතික වගකීම එකට එකතු කරගෙන මේ ගැටලුවට මුහුණ දිය යුතුය යන්නයි.

I am just about to wind up. Before that, I would like to say that today is a very historic day, which has no connection to the Debate going on. Today, the third confirmed interstellar object - Comet 3I/ATLAS, as some people may know- passes closest to the Earth and is watched intently by the world's great space powers, NASA, ESA, China, India, and Russia. This enigmatic visitor behaves unlike anything known to modern physics, forcing science itself to question its limits. Perhaps, this moment reminds us that the universe is far larger, and far less lonely than we once believed.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මේ පිළිබඳව සඳහන් කළේ මේ දිනය ඉතිහාසගත වන විට ශ්‍රී ලංකාවේ පාර්ලිමේන්තුවේ මන්ත්‍රීවරයෙක් සභා ගර්භය තුළ මේ පිළිබඳව කථා කළා කියන එක හැන්සාඩ්ගත වීම සඳහා මිස වෙන මොකවත් හින්දා නොවෙයි.

බොහොම ස්තුතියි.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
ගරු ජනාධිපතිතුමා.

[අ.භා. 4.59 ]

**ගරු අනුර කුමාර දිසානායක මහතා (ජනාධිපතිතුමා, ආරක්ෂක අමාත්‍ය, මුදල්, ක්‍රමසම්පාදන සහ ආර්ථික සංවර්ධන අමාත්‍ය සහ ඩිජිටල් ආර්ථික අමාත්‍යතුමා)**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க - சனாதிபதியும் பாதுகாப்பு அமைச்சரும் நிதி, திட்டமிடல் மற்றும் பொருளாதார அபிவிருத்தி அமைச்சரும் டிஜிட்டல் பொருளாதார அமைச்சரும்)
(The Hon. Anura Kumara Dissanayake - President, Minister of Defence, Minister of Finance, Planning and Economic Development and Minister of Digital Economy)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෑත ඉතිහාසයේ ඉදිරිපත් කරන ලද විශාලම පරිපූරක ඇස්තමේන්තුවයි අප විසින් පාර්ලිමේන්තුවට මේ ඉදිරිපත් කරලා තිබෙන්නේ. අපි දෙසැම්බර් 05වන දා 2026 වසරට අවශ්‍ය වන අය වැය ලේඛනය මේ පාර්ලිමේන්තුවේදී සම්මත කර ගත්තා. ඒ, දීර්ඝ විවාදයකින් පසුවයි. හැබැයි, ඉතාම කෙටි කාලයක් තුළ අපට නැවත රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුවක් ඉදිරිපත් කරන්න සිදු වෙලා තිබෙනවා. මේ ඇති වී තිබෙන ආපදා තත්ත්වයෙන් අපේ සාමාන්‍ය ජනතාවගේ ජීවිත යළි සක්‍රිය කරන්නත්, අපේ ආර්ථිකයට යළි පණ ලබා දීම සඳහාත් මෙවැනි පරිපූරක ඇස්තමේන්තුවක් අපට අවශ්‍ය බව මේ පාර්ලිමේන්තුවේ ඉන්න හැම දෙනාම පිළිගන්නවා ඇති කියා මම හිතනවා.

නමුත්, මා දන්නවා පාර්ලිමේන්තුවේ සංවාද නොවුණත් එළියේ සංවාදයක් තිබෙනවා, මේ බිලියන 500 හේතුකොටගෙන අප්‍රේල් වනකොට ආර්ථිකය කඩා වැටෙනවා කියලා. හැබැයි, මම ස්තුතිවන්ත වනවා, ගරු හර්ෂ ද සිල්වා මන්ත්‍රීතුමාට. මොකද, මම දැක්කා ඔබතුමා අවස්ථා කිහිපයකදී ප්‍රකාශ කරලා තිබුණා, රජයට මේ ප්‍රතිපාදන වෙන් කිරීම සඳහා මුදල් තිබෙන බව. ඒ වාගේම ආධාර ගැනත් ඔබතුමා ප්‍රකාශයක් ඉදිරිපත් කරලා තිබුණා. ඊට වඩා වැඩියෙන් ආයෝජනය කෙරෙහි අවධානය යොමු කරන්න ඕනෑ කියන ප්‍රකාශයත් ඔබතුමා කරලා තිබෙනවා. ඒක වැදගත්.

මම ඉස්සෙල්ලාම යම් පැහැදිලි කිරීමක් කරන්න ඕනෑ. මොකද, මේ සමාජය තුළ අනියත බියක් හදනවා, මෙවැනි විශාල මුදල් ප්‍රමාණයක් පරිපූරක ඇස්තමේන්තුවක් හරහා ඉදිරිපත් කිරීම තුළින් ආර්ථිකය විශාල තර්ජනයකට මුහුණ දෙනවා කියලා. මම දැක්කා අප්‍රේල්වලදී ආර්ථිකය කඩා වැටෙනවා කියලා කියනවා. ගරු රවි කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා ගියාද දන්නේ නැහැ. ඔබතුමන්ලාගේ පක්ෂයේ අභ්‍යන්තර සාකච්ඡාවක් තිබුණේ. එම අභ්‍යන්තර සාකච්ඡාවට ඔබතුමා ගියේ නැද්ද?

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)
ආරාධනා කළේ නැහැ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමාට ආරාධනා කරලා නැහැ.

එම සාකච්ඡාවේදී කියලා තිබෙනවා, අප්‍රේල් වනකොට ආර්ථිකය කඩා වැටෙනවා කියලා. ඒක අහගෙන ඇවිල්ලා මාධ්‍ය සාකච්ඡා හරහා කිහිපදෙනෙක්ම, අප්‍රේල්වල ආර්ථිකය කඩා වැටෙන කථාවක් ඉදිරිපත් කරලා තිබෙනවා මම දැක්කා. මෙම බිලියන 500 වෙන් කිරීම හරහා සිදු විය හැකි ආර්ථික ප්‍රතිවිපාක කියලා තමයි ඔවුන් ඒ අදහස ඉදිරිපත් කරන්නේ. හැබැයි, අපි ඉතා හොඳින් මූල්‍ය විනයක් සහ ඉලක්කයක් සහිතව වැඩ කරපු ආණ්ඩුවක්. අපි 2025 වසර බැලුවොත්, අපේ රටේ ආර්ථික ක්ෂේත්‍රයේ වාර්තා තබා තිබෙනවාට වඩා ඉතා වැදගත් සාධක ගණනාවකින් අපි 2025 වසරේ හොඳ ජයග්‍රහණ ලබා තිබෙනවා.

පළමු එක ගත්තොත්, අපේ භාණ්ඩාගාර ගිණුම. තමුන්නාන්සේලා දන්නවා අපේ රටේ භාණ්ඩාගාර ගිණුමේ දීර්ඝ කාලයක් තිබුණේ, බැංකු අයිරාවක් - OD එකක් - බව.සමහර වෙලාවට සියයට 33ක, 36ක වාගේ පොලියක් ගෙව්වා ඒ බැංකු අයිරාව වෙනුවෙන්. කොච්චර බැංකු අයිරාවක් තිබුණාද කිව්වොත්, 2018 බැංකු අයිරාව බිලියන 180යි. Treasury එක බිලියන 180ක බැංකු අයිරාවක් එක්ක තමයි කටයුතු කළේ. 2019දී බැංකු අයිරාව බිලියන 274යි. 2020දී බිලියන 575යි. 2021දී බිලියන 821යි. ඒ කියන්නේ, 2021දී ආණ්ඩුවේ account එක බිලියන 821කින් OD වෙලා තිබුණා. හැබැයි, මම කියන්න කැමැතියි අපේ ආණ්ඩුව යටතේ 2025 නොවැම්බර් වනකොට භාණ්ඩාගාරයේ account එකේ ධන අගය බිලියන 1,202ක් බව. 2021ට සාපේක්ෂව බැලුවාම ඒක ජයග්‍රහණයක්. එදා බැංකු

අයිරාව බිලියන 821යි. අද බිලියන 1,202ක ධන අගයක් කියන්නේ, ට්‍රිලියන 02ක ඉහළ යෑමක්. එය අපේ රටේ ආර්ථිකයට ඉතා වැදගත්. මම හිතන හැටියට එවැනි සංචිතයක් නොතිබෙන්න අපට අද මෙම බිලියන 500 වෙන් කිරීමේ හැකියාවක් ලැබෙන්නේ නැහැ. එහෙම නම් වෙන උපාය මාර්ග ගණනාවක් අපට හොයා ගන්න වෙනවා, මේ බිලියන 500 සම්පූර්ණ කර ගන්න.

දෙවැනි එක, අපේ ආදායම. අපේ රාජ්‍ය ආදායම ගත්තොත්, 2007 වසරේ සියයට 16.6ක රාජ්‍ය ආදායමක් තිබුණා. හැබැයි, 2025 වසරේ අපි සියයට 15.9ක රාජ්‍ය ආදායමක් උපයනවා. ඒ කියන්නේ, 2007 වසරින් පසුව ලංකාවේ වැඩිම ආදායම් ප්‍රමාණය මේ වසරේ උපයනවා. ඒ ආර්ථික හයිය අපට අවශ්‍යයි මෙම අර්බුදයට මුහුණ දෙන්න.

තුන්වැනි එක, අය වැය හිඟය. අය වැය හිඟය බැලුවොත්, 1977 තමයි සියයට 4.5ක අඩුම අය වැය හිඟයක් තිබුණේ. 1977න් පසුව සියයට 4.5ට වඩා වැඩි අය වැය හිඟ තමයි තිබුණේ. සමහර වර්ෂවල සියයට 10.8 දක්වා අය වැය හිඟය තිබුණා. 2013, 2014 වර්ෂවල එවැනි අය වැය හිඟවලට ගමන් කරලා තිබුණා. අපට කියන්න සතුටුයි, 1977 තිබුණු අය වැය හිඟය වන සියයට 4.5ක මට්ටමට දශක ගණනාවකට පසුව මෙම අවුරුද්දේ අඩු කරගෙන තිබෙනවා. 1977න් පසුව අඩුම අය වැය හිඟය 2025 වර්ෂයේ වාර්තා කරලා තිබෙනවා. ඒක වැදගත් දෙයක්.

ඊළඟට, අය වැය ඉලක්ක. අය වැය ඉලක්ක බැලුවොත්, අපේ අය වැය ඉතිහාසයේම - මුළු ඉතිහාසයේම - ආදායම් ඉලක්ක අභිභවා ගිය අවුරුද්ද බවට මේ අවුරුද්ද පත් වෙලා තිබෙනවා. හැම දාම අය වැය ලේඛනයෙන් ආදායම් අපේක්ෂා කරනවා. හැබැයි, එම ආදායම් උපයා ගන්නේ නැහැ.

මේ අවුරුද්දේ අපි අපේක්ෂා කළා බිලියන 4,960ක්. මේ 2025 දෙසැම්බර් 15වෙනකොට බිලියන 5,125ක් ලැබුණා. ලංකා ඉතිහාසයේ පළමු වතාවට අය වැය ලේඛනයකින් අපේක්ෂා කරන ලද ආදායම ඉක්මවා යන්න අපට පුළුවන්කම ලැබුණා.

අපේ ණය සීමාව ගැන බැලුවොත්, අපි දන්නවා හැම දාම අය වැය ලේඛනයක් ඉදිරිපත් කළාට පසුව ණය සීමා වැඩි කරනවා. හැබැයි අපට පුළුවන්කම ලැබුණා ඒ ණය සීමාව වැඩි නොකර තබා ගන්න. 2026 සඳහා අය වැය ලේඛනය ඉදිරිපත් කරනකොට බිලියන 3,800ක ණය සීමාවක් අපි අපේක්ෂා කළා. නමුත් අපි අය වැය යෝජනා හරහා තව බිලියන 60ක් අඩු කරලා මේ වන විට අපට බිලියන 3,740ක ණය සීමාවක් තමයි තිබෙන්නේ. අපි අද අනුමත කරන මේ බිලියන 500ක අතිරේක මුදල් යොදවන්නේ අපේ ණය සීමාව වැඩි කරන්නේ නැතිව. ඒක තමයි වැදගත්. ඒ අනුව දීර්ඝ කාලයකට පසුව අය වැය ලේඛනයකින් අපේක්ෂා කරන ණය සීමා තුළ ආරක්ෂා වීම සඳහා අපට හැකියාව ලැබිලා තිබෙනවා. ඒක වෙන්නේ දීර්ඝ කාලයකට පසුව.

1950න් පස්සේ අපේ ප්‍රාථමික ගිණුමේ අතිරික්තයක් තිබිලා තිබෙන්නේ අවස්ථා 6යි, 2024 වෙනකම්. 1950න් පස්සේ අවුරුදු 74ක්ම ප්‍රාථමික ගිණුමේ ධන අතිරික්තයක් තිබිලා තිබෙන්නේ අවස්ථා 6යි. ඒ අවස්ථා 6ම සියයට 1ට වඩා අඩුයි. ඒක මතක තබා ගන්න. දශම 6යි, දශම 5යි, දශම 4යි විදියට සියයට 1ට වඩා අඩුයි. හැබැයි ඉතිහාසයේම පළමු වතාවට අපේ ප්‍රාථමික ගිණුමේ අතිරික්තය සියයට 3.8ක් වාර්තා කරනවා මේ අවුරුද්දේ. ඒ කියන්නේ මොකක්ද? ලංකා ඉතිහාසයේ වැඩිම විදෙස් ප්‍රේෂණ මේ අවුරුද්දේ ලැබෙනවා. 2018දී තමයි බිලියන 3.8ක වාගේ සංචාරක ඉපයීම් ප්‍රමාණයක් තිබුණේ. මේ වසරේ ඒක අබිබවා යයි කියලා අපි අපේක්ෂා කරනවා. ඩොලර් බිලියන 18කට ආසන්න භාණ්ඩ හා සේවා අපනයන ආදායමක් උපයා ගන්න අපට හැකි වෙයි කියලා සියලු වාර්තා කියනවා. මම නොවෙයි ඒක කියන්නේ. හැබැයි ඒ දත්තවලින් ඒ විධියට ඉතාම ප්‍රශස්ත මට්ටමක් පෙන්නුම් කරලා තිබෙනවා, ශක්තිමත් මූල්‍ය කළමනාකරණයක් සහ ඉලක්ක සහගතව වැඩ කිරීමේ ප්‍රතිඵල හැටියට.

අපට තිබුණේ විශාල කම්පනවලට ඔරොත්තු දෙන්න සමත් ආර්ථිකයක් නොවෙයි. අපේ ආර්ථිකයේ කුඩා හෝ වැරදි තීන්දුවක් බරපතළ ගණයේ විනාශයක් ඇති කරන ආර්ථිකයක් අපට තිබුණේ. පොඩි වැරදි තීන්දුවක් විශාල හානිකර ප්‍රතිඵල ගෙනත් දෙනවා. සාමාන්‍යයෙන් ලොකු වැරදීම්වලින් හානිකර ප්‍රතිඵල දෙන එක පිළිගන්න පුළුවන්. හැබැයි අපට තිබුණේ අපි ඇති කරනු ලබන කුඩා වැරදීමක් මාරාන්තික ප්‍රතිඵල ගෙන දෙන ආර්ථිකයක්. ඒ නිසා අපි ගත වුණු මාස 14, -15කට ආසන්න කාලය- තුළ ඉතාම සංයමයෙන් සියුම් තැන් පවා අධ්‍යයනය කරමින්, මැදිහත් වෙමින්, වරද්දා ගන්නේ නැතිව ආර්ථිකය ස්ථායීභාවයකට ගෙනැත් තිබෙනවා. මම හිතන්නේ ඒක කවුරුත් පිළිගන්නවා. ඒක කාටවත් ප්‍රතික්ෂේප කරන්න බැහැ. එවැනි ආර්ථික ස්ථායීභාවයක් ඇතුළේ තමයි අපට මේ ප්‍රහාරය එල්ල වෙලා තිබෙන්නේ. මේක ප්‍රහාරයක්. ආර්ථිකයටත්, අපේ ජන ජීවිතයටත්, අපේ පරිසර පද්ධතියටත් මේක ප්‍රහාරයක්. මෙවැනි ආර්ථික වශයෙන් ශක්තිමත් සහ ස්ථාවර තැනක පූර්ව වශයෙන් අපි හිටියේ නැත්නම්, අපට මේකට මුහුණ දෙන්න බැහැ. මේකට මුහුණ දීම සඳහා අපට ධෛර්යය සහ විශ්වාසය නිර්මාණය කරන්නේ මේ වෙනකොට අපි අත්පත් කරගෙන තිබෙන ආර්ථික ස්ථාවරභාවයයි. ඒක වැදගත්. නමුත් අපි දන්නවා මෙවැනි ප්‍රහාරයකට ඔරොත්තු දීමේ මට්ටමට මේ ආර්ථිකය වර්ධනය වෙමින් නොතිබුණු බව.

අපි බිඳ වැටුණු රටක්. අපි ක්‍රමානුකූලව, පියවරෙන් පියවර ස්ථාවරභාවය සඳහා ගොඩනැඟෙමින් සිටි වෙලාවක තමයි මේ කම්පනය අපේ ආර්ථිකයට ගෙනැත් දීලා තිබෙන්නේ. ඒ නිසා දැන් අපි මේ ආර්ථිකයට ඇති වී තිබෙන මේ කම්පනය සමනය කර ගැනීම සඳහා ඉතාම සියුම් මැදිහත්වීම් හරහා ආර්ථිකය කළමනාකරණය කර ගත යුතුයි. ආර්ථිකයක් මොකටද? මසුරු සිටාණෝ වාගේ සියල්ල එකතු කරමින්, එකතු කරමින් ධනය එක්රැස් කර ගැනීම නොවෙයි ආර්ථිකයක් කියන්නේ. ආර්ථිකයක් ලබා ගන්නා යම් හෝ ප්‍රතිලාභයක් තිබෙනවා නම් ඒ ප්‍රතිලාභය පෙරළා ජනතාවට ගලාගෙන යා යුතුයි. එහෙම නැතිව භාණ්ඩාගාරයේ ධනය ධන වුණා කියලා, භාණ්ඩාගාරයේ ට්‍රිලියන ගාණක අතිරික්තයක් තිබෙනවා කියලා එකෙන් මොකක්ද ජනතාවට ලැබෙන ප්‍රතාලාභය? ආර්ථිකය අත්පත් කර ගන්නා කුඩා හෝ ජයග්‍රහණයක් තිබෙනවා නම් ඒ ජයග්‍රහණය ජනතාවට ගලාගෙන යා යුතුයි. ඒක තමයි අපේ ස්ථාවරය. අපි හිතනවා අප සතුව තිබුණු ට්‍රිලියන 1.2ක් වන සංචිතය උපයෝගි කර ගත යුතුයි කියලා මේ ආපදා තත්ත්වයේදී ජනතාවට ආධාර ලබාදීමට.

ඒක අපි අත්හරින්නේ නැහැ. මොකද, මීට ඉහත ඉතිහාසයේ තිබුණේ, ආණ්ඩු බලය තිබෙන අය ලොකු හැඳිවලින් බෙදා ගත්ත ඉතිහාසයක්. බලන්න, අර නිවාස ගිනි තිබ්බාට පසුව ඒ නිවාසවලට වන්දි දුන්නේ කොහොමද කියලා. සාධාරණද? පාර්ලිමේන්තු මන්ත්‍රීවරුන්ට, ඇමතිවරුන්ට, සභාපතිවරුන්ට, පළාත් සභාවල හිටපු මන්ත්‍රීවරුන්ට වන්දි දීලා තිබෙන්නේ කොහොමද? රුපියල් මිලියන 50, 60, 100, 150 එහෙම ගෙවලා තිබෙනවා. ඇයි? හැන්ද තිබුණේ ඒ ගොල්ලෝ ළඟ. හැන්ද ඒ ගොල්ලෝ ළඟ තිබෙන කොට, මේ රටේ හැමදාම තිබුණේ, තමන්ට විශාල පංගුවක් බෙදා ගන්නා පූර්වාදර්ශයක්. ජනතාවට කුඩා හැඳිවලින් බෙදනවා. රුපියල් ලක්ෂ එකහමාරක් දෙනවා, ගෙයක් හදා ගන්න. ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා දන්නවා, පසුගිය කාලයේ මන්නාරම ප්‍රදේශයේ ගෙව්වා. ලක්ෂ එකහමාරයි දුන්නේ. ඒකෙන් ගෙදරකට යන්න රුපියල් 10,000ක් දෙනවා. ඒ

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

රුපියල් 10,000ත් කලින් දීපු මුදල කියලා අර ලක්ෂ එකහමාරෙන් අඩු කර ගන්නවා. එහෙම නේ තිබුණේ. ඒ කියන්නේ හැම වෙලාවේම ජනතාවට බෙදනකොට නිකම් ඇඟෙන් ඇටයක් ගලවලා දෙනවා වාගෙයි. තමන්ට බෙදා ගන්න කොට ලොකු හැඳිවලින් බෙදා ගත්ත ඉතිහාසයක් තිබෙනවා.

අපි ජාතික ජන බලවේගයේ ආණ්ඩුව හැදුවේ මොකටද? ලොකු හැඳිවලින් ආණ්ඩුවට බෙදා ගන්න නොවෙයි, ආණ්ඩුවට බෙදන හැඳිත් නැති කර ගන්න. ඒක කරලා තිබෙනවා. මම ඒවා නැවත නැවත කියන්න යන්නේ නැහැ. හැබැයි, අපේ අභිප්‍රාය තමයි ජනතාවට සාධාරණව මේ ප්‍රතිලාභ ලබා දෙන එක. ඒ නිසා තමයි, අපි මේ පරිපූරක ඇස්තමේන්තුව පාර්ලිමේන්තුවට ඉදිරිපත් කළේ. මෙම ප්‍රශ්නයෙන් ගොඩ ඒම සඳහා ජනතාවට සාධාරණව ප්‍රතිලාභ ලබා දීමට ආණ්ඩුවක් හැටියට අපි මැදිහත් විය යුතුයි. ලංකා ඉතිහාසයේ කවදාවත් මෙහෙම කරලා නැහැ. ගංවතුරට සතුන් හසු වුණා නම්, ඒ farm එකේ අයිතිකරු ඒ ගැන බලා ගන්න ඕනෑ. කඩයක් හසු වුණා නම්, ඒ කඩේ අයිතිකරු ඒ ගැන බලා ගන්න ඕනෑ. ගෙයක් හසු වුණා නම්, පොඩි මුදලක් දෙනවා. ඒ ඇයි? ඇඟෙන් ඇටයක් දෙනවා වාගේ තමයි ජනතාවට සැලකුවේ. ඒක තමයි ඉතිහාසය. කාටවත් ඒකට අභියෝග කරන්න පුළුවන්ද? මම ඒ දත්ත එක්ක පැටලෙන්න යන්නේ නැහැ. අපේ ගරු ආනන්ද විජේපාල ඇමතිතුමා පුනරුත්ථාපන අධිකාරියේ අධ්‍යක්ෂවරයා හැටියට දීර්ඝ කාලයක් කටයුතු කරලා තිබෙනවා. එතුමා පුනරුත්ථාපන අධිකාරියේ වැඩ කරපු නිසා ඒ ගැන දන්නවා. ගරු රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමා ඇමතිවරයා හැටියට හිටපු කාලයේත් එතුමා ඒ ආයතනයේ අධ්‍යක්ෂවරයා හැටියට කටයුතු කළා. ඔබතුමා දන්නවා, ඔබතුමාගේ අමාත්‍යාංශයෙන් කොහොමද ඒ කාලයේ ගෙව්වේ කියලා. ඉතා සොච්චම් මුදලක් ගෙව්වේ. හැබැයි, අපිට අවශ්‍ය වෙලා තිබුණේ කුමක්ද? ඒ ජනතාවට යළි තමන්ගේ ජීවිතය ආරම්භ කරමින්, වඩාත් ස්ථාවර ජීවිතයක් ගත කිරීම සඳහා අවශ්‍ය කරන මැදිහත්වීම අපි කරන්නේ කොහොමද කියන එක තමයි, අපේ ප්‍රතිපත්තිමය ප්‍රවේශය. අන්න ඒ සඳහා තමයි, අපි මේ රුපියල් බිලියන 500ක් වෙන් කර ගන්න අපේක්ෂා කරන්නේ.

අපි දෙසැම්බර් 05වැනි දා අය වැය ලේඛනය සම්මත කර ගැනීමෙන් පස්සේ රුපියල් බිලියන 72.5ක පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කර ගත්තා. දැන් අපි රුපියල් බිලියන 500ක තවත් පරිපූරක ඇස්තමේන්තුවක් සම්මත කර ගන්න අපේක්ෂා කරනවා. අපි ලබන අවුරුද්දට රුපියල් බිලියන 1,400ක් ප්‍රාග්ධන වියදම් සඳහා වෙන් කරලා තිබෙනවා. අපි ඒ ප්‍රාග්ධන වියදම්වලින් මේ ක්ෂේත්‍රයට යොමු කිරීම සඳහා රුපියල් බිලියන 130ක් විතර හඳුනා ගෙන තිබෙනවා. එතකොට අපිට මේ රුපියල් බිලියන 500යි, දැනට වෙන් කරලා තිබෙන මුදලින් රුපියල් බිලියන 130ක් මේ අරමුණට යොදවා ගන්න පුළුවන්. එතකොට රුපියල් බිලියන 630යි. කලින් රුපියල් බිලියන 72ක් වෙන් කර ගත්තා. ඒ අනුව රුපියල් බිලියන 700කට ආසන්න මුදලක් අපි මේ ව්‍යසනයෙන් ගොඩ ඒම සඳහා අවශ්‍ය කරන මුළු ප්‍රතිපාදන වශයෙන් වෙන් කරලා තිබෙනවා.

ඒ වාගේම ලෝක බැංකුව මේ පිළිබඳව සමීක්ෂණය කරලා, සඳුදා අපිට දළ වශයෙන් වාර්තාවක් ලබා දෙයි. එම වාර්තාවෙන් අපිට සමස්ත හානියේ ප්‍රමාණය බලා ගන්න පුළුවන්. ඒ හානියේ ප්‍රමාණයට නැවත මෙය ප්‍රතිස්ථාපනය කිරීම සඳහා අවශ්‍ය වන මුදල හැටියට රුපියල් බිලියන 700කට ආසන්න ප්‍රමාණයක් අපි රජයක් හැටියට වෙන් කරලා තිබෙනවා. එම ජනතාවට මේ තත්ත්වයෙන් ගොඩ ඒම සඳහා ඒක වැදගත් කියලා මා හිතනවා.

හැබැයි, මෙහිදී අපි අවධානය යොමු කරන කරුණු කිහිපයක් තිබෙනවා. රුපියල් බිලියන 500ක් අතිරේකව market එකට එනකොට උද්ධමනයට ඇති විය හැකි බලපෑම පිළිබඳව අපි සැලකිල්ලට භාජන කරනවා. ඒක සැලකිල්ලට භාජන කළ යුතුයි. ඔබට මතක ඇති පසුගිය කාලයේ එක් මහ බැංකු අධිපතිවරයෙක් කිව්වා, ඇති තරම් සල්ලි අච්චු ගැහුවාම, සල්ලි අච්චු ගහන කොට භාණ්ඩවලට ඉල්ලුමක් එනවා, ඒ ඉල්ලුම ආවම භාණ්ඩ නිෂ්පාදනය කරන්න පටන් ගන්නවා, එතකොට reverse කරලා ආර්ථිකය ගොඩ ගන්න පුළුවන් කියලා මතයක් ඉදිරිපත් කළා නේ. අපි ඒ මතයේ නැහැ. ඔබතුමන්ලාට මතක ඇති. අපි දන්නවා, රුපියල් බිලියන 500ක අතිරේක මුදලක් market එකට එනකොට, උද්ධමනයට යම් ප්‍රමාණයක බලපෑමක් ඇති වෙයි කියලා. හැබැයි, උද්ධමනයට බලපෑමක් ඇතිවීම වළක්වන්න නම්, අපි භාණ්ඩ හා සේවා නිෂ්පාදනයට කාර්යක්ෂමතාවක් ගෙනෙන්න ඕනෑ. ඒ නිසා අපි මේ වෙන් කරන මුදල්වලින් සැලකිය යුතු ප්‍රමාණයකින් යළි භාණ්ඩ හා සේවා නිෂ්පාදනයේ වර්ධනයක් ඇති කර ගත්තොත් තමයි උද්ධමනයේ යම් පාලනයක් ඇති කර ගන්න අපිට හැකියාවක් ලැබෙන්නේ. අපි රුපියල්වලින් මුදල් වියදම් කළාට, රුපියල් බිලියන 500ක් market එකට එනකොට වියදම් කරන හැම රුපියලක් ඇතුළේ ඩොලර් කොටසක් තිබෙන බව අපි දන්නවා. අපි supermarket එකකට ගිහිල්ලා බඩු ගත්තොත්, ඒ බඩු මල්ල ඇතුළේ ඩොලර්වලින් ගත්ත බඩු ටිකක් තිබෙනවා. අපි වාහනයකට තෙල් ගැහුවොත්, ඩොලර් පංගුවක් තිබෙනවා. අපි නිවාසයක් හදන්න ගත්තොත්, ඩොලර් පංගුවක් තිබෙනවා.

සමීක්ෂණයක් කරලා තිබෙනවා. අධිවේගී මාර්ගයක් හදන්න පටන් ගත්තොත් සියයට 18ක් ආනයනික භාණ්ඩ තිබෙනවා. ඒ නිසා රුපියල් බිලියන 500ක් අලුතින් market එකට දමනකොට ඩොලර්වලට එන ඉල්ලුම යම් ප්‍රමාණයකින් වැඩිවීමට ඉඩක් තිබෙනවා. ඒක අපි තේරුම්ගන්න ඕනෑ. එහෙනම් මොකක්ද කරන්න ඕනෑ වෙන්නේ? ඒ ප්‍රමාණය මැනලා, අපි අපේක්ෂා කරන ලද ඩොලර් ආදායමට වඩා අතිරේක ආදායමක් ඩොලර්වලින් උපයාගන්න ඕනෑ. එහෙම නැත්නම්, විනිමය අනුපාතිකයට බලපෑමක් ඇතිවෙනවා. එය, වැළැක්වීම සඳහා තමයි අපි ජාත්‍යන්තර මූල්‍ය අරමුදලෙන් ඩොලර් මිලියන 200ක ක්ෂණික ආධාරයක් අපේක්ෂා කළේ. අද, ජාත්‍යන්තර මූල්‍ය අරමුදලේ Board එක රැස්වෙනවා. අපට සාධාරණයක් ඉටු කරයි කියලා අපි හිතනවා. ලෝක බැංකුවෙන් සහ ආසියානු සංවර්ධන බැංකුවෙන් ඒ සඳහා සහාය ලැබෙයි කියා අපි අපේක්ෂා කරනවා. අපි 2026 සැලසුමේ තිබුණු ඩොලර් ප්‍රමාණයට වඩා ඩොලර් මිලියන 500ක්වත් අලුතින් කැඳවාගන්න ඕනෑ. එතකොට ඩොලරයට සිදුවෙන බලපෑම අපට වළක්වා ගන්න පුළුවන්. මේ ඩොලර් බිලියන 500 market එකට දමනකොට පැති දෙකකින් අපට අනතුරක් තිබෙනවා. ඒ, උද්ධමනය පාලනය කරගැනීම හා විනිමය අනුපාතිකයට සිදුවෙන බලපෑම පාලනය කරගැනීම. ඒ පිළිබඳව සැලකිල්ල දක්වමින් තමයි, කොතැනටද මේ ආයෝජන යන්න ඕනෑ, මොන වාගේ ආයෝජනද යන්න ඕනෑ කියන එක කල්පනා කරන්නේ. ඒ අනුව මේ මුදල් වෙන්කිරීමේ ආකාරය පිළිබඳව බලමු. ඉස්සෙල්ලාම මේ පුනරාවර්තන වියදම්වලට මුදල් වෙන් කරන ආකාරය පිළිබඳව සැලැස්මක් හදලා තිබෙනවා. මම මේක කියන්නේ, සමහර අවස්ථාවලදී එක එක විධියට, පැටලිලි සහගත විධියට මේක සිද්ධවෙලා තිබෙන නිසා. ඒ නිසා මම පූර්ණ අදහස කියන්නම්, අපි ලබාදෙන සහන package එක ගැන.

පළමුවැනි එක, හදිසි ආපදා තත්ත්වය පහව යැමෙන් පසුව ආපදාවට ලක්වුණු පවුල්වලට තමන්ගේ නිවාසය පිරිසිදු කරගැනීම සඳහා රුපියල් 25,000 ලබා දීම. ඒ සියලු දෙනාටම මේ රුපියල් 25,000 හිමියි. හැබැයි, මම දන්නවා, මෙතැන දුෂ්කරතාවක් තිබෙනවා කියලා. ග්‍රාම නිලධාරි ඇතුළු නිලධාරින්

කිහිප දෙනෙකුගෙන් සමන්විත කණ්ඩායමකින් මේක තීරණය කරනවා. මේකට දේශපාලන අධිකාරියක් නැහැ. අපි ඉන්නේ මොකටද? ඒ මුදල ලැබුණේ නැහැ කියලා කවුරුහරි කිව්වොත් අපි ඒ නිලධාරීන්ට කියනවා, සාධාරණ දුක්ගැනවිල්ලක් තිබෙනවා, ඒ ගැන චුට්ටක් සොයලා බලන්න කියලා. දේශපාලකයා, මේක බෙදන කෙනා නොවෙයි. දේශපාලකයා, මේක දෙන්න ඕනෑ කෙනා තීරණය කරන කෙනාත් නොවෙයි. ඒක, තීරණය කිරීම සඳහා තිබෙන රාජ්‍ය යාන්ත්‍රණය තමයි විශ්වාස කරන්නේ. හැබැයි, දේශපාලකයාත් ඉන්න ඕනෑ. ඒ මොකටද? යම්කිසි කෙනෙකුට අසාධාරණයක් සිදුවෙලා තිබෙනවා නම්, ලැබිය යුතු කෙනෙකුට ලැබිලා නැතිනම් දේශපාලන අධිකාරියට කියන්න පුළුවන්, "මහත්මයා, මේක පොඩ්ඩක් බලන්න, මේ පුද්ගලයාට ලැබිය යුතුයි කියලා ඔහුගෙන් ඉල්ලීමක් ඇවිල්ලා තිබෙනවා, හැබැයි, එයාට ලැබිලා නැහැ, ඒ නිසා ඒ ගැන විමර්ශනය කරන්න" කියලා. ඒක තමයි විධිමත් ක්‍රමය.

මම දැක්කා, මෙතැන ඇවිල්ලා කියනවා දේශපාලන කමිටුවලින් අත්සන් ගන්නවා කියලා. ඒවා බොරු, හොඳේ! අපි ඉතාම පැහැදිලි විධිමත් ක්‍රමයක් හදලා තිබෙනවා. ඒක තමයි රාජ්‍ය යාන්ත්‍රණය. හැබැයි, මෙතැන ප්‍රශ්නයක් තිබෙනවා. මේකේ, සීමා - boundaries - නිශ්චිතව නැහැ නේ. මිදුලට වතුර ආවද, ගෙදර ඇතුළට වතුර ආවද, පාරේ වතුර තිබුණාද කියලා. මේ වාගේ පොඩි දුෂ්කරතා තිබෙනවා. මෙතැනදී ග්‍රාම නිලධාරිවරු විශාල වැඩ කොටසක් කරනවා. සමහර ඒවා තිබෙනවා, හරිම clear. ගේ මුළුමනින්ම විනාශයි. ඒකට අතරමැදි තැන් නැහැ නේ. ගේ මුළුමනින්ම විනාශයි නම්, විනාශයි තමයි. හැබැයි, මේ මුදල හිමිවිය යුතුද, හිමිනොවිය යුතුද කියලා බැලිය යුතු අතරමැදි තැනුත් තිබෙනවා. ඒ නිසා ග්‍රාම නිලධාරි කල්පනා කරනවා, හිමිවිය යුතු කෙනා තෝරාගන්න. එතකොට යම් ප්‍රමාදයක් සිදුවීමට ඉඩක් තිබෙනවා. මේක ස්වාභාවිකයි. රජයේ රස්සාවක් තිබිලා නැති වුණා නම් එතකොට අපි දන්නවා, රජයේ රස්සාවක් තිබුණා; පැමිණීමේ ලේඛනයේ නම තිබුණා; ඒ රස්සාව නැති වුණා කියලා. ගාණක් දුන්නාම ඒ ප්‍රශ්නය ඉවරයි. හැබැයි, මේක එහෙම නොවෙයි. මේකේ විවිධත්වයන් ගොඩක් තිබෙනවා. විවිධත්වයන් ගොඩක් තිබෙනකොට මොකක්ද වෙන්නේ? කෙනෙක් කියනවා, මටත් හිමිවිය යුතුයි කියලා. හැබැයි, නිලධාරි මහත්මයා කියනවා, ඔබට හිමි නැහැ කියලා. නමුත් ඔහු හිතනවා, මට හිමිවිය යුතුයි කියලා. ඒ විධියේ පොඩි පරස්පරතා තිබෙනවා. දේශපාලන අධිකාරිය හැටියට, දේශපාලන නායකයින් හැටියට ගම්වල වැඩකරනකොට මේවා ගැන දන්නවා. මේක, මෙවැනි ව්‍යසනයකදී අපි කවුරුත් මුහුණ දෙන යථාර්ථයක්. මොකද, මේකේ සීමාව හරියටම කොටු ගහලා නැහැ නේ. කොටු ගහන්නත් බැහැ නේ. ඉස්තෝප්පුව යට වුණොත් දෙනවාද, කාමර යටවුණොත් දෙනවාද කියලා. එහෙම කරන්න බැහැ. අපි කියනවා, මේ හැම දෙනාටම රුපියල් 25,000ට හිමිකම තිබෙනවා කියලා. එතකොට ග්‍රාම නිලධාරි ඇතුළු නිලධාරි මණ්ඩලය හිමිකම තිබෙන කෙනාට ඒ මුදල් දෙනවා. කිසිදු භේදයකින් තොරව ඒ හැමකෙනාටම ලබා දෙනවා. දැනට වාර්තාවෙලා තිබෙන ආකාරයට සියයට 65කට ආසන්න ප්‍රමාණයකට ලබා දීලා තිබෙනවා. සමහර දිස්ත්‍රික්කවල සියයට 90ක් ලබා දීලා තිබෙනවා. සමහර දිස්ත්‍රික්කවලට සියයට 100ක්ම දීලා තිබෙනවා. හැබැයි, තවම ලැබිලා නැති තැනුත් තිබෙනවා. නමුත්, රුපියල් 25,000 දෙනවා.

ඊළඟට අපි කිව්වා, රුපියල් 50,000ක දීමනාවක් දෙනවා කියලා. ඒ රුපියල් 50,000 දීමනාව ලබා දෙනකොට සීමා තිබෙනවා. ගේ කැඩිලා නම්, ගෙදර ගෘහ භාණ්ඩවලට හානියක් සිදුවෙලා තිබෙනවා නම්, - සමහර ඒවා තිබෙනවා, ගෘහ භාණ්ඩවලට හානියක් සිදුවෙලා නැහැ. මූලික උපකරණවලට, අඩුම තරමේ ඉවුම් පිහුම් කරගැනීම සඳහා අවශ්‍ය කරන උපකරණ ටිකට හානියක් සිදුවෙලා තිබෙනවා නම් ඒ හැම පවුලකටම අපි රුපියල් 50,000 ලබා දෙනවා. කවදාවත් රටක්, ආණ්ඩුවක් මෙහෙම කල්පනා කරලා නැහැ. ගෑස් සිලින්ඩරය වතුරට ගිහිල්ලා නම්, ළිප ගිහිල්ලා නම්, මූලික දේවල් ටික කරගන්න බැරි නම් ගෙදරට යන්න කිව්වාට වැඩක් නැහැ නේ. ඒ හැම පවුලකටම අපි රුපියල් 50,000 ලබා දෙනවා. ඒක තමයි ප්‍රතිපත්තිමය තීරණය. ප්‍රතිපත්තිමය මූලධර්මයක් මත තමයි අපි මේ රුපියල් 50,000 ලබා දෙන්නේ.

මොකද ඔහු ගෙදරට යනවා, ගෙදර තිබුණු භාණ්ඩ වතුරෙන් යට වෙලා තිබෙනවා. ග්‍රාම නිලධාරි මහත්මයා ඒක වාර්තා කරනවා නම් ඔහුට මේ රුපියල් 50,000 හිමියි.

ඊළඟට තව කණ්ඩායමක් ඉන්නවා, ඒගොල්ලන්ගේ ආදායම් මාර්ග නැති වෙලා තිබෙනවා, ජීවත් වෙන්න විධියක් නැහැ. එතකොට ඒ ප්‍රශ්නය ගොඩක්දුරට පැතිරෙන්න ඉඩ තිබෙනවා. එම නිසා අපි ඒ අය ගැනත් කල්පනා කරලා තිබෙනවා. මේ සමහරුන්ට නිවාසය මුළුමනින්ම අහිමි වෙලා තිබෙනවා, තවත් සමහරුන්ට පූර්ණ වශයෙන් නිවාසය හානි වෙලා තිබෙනවා. තවත් සමහරුන්ට අර්ධ වශයෙන් නිවාසය හානි වෙලා තිබෙනවා, නමුත් NBRO එකෙන් කියනවා, එතැනට යන්න එපා කියලා. තව කාණ්ඩයක් තිබෙනවා, නිවාසයට හානි වෙලා නැහැ, නමුත් එහි තත්ත්වය අවදානම් කියලා එතැනට යන්න එපා කියනවා. මෙහෙම කාණ්ඩ තුනක් තිබෙනවා. දැනට වාර්තා වී තිබෙන ප්‍රමාණය අනුව ඒ කාණ්ඩ තුන පිළිවෙළින් කිව්වොත්, පූර්ණ වශයෙන් හානි වුණු නිවාස 6,228ක් තිබෙනවා. අර්ධ වශයෙන් හානි වුණු, NBRO එක අවසර ලබා නොදෙන නිවාස 4,543ක් තිබෙනවා. හානි නොමැති නමුත්, NBRO එක අවසර නොදෙන - ගෙදරට කිසි දෙයක් වෙලා නැහැ, හැබැයි, NBRO එක යන්න එපා කියනවා- නිවාස 6,877ක් තිබෙනවා. එහෙම ගත්තොත්, මුළු නිවාස සංඛ්‍යාව 17,648ක් වනවා. අපි පළමුකොට මේ නිවාස 17,648 හිමි අයට ජනවාරි මාසයේ සිට මාස තුනක් දක්වා රුපියල් 50,000ක දීමනාවක් දෙනවා. මොකද, ඔවුන්ට ඉන්න තැනක් නැහැ, නිවසක් නැහැ, යන්න තැනක් නැහැ. ඒ අය ස්ථිර ආදායමක් ලබන්නේ නැත්නම් ඒ හැම දෙනාටම මාස තුනක් රුපියල් 50,000ක දීමනාවක් දෙනවා. මොකද, ඒ අයට නිවසක් නැතිව ඉන්න බැහැ.

අපේ ඊළඟ අපේක්ෂාව මෙයයි. මා දන්නවා, අහලා තිබෙනවා, රිසාඩ් බදියුදීන් මන්ත්‍රීතුමනි, ඔබතුමා කාලයක් අවතැන් කඳවුරක ජීවත් වුණා කියලා. අපි දන්නවා, අවතැන් කඳවුරුවල ජීවිත ගෙවීම මොන තරම් අසීරුද කියලා. පවුල් සාමූහිකව, එකට, එක ශාලාවේ නිදාගන්න එක සුදුසු නැහැ. ඒක දීර්ඝ කාලයක් කරන්නත් බැහැ. හැබැයි, අපේ රටේ අවුරුදු ගණන් එවැනි ජීවිත ගත කරන අය ඉන්නවා. මම දන්නවා, යුද්ධයෙන් අවතැන් වුණු අය තවමත් එලෙස ඉන්න බව. අපි මේ Budget එකෙනුත් මුදල් වෙන් කළා, ගෙවල් 2,500ක් හදන්න. 5,000කට වැඩි පවුල් ප්‍රමාණයක් තවමත් ඉන්නවා, නිවාස නැතිව. ඔවුන් ඉන්නේ 2009 ඉඳලා. හිතන්න, ඔවුන්ට තවම නිවාස දීලා නැහැ. අපි 2026 අය වැය යෝජනාවලියෙන් නිවාස 2,500ක් හදන්න රුපියල් මිලියන 3,000කට වැඩි මුදල් ප්‍රමාණයක් වෙන් කළා. ඇයි, ඒ? අවතැන් වීම විශාල ප්‍රශ්නයක්. අවතැන් කඳවුරක සිටින මිනිස්සුන්ට පවුල් ජීවිතයක් ගෙන යන්න බැහැ. එම නිසා අපේ අපේක්ෂාව තමයි ඉතා ඉක්මනින්ම ඒ අය එතැනින් ඉවත් කිරීම. ඒ සඳහා මම අර කියපු කාණ්ඩ තුනට රුපියල් 25,000ක නිවාස කුලියක් දෙනවා. එතකොට ඔහු ඥාතියෙකුගේ නිවසක ඉන්නවා නම්, ඒත් රුපියල් 25,000 දෙනවා. ඔහු යන්නේ තමන්ගේ ඥාතියෙකුගේ නිවසකට නම් ඔහුට ඒ රුපියල් 25,000 හිමිකම තිබෙනවා. ඊට පසුව ඔහුට මාස තුනක් රුපියල් 50,000 ගාණේ දීමනාවක් දෙනවා, ජීවත් වෙන්න. මොකද, අපට ඒ ජනතාව බලාගන්න ඕනෑකම තිබෙනවා.

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

ඊළඟට අපට තිබෙන ප්‍රධාන ප්‍රශ්නය මෙයයි. මා කලින් කිව්ව විධියට අපි මුදල් යොදවා අපේ භාණ්ඩ හා සේවා ඉක්මනින්ම නිෂ්පාදනය වුණේ නැත්නම් එය අපේ උද්ධමනයට විශාල බලපෑමක් ඇති කරනවා. එම නිසා අපි තීරණයක් අරගෙන තිබෙනවා, වගාවන් ඉතා වේගයෙන් නැවත පටන්ගන්න ඕනෑ කියලා. වාරිමාර්ග දෙපාර්තමේන්තුවට, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවට, ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවට අයිති ජලාශ විශාල ප්‍රමාණයක් ගැන අපි දිස්ත්‍රික්කයෙන් දිස්ත්‍රික්කයට ගිහිල්ලා කථා කළා. මතක ඇති නේද? වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි සැපයුම අඩාළ වීම නිසා කුඹුරු කොච්චරක් වගා කරන්න බැරිව යනවාද, පළාත් වාරිමාර්ග දෙපාර්තමේන්තුවේ වාරි සැපයුම අඩාළ වීම නිසා කුඹුරු කොච්චරක් වගා කරන්න බැරිව යනවාද කියලා අපි අහලා බැලුවා. වැව් කැඩිලා නම් කොච්චරක් වගා කරන්න බැරි වෙනවාද කියලා අපි ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් අහලා බැලුවා. අපි උපරිම උත්සාහ කළා, සියලු බිම් වගා කරන්න. අපි වාරිමාර්ග දෙපාර්තමේන්තුවට කිව්වා, වැව් ටික හදන්න අනෙක් පළාත්වලින් පුද්ගලයින් අරගෙන එන්න කියලා. මාවිල්ආරු වාගේ ජලාශ ගත්තොත්, ඒවා හදන්න දීර්ඝ කාලයක් යයි. අනෙක් හැම anicut එකකම තිබෙන හැම කුඩා ප්‍රතිසංස්කරණයක්ම කරන්න කියලා අපි කිව්වා. ඒවාට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන සියල්ල අපි ලබා දුන්නා.

අපට අවශ්‍ය වෙලා තිබුණේ ඉක්මනින්ම වගා කිරීමටයි. මේ, මහ කන්නයේ ආරම්භය. දෙසැම්බර් මස 30වැනි දා දක්වා මහ කන්නය තිබෙනවා. එම නිසා මේ මහ කන්නයේ ඉතා ඉක්මනින්ම වගා කිරීමේ සැලැස්ම අපට තිබුණා. අන්න ඒ වගාවන් සඳහා අවශ්‍ය වන සහන අපි ලබා දුන්නා. ඒ අනුව වී, බඩඉරිඟු, රටකජු ඇතුළු ධාන්‍ය වර්ග වගා කරලා තිබෙනවා නම් හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක දීමනාවක් දෙන්න අපි තීරණය කළා. මේ දීමනාව ඉස්සර තිබුණේ අක්කරයකට රුපියල් 16,000යි, හෙක්ටෙයාරයකට රුපියල් 40,000යි. හැබැයි, අපි රුපියල් 150,000ක් දෙන්න තීරණය කළා. වගා කර තිබුණු හෙක්ටෙයාරයක පැළ ගොයම විනාශ වුණාම නැවත වගා කරන්න රුපියල් 150,000ක් යන්නේ නැහැ.

හැබැයි, ඒ ගොවියාට නැවත නැඟිටින්න අපි ධෛර්යයක් දෙන්න ඕනෑ. ඔහුගේ කුඹුර හාන්න යන ගණන බලලා, පොහොර සහනාධාරය ගෙවූ ගණන බලලා, ශ්‍රම කුලිය විතරක් බලලා ගණන් හැදුවා නම්, රුපියල් 80,000ක් විතර වේවි. හැබැයි, අපට අවශ්‍යව තිබුණේ ඒක නොවෙයි. ඒ ජනතාවට යළි පණක් දෙන්න ඕනෑ. තමන් වගා කරපු භූමිය අහිමි වුණාම ඒ ගොවියාට තිබෙන වේදනාව අපි දන්නවා. සාමාන්‍යයෙන් ගොවියෙක් වගාවක් කළාට පසු පුරුද්දට වාගේ හැමදාම උදේ කුඹුරට ගිහිල්ලා නිල ගොයම දිහා බලනවා; සතුටු වනවා. එහෙම නැඟී ගෙන එන ගොයමක් විනාශ වුණාම ඔහු මානසික වශයෙන් බිඳ වැටෙන බව අපි දන්නවා. ඒ නිසා අපි හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක් දෙන්න තීරණය කළා. පොහොර සහනාධාරය ලබා දෙන්නේ බැංකු ගිණුම් හරහා. ගොවිජන සංවර්ධන දෙපාර්තමේන්තුවෙන් මට කිව්වා, 15වැනි දා වනකොට ඔක්කෝම වාර්තා අරගෙන එම කටයුතු අවසන් කරනවා කියලා. මම හිතන විධියට ලබන සතියේ, පොහොර සහනාධාරය ලබා ගත් හැම ගොවියෙකුටම හෙක්ටෙයාරයකට රුපියල් 150,000ක දීමනාව ලබා දෙන්න පුළුවන්කම තිබෙනවා. ඒක අපි දෙන්න කිව්වා, ඒ ගොවිතැන් කටයුතු නැවත පටන් ගන්න.

**ගරු නියෝජ්‍ය කථානායකතුමා**
(மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள்)
(The Hon. Deputy Speaker)
Order, please! Does the House agree to extend the time until today's Proceedings are concluded?

**ගරු මන්ත්‍රීවරු**
(மாண்புமிகு உறுப்பினர்கள்)
(Hon. Members)
Aye.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඊළඟට එළවලු වගාවට ලබා දෙන සහනාධාර බලමු. එළවලු කියලා තමයි අපි මූලික වශයෙන් කිව්වේ. නමුත්, අපට සමහර ප්‍රදේශවලට ගියාට පසුව දැනුණා, එළවලු කිව්වාට මිරිස් වගා කරපු අය ඉන්න බව. ඒගොල්ලනුත් එළවලු කාණ්ඩයට අපි ඇතුළු කළා. ලූනු වගා කරපු අයත් හිටියා, ඒගොල්ලනුත් අපි එළවලු කාණ්ඩයට ඇතුළු කළා. ගස්ලබු වගා කරපු අයත් හිටියා, ඒගොල්ලනුත් අපි එළවලු කාණ්ඩයට ඇතුළු කළා. කෙසෙල් වගා කරපු අයත් හිටියා, ඒ ඔක්කෝම එළවලු කාණ්ඩයට අපි ඇතුළු කළා. එළවලු, කෙසෙල්, මිරිස්, ලොකු ලූනු සහ ගස්ලබු එක කාණ්ඩයකට ඇතුළු කරලා හෙක්ටෙයාරයකට රුපියල් ලක්ෂ 2ක් දෙන්න තීරණය කර තිබෙනවා. ඒ ඔක්කෝම දෙන්න පුළුවන්. මොකද, නැවත ඒ වගාවන් පටන්ගන්න ඕනෑ.

මීට අතිරේක වශයෙන් අපනයන කෘෂි කර්මාන්තය පැත්තෙන් යෝජනා ගණනාවක් ආවා. සනත්වය අනුව ගම්මිරිස් වගාවට අවශ්‍ය වන වන්දි මුදල් ලබා දෙන්න අපි තීරණය කර තිබෙනවා. ඒ වාගේම එනසාල් වගාවටත්, කෝපි වගාවටත් වන්දි දෙන්න අපි තීරණය කර තිබෙනවා. ඊට අවශ්‍ය වන දත්ත ඔක්කෝම ලබා දී තිබෙනවා. ඒ දත්ත අනුව මම හිතන විධියට ගම්මිරිස් වැලකට රුපියල් 250 ගණනේ ගෙවන්න තීරණය කර තිබෙනවා. සාමාන්‍යයෙන් හෙක්ටෙයාරයක ගම්මිරිස් පැළ 1,700ක් වාගේ වගා කරනවා. නැවත ඒ වගාව ගේන්න ඕනෑ. ඒ විතරක් නොවෙයි. අපනයන කෘෂිකර්ම දෙපාර්තමේන්තුව එකහතාව පළ කර තිබෙනවා, ඒ නව වගාවට අවශ්‍ය පැළ ලබා දෙන්න. එතකොට අපට පුළුවන්, ඒ වගාවත් යළි ගේන්න.

මෙම ව්‍යසනයෙන් පසු ඊළඟට ප්‍රධාන වශයෙන් මුහුණ දුන් තවත් ප්‍රශ්නයක් තමයි, සත්ව පාලනය. කුඹුරකට නම් හෙක්ටෙයාර කියලා මිම්මක් තිබෙනවා. එළවලුවලට නම් අක්කරය කියලා මිම්මක් තිබෙනවා. හැබැයි, සත්ව පාලනයට? සත්ව පාලනයට එහෙම මිම්මක් නැහැ. සත්තු කොච්චර ඉන්නවාද? සත්තු වර්ග ගොඩක් ඉන්නවා. එකම සතාගේ වුණත් ලොකු සත්තු ඉන්නවා, පොඩි සත්තු ඉන්නවා, පැටව් ඉන්නවා. ඒ නිසා විවිධත්වයන් ගොඩයි. එතකොට අපි ඒ විවිධත්වයට සාධාරණය ඉටු කරන්නේ කොහොමද? ඒ වාගේම ඒ කර්මාන්ත පශු වෛද්‍ය කාර්යාලයේ register කරන්න ඕනෑ. මේ සමහර කර්මාන්ත register වෙලා නැහැ. එතකොට ලියාපදිංචි වෙලා නැති ඒවා ගැන අපි වෙනම හිතන්න ඕනෑකම තිබෙනවා. හැබැයි පළමු පියවර වශයෙන් ලියාපදිංචි වෙච්ච ඒවාට අපි සැලසුම් හදා තිබෙනවා. එහිදී අපි තීරණය කර තිබෙනවා, දෙමුහුන් ගවයෙක් නැති වුණොත්, විපතට පත් වෙලා තිබෙනවා නම්, රුපියල් ලක්ෂ 2ක ආධාරයක් දෙන්න. එක ගවයෙකු වෙනුවෙන් රුපියල් ලක්ෂ 2ක් දෙනවා, උපරිම ගවයින් 10ක් දක්වා. කාගේ හරි දෙමුහුන් - cross කරපු - ගවයින් 10ක් නැති වෙලා තිබෙනවා නම්, රුපියල් මිලියන 2ක් ලැබෙනවා. 10ට වඩා වැඩි නම් ඒත් රුපියල් මිලියන 2යි. මොකද, ඒකේ සීමාවක් දමන්න ඕනෑ; cap එකක් දමන්න ඕනෑ. ඒ නිසා ඒ එක ගවයෙකුට රුපියල් ලක්ෂ 2 ගණනේ ගවයින් 10ක් සඳහා ඒ ආධාරය දෙන්න අපි තීරණය කර තිබෙනවා. ඒ වාගේම අපි තීරණය කර තිබෙනවා, දෙමුහුන් නොවන දේශීය ගවයෙකු වෙනුවෙන් රුපියල් 50,000 ගණනේ දීමනාවක් දෙන්න. දේශීය ගවයෙක් නැති වෙලා නම්, ඒ ලොකු සතෙක්ද, පොඩි පැටියෙක්ද කියන භේදයකින් තොරව රුපියල් 50,000ක් දෙනවා, උපරිම සත්තු 20ක් දක්වා. ඒ කියන්නේ, රුපියල් මිලියනයක දීමනාවක් ඔහුට ලබාගන්න පුළුවන්කම තිබෙනවා, දේශීය ගවයින් 20ක් නැති වෙලා නම්.

ඊළඟට අපි සැලසුම් හදා තිබෙනවා, සූකර, එළු සහ බැටළු පාලනය සම්බන්ධයෙනුත්. මේ වාගේ ප්‍රශ්නයක් තිබුණු හැම වෙලාවේම -මතක ඇති, සූකර උණ ආපු වෙලාවේදීත්- අපි ඇත්තටම ඒ කර්මාන්තය නැවත ගොඩනඟන්න ආධාරයක් දෙන්න කල්පනා කළා. නමුත් ඒ අවස්ථාවේ මේ කර්මාන්ත ලියාපදිංචි වෙලා තිබුණේ නැහැ. මේ ගොවියා ළඟ කොච්චර සත්තු හිටියාද, කොච්චර සත්තු මිය ගියාද කියලා ලියාපදිංචි වෙලා නැහැ. ඒ නිසා සත්ව පාලනයේ යෙදෙන අපේ හැම ගොවියෙකුගේම ප්‍රධාන අභිප්‍රාය බවට පත් වන්න ඕනෑ, තමන්ට කොච්චර සත්තු ප්‍රමාණයක් ඉන්නවාද කියලා පශු වෛද්‍ය කාර්යාලයේ ලියාපදිංචි වීම. අඩුම තරමේ මාස හයෙන් හයටවත් තමන්ගේ සත්තු ප්‍රමාණය ගැන වාර්තා කරන්න ඕනෑ. එසේ ලියාපදිංචි නොකරන ගොවිපොළකට පශු වෛද්‍ය සේවාව ලබා දෙනවා නම් මුදලක් අය කරන්න ඕනෑ. ඉදිරියේදී පශු වෛද්‍ය සේවාව නොමිලේ ලබා දෙන්න බැහැ. එතකොට ඒ ගොවියා ලියාපදිංචි වෙන්න ඕනෑ. ලියාපදිංචි වෙලා නම් පශු වෛද්‍ය සේවාව වෙනුවෙන් මුදල් ගන්නේ නැහැ. හැබැයි, ලියාපදිංචි නැත්නම් මුදලක් ගන්නවා. ගවයෙක් ප්‍රවාහනය කිරීම සඳහා සහතිකය දෙනකොට එම ගොවිපොළ ලියාපදිංචි වෙලා නැත්නම් පළාතෙන් පළාතට සත්තු මාරු කරන්න දෙන්නේ නැහැ. ඒ නිසා ලියාපදිංචි වීම අත්‍යවශ්‍යයි. නමුත්, මේ අවස්ථාව වන විට සමහර ගොවිපොළවල් ලියාපදිංචි කරලා නැහැ. නමුත් අපි මෙම සූකර, එළු සහ බැටළු කියන වර්ග තුනටම එක සතෙක් අහිමි වෙලා තිබෙනවා නම් රුපියල් 20,000ක් දෙනවා. රුපියල් 20,000 ගණනේ සත්තු 20ක් සඳහා මුදල් ලබා දෙන්න අපි තීරණය කර තිබෙනවා. කාගේ හරි සත්තු 5ක් නැති වෙලා නම්, රුපියල් ලක්ෂයක දීමනාවක් ලැබෙනවා. කාගේ හරි සත්තු 20ක් නැති වෙලා තිබෙනවා නම්, රුපියල් ලක්ෂ 4ක දීමනාවක් ලැබෙනවා.

සත්තු 20ට වැඩියෙන් නැති වෙලා තිබෙන්නේ බොහොම අඩුවෙන්. අපි ඒ ගැන සොයා බැලුවා. ඒ ගැන අපි ටිකක් සොයා බලා තමයි කටයුතු කරලා තිබෙන්නේ. ඒ අනුව මම හිතන්නේ අපට රුපියල් ලක්ෂ 4ක දීමනාවක් අවශ්‍ය වන්නේ නැහැ. සත්ව පාලනයේ යෙදෙන ලියාපදිංචි වී සිටින අයට එක් සතෙකුට අපි රුපියල් 20,000ක් බැගින් දෙනවා. මොකද, අපි සොයා බැලුවාම සාමාන්‍යයෙන් පැටවෙක් වෙන්නේ රුපියල් 5,000යි, 6,000යි. එතකොට ඒ පුද්ගලයාට පැටව් ඇති කරගෙන ගාලට දීලා, ආහාර පාන සකස් කරගෙන මේ වැඩේ කරන්න පුළුවන්කම තිබෙනවා. ඒ නිසා යළි අපි සත්ත්ව පාලනය නඟාසිටුවීම සඳහා ඒ සැලැස්ම සකස් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම ඊළඟට ප්‍රධාන ප්‍රශ්නයකට මුහුණ දෙන්නේ කුකුළු පාලනය කරන අයයි. විශේෂයෙන්ම කුකුළු පාලනය ගත්තාම ලේයර්, බ්‍රොයිලර්, එක එක වයස් මට්ටම් වාගේ විශාල ප්‍රභේද ගණනාවක් තිබෙනවා. ඒ නිසා අපි මෙහෙම තීරණයක් ගත්තා. ඒ අනුව මිය ගිය එක් ලේයර් සතෙකු සඳහා රුපියල් 500 බැගින් සත්තු 2,000ක් දක්වා ආධාර ලබා දෙන්න අපි තීරණය කළා. එතකොට රුපියල් මිලියනයක් හම්බ වෙනවා, ෆාම් එකේ සත්තු 2,000ම මිය ගිහිල්ලා නම්. මිය ගිය එක් ලේයර් සතෙකු වෙනුවෙන් ඔහුට රුපියල් 500 ගණනේ ගෙවනවා.

බ්‍රොයිලර් සතෙකුට අපි රුපියල් 250 ගණනේ ගෙවනවා. ඔහුටත් සත්තු 4,000ක උපරිමය දක්වා යන්න පුළුවන්. සත්තු 4,000ක් මැරිලා නම් ඔහුට රුපියල් ලක්ෂ 10ක් ලැබෙනවා. මම හිතනවා, ඒක සාධාරණ ගෙවීමක් කියලා. එතකොට ඒගොල්ලන්ට නැවත තමන්ගේ කර්මාන්තය පටන් ගන්න පුළුවන්.

ඒ වාගේම ගෙවතු ආශ්‍රිත කුකුළු පාලනය විශාල වශයෙන් තිබෙනවා. අපි ඒ ගැන සොයා බැලුවා. හැබැයි, මේවා registered ඒවා. මොකද, මේ ගොවීන් දිරිගැන්වීම සඳහා විශේෂයෙන්ම උතුරු පළාතේ අපේ පළාත් සභාවලින්, දෙපාර්තමේන්තුවලින් සත්තු 10, 15, 25 ලබා දීපු ගොවිපළවල් විශාල ප්‍රමාණයක් තිබෙනවා, backyard ක්‍රමයට. ඒ කියන්නේ, ඒගොල්ලන් සත්තු නිදැල්ලේ තමයි ඇති කරන්නේ. හැබැයි, ඔවුන්ට ඇති කරන්න සත්තු දීලා තිබෙන්නේ පළාත් සභාවෙන්. ඊට පස්සේ ඒ සතුන්ට අවශ්‍ය අනෙකුත් පශු සම්පත් සේවාව ලබා දීලා තිබෙන්නේත් පළාත් සභාවෙන්. එම නිසා ඒගොල්ලන් වැඩිය නැහැ. ඒගොල්ලන් ඉන්නේ 10ක් වාගේ තමයි. උපරිම වශයෙන් 25ක් වාගේ තමයි ලබා දීලා තිබෙන්නේ. ඒ, backyard ක්‍රමයට, ඒ කියන්නේ, පළාත් සභාවලින් ආධාර දීලා නිදැල්ලේ ඒ සත්තු ඇති කරපු අයගේ registered ලේඛනයක් තිබෙනවා. ඒ හැම කෙනාටම රුපියල් 10,000 ගණනේ ලබා දෙන්න අපි තීරණය කරලා තිබෙනවා. ඒ වාගේම නැවත ඒගොල්ලන්ට පළාත් සභාවෙන් අවශ්‍ය වන පැටව් නොමිලේ ලබා දෙන්නත් තීරණය කරලා තිබෙනවා. ඒ අනුව ඒ අයගේ ජීවිතය නැවත නඟාසිටුවන්න අපට පුළුවන්කම ලැබෙනවා. ඒ හැම කෙනාටම රුපියල් 10,000ක් දෙනවා.

ඊළඟට, ධීවර කර්මාන්තය ගනිමු. ධීවර කර්මාන්තය සම්බන්ධයෙන් ප්‍රශ්න කීපයක් තිබෙනවා. මිරිදිය ධීවර කර්මාන්තයේ යෙදෙන අය ඉන්නවා; කරදිය ධීවර කර්මාන්තයේ යෙදෙන අය ඉන්නවා. කරදිය ධීවර කර්මාන්තයේ යෙදෙන අය ගැන අපි හොයා බැලුවා. කරදිය ධීවර කර්මාන්තයේ යෙදෙන්න බැහැ, බෝට්ටු insure කරන්නේ නැතුව. බෝට්ටුව insure කරලා නම් තමයි ඔවුන්ට මත්ස්‍යයින් නෙළීම සඳහා ධීවර අමාත්‍යාංශයෙන් බලපත්‍රය ලබා දෙන්නේ. ඒක ඉතා හොඳ දෙයක්. ඒ නිසා කරදියේ - මුහුදේ - මාළු අල්ලන හැම කෙනාටම බෝට්ටුවට insurance එකක් තිබෙනවා. හැබැයි, සාමාන්‍ය කෙනෙක් insure කරනකොට මොකද කරන්නේ කියා අපි දන්නවා. ඔහුට ඒක දරා ගන්න බැරි නිසා ඔහු සාමාන්‍යයෙන් ප්‍රායෝගිකව හොඳද, නරකද කියලා බලන්නේ නැතුව ඒක undervalue කරනවා. ඒක නේ කරන්නේ. අවුරුදු 4ක්, 5ක් පරණ බෝට්ටුවක් සම්පූර්ණයෙන් හානි වුණාට ඔහුට අලුත් බෝට්ටුවක් මිලදී ගන්න තරමට දීමනාව ලැබෙන්නේ නැහැ. සම්පූර්ණයෙන්ම බෝට්ටුව හානි වුණාම ඔහුට රක්ෂණයෙන් මුදලක් ලැබුණාට, ඒ මුදල අලුතින් බෝට්ටුවක් මිලදී ගන්න ප්‍රමාණවත් නැහැ. ඒ නිසා අපි තීරණයක් ගත්තා, රක්ෂණයෙන් ලැබෙන මුදල සීනෝර් ආයතනයට ලබා දෙන්න. එතකොට සීනෝර් ආයතනයෙන් අලුත් බෝට්ටුවක් ලබා දෙනවා. සාමාන්‍යයෙන් බෝට්ටුවක් මිලදී ගන්න රුපියල් ලක්ෂ හතරහමාරක්, රුපියල් ලක්ෂ 5ක් විතර වැය වෙනවා. Insurance එකෙන් ඔහුට හම්බ වෙන්නේ රුපියල් ලක්ෂ 2ක නම් ඒ මුදල සීනෝර් ආයතනයට දුන්නාම, සීනෝර් ආයතනය ඉතුරු රුපියල් ලක්ෂ 3 දරලා රුපියල් ලක්ෂ 5ක බෝට්ටුවක් ඔහුට ලබා දෙනවා. ඔහුට insurance එකෙන් ලැබෙන්නේ රුපියල් ලක්ෂ 4 නම් ඉතුරු රුපියල් ලක්ෂය දරලා අලුත් බෝට්ටුවක් ලබා දෙනවා. අපට අවශ්‍යකම තිබෙන්නේ කර්මාන්තයේ නිරන්තරයෙන් යෙදීම සඳහා අවශ්‍ය වන බෝට්ටු ඔවුන්ට ලබා දීමයි. ඒ හින්දා බෝට්ටු විනාශ වුණු හැම කෙනාටම insurance එක ලබා දෙන මුදලට සීනෝර් ආයතනයෙන් අපි බෝට්ටුවක් ලබා දෙනවා. සීනෝර් ආයතනයට අවශ්‍ය වන මුදල් ටික අපි ලබා දීලා තිබෙනවා.

ඊළඟට, මේ ආපදා තත්ත්වය හේතුවෙන් ධීවරයින්ට දැල් ආම්පන්න ටික නැති වෙලා තිබෙනවා. මම සොයා බැලුවා, කරදිය ධීවර කර්මාන්තයේ යෙදෙන ධීවරයෙකුගේ එක් දැල් piece එකක් සඳහා රුපියල් 20,000ක් වැය වෙනවා. ඒ නිසා අපි තීරණය කරලා තිබෙනවා, ඒ දැල් ආම්පන්න නැති වුණු හැම කෙනාටම pieces 5ක් දෙන්න. ඒ සඳහා රුපියල් ලක්ෂයක වවුචරයක් දෙනවා. කරදිය ධීවර කර්මාන්තයේ යෙදිලා ඉන්නවා නම් ඒගොල්ලන්ට

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

pieces 5ක් ලබා දෙනවා. ඒ වෙනුවෙන් රුපියල් ලක්ෂයක් ඕනෑ. රුපියල් ලක්ෂයක වවුචරයක් දෙනවා. ඒ වවුචරය ගිහිල්ලා දුන්නාම, සීනෝර් ආයතනයෙන් දැල් pieces 5ක් ගන්න පුළුවන්.

අපිට අවශ්‍යකම තිබුණේ මොකටද? ඒ ලබා දෙන රුපියල් ලක්ෂයක මුදල දැල්වලටම යොදවන්න ඕනෑ. මොකද, අපිට අවශ්‍ය එම කර්මාන්තය දියුණු කරන්නයි. ඒ නිසා තමයි insurance එකෙන් ලැබෙන මුදල බෝට්ටුවටම යොදවන්න අවශ්‍ය කරන්නේ; ඒ නිසා තමයි අපි බෝට්ටුවක් දෙන්නේ; ඒ නිසා තමයි අපි දැල් ලබා දෙන්න තීරණය කර තිබෙන්නේත්. තවත් බෝට්ටු විශාල ප්‍රමාණයකට විවිධ හානි වෙලා තිබෙනවා. සීනෝර් ආයතනයෙන් විශේෂ කණ්ඩායමක් යොදවා විශාල මෙහෙයුමක් දියත් කරනවා, එසේ ආපදාවට ලක් වෙලා තිබෙන බෝට්ටු සම්බන්ධව සොයා බැලීමට. ඒවා මුළුමනින්ම හානි වෙලා නැතත්, පොඩි පොඩි damages වෙලා තිබෙනවා. ඒ සියලු බෝට්ටු නොමිලේ හදා දීම සඳහා සීනෝර් ආයතනයට අපි මුදල් වෙන් කර තිබෙනවා. ඒක තමයි කරදිය ධීවර කර්මාන්තය යළි ප්‍රතිෂ්ඨාපනය කිරීම සඳහා අපි සකස් කර තිබෙන වැඩ පිළිවෙළ.

ඊළඟට, මිරිදිය ධීවර කර්මාන්තය ගනිමු. දැන් සීනෝර් ආයතනයට ගොඩක් වැඩ එනවා නේ. බෝට්ටු හදන්න, දැල් ලබා දෙන්න යනාදී වශයෙන් වැඩ ගොඩක් තිබෙනවා නේද? ඒ නිසා මිරිදිය ධීවර කර්මාන්තයේ බර අපි සීනෝර් ආයතනයට දෙන්නේ නැහැ. මිරිදිය කර්මාන්තයේ යෙදෙන කෙනෙකුගේ ඔරුවක් නැති වෙලා නම්, ඔරුවට සම්පූර්ණයෙන්ම හානි වෙලා නම් අපි ආධාරයක් ලෙස ඒ කෙනාට රුපියල් ලක්ෂයක් ලබා දෙනවා, අලුතින් ඔරුවක් මිලදී ගැනීම සඳහා. එසේ රුපියල් ලක්ෂයක් ලබා දෙන්නේ ඔරුව නැති වෙලා නම්. ඒගොල්ලන්ටත් දැල් pieces ප්‍රමාණයක් ලබා දෙනවා, උපරිමය පහක් දක්වා. ධීවර, ජලජ සහ සාගර සම්පත් අමාත්‍යාංශයේ නිලධාරින් කැඳෙව්වාම ඒ අය අපට කිව්වා, විශේෂයෙන්ම එම කර්මාන්තය ආශ්‍රිතව ධීවර සමිති තිබෙන බව. මේ ධීවර සමිතිවලට අදහසක් තිබෙනවා කිව්වා, ඒ එක් එක් ධීවරයාට අහිමි වුණු දැල් පිළිබඳව. ඒ නිසා අපිට ඒ ධීවරයින් සතුව තිබුණු දැල් ප්‍රමාණය හා සමානවම දැල් ලබා දෙන්න පුළුවන්. එම ධීවරයාට තිබුණේ දැල් දෙක නම්, එහෙම නැත්නම් දැල් පහ නම් අපට හරියටම ඒ ප්‍රමාණයම ගණනය කර ලබා දෙන්න පුළුවන්. මොකද, ඒ දත්ත තිබෙනවා කියලා ධීවර අමාත්‍යාංශයෙන් අපට කිව්වා. හැම වැවක් සම්බන්ධවම ධීවර සමිතියක් තිබෙනවා. ඒ සමිති යටතේ තිබෙනවා, ඒ ඒ ධීවරයාට හිමි දැල් ප්‍රමාණය පිළිබඳ දත්ත. ඒ අනුව යම් ධීවරයෙකුට දැල් අහිමි වෙලා නම්, දැලකට රුපියල් 15,000 ගණනේ උපරිමය දැල් 5ක් දක්වා රුපියල් 75,000ක් ලබා දෙන්න අපි තීරණය කර තිබෙනවා, මිරිදිය කර්මාන්තය ඉහළට ගැනීම සඳහා.

ඊළඟට, ප්‍රධාන ප්‍රශ්නයක් වෙලා තිබෙන්නේ මොකක්ද? සාමාන්‍යයෙන් මිරිදිය කර්මාන්තයට අදාළ ධීවර සමිති යම් මුදලක් එකතු කරලා තමයි ඒ වැව්වලට මාළු පැටව් දමා තිබෙන්නේ. දැන් ඉස්සර වාගේ ඕනෑම කෙනෙකුට වැවකින් මාළු අල්ලන්න බැහැ. දැන් ධීවර සමිතියක් තිබෙනවා. ලාල් කාන්ත ඇමතිතුමනි, අපි තමයි ඒ කාලයේ ගිහිල්ලා ඕනෑ තරම් මාළු ඇල්ලුවේ නේද? නමුත්, දැන් එහෙම මාළු අල්ලන්න බැහැ.

**ගරු කේ.ඩී. ලාල් කාන්ත මහතා (කෘෂිකර්ම, පශු සම්පත්, ඉඩම් සහ වාරිමාර්ග අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.டீ. லால் காந்த - கமத்தொழில், கால்நடை வளங்கள், காணி மற்றும் நீர்ப்பாசன அமைச்சர்)
(The Hon. K.D. Lal Kantha - Minister of Agriculture, Livestock, Land and Irrigation)
ඕන ඕන විධියට මාළු ඇල්ලුවා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඔව්. නමුත්, දැන් එහෙම මාළු අල්ලන්න බැහැ. දැන් ධීවර සමිති තිබෙනවා. ඒ සමිතිවල සාමාජිකයින්ට විතරයි මාළු අල්ලන්න පුළුවන්. එම සමිතියේම සාමාජිකයින් මුදල් එකතු කර තමයි ඒ වැවට මාළු පැටව් ගෙනැත් දමන්නේ. ඒ වෙනුවෙන් ඒ අයට මුදලක් වැය වෙනවා. නමුත් ධීවර අමාත්‍යාංශයේ නිලධාරින් සමඟ පැවැති සාකච්ඡාවේදී අපට තේරුම් ගියා, වැව් විශාල ප්‍රමාණයක් පිටාර ගලපු නිසා ඒවාට දමපු මාළු පැටව්න්ගෙන් සියයට 30කට, සියයට 35කට ආසන්න ප්‍රමාණයක් ගිහිල්ලා බව. සමහර වැව්වලින් ඔක්කෝම මාළු පැටව් ගිහිල්ලා. අරගොල්ලන් මුදල් යොදවා වැව්වලට මාළු පැටව් දැම්මාට, දැන් ලොකු වෙන්න ඒවායේ පැටව් නැහැ. ඒ නිසා ධීවර අමාත්‍යාංශයට අපි මුදල් වෙන් කරනවා, එසේ හානියට පත් වුණු ජලාශවලට දෙවරක් මාළු පැටව් ලබා දීමට. මොකද, අපිට ඕනෑ කරන්නේ කර්මාන්තය දියුණු කරන්නයි. ඒ නිසා මාළු පැටව් ගැනීමට සල්ලි දීලා වැඩක් නැහැ. අපි තීරණය කළා, වැව්වලට මාළු පැටව් ලබා දීමට. එතකොට මාස කිහිපයක් යනකොට එම ධීවරයින්ට ඒ අස්වැන්න ලබා ගන්න පුළුවන්කම තිබෙනවා. අපි මිරිදිය කර්මාන්තය දියුණු කිරීම ගැන ඒ ආකාරයට කල්පනා කර තිබෙනවා.

අපි කලින්ම කිව්වා වාගේ ආපදාවට ලක් වුණු පාසල් සිසුන්ට රුපියල් 25,000ක දීමනාවක් ලබා දෙනවා. මේ රුපියල් 25,000 දීමනාව ලබා දීමේදී එයින් රුපියල් 10,000ක් අපි ජනාධිපති අරමුදලෙන් ලබා දෙනවා, ඉතුරු රුපියල් 15,000 අපි භාණ්ඩාගාරයේ සල්ලිවලින් ලබා දෙනවා. එහෙම දෙන්න තමයි අපි තීරණය කර තිබෙන්නේ. මෙතැනදී මතු වුණු ප්‍රශ්නය තමයි, ඒ පාසල් දරුවා ආපදාවට ලක් වුණා කියා කවුද හඳුනා ගන්නේ කියන එක. අපිට බොහොම පැහැදිලියි, ඒක විදුහල්පතිට හඳුනා ගන්න බැහැ කියන කාරණය. අපි සහභාගි වුණු සාකච්ඡාවලදී අපට ඒ බව තේරුම් ගියා.

මොකද, ඒ සීමාවේ නොවෙයි තිබෙන්නේ. සමහර දරුවන්ගේ ඉස්කෝලේ යට වෙලා නැහැ; ගෙදර යට වෙලා. සමහර දරුවන්ගේ ගෙදර යට වෙලා නැහැ; ඉස්කෝලේ යට වෙලා. ඒ නිසා විදුහල්පතිවරයාට හොයා ගන්න බැහැ. ඒ නිසා අපි කිව්වා, ග්‍රාම නිලධාරි මහත්වරු හරහා ඒ සංඛ්‍යා දත්ත ටික ගන්න කියලා. මොකද, රුපියල් 25,000 දීමනාව දෙනකොට ඒ ගොල්ලන් දන්නවා, මේ කවුද කියලා. මොකද, දැනට වාර්තා වෙලා තිබෙන විධියට පවුල් 620,000ක් ආපදාවට ලක්වෙලා තිබෙනවා. එතකොට ඒ පවුල් 620,000ම දරුවන්ට, ආපදාවට ලක් වුණු දරුවන්ට අපි රජයෙන් රුපියල් 15,000ක දීමනාවක් ලබා දෙනවා. එතකොට ඒ තොරතුරු එකතු කර ගන්න පුළුවන්, ග්‍රාම නිලධාරි මහත්වරුන්ට. ග්‍රාම නිලධාරි මහත්වරු ඒ තොරතුරු එකතු කර ගත්තාට පස්සේ ජනාධිපති අරමුදලට ලෙහෙසියි. මොකද, ජනාධිපති අරමුදලට පහළ යන්ත්‍රණයක් නැහැ. ඒ නිසා පහළ යන්ත්‍රණය තිබෙන රාජ්‍ය යන්ත්‍රණයෙන් - ග්‍රාම නිලධාරි මහත්වරු - ඒ තොරතුරු එකතු කරලා ප්‍රාදේශීය ලේකම්තුමන්ලා හරහා ලබා දුන්නාට පසුව ඒ නාම ලේඛනයටම නැවත රුපියල් 10,000ක් ජනාධිපති අරමුදලෙන් ලබා දෙන්න පුළුවන්. ඒ අනුව රුපියල් 25,000ක් පාසල් දරුවෙකුට ලබා දෙන්න අපට පුළුවන්. අලුත් පාසල් වාරය ආරම්භ කරන්න කලින් මේ මුදල ලබා දෙන්න ඕනෑය කියන ස්ථාවරයේ අපි ඉන්නවා; ඒ සඳහා අපි උපරිම උත්සාහ කරනවා. ඒ දරුවන්ට නැවත පාසලට යාම සඳහා ඒක සහනයක් වෙනවා. ඒ වාගේම අපි දැනටමත් මුදල් වෙන් කරලා තිබෙනවා, සමෘද්ධි සහනාධාරය ලබන පවුල්වල සහ ළමයින් 200ට අඩු පාසල්වල ළමයින්ට රුපියල් 6,000ක දීමනාවක් ලබා දෙන්න. ඒ කිසිවක් කප්පාදු කරන්නේ නැහැ. ඒ දීමනා එසේම ලබා දෙන ගමන් මේ විශේෂ ආපදාව හේතුකොට ගෙන අපි ඒ ළමුන්ට රුපියල් 25,000ක දීමනාව ලබා දෙනවා. ඒකට අවශ්‍ය මුදල් ප්‍රතිපාදන මේ පරිපූරක ඇස්තමේන්තුව තුළ තිබෙනවා.

ඊළඟට ව්‍යාපාරික ගොඩනැගිලි, ව්‍යාපාරික ස්ථාන සම්බන්ධව ගත්තොත්, අපි දැක්කා, කර්මාන්ත අමාත්‍යාංශය 16වැනිදා දක්වා කාලය ලබා දුන්නා, register වෙන්න කියලා. ඒ අනුව තනි පුද්ගල ව්‍යාපාර, ක්ෂුද්‍ර සහ සුළු පරිමාණ ව්‍යාපාර register වෙලා තිබෙනවා. තනි පුද්ගල ව්‍යාපාර, ක්ෂුද්‍ර සහ සුළු පරිමාණ ව්‍යාපාර කියලා වර්ග තුනක් තිබෙනවා. ඒ වර්ග තුන යටතේ දැනට 9,600ක් වාගේ ප්‍රමාණයක් ලියාපදිංචි වෙලා තිබෙනවා, හානි වුණාය කියලා. අපි තීරණය කරලා තිබෙනවා, ඒ 9,600ටම රුපියල් ලක්ෂ 2 ගණනේ ලබා දෙන්න. ඒකට අවශ්‍ය මුදල් අපි කර්මාන්ත අමාත්‍යාංශයට එව්වා. මම හිතන විධියට, ඒ කාර්යය කරන්න හරි ලෙහෙසියි; ඒ ගොල්ලන් data එකතු කරලා තිබෙන්නේ, ඒගොල්ලන්ගේ නිලධාරින්ගේ අධීක්ෂණය යටතේ; පද්ධතියකට එකතු කරලා තිබෙන්නේ. Account number එක තිබෙනවා. ඒ නිසා ඉතා ඉක්මනින් අපට ඒ සල්ලි ටික යවන්න පුළුවන්. ඒ සුළු පරිමාණ කර්මාන්තවලට, තනි පුද්ගල ව්‍යාපාරවලට යළි පණ දීම සඳහා අපි මේ රුපියල් ලක්ෂ 2ක දීමනාව ලබා දෙන්න තීරණය කරලා තිබෙනවා.

ඊළඟට, අපි තවත් දෙයක් දැක්කා. බිල්ඩින්වලට විශාල හානියක් සිද්ධ වෙලා තිබෙනවා. ඒ කියන්නේ, ව්‍යාපාර ගොඩනැගිලිවලට හානි වෙලා තිබෙනවා. යම් පුද්ගලයෙකුට ගෙයකුත් තිබෙනවා; කඩයකුත් තිබෙනවා. ගෙය හොඳින් තිබෙනවා. හැබැයි, කඩේ යට වෙලා තිබෙනවා. එතකොට අපි ඒ බිල්ඩින් එක හදන්න මුදලක් දෙන්න ඕනෑ. ඒ නිසා අපි තීරණය කරලා තිබෙනවා, ආපදාවෙන් අර්ධ වශයෙන් හානිවලට ලක් වෙලා තිබෙන ඔක්කෝම බිල්ඩින්වලට ආරම්භයක් ලෙස රුපියල් ලක්ෂ 5 ගණනේ දෙන්න. කවුරු හරි කියනවා නම් තමන්ට ඒ රුපියල් ලක්ෂ 5 ප්‍රමාණවත් නැහැ කියලා, ඒක තක්සේරු කරලා උපරිමය රුපියල් ලක්ෂ 50 දක්වා දෙනවා.

**ගරු බිමල් රත්නායක මහතා**
(மாண்புமிகு பிமல் ரத்நாயக்க)
(The Hon. Bimal Rathnayake)
රුපියල් ලක්ෂ 5ක මුදල තක්සේරු නොකර දෙනවා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඒක තක්සේරු නොකර දෙනවා. යම් ව්‍යාපාරයක් කරගෙන ගිය බිල්ඩින් එකකට හානියක් වෙලා තිබෙනවා නම්, කිසිදු තක්සේරුවකින් තොරව රුපියල් ලක්ෂ 5ක දීමනාවක් ලබා දෙනවා. කවුරු හරි කියනවා නම් තමන්ගේ ව්‍යාපාරික ස්ථානයට වෙච්ච හානිය අනුව තමන්ට රුපියල් ලක්ෂ 5 ප්‍රමාණවත් නැහැ කියලා, ඒ පුද්ගලයාට කියන්න පුළුවන් "මට රුපියල් ලක්ෂ 5 එපා, මගේ ගොඩනැගිල්ලේ හානිය තක්සේරු කරන්න" කියලා. හැබැයි, රුපියල් ලක්ෂ 5ත් අරගෙන තක්සේරු කරන්න බැහැ. මූලික වටයේ රුපියල් ලක්ෂ 5ක මුදල ගන්න කැමැති හැමකෙනාටම රුපියල් ලක්ෂ 5 ගන්න පුළුවන්. එහෙම නැත්නම් තමන්ගේ ව්‍යාපාරික ස්ථානයට වෙලා තිබෙන හානිය රුපියල් ලක්ෂ 5කට වඩා වැඩියි කියලා හිතනවා නම්, ඒ පුද්ගලයාට අපට කියන්න පුළුවන්, "තක්සේරු කරන්න" කියලා. අපි තක්සේරු කරලා රුපියල් ලක්ෂ 50 දක්වා ලබා දෙන්න තීරණය කරලා තිබෙනවා. එතකොට මම හිතන්නේ ඒ ව්‍යාපාරික ස්ථාන ගොඩනැඟීම සඳහා ඒ කාර්යය ප්‍රමාණවත්.

ඊළඟට, කර්මාන්ත අමාත්‍යාංශයේ register නොවුණු, හැබැයි ප්‍රාදේශීය ලේකම් කාර්යාලවලින් වෙළෙඳ බලපත්‍ර ලබා ගත්ත සුළු ව්‍යාපාරිකයන් විශාල සංඛ්‍යාවක් ඉන්නවා. හැබැයි, ඊට අදාළ දත්ත හරියටම එකතු වෙලා නැහැ. ඒ නිසා දත්ත එකතු වෙන්නේ නැතුව අපට ඒ ගැන තීරණයක් ගන්න බැහැ. හැබැයි අපි ආණ්ඩුවක් හැටියට ඒ අයට ආධාරයක් ලබා දෙන්න ඕනෑය කියන මතයේ අපි ඉන්නවා. ගමක යම් පුද්ගලයෙක් කරගෙන ගිය කඩේ බඩු ඔක්කෝම වතුරට ගහගෙන ගියා නම් ඒ පුද්ගලයා ආපහු කඩේ පටන් ගන්නේ කොහොමද? ඒ වාගේම වෙනත් පොඩි ව්‍යාපාරයක් කරමින් හිටි අය ඉන්න පුළුවන්. අපි හිතමු, පුද්ගලයකු මාළු ලෑල්ලක් තබාගෙන හිටියා කියලා. ඒ මාළු ලෑල්ලේ හට් එක ගලවාගෙන ගියා කියලා හිතමුකෝ. හැබැයි, ඒ පුද්ගලයා register වෙලා නැහැ. නමුත්, ඒ පුද්ගලයාට නැවත ඒ ව්‍යාපාරය පටන් ගන්න නම් අලුතෙන් හට් එකක් හදා ගන්න ඕනෑ. ඒකට ආණ්ඩුව ආධාර කරන්න ඕනෑ. හැබැයි, ඒවා පිළිබඳව පූර්ණ දත්ත නැහැ. හෙට අපි සියලු දිස්ත්‍රික් ලේකම්වරු කැඳවා තිබෙනවා. ඒ දිස්ත්‍රික් ලේකම්වරුන් යටතේ ප්‍රාදේශීය වශයෙන් තිබුණු; කර්මාන්ත අමාත්‍යාංශයේ register නොවුණු ප්‍රාදේශීය වශයෙන් තිබුණු ව්‍යාපාරික ස්ථාන පිළිබඳව අපි වාර්තාවක් අරගෙන, ඒ ව්‍යාපාර නැවත නඟා සිටුවීම සඳහාත් අපි දීමනාවක් ලබා දෙන්න තීරණය කරලා තිබෙනවා. මට දැනට ඒ දීමනාව ගැන කියන්න බැහැ. සමහර විට ගඩොල් පෝරනුවක් වෙන්න පුළුවන්; ගසාගෙන ගිහිල්ලා තිබෙනවා නම්, ඒ පුද්ගලයා නැවත ශ්‍රමය යොදවලා ඒක පටන් ගන්න ඕනෑ. මම දන්නවා, සමහර ඒවා ණයට අරගෙන පටන් අරගෙන තිබෙන්නේ. ඒ නිසා ඒගොල්ලන්ට නැවත ඒ ව්‍යාපාරය පටන් ගන්න නම් අපි ඒගොල්ලන්ට ආධාරයක් ලබා දිය යුතුයි.

හැබැයි, ඒ ආධාරය ලබාදීම සඳහා ඒ කොච්චර ප්‍රමාණයක් ද කියලා තීරණය කරන්න අපට අවශ්‍යකම තිබෙනවා. කොච්චර ප්‍රමාණයකට හානි වෙලා තිබෙනවා ද කියලා අපි බලන්න ඕනෑ. හෙට දිසාපතිතුමන්ලා -දිස්ත්‍රික් ලේකම්තුමන්ලා- ඒ තොරතුරු අරගෙන ආවාට පස්සේ ඒ පිළිබඳව අපි තීරණයක් ගන්නවා.

ඊළඟට, මහා පරිමාණ ව්‍යාපාර තිබෙනවා. විශේෂයෙන්ම ඉස්සෝ වගාව වාගේ ඒවා මිල අධික විශාල ව්‍යාපාර. ඒ ව්‍යාපාරවලට දැන් තිබෙන ප්‍රධාන ප්‍රශ්නය තමයි, නැවත ආරම්භ කිරීම සඳහා අවශ්‍ය වන working capital එක. ඒක ලබා දෙන්න ඕනෑ. ඒගොල්ලන්ට වැඩ කර ගන්න සල්ලි නැහැ. ඒ නිසා අපි මෙන්න මෙහෙම තීරණයක් ගත්තා. ඒගොල්ලන් එක්ක අපි සාකච්ඡා කළා. ඒගොල්ලන්ගෙන් ආපු යෝජනා තමයි, ඔවුන්ට සහනශීලී ණයක් ලබා දෙන්න කියන එක. ඒගොල්ලන්ගේ යෝජනාවක් තිබෙනවා, සහනශීලී ණයක් ලබා දෙන්න කියලා. ඒ නිසා අපි තීරණය කර තිබෙනවා, සහනශීලී ණයක් ලබා දෙන්න. එකක් තමයි, පොඩි ව්‍යාපාරවල යෙදී සිටි අයට රුපියල් ලක්ෂ දෙකහමාරේ සිට ලක්ෂ 10 දක්වා සහනශීලී ණයක් ලබා දීම. විශාල ව්‍යාපාරවල යෙදී සිටින අයට රුපියල් මිලියන 25 දක්වා සහනශීලී ණයක් ලබා දෙන්න ඕනෑ. ඒ කියන්නේ, රුපියල් ලක්ෂ 250 දක්වා ණයක් ලබා දෙන එක.

මේ ණය ලබා දෙනකොට ආණ්ඩුව පොලියක් අය කරන්නේ නැහැ. ආණ්ඩුව මුළුමනින්ම ඒ මුදල් ටික බැංකුවට ලබා දෙනවා. බැංකු හරහා තමයි මේ ණය මුදල් දෙන්න ඕනෑ. මොකද, මේ ව්‍යාපාරවල යෙදී සිටි අයගේ පරණ ගිණුම් බලලා, මේ ව්‍යාපාරයට රුපියල් මිලියන 25ක් ඕනෑ ද, මේ ව්‍යාපාරයට රුපියල් මිලියන 10ක් ඕනෑ ද කියලා හරියටම බැංකු දන්නවා, ඒ ව්‍යාපාරිකයන් මේ බැංකුවල ගනුදෙනුකරුවන් නිසා. එතකොට බැංකුවට පුළුවන් ඒක තීරණය කරන්න. අපි මොකක්ද කරන්නේ? අපි බැංකුවට මුදල් ලබා දෙනවා; බැංකුව විසින් ඒගොල්ලන්ගේ පරිපාලන වියදම්වලට අදාළ වන පරිදි ඒ පොලියට ණය ලබා දෙනවා. ඒ කියන්නේ, ඒ අය ඉස්සර නම් පරිපාලන වියදම් ලෙස සියයට 3ක වාගේ පොලියක් ගත්තා. ඒ කියන්නේ, ආණ්ඩුව මුදල් දුන්නාට, බැංකු හරහා තමයි මේ ණය යෝජනා ක්‍රමය ක්‍රියාත්මක කරන්නේ. ආණ්ඩුව බැංකුවට සල්ලි දෙනවා; බැංකුව මේ ව්‍යාපාර

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

හානි වුණු අයට ඒ තක්සේරුව අනුව ණය මුදල් ලබා දෙනවා. ඒගොල්ලන්ට මුදල් ලබාදීමට කටයුතු කිරීමේදී බැංකුවට පරිපාලන වියදමක් යනවා. ඒ වියදමට සරිලන පොලියක් බැංකුව අය කරයි. මම හිතන විධියට සියයට 2ක, 3ක විතර පොලියක් බැංකුව අය කරයි. ඒ ආකාරයට පොලියක් අය කරලා මේ ණය මුදල් ලබා දෙනවා. ඒ වාගේම, මාස 6ක grace period එකකුත් ලබා දෙනවා. මාස 6කින් පසුව තමයි ඒගොල්ලන් මේ ණය මුදල වාරික වශයෙන් ගෙවන්න පටන් ගන්න ඕනෑකම තිබෙන්නේ. අපට මේ සුළු හා මහා පරිමාණ ව්‍යාපාරිකයින්ට රුපියල් මිලියන 25ක් වන්දි ලෙස ගෙවන එක අමාරුයි නේ. ඒක අපි කවුරුත් දන්නවා. ඒ නිසා අපි කරන්න ඕනෑකම තිබෙන්නේ ඒ ව්‍යාපාර නඟා සිටුවීම සඳහා අත දෙන එකයි. ඇත්තටම ගත්තොත් මේ මුදල් ආණ්ඩුවෙන් දෙන්නේ පොලී රහිතවයි. නමුත්, බැංකුව හරහා තමයි මේ ණය ලබා දෙන්න ඕනෑ. බැංකුව තමන්ගේ පරිපාලන වියදම් සඳහා යම් පොලී අනුපාතයක් අය කරයි. අපි හිතනවා, බැංකුව සියයට 2ත්, 3ත් අතර පොලී අනුපාතයක් යටතේ ඒ ණය මුදල් ලබා දෙයි කියලා. අපි රුපියල් මිලියන 25 දක්වා ණය යෝජනා ක්‍රමයක් හදලා තිබෙනවා, එවැනි ව්‍යාපාර යළි නඟා සිටුවන්න. ඊළඟ, ප්‍රධාන ප්‍රශ්නය,-

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

ගරු ජනාධිපතිතුමනි, එතකොට කඩවල තිබිච්ච බඩු සම්බන්ධයෙන් මොකද කරන්නේ?

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)

මෙතැනදීත් අපි ප්‍රවේසම් වෙනවා. අපේ රක්ෂණ policy එකේ ප්‍රශ්නයක් තිබෙනවා නේ. ඒ කියන්නේ, අපි බිල්ඩින් එකට වන්දියක් දෙනවා. ඒක අඩු කරලා තමයි රක්ෂණය දෙන්නේ. එහෙම policy එකක් අපේ නැහැ. අපි වෙන විධියකට කළමනාකරණය කරවන්නේ. එතකොට කෙනෙකුගේ ව්‍යාපාරයක භාණ්ඩ ගසාගෙන ගිහිල්ලා තිබෙනවා නම්, මම අර කලින් කියපු package එක යටතේ තනි, ක්ෂුද්‍ර සහ සුළු ව්‍යාපාරවලට රුපියල් ලක්ෂ 2ක දීමනාවක් දෙනවා නේ. අන්න ඒ දත්ත ටික අපට එකතු වුණාම, ඒ හානියට යම් දීමනාවක් ලබා දෙන්න අපට පුළුවන්. හැබැයි, ඒක මුළුමනින්ම තක්සේරු සහිත දීමනාව නොවෙන්න පුළුවන්. හැබැයි, දීමනාවක් අපි ලබා දෙනවා. එවැනි දීමනාවක් ලබා දෙන්න නම් අපට මේ දත්ත ටික ඔක්කෝම එකතු වෙන්න ඕනෑකම තිබෙනවා. අපි හිතනවා, හෙට අපට ඒ ගැන තීරණයක් ගන්න පුළුවන් වේවි කියලා. එවැනි දීමනාවක් අපි ඒගොල්ලන්ට ලබා දෙනවා. මම කලින් කියපු ආකාරයට ඒගොල්ලන්ගේ බිල්ඩින් එකට හානිවෙලා තිබෙනවා නම්, ආරම්භයක් ලෙස රුපියල් ලක්ෂ 5ක් දෙනවා. රුපියල් ලක්ෂ 5 ඒගොල්ලන්ට ප්‍රමාණවත් නැහැ කියලා හිතනවා නම්, තක්සේරු කරලා රුපියල් ලක්ෂ 50 දක්වා දීමනාවක් ලබා දෙනවා බිල්ඩින් එක නැවත හදා ගැනීම සඳහා. එතකොට, මේ ව්‍යාපාරිකයන්ට නැවත,-

**ගරු රිසාඩ් බදියුදීන් මහතා**
(மாண்புமிகு றிஸாட் பதியுதீன்)
(The Hon. Rishad Bathiudeen)

ගරු ජනාධිපතිතුමනි, මම ඊයේ සමහර ප්‍රදේශ බලන්න ගියා. ඒ ප්‍රදේශවල කඩවල තිබුණු භාණ්ඩ ඔක්කෝම ගසාගෙන ගිහිල්ලා තිබෙනවා. ඒ වාගේ ප්‍රශ්න ගැනත් විශේෂයෙන්ම බලන්න.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)

අනිවාර්යයෙන්ම. ඇති වෙච්ච ආපදා තත්ත්වයත් එක්ක අපි ඒක ගැන බලමු. අපේ අරමුණ මොකක්ද? අපේ අරමුණ තමයි, මේ ව්‍යසනයට පත් වුණු අයගේ ජීවිත යළි නඟා සිටුවීම සහ සමහර තැන් තිබුණාටත් වඩා උඩට අපි ගේන්න ඕනෑ කියන එක. ඒක තමයි ආණ්ඩුවක වගකීම. එහෙම නැතිව ඒ අය අත්හරින්න බැහැ. ඔයගොල්ලන් ගහ අයිනේ තමයි මේවා හදාගෙන හිටියේ කියලා අපට ඒ අයව අත්හරින්න බැහැ. අපි මේකේදී "අනවසර" කියලා සැලකිල්ලට භාජන කරන්නේ නැහැ. අපේ වගකීම තමයි, අනවසර ඉදිකිරීමකට හානිවෙලා තිබෙනවා නම් ඒකටත් ගෙවන එක. හැබැයි, අපේ අභිප්‍රාය මොකක්ද? අනවසර ඒවා අයින් කර ගන්න එක තමයි අපේ අභිප්‍රාය. ඒක තමයි ඒ සඳහා තිබෙන අපේ යෝජනාවලිය. ඊළඟ ප්‍රධාන කාරණය තමයි, නිවාස ප්‍රශ්නය.

**ගරු රවී කරුණානායක මහතා**
(மாண்புமிகு ரவி கருணாநாயக்க)
(The Hon. Ravi Karunanayake)

ගරු ජනාධිපතිතුමනි, ඒකට දින වකවානුවක් දාන්න. නැත්නම් මේක ඇදගෙන යාවි. ඉක්මනින් මේක අවසන් කරන්න ඕනෑ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)

ඇත්තටම ඔව්. ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමා මතු කරන කාරණය ඇත්ත. මේකට යම් කාලරාමුවක් අවශ්‍යයි. නැත්නම් මේක ඇදගෙන යන්න ඉඩ තිබෙනවා. ඒකයි මම කිව්වේ, අර රුපියල් ලක්ෂ 5ක් දෙනවා කියලා දාපුවාම මේ අයගෙන් සියයට 80ක් විතර ඉවත් වෙයි කියලා මම හිතනවා. එහෙම නැතිව මේ හැමකෙනාගේම ඒවා තක්සේරු කර කර වන්දි දෙන්න ගියොත් මේ වැඩේ කරන්න බැහැ. මොකද, ගෙවල් විතරක් 120,000ක් පමණ වාර්තා වෙලා තිබෙනවා. මේ හැම නිවසක්ම තක්සේරු කරන්න ගියොත් මේ වැඩේ කරන්න හම්බ වෙන්නේ නැහැ.

සමහර අයට වැඩි වෙන්න පුළුවන්; සමහර අයට අඩු වෙන්න පුළුවන්. නමුත්, අපි රුපියල් ලක්ෂ 5ක දීමනාවක් දෙනවා කිව්වාම සියයට 80ක් විතර එතැනින් එළියට යයි කියලායි මා හිතන්නේ. මොකද, ඒ රුපියල් ලක්ෂ 5 අරගෙන, එය ප්‍රමාණවත් කියලා ඒ ගොල්ලන් හිතනවා. ඊට පසුව ඉතිරි ටික තක්සේරු කරලා දෙන්න අපට පුළුවන්. මම හිතනවා එතකොට අපට එය කාර්යක්ෂම කර ගන්න පුළුවන් කියලා.

ගරු රවී කරුණානායක මන්ත්‍රීතුමනි, ඔබතුමා මතු කරපු කාරණය ඇත්ත. කාල රාමුවක් අවශ්‍යයි. හැබැයි, අපි මේක අද - සිකුරාදා- කිව්වාට පස්සේ සඳුදා ගිහිල්ලා, 'ලැබුණාද?' කියලා අහන්න නම් එපා. ඒක සාධාරණ නැහැ නේ. එහෙම ඒවා අහන කොට තමයි ප්‍රශ්නය වෙන්නේ. අද සිකුරාදා මේක සම්මත කරනවා. සඳුදා ගිහිල්ලා අහනවා 'ලැබුණාද?' කියලා. පොතේත් ලියා ගන්නවා. ඇත්තටම අපි මේකට ඕවර්සියර් මහත්තුරු ටිකක් පත් කරන්න හිතාගෙන ඉන්නවා. විමර්ශනය කරන්න ඕනෑ, මෙය ක්‍රියාත්මක වෙනවාද කියලා. මම කියන්නේ එහෙම ඒවා කරන්න එපා කියලායි. ඒ ඔක්කෝම රැස් වෙන තැනක් තිබෙනවා. ඒ මොකක්ද? හැම දිස්ත්‍රික්කයකම දිස්ත්‍රික් ආපදා කළමනාකරණ කමිටුව තිබෙනවා. ප්‍රාදේශීය ආපදා කළමනාකරණ කමිටුව තිබෙනවා. ඔබතුමන්ලා ඒවාට සහභාගි වෙන්න. ඒවාට ඒ අදාළ නිලධාරින් ඔක්කොම එනවා. ඒවා බලන්න පිට පළාත්වලින් යන්න ඕනෑ නැහැ. කොළඹින් යන්න ඕනෑ නැහැ, මාතලේ මොකද වුණේ කියලා බලන්න. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට ඒ නිලධාරින් ඔක්කෝම එනවා; තමුන්නාන්සේලාගේ මන්ත්‍රීවරුත්

එනවා. එතැනදී ඒ ප්‍රශ්නය ගන්න. "මේ ග්‍රාම සේවා වසමේ මෙන්න මේ අයට රුපියල් 25,000 ලැබිලා නැහැ. ඒ, මොකද?" කියලා අහන්න. එයට වග කියන නිලධාරියා එතැන ඉන්නවා. ඇත්ත ප්‍රශ්නය විසඳන්න නම් ක්‍රමයක් තිබෙනවා. බදුල්ලේ ආපදා කළමනාකරණ කමිටුව කාලයක් හැම දාම රෑ 7.00ට රැස් වුණා. එය උදේ 7.00ටයි, රෑ 7.00ටයි දෙකටම රැස් වුණා. ඒ කමිටු දිනපතා රැස් වෙනවා. දැන් නම් දිනපතා රැස් වෙන්න අවශ්‍ය නැහැ. එහෙම නේද? බදුල්ලේ ආපදා කළමනාකරණ කමිටුව දැන් දවසක් ඇර දවසක් රැස් වෙනවා. ඉතින් ඒ කමිටුවලට තමුන්නාන්සේලා යන්න. විපක්ෂය ඇතුළු අප හැම දෙනාගේම අභිප්‍රාය වෙන්න ඕනෑ මොකක්ද? කොතැනක හරි මේ කියන දීමනා ලැබෙන්නේ නැත්නම් ලැබෙන්නේ නැති තැන් ටික බලලා ඒ තැන්වල ඉන්න නිලධාරි මහත්තුරුන්ගෙන් අහන්න, 'ඇයි, මේ දීමනා ලැබෙන්නේ නැත්තේ?' කියලා.

**ගරු කේ.වී. සමන්ත විද්‍යාරත්න මහතා (වැවිලි සහ ප්‍රජා යටිතල පහසුකම් අමාත්‍යතුමා)**
(மாண்புமிகு கே.வீ. சமந்த வித்யாரத்ன - பெருந்தோட்ட மற்றும் சமூக உட்கட்டமைப்பு வசதிகள் அமைச்சர்)
(The Hon. K.V. Samantha Viddyarathna - Minister of Plantation and Community Infrastructure)
බදුල්ලේ එකට නම් ඒ කිසි කෙනෙක් ආවේ නැහැ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
ඒක නේ ඉතින්. ඒ රැස්වීම්වලට එන්නේ නැත්නම් මොකක්ද තත්ත්වය? බදුල්ලේ අපේ සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා කියන්නේ, විපක්ෂයේ කවුරුවත් ඒ රැස්වීම්වලට එන්නේ නැහැ කියලායි. ඒ කමිටුවලට ගිහිල්ලා බලන්න. මේ මුදල් ඇත්තටම පුරවැසියන්ට ලබා දෙන්න නම් කළ යුත්තේ කුමක්ද? ඊට වග කිව යුතු නිලධාරින් ඉන්නවා, ඒ නිලධාරින් එක්ක ආපදා කළමනාකරණ කමිටුවේ හමුවක් තිබෙනවා. ඒ ආපදා කළමනාකරණ කමිටුවට ඔක්කෝම එනවා. පාර්ලිමේන්තුවේ අපිත් තමුන්නාන්සේලාත් ඔක්කෝම එකතු වෙලා මුදල් අනුමත කර දීලා තිබෙනවා, පාර්ලිමේන්තුවෙන්. ඒ කමිටු රැස්වීම්වලට ගිහිල්ලා අහන්න ඕනෑ "මේක ලැබුණා ද නැද්ද, ලැබිලා නැත්තේ මොකද, කීදෙනෙකුට ලැබුණාද, කොහේද ලැබිලා නැත්තේ?" කියලා. ඇත්තටම ප්‍රශ්නය විසඳන්න ඕනෑ නම් කරන්න ඕනෑකම තිබෙන්නේ ඒක නේ. ඇත්තටම ඒ පුරවැසියන්ට මේ දීමනා ලබා දීමේ අවංක, සත්‍ය වුවමනාවක් නම් තිබෙන්නේ, ආපදා කළමනාකරණ කමිටුවලට ඇවිල්ලා ප්‍රශ්නය අහන්න. වෙනත් ව්‍යාජයක් නම් තිබෙන්නේ, පාරෙන් පාරට ගිහිල්ලා කොළයේ ලියාගෙන එන්න, ලැබුණාද, නැද්ද කියලා. ඒවා බොරු. හොඳද? ඇත්ත වුවමනාව නොවෙයි ඒකේ තිබෙන්නේ. ඇත්ත වුවමනාවක් තිබෙනවා නම්, ගරු මනෝ ගනේසන් මන්ත්‍රීතුමා, ඔබතුමාගේ ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට අදාළ ආපදා කළමනාකරණ කමිටුවට සහභාගි වෙලා ප්‍රශ්න අහන්න ඔබතුමාට පුළුවන්. මොකද, එතැන නිලධාරින් ඉන්නවා. අපි ඔක්කෝම එකතු වෙලා ඒ ගැන අහමු. මොකද, අපි මුදල් පාස් කරලා දීලා තිබෙනවා. අදාළ විධියට මුදල් ලැබුණා ද, නැද්ද කියලා සොයා බලන එක අප හැම දෙනාගේම වගකීම. මාස දෙකක් විතර ගිහිල්ලා ගෙයින් ගෙට යන්න. දැන් කමිටුවට යන්න. මම අවංකව ඉල්ලා සිටින්නේ ඒකයි. එතකොට මේ ප්‍රශ්නය නිරාකරණය කර ගන්න පුළුවන්. මොකද, අප හැම දෙනාටම ඕනෑකම තිබෙන්නේ එම දීමනා කාර්යක්ෂමව ලබා දෙන්න නම්, එය ලබා දීම කාර්යක්ෂම කරන ස්ථානය තමයි මේ කියන ආපදා කළමනාකරණ කමිටුව. ඒක වැදගත් කියලා මම හිතනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඊළඟට මා විශේෂයෙන්ම අවධානය යොමු කරන්න කැමැතියි, නිවාස ප්‍රශ්නය ගැන. මම මේ පාර්ලිමේන්තුවේදී කිව්වා, පූර්ණ වශයෙන් නිවාස අහිමි වුණු හැම කෙනෙකුටම රුපියල් ලක්ෂ 50ක් ලබා දෙනවා කියලා. ඊට අමතරව කිව්වා, රජයෙන් ඉඩමක් ලබා දෙන්න උත්සාහ කරනවා. ඉඩමක් ලබා දෙන්න බැරි නම් රුපියල් ලක්ෂ 50 දක්වා සීමාවකට ඉඩමක් මිල දී ගන්න අවස්ථාව දෙනවා කියලා. ඒක තමයි අපේ යෝජනාව. ඒ යෝජනාව, පූර්ණ වශයෙන් නිවාස හානි වූ අයටයි. පූර්ණ වශයෙන් හානි වුණු නිවාස ගැන මම කලින් කිව්වා. පූර්ණ වශයෙන් හානි වුණු නිවාස තිබෙනවා 6,228ක්. නමුත්, අප මේක අධ්‍යයනය කරන කොට පෙනුණා, පූර්ණ වශයෙන් හානි වුණු නිවාසවලට පමණක් මේක යෝජනා කරලා හරි යන්නේ නැහැ කියලා. පූර්ණ වශයෙන් හානි වෙලා තිබෙන නිවසට එහා පැත්තේ නිවසට අර්ධ හානි වෙලා තිබෙනවා වෙන්න පුළුවන්. හැබැයි, NBRO එකෙන් කියනවා ඒ අයට එතැන පදිංචියට යන්න සුදුසු නැහැ කියලා. ඒ හානි වුණු කලාපයේ තවත් නිවසක් තිබෙනවා, නිවසට හානි වෙලා නැති. හැබැයි, අවදානම් කියලා කියනවා. එහෙම ගත්තොත්, මා කලින් කිව්වා වාගේ, පූර්ණ වශයෙන් හානි වුණු නිවාස තිබෙනවා 6,228ක්. අර්ධ හානි වූ නමුත් පදිංචිය සඳහා NBRO එකේ අවසරය ලබා නොදෙන නිවාස තිබෙනවා, 4,543ක්. හානි නොමැති නමුත් පදිංචිය සඳහා NBRO එකෙන් අවසරය නොදෙන නිවාස තිබෙනවා, 6,877ක්. මුළු නිවාස ප්‍රමාණය තිබෙනවා, 17,648ක්. ඊට අමතරව, තවත් කාණ්ඩයක් ඉන්නවා. එනම්, මීට පෙර අවදානම් කලාප කියලා කියපු තැන්වල තවත් ගෙවල් තිබෙනවා. ඒවා මේ සැරේ නාය ගිහිල්ලා නැහැ. හැබැයි, කලින් කියලා තිබුණේ, ඒවාත් අධිඅවදානම් කියලායි.

අපේ සමන්ත විද්‍යාරත්න ඇමතිතුමා ඒ ගැන දන්නවා ඇති. අධිඅවදානම් කියලා කලාප තිබෙනවා. නමුත්, මේ වතාවේ නාය ගිහිල්ලා නැහැ. එතකොට මේ අවදානම් කලාපවල කාණ්ඩ 4ක් ඉන්නවා. ඒ තමයි, පූර්ණ වශයෙන් නිවාස අහිමි වුණු අය, අර්ධ වශයෙන් නිවාස හානි වෙලා අධිඅවදානම් කලාපවල ඉන්න අය, හානි නොවී අධිඅවදානම් කලාපවල ඉන්න අය. ඒ වාගේම, මේ සැරේ නාය යාමට බඳුන් නොවුණු අධිඅවදානම් කලාපවල ජීවත් වන අය.

අපේ මුළු ප්‍රතිපත්තිය තමයි, මේ සියලුදෙනාම අවදානම් කලාපවලින් යළි සුරක්ෂිත පළාත්වල පදිංචි කරවන එක. අපි ඒක පියවරෙන් පියවර පටන් ගන්නවා. පියවරෙන් පියවර පටන් ගන්නවා කියන්නේ මොකක්ද? මා කලින් කියපු, නාය යාමට භාජනය වුණු කලාපවල මා අර කියපු කාණ්ඩ 3ටම ඇතුළත් පවුල් 17,648ටම රුපියල් ලක්ෂ 50 දීමනාව ලබා දෙනවා. ඒකට රුපියල් බිලියන 85ක් විතර යනවා. ඒක කරන්න ඕනෑ. මා හිතන විධියට, අපි එය වියදමක් හැටියට දැරිය යුතුයි. ජනතාවගේ ජීවිත අපි කොතැනින්ද මිල කරන්නේ? ඒකට සීමාවක් නැහැ. මෙහිදී පාර්ලිමේන්තුව හැටියට අප හැමදෙනාටම වගකීමක් තිබෙනවා. මේ පවුල් 17,648ම අපි එතැනින් ඉවතට ගන්නවා.

ඊළඟට, අධිඅවදානම් කලාපයේ ජීවත් වන අනෙක් පවුල්වලට 2026 වසර සඳහා නිවාස 2,000ක් වෙනුවෙන් අපි සල්ලි වෙන් කරලා තිබෙනවා. ඒක, රුපියල් ලක්ෂ 25 දීමනාව. ඒක තව ප්‍රමාණයකින් වැඩි කරලා ඒ කණ්ඩායමත් එළියට ගන්න අපි උත්සාහ කරනවා. අපට 2026දී ඒක කරන්න බැරි වෙයි. නමුත් 2027 වනකොට අධිඅවදානම් කලාපවල කිසිදු පවුලකට ජීවත් වෙන්න බැරි විධියට නීති සම්පාදනය කරනවා; ඒ අය එම කලාපවලින් එළියට ගැනීම සඳහා අවශ්‍ය වන මූල්‍ය පහසුකම ලබා දෙනවා.

ඊළඟ කාරණය මොකක්ද? කුරුණෑගල වාගේ ප්‍රදේශ ගත්තොත්, එහේ සමහර අය ගංවතුරට යට වුණා; නමුත් ඒ අයට ඉඩම තිබෙනවා. ඒවා මේ වාගේ ගංවතුරකට යට වෙනවා මිසක් වාර්ෂිකව යට වන තැන් නොවෙයි. ඒ ගොල්ලන් ඒ ඉඩමටම

[ගරු අනුර කුමාර දිසානායක මහතා]

යන්න කැමැති නම්, එහෙම යනවාට NBRO එකෙන් මුකුත් කියන්නේත් නැත්නම්, හානිදායකත් නැත්නම් ඒ අයට දැන්මම පුළුවන් ඒක කරන්න. අපේ පළමු පියවර තමයි, මුළුමනින්ම නිවාසය අහිමි වුණු එහෙත් පදිංචි වීම සඳහා ඉඩම සුදුසු අයට රුපියල් ලක්ෂ 50 ලබා දෙන එක. එතැන වාර්තා වෙලා තිබෙනවා, 2,000ක් විතර ඉන්නවා කියලා. ඒ 2,000 ඉක්මනින්ම ඉවත් කර ගන්න අපට පුළුවන්.

ඊළඟට, අපි හැම දිස්ත්‍රික් ලේකම්වරයෙකුටම දැනුම් දීලා තිබෙනවා, තම පළාතේ තිබෙන ඉඩම් හොයා ගන්න කියලා. රජයේ ඉඩම්. සමහර විට පෞද්ගලික ඉඩම් වෙන්නත් පුළුවන්. පෞද්ගලික ඉඩම් ඒ ගොල්ලන්ගේ එකඟතාව මත රජයට අත්පත් කර ගන්න අපි සැලසුම් හදලා තිබෙනවා. මොකද, ඉඩම් අවශ්‍යයි, ඒ ජනතාව පදිංචි කරවන්න. පවුල් 17,000න් 2,000ක් තමන් හිටපු තැන්වලටම ගියොත් පවුල් 15,000කට අලුතින් ඉඩම් අවශ්‍යයි. ඒ නිසා අලුතින් ඉඩම් ලබා දීම සඳහා රජය සහ රජය විසින් අත්පත් කර ගනු ලබන - රජයට අත්පත් කර ගත හැකියි - ඉඩම්වල ඉතිරි පවුල් 15,000ම පදිංචි කරවන්න අපි සැලසුම හදලා තිබෙනවා. අන්න ඒ දක්වා ඒ පවුල් 17,000ටම මා කලින් කිව්වා වාගේ මාස 6කට රුපියල් 25,000 ගණනේ දීමනාවක් ලබා දෙනවා, නිවාසයක කුලියට ඉන්න. ඒ අය තමන්ගේ ඥාතියෙකුගේ ගෙදර හිටියත් ඒක ලැබෙනවා. එතකොට මම හිතනවා, මේ ඇති වුණු තත්ත්වය සැලකිය යුතු ප්‍රමාණයකින් යථාවත්භාවයට පත් කර ගන්න අපට පුළුවන්කම ලැබේවි කියලා. අපි රුපියල් බිලියන 500ක පරිපූරක ඇස්තමේන්තුව ඉදිරිපත් කරන්නේ ඒ ජනතාවගේ යහපත වෙනුවෙන්.

අපි පියවර කිහිපයක් අනුගමනය කරනවා. පළමුව අපි විශාල මෙහෙයුමක් දියත් කළා. එයින් ජනතාව මුදා ගන්න. විශාල පිරිසක් මුදා ගන්න අපි සමත් වුණා. දෙවෙනි පියවර බවට පත් වුණේ, අවතැන් වුණු ජනතාව සුරක්ෂිතව සුරක්ෂිත මධ්‍යස්ථානවලට ගෙන යෑම, ආහාර පාන ලබා දීම, සෞඛ්‍ය ආරක්ෂණය ලබා දීම. දැන් ඒ පියවර අවසන්. තුන්වෙනි පියවර බවට පත් වෙන්නේ ඒ අය නැවත පදිංචි කරවීම සහ ඒ ගොල්ලන්ගේ ජීවනෝපාය සකස් කරලා දෙන එක. ගොවියෙකු නම් කෘෂි කර්මාන්තයට යොදවන එක; සත්ත්ව පාලනය කරන කෙනෙකු නම් ධීවර කර්මාන්තයට යොදවන එක; සුළු කර්මාන්තයේ යෙදෙන කෙනෙකු නම් ඒකට අවශ්‍ය සහාය දෙන එක; ඒ ගොල්ලන්ගේ ජීවනෝපාය සම්පූර්ණ කරලා දෙන එක. ඊළඟ පියවර, අවතැන් වුණු අයට අවශ්‍ය වන නිවාස ටික සකස් කරලා දෙන එක.

ඊළඟ පියවර මොකක්ද? අපට මෙවැනි ස්වාභාවික ව්‍යසන වළක්වන්න බැහැ. හැබැයි, ස්වාභාවික ව්‍යසනවලින් විය හැකි හානිය වැළැක්වීම සඳහා විශේෂයෙන්ම මධ්‍යම කඳුකරය යළි යථාවත් කිරීම ඉලක්ක කරගත් දීර්ඝ කාලීන සැලසුමක් සකස් කරලා ක්‍රියාත්මක කරනවා.

මේ අනුව, ඉතාම විධිමත් පියවර ගණනාවකින් අපි මේකට ප්‍රවිෂ්ට වෙලා තිබෙනවා. මේ කිසිවක් ඒ වෙලාවේ දැනිලා, ඒ වෙලාවේ හැඟිලා කරපු වැඩ නොවෙයි. මේ හැම එකක්ම සැලසුම් සහගතව කරපු ඒවා. අපි හැම තැනම ගිහිල්ලා කථා කළේ මොකක්ද? ඉස්සෙල්ලාම ඒ ජනතාව පදිංචි කරවන්න ඕනෑ. හැබැයි, ජනතාව එතැනට යන්න නම් ඒ අයට ප්‍රවිෂ්ට මාර්ග අවශ්‍යයි. පාර නැතිව යන්න බැහැ. මාර්ග සංවර්ධන අධිකාරිය, පළාත් මාර්ග සංවර්ධන අධිකාරිය, ප්‍රාදේශීය සභා විශාල වෙහෙසක් දරලා පළාත් පාලන ආයතනවලට අදාළ පාරවල් සියල්ල සැලකිය යුතු ප්‍රමාණයක් -මා හිතන්නේ සියයට 90කට වඩා වැඩි ප්‍රමාණයක්- ප්‍රතිසංස්කරණය කරලා හැම පුරවැසියෙකුටම ප්‍රවිෂ්ට මාර්ග හදා දීලා තිබෙනවා. ඒක වැදගත්, මේක යථාවත් කරන්න. සමහර ඒවා තාවකාලිකයි. ඒක හරි. ඒ සමහර ඒවා තාවකාලිකයි. එහෙම නේ කරන්න ඕනෑකම තිබෙන්නේ. අපි ඒ ටික කරලා දීලා තිබෙනවා.

ඊළඟට, ඒගොල්ලන්ට අවශ්‍ය වන විදුලිය පහසුකම සපයන්න ඕනෑ. ලංකා විදුලිබල මණ්ඩලයේ නිලධාරීන් විශාල වෙහෙසක් දරා -ඒ කටයුතු කරන අතරතුර එක නිලධාරි මහත්මයෙක් මිය ගියා- මා හිතන විධියට විදුලි බලය ලබා දීම දැන් වන කොට හැම තැනම වාගේ යථාවත් කරලා තිබෙනවා. ඒ ජනතාවගේ යටිතල පහසුකම් හදලා දෙන එක අපගේ දෙවෙනි පියවර. තුන්වෙනි එක, ජල සැපයුම. ඒගොල්ලන් ආකාර තුනකට ජලය සපයා ගන්නවා. එකක්, ජාතික ජල සම්පාදන හා ජලාපවහන මණ්ඩලයෙන් - National Water Supply and Drainage Board එකෙන්. දෙවෙනි එක, ජාතික ප්‍රජා ජල සැපයුම් දෙපාර්තමේන්තුවෙන්. තුන්වෙනි එක, ඒගොල්ලන්ගේම වූ ළිඳකින්. අපි National Water Supply and Drainage Board එකත් එක්ක කථා කරලා සියලු ජල සැපයුම් දැන් යථාවත් කරලා තිබෙනවා.

ප්‍රජා ජල සංවර්ධන ව්‍යාපෘතිවල ජල මූලාශ්‍ර දෙක තුනකට විශාල හානියක් වෙලා තිබෙනවා. මේ වෙනකොට අනෙක් ඔක්කොම ඒවායේ ප්‍රතිසංස්කරණ කටයුතු අවසන් කරලා තිබෙනවා. ඊළඟට, ළිං පිරිසිදු කිරීම ගත්තොත්, හමුදාව, අපේ පක්ෂයේ සාමාජිකයෝ ගෙවල් ගාණේ ගිහිල්ලා ස්වේච්ඡාවෙන් ඒ ළිං ටික පිරිසිදු කරලා තිබෙනවා. ඒ ජීවිත යළි යථාවත් කරන්න නම් ඒ ජනතාවට අවශ්‍ය පානීය ජලය ලබා දෙන්නට ඕනෑ.

ඒ වාගේම, මම සන්නිවේදනය ගැනත් කියන්න ඕනෑ. අපි අවස්ථා ගණනාවකදී අදාළ සන්නිවේදන ආයතනත් එක්ක සාකච්ඡා කරලා, සන්නිවේදන අවශ්‍යතා සපයා දීලා තිබෙනවා. අපේ ඊළඟ අභිප්‍රාය වෙන්නේ පාසල් ආරම්භ කිරීම. දැනට පාසල් 200කට ආසන්න ප්‍රමාණයක,-

**ගරු (ආචාර්ය) හරිනි අමරසූරිය**
(மாண்புமிகு (கலாநிதி) ஹரினி அமரசூரிய)
(The Hon. (Dr.) Harini Amarasuriya)
දැනට පාසල් 600 ගණනක් විවෘත කරලා නැහැ.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)
තව පාසල් කිහිපයක් විවෘත කරන්න තිබෙනවා. ඒ පාසල් ටිකත් ඉතා ඉක්මනින් විවෘත කිරීම තමයි අපේ ඊළඟ අභිප්‍රාය. මම නැවත කියන්නේ, මේ එකක්වත් දකිනකොට, හිතෙනකොට කරන ඒවා නොවෙයි. අපි ඉතාම සැලසුම්සහගතව, පියවරෙන් පියවර මේ සඳහා වන සැලසුම් සකස් කරලා, අද වෙනකොට මේ ජීවිත යථාවත් කිරීමට අවශ්‍ය යටිතල පහසුකම් ටික සකස් කරලා තිබෙනවා. ආණ්ඩුවක් හැටියට ඒ වගකීම අපි නිසි පරිදි ඉටු කළාය කියන තෘප්තිය අපට තිබෙනවා. ඒ වාගේම එම වගකීම ඉටු කළා යැයි කියන හැඟීමත් අපට තිබෙනවා. අපි ඒ කටයුතු කරලා තිබෙනවා.

මේ ව්‍යසනය දෙස බැලුවාම බොහෝ අය හිතුවා තමන්ගේ ජීවිත යළි යථාවත් කර ගන්න සැලකිය යුතු කාලයක් යයි කියලා. පාර විවෘත වෙන්න, විදුලිය ලබා ගන්න සැලකිය යුතු කාලයක් යයි කියලා හිතුවා. විදුලි සම්පාදනය පැත්තෙන් ගත්තොත්, high tension කණු ගැලවිලා ගිහින් තිබුණේ. National Water Supply and Drainage Board එකේ පොම්ප, machines ඔක්කෝම ගැලවිලා ගිහිල්ලා තිබුණේ. පාරවල් බෝක්කු පිටින් ගැලවිලා ගිහිල්ලා තිබුණා. විශේෂයෙන්ම අපට ඉන්දියානු රජයෙන්

තාවකාලික පාලම් ලබා දුන්නා. අපේ හමුදාව සතුවත් පාලම් තිබුණා. RDA එකේත් තිබුණා. ඒ අය තාවකාලික පාලම් ස්ථාපිත කළා. අපේ ළඟ තිබෙන පාලම් සංචිතය කොහොමද කියලා අපි බැලුවා, ඒවා අවශ්‍ය වන තැන් ටික බැලුවා, ඒ සඳහා අවශ්‍ය සැලැස්ම RDA එකෙන් හැදුවා. ඒ සැලැස්මට අනුව අවශ්‍ය තාවකාලික පාලම් ටික අපි හැදුවා. මේ රට යථාවත් කිරීම සඳහා අපි ඉතාම සැලසුම්සහගතව කටයුතු කරලා තිබෙනවා. ඒ වාගේම අපට තව ඉස්සරහට යන්න ඕනෑකම තිබෙනවා කියලාත් මම හිතනවා. ඒ පාරවල් ස්ථාවර පාරවල් බවට පත් කරන්න ඕනෑ. ඒ සඳහා RDA එක ඇස්තමේන්තු හදලා තිබෙනවා. RDA එකට අයිති පාරවල් ටික හදන්න රුපියල් බිලියන 190ක් වැය වේවි කියලා RDA එක කියනවා. ඒ සඳහා වෙන් කර තිබෙන මුදල්වලින් කොච්චර ප්‍රමාණයක් ගන්න පුළුවන්ද කියා සොයා බලා, අවශ්‍ය අමතර මුදල් මේ පරිපූරක ඇස්තමේන්තුව මඟින් ලබා දෙන්න අපි කල්පනා කරනවා.

Sri Lanka Railways එකටත් විශාල හානියක් සිද්ධවෙලා තිබෙනවා. ඒ ඇස්තමේන්තුව ඉතාම හොඳින් සකස් කරමින් තිබෙනවා. ඒ ඇස්තමේන්තුව අපට ලැබුණාම, ඒ සඳහා අවශ්‍ය ප්‍රතිපාදන ලබා දෙන්නත් අපි සැලසුම් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම වාරිමාර්ග දෙපාර්තමේන්තුව ගත්තොත්, එම දෙපාර්තමේන්තුවට අයත් හානිවෙලා තිබෙන තිබෙන තැන් ටික ගැනත් සොයා බලා, ඒවාත් ලබන අවුරුද්ද තුළ ප්‍රතිසංස්කරණය කරන්න ඕනෑ. ආරම්භයක් ලෙස මේ මහ කන්නයට අවශ්‍ය ජල සැපයුම් දුන්නත්, දිගටම ඒ විධියට දෙන්න බැහැ. ඊළඟ යල කන්නය වෙනකොට කුමන වාරිමාර්ග පද්ධතියද ප්‍රතිසංස්කරණය කරන්න ඕනෑ කියලා අපි තෝරාගෙන තිබෙනවා. ඊළඟ මහ කන්නය එනකොට අපි කුමන වාරිමාර්ග පද්ධතිද ප්‍රතිසංස්කරණය කරන්නේ කියලා සැලසුම් සකස් කරලා තිබෙනවා.

විශේෂයෙන්ම ගත්තොත්, මේ රටේ ජාතික භෞතික සැලසුම් දෙපාර්තමේන්තුවේ නිලධාරි මහත්වරු ඉතාම වෙහෙසක් දරලා මේ දෙපාර්තමේන්තුවල තොරතුරු ඔක්කෝම එකතු කරලා පොඩි, පොඩි packages හදලා තිබෙනවා. කවුරුන් හෝ ආධාරයක් දෙන්න ලෑස්ති නම් ඒවා තැන තැන යවන්න එපා, අක්‍රමවත්ව වියදම් කරන්න එපා, ප්‍රතිඵලයක් නැහැ. දෙන්න පුළුවන් මුදල කියන්න, ඒ මුදලට කරන්න පුළුවන් අදාළ වැඩේ මොකක්ද කියලා අපි කියන්නම්. මෙන්න මේ වැඩේ අපට කරලා දෙන්න, ඒ සඳහා මෙච්චර මුදලක් වැය වෙයි කියලා අපි කියන්නම්. අපි ආධාර ලබා ගන්න අපේක්ෂා කරනවා. මේ මුළු බරම අපේ භාණ්ඩාගාරයට දරාගන්න බැරි බව අපි දන්නවා. නමුත්, ඒ සඳහා විධිමත් වැඩ පිළිවෙළක් අවශ්‍යයි. අපි දන්නවා, පසුගිය කාලයේ ඒ විධියට ආධාර දෙනකොට ඒ කටයුතු විධිමත්ව සිද්ධ වුණේ නැති නිසා ඒ වියදම් කරපු මුදලට සාපේක්ෂව අපට ප්‍රතිඵල ලැබුණේ නැහැ. එම නිසා, ආධාර ලබා දිය යුතු පොඩි පොඩි packages කිහිපයක් අපි හදනවා. පාසල් දෙකක් හදලා දෙන්න කවුරු හරි දානපතියෙක් කැමති නම්, ඒ සඳහා අපිත් පොඩි සැලැස්මක් හදලා, මේ පාසල් දෙක හදන්න මෙච්චර මුදලක් වැය වෙනවා කියලා අපි කියනවා. කවුරු හරි කැමති නම් රෝහලක් හදන්න උදව් කරන්න, කවුරු හරි කැමති නම් පාරක් හදලා දෙන්න, කවුරු හරි කැමති නම් පාලමක් හදලා දෙන්න, අපට එයාගේ නම වුණත් ඒකේ ගහන්න පුළුවන්. ඒ ආධාර ලබා ගැනීම සඳහා package එකක් හදන්න අපි සැලසුම් කරලා තිබෙනවා.

ඒ වාගේම අපේ ආගමික ස්ථාන පිරිසිදු කර ගැනීම සඳහා අවශ්‍ය වන රුපියල් 25,000 දීමනාව අපි ලබා දීලා තිබෙනවා. ගරු බුද්ධ ශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු ඇමතිතුමා එවැනි ආගමික ස්ථාන 861ක් හඳුනාගෙන තිබෙනවා.

**ගරු (ආචාර්ය) හිනිදුම සුනිල් සෙනෙවි මහතා (බුද්ධශාසන, ආගමික සහ සංස්කෘතික කටයුතු අමාත්‍යතුමා)**
(மாண்புமிகு (கலாநிதி) ஹினிதும சுனில் செனெவி - புத்தசாசன, சமய மற்றும் கலாசார அலுவல்கள் அமைச்சர்)
(The Hon. (Dr.) Hiniduma Sunil Senevi - Minister of Buddhasasana, Religious and Cultural Affairs)

දැනට ආගමික ස්ථාන 1,000කට ආසන්න ප්‍රමාණයක තොරතුරු තිබෙනවා.

**ගරු අනුර කුමාර දිසානායක මහතා**
(மாண்புமிகு அநுர குமார திஸாநாயக்க)
(The Hon. Anura Kumara Dissanayake)

දැනට 1,000කට කිට්ටු ප්‍රමාණයක් පිළිබඳව තොරතුරු ඇවිල්ලා තිබෙනවා. ඒ සියල්ලම ප්‍රතිසංස්කරණය කිරීම සඳහා සැලසුම් හදලා තිබෙනවා. පන්සල් සහ අනෙකුත් ආගමික ස්ථාන - පල්ලි, කෝවිල් ආදිය - ප්‍රතිසංස්කරණය කිරීම සඳහා දායක සභාවල දායකත්වය ලබා දෙන්න එකඟතාව පළ කරලා තිබෙනවා. මේ විධියට රජයත්, ඒ වාගේම අපේ පුරවැසියන්, විදෙස්ගත ශ්‍රී ලාංකිකයන්, මේ ඔක්කෝම එකතු කර ගත්තොත් මේ කටයුතු කරන්න පුළුවන්. එක්සත් ජනපදයේ ජීවත් වන ශ්‍රී ලාංකිකයන්ට පුළුවන් යම් ව්‍යාපෘතියක් භාර ගන්න. ප්‍රංශයේ ජීවත් වන සමහර ශ්‍රී ලාංකිකයන්ට පුළුවන් තව ව්‍යාපෘතියක් භාර ගන්න. ඒ විධියට අපි අපේ ශ්‍රී ලාංකිකයන්ට මේ ව්‍යාපෘති බෙදලා දෙනවා. අපේ රටේ සිටින දානපතියන්ටත් මේ ව්‍යාපෘති බෙදලා දෙන්න අපි කල්පනා කරනවා.

අපේ ආණ්ඩුව, විපක්ෂය, පොදු ජනතාව, අපේ විදෙස් මිතුරන් - මේ සියලුදෙනා - එකතු කරලා දායකත්වය ගත්තොත් මේ තත්ත්වයෙන් ඉතා ඉක්මනින් ගොඩ ඇවිල්ලා අපි අය වැය ලේඛනයෙන් අපේක්ෂා කරමින් තිබෙන වැඩසටහන ඉදිරියට ක්‍රියාත්මක කරන්න පුළුවන් වෙයි කියලා අපි හිතනවා. ඒ වෙනුවෙන් මේ රුපියල් බිලියන 500 පරිපූරක ඇස්තමේන්තුව සම්මත කරලා දෙන්න කියා මේ පාර්ලිමේන්තුවෙන් ඉල්ලා සිටිමින් මම නවතිනවා.

බොහොම ස්තුතියි, ගරු නියෝජ්‍ය කථානායකතුමනි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*வினா விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*
*Question put, and agreed to.*

## කල්තැබීම
## ஒத்திவைப்பு
## ADJOURNMENT

***එකල්හි වේලාව අ.භා. 5.30 පසු කර තිබුණෙන් ගරු නියෝජ්‍ය කථානායකතුමා විසින් ප්‍රශ්නය නොවිමසා පාර්ලිමේන්තුව කල් තබන ලදී.***

***පාර්ලිමේන්තුව ඊට අනුකූලව, අ.භා. 6.07ට, අද දින සභා සම්මතිය අනුව, 2026 ජනවාරි 06වන අඟහරුවාදා පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***

*அப்பொழுது நேரம் பி.ப. 5.30 மணிக்குப் பிந்திவிட்டமையால் மாண்புமிகு பிரதிச் சபாநாயகர் அவர்கள் வினா விடுக்காமலேயே பாராளுமன்றத்தை ஒத்திவைத்தார்.*

*இதன்படி, பி.ப. 6.07க்கு, பாராளுமன்றம் அதனது இன்றைய தீர்மானத்திற்கிணங்க, 2026 சனவரி 06, செவ்வாய்க்கிழமை மு.ப. 9.30 மணி வரை ஒத்திவைக்கப்பட்டது.*

*It being past 5.30 p.m., THE HON. DEPUTY SPEAKER adjourned Parliament without Question put.*

*Parliament adjourned accordingly at 6.07 p.m. until 9.30 a.m. on Tuesday, 06th January, 2026, pursuant to the Resolution of Parliament of this Day.*

**සැ.යු.**

මෙම වාර්තාවේ අවසාන මුද්‍රණය සඳහා ස්වකීය කථාවල නිවැරදි කළ යුතු තැන් දක්වනු රිසි මන්ත්‍රීන් මින් පිටපතක් ගෙන නිවැරදි කළ යුතු ආකාරය එහි පැහැදිලිව ලකුණු කොට, පිටපත ලැබී දෙසතියක් නොඉක්මවා **හැන්සාඩ්** සංස්කාරක වෙත ලැබෙන සේ එවිය යුතුය.

**குறிப்பு**

உறுப்பினர் தமது உரையின் இறுதிப் பதிப்பிற் செய்யவிரும்பும் பிழை திருத்தங்களை தமது பிரதியில் தெளிவாகக் குறித்து அதனைப் பிழை திருத்தப்படாத பிரதி கிடைத்த இரு வாரங்களுள் **ஹன்சாட்** பதிப்பாசிரியருக்கு அனுப்புதல் வேண்டும்.

**NOTE**

Corrections which Members suggest for the Final Print of their speeches should be clearly marked in their copy and sent to the Editor of HANSARD within two weeks of receipt of the uncorrected copy.

**Contents of Proceedings :**

**Final set of manuscripts Received from Parliament :**

**Printed copies dispatched :**

**හැන්සාඩ් වාර්තා**
**කොළඹ 5, පොල්හේන්ගොඩ, කිරුළපන පාර, අංක 163 දරන ස්ථානයෙහි පිහිටි**
**රජයේ ප්‍රවෘත්ති දෙපාර්තමේන්තුවේ පිහිටි රජයේ ප්‍රකාශන කාර්යාංශයෙන්**
**මිල දී ගත හැක.**

**මෙම හැන්සාඩ් වාර්තාව www.parliament.lk වෙබ් අඩවියෙන්**
**බාගත හැක.**

ஹன்சாட் அறிக்கையின் பிரதிகளை
இல. 163, கிருலப்பனை வீதி, பொல்ஹேன்கொட, கொழும்பு 5இல் அமைந்துள்ள
அரசாங்க தகவல் திணைக்களத்தின் அரசாங்க வெளியீடுகள் அலுவலகத்தில்
பணம் செலுத்திப் பெற்றுக்கொள்ளலாம்.

இந்த ஹன்சாட் அறிக்கையை www.parliament.lk எனும் இணையத்தளத்திலிருந்து
பதிவிறக்கம் செய்ய முடியும்.

Hansard Reports can be purchased from the Government Publications Bureau
at the Department of Government Information,
No. 163, Kirulapone Avenue, Polhengoda, Colombo 5.

This Hansard Report can be downloaded from
www.parliament.lk

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.